# ඩ්‍රැකියුලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්



චන්දන මෙන්ඩිස්

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ඩ්‍රැකියුලාට

එරෙහිව

# ෂර්ලොක් හෝම්ස්

සමග

ටාල්ටන් මිනිමැරුම

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ඩ්‍රැකියුලාට

එරෙහිව

# ෂර්ලොක් හෝම්ස්

සමග වාල්ටන් මිනීමැරුම

## SHERLOCK HOLMES
## Vs.
## DRACULA

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

ප්‍රකාශක

**චන්දන මෙන්ඩිස්**

141/2, දූව පාර,

බැද්දගාන, කෝට්ටේ

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

*The author – translator gratefully
acknowledges his debt to the
late Sir Arthur Conan Doyle and his estate for
permission to use the characters
and settings created by him.*

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


i. ඩ්‍රැකියුලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්

| | | |
|---|---|---|
| | දෙස්තර ජෝන් වොට්සන්ගෙන් වචනයක් | 09 |
| 1 | අද්භූත නෞකාව | 11 |
| 2 | ප්‍රහේලිකාවක් | 31 |
| 3 | ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ අරඹයි | 40 |
| 4 | හැම්ස්ටෙඩ්හි භීෂණය | 53 |
| 5 | ඛේදජනක මරණයක් | 64 |
| 6 | ට්‍රාන්සිල්වේනියාවෙන් ආ කවුන්ට් ඩ්‍රැකියුලා නම් ආදිපාදවරයාගේ කථාව | 83 |
| 7 | දුෂ්ටයා අපට හමුවේ | 100 |
| 8 | සොයායාම | 120 |
| 9 | ඩ්‍රැකියුලා අතින් වරදක් සිදුවේ | 134 |
| 10 | භයානක හෙළිදරව්වක් | 145 |
| 11 | වැම්පයර්ගේ අඩිපාරේ | 156 |
| 12 | උපරිම ශක්තියෙන් | 168 |
| 13 | හමුවීම | 185 |
| 14 | අවසානය | 197 |
| 15 | අලුත් අභිරහසක් | 205 |

**ii.** වාල්ටන් මිනීමැරුම 208



Reading Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# දෙස්තර ජෝන් වොට්සන්ගෙන් වචනයක්

මෙම කථාන්තරය ඔබට පැවසීමට පෙර, මා විසින් ඉටු කළ යුතු එක් භාරදූර කාර්යයක් ඇත. මා විස්තර කරන්නට යන සිද්ධියට අදාළව, වැරදි ආරංචි හා ප්‍රකාශන රැසක් මෑතකදී ප්‍රසිද්ධියට පත්විය. ඒවා පිළිබඳව පාඨකයා දැනුවත් කොට, සත්‍යය කුමක්ද යන්න ඔහුට හෙළිකිරීම මගේ වගකීමක් යයි මම විශ්වාස කරමි. මෙයට මාස හතරකට පමණ පෙර, බ්‍රැම් ස්ටෝකර් නම් අයර්ලන්ත ජාතික මහත්මයෙකු ලියූ ඩ්‍රැකියුලා නම් ග්‍රන්ථය අනප්‍රියත්වයට පත්විය.

එම පොතේ අඩංගු වන්නේ, ඒ සිද්ධියට අදාල යම් යම් චරිත විසින් යැවූ ලිපි, දිනපොත්, පුවත්පත්, ශබ්ද සිලින්ඩරගත ඕප වලින් උපුටා ගත් කොටස්ය. එහෙත් ඔවුන්ගේ අරමුණු මුදුන්පත් කරගැනීමේ කටයුත්තට, මගේ මිත්‍ර, උපදේශක අපරාධ පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා සැහෙන තරම් (හා මම ස්වල්ප වශයෙන්) දායක වූයෙමු. එහෙත් මා කලින් සඳහන් කළ පුද්ගලයන් ඔවුන්ගේ පොතේ, ඒ පිළිබඳ කිසිදු සඳහනක් කර නොමැත. මෙයට හේතුව මහාචාර්ය වෑන් හෙල්සිං විසින්, පොත ලියූ බ්‍රැම් ස්ටෝකර් වෙත කර ඇති බලපෑමක්ය යන්න මගේ විශ්වාසයයි. එහෙත් ෂර්ලොක් හෝම්ස් මගේ අදහසට එකඟ නොවේ.

මෙම කාරණා පැහැදිලි වන තැනක් දෙකක් මෙහි සඳහන් කිරීමට මම කැමැත්තෙමි. ස්ටෝකර් පවසන්නේ "චාටු නෝනා" (පුවත්පත් ඇය හැඳින්වූයේ මේ නමිනි) ගේ අවසානය සිදුවූයේ සැප්තැම්බර් 29 වැනිද දහවල් කාලයේ ලෙසයි. එහෙත් වැම්පයර් ශාපයෙන් ඇය මුදවාලමින් නොවැල්මින් සාමි ඇගේ හදවතට ලී උලක් යැව්වේ 29 වැනිදා එළිවෙන පාන්දරය.

කවුන්ට් ඩ්‍රැකියුලා රැගත් "සරීනා කැතරින්" නෞකාව, කළුමුහුදේ වාර්නා වරාය බලා ඔක්තෝබර් 4 වැනිද පිටවූයේ, ලන්ඩනයේ ඩූලිට්ල් වාප්පුවේන් බව මහාචාර්ය වෑන් හෙල්සිං සඳහන් කරයි. නැව් ගමනාගමනය පිළිබඳ තොරතුරු සඳහන් නාවික ඒජන්තවරුන්ගේ පොත්පත් පරීක්ෂාකර බලන්න. "සරීනා

http://sherlockholmesinvestigations.blogspot.com

කැතරින්" හැට පිටත්පුමේ ලන්ඩනයෙන් නොව යෝක්ෂයරයේ පිහිටි විට්බි වරායෙන් බව ඔබට දැනගන්නට ලැබෙනු ඇත. ස්ටෝකර් මේ අයුරින් සඳහන් කරන්නට ඇත්තේ, ඔක්තෝබර් 4 වැනිද හෝම්ස් හා මා "පණ එපා" කියා වැම්පයර් ලුහුබැඳ ගිය පුවත සැඟවීමේ චේතනාවෙන් විය යුතු යයි මම සිතමි.

පොත කියවාගෙන යද්දී පාඨකයාට මා පෙනෙනු ඇත්තේ, වැම්පයර්වරුන් ගැන කිසිවක් නොදන්නා පුද්ගලයෙකු ලෙසය. 1890 කාලයේදී එංගලන්තයේ කාටත් එම ක්ෂේත්‍රය ගැන තිබුණේ එවැනි අසම්පූර්ණ දැනුමකි. ස්ටෝකර්ගේ පොත නිකුත්වීමෙන් පසු සුදුළූණු, ලී උල් සහ ශ්‍රී ශුද්ධ පෝෂී ශිරාව අසල් තුවාල ගැන බොහෝ දෙනා දැනුවත්ව සිටිති.

අපගේ පරීක්ෂණය පිළිබඳ සත්‍ය වාර්තාව වන්නේ ඔබට ඉදිරිපිටු වල කියවන්නට ලැබෙන කථාන්තරයයි. ඒ දිනවල මා ලියාගත් සටහන් රාශිය, වරක් නොව දෙවරක් සසඳා බලා එහි නිරවද්‍ය බව මම තහවුරු කරගත්තෙමි.

කථාන්තරයක් ලිවීමේදී මා සාමාන්‍යයෙන් අනුගමනය කරන එක් ප්‍රතිපත්තියක් මගේ පාඨකයෝ හොඳින් දනිති. එනම් සිද්ධියට අදාළ පුද්ගලයින්ගේ සත්‍ය නම් ගම් හෙළිනොකොට, ව්‍යාජ නම් ගම යෙදීමය. එහෙත් මෙවර මට එය වෙනස් කිරීමට සිදුවී ඇත. මෙම කථාන්තරයේ සත්‍යාසත්‍යභාවය සැකහැර දැනගැනීමට පාඨකයාට ඉඩ සැලසිය යුතුය. එබැවින් අදාළ පුද්ගලයින්ගේ ඇත්ත නම හා සම්පූර්ණ තොරතුරු, වෙනස් නොකොට එලෙසින්ම ඇතුලුවෙමි. මා කියන දෙයට වඩා බ්‍රැම් ස්ටෝකර් ගේ වචන විශ්වාස කරන අය සමහරවිට සිටීමට ඉඩ ඇත. ඔවුන් වෙත කීමට මට ඇත්තේ එක් දෙයකි. මෙම සිද්ධියේ "වාටු නෝනා" නමින් හැඳින්වෙන තැනැත්තියගේ ඇඳුම් පැළඳුම්වල පැහැය, සුදුද කළුද යන්න ස්ටෝකර් හෝ මහාචාර්ය වෑන් හෙල්සිංවත් නොදනී!

ජෝන් එච්. වොට්සන්
(එම්. ඩී)

1897 සැප්තැම්බර් 15 වැනි දින
ලන්ඩන්
එංගලන්තය.



http://sherlockholmesinvestigations.blogspot.com

# 1

# අද්භූත නෞකාව

මුළු එංගලන්තයම සංත්‍රාසයෙන් හෙල්ලූ, ජනතාව අතිමහත් භීතියට පත්කළ මෙම භීෂණ ගැටලුව විසඳීම භාරවූයේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාටය. ඒ 1890 වසරේ අගෝස්තු මාසයේ බව කීමට, මට මගේ සටහන් පොත් පෙරළා බැලීම අවශ්‍ය නැත. ඒ තරමටම සිදුවීම් සියල්ල මගේ සිතට තදින් කාවැදී ඇත.

මේ සිද්ධිය ගැන යම් යම් අවස්ථාවලදී මම මගේ සටහන්වල සඳහන් කළෙමි. ඒ බැව් මගේ පාඨකයන්ට මතක ඇතුවා නිසැකය. "තැපැලෙන් ආ තෑග්ග" කථාවේ, ක්‍රොයිඩන්හි සූසාන් කුෂිං මෙනෙවියට ලැබුණු පාර්සලය ගැන කියද්දී, මම මේ පිළිබඳව සඳහන් කළෙමි. ශරීරයෙන් බේකර් වීථියේ අපගේ නිවහනේ රැඳී සිටිමින්, අපගේ ආත්මයන් පමණක් යුරෝපා මහාද්වීපයේ හිමෙන් වැසුණු කඳුකරයකට යැවූ එකම පරීක්ෂණය මෙයයි. ඒ බවට හෝම්ස් මා සමග සම්පූර්ණයෙන්ම එකඟ වෙයි. එම කථාන්තරය ඔබ හමුවට ගෙන ඒම දැන් මට භාරවී ඇත.

අගෝස්තු මාසය පටන් ගනිද්දීම ලන්ඩන් නගරය හරහා ඇතිරගියේ දැඩි උණුසුමකි. අතමිට සරුසාර වූ හැමදෙනෙක්ම ලන්ඩනය හැර දමා, රටේ සීතල පෙදෙස් වෙත සංක්‍රමණය වූහ. මම කලක් ඉන්දියාවේ උෂ්ණ කලාපයේ ජීවත්වූයෙමි. එහෙත් උෂ්ණත්වමානයේ රසදිය ඉහළ යන හැමවිටකම, මගේ සිතේ නොසන්සුන් බව හා නොඉවසිලිමත් බව ඉහළයෑමට පටන්ගනී. මගේ කරදරකාරී ස්වභාවයෙන් මිදී, මගේ බිරිඳට විවේකයක් ගැනීමට ඉඩ සලස්වා, මම බේකර් වීථියේ අපගේ නිවහන වෙත යාමට තීරණය කළෙමි.

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් යමක් ඉතා උනන්දුවෙන් කියවමින් සිටියේය. ඒ, ඔහු අපරාධකරුවන් පිළිබඳ තොරතුරු පුවත්පත්වලින් කපා අලවා ගත් ස්ක්‍රැප් පොතකි. ඔහුට බාධා නොකොට මම නිශ්ශබ්දව පුටුවක වාඩිගතිමි. මෙම පොතේ



http://sherlockholmesinvestigations.blogspot.com

එංගලන්තයේ පාතාල ලෝකයේ අපරාධකරුවන් ගැන සියලුම තොරතුරු ඇතුළත්ව තිබිණ. හෝම්ස්ගෙන් මෙය සොරකම් කර ගැනීමට, අපරාධකරුවෙකුට ඉඩ ලැබුණොත්, එය ඔහුට මහානර්ඝ වස්තුවක් වනු නොඅනුමාන බව මට කල්පනා විය. මීළඟට මගේ සිතට ආවේ පසුගිය කාලයේ අපට අල්ලාගැනීමට හැකි වූ දරුණු අපරාධකරුවන් ගැනය.

"ඔබ හිතුවා හරි වොට්සන්" මගේ මිතුරා කීවේ මිනිත්තු කිහිපයක නිහඬතාවය බිඳදමමිනි. "දෙස්තර ග්‍රයිම්ස්බි රොයිලොට් චණ්ඩියෙක් වගේම බොහොම දරුණු මිනීමරුවෙක්. ඔහුගේ ක්‍රියාකලාපයට ගැළපෙන විධියේ සාධාරණ ඉරණමක්, අන්තිමේදී ඔහුට හිමිවුණා"

"ඒකෙ කිසි සැකයක් නෑ" මම කීවෙමි. මීළඟට මම අතිශයින්ම මවිතයට පත්වූයෙමි.

මීට මොහොතකට පෙර මා ග්‍රයිම්ස්බි රොයිලොට් ගැන සිතමින් සිටි බව ඇත්තකි. එහෙත් මගේ හිතේ ගැඹුරේම තිබූ අදහස්, හෝම්ස් දැනගත්තේ කෙසේද?

"මගේ හිතවත් මිත්‍රයා!" මට කෑගැසිණ. "මේක මහා පුදුමාකාර වැඩක් නේ! ඉස්සර නම් ඔබ කළේ නිරීක්ෂණ මගින් තර්කානුකූලව නිගමනයන්ට එළැඹීම. දැන් ඒක අත් ඇරදලා කෙනෙකුගේ හිතේ තියෙන දේවල් පවා කියන්න පටන් අරගෙනද? දැන් ඔබ අර ජේන කියන්නන්ගේ නැත්නම් අත බලා ශාස්ත්‍ර කියන්නන්ගේ තත්ත්වයට පත්වෙලාද?

හඬ නොනගා සිනාවක් පෑ ඔහු, ළඟ තිබූ තම චෙරිවුඩ් පයිප්පය අතට ගෙන පුටුවේ පිටුපසට හේත්තු විය. මීළඟට දුම්කොළ පසුම්බියෙන් දුම්කොළ, පයිප්පයට පුරවන්නට පටන්ගත්තේය.

"ඔය කියන ආකාරයේ පුදුමාකාර දෙයක් මගෙන් කියැවුණේ නෑ වොට්සන්" කී ඔහු පයිප්පය දල්වා ගත්තේය. "බේකර් වීථියේ අංක 221 B කියන තැන ඉන්ද්‍රජාලික වැඩ නෑ. අපි කරන්නේ නිරීක්ෂණය කිරීමත්, එයින් නිවැරදි නිගමනවලට ඒමත් පමණයි. ඒකට ඇති දක්ෂතාවය කෙනෙක් ඉන්ද්‍රජාලික වැඩක් ලෙස සලකන්න ඉඩ තියෙනවා" ඔහු කීවේ පයිප්පයෙන් දුම් පිටකරමිනි.

"ඒ වුණාට ඔබට නිරීක්ෂණය කළ හැකි කිසිම දෙයක් මං කළේ නෑ" මම කීවෙමි. "මෙතැන වාඩිවුණු වෙලාවේ පටන් මං හිටියේ පිළිමයක් වගේ. එහෙම නේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"කිසිම කෙනෙකුට පිළිමයක් වගේ ඉන්න බෑ වොට්සන්" ඔහු කීය. "සමහර වෙලාවට තමන් හිටියේ එහෙමයි කියල ඔහුට හිතෙන්න පුළුවනි. ඒ වුණත් ඔහු දෙස හොඳ අවධානයක් යොමුකරන්නෙකුට, නිරීක්ෂණය කළ හැකි දේවල් තියෙනවා. ඒ තැනැත්තා නොදැනුවත්ම ඔහුගේ මුහුණේ ඇතිවෙන හැඟීම්, ඇදෙනෙත් නොයෙක් පැති වලට යොමුවෙන හැටි. අන්න ඒවා තේරුම් ගත්තොත් දක්ෂ නිරීක්ෂකයෙකුට අමාරු වෙන්නෙ නෑ දකින්න. මොනවද? අර පුද්ගලයාගෙ සිතේ ගැඹුරින්ම ඇතිවෙන සිතිවිලි.

උදාහරණයක් ලෙස, ඔබ මොහොතකට පෙර මේ පුටුවේ වාඩිවුණු සිද්ධිය ගනිමු. මුලින්ම ඔබේ දෙනෙත් යොමු වුණේ අන්න අර මේසය උඩට බිව ඔෑ දුටුවා. එතැන තිබෙන "උග්‍රවිෂ" යන මාතෘකාවෙන් මා ලියූ පොත් පිංච වෙත. ඒ පොත විවෘත කරලයි තියෙන්නෙ. ඒ මොන පරිච්ඡේදයද? "පොළඟා ඇතුළු විෂඝෝර සර්පයින්" කියන පරිච්ඡේදය. අපි දෙන්නාට එවැනි සතෙකු සමග අත්දැකීමක් විඳගන්න ලැබුණේ එකම අවස්ථාවයි. එක් ක්ෂණයකින් ඒක මගේ හිතට ආවා. ඒ තමයි අර තක්කඩි දෙස්තර ග්‍රයිම්ස්බි රොයිලොට් ඔහුගේ දැති දියණිය ඝාතනය කරන්න කළ උත්සාහය. එබගේ සිතිවිලි ධාරාව වහාම ඒ පැත්තට ගමන්කළ බව හිතාගන්න මට අමාරුවුණේ නෑ. ඊළගට ඔබේ මුහුණේ ඇතිවුණු හැඟීම.

එයින් මුලින්ම පිළිබිඹු වුණේ පිළිකුල. එතකොට මං තේරුම් ගත්තා, මගේ හිතේ ඇතිවූ සැකය නිවැරදි බව. ඊළගට ඔබේ මුහුණේ ඉරියව් වෙනස්වුණේ, ඔබ කෝපයට පත්වූ බව හඟවමින්. එතකොට මං කළ නිගමනය නිවැරදි බව ස්ථිරවුණා. එවිටයි මං ඔබ සමග එකඟවුණේ, දෙස්තර රොයිලොට් බිහිසුණු අපරාධකාරයෙක් බවට"

"හෝම්ස්. හෝම්ස්" මා පැවසුවෙ සිනාසෙමින් හිස සොලවමිනි. "මා නැවත වරක් ඔබට මහත් කරල දෙන්න ඕනෑ ඒ නිගමනයන්ට ඔබ ළඟාවූ ආකාරය තේරුම් කරල දුන්නාම එහි වටිනාකම අඩුවෙනවා. කිසිවක් නොකියා හිටියා නම් තමයි, අදාළ තැනැත්තා මවිතයට පත්වෙන්නේ"

"එහෙම වුණොත් වෙන්නේ මොකක්ද දන්නවද, වොට්සන්?" මගේ මිත්‍රයා ඇසීය. "මගේ අපරාධ පරීක්ෂණ ගැන ඔබ ලියා ඇති


http://sherlockholmesinvestigations.blogspot.com

වාර්තා, අද්භූත ප්‍රබන්ධ කියල මිනිස්සු කියාවි. එතකොට දෙස්තර ජෝන් වොට්සන් ඉදිරිපත් කර ඇති රහස්පරීක්ෂණ කථා වැටෙන්නේ ජූල්ස් වර්න් මහත්තයාගේ විද්‍යා ප්‍රබන්ධ සමග; නැත්නම් ග්‍රිම් සහෝදරයන්ගේ සුරංගනා කථා සමග. ඒක නෙමෙයි මිත්‍රයා. මෙන්න මේ විදුලිපුවත ගැන ඔබ මොනවද හිතන්නේ? මේක ආවෙ මං උදේ කෑම කනද්දි"

මම විදුලිපුවත කියවා බැලීමි.

"අද උදේ ඩේලිග්‍රාෆ් පුවත්පතේ ප්‍රධාන පුවෘත්තිය සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් ලබාගැනීමට කැමැත්තෙමි.

තෝමස්. සී. පාකර්
විට්බි
යෝක්ෂයරය."

"ඔබගෙන් උපදෙස් ලබාගැනීමට අවසරයක් ඉල්ලා ඇති බවයි පෙනෙන්නේ" විදුලිපුවත ආපසු ඔහු අතට දෙමින් මම කීවෙමි.

"ඔව්"

"ඔහු මේ කියන ප්‍රධාන පුවෘත්තිය මොකක්ද කියල ඔබ කියෙව්වද?"

"විදුලිපුවත ලැබුණාට පස්සේ මං පුවත්පත ගෙන්වාගත්තා. මෙන්න කියවා බලන්න වොට්සන්"

## ද ඩේලිග්‍රාෆ්

අගෝස්තු 8 වැනිද

(ප්‍රාදේශීය වාර්තාකරුවෙකු විසිනි)

## විට්බි වරායේ අභිරහස් නෞකාවක්

විට්බි ප්‍රදේශයට ඉතිහාසයේ මෙතෙක් වාර්තා වී ඇති දරුණුම කුණාටුව, මේ අවසන්ව ගියා පමණි. එය ඉතාම ක්ෂණිකව හටගත් චණ්ඩම කුණාටුව වූ බව බොහෝදෙනාගේ මතයයි. කෙසේ වෙතත් මේ කුණාටුව විට්බි පළාතට ගෙන ආවේ කිසිදක නොදුටු අද්භූත ප්‍රතිඵලයකි.

දින කිහිපයක සිරුම කාලගුණය පැවතුණේ තරමක් අසතුටුදායක තත්ත්වයකය. එය අගෝස්තු මාසයට එතරම් අසාමාන්‍ය දෙයක් නොවේ. සෙනසුරාද හැන්දෑව වෙද්දී කාලගුණය ඉතාම යහපත්



http://sherlockholmesinvestigations.blogspot.com

අතට හැරිණි. සතිඅන්ත නිවාඩුව විවේකයෙන් ගතකිරීමට විශාල පිරිසක් විට්බි වෙරළ වෙත ඇදී ආහ. මොවුන්ගෙන් සමහර දෙනෙක් විට්බි අසල වූ මල්ග්‍රේව් වනලැහැබ, රොබින්හුඩ් බොක්ක, රිග්මිල්, රන්ස්වික්, ස්ටෙයිත්ස් ආදී පෙදෙස් නැරඹීමට, චාරිකා වල යෙදුණාහ. "එමා" සහ "ස්කාබ්‍රෝ" නම් වාෂ්පබල නෞකා දෙක, කිහිප විටක්ම මුහුදුතීරයේ ඉහළ පහළ ගමන් කළේ සංචාරකයන්ගේ පහසුව පිණිසමය. අපරභාගය වන තුරු ම පැවතුණේ යහපත් කාලගුණයකි.

ඊස්ට්ක්ලිෆ් කඳුමුදුනෙන් පිහිටි දේවමැඳුර මේ පළාතේ පිහිටි සුප්‍රසිද්ධ ස්ථානයකි. ඒ අසලට පැමිණි විට මුළු මුහුදුතීරයම ඉතා දර්ශනීය අයුරෙන් දිස්වේ. පෙරේද සැන්දෑවේ මෙතැනට රැස්වූ ජනකාය අතර ඕපාදූපකාරයෝ රැසක් වූහ. ඔවුන්ගේ කතාබහට ලක්වූයේ, ඊසාන අහසේ දක්නට තිබූ මවනඝ ය. යෝධ කළුපැහැති වලාකුළු රාශියක්, ඊසාන දිග ක්ෂිතිජයේ සිරස් අතට පිහිටා තිබූ බව ඔවුහු පැවසූහ. මේ වෙලාවේ-නිරිත දිගින් හැමුයේ මඳ සුළඟක් පමණි. වෙරළාරක්ෂක ස්ථානයේ මුරභටයෙක් මේ අසාමාන්‍ය දසුන වහාම ඉහළ නිලධරයන්ට වාර්තා කළේය! අවුරුදු පනහකට අධික කාලයක් මුහුදේ කරත් ගසා ඇති-ඕපස්ගත ධීවරයකු කීවේ, ඉතා චණ්ඩ කුණාටුවක් වෙරළ දෙසට හමා එන බවය.

කෙසේ වෙතත් හිරු බැස යද්දී දකින්නට තිබූ දර්ශනය ඉතාම අලංකාර එකක් විය. දේදුනු පැහැයෙන් වර්ණවත් වූ වලාකුළු වල සුන්දරත්වය නැරඹීමට ඊස්ට්ක්ලිෆ් දේවමැඳුර ඉදිරිපිට පිට්ටනියේ මහ සෙනගක් රැස්වී සිටියහ. ක්ෂිතිජයේ නොසෙල්වී තිබුණු කාලවර්ණ වලාකුළු පිටුපස සැඟවී යාමට, හිරු දෙවියෝ සූදානම් වූහ. කුණාටුව අවසන්වන තුරු තමන්ගේ කුඩා නාවික යාත්‍රා, වරාය තුළම රඳවාතැබීමට තීරණය කළ නාවිකයෝ, ඒවා ආපසු පදවාගෙන ආහ.

ඇඳිරි වැටෙද්දී සුළං හැමීම සම්පූර්ණයෙන්ම නැවතිණි. රැය ළඟාවෙද්දී මුහුදේ තිබුණේ දැඩි නිශ්චලතාවයකි. මෙම නිසල බවත් උණුසුම් බවත්, චණ්ඩ කුණාටුවක පෙර නිමිති බව නතු දන්නෝ කීහ. මුහුදේ ගමන් කළ යාත්‍රාවල දල්වා තිබූ එළි ද දක්නට ලැබුණේ කිහිපයක් පමණි. වරාය කරා එන නෞකා සාමාන්‍යයෙන් යාත්‍රා කරන්නේ වෙරළ තීරයට සමීපයෙනි. එහෙත් මෙදින ඔවුහු



http://sherlockholmesinvestigations.blogspot.com

දියගොන්ම පැමිණියහ. පෙනෙන තෙක් මානයේ ධීවර බෝට්ටු කිහිපයක් විය. පැහැදිලිව දක්නට තිබූ එකම නෞකාව වූයේ විශාල විදේශීය නෞකාවකි. එය රුවල් සියල්ලම ඉහළට නංවාගෙන බටහිර දෙසට යාත්‍රා කළ බැව් පෙනිණ. මෙවැනි කුණාටුවක් ළං වෙද්දී, සියලුම රුවල් දිගහැර සිටීම මොනතරම් අඥාන ක්‍රියාවක්ද? මේ නැවේ නාවිකයන් එතරම් කරුණු තේරුම් ගැනීමට නොහැකි අමන පිරිසක්ද? වෙරළ සමීපයේ සිටි තායෙන් සිත්වලට නැඟුණු ප්‍රශ්න ඒවාය. ළඟ එන අන්තරාය පිළිබඳව ආලෝක සංඥා මඟින් ඔවුනට දැන්නුවත්, ඔවුන් ඒ සියල්ල නොසලකා හැරි බවක් පෙනිණ. මහමුහුද දැක්වෙන තෙල් සායම් චිත්‍රයක ඇඳ තිබූ සිතුවමක් මෙන්, නෞකාව රුවල් හකුළා නොගෙන මුහුදු රළ මත රැඳී තිබිණ.

හිරු බැසයත්ම ඝන අන්ධකාරයේ, සයුර නොපෙනී ගියේය. රාත්‍රි දහයට මඳ වේලාවකට පෙර, සැම තැනකම පැතිරගියේ දැඩි නිහඬතාවයකි. ගොඩබිමේ හඬන බැටළුවෙකු හෝ වීථියේ බුරන බල්ලෙකුගේ හඬ ද පැහැදිලිව ඇසීමට හැකිවිය. මධ්‍යම රාත්‍රිය පසුව මඳවේලාවක් ගතවෙද්දී මහාසාගරය දෙසින් අසන්නට ලැබුණේ, දුක් අඳෝනාවක් වැනි අද්භූත ආකාරයක ශබ්දයකි.

මිලඟට එක්වරම කුණාටුව හමන්නට පටන්ගත්තේය. ඒ සමගම චණ්ඩ මුහුදුරළ එකිනෙකා පරයමින් වෙරළට ගසාගෙන එන්නට පටන්ගත්තේ සැඩ පහරක් ද සමඟය. මිනිත්තු කිහිපයකට පෙර වීදුරු කැබැල්ලක් මෙන් නිසලව තිබූ මුහුද, තත්පර කිහිපයකදී විසරුවෙන් ගර්ජනා කළ යක්ෂයෙකු බවට පත්විණි. සුදු පැහැති පෙණකැටි රැගත් මුහුදුරළ, අඩි හතළිහක් පනහක් ඉහළට නැග යළි කඩාහැළිණි. විට්බි වරායේ දෙපසින් මුහුද දෙසට බැඳ ඇති දියකඩන දෙකකි. ඒ මත ප්‍රදීපාගාර දෙකකි. සුළඟේ වේගය කොතරම් ප්‍රබලවී ද යත්, ශක්තිමත් වැඩිහිටියන් පවා දෙපයින් සිටගෙන සිටියේ. බිම සවිකොට තිබූ යකඩදම්වැල් වල එල්ලී ගෙනය. කුණාටු මුහුද නැරඹීමට එක්රැස්ව සිටි පිරිස එතැනින් ඉවත්කිරීමට වෙරළාරක්ෂක නිලධරයෝ පියවර ගත්හ. එසේ නොවන්නට කුණාටුවෙන් මරණයට පත්වූ ගණන ඉහළ යන්නට ඉඩ තිබිණ. මේ මොහොතේ වෙරළේ තිබුණේ, කලබලකාරී අවදානම් තත්ත්වයක් බව අමුතුවෙන් කිවයුතු නැත. එය දෙගුණ තෙගුණ කරමින් ඉතා ඝන මීදුමක් මුහුද දෙසින් ගොඩබිමට ගලා



http://sherlockholmesinvestigations.blogspot.com

ඒමට පටන්ගත්තේය. මෙය දුටු ඇතැමෙකුට හැඟුණේ, මුහුදේ ගිලී මියගිය අයගේ අවතාර, සුදු මල්වඩම් රැගෙන, සිය දෑතින් දකිමට ගොඩබිමට පැමිණෙන අයුරකි. මෙම දර්ශනයෙන් භීතියට පත්වූ සමහරු වෙව්ලා ගියහ. මොහොතකට හෝ දෙකකට මීදුම ඉවත්වෙද්දී, ඈත දියඹ ද ගොඩබිමට පෙනිණි. ඒ නොනවත්වාම සිදුවූ විදුලිකෙටීම් වල ආලෝකයෙනි. ඒ සමගම ඇතිවූ හෙණ පුපුරායාමෙන් මුළු ප්‍රදේශයම දෙදරා ගියේය.

වරින්වර ඇතිවූ විදුලිකෙටීමෙන් සිත් ඇදගන්නා දසුන් ද දැකගන්නට ලැබිණි. කඳු මෙන් ඉහළ නැඟුණු දියරැළි, රකුසෙකු මෙන් මුහුද කලඹද්දී, පණ බේරාගැනීමට උමතුවෙන් මෙන් වෙරළ දෙසට ඇදෙන ධීවර බෝට්ටුවලත් ඉදහිට පෙනිණි. ඊස්ටක්ලිෆ් කඳුමුදුනේ සූදානම්ව තිබූ ප්‍රබල ආලෝකධාරා නිකුත් කළ පහනකි. එහි ආධාරයෙන් දියකඩනවල නොගැටී, ධීවර බෝට්ටු ගොඩබිමට ලගාවෙද්දී මහජනයා වෙතින් ප්‍රීතිඝෝෂා නැගිණි. එය මුහුදේ ඝෝෂාව ඉක්මවා ගියේය.

වැඩිවේලා යාමට පෙර මෙම ප්‍රබල ආලෝකධාරා වලට රුවල් නැවක් දිස්විය. මේ සව්ස්වරුවේ රුවල් සියල්ලම දිගහැරෙන සිටි විදේශීය නෞකාවමය. දැන් කුණාටුව වේගයෙන් හැමුවේ දියඹ සිට ගොඩබිම දෙසටය. රුවල්නැව පත්ව ඇති අන්තරාය, බලාසිටි හැමටත් වැටහිණි. විවෘත වරායට හොඳටම ළඟින් මුහුදමැද ඇත්තේ අතිවිශාල ගල්පරයකි. එහි ප්‍රධානම කොටස තිබුණේ ජලමට්ටමට මදක් පහතිනි. ශතවර්ෂ ගණනාවක් තිස්සේ සුළඟට ගසාගෙන ආ යාත්‍රා, මෙම ගල්පරයේ හැපී විනාශවී ගිය අවස්ථා අපමණය. මේ මොහොතේ සුළඟ හැමූ ආකාරයට, ගල්පරයේ නොගැටී වරායට ඇතුළුවිය හැකි ක්‍රමයක්, රුවල් නැවට නොතිබිණි.

හැම රුවලක්ම දිගහැර සිටි නෞකාව, ගොඩබිම දෙසට ගසාගෙන ආවේ අධික වේගයෙනි. පළපුරුදු නාවිකයෙකු පැවසුවේ "මේ නැව ගහගෙන එන වේගෙට, ගිහින් නවතින්නෙ අපායෙ තමයි!" යනුවෙනි. මීළඟට එක්වරම සුළඟත් සමග ඝන මීදුම ද ගලා ආවේය. පෙරටත් වඩා ඝනකමින් වැඩිවූ එය වෙරළ තීරයම වසා ගත්තේ, සුදුරෙද්දක් ඇතිරූ විලසිනි. කිසිවක් දැකීම එයින් සීමාවිය. ග්‍රහණය කරගත හැකිවූයේ කනට ඇසෙන දේ පමණි. කුණාටුවේ වියරු හඬ සමග හෙණ පුපුරණ හඬ පෙරටත්



http://sherlockholmesinvestigations.blogspot.com

වඩා පැහැදිලිව ඇසිණ; නොනවත්වාම ඇසිණ. නැගෙනහිර දියකඩනයට ද මඳ එළියක් වැටෙන සේ, සෝදිසිපහනේ ආලෝකධාරා වරායේ දෙරටුව වෙත එල්ල කර තබන ලදී. රැස්ව සිටි ජනයා සවන් යොමුකරගෙන බලාසිටියේ, හුස්ම ඉහළ පහළ දැමීමට අමතක වූ පරිද්දෙනි.

සුළං හමන දිශාව එක්වරම ඊසාන දිගට වෙනස් විය. ඒ සමගම මීදුම ඉවතට පාවී ගියේය. වේගයෙන් ගසාගෙන ආ දියරැල්ලක් සමගම රුවල් නෞකාව දියකඩන දෙක අතරින්, වරාය තුළට නිරුපද්‍රිතව ලඟාවිය. සෝදිසිපහනේ ආලෝක කදම්බය නෞකාව වෙත එල්ලවිණි. එයින් දක්නට ලැබුණේ කාගේත් සිත් භීතියට පත්කරවන දසුනකි. නැවේ සුක්කානමට දැත් බැඳ දමා තිබුණේ මළමිනියකි! නැවේ පැද්දීමත් සමගම පැත්තකට කඩා වැටී තිබූ හිස දෙපසට පැද්දිණි. නැව් තට්ටුව මත වෙනත් කිසිදු ප්‍රාණයක සලකුණක් නොවීය.

කිසිදු විනාශයකට පත්නොවී, නෞකාව දෛව හාස්කමකින් මෙන් වරාය තුළට ආවේ කෙසේද? මළමිනියෙකුගේ දැතින් සුක්කානම හැරෙව්වා මිස, එය නිරවුල්ව පැදෙව්වේ කවුද? බලාසිටියවුන් භීතියෙන් මවිතයටත්, මවිතයෙන් භීතියටත් පත්කළ කරුණ වූයේ එයයි. කෙසේ වෙතත් එය සිදුවීමට ගතවුණේ මෙය ලිවීමට ගතවූ කාලයටත් අඩුකාලයකි. දෙකට හෝ නොනැවතුණු රුවල් නෞකාව වරාය හරහා එහි නිරිත දිග දෙසට ගමන් කළේය. වරායේ නිරිත දිග කෙළවරේ දියරැලි වලින් ගෙනා වැලි බොරළු තැන්පත්වී ගොඩවුණු මුල්ලක් තිබේ. මෙය හැඳින්වුණේ ටේට්හිල් දියකඩනය නමිනි. වේගයෙන් පාවී ආ නෞකාව, ගල් බොරළු දියකඩනය මතට නැග, සියගමන උපද්‍රවයකින් තොරව අවසන් කළේ කවුරුත් පුදුමයට පත්කරමිනි.

මීළඟට හැමදෙනා විස්මයට පත්කළ තවත් අද්භූත සිදුවීමක් විණි. බොරළු පරය මත නැව රැඳුණා පමණි. නැව ඇතුළත සිට ඉහළට නැග ඇවිත්, නැව් තට්ටුව මතට පිවිස, එතැනින් වෙරළට පැන්නේ රෞද්‍ර පෙනුමක් තිබූ කළුපැහැති දැවැන්ත බල්ලෙකි. නොනැවතී වේගයෙන් ඉදිරියට දිවගිය ඌ, ඊස්ට්ක්ලිෆ් දේවමැඳුරු සොහොන්බිමේ සොහොන් කොත් අතර අතුරුදන් විය. සෝදිසි ලාම්පුව ඒ දෙසට එල්ල වුවත්, ඌ පිළිබඳ කිසිදු සලකුණක් දක්නට නොලැබිණ.



http://sherlockholmesinvestigations.blogspot.com

රැස්ව සිටි මහසෙනඟ දිව ගියේ ගොඩගැසූ නෞකාව වෙතය. එහෙත් එයට ඇතුළුවීමට, ඔවුනට, වෙරළාරක්ෂක භටයින්ගෙන් අවසර නොලැබිණ. ඔබේ වාර්තාකරුවා ලෙස මට නම් ඊට අවසර ලැබුණු බව සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

සුක්කානම් රෝදය මත දෑත් තබා, ඒ අතරට කුරුසියක් හා ජප මාලයක් ද රඳවා ගෙන, නැවේ නියමුවා යයි සිතියහැකි පුද්ගලයා මියගොස් සිටියේය. ඔහුගේ දෑත්, සිහින් කඹ වලින්, සුක්කානම් රෝදයට ගැටගසා තිබිණ. මුලින් මේ අසරණයා සිටින්නට ඇත්තේ, වාඩිවී සිටින ඉරියව්වෙන් වන්නට ඇත. නමුත් කුණාටුව නිසා නැව ඒ මේ අතට හැරෙද්දී ඔහු තම අසුනෙන් ඉවතට විසිවී ගොසිනි. දෑත් ගැටගැසීම සඳහා යොදාගත් කඹයට, ඔහුගේ අත්වල ඇටකටු මතුවන සේ, මස තුළට කැපීගොස්ය. මා සමග නැවට පැමිණි කිහිපදෙනා අතර, නැගෙනහිර එලියට පෙදෙසේ ශල්‍යවෛද්‍ය ජේ. එම් කැෆින් මහතා ද සිටියේය. මෘතශරීරය පරීක්ෂා කර බැලූ ඔහු පැවසුවේ "මේ නාවිකයා මියගොස් දින දෙකක් වත් ගතවී ඇත" යනුවෙනි.

මෙම නාවිකයාගේ කබා සාක්කුව තුළ තිබී මූඩිය හොඳින් තද කළ බෝතලයක් හමුවිණි. දියර කිසිවක් නොතිබූ බෝතලය තුළ රෝල් කළ කඩදාසි කිහිපයක් විය. එය වැඩිදුරටත් පරීක්ෂා කර බලන ලදී. එහි වූයේ නැවේ ලොග් පොතට ඇතුළත් විය යුතු අවසන් පිටු කිහිපය බව පැහැදිලි විය. මෙම තැනැත්තා කඹයකින් දෑත් සුක්කානමට ගැටගසාගෙන ඇත්තේ තමා විසින්ම බවත්, ඔහු ගැට තදකරගෙන ඇත්තේ කටේ දත්වල උපකාරයෙන් විය යුතු බවත්, වෙරළාරක්ෂක නිලධරයෙක් පැවසීය.

නෞකාවේ ලියවිලි වැඩිදුර පරීක්ෂා කිරීමේදී තොරතුරු රැසක් හෙළිකරගැනීමට හැකිවිණි. ඩෙමිටර් නම් මෙම රුසියානු නෞකාව ගමන් අරඹා ඇත්තේ, කළුමුහුදේ "වාර්නා" නම් නැව්තොටෙනි. නැවේ සමබරතාවය සකසා ගැනීමට ගෙනගිය වැලි හැරුණු විට, මෙහි ප්‍රවාහණය කළ භාණ්ඩ ඉතා ස්වල්පයකි. ඒ විශාල ලී පෙට්ටි සමූහයකි. ඒවා මතුපිටින් පුස් බැඳී තිබිණ. මෙම ගමන්බඩු යොමුකොට තිබුණේ, විට්බි හි ක්‍රෙසන්ට් මාවතේ අංක 7 දරණ තැන පදිංචි නීතිඥ එස්. එෆ්. බිලිංටන් මහතා වෙතටය. නැව වෙත පැමිණි ඔහු තම බඩු භාරගත්තේය. රුසියානු තානාපතිවරයා



http://sherlockholmesinvestigations.blogspot.com

පැමිණි වරාය ගාස්තු ගෙවා, තම පාර්ශ්වය වෙනුවෙන් කටයුතු සමර්යකට පත්කළේය.

නැව වරායට කඩාවදිද්දී, එයින් පැනගිය සුනඛයා ගැන, දුන් කාගේත් අවධානය යොමුවී තිබේ. විටක හි සත්ත්වාහිංසා සමිතිය මෙම සුනඛයා සොයාගැනීමට උත්සාහ දැරන්නේ, කාරුණික හැඟීම් පෙරදැරි කරගෙනය. එහෙත් කාගේත් බලාපොරොත්තු සුන්කරමින් ඌ නගරයෙන් අතුරුදන්ව් තිබේ. සමහරවිට මේ සුනඛයා විල්ලු ප්‍රදේශයට පැනගොස් භයෙන් එහි සැඟවී සිටිනවා ද වියහැක. වෙට්ටිහිල් පෙදෙසේ ගල්අඟුරු වෙළෙන්දෙකුගේ මැස්ටිෆ් වර්ගයේ ලොකු බල්ලෙකු, උගේ ස්වාමියාගේ නිවස ඉදිරිපිට මරාදමා තිබී හමුවිය. ඌ මියගොස් තිබුණේ දරුණු සටනකින් පසුව බැව් සිතාගැනීමට හැකිවිණි. මෙම බල්ලාගේ උගුරු දණ්ඩ පළා, ආමාශය දක්වාම දරුණු තුවාලයක් සිදුකොට තිබිණ. මේ අනුව සිතාගත හැක්කේ උගේ ප්‍රතිවාදියා, උල් නියපොතු සහිත බිහිසුණු එකෙක් වියයුතු බවයි.

පසුව

භාර නිලධරයාගේ කාරුණික අවසරයෙන්, නැවේ ලොග් පොත පරීක්ෂා කර බැලීමට, මට අවස්ථාව ලැබිණ. අතුරුදන් වූ නාවිකයන් ගැන කළ සඳහනක් හැරෙන්නට, එහි වෙනත් වැදගත් යමක් සටහන්ව නොතිබිණ. කෙසේ නමුත් කාගේත් අවධානය යොමුවූයේ බෝතලය තුළ තිබූ කඩදාසි වෙතයි. මෙය කියවා බැලීමේදී පෙනී යන්නේ, නැව ගමන ආරම්භ කිරීමට පෙර සිටම, කපිතාන්වරයා එක්තරා ආකාරයක උන්මාදයකින් පෙළෙමින් සිට ඇති බවයි. මුහුදු ගමනේදී මෙම රෝගය වඩාත් උත්සන්න වී ඇති බවක් පෙනේ. කෙසේ වෙතත් මේ ඔහු තේරුම් ගත් ආකාරයයි. සියල්ලක්ම රුසියානු භාෂාවෙන් සටහන් කර ඇත. මට තිබුණේ සීමිත කාලයක් බැවින් එය පරිවර්තනය කරගැනීමට මම, රුසියානු තානාපති කාර්යාලයේ ලිපිකරුවෙකුගේ සහාය ලබාගතිමි. මෙන්න එම පරිවර්තනය.

වාර්නා සිට විට්බි දක්වා.

ජුලි 18 - පුදුමාකාර දේවල් සිදුවෙමින් ඇත. ගොඩබිමකට යන තුරු මින් ඉදිරියට හැමදෙයක්ම මම නිවැරදිව සටහන් කර තබන්නෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

ජුලි 6 වැනිද - නැවට බඩු පැටවීම අවසන් කළෙමු. නැවේ සමබරතාවයට අවශ්‍ය වැලි සහ පස් පිරවූ පෙට්ටි එයට අයත්ය. දහවල් වෙද්දී රුවල් ඔසවා ගමන පිටත්වූයෙමු. සුළං හැමීම හැගෙහගිරින්ය. අපේ නැවේ කාර්ය මණ්ඩලය - නාවිකයන් හයදෙනායි, නිලධරයන් දෙදෙනායි, අරක්කැමියා සහ මම (කපිතාන්)..... ඔක්කොම දහඅදෙනායි.

ජුලි 11 - සමුද්‍ර සන්ධිය හරහා බොස්පරස් වරායට ළඟාවූයෙමු. තුර්කි රේගු නිලධාරීහු අපෙන් අල්ලස් ඉල්ලා සිටියහ. එය ගෙවූ විට ඔක්කොම ප්‍රශ්න විසඳිණ. සවස 4ට යළිත් පිටත්වූයෙමු.

ජුලි 12 - ඩාඩනලෙස් වෙත ගමන් කළෙමු. රේගු නිලධරයන් රැසකි. යළිත් වරක් අල්ලස් දී වැඩ කටයුතු ඉක්මනින් අවසන් කරගැනීමට හැකිවුණ. ඔවුනට ඇවැශ්‍ය වූයේ අප ඉක්මනින් එතැනින් පිටවී යනු දැකීමටයි. ඇඳිරිවැටෙද්දී දූපත් පෙදෙස හරහා ගමන් කළෙමු.

ජුලි 13 - මැටපන් තුඩුව පසුකළෙමු. යම්කිසි දෙයක් ගැන කාර්ය මණ්ඩලය සිටින්නේ නොසතුටෙනි. ඔවුන් භයට පත්වී ඇති බවක් පෙනේ. එහෙත් ඒ කුමක් නිසාද යන්න අදහස් නොකරති.

ජුලි 14 - කාර්යමණ්ඩලයේ හැම එකෙනෙක්ම කැලැඹීමට පත්ව සිටිති. ඔවුන් හැම දෙනෙකුම මා සමග කලින් මුහුදු ගමන් වල යෙදී ඇති නිර්භය නාවිකයන්ය. මෙම ප්‍රශ්නයට හේතුව කුමක්ද? එය මගේ සහකාරයාට තේරුම් ගැනීමට නොහැකිවී ඇත. ඔවුන්ගේ සිත් කැලඹූ යමක් නැවේ ඇති බව ඔවුන් පවසා ඇත. එහෙත් ඒ ගැන අසද්දී, පපුවේ කුරුසිය ඇඳ නිශ්ශබ්ද වූවා මිස, ඔවුන් වැඩිදුර කිසිවක් කියා නොමැත. මගේ සහකාරුවා කෝපයට පත්වී එක් නාවිකයෙකුට පහරදී ඇත. මෙයින් සණ්ඩු සරුවල් ඇවිලේවි යයි අප සිතුවත් කිසිවක් නොවිණි. හැමෝම නිහඬය.

ජුලි 16 - පෙට්රොව්ස්කි නම නාවිකයා අතුරුදන් වී ඇත. ඔහුට සිදුවූයේ කුමක්ද යන්න කාටවත් සිතාගත නොහැකියි. රාත්‍රී මුර ශේෂවයේ යෙදී සිට, ඇම්‍රමොෆ්ට රාජකාරි භාරදී පිටත්ව ගියාලු. නමුත් නිදගැනීමට ඇඳට ගොස් නොමැත. නාවිකයන් හැමදෙනෙකුම සිටින්නේ දෙමනස්සනි. මේ වගේ දෙයක් ළඟදීම සිදුවෙතැයි හැමදෙනෙකුම සිතුවාලු. නැවේ මොකක් හරි අමුතු දෙයක් ඇතිබව ඔවුහු කියති. නමුත් ඒ මොකක්ද යන්න ඔවුහු


http://sherlockholmesinvestigations.blogspot.com

නොකියති. මගේ සගකරු සිටින්නේ අනෙක් නාවිකයන් සමග කෝපයෙනි. ළඟදීම ලොකු ප්‍රශ්න වලට මුහුණදීමට සිදුවන බැව් පෙනේ.

ජුලි 17 - ඔල්ගාරෙන් නම් නාවිකයා මගේ කාමරයට පැමිණ මට කථාකළේ අතිශය භීතියට පත්වය. නැවේ යම්කිසි අද්භූත මිනිහෙක් සැරිසරන බව ඔහු කීය. වැහිකුණාටුවක් තිබූ වෙලාවක, ඔල්ගාරන් වැස්සෙන් ආරක්ෂාවීමට පියස්සක් යට බැගවී සිට ඇත. ඒ වෙලාවේ උස කෙට්ටු මිනිහෙක් නැව් තට්ටුවට පැමිණ ඉදිරියට ගොස් අතුරුදන් වී ඇත. මේ පුද්ගලයා නැගුව් ගමන් කරන කිසිම කෙනෙකු විය නොහැකි බව ඔල්ගාරෙන් කීවේ දිවුරමිනි. අද්භූත දේවල් අදහන මෙවැනි පුද්ගලයින්ගේ කථා නිසා, හැමකෙනෙකුම භයට පත්වීමට ඉඩ ඇත. මේ නිසා මම අද නැවේ එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වාම සම්පූර්ණයෙන් සෝදිසි කරන්නෙමි.

එද නවස මම නැවේ සේවකයින් හැම්දෙනෙක්ම කැඳෙව්වා. "ඔබ කියන්නේ මේ නැවේ කවුදෝ හැංගිලා ඉන්නවා කියලනේ. ඉතින් අපි මුළු නැවම සෝදිසි කරල බලමු." මං කිව්වා. කෝපයට පත් මගේ දෙවැනියා කිව්වේ, මේ මෝඩ අදහස් වලින් මිනිසුන් අධෛර්යයට පත්වෙන බවයි. ඔහු කිව්වේ යකඩ පොලු කැල්ලකින් මේ මිනිසුන් පාලනය කරන්න ඔහුට පුළුවන් බව. ඒ වුණත් නැවේ සුක්කානම ඔහුට භාරදීලා, ලන්තෑරුම් දල්වාගෙන අපි නැවේ හැම අස්සක් මුල්ලක් නෑරම සෝදිසි කළා. ප්‍රවාහණ බඩු ගැට්යට නැවේ තිබුණේ, විශාල ලී පෙට්ටි කිහිපයක් පමණයි. ඒ නිසා අපට නොපෙනී කෙනෙකුට හැංගෙන්න තරම් අහුමුළු නැවේ තිබුණේ නෑ. මේ සෝදිසිය අවසන් කළාට පස්සේ, නාවිකයන් කාගේත් හිත්වලට දැනුණේ ලොකු සහනයක්. ඔවුන් යළිත් රාජකාරියට ගියේ සතුටෙන්. මගේ දෙවැනියා අනෙක් අය දිහා ඔරවා බැලුවා. ඒත් මොකුත් කිව්වේ නෑ.

ජුලි 22 - පහුගිය දවස් තුනක් තිස්සේම තිබුණේ, මහවැහි හා කුණාටු සහිත රළු කාලගුණයක්. නිතර රුවල් ඔසවමින් යළි පහත දමමින් කාටත් වැඩ රාශියක් තිබුණා. බයවෙන දෙයක් ගැන හිතන්නවත් වෙලාවක් තිබුණේ නෑ. කාගේත් හිත්වල තිබුණු භය අතුරුදන්වෙලා වගෙයි. කවුරුත් හිටියේ සතුටින්. අපි ජිබ්‍රෝල්ටාවට ළඟාවුණා. එය පසුකර අපි සමුද්‍රසන්ධිය හරහාත් ගමන් කළා. හැමදෙයක් ම යහපත් අයුරින් සිදුවෙනවා.



http://sherlockholmesinvestigation.blogspot.com

ජුලි 24 - මේ නැවට නම් ලැබිලා තියෙන්නේ මහ නරක කාලයක්. අපිට දැනටමත් එක නාවිකයෙක් අඩුවෙලා හිටියේ. අපි බිස්කේ බොක්කට ඇතුළුවුණා. ඒ කියන්නේ ඊළඟට අයහපත් කාලගුණ තත්ත්වයන්ට අපට අනිවාර්යයෙන්ම මුහුණදෙන්න වෙනවා. ඒත් ඊයේ රෑ තවත් මිනිහෙක් අතුරුදන් වෙලා. කලින් එක්කෙනා විධියටමයි. රෑ වැඩ මුරය අවසන් කර පිටවෙලා ආවලු. ඊට පස්සේ ඔහුව දැකපු කෙනෙක් නෑ. කවුරුත් ඉන්නේ හරි භයකට පත්වෙලා. මදගුණයක් සෝදිසියෙන් ඉන්න කියලා මම හැමකෙනෙකුටම පණිවුඩ යැව්වා. මගේ දෙවැනියා නම් ඉන්නේ හරි තරහෙන්. ඔහු අනෙක් මිනිස්සු එක්ක ළඟදීම මොකවා හරි කෝලාහලයක් ඇතිකර ගනීවි කියල මට භයයි.

ජුලි 28 - අපි පහුගිය දවස් හතරම ගතකළේ අපා දුක් විඳිමින්. අපි මහා කුණාටුවකට මුහුණ දුන්නා. ඒකෙන් කිසිම කෙනෙකුට එක මොහොතක් වත් නිදගන්න ලැබුණේ නෑ. කවුරුත් ඉන්නේ දැඩි වෙහෙසකින්. නැව පදවමින් සෝදිසියෙන් ඉඳීම තුන්වැනි කපිතාන්ට භාරදුන්නා. එතකොට කාට කාටත්, පැය කීය කීය හරි නිදගන්න පුළුවනි. මුහුද තවමත් ප්‍රචණ්ඩයි. නමුත් නැව සතුටුදායක විධියට ඉදිරියට යනවා.

ජුලි 29 - තවත් ඛේදවාචකයක්. කවුරුත් මහන්සියෙන් නිසා මුරවැඩට දෙන්නෙක් දමන්න හැකියාවක් තිබුණේ නෑ. උදේ බලද්දී මගේ තුන්වැන්නා අතුරුදන් වෙලා. කවුරුත් දැන් ඉන්නේ අප්‍රමාණ බියෙන්.

ජුලි 30 - ඊයේ රෑ අපි එංගලන්තයට ළං වෙමින් හිටියේ. ඒ නිසා කාගෙත් හිත්වල ලොකු සන්තෝෂයක් ඇතිවුණා. කාලගුණයත් හොඳයි. හැම රුවලක්ම උඩටම එසෙව්වා. නිදගන්න ගියේ ඇගේ මහන්සියෙන්. මගේ දෙවැන්නා මාව අවදිකළා. සුක්කානම ළඟ රැඳවූ නාවිකයාත්, මුරට රැඳවූ දෙන්නාත්, තුන්දෙනාම අතුරුදන් වෙලාලු. නාවික වැඩකටයුතුවලට ඉතිරි වෙලා ඉන්නේ අපි හතරදෙනෙක් විතරයි.

අගෝස්තු 1 - දවස් දෙකක් තිස්සේම මුහුදු මීදුමෙන් වැහිලා තිබුණා. වෙනත් කිසිම නැවක් හෝ රුවලක් දකින්න තිබුණේ නෑ. ඉංග්‍රීසි ඔඩයට ආවාම නැවක් දුටුවොත්, උදව් ඉල්ලා සංඥාකරන්නයි අපි බලාපොරොත්තුවෙන් හිටියේ. නැත්නම් මේක



http://sherlockholmesinvestigations.blogspot.com

අත්ඇර දමලා. වෙනත් නැවකට හරි නගින්නයි. සුළං හමන වේගෙට රුවල් ඉහළ පහළ දමන්න අපට ශක්තියක් නෑ. අපි මහා අවාසනාවන්ත අගාධයකට තල්ලුවෙලා යනවා වගෙයි තේරෙන්නේ. මගේ දෙවැනියා ඉන්නේ, අනෙක් අයටත් වඩා භයෙන් හා කලකිරීමෙන්. ඔහු ස්වභාවයෙන්ම බොහොම තද හිතක් ඇති කෙනෙක්. ඒකම දැන් ඔහුට බලපාලා වගෙයි. ඔහු රුමේනියානු ජාතිකයෙක්. නාවිකයන් දෙන්නා රුසියන්වරු.

අගෝස්තු 2 - මධ්‍යම රාත්‍රියේදී, මට නිදාගන්න ලැබුණේ මිනිත්තු කිහිපයයි. විලාප හඬක් ඇහිලා ඇහැරුණා. ඒක ඇහුණේ මගේ කාමරේට කිට්ටුවෙන් වගෙයි. එළියට දුවගෙන ආව මා හැපුණේ, මගේ දෙවැනියාගේ ඇඟේ. මුරට ඉඳපු නාවිකයාට වෙච්ච දෙයක් නෑ. තවත් එකෙක් හිහිං. දෙවියන් වහන්ස! අපට අනුකම්පා කරනු මැනවි! දෙවැනි කපිතාන් කියන්නේ අපි මේ වනවිටත් ඩෝවර් සමුද්‍රසන්ධිය පහුකරලා බවයි. එහෙම නම් අපි ඉන්නේ එංගලන්තයට බොහොම ළඟින් විය යුතුයි. විලාපය ඇහෙන්න මොහොතකට කලින් මීදුම තුනීවෙලා, ඔහු ගොඩබිමක් දැකල තිබුණා. ඒක ඇත්ත නම් අපි ඉන්නේ උතුරු මුහුදේ. යළිත් වරක් මීදුම අපව වසාගෙන. ඒක අප සමග ගමන් කරනවා. අපව වරායකට ගෙනියන්න පුළුවන් දෙවියන් වහන්සේට පමණයි. දෙවියන් වහන්සේත් අපව අත්හැරදමා ගිහින් වගෙයි.

අගෝස්තු 3 - මැදියම් රැයේ මං ගියේ සුක්කානමේ රාජකාරි කළ නැනැත්තාගේ වැඩ භාරගන්න. නමුත් මට දකින්න ලැබුණේ එතැන කිසිකෙනෙක් නොමැති බව. රුවල් පිරෙන්න හොඳ හුළඟක් හමා එමින් තිබුණා. ඉතින් අපි මොකටද නියම මාර්ගයෙන් බැහැර වෙන්නේ. මං මගේ සහකාර කපිතාන්ව කැඳවන්න කෑගැහුවා. ඒ මොකද ඒ වෙලාවේ මට සුක්කානම අත්ඇරලා යන්න හැටියක් තිබුණේ නෑ. තත්පර කිහිපයට පස්සේ ඔහු දුවගෙන ආවෙ, රෑට ඇඳගෙන හිටි ඇඳුමෙන්මයි. ඔහුගේ ඇස්දෙකෙන් හා මුහුණෙන් පළවුණු හැඟීම් වලින්, මට හිතුණේ ඔහුට පිස්සු හැදිලා කියල. ඔහු මගේ කනට කරල කෙඳිරුවා. "ඒකා මෙහේ ඉන්නවා. ඒ බව මං හොඳාකාරවම දන්නවා. ඊයෙ රෑ සෙඳිසියෙන් ඉඳිද්දී මං ඌව දුටුවා. උස කෙට්ටු මිනිහෙක්. මළමිනියක් වගේ සුදුමැළියි. නැව් තට්ටුවේ කෙළවර ඉඳන් මුහුද දිහා බලාගෙනයි හිටියේ. මං



http://sherlockholmesinvestigations.blogspot.com

හෙමිහිට පිටිපස්සෙන් ගිහිං මමත් පිහියෙන් උගේ පිටට ඇන්නා. ඒත් පිහිය ගියේ හිස් අහසේ, හුළං කපාගෙන යනවා වගේ. නමුත් ඌ මේ නැවේ ඉන්නවා. මං කොහොම හරි ඌව හොයාගන්නවා. අර බඩු ගබඩාකරල තියෙන කොටසේ තමයි ඌ ඉන්නෙ. බාගවෙලාවට අර ලී පෙට්ටියක වෙන්න ඇති. මං ඒවා එකක් ගානේ පියන් ගලවලා බලනවා. ඒ අතරේ ඔබ නැව පදවන වැඩේ කරන්න." මට එහෙම කිව් ඔහු පිටවෙලා ගියා.

ඊළඟට මං දුටුවා ඔහු ලන්තෑරුමක් හා ආයුධ පෙට්ටියක් අරගෙන, බඩු ගබඩා කරල තියෙන පහළ තට්ටුවට බහිනවා. "මේ යකාට නං පිස්සු" මං මටම කියාගත්තා. "හොඳටම පිස්සු. එයාව නවත්වන්න උත්සාහ කිරීමෙන් වැඩක් නෑ. ඒ විශාල පෙට්ටි වලින් මොකක්ද එයාට වුණු හිරිහැරේ? ගමන්බඩු ලේඛනයේ සඳහන් කරල තියෙන්නේ ඒවායේ අඩංගු පස් කියලයි. ඉතින් ඒවා කුරු ගාළු බැලීමෙන් ඇති වැඩේ මොකක්ද? ඉතින් මං සුක්කානම ළඟ රැඳී ඉඳිමින් මේ සටහන් ලියනවා. මට කරන්න පුළුවන්, දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මීදුම ඉවත්වෙන තුරු බලාඉඳීම පමණයි. ඊළඟට මොකක් හරි වරායකට නැව ඇගහිගිං උදව් ඉල්ලා සංඥා කරන්න ඕන..........

දැන් හැමදෙයක්ම බොහොම දුරට අවසන්. මගේ මිත්‍ර සහකාර කපිතාන් වඩාත් සන්සුන් වෙලා උඩට ඒවි කියල මං හිතුවා විතරයි. ඒ මොකද මට ඇහුණා ගබඩාකාමරයේ ලී පෙට්ටි වලට ඔහු මිටියෙන් දඩිබිඩි ගාලා පහරදෙන හඬ. නමුත් ඔහු දොරටුවෙන් උඩට ආවෙ මරලතෝනි නගමින්! ඒකට මගේ මුළු ඇඟම හිරිවැටුණා. ඔහුගේ මුහුණ භීතියෙන් විරූපී වෙලා; ඇස් දෙක උඩ ගිහින්; හොඳටම පිස්සු වැටුණු මිනිහෙක් වගේ "මාව බේරාගන්න! මාව බේරාගන්න!" ඔහු විලාප නැඟුවා. ඊළඟට ඔහු හිස හරවා වටපිට බලද්දී දුටුවේ ඝන මීදුම. ඔහුගේ හිතේ තිබුණු භය හැරුණේ බලාපොරොත්තු කඩවූ බවකට. ඊළඟට හොඳ සිහිකල්පනාවෙන් වගේ මා එක්ක කථාකළා- "කපිතාන්. තවත් පරක්කු වෙන්න කලින් ඔබ එන්න මාත් එක්ක. ඌ ඉන්නවා ඒකෙ. දැන් මං දන්නවා රහස. මහමුහුද ඒ යක්ෂයාගෙන් මාව බේරාගනීවි. මට ඉතිරිවෙලා තියෙන්නේ එච්චරයි" මෙහෙම කිව් ඔහු, මං තව වචනයක්වත් කියන්න කලින්, නැවේ අයිනට දුවගෙන ගිහින් මුහුදට පැන්නා. මං



http://sherlockholmesinvestigations.blogspot.com

හිතන්නෙත් මෙතැන සැඟවුණු රහස මටත් තේරෙනවා. මේ පිස්සු මිනිහා තමයි මගේ නාවිකයන් එක්කෙනා එක්කෙනා මුහුදට දැම්මේ. දැන් ඔහුත් ඒ පාරෙම ගියා. මට දෙවියන් වහන්සේගේ පිහිට ලැබේවා. මං වරායකට ළඟාවුණොත් මේ භීෂණය මොකක් කියලා තේරුම් කරල දෙන්නද? මං වරායකට ගියාම......! මට එහෙම වරායකට ළඟාවෙන්න ලැබේවිද?

අගෝස්තු 4 - මීදුම කොයිතරම් ඝනද කිව්වොත්, ඉරඑළියට වත් ඒක විනිවිද යන්න බැහැ. මං නාවිකයෙක් නිසා ඉර පායා ඇති බව දන්නවා. මට කොහොමටවත් සුක්කානම අතඇරලා යන්න බැහැ. රාත්‍රී අන්ධකාරයේ ඉඳිද්දී මට ඌව දකින්න ලැබුණා. ඌ! ඒ මිනිහා! දෙවියන් වහන්සේ මට සමාව දෙන සේක්වා! මගේ මිත්‍රයා මුහුදට පැන්න එක හරි. නියම නාවිකයෙක් වගේ, නියම මිනිහෙක් වගේ මුහුදට පැනලා මැරෙන එක තමයි හරි. නමුත් මම මේ නැවේ කපිතාන්. මට මගේ නෞකාව අත්හැර දමලා යන්න බැහැ. මොන තරම් භයකට පත්වුණත් මට මගේ නැව අත්හරින්න බැහැ. මගේ හිත දුර්වල වෙද්දී, මගේ අත්දෙක සුක්කානමට තියලා කඹයකින් බැඳගන්නවා. මේ යක්ෂයා මොකෙක් වුණත් මං ඌට භයවෙන්නෙ නෑ. කපිතාන්වරයෙක් හැටියට මගේ ආත්ම ගෞරවය මං ආරක්ෂා කරගතයුතුයි. ඌ එක සැරයක් හරි මගේ මුහුණට එබී බැලුවොත් මට ක්‍රියාත්මක වෙන්න ඉඩක් හිටින්නෙ නෑ. අපේ නැව මුහුදුබත් වුණොත් කාටහරි මේ බෝතලය හම්බවෙවි. එතකොට මේක කියවලා ඔවුනට පුළුවන් වේවි තේරුම් ගන්න. මට භාරවුණු රාජකාරිය මං හැකි පමණින් අවංකව ඉටුකළ බව, හැමදෙනාම දැනගනීවි. තමන්ගේ රාජකාරිය ඉටුකරන්න හදන මේ අසරණයාගේ ආත්මයට දෙවියන්වහන්සේගේත්, කන්‍යා මරියතුමියගේත් පිහිටාධාරය ලැබේවා.....!"

මරණ පරීක්ෂණයේදී දුන්නේ විවෘත තීන්දුවකි. සිදුවී ඇති මිනීමැරුම වලට වගකිවයුත්තා මොහුද වෙන කෙනෙක්ද යන්න පැහැදිලිව දැනගැනීමට සාක්ෂි නොවීය. රැස්වී සිටි මහජනයාගේ මතය වූයේ වීරයෙකු ලෙස මියගිය කපිතාන් වෙනුවෙන් ගෞරවාචාර සහිත අවමඟුලක් පැවැත්විය යුතු බවයි.

පැනගිය විශාල සුනඛයා ගැන කිසිදු ආරංචියක් නොමැත."

පුවත්පතේ වූ එම විස්තරය කියවා අවසන් කොට, කිසිවක් තේරුම් ගැනීමට අපහසුව මම මගේ මිත්‍රයා දෙස බැලීමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඕකෙ තියෙනවා වොට්සන් සිත් ඇදගන්නා කාරණා දෙකක්" ඔහු කීය. "නමුත් තොරතුරු හැමදෙයක්ම දැනගන්නා තුරු අපට මොනම උපකල්පනයක්වත් කරන්න බැහැ. වොට්සන් අද ඔබේ වෛද්‍ය චිකිත්සාගාරයේ වැඩකටයුතු අඩුකද? තවත් පැයක් හෝ දෙකක් මෙහේ ගතකරන්න වුණොත් රෝගීන්......"

"කිසිම ප්‍රශ්නයක් නෑ" මම කීවෙමි. "මගේ රෝගීන්ගෙන් වැඩිදෙනෙක් ලන්ඩන් නගරයේ ග්‍රීෂ්මය උහුලන්න බැරිව මෙහෙන් පිටවෙලා ගිහින්"

"හරිම හොඳයි!" හෝම්ස් හිනාවෙමින් කීවේ ඔහුගේ අතේ තිබූ ස්ක්‍රැප් පොත රාක්කයේ තබමිනි. ඔහෝ! මොකක්ද ඒ ශබ්දෙ? කවුද තරප්පුව නැගගෙන උඩුමහලට එනවා..... ඔව්. මට ලොකු වැරදීමක් නෙමෙයි නම්, මේ එන්නේ තෝමස් පාකර් මහත්මයා විය යුතුයි."

මගේ මිත්‍රයාගේ වාක්‍යය අවසන් වෙද්දී අපේ විසිත්ත කාමරයේ දොරට කිසිවෙකු තට්ටු කරන ශබ්දයක් ඇසිණි.

"ඇතුළට එන්න" හෝම්ස් කීය.

අපේ අමුත්තා වූයේ වයස අවුරුදු විසිහයකට වැඩිනොවූ තරුණයෙකි. රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකොට තිබූ ඔහුගේ මුහුණ පැල්ලින් අඩු එකක් විය. අළුපැහැති ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි ඔහු, කාමරයට ඇතුළු වෙද්දී හිස්වැස්ම අතට ගත්තේය. එවිට අපට දැකගත හැකිවූයේ, අකාලයේ කෙස් ගැලී යාමෙන් පෑදුණු තට්ට හිසකි. කෙසේවුවත් හිස්වැටෙට, දුඹුරු පැහැති හිසකෙස් ස්වල්පයක් ඉතිරි වී තිබිණි.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා වෙන්න ඇති කියල මම විශ්වාස කරනවා?" ඔහු ඇසුවේ මගේ මිත්‍රයා දෙස බලමිනි.

"ඔව්. ඔබ විට්බි හි තෝමස්. සී. පාකර් මහත්මයා විය යුතුයි. මේ මගේ හිතමිත්‍ර දොස්තර වොට්සන්. ඔය පුටුවේ වාඩිවෙන්න පාකර් මහත්මයා. ගිම්හාන සෘතුවේ ලන්ඩන් නගරයේ ඇති උණුසුම විඳදරාගන්න අමාරුයි."

ඔහුට අසුන්ගැනීමට ඉඩ සලසා මා ඉවත් වූ අසුනේ හිඳගෙන, පාකර් මහතා මඳවේලාවක් නිහඬව සිටියේය. ඔහු කථාව ඇරඹුවේ ඉන්පසුවය. "මගේ විදුලිපුවතින් සඳහන් කළ ප්‍රවෘත්තිය ඔබ කියෙව්වාද?"



http://sherlockholmesinvestigations.blogspot.com

සිනාමුසු මුහුණින් හිස ඉදිරියට සලමින් හෝම්ස් ඒ බව සනාථ කළේය.

"ඒක ලිව්වෙ මමයි" අමුත්තා කීය.

"ඒ බව මං දන්නවා" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"හැබෑට? කොහොමද ඔබ දැනගත්තේ?"

තම දෑත් දම්පැහැති පිටිකබායේ සාක්කුවල දමාගත් හෝම්ස් යළිත් සිනාසුණේය.

"ඔබේ දකුණු අතේ මහපටැඟිල්ලේ ඇතුළුපැත්තේ සහ දබරැඟිල්ලේ තිබෙනවා තද තීන්ත පැල්ලම් දෙකක්. ඊළඟට ඔබේ කබායේ ඉදිරිසාක්කුව විශාලෙට පිම්බී තියෙන්නේ, එහි ඇති සටහන් පොතක් නිසා බව සිතාගත හැකියි. මේ ආකාරයේ සටහන් පොත් පාවිච්චි කරන්නේ පුවත්පත් වාර්තාකාරයින්. ඔබේ පාවහන් වල විළුඹ කොටස ගෙවී ඇති ආකාරයෙන්, ඔබ නිතරම එහෙ මෙහෙ ඇවිදින කෙනෙක් බව කිවහැකියි. ලේඛන කලාවේ නියැළුණු කෙනෙක් මෙතරම් ක්‍රියාශීලිව තබන්න පුළුවන් එකම වෘත්තිය පුවත්පත් වාර්තාකරුවෙකුවීමයි.

එතකොට මට හිතුණා, මේ සිත්ඇදගන්නසුළු සිද්ධීන් පිළිබඳව විදුලිපුවත යොමුකළ නැනැත්තා ඔබ විය යුතු බව. කොහොම වුණත් මේ හැම දෙයක්ම නිරීක්ෂණ මගින් කළ සරල නිගමන. ඔබට ප්‍රශ්නයක් වී තිබෙන්නේ මොකක්ද කියල අපට කියන්න මහත්මයා. ඔබ අපේ දොරට තට්ටු කළේ, හිත බොහොම කැලැඹුණු කෙනෙක් දොරට තට්ටු කරන ශබ්දයෙන්."

තම කථාව අවසන් කළ හෝම්ස් හාන්සිපුටුවේ පිටුපසට හේත්තුවී දෙනෙත් අඩවන් කරගත්තේය. ඒ තුළින් අපේ අමුත්තා දෙස දිගටම බලාසිටි බැව් මම දැනසිටියෙමි. පාකර් මහතා මිනිත්තු කිහිපයක්ම මගේ මිතුරා දෙස බලාසිටියේ ඉමහත් පුදුමයකට පත්වය. කිසියම් අලුත් පුවතක් වෙත දැඩි අවධානයක් යොමු කරන වෘත්තීය බැල්ම මම ඔහුගේ මුහුණේ දුටුවෙමි.

"හෝම්ස් මහත්මයා, මං ආවෙ ඩේලිග්‍රාෆ් පුවත්පතේ කර්තෘ මණ්ඩලය වෙනුවෙන්. පෙරේද හැන්දෑවෙ විටබි වරායේ සිදුවුණු මේ අභිරහසට, විසඳීමක් ලබාදෙන්න කියලා ඔවුන් ඉල්ලා සිටිනවා. ඔබ නියම කරන ගාස්තුවක් ගෙවන්න ඔවුන් සූදානම්"

"මගේ ගාස්තුව ආදී දේවල්, අපි පසුව කථාකරමු." හෝම්ස් කීවේ ඒ ගැන තමාගේ උනන්දුවක් නොමැති බව හඟවමිනි. "මං



http://sherlockholmesinvestigations.blogspot.com

දැන් කැමැතියි මෙම සිද්ධිය ගැන ඔබේ වචන වලින්ම අසා දැනගන්න. ඒ මොකද සමහරවිට, මහජනයා අතර කැලඹීමක් ඇතිවේ යයි බියෙන් කර්තෘවරු පුවත් වාරණය කරනවා."

"හෝම්ස් මහත්මයා, මං ඔය පුවත්පතට එවා තිබූ විස්තරය සම්පූර්ණයෙන්ම නිවැරදියි. කතුවරයා ඒකෙන් කිසිම දෙයක් ඉවත්කරලා නැහැ. ඒ වුණත් පාඨකයන්ට ඒ තරම් වැදගත් නොවේවි කියල, මං නොලිව් සමහර කාරණා තියෙනවා. ඒවා බොහොම සුළු සුළු දේවල්"

"ඒ වුණත් මං කැමතියි ඒ හැම දෙයක්ම දැනගන්න" හෝම්ස් කීය.

"ඔව්. මං ඒවාත් ඔබට කියන්නම්. පැහැදිලි නැති තැනක් වෙනොත්, මාව නවත්වලා ප්‍රශ්න කරන්න."

"බොහොම ස්තුතියි"

"මහත්මයා, මං පුවත්පතේ සඳහන් කළ ආකාරයට, විට්බි වරායට ඉතාම නුදුරින් තියෙනවා, මහ විශාල ගල් පර්වතයක්. වරාය අසලදීම මුහුදු මට්ටමෙන් උඩට, එහි ඉතා කුඩා කොටසක් පෙනෙන්න තිබෙනවා. නමුත් එළියට නොපෙනී මුහුද පත්ලේ ඇති ප්‍රමාණය ඉතා විශාලයි. අනෙක එය සැතපුම් කිහිපයක් දුරටත් විහිදී තියෙනවා. මෙ ගැන නොදන්නා නැව් කපිතාන්වරු ඉදිරියට යාත්‍රා කිරීමෙදී, මේ පර්වතයේ ගැටී විනාශ වුණු නැව් ගණන අප්‍රමාණයි. මේ හේතුව නිසාම, රාජකීය නාවික හමුදාව, මේ ගල්පරයේ එක්තැනක ප්‍රදීපාගාරයක් ගොඩනංවලා තියෙනවා. ඔබට ඇත්තම කියන්න මහත්මයා, අපේ ටෙලිග්‍රාෆ් පුවත්පත පවත්වාගෙන යන්නෙ නැව් සමාගම්වල ආධාරයෙන්. ඒ කියන්නෙ ඔවුන් අපේ පුවත්පතේ, නිතිපතා පළකරන දැන්වීම් වලින්, අප ලබන ආදායමෙන්. ඉතින් පර්වතය උඩ ගොඩ නැංවූ පහනේ සාර්ථකත්වය, මේ නැව් සමාගම් වලට ඉතාම වැදගත්. මේ කටයුත්ත සාර්ථකව සිදුවෙනවාද බලල වාර්තාකරන්න කියලා, අපේ කර්තෘ මාව විට්බි වරාය වෙත යැව්වා. මේ රාජකාරිය මට පෙනුණේ මහ වෙහෙසකාරී, ඒ වගේම බලාගෙන ඉන්න කම්මැලි වැඩක් හැටියට. ඉතින් මා ඒකට ගියේ හිතේ ඒ හැටි උනන්දුවකින් නෙමෙයි. මං පර්වතය මුඳුනට නගිද්දී නමයි දෙව්මැඳුරේ ඔරලෝසුවේ 12 නාදවුණේ.


http://sherlockholmesinvestigations.blogspot.com

ඔන්න එතකොට තමයි කුණාටුව හමන්න පටන්ගත්තේ. හරියට බඩගිනි වුණු වෘකයින් රැළකගේ කෑගැහිල්ලක් වගේ ශබ්දයකින්. හෝම්ස් මහත්මයා. මගේ තාත්තා ප්‍රංශ - ප්‍රශියානු යුද්ධයේදී සටන්බිමට ගිය පුවත්පත් වාර්තාකාරයෙක්. ඔහුගෙන් මං හොඳට විස්තර අහල තියෙනවා. ඒ වුණත් පෙරේද, රෑ මුහුදු රැළ ඇවිත් වෙරළෙ හැපුණු වේගය, නැපෝලියන්ගෙ කාලතුවක්කුවල වෙඩි වර්ෂාවකට දෙවැනි වෙන්නෙ නෑ කියල මට කියන්න පුළුවනි. සෝදිසි පහන නියම විධියට සවිකරන්න සේවකයො හුඟාක් මහන්සිවුණා. මමත් ඔවුනට උදව් කළා. අන්තිමට වැඩේ සම්පූර්ණ කරල, පහනෙන් ප්‍රබල ආලෝක ධාරාවට අන්ධකාරයයි, වැස්සයි කපාගෙන යන්න හැකිවුණාම, අපි කවුරුත් සැනසුම සුසුම හෙළුවා."

මෙතැන් සිට පාකර් මහතා පුවත්පත් වාර්තාවේ සඳහන් කර තිබූ කරුණු ඒ අයුරින්ම විස්තර කළේය.

"නැවෙන් එළියට පැනල දිව්වා කියන සුනඛයා ගැන මොනවද ඔබට කියන්න පුළුවන්?" හෝම්ස් විමසුවේය.

"හෝම්ස් මහත්මයා. මට හිතෙන්නෙ ඌ නැවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකුගේ සුරතල් බල්ලා වෙන්න පුළුවනි"

"පාකර් මහත්මයා" හෝම්ස් කීය. "මං මගේ හිතවත් දොස්තර වොට්සන්ට නිතරම කියන දෙයක් තමයි, සෑහෙන තරම් නිරීක්ෂණ හෝඩුවාවන් නොමැතිව, නිගමනයකට ඒම වැරදි බව. ඔබ ප්‍රවාහණය කරන නැවකට ඉඩකඩ තියෙන එක හරියට වටිනවා. එහෙම තිබියදී නැවේ සේවකයෙකුට සුරතල් බල්ලෙකු ගෙනියන්න කපිතාන් ඉඩදුන්නා කියල හිතන්න අමාරුයි නේද?"

"රුසියන් ජාතිකයො මේ වගේ දේවල් දිහා බලන්නෙ මොන විධියකටද කියල, අපි දන්නේ නැහැනෙ හෝම්ස් මහත්මයා"

"වාර්තාවේ සඳහන් වෙන ආකාරයට" මම කීවෙමි. "නැවේ වෙනත් කිසිම කෙනෙක් හිටියෙ නැද්ද? ඔබ නැව සෝදිසි කර බැලුවාද?"

"ඔව්. නැවේ වෙන කිසිම කෙනෙක් හිටියේ නැහැ. ඉතිරිව තිබුණේ කපිතාන්ගේ මළසිරුර පමණයි!"



http://sherlockholmesinvestigations.blogspot.com

# 2

## ප්‍රහේලිකාවක්

"දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ!" මට කැගැසිණ.

අපගේ විසිත්ත කාමරයේ මිනිත්තු කිහිපයක් යනතුරු පැතිරගියේ දැඩි නිහඬතාවයකි. සැර දුම්කොළ කෝව්වට පුරවාගෙන, තම පයිප්පය දල්වා ගැනීමට, හෝම්ස් මඳ වෙලාවක් ගතකළේය. ඔහු සංවාදය යළිත් ඇරඹුවේ පයිප්පයෙන් දුම්ගුලි කිහිපයක් පිටකිරීමෙන් පසුවය.

"පාකර් මහත්මයා" හෝම්ස් කීය. "නැව වරායට ගසාගෙන ඇවිත්, වැලි ගොඩේ හිරවුණාට පස්සේ, මුලින්ම නැවට ගියේ කවුද?"

"ඒ වෙලාවේ රාජකාරි කළ වෙරළාරක්ෂක භටයා"

"ඔහු මළසිරුර සෝදිසිකරල බැලුවද?"

"ඔව්. ඔහු නැවට නැගුණාම මුලින්ම කළේ එයයි. නමුත් මළසිරුරට ළංවුණු වහාම ඔහු භීතියට පත්වී උස්හඬින් කෑගැසුවා"

"කෑගැසුවා? ඇයි ඒ?"

"මමත් ඒ ළඟටම ගිය විට යි දුටුවේ. කපිතාන්ගේ මුහුණ මනුෂ්‍යයෙකුගේ මුහුණ කියා හිතාගන්න අමාරුයි; ඒ තරමටම විරූපී වෙලා භයානක පෙනුමක් එහි තිබුණේ"

"ඒ මොන ආකාරයටද?"

"භයෙන් මහත්මයා, භයෙන්! මියයද්දී ඔහු පත්ව තිබූ භීතිය කපිතාන්ගේ මුහුණෙන් ප්‍රකාශවුණා. මිනීමස් කන සතුන් අපාලොවේ රජකළ අබදියෙන් පස්සේ, මනුස්සයෙකුගේ හිතේ කවදාවත් එහෙම භයක් ඇතිවෙන්න නැහැ"

"කාව්‍යමය වර්ණනා මට අවශ්‍ය වෙන්නේ නැහැ පාකර් මහත්මයා. මට මළසිරුරේ පෙනුම ගැන නිවැරදි සම්පූර්ණ විස්තරයක් කරන්න"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු මැදිවිය පසුකළ කෙනෙක්. ඔහුගේ මුහුණේ තළු පැහැති රැවුලක් තිබුණා. ඔහු හැඳ සිටියේ සාමාන්‍යයෙන් කුඩා වෙළඳ නැව් වල නාවිකයන් අඳින පිළිවෙළේ ඇඳුමක් - නිල් පැහැති ලෝම ජර්සියක්. එය මුහුදු දියෙන් පෙඟී තිබුණා. ඔහුගේ දැත් සුක්කානමට තබා කඹයකින් ගැටගසා තිබුණා. හරියට තදබල කුණාටුවකදී නැවක සිටින කෙනෙක්, තමා මුහුදට ගසාගෙන යාම වළක්වන්න සුක්කානමට ගැටගසාගන්නවා වගේ. කඹය ඔහුගේ මැණික්කටුවේ මස් හා ලේ නහර කපාගෙන ඇට දක්වා ගිහින් තිබුණා"

"වෙන මොනවද ඔබ දුටුවේ?"

"සුක්කානමට හිරවෙන සේ බැඳ තිබූ අත් වලට යටින් කුරුසියක් මා දුටුවා. වෙනත් වැදගත් දෙයක් දුටුවා නම් ඒ තුවාල පමණයි"

"තුවාල?" හෝම්ස් විමසුවේ අතිශය පුදුමයට පත් ආකාරයෙනි.

"ඔව්. උගුරේ - උගුරු දණ්ඩට දෙපසින් කුඩා තුවාල දෙකක් තිබුණා."

නළල රැලිකරගත් හෝම්ස්ගේ මුවෙන් මිනිත්තුවක් පමණ යනතුරු වචනයක් හෝ පිටනොවීය.

"පාකර් මහත්මයා. මට ඒ තුවාල ගැන දොනුම සම්පූර්ණයෙන්ම විස්තර කරන්න"

"තුවාල කිව්වට ඒවා ඉතා ලොකු තුවාල නෙමෙයි. බොහොම කුඩා සිදුරු කිව්ව හැකි"

"එකක් අනෙකට කොයිතරම් දුරකින්ද තිබුණේ?"

"අඟලක් පමණ දුරින්. එහි දරය තද තොළු වී රැලිවැටී තිබුණා"

"මේ බවක් ඔබේ පුවත්පත් වාර්තාවේ සඳහන් නොකළේ ඇයි?" මම ඇසීමි.

"දෙස්තර මහත්මයා. බලධරයන් මට නියෝග කළා ඒ ගැන, පුවත්පතේ සඳහන් නොකරන ලෙසට. ලොකු සුනඛයෙක් නැවෙන් එළියට පැන දිවූ බව මං කිව්ව නේ. ඌ දැන් සිටින්නේ නිදැල්ලේ. එහෙම ඉන්න බිහිසුණු සතෙකු නිසා මේ තුවාලය ඇතිවුණා කියල හිතන්න පුළුවනි. එවිට මහජනයා හයෙන් තැතිගනීවි කියල බලධරයන් හිතනවා. ඒ වුණත් මේ තුවාල දෙක මනුෂ්‍යයෙකුගේ මරණය සිදුවෙන්න තරම් විශාල ඒවා කියල මට නම් හිතෙන්නේ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"හිතවත් මහත්මයා" හෝම්ස් කීය. "සමහර සතුන් ඉන්නවා. උන් මිනිස් සිරුරේ ඇතිකරන තුවාල, සාමාන්‍ය මනුෂ්‍ය ඇසට නොපෙනෙන තරම් කුඩායි. ඒ වුණත් ඒවා වෙඩිඋණ්ඩ තරම් මාරාන්තිකයි" පැවසූ හෝම්ස්ගේ දෙනෙත් මා දෙසට හැරිණි.

"ඇයි වොට්සන් අපි අද උදෑසන කතා කර කර හිටියේ....... දොස්තර රොයිලොට් හා තිත්වැටුණු පටිය ගැන. නමුත් මෙතැනත් එහෙම දෙයක් කියා මා හිතුවේ නෑ. සතුටුදයකව යමක් නිරීක්ෂණය නොකර නිගමනවලට එන්න බෑ. අනුමාන කිරීම වලින් වෙන්නේ, තර්කානුකූලව නිගමනයකට එන්ට බාධාවක්. හොඳයි පාකර් මහත්මයා. වෛද්‍යවරයෙක් මළසිරුර පරීක්ෂා කර බැලූ බව ඔබේ වාර්තාවේ තියෙනවා..........?"

"ඔව්" පාකර් හිස සලමින් පිළිතුරු දුන්නේය. "වෛද්‍ය ජේ. එම්. කැම්බ්‍රන් මහත්මයා කළ සොයාගැනීම්, පුවත්පත් වාර්තාවේ සඳහන් අයුරුමයි"

"එතකොට නැවේ ප්‍රවාහණය කළ බඩු මොනවද?" හෝම්ස් ඇසීය.

"ශක්තිමත් ලෑලිවලින් තැනූ පෙට්ටි පනහක් තිබුණා. එකක් දිගින් අඩි 7 හා පළලින් අඩි 3ක්, උසින් අඩි 3ක් පමණ"

"සාමාන්‍ය පුද්ගලයෙකුගේ නිදන ඇඳක ප්‍රමාණය විතර?"

"ඔව් මහත්මයා, හරියටම ඒ ප්‍රමාණයමයි. අපි මේවා කිහිපයක් විවෘත කොට පරීක්ෂා කර බැලුවා. ඇතුළත පුරවා තිබුණේ සාමාන්‍ය පස්. එපමණයි"

"මොන වගේ පස්ද? තෙත් සහිත පස්? මැටි ගතිය ඇති පස්? විශේෂ වර්ණයක් ඇති ඛනිජමය පස්?" හෝම්ස් විමසුවේ උනන්දුවෙනි.

"පස්වල එහෙම විශේෂයක් තිබුණා කියලා කියන්න අමාරුයි. අගාවිපොළක හෝ අසාහොහනක වළක් හාරන කොට, එළියට එන පස්වලට සමානයි. කොහොම වුණත් ඒවායේ ඛනිජමය වටිනාකමක් ඇතිද කියන්න තරම් දැනුමක් මට නෑ. මේවා මොන අරමුණකින් එංගලන්තයට රැගෙන ආවාද කියන එකත් මට හිතාගන්න අමාරුයි"

"එතකොට සුනඛයා? නැවෙන් පිටවී ගියාට පස්සේ ඌට අත්වුණු ඉරණම ගැන ආරංචියක් නැද්ද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ මහත්මයා" පාකර් මහතා පිළිතුරු දුන්නේය. "මං හිතනවා ඒක, ඒ වෙලාවේ කාගේත් හිත්වල තිබූ භීතිය නිසා දුටු මායා - ජවනිකාවක් නොවේයි කියා. කොහොමවුණත් ඇත්තටම එහෙම බල්ලෙක් හිටියා කියල හිතමු. නැවේදී අත්විඳින්න වුණු කලබැගෑනිය නිසා බොහෝ විට ඌ හැංගිලා ඇති. ඌ ගැන කිසිම ආරංචියක් නැහැ. ඒකත් අද්භූත දෙයක් වෙන බවයි පෙනෙන්නේ"

පුටුවේ පිටුපසට හේත්තුවුණු හෝම්ස්, ඔහුගේ නිවී තිබූ පයිප්පය යළි දල්වා ගත්තේය. "බොහොම සිත් ඇදගන්නාසුලු ගැටලුවක් පාකර් මහත්මයා" හෝම්ස් කියද්දී, ඔහුගේ කම්මුල් රත්පැහැ ගැන්වී, දෙනෙත් දීප්තියෙන් බබළනු මම දුටුවෙමි.

"ඒ කියන්නේ ඔබ මේ ගැටලුව විසඳීම භාරගන්නවාද මහත්මයා?" තරුණ වාර්තාකරුවා ඇසුවේ නොඉවසිල්ලෙනි.

"බොහොම සතුටෙන් භාරගන්නවා" මගේ මිත්‍රයා කීය. "ඩේලි ග්‍රාෆ් පුවත්පතේ කර්තෘ මණ්ඩලයට දැනුම දෙන්න, ඔබේ කථාන්තරය මගේ සිතේ උද්යෝගයක් ඇතිකිරීමට සමත්වුණු බව. මේ ගැන සොයාබැලීම මං වහාම අරඹනවා. මේකට විසඳුමක් ලැබුණු වහාම, මං ඩේලි ග්‍රාෆ් පුවත්පතට දන්වා එවන්නම්. ඔබට සුභ දවසක් මහත්මයා"

මදක් පුදුමයෙන් මෙන් රහස්පරීක්ෂකයා දෙස බලා සිටි තරුණයා ඉන්පසු අපෙන් සමුගෙන පිටවී ගියේය.

"හොඳයි වොට්සන්" මගේ මිත්‍රයා විමසුවේ අමුත්තා පිටවී ගිය වහාමය. "ඔබට මොනවද මේ සිද්ධිය ගැන හිතෙන්නෙ?"

"මට මේක පැහැදිලිව වටහා ගන්න නම් අමාරුයි. කොහොම වුණත් මෙතැන මොකක් හරි නින්දා සහගත අපරාධයක් සිදුවුණු බවට සැක නෑ" මම කීවෙමි.

"ඔබේ අදහසට මාත් සම්පූර්ණයෙන්ම එකඟයි වොට්සන්" ඔහු කීය. "ඒ වුණත් මෙතැන තියෙනවා, මේ තරම් කාලයක් අප කළ පරීක්ෂණ වලදී දකින්න නොලැබුණු විධියේ, සුවිශේෂ සලකුණු කිහිපයක්. නැවේ කාර්යමණ්ඩලය අතුරුදන් වූ ආකාරය, කපිතාන්වරයාගේ අද්භූත මරණය, නැවේ සුනඛයෙක් සිටීම ආදී කරුණු වලින්, ඔබේ හිතට එන්නේ මොන වගේ අදහස්ද?"

නළල රැලි කර ගෙන මම ස්වල්ප වේලාවක් සිතා බැලුවෙමි. මෙහි අගක් මුලක් වටහාගැනීමට මට කිසිසේත් හැකියාවක් නොවීය.



http://sherlockholmesinvestigations.blogspot.com

"මෙතැන තියෙන කාරණා කිහිපයක් මට සිහිකරන්නේ, ඩෙවොන්ෂයරයේ ශ්‍රීමත් හෙන්රි බැස්කර්විල්ගේ පවුලට තිබූ ශාපය සිද්ධියේදී අපට දකින්න ලැබුණු කරුණු සමහරක්........."

"ඔව්. ඔබේ ඒ අදහසෙන් යම් ගතයුත්තක් තිබෙනවා" හෝම්ස් කීය. "මියගොස් සිටි පුද්ගලයාගේ මුහුණේ දකින්නට ලැබුණු භීතියේ සලකුණු, නැවෙන් පැනගිය විශාල සුනඛයා ආදිය. නමුත් කපිතාන්වරයාගේ උගුරේ දක්නට ලැබුණු කුඩා තුවාල දෙක ගැන ඔබට මොනවද හිතෙන්නේ?"

"කාරණා දෙකක් නිසා ඒය වෙන්න පුළුවනි." මම කීවෙමි. "එකක් සර්පයකු දෂ්ට කිරීමෙන්............"

හෝම්ස් හිස සෙලවූයේ මගේ අදහසට එකඟ නොවන බව හඟවමිනි. "........... මං ඒ වෙලාවේ සර්පයා ගැන සඳහන් කළේ, පාකර් මහත්මයා මුලින් කී දේ වැරදි බව පෙන්වා දෙන්නයි. නමුත් සර්පයකු දෂ්ට කළ තැනක, දරය රවුමට කඩතොළු සහිත වූ සිදුරක් දකින්න ලැබෙන්නෙ නෑ වොට්සන්"

"........... එහෙම නැත්නම් විෂ පෙවූ ඊතලයක් වැදීමෙන් ඇති වූ සිදුරක්?"

"ඔබ අදහස් කරන්නේ ජොනතන් ස්මෝල් සම්බන්ධ සිද්ධියේදී අප දුටු, විෂ ඊතල පිඹීමට සමත් වූ වනචාරියාගේ ක්‍රියාවට සමාන එකක්ද? එයත් යම්කිසි වැදගත් කමක් ඇති සැසඳීමක්. නමුත් එවැන්නක් වෙන්න විධියක් නෑ. ඒ මොකද මෙතැන සිදුරු එකක් නොවෙයි, දෙකක් තිබුණා. විෂ උලක් පිම්බා නම් එකක් සෑහෙනවා. දෙකක් උවමනා නෑ. නැහැ වොට්සන්. මෙකෙ විසඳුම තියෙන්නේ වෙනත් පැත්තක."

"ඒ කියන්නෙ?"

"හෙට උදේ නවයට මෙහි ඇවිත් මං හමුවෙන්න පුළුවන් නම්, මං ඔබට ඒ ගැන තොරතුරු කියන්නම්. ඊළඟ පැය විසිහතර, මගේ මේ හාන්සිපුටුවට වෙලා කල්පනා කරන්න මං බලාපොරොත්තුවෙනවා. ඒ ගැටලුවට විසඳුම හොයමින්, මං මගේ මොළය ඇතුළ මුළු ස්නායු පද්ධතියම ව්‍යායාමයට භාජනය කරනවා. උත්තේජන ලෙස අවශ්‍ය වෙන්නේ කෝපි සහ පයිප්ප දුම්කොළ පමණයි. එහෙනම් ඔබට ආයුබෝවන් මිත්‍රයා"

"හෝම්ස්. මම යන ගමන් බයඩිලිලාගේ සාප්පුවෙන් ඔබට දුම්කොළ අවුන්ස අටක් එවන්න කියලා ඇණවුමක් දීලා යන්නද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ස්තුතියි වොට්සන්. ඒක උවමනා වෙන්නෙ නැහැ. මං ළඟ තියෙනවා ප්‍රමාණෙටත් තරම් දුම්කොළ. ඒවට බිරිඳ මතක් කළ බව කියන්න"

මා සමග වැඩිදුර කතාබහ නොකොට, මා එතැනින් පිටකර යැවීමට, හෝම්ස්ට උවමනා වූ බව මම තේරුම් ගත්තෙමි. එහෙත් මම එයින් අමනාපයට පත්නොවුණෙමි. ඉතා සංකීර්ණ ගැටලුවක් විසඳීමට අවශ්‍ය වූ විට, ඔහු අනුගමනය කළේ මෙවැනි ප්‍රතිපත්තියකි. අවුරුදු ගණනාවක් තිස්සේ ඔහුගේ මෙම සිරිත්විරිත් හොඳින් දැනසිටි නිසා, මම එයින් කෝප නොවුණෙමි. ගැටලුව ආරම්භයේදීම භාවනාවේ යෙදෙන ඉන්දියානු තාපසයෙකු මෙන්, එකදිගට පැය ගණනාවක් නිහඬව කල්පනාකිරීම ඔහුගේ පිළිවෙත විය. දත්ත හා තොරතුරු එක් රැස්කර ඇති පොත් විමර්ෂණය කරමින්, ඔහු කාලය ගතකරන අයුරු මට රහසක් නොවිය. එබැවින් ඔහු නියම කළ ආකාරයට ගෙදර ගොස් පසුවද උදේ නවයට බේකර් වීදියේ නිවහනට පැමිණියෙමි.

මගේ මිත්‍රයා ඔහුට සුපුරුදු ආන්සිතුටුවේ වැතිර සිටියේය. ඔහුගේ උඩුකය වටා වූ පයිප්ප දුම කොතරම් ඝනව පැවැතියේද යත්, ඔහු නිතර හඳින දම්පැහැති පිටකබාය පෙනාවන්නට, මට ඔහු හඳුනාගැනීම අපහසුවන්නට ඉඩ තිබිණ. හෝම්ස්ගේ දෙපා අවට බිම, පොත් හා පුවත්පත් වලින් ගැලෑවී ගිය පිටු විසිරී තිබිණ. මීට අමතරව පයිප්පයෙන් ඉවත් කළ අළු, දුවී ඉහිරී වූ රොඩු හා ගිනිකූරු කාමරය පුරා විසිරී තිබෙනු දුටුවෙමි.

"හෝම්ස්. මුළු උඩුමහල් තලයම විෂ සහිත දුමාරය නිසා කටුක තැනක් බවට පත්වෙලා." මගේ මුවෙන් පිටවිණි. ඔහු සමග මා තවදුරටත් හවුලේ ලැගුම් නොගත් නිසා, එවැනි විවේචන කිරීමට මට අයිතියක් නොවීය. නමුත් ඒ බව මට සිහිවුණේ, මා කලින් කී වැකිය, මගේ කටෙන් පිටවුවාට පසු පසුවයි.

"ඔබ කියන දේ හරි වොට්සන්. මං ජීවත්වෙන පිළිවෙළ හඩ්සන් මහත්මියටත් දැන් හොඳට හුරුපුරුදුයි. ඒ වුණත් පරීක්ෂණයක යෙදිලා මං දවසක ආපහු එද්දී, ඇය මගේ බඩුබාහිරාදිය පාරට විසිකරලා, දොර අගුළු දමලා තියන්නත් ඉඩ තියෙනවා. එහෙම කළත් මට බෑ ඇයට දෙස් පවරන්න"

පයිප්පය ඉවතට දැමූ ඔහු, මගේ මුහුණ දෙස දැඩි උනන්දුවකින් බලාසිටියේය. "වොට්සන් ඔබ අද වෙනදාට වඩා හුගක් උදෙන් අවදිවෙලා බවයි මට පෙනෙන්නෙ......"



http://sherlockholmesinvestigations.blogspot.com

"...... ඔව්. මට උදේ පාන්දරින්ම රෝගියෙකු බලන්න යන්න සිදුවුණා. ඒ වුණත් කොහොමද ඔබ ඒක......?"

"මා ඔබේ සිරිත් විරිත් ගැන හොඳින් දන්නවා නේ මිත්‍රයා" ඔහු කීවේ හඬ නගා සිනාසෙමිනි. "බාහිර පෙනුම, ඇඳුම් පැළඳුම්, ඒවායේ වර්ණ ගැළපීම ගැන ඔබ දක්වන්නේ ලොකු සැලකිල්ලක්. නමුත් ඔබේ සපත්තුවලට ඇතුළතින් ඔබ අද පැළැඳ තියෙන මේස් දෙක වර්ණ දෙකක බව මං ඔබට කිව්වොත්......? ලැජ්ජාවෙන්න දෙයක් නෑ වොට්සන්. උදේ පාන්දරම පහන් දල්වලා, ඔබ ඔබේ බිරිඳගේ නින්දට බාධා කරන්න කැමැතිවුණේ නෑ. කළුවරේම හැඳ පැළඳගෙන, කළුවරේම අතපත ගාලා මේස් දෙකක් හොයාගෙන ඒකත් සපත්තුත් දමාගත්තා. ඔබ රෝගියෙකු බලන්න ගියේ ඒ විධියට. ඒ නිසා ඔබේ එක මේස්කකුලක් තද නිල්; අනෙක අළුපාට. ඇය අවදිවෙලා හිටියා නම්, ඔබට මේ විධියට ගෙදරින් පිටවෙන්න ඇය ඉඩදෙන්නේ නෑ. මං නිවැරැදිද?"

"හරියට හරි" මම කීවෙමි. "දැන් මට ඒක බොහොම සරල දෙයක් වගේ පෙනෙනවා, ඔබ පැහැදිලි කළ පසු. නමුත් ඔබ තේරුම් කරන තුරු......"

"...... හිතාගන්න අමාරුයි. එහෙමනේද වොට්සන්. මං දන්නවා, ඔබ හිතනවා ඇති, ඔබ නැති අතරේ අපේ ගැටලුවේ මං කොයිතරමක් ඉදිරියට ගිහින්ද කියලා?"

"ඔව්"

"අපේ තරුණ පුවත්පත් වාර්තාකරුවා ලබාදුන් තොරතුරු පිළිබඳව මම තවදුරටත් විමර්ශණය කරල බැලුවා. ඔබට පෙනෙනවා ඇති මෙතැන බිම විසිරී ඇති නාවික ගමනාගමනය පිළිබඳ සඟරා හා පොත්පත්. එංගලන්තය අවට දේශගුණික හා කාලගුණික විපර්යාස, කුණාටු හා සුළිසුළං ගැන පොත්. මේ නැම එකකින්ම මං තේරුම් ගත්ත එක දෙයක් තියෙනවා. එද විට්බි වරායට ඩෙමිටර් රුවල් නැව කල්ල කරගෙන ආව කුණාටුව, සාගර කාලගුණ විද්‍යාවේ බොහොම කලාතුරකින් අහන්න ලැබෙන එකක්; කිසිමදක නොඇසූ එකක් කිව්වොත් වඩාත් නිවැරැදියි."

"මොකක්ද ඒකෙන් ඔප්පුවෙන්නෙ?"

"යමක් හරියටම ඔප්පු වෙනවා කියල මට කියන්න බෑ" හෝම්ස් කීය. "ඒ මොකද සුළඟේ වේගය හෝ දිශාව තමාට කැමැති පරිදි



http://sherlockholmesinvestigations.blogspot.com

වෙනස් කිරීම මානුෂික බලවේගයකුට කරන්න බැරි දෙයක්. අන්න ඒ නිසාම, එහි සිත් ඇදගන්නාසුලු ගතියක් මට පෙනෙනවා."

"මොකක්ද ඔබට එයින් ගතහැකි නිගමනය?" මා ඇසුවේ ඉදිරිපස අසුනේ වාඩිවී සුරුට්ටුවක් දල්වා ගනිමිනි.

"මෙ පරීක්ෂණය අපේ අවධානය යොමුකිරීමට තරම් අභිරහස් එකක් බවයි මං නිගමනය කළේ. ඒකට කලින් කියන්න වොට්සන්, මොනවද ඔබ තේරුම් අරගෙන තියෙන්නෙ?"

"මට මොකුත් හිතාගන්න බැරි තරමට මේක සංකීර්ණ වැඩියි"

"සංකීර්ණ වැඩියි? ඇයි වොට්සන් නැවේ කාර්යමණ්ඩලය අතුරුදන්වුණු ආකාරය? ඔබට පුළුවන් ඉව්වී ඒ ගැනවත් අදහසක් ඉදිරිපත් කරන්න?"

"මට හිතෙනවා බාගදවෙලාවට නැවේ කැරැල්ලක් ඇතිවුණාද දන්නෙ නැහැ කියල. කපිතාන්ට එරෙහිව කැරලි ගැසීමක්?" මම කීවෙමි.

තමාට එයට එකඟවිය නොහැකි බව හඟවමින් හෝම්ස් හිස සොලොව්වේය. "එහෙම දෙයක් කළා නම් ඇයි ඔවුන් නැව අත් ඇරල ගියේ? නැවක කැරැල්ලක් ඇතිවුණාම, හැමවිටම වගේ මුලින්ම නැවෙන් පිටවෙන්න වෙන්නෙ, නැවේ කපිතාන්ට. හොඳට සිහිකල්පනාව තියෙන කිසිම මිනිහෙක්, හොඳට ගමන් කළ හැකි නැවක් අත්හැර දමලා මුහුදට පනීවිද? නැවේ කාර්ය මණ්ඩලය අතුරුදන් වූ හැටි තේරුම් කළ හැකි එකම විසඳීමයි තියෙන්නේ. ඒ තමයි, ඒ හැමදෙනෙක්ම නැවෙන් පිටවෙද්දී මළමිනී!"

හෝම්ස් කියූ දෙයින් මගේ ඇඟ සීතලවී ගියේය. "හෝම්ස්. ඔබ කියන්නෙ නැවේ කපිතාන්වරයා ඔහුගේ කාර්යමණ්ඩලය එකා බැගින් ඝාතනය කරලා මුහුදට දැම්මා කියලද?"

"ඒකත් විය හැකියි" මගේ මිත්‍රයා කීය. "නමුත් එහෙම දෙයක් වෙන්න තියෙන්නෙ ඉතාම සුළු ඉඩකඩක්. දසදහසකින් එක් අවස්ථාවක්. හොඳයි එහෙම නම් කපිතාන් අන්තිමේදී අර විදියට මියගියේ ඇයි?"

"කුණාටුවෙන් මුහුදට වැටීමෙන් වළකින්න ඔහු තමාව සුක්කානමට තියලා ගැටගසා ගත්තා." මම කීවෙමි. "තමන් කළ අපරාධයේ බරපතලකම වැටහෙද්දී, ඔහුගේ හිතේ ඇතිවූ කම්පනය හා කලකිරීම නිසා, ඔහුට හෘදයාබාධයක් හැදෙන්න ඇති?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණේ ඔහුගේ මුහුණෙන් පළවුණු භීතිය, ඒකෙන් පැහැදිලි වෙන්නෙ නැහැ නේද? නැහැ වොට්සන් නැහැ. කාර්ය මණ්ඩලයේ මරණයට හේතුවුණේ කුමක්ද? කපිතාන්ගේ මරණයට හේතුවුණෙත් එයමයි. ඔහු දුටුවා එය ඔහු වෙත ළඟාවෙන හැටි. තමන්ට අත්වෙන ඉරණම ඔහු තේරුම් ගත්තා. කඹයෙන් දැන් ගැටගසා ගත්තේ තමා මුණින්. පසුව ඒ බන්ධන වලින් ගැළවෙන්න දරුණු විධියට දඟළුවා. ඒයින් තමා සමහර මාංශපේශී අස්ථි දක්වාම කැපී ගියේ. මේ නෞකාවේ යම්කිසි අද්භූත දෙයක් තිබුණා වොට්සන්. ඒක මොකක්ද කියල අපි හරියටම දන්නෙ නෑ. නමුත් ඒක දුටු හැම කෙනෙක්ම අකාලයේ මරණයට පත්වුණා, නැත්නම් පිස්සු හැදුණා. ඒක මොකක්ද කියල හෙළිකරගැනීම අපිට භාරයි."

"එතකොට අර පුදුමාකාර සුනඛයා ගැන සහ කපිතාන්ගේ උගුරේ තිබූ තුවාල ගැන මොනවද ඔබට කියන්න පුළුවන්?"

මගේ පැනයට පිළිතුරු දීමට පෙර, ඔහු වැතිරී සිටි හාන්සි පුටුවෙන් එක්වරම නැගිට්ටේය. ඔහුගේ සිතට මෙන්ම කයට ද ජීවය ගෙන ආ මෙවැනි අවස්ථා ගැන, මම මීට පෙර ද සඳහන් කර ඇත්තෙමි. හෝම්ස්ගේ දෙනෙත් දිලිසුණේ මුවහත් පිහිතලයක තියුණු වාගේ දරය විලසිනි.

"වොට්සන්, අන්න ඒ අභිරහස තමයි විට්බි නගරය වෙත ගිහින් අපට විසඳන්න තියෙන්නෙ. ඒ ඉතින් ඔබේ චිකිත්සාගාරයේ රෝගීන්, දින කිහිපයක් යනතුරු වෙනත් වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ගන්න කැමැති නම්" කී ඔහු, පිටකබාය ඉවතට දමා ගමනට සූදානම් විය.

"මේ සැරේ ඔබ කියන්නත් කලින් මං ඒකට සූදානම් වෙලා ආවෙ හෝම්ස්" මම කීවෙමි. "මගේ රෝගීන් හැම දෙනෙක්ම, මගේ අසල්වාසී වෛද්‍යවරයා වෙත යවන්න කටයුතු කළා. දැන් මට තියෙන්නෙ දින කිහිපයකට මම ගෙදර එන්නෙ නැහැ කියලා, ලියුම් කැබැල්ලකින් මගේ බිරිඳට දැනුම්දෙන එක පමණයි"

"එහෙම නම් ඒ ලියුම වහාම ලියන්න වොට්සන්. මට සහතික වෙන්න පුළුවන්, ඔබේ අපරාධ පරීක්ෂණ කථා පෙළට අලුත් කථාවක් එකතුකර ගැනීමට හැකිවෙන බවට.... සමහර විට ඔබ ඒක නම් කරාවි මාරක නෞකාවේ වික්‍රමය කියලා" කී හෝම්ස් කුලිරියක් කැඳවීමට වීථියට පිවිසියේය.



http://sherlockholmesinvestigations.blogspot.com

3

## ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ අරඹයි.

පැයක් පමණ ගතවෙද්දී අපි පළමුවැනි පංතියේ මැදිරියකට වී දුම්රියෙන් විට්බි වෙත ගමන් කරමින් සිටියෙමු. මෙම පරීක්ෂණය ගැන වැඩිදුර කතාබහකට හෝම්ස් අල්ලා ගැනීමට මම උත්සාහ කළෙමි. නමුත් හැමවිටකම ඒ මාතෘකාව මග හරිමින් ඔහු කතාබහ වෙනත් අතකට යොමුකළේය. සංගීත ප්‍රසංග ගැනත්, දුරකතනයක් තිබීමේ වාසි අවාසි ගැනත්, හෝම්ස් දිගින් දිගටම කරුණු ගෙනහැර පෑවේය. අදාළ මාතෘකාව ගැන ඔහු අමක් කීවේ දුම්රිය විට්බි නගරය වෙත ළඟාවෙද්දීය.

"මං අද උදේ පාකර්ට විදුලිපුවතක් යැව්වා. අපි උදේ හයට ලන්ඩනයෙන් පිටත්වෙන දුම්රියෙන් එන බව, මං ඔහුට දැන්නුවා. ඒ හින්ද ඔහු දුම්රියපොළට ඇවිත් හිටියොත් මං පුදුම වෙන්නෙ නෑ." හෝම්ස් කීවේ දුම්රිය වේදිකාවට බස්නා වෙද්දීය.

"...... අර ඉන්නේ අපේ තරුණ මිත්‍රයා"

අප දුම්රියෙන් බසිද්දී ඉදිරියට ආ ආචාර්යපත්කලාවෙදියා මම දුටුවෙමි. ඒ අසලම වයස්ගත මහත්මයෙක් ද විය. හිස හා හිස්වැස්ම අතරින් දිගට ඇදුණු පැසුණු කොණ්ඩයක් තිබූ ඔහු, රන්වන් රාමුවක් සහිත උපැස් යුගලක් පැළැඳ සිටියේය.

"වැඩකටයුතු සඳහා–මං කාර්යාලයෙන් පිටත ගිහිල්ලයි හිටියේ. අහම්බෙ ආවාමයි මට ඔබේ විදුලිපුවත බලන්න ලැබුණේ. මං බයේ හිටියෙ දුම්රිය එන වෙලාවට දුම්රියපොළට ළඟාවෙන්න බැරිවේවි කියල" පාකර් මහතා කීවේ අපට අතට අත දෙමිනි.

"එහෙනම් දුම්රිය පමාවුණේ කාගේත් හොඳවෙලාවට" කී හෝම්ස් වයස්ගත මහතා දෙසට හැරුණේය. "සුභ දවසක් කැමින් දෙස්තර මහත්මයා. ඔබව හමුවෙන්න ලැබීම සතුටක්" කියා තම සුරත දිගු කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

මේ අනපේක්ෂිත ආභිෂයනය හා හඳුනාගැනීම ගැන වයස්ගත පුද්ගලයාගේ මුහුණෙන් පළවූයේ මවිතයයි. මිළඟට ඔහු තම කළු කබායේ පහළට නෙත් යොමු කරද්දී මුහුණට සිනාවක් නැගිණ.

"එක් මොහොතකට මට හිතුණේ ඔබ නම් පුදුමාකාර පුද්ගලයෙක් කියල. දනුයි මං දුටුවේ ලොවුන් පරීක්ෂා කරන හලාව. ඒක මගේ කබා සාක්කුවෙන් එළියට මතුවී ඇති සැටි ඔබ දකින්න ඇති. කොහොම වුණත් ඔබ හමුවෙන්න ලැබීම සන්තෝෂයක්, මහත්මයා"

"මේ අද්භූත ප්‍රහේලිකාව විසඳාගැනීමට, හැරිත් දෙස්තර මහත්මයත් උනන්දුවක් දක්වනවා" පාකර් කීය. "කපිතාන්ගේ සැඩිරුමේ ඔහු දුටු විස්තර ඔබටත් ප්‍රයෝජනවත් වේවි කියල මට හිතුණා"

"ඔහුට ලබාදියහැකි ඕනෑම තොරතුරක් මට හුගක් ප්‍රයෝජනවත් වෙන බව සහතිකයි" හෝම්ස් කීය.

දුම්රියවේදිකාවේ කෙළවර, රෝද හතරේ ලොකු අශ්ව කරත්තයක් නවත්වා තිබිණ. අපගේ ගමන්මලු එයට ගෙන ගොස් දැමීමට, පාකර් සේවකයෙකුට නියම කළේය. මිනිත්තු පහකට පසු අපි අශ්වකරත්තයෙන් විට්බි නගරයේ වීථි හරහා ගමන් කළෙමු. මුහුද දෙසින් හමා ආ සුළඟේ රැඳී තිබුමේණ් මාළුවල පිළිගඳය.

"දීර්ඝ ගමනකින් පස්සේ ඔබට මහන්සි ඇති. ඔබතුමන්ලා ටිකක් විශ්වේකගන්න. ඊට පස්සේ මං ඔබව ඩෙමීටර් නෞකාවට කැඳවාගෙන යන්නම්" පාකර් පැවසීය.

"විවේක ගැනීමක් කරන්න කලින් මේ අභිරහස් නැව නරඹල හිටින්න අපි කැමැතියි." හෝම්ස් කීය.

"මට හිතුණා ඔබ එහෙම කියාවි කියල" සිනාසෙමින් කී පාකර්, අශ්වකරත්තය වෙට්හිල් දියකඩනය දෙසට පැදවීමට රියැදුරාට නියම කළේය.

"හැරිත් මහත්මයා" හෝම්ස් කීය. "මේ අවාසනාවන්ත නාවිකයාගේ මරණයට හේතුව, කුමක් කියලාද ඔබ අදහස් කරන්නේ?"

"මේක බොහොම පැටලිලි සහගත පුදුමාකාර සිද්ධියක්"

"හැබැට? ඇයි ඔබ එහෙම කියන්නේ?"

"මට හිතෙනම ඔට්ටුවක් අල්ලන්න පුළුවනි, මේ මිනිහාගෙ මරණයට හේතුව ශරීරයෙන් ඉවතට ලේ ගලා යාම බව. මරණය


http://sherlockholmesinvestigations.blogspot.com

සිදුවුණේ සිරුරේ ලේ නොමැතිකමෙන්. නමුත් එහෙම වෙන්න හේතුවක් හෝ ඒක වුණේ මේ පිළිවෙළටය කියන්න මට හැකියාවක් නෑ."

"එතකොට මොකක්ද මේ ප්‍රහේලිකාව?"

"ඔහුගේ උගුරේ තිබූ කුඩා සිදුරු දෙකක් වැනි තුවාල දෙක හැරෙන්න, ශරීරයේ කිසිම තුවාලයක් නැහැ. අනෙක් අතට මේ කුඩා තුවාල දෙකෙන්, මේ තරම් ලේ ප්‍රමාණයක් ශරීරයෙන් ඉවතට ගලා ගියා කියල හිතන්නත් අමාරුයි" කැෆින් කීය.

කරුණු මෙසේ හෙළිවෙද්දී, මම වචනයෙන් විස්තර කළ නොහැකි ආකාරයේ භීතියකට මෙන්ම මවිතයකට පත්වූයෙමි. කෙසේ වෙතත් මගේ මිතුරා සුන්සුන්ව සිටියේය.

"මගේ අවධානය යොමු කළ යුතු යයි ඔබ සිතන, තවත් මොනවා හරි දෙයක් තියෙනවාද මහත්මයා?" හෝම්ස් ඇසීය.

දෙස්තර කැෆින් තම උපැස් යුගල ඉවත්කළේ වෙවුලන දෑතිනි. මිළඟට ඔහු මුහුණ හෝම්ස් දෙසට හරවා වෙවුලන ස්වරයෙන් කථාකළේය.

"හෝම්ස් මහත්මයා, එහෙම ඉවතට ගලාගිය ලේ එක බිඳුවක්වත්, නැවේ කොහැනකවත් මට දකින්න ලැබුණේ නැහැ!"

අශ්වකරත්තය තුළ සිටි අප හතරදෙනා අතර පැතිර ගියේ දැඩි නිහඬතාවයකි. හෝම්ස්ගේ මුහුණේ දකින්නට ලැබුණු බැල්මෙන් මම ඉමහත් කැළඹීමට පත්වූයෙමි. ජීවිත කාලයක් පුරා තමා අනුගමනය කළ සිද්ධාන්ත සුනුවිසුනු වී ගිය අයෙකුගේ පෙනුමක් හෝම්ස් වෙතින් දිස්විය. අන්තිමේදී ඔහු කථාකළේ බිඳුණු හඬකිනි.

"මං ඔබෙන් සමාව අයදිනවා පාකර් මහත්මයා. මෙපමණ වේලාවක් මං හිතාගෙන හිටියේ ඔබ ගෙනා මේ ගැටලුව ඉතාම සුළු එකක් කියලයි. නමුත් ඉදිරියට මට එහෙම හිතෙන්නෙ නෑ"

අප විට්බි වරාය වෙත ළඟාවෙද්දී, මුහුදෙන් නැඟුණු මීදුමෙන් මුළු පරිසරයම වැසීගොස් තිබිණි. දියකඩනයේ එක් කෙළවරක වැලිබොරලු මතට නැඟ තිබූ ඩෙමිටර් නම් වූ රුවල් නැව අපි දුටුවෙමු. එය මීදුමෙන් යම් තරමකට ආවරණය වුවත් රුවල් සියල්ල ඉරීගොස් තිබුණු අයුරු දැකගත හැකි විය. එහි තිබුණේ සිතේ චකිතයක් ඇතිකරවන අප්‍රසන්න පෙනුමකි. භූතයින් විසින් පාලනය කරන ලද හොල්මන් නෞකාවක්, මළවුන්ගේ ලෝකයේ වරායක නැංගුරම් ලා ඇති අයුරක් මගේ සිතේ මැවිණ.



http://sherlockholmesinvestigations.blogspot.com

අප අශ්වකරත්තයෙන් බැසීමත් සමඟම, හැඩිදැඩි වෙරළාරක්ෂක නිලධාරියෙක් අප වෙතට පැමිණියේය. මහජනයාට මෙම ස්ථානයේ ගැවසීම තහනම් බැව් ඔහු දැනුම් දුන්නේය. එහෙත් ෂර්ලොක් හෝම්ස් යන නම ඇසෙද්දී ඔහුගේ සැරපරුෂ බව ඉවත්වෙන අයුරු අපට පෙනිණ. ඉක්බිති නැව වෙත යාමට ඔහු අවසර දුන්නේය.

"ඒ ගැන අපි ස්තුති කරන්න ඕන දෙස්තර් වොට්සන්ට" මගේ මිත්‍රයා කීය. "ජනප්‍රියවීමෙත් ලොකු වාසියක් තියෙනවා. එහෙම නොවෙන්න, අල්ලසක් නොගෙවා අපට මෙතැනින් ඇතුළුවෙන්න ලැබෙන්නේ නෑ"

හමා ආ සුළඟත් සමඟ ඒ මේ අත අත්තට ඇදුණු කුඹගස් වලින් නැගුණේ ශෝකජනක හෙඬිරියකි. මේ නෞකාව මට සිහි කළේ මුහුද පත්ලෙන් ගොඩට පැමිණ අතරමංවී සිටි අද්භූත සත්ත්වයෙකි. පසුගිය පැය හතළිස් අට තුළ නැවේ දක්නට ලැබුණු සිදුවීම ගැන වූ හැකිය, මගේ දෙම්නස් බව තවත් වැඩි කළේය.

"මේ තමයි මහත්වරුනි ඩෙමිටර් නෞකාව" පාකර් පැවසුවේ රාජකීය නැටුම් උළෙලකදී සුප්‍රකට නළඟනක් හඳුන්වා දෙන තරම් ආඩම්බරයකිනි.

එයට යම්කිසි ප්‍රතිචාරයක් දැක්වුණේ හෝම්ස් වෙතින් පමණි. "ආ. ඔව්" හෝම්ස් කීය. "මේ තියෙන්නේ සිරිලික් හෝඩියේ අකුරු වලින් නම සටහන් වෙලා." නම කාවය අතට ගත් මගේ මිත්‍රයා ජලයට නොබැස ඔහුට යා හැකි තරම් දුර නැව් බඳ පරීක්ෂා කරමින් ගමන් කළේය. ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ පවත්වන ආකාරය ගැන වැටහීමක් නොතිබූ පාකර් හා හැරිත් දෙදෙනා ඒ දෙස බලාසිටියේ විස්මයට පත්වය. අන්තිමේදී හෝම්ස් අප සිටි තැනට ආවේ බලාපොරොත්තු කඩවූ මුහුණකිනි.

"නැවෙන් ප්‍රවාහණ බඩු හැටියට ගෙන ආ හැම දෙයක්ම ඉවත්කරගෙන ගිහින්. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"බඩු ගෙනියන අශ්වකරත්ත වගයක් අරගෙන ඒ කටයුත්තට අද උදේ මිනිස්සු ඇවිත් තිබුණා. ඔවුන් ඉදිරිපත් කළ ලියකියවිලි නිවැරදි බව පෙනුණාම, පස් පටවා තිබූ පෙට්ටි පනහ ගෙනියන්න අවසර දුන්නාලු. ඔබ කොහොමද..........?"

"මෝඩයෝ!" හෝම්ස්ට කෑගැසිණ. "අභිරහස් විසඳීමේ කටයුතු එහේලා මට භාරදෙනවා. ඊළඟට හෝඩුවාවන් කිසිවක් බලාගන්න



http://sherlockholmesinvestigations.blogspot.com

බැරිවෙන විධියට, මිනිසුන්ට ඒ ඔහු ගමන්කර, ඒවා මකාදමන්න ඉඩහරිනවා. ගැටලු විසඳීමට ප්‍රයෝජනයට ගතහැකි එකම සාක්ෂියත් ඔවුනට අරගෙන යන්න ඉඩදීලා. පාකර් මහත්මයා. ඔබේ පෙනී ඉන්නේ මොන පැත්ත වෙනුවෙන්ද?"

එක්වරම එයට පිළිතුරක් දීගත නොහැකිව පාකර් මහතා ගොතගසන අයුරු මම දුටුවෙමි. මේ අතර නැවට යාම සඳහා, ජැටියේ සිට නැව්තට්ටුව වෙතට ලෑලි ආලම සකසන ලදී.

"යමු වොට්සන්. ගිහින් බලමු අපි දෙන්නට පුළුවන් වේවිද කියල මොකක් හරි හෝඩුවාවක් හොයාගන්න"

නැව්තට්ටුව මත තිබුණේ වඩාත් ශෝකාකුල මුස්පේන්තු පෙනුමකි. ලෑලි මතට අඩිය තබන සෑම වාරයක් පාසාම අසන්නට ලැබුණේ, ඇඟ හිරිවට්ටන ආකාරයේ ශබ්ද ය. මැරුම් කෑ නැවියන්ගේ හොල්මන් තවමත් නැව තුළ රැඳී ඇත්දැයි, මගේ සිතේ බියමුසු චංචල බවක් ඇතිකළේය. මුහුදෙන් ගලා ආ මීදුම නැව පුරා විසිරගියේ, එතැන පරිසරය තවත් බියකරු බවට හරවමිනි. නැවේ කපිතාන්වරයා ඔහුගේ ලියවිල්ලේ අන්තිම වචන කිහිපය ලියා, එය බෝතලය තුළට දමා, තම දෑත් සුක්කානමට බැඳගත් අවස්ථාවේත් තිබෙන්නට ඇත්තේ, මෙවැනිම ශෝකාකුල බියකරු පරිසරයක් වන්නට ඇතැයි මට සිතිණ. කෙසේ වෙතත් මගේ මිත්‍රයාට පරීක්ෂණ කටයුතු ඇරඹූ විගසම සෙසු ලෝකය අමතක වේ. එබැවින් මගේ සිතේ ඇතිවූ හැඟීම් මටම තබාගෙන, ඔහුගේ කටයුතු නිශ්ශබ්දව බලාසිටියෙමි.

නැව්තට්ටුව දෙස දෙනෙත් යොමුකරගෙන, එහි එක් කෙළවරක සිට අනෙක් කෙළවරට හෝම්ස් දෙවරක්ම ඇවිද්දේය. මීළඟට නැව්තට්ටුව අයිනේ ආරක්ෂාවට තිබූ පිත්තල වැට, කාචයේ ආධාරයෙන් පරීක්ෂා කළේය. වරෙක් ඔහුගේ මුවෙන් නිකුත්වූ ශබ්දයක් මම හඳුනාගතිමි. ඒ, යමක් සොයාගැනීමට හැකිවීම නිසා සිතේ ඇතිවූ සතුට පළකරන හඬකි. අන්තිමට ඔහු තම අවධානය යොමුකළේ, සුක්කානමට හා ඒ අසල එල්ලී තිබූ කඹ කැබලි වෙතය. එද උදයේත් මෙම ස්ථානයේ තිබූ කපිතාන්ගේ මළසිරුර ගැන පාකර් පැවසූ දෙය සිහිවූ විට, මගේ ඇඟ වෙව්ලා ගියේය. හෝම්ස් තම කාචය ආධාරයෙන් සුක්කානම, කඹ කැබලි හා ඒ අවට සෑම දෙයක් පරීක්ෂා කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"අපි වාසනාවන්තයි වොට්සන්" ඔහු කීවේ පරීක්ෂාව නවත්වා කාචය සාක්කුවේ දමාගනිමිනි. "වටිනාම සාක්ෂිය වන ලී පෙට්ටි ගෙනියන්න ඉඩදුන්නු මෝඩයින්, හොඳ වෙලාවට අර කඹය නොලිහා, ගැට තිබූ තැන් වලින් කපා දමලා"

"ඒ කියන්නේ නිගමනයකට ඒමට ඔබට හැකිවුණාද?"

"එක් කාරණාවක් නිවැරදි බව තහවුරු වුණා. මොකක්ද...... සුක්කානම රෝදයට දැත් ගැටගසාගෙන තිබුණේ කපිතාන් විසින්මයි කියලා, පාකර් මහත්මයා කිව දේ නිවැරදියි. කඹ කෙළවරවල තිබූ පළුදුවීම, මා කාචයෙන් බැලුවා. ඒවා මිනිස් දත් වලින් ඇතිවූ ලකුණු. ඒවා නිසැකවම තමන් ගැටදමා ගනිද්දී ඇතිවූ ඒවා. නමුත් මේ අපරාධයට වගකිව යුතු පුද්ගලයින් හඳුනාගැනීමට ඒකෙන් ලැබෙන ප්‍රයෝජනයක් නෑ."

"නැව් තට්ටුව පරීක්ෂාවෙන් මොනවද හෝම්ස් ඔබට දකගන්න ලැබුණේ?"

"වැදගත් දෙයක් සොයාගන්න බැරිවුණා. තේක්ක ලෑල්ල මත පා සටහන් කිසිවක් නැහැ. නමුත් ආරක්ෂක වැටෙන් නම් යම් හෝඩුවාවන් ලැබුණා කියන්න පුළුවන්"

"ඒ මොනවද?"

"ලේ සලකුණු කිහිපයක් මට දකින්න ලැබුණා වොට්සන්" හෝම්ස් කීය. "අපේ මිත්‍ර වෛද්‍යවරයා කිව්වා නේද, නැවේ ලේ සලකුණු කිසිවක් තිබුණේ නැහැ කියලා. නමුත් මට ලේ තිබූ තැන් තුනක් හමුවුණා. ඒ, නාවිකයන්ගේ සිරුරු වැටට උඩින් මුහුදට දමද්දී ඇතිවුණු ඒවා."

හෝම්ස්ට ලැබී ඇති සාක්ෂි වලින් තහවුරු වන්නේ මේ නැවේ මනුෂ්‍ය ඝාතන සිදුවී ඇතිබවයි. එය අසද්දී මගේ සිතේ ඇතිවූයේ පිළිකුලකි. "ඔවුන්ගෙන් හැමදෙනෙක්ම මරාදම්මා කියල ඔබට හොඳටම විශ්වාසයි එහෙනම්?" මම ඇසීමි.

"මගේ හිතවත් මිත්‍රයා, ඒ කාරණය ගැන මගේ හිතේ කොයි වෙලාවකවත් සැකයක් තිබුණේ නැහැ. නමුත් මේවා ගැන විස්තර සහිතව කථාකිරීම, අපි හෝටලයට යනතෙක් කල්දමු. එහෙනම් වොට්සන් ඔබ ගිහින් පාකර් සහ කැෆින් මහත්වරු සමග එකතුවෙන්න. මං මේ ඉඩිමගාදිගේ නැවේ ගබඩාකාමර පැත්තටත් ගිහිං, ඉක්මනට එන්නම්. ඔබ ගිහින් ඔවුන් සමග කථා



http://sherlockholmesinvestigations.blogspot.com

නොගොලොත් ඔවුන් නිහැඬි, ඩෙමිටර් නැවෙ නැවියන්ට අත්වුණු ඉරණම අපි දෙන්නාටත් අත්වෙලා කියල, නැවිතට්ටුවෙන් ජැටියට ගොඩබහින ලෑලි පාලම ඉවත්කරන්න එපා කියන්න"

මම ඔහුට යමක් කීමට සූදානම් වුණෙමි. එහෙත් ඒ වනවිටත් හෝම්ස් ලී තරප්පු පෙළ දිගේ, නැවේ අන්ධකාර ගබඩාව වෙත යෑමට පිටත්ව අවසන්ය.

තවත් පැය භාගයක් ගතවෙද්දී, පාකර් අපට නවාතැන් ගැනීමට සූදානම් කළ හෝටලයට පැමිණියෙමු. හෝම්ස් මා සමග කතාබහ ඇරඹුවේ, අපේ කාමරය තුළ වයින් ස්වල්පයක් රසවිඳින අතරතුරය.

"ඩෙමිටර් නැවේ මිනීමැරුම් කළ පුද්ගලයා කවුද කියල අපි තවම දන්නෙ නෑ" හෝම්ස් කීය. "ඔහු කවුරු වුණත් ඔහුට උවමනා වුණේ නැවේ හැමදෙනෙකුම ඝාතනය කරන්න. ඒ මොකද මේ මුහුදු ගමනේදී, තමන්ට දකින්න ලැබුණු දෙය එක් නාවිකයෙකුගේ හෝ කටින් පිටවුණොත්, ඒක මේ අපරාධකාරයාට ලොකු අවාසියක් වෙනවා. පළමුවැනි පුද්ගලයා අපරාධකාරයා අතින් මැරුම්කෑවාම, ඔහුට සිදුවුණා නැවේ හැමදෙනෙකුටම ඒ ඉරණම අත්කරවන්න."

"ඒ වුණත් කවුද ඔය අපරාධකාරයා?" මම ඇසීමි. "ඉතින් ඇයි ඔහු පළමුවැනි නාවිකයාව මරාදැම්මේ?"

හෝටලයේ ජනේලය පිටතින් අසන්නට ලැබුණේ වරායේ ඝෝෂා, මීදුම් නළාව හඬවන ආකාරයයි. එය මට යළි යළිත් සිහිකළේ අප සිටි තැනට යාර සියගණනක් දුරින් නවතා තිබූ මරණයේ නෞකාවය.

හෝම්ස්ගේ මුහුණෙන් ද පිළිබිඹු වූයේ ප්‍රීතිමත් ස්වභාවයක් නොවේ. "මේ වෙලාවෙ නම් ඔබේ බලාපොරොත්තු කඩකරන්න වෙනවා වොට්සන්" ඔහු පැවසුවේ වයින් වීදුරුව දෙසම නෙත් යොමුකරගෙනය.

"ඔබේ පළමුවැනි ප්‍රශ්නය - කවුද අපරාධකාරයා කියන එකට පිළිතුරක් තවමත් මා ළඟ නෑ. දෙවැනි ප්‍රශ්නය - ඇයි මෙහෙම කළේ කියන එකට නම් එක්තරා අන්දමක උපකල්පනයක් මා සතුව තිබෙනවා. නමුත් ඒක ඒ තරම්ම ශක්තිමත් එකක් නොවෙයි. ඒ හින්දා ඒක ප්‍රකාශයට පත්කරන්න මං කැමැති නැහැ. නමුත් මං විශ්වාසයෙන් මේ ඒක කියන්නම්. අපට උවමනා කරන


http://sherlockholmesinvestigations.blogspot.com

අපරාධකාරයා, පුදුමාකාර ශරීරශක්තියක් ඇති පුද්ගලයෙක්. යුරෝපයේ අංක එකට ඉන්න මල්ලවපොර ශූරයා ඉදිරිපත් වුණෙත්, ශක්තියෙන් ඔහුව පරාජය කිරීම මේ අපරාධකාරයාට සුළු වැඩක්"

"කොහොමද ඔබ එහෙම නිගමනයකට ආවෙ?"

"ඔබ දුටුවා නැවෙ ආරක්ෂක වැට. එහෙම නේද වොට්සන්? ඒක අඩි තුනක් උසයි. සම්පූර්ණයෙන්ම වැඩුණු ශක්තිමත් නාවිකයකුගේ මළසිරුර, මේ වැටට උඩින් ඔසවලා මුහුදට දැමීම පහසු වැඩක් කියලා ඔබ හිතනවාද?"

"ඒ වුණත් හෝම්ස්, අප්‍රාණික මළසිරුරක් වැටක් උඩින් මුහුදට පෙරලා, තල්ලුකර දැමීම ඒ තරම්ම අපහසු කටයුත්තක් වෙන්න බෑ. එහෙම නේද?" මම ඇසීමි.

"නාවිකයන්ගෙන් එක්කෙනෙක්වත් ඔබ කියන විධියට වැට උඩට පෙරලා, ඒකෙන් මුහුදට තල්ලුකර දැමුවෙ නෑ. හැමකෙනෙකුම උඩින් විසිකළා" හෝම්ස් කීය.

"මොනවා හෝම්ස්?"

"වැට ළඟින්ම නැව් තට්ටුව මත අඩියටහන් කිසිවක් තිබුණෙ නෑ." ඔහු කීය. "ආරක්ෂක වැටේට කිසිදු තැනක ලේ තැවරිලා තිබුණෙත් නෑ, වොට්සන්. මේ අපරාධකාරයාට පුළුවනි අඩුම ගණනේ රාත්තල් දෙසීයක බරක් තමාගේ හිසට උඩින් ඔසවලා ඉවතට විසිකරන්න"

"දෙයියෝ සාක්කි!" මට කෑගැසිණ.

"ඔබ කියන දේ ඇත්ත නම්, අපට කටයුතු කරන්න වෙලා තියෙන්නෙ, මනුෂ්‍යයෙක් එක්ක නෙමෙයි, තිරිසනෙක් එක්ක"

"හරියට හරි" ඔහුගේ කටහඬේ ශබ්දය අඩුවිය. "වොට්සන් ඔබ කිව්වා වගේ ඔහු තිරිසනෙක්. නැත්නම් තිරිසනෙකුටත් අන්තයි"

ඔහු එය කියද්දී හෝම්ස්ගේ මුහුණේ තිබූ බැරෑරුම් පෙනුම කොතරම් වූයේ ද යත්, මගේ මීළඟ ප්‍රශ්නය ඔහු වෙත ඉදිරිපත් කිරීමට මට ශක්තියක් නොවීය.

"එතකොට අර බල්ලා?"

එයට පිළිතුරු දීමට මගේ මිතුරා සූදානම් වූවා පමණි. එවිටම අපේ කාමරයේ දොරට තට්ටුකරන හඬක් ඇසිණ.

"ඇතුළට එන්න" හෝම්ස් කීය.

ඒ තෝමස් පාකර්ය. එහෙත් ඒ අප දෙදෙනා මෙතෙක් දුටු තෝමස් පාකර් නොවේ. ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලි වී



http://sherlockholmesinvestigations.blogspot.com

නිවුණේ මළමිනියක ස්වරූපය ගනිමිනි. හිස්වැස්ම අල්ලා ගෙන සිටි ඔහුගේ අතේ, ඇඟිලි වෙවුලන අයුරු මම දුටුවෙමි. මට සිතුණේ මොහු හදිසියේ යම්කිසි රෝගයකට ගොදුරු වී ඇත කියායි. කාමරය තුළට පා තැබුවත් ඔහු විසිටි ගියේ ක්ලාන්තවීමට ආසන්න පුද්ගලයෙකු ලෙසය. මගේ වෛද්‍ය ප්‍රතිකාර මල්ල පාකර් විටියේ හෝම්ස්ගේ කාමරයේ දමා ඒම, කොතරම් මෝඩකමක්ද යන්න ක්ෂණිකවම මගේ සිතට නැගිණ.

"මගේ හිතවත් මිත්‍රයා. මේ මොකද?" ඇසූ හෝම්ස්, එක් නිමේෂයකින් පුටුවෙන් ඉහළට පැන, තරුණයා සැපපහසු පුටුවකට වත්තම් කළේය. "වොට්සන්! වහාම වයින් වීදුරුවක් දෙන්න! මොකක්ද මහත්මයා ප්‍රශ්නෙ?"

මා වයින් වීදුරුවක් ඔහු වෙත පිළිගැන්වූවත් එය අනවශ්‍ය බවට පාකර් සංඥා කළේය.

"ටික වෙලාවක් යද්දි මේක ඇඳිල යාවි" ඔහු කීය. "දිගින් දිගටම මට මුහුණදෙන්න වෙලා තියෙන සිදුවීම මට දරාගන්න අමාරුයි. පෙරේද රෑ තිස්සෙස් වරාගේ මුහුණදෙන්න වුණු සිදුවීම වලට අමතරව දැන් එන ඒවා"

"ඉතින් මොනවද අපෙන් කෙරෙන්න ඕනා?"

හෝම්ස් විමසුවේ යළිත් තම ඉඩුගේ සිඳගෙන පයිප්පය අතට ගනිමිනි.

"මට දෙන්න තියෙන පිළිතුරෙන් ඔබ සන්තෝෂ වේවි කියලා මං හිතන්නේ නෑ" පාකර් පවසද්දී ඔහුගේ සුදුමැලි බව යම්තරමකට අඩුවී තිබිණ. "මං මේ ආවෙ ඔබේ පරීක්ෂණය සම්පූර්ණයෙන්ම අත්හැරදමන්න කියන්නයි."

අපි විමතියට පත්ව පුවත්පත් වාර්තාකරුවා දෙස බලා සිටියෙමු. දල්වා ගත් ගිනිකූර පයිප්පයේ කෝව මත නොතබාම, හෝම්ස් බලාසිටියේ නිගැස්සුණු ඇසුරෙනි.

තත්පර කිහිපයකට පසු හෝම්ස්ගෙන් ප්‍රශ්නයක් එල්ලවූයේ තරුණයා වෙතය. "හැබෑට? මං මේ පරීක්ෂණයේ යෙදෙන විධිය ඒ තරම් අසතුටුදායක බව මං දැනගෙන හිටියෙ නැහැනෙ?"

"මෙතැන තියෙන්නේ එහෙම ප්‍රශ්නයක් නොවෙයි මහත්මයා" පාකර් කීය. "මේ අභිරහස විසඳුණා"

"විසඳුණා?" දෙබැම ඉහළ නංවාගත් හෝම්ස් විමසුවේ පුදුමයෙනි. "මේක විසඳාගත්තේ කොහොමද කියල දැනගන්න මමත් කැමතියි"



http://sherlockholmesinvestigations.blogspot.com

"කපිතාන්වරයාගේ සාක්කුවෙන් ලැබුණු බෝතලයේ තිබී හමුවුණු සටහන් ඔබට මතක ඇති" පාකර් කීය. "අගෝස්තු 3 වැනිදට ඔහු ලියූ සටහනෙන්ම පෙනෙනවා නේද, මේකට වගකිවයුත්තා කවුද කියල? මෙට ඔහුගේ දෙවැනියා වන සහකාර කපිතාන් වියරුවැටීමෙන් කළ අපරාධ බව කපිතාන් සඳහන් කරනවා"

"නමුත් කපිතාන්ගේ මරණය?"

"එය සිදුවෙනකොටත් ඔහු පැය විසිහතරකට වැඩි කාලයක් දැන් සුක්කානමේ ගැටගසාගෙන හිටියේ" පාකර් පැවසීය. "කුණාටුවට මුහුණ දෙන්න වෙහෙස මහන්සිවුණා මදිවාට, ඔහුට කන්න ආහාරවත්, බොන්න වතුරවත් ලැබුණේ නෑ. ඔහුගේ මරණයට හේතුවෙන්න ඇත්තේ එයයි"

"ඇයි ඔබට මෙහෙම දෙයක් මුලින් හිතාගන්න බැරිවුණේ?" හෝම්ස් ඇසීය. "හොඳයි කමක් නෑ. දොස්තර කැෆින් පැහැදිලිවම කිව්වා, කපිතාන්ගේ ශරීරයේ ලේ ඉතා විශාල ප්‍රමාණයක් ඉවත්වී ගොස් ඇතිබව. ඒකට හේතුව මොකක් කියලද ඔබ හිතන්නේ?"

"මෙම ප්‍රශ්නයට දියහැකි පිළිතුරක් එක්වරම නොතිබූ නිසාදෝ පාකර් මහතා ලැජ්ජාවට පත්වූ බවක් පෙනිණ.

"වෛද්‍ය කැෆින් දක්ෂ ශල්‍යවෛද්‍යවරයෙක් බව ඇත්තයි" පාකර් කීවේ මදක් පැකිළෙමිනි. "ඒ වුණත් ඔහු හුගක් වයස්ගත, පැරණි තාලේ වෛද්‍යවරයෙක්. මං හිතන්නේ මේ කපිතාන් දීර්ඝ කාලයක් අයහපත් තත්ත්වයන් යටතේ මුහුදුගමන් වල යෙදීම නිසා, ඔහුගේ රක්තහීනතාවයක් - ලේ අඩුකමක් තියෙන්න ඇති. මේ තත්ත්වය තමයි කැෆින්ට වරදින්න ඇත්තේ, සිරුරෙන් ලේ ඉවත්වීම කියලා. කපිතාන්ට දිගින් දිගටම කෑම නොලැබී ගියා. කාලගුණයේ වෙනස්කම් වලට මුහුණ දුන්නා. ඒ නිසාම ඔහු සිහිවිකල් වීමට පත්වුණා. එයින් පසු හෘදයාබාධයක් සෑදීමෙන් තමා ඔහු මියයන්න ඇත්තේ"

"පාකර් මහත්මයා. හැම ප්‍රශ්නයකටම ඔබට තියෙනවා පිළිතුරක්" හෝම්ස් කීය. "එහෙම නම් ඔබට කියන්න පුළුවන් වේවි, කපිතන්ගේ උගුරේ, අර සිදුරු දෙකක් හැදුණේ කොහොමද කියන එකත්?"

"ඇයි අර යෝධ බල්ලා? උම ගැනත් අපට අමතක කරන්න බෑ" මම කීවෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම හරි වොට්සන්" හෝම්ස් මගේ අදහසට එකඟ විය.

"බල්ලා නම අයත්වෙන්න ඇත්තේ මේ නැවේ කාර්ය මණ්ඩලයේ නාවිකයෙකුට" පැවසූ පාකර්ට ඉහින් කනින් ඩහදිය දැමීමට පටන්ගෙන තිබිණි. "බෙල්ලේ සිදුරු නම්...... සමහරවිට යවුල බාද්දී බෙල්ලේ වුණු කැපීම් දෙකක් විමටත් ඉඩ තියෙනවා......... නමුත් ඒවා මොනවද කියල හරියටම කියන්න මට අපහසුයි"

"මහත්මයා" හෝම්ස් කීවේ නැඹ අනුමෙනත් හැගිට්මිනි. "ඔබේ නිගමන නම් ඉතාම අඥාන ඒවා. එපමණකින් නොවෙයි. මරණය සමග ජීවත්වෙමින් පුවත්පත් වාර්තාකරණයේ යෙදෙන අවංක පත්‍රකලාවේදීනට ඔබ මහා නින්දාවක්. ඔබට ශුභ දවසක්" කී හෝම්ස් කාමරයේ දොර විවෘත කළේය.

මෙම සාකච්ඡාව පියවරෙන් පියවර ඉදිරියට යද්දී, තෝමස් පාකර්ගේ මුහුණ සුදුමැලි වූ ආකාරය, මම බලාසිටියෙමි. හෝම්ස්ගේ අවසන් වචන සමූහය නිකුත් වූ කෝපය මුසු ස්වරය නිසා, තරුණයා කාමරයෙන් එළියට පැන දිව්වේ, මිටින් හළ කුරුල්ලෙකු ලෙසිනි. ශබ්ද නගා දොර වසාගෙන ගිය ඔහු විථියේ දිව යන අඩි ශබ්දය අපට ඇසිණ.

අපරාධයක් සිදුවුණු තැනක පරීක්ෂණයකට බාධා කරමින්, ඔහු මැදට ආව හැටි එක අතකින් පුදුමයි" මගේ මිත්‍රයා කීවේ සිනාමුසු මුහුණෙනි. "මීට පස්සේ ඔහොම දේකට මැදිහත් වෙන්න කලින් ඔහු දෙවරක් කල්පනා කරාවි"

"මොකක් කරන්නද ඔහු මේ සූදානම් වෙන්නේ? මට නම් හිතාගන්න අමාරුයි" මම කීවෙමි.

"මිනිහා දැන් උත්සාහ කරන්නේ කාරණය වහල දමන්න" හෝම්ස් කීවේ තම පයිප්පය දල්වා ගනිමිනි.

"එහෙම දෙයක් කරන්න ඔහු උත්සාහ දරන්නෙ ඇයි?"

"තෝමස් පාකර් කාමරයට ඇතුළු වෙද්දී ඔහුගේ පෙනුම ඔබ දුටුවා නේද වොට්සන්? ඔහු දැන් අතිශයින්ම භීතියට පත්වුණු කෙනෙක්. කාගෙ හරි තරවටු කිරීම හෝ මරණීය තර්ජන ඔහුට එල්ල වෙලා ඇති බවට සැක නෑ. කාට හරි උවමනා වෙලා තිබෙනවා මේ සිද්ධිය යටපත් කරන්න, වසා දමන්න. ඒක පැහැදිලියි"



http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම දෙයක් කරන්න උවමනා වෙලා තියෙන්නේ කාටද?" මම ඇසීමි.

"ඒ ගැන සැකයකින් තොරව තමුන් හිතාගන්න අමාරුයි. නමුත් මට හැඟෙනවා මේක පාර්ලිමේන්තුව ඇත්තෙන් කළ බලපෑමක් කියලා. අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයේ කවුරුහරි මේ පිටිපස ඉන්නවා කියලයි මට හිතෙන්නේ"

"ඇයි අගමැතිතුමා........."

"මේ මෑත කාලයේ බ්‍රිතාන්‍යයත් රුසියාවත් අතර දේශපාලනමය අර්බුදයක් ඇතිවෙලයි තියෙන්නේ. මේ උග්‍ර ප්‍රශ්න හමුවේ රුසියන් නැවක් අපේ වරායකට කඩාවැදිලා. ඔවුන් මොකක්ද මේ කරන්න හදන්නේ? විපක්ෂ නායකවරයා මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී ඇදල ගන්නවාට සැක නෑ. මෙතැන තියෙන අභිරහස මොකක්ද කියලා ඔහු ප්‍රශ්න කරන්න ගත්තාම, තැමඟකක්ම අවුල්ජාල බවට පත්වේවි. ඒ නිසා රජය මේ වෙලාවේ උත්සාහ කරන්නේ මේ ප්‍රශ්නය ගැන උදාසීන පිළිවෙතක් අනුගමනය කරන්න"

"එහෙම තත්ත්වයක් උද්ගතවීම ගැන ඔබ පුදුමයට පත්වෙන්නෙ නැද්ද හෝම්ස්?"

"යම්කිසි ක්‍රියාවලියක් ඇරඹී ඇති බව මට වැටහුණා. ඩෙමිටර් නැවේ ලී පෙට්ටි, පැය කිහිපයක් ඇතුළත ඉවතට ප්‍රවාහණය කිරීම බලන්න. මං එවෙලේ ඒ ගැන යමක් කිව්වා ඔබට මතක ඇති. අර පැනදිව්වා කියන සුනඛයාගේ පාසටහන් පරීක්ෂා කිරීමට මට තිබුණු අවස්ථාව අහිමිවුණා. ඊළඟට මේ සිද්ධියට අදාළ වැදගත්ම සාක්ෂි ලබාගැනීමට තිබුණු ලී පෙට්ටි පරීක්ෂා කිරීමත් මට අහිමිවුණා. ආණ්ඩුවේ කවුරුහරි මේ ප්‍රශ්නයට බලපෑමක් කරන බව මට සහතිකයි. එහෙම නොවෙන්න බලධාරයන් මේ විධියට කටයුතු කරන්න පෙළඹෙන්නේ නෑ. මට ඔබෙන් සමාව ඉල්ලන්න සිදුවෙනවා වොට්සන්"

"ඒ මොකටද?"

"විසඳීමට නොහැකි අභිරහසකට, ඔබ පටලවා ගැනීම ගැන"

"හෝම්ස්. මේක විසඳීමට නොහැකි අභිරහසක් කියලා ඔබ කියන්නේ ඇයි?"

"අපේ ඉදිරි ගමන් මග අවහිර කරන, දැවැන්ත ප්‍රාකාරයක් දැනටමත් ඉදිවෙලා අවසන්. ඒ බව ඔබට පෙනෙන්නේ නැද්ද



http://sherlockholmesinvestigations.blogspot.com

මිත්‍රයා? බාගවෙලාවට අපි ලන්ඩන් බලා ආපහු යන ගමනේදී ඒක ඔබට පැහැදිලි කර දෙන්න මට හැකිවේවි.

ඔබ දන්නේ නැහැ නේද වොට්සන්, මං මෑතකදී සම්බන්ධවුණු ගැටලුවක් ගැන? කෙන්සිංටන්හි අර්නස්ටයින් හැරුතර්ස් ආර්යාව සම්බන්ධව? ඒකෙදී අපට අහන්න ලැබුණා ගුප්ත විද්‍යාඥයෙකුගේ මාර්ගයෙන් ඇයට, ඇගේ මියගිය සැමියාගෙන් ලැබුණු පුදුමාකාර පණිවුඩ කිහිපයක් ගැන. ඔබට ඔබේ පාඨකයන් වෙනුවෙන් ලියන්න හැකි වේවි "අතීතයේ අවතාරයේ වික්‍රමය" කියල කථාවක්.

ඩෙමිටර් නෞකාවේ අභිරහසට සම්බන්ධවී, එයට ඇතිවූ අවහිරතා ගැන, ෂර්ලොක් හෝම්ස්ගේ සිතේ දැඩි අප්‍රසාදයක් මෙන්ම කලකිරීමක් ඇතිවී තිබිණ. කෙසේ වෙතත් අපට ඉදිරියේදී මුහුණදීමට සිදුවන ඉරණම ගැන මා දැනසිටියේ නම්, ඔහුගේ ආකල්පය මීට වඩා වෙනස් එකක් වීමට ඉඩ තිබිණ.



http://sherlockholmesinvestigations.blogspot.com

# 4

## හැම්ස්ටෙඩ්හි භීෂණය

අගෝස්තු මාසයේ ඉතිරි දින කිහිපයේත්, සැප්තැම්බර් මුල සතියේත්, ෂර්ලොක් හෝම්ස් හමුවීමට යාමට මට ඉඩක් නොලැබිණ. එහෙත් පුවත්පත්වල, ඔහු යෙදුණු රහස්පරීක්ෂණ කටයුතු පිළිබඳ තොරතුරු පළවී තිබිණ.

කොවෙන්ට්‍රි හි ශ්‍රීමත් ඔලිවර් විර්ත් බෙන්ටන් ඝාතනය එවැනි සිද්ධියකි. සති කිහිපයක් පුවත්පත්වල මුල් පිටුවේ පළවූ වැදගත්ම ආරංචිය වූයේ මෙයයි. මෙම ඝාතනය ගැන සැකය එල්ල වී තිබුණේ වර්ත් බෙන්ටන් ආර්යාව වෙතය. ඒ අනුව ඇය සිරභාරයට ගැනිණ. එහෙත් මගේ මිත්‍ර හෝම්ස් පරීක්ෂණය භාරගෙන, එම අපරාධය සිදුකළ පුද්ගලයා, බෙන්ටන් පවුලේ උද්‍යාන සේවකයා බව පෙන්වා දුන්නේය. එල්ලුම් ගසට නියමවීමට සිටි වර්ත් බෙන්ටන් ආර්යාව නිදහස ලැබුවාය. මෙම අභිරහස ඉතා විශිෂ්ට අයුරින් විසඳීම නිසා, මහජනතාවගෙන් ෂර්ලොක් හෝම්ස් වෙත ලැබුණේ ඉමහත් ප්‍රසාදයකි. එය ඔවුන් අතර කොතරම් කතාබහට ලක්වුවාද යත්, වීථියක එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ගමන් ගනිද්දී, මහජන කතාබහේදී හෝම්ස් යන නාමය සඳහන් වෙනු කිහිපවරක් අසන්නට ලැබිණ.

ග්‍රීෂ්ම සෘතුවේ නිවාඩුව සඳහා පිට පළාත්වලට ගිය ලන්ඩන් නාගරවාසීන් ආපසු ආවේ ද නොයෙක් සුළු සුළු ආබාධ සහිතවය. විවිධ කෘමීන් විසින් කළ දෂ්ට කිරීම්, සෙම්ප්‍රතිශ්‍යා ආදිය සෑහෙන තරම් දක්නට ලැබිණ. ඒවාට ඉනකඩවා ප්‍රතිකාර කිරීමට සිදුවීම නිසා, මට ද මගේ ශල්‍යාගාරයෙන් ඉවත යා හැකි ක්‍රමයක් නොවීය. මගේ අවධානය සම්පූර්ණයෙන්ම යොමුවී තිබුණේ, ඖෂධ නියමකිරීම හා රෝග විනිශ්චය වෙතය. එද සැප්තැම්බර් 27 වැනිද දැඩි වෙහෙසට පත්ව, නින්දට යාම සඳහා යහනේ වැතිරුණෙමි. එහෙත් මගේ බිරිඳ ඉක්මනින් මා අවදිකළාය.



http://sherlockholmesinvestigations.blogspot.com

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා ඇවිත්. පහළ තට්ටුවේ ඔහු ඉන්නවා ඔයා හම්බවෙන්න" ඇය කීවාය.

ඔහු මගේ උඳුන ඉදිරිපස ඉහළ පහළ සක්මන් කරමින් සිටියේය. දල්වා ගත් පයිප්පය වරින්වර උරමින්, හිස පහතට නමාගෙන මෙසේ ඇවිදින්නේ කුමන අවස්ථාවක ද යන්න, මම හොඳින් දැන සිටියෙමි. ඒ ඔහුට විසඳීම සඳහා සංකීර්ණ ගැටලුවක් යොමු වී, එහි අගමුල සකසා ගැනීමට නොහැකි වූ විටය. දිගු ගමනක යෙදීමට සූදානමෙන්, ඔහු ගමන්කබාය ආදියෙන් සැරසී සිටියේය. ඒ අනුව වැඩසටහනේ මීළඟ පියවර ගමනක් බැව් මට සිතාගත හැකිවිණි.

"මේ වෙලාවේ ඔබ නින්දෙන් අවදිකුරන්න සිදුවීම ගැන මට කණගාටුයි වොට්සන්" ඔහු කීය. ඔහුගේ දීප්තිමත් දෙනෙතින් හා රත් පැහැති කම්මුල් වලින් මට එක් කරුණක් වැටහිණි. එනම් මගේ මිත්‍රයා යළිත් වරක් සිත් ඇද ගන්නා පරීක්ෂණයක් අරඹා ඇති බවයි.

"දොස්තර මහත්මයා දින කිහිපයකට කැඳවා ගෙන යන්න මට අවශ්‍ය වී තිබෙනවා. වොට්සන් මහත්මියගෙන් එයට විරුද්ධත්වයක් නැද්ද? නැහැ? ඔබට ස්තුතියි. යම්කිසි සිද්ධියක් වී තිබෙනවා. එයට වොට්සන්ගේ උදව් මට අවශ්‍යමයි. ඔබට මා සමග ඒමට හැකි නම්..........?"

මම මගේ බිරිඳ දෙස බැලුවෙමි. පසුගිය දින කිහිපයම මා ගතකළේ රෝගීනට ප්‍රතිකාර කිරීම සඳහා මහන්සිවෙමිනි. දිනපතාම ඇය සමග ගතකිරීමට මට තිබුණේ සුළු කාලයකි. එසේ තිබියදී මගේ මිත්‍රයා සමග දින කිහිපයක ගවේෂණ චාරිකාවක යෙදීමට අවසර ඉල්ලීම කොතරම් සාධාරණද? මා දකින්නට බලාපොරොත්තු වූයේ ඇගේ මුහුණේ අමනාප හැඟීමය. එහෙත් එවැන්නක් මතු නොවිණි. ඇයගේ මුහුණට නැගුණේ සිනාවකි.

"පසුගිය සති කීපයක්ම ඔයා ඒ දවල් රෑ දෙකේම හරියට මහන්සි වුණා" ඇය කීවාය. "ඒ නිසා ඔයා හෝම්ස් මහත්තයා එක්ක ඒ විධියේ වැඩකට ගිහින් විවේක ගන්න එක හොඳයි. මං ඔයාගෙ රෝගීන් දොස්තර ජැක්සන් වෙත යවන්නම්. ඔහු පසුගිය දවස්වල අපට චෝදනා කළා නේ, ඔහුගේ රෝගීන් වැඩිහරියක් දැන් ඔයා ළඟට එන්න පටන් අරගෙන කියලා"

"අන්න හොඳයි" හෝම්ස් කීවේ සතුටෙනි. "දින කිහිපයක් ඔබට මා සමග රැඳෙන්න වෙනවා වොට්සන්. ඒ හින්ද ගමන් මල්ලක බඩු



http://sherlockholmesinvestigations.blogspot.com

අනුරාගන්න. ඔබ ගැන බලාපොරොත්තුවෙන්, මං ආව කුලීරිය රඳවාගත්තා. ගමන යද්දී මං ඔබට හැම දෙයක්ම කියන්නම්"

"පහුගිය දවස් කිහිපයේ පුවත්පත් ඔබට කියවන්න ලැබුණද?" හෝම්ස් මගෙන් විමසුවේ ගෑස්ලාම්පු වලින් ආලෝකමත් වූ වීථි අතරින් අශ්වකරත්තය ගමන්කරමින් සිටියදීය.

"පහුගිය දවස් කීපයේ නම් මං පුවත්පතක් දැක්කෙ නෑ" මා කීවේ හෝම්ස්ගේ අලුත්ම පරීක්ෂණයේ තොරතුරු දැනගැනීමේ මහාඅවසිල්ලෙනි.

"පහුගිය සතියේ පුවත්පත්වල අවධානය යොමුවුණේ එක්තරා භූවිශේෂ සිදුවීමකට. එවායින් පුවත්පත්වල 'මුල්පිටු පිරී තිබුණා. ඒ විස්තරවල සාරාංශයක් තියෙනවා. "වෙස්ට්මින්ස්ටර් ගැසට්" පුවත්පතේ" කී ඔහු, දෙකට නැමූ බර් පුවත්පතක් මගේ අතේ තැබුවේය. "මං හිතන්නේ මතැන සඳහන් කාරණා එකක් දෙකක් ඔබේ හිත ඇදගන්න සමත්වේවි."

## වෙස්ට්මින්ස්ටර් ගැසට්

සැප්තැම්බර් 25 වැනිදා.

## හැම්ස්ටෙඩ්හි අභිරහසක්

පසුගිය දිනවල පුවත්පත්වල පළවූ ආන්දෝලනාත්මක ප්‍රධාන පුවත පිළිබඳව පාඨකයාට මතක ඇතුවා නිසැකය. "කෙන්සිංටන්හි භීෂණය" "පිහියෙන් ඇනීත ගැහැනිය" "කළු වත හැඳි කත" ආදී සිරස්තල යටතේ පළවූ ප්‍රවෘත්ති වලට, සමාන්තරව දිවෙන පුවතක් දැන් අප වෙත ලැබී ඇත. හැම්ස්ටෙඩ් ප්‍රදේශය අවට වූ මෙම සිද්ධියෙන්, ප්‍රදේශවාසී ජනයා භීතියෙන් ඇළලී ගොස් සිටිති.

හැම්ස්ටෙඩ්හි, තැනින් තැන කුඩා පඳුරු පමණක් ඇති විශාල බුඩුබිම ලාබාල දරුදැරියන්ගේ විචිත්‍ර කෙළිබිමක් බව ප්‍රකට කරුණකි. පසුගිය දින දෙකක හෝ තුනක කාලයේදී, මෙම භිට්ටනියට සෙල්ලම් කිරීමට ගිය ළමුන් කිහිපදෙනෙකු ආපසු සිය නිවාස කරා නොපැමිණි බැව් වාර්තා විය. මේ හැමදෙනෙකුම ලාබාල වියේ පසුවූ දරුවන් බැවින්, ඔවුන් මුහුණ දුන්නේ කුමන ආකාරයක අත්දැකීමකටද යන්න, පැහැදිලිව කීමට ඔවුනට හැකියාවක් නොවීය.

ඔවුන් හැමදෙනෙකුගෙන්ම කියැවුණේ ඔවුන් "නෝනා" කෙනෙකු සමග කාලය ගතකර ඇති බවයි. (මේ 'නෝනා'



http://sherlockholmesinvestigations.blogspot.com

හැඳින්වීමට කටකාර මැඩිහිටියකු යෙදූ "වාපු නෝනා" යන යෙදුම දැන් කවුරුත් භාවිතයට ගෙන ඇති බැව් පෙනේ) මේ දරුවන් හැමවිටකම අතුරුදන් වී ඇත්තේ ඇඳිරි වැටෙන සන්ධ්‍යා කාලයේදීය. අවස්ථා දෙකකදීම අතුරුදන් වූ දරුවන් හමුවූයේ පසුවද උදෑසනය. මුලින්ම අතුරුදන් වූ දරුවා ගෙදර නොඒමට හේතුව ලෙස දක්වූයේ, තමා "නෝනා" කෙනෙකුගේ ඉල්ලීම නිසා ඇය සමග ඇවිදින්නට ගිය බවයි. ඉන්පසු කුඩා දරුවන් කිහිප දෙනෙකුම මෙම "වාපු නෝනා" ගේ ග්‍රහණයට හසුවී ඇති බැව් පෙනේ.

දැන් මෙය කුඩා දරුවන් අතර සෙල්ලමක් වෙන තත්ත්වය දක්වා පැතිරී ඇත. කොහොමටත් හැංගිමුත්තන් සෙල්ලමට ප්‍රියකරන ඔවුහු "වාපු නෝනා" විසින් කැඳවාගෙන යන බව කියමින් මිතුරන් මුළා කිරීමට පටන්ගෙන ඇත. ලාබාල දරුවන් 'වාපු නෝනා' ලෙස කරන රඟපෑම් ඉතාම හාස්‍යජනක බව අපේ වාර්තාකරුවෙක් පවසයි.

එහෙත් මෙම සිද්ධියේ බියකරු පිළිකුල් සහගත පැත්තක් ඇත. එයින් පාඩමක් ඉගෙන ගෙන, ඇක්ම හා එයින් නිරූපනය වන සිතුවම, කරුණු අතිශයෝක්තියෙන් දක්වන්නන්ගේ අවධානයට යොමුකළ යුතු බව අපේ වාර්තාකරු පවසයි. මෙවැනි එළිමහන් රඟදැක්වීම් වල මුල්තැන "වාපු නෝනා" ට පැවරිය යුත්තේ මිනිස් හැසිරීම පිළිබඳ මූලධර්ම අනුව පමණකි.

කෙසේ වෙතත් මේ ප්‍රශ්නයට අදාළව බැරෑරුම් පැත්තක් ඇති බව සඳහන් කළ යුතුය. මෙසේ අතුරුදන් වූ සෑම දරුවෙකුගේම උගුරේ වුණු තුවාල, දෙමාපියනට දකින්නට ලැබී ඇත. මෙම තුවාල මීයෙකු හෝ කුඩා බල්ලෙකු විසින් සිදුකර ඇතැයි සිතිය හැකි ආකාරයේ ඒවා වෙයි. මේවා එතරම් වැදගත්කමක් නොමැති යයි නොසලකා හැරිය හැකි බව සැබෑය. එහෙත් මේවා සිදුකරන සත්ත්වයා කුමන එකෙකු වුවත්, ඌට අරුම විශේෂිත ක්‍රමයක් ඒ සඳහා යොදා ගන්නා බව සිහිතබා ගත යුතුය. හැම්ස්ටෙඩ් පිට්ටනිය අවට කෙළිදෙලෙන් සැරිසරන කුඩා ළමයින් ගැනත්, දඩාවතේ යන බල්ලන් ගැනත් විශේෂ අවධානයක් යොමුකිරීමට පොලීසියට උපදෙස් දී ඇත.



http://sherlockholmesinvestigations.blogspot.com

# විශේෂ වාර්තාවක්

## හැම්ස්ටෙඩ්හි භීෂණය
## තවත් දරුවෙක් අනතුරට ලක්වෙයි.
## "වාපු නෝනා"

"ඊයේ රාත්‍රියේ අතුරුදන්වූ තවත් කුඩා ළමයෙකු අද උදේ පඳුරක් මත සිටියදී සොයාගෙන ඇති බැව්, අපට දැන් ලැබුණු වාර්තාවක සඳහන් වේ. ඔහු හමුවී ඇත්තේ හැම්ස්ටෙඩ් මුඩුබිමේ ශූටර්ස්හිල් ප්‍රදේශයෙනි. මේ පෙදෙස මෙම අර්බුදයට ඉතාම අධුවෙන් ලක්වූ ස්ථානයකි. අනෙක් සෑම දරුවෙකුගේම උගුර දෙපස දක්නට ලැබුණු කුඩා තුවාල, මෙම දරුවාගේ උගුර දෙපස ද තිබූ බැව් සොයාගොස් ඇත. මෙම ළමයා අතිශයින්ම දුර්වලව ක්ලාන්ත ගතියෙන් සිටි බැව් සඳහන්ය. යන්තමින් සුවයක් ලැබීමේදී ඔහු පැවසුවේ ද තමා "වාපු නෝනා" ගේ කැඳවීමකට අනුව ඇය සමග ඇවිදීමට ගිය බවය.

"මොන තරම් තිරිසන් වැඩක්ද?" මා පැවසුවේ සිතේ ඇතිවූ පිළිකුල යටපත් කරගැනීමට නොහැකිවය. අප ගමන්කරමින් තිබූ පාර දෙපස මීදුම දැන් තවත් ඝනවී තිබුණි. මිලියන හතරක ජනකායක සෙවණැලි අතර සැඟවී තිබුණු ක්‍රියාවල යෙදීමට, දැන් එවැනි දුෂ්ටයෙකුට අවස්ථාව ලැබී ඇත.

"තිරිසන් වැඩක්?" හෝම්ස් ඇසුවේ මේ ක්‍රියාවේ පිළිකුල් සහගත බව තවමත් ඔහුට වැටහී නොතිබුණු බවක් හඟවමිනි.

"එව් ඇත්ත තමා. ඔබ යෙදූ වචනය නිවැරදියි වොට්සන්. මේ ළමයින් මෙහෙම දේකට ගොදුරු වෙලා ක්ලාන්ත ගතියකින් හෝ ගොළුවීමකින් බේරිලා ආ එක ලොකු වාසනාවක්. ඒක තමයි වොට්සන්. මේ දරුවන්ගේ උගුරේ දක්නට ලැබුණු තුවාල සහ ශාරීරික දුර්වලකමට හේතුව මොක්ක කියලද ඔබ හිතන්නේ?"

මගේ මිත්‍රයා, තමා දන්නා කරුණුවල උදව්වෙන් නිගමනයකට එන හැටි අනුකරණය කරමින් මම කල්පනා කළෙමි.

"ශාරීරික දුර්වලකමත්, ක්ලාන්ත බවත් දෙකම අධික භයකට පත්වීම නිසා ඇතිවිය හැකි ප්‍රතික්‍රියා," මම කීවෙමි. "නමුත් තුවාල ගැන කියනවා නම් ඒවා දඩාවතේ යන බල්ලෙකුගෙන් අහම්බෙන් සිදුවූ ඒවා වෙන්න බෑ. කවුරු හරි එහෙම කියනවා නම්, ඒක මෝඩ කතාවක්. ඒ මොකද දැන් පහුගිය රාත්‍රි හතරකම මේ සිද්ධිම දකින්න



http://sherlockholmesinvestigations.blogspot.com

ලැබී තියෙනවා. ඒ නිසා එද අර පුවත්පත් වාර්තාකරුවා කිව්වා වගේ මේක මානසිකව විකෘති වූ වෛද්‍යවරයෙකුගේ වැඩක්ද කියලත් මට හිතෙනවා. මේක සමහර විට, ඔහු අසරණ දරුවෙකු යොදාගෙන, මාංශ භක්ෂක සතෙකු ලවා තුවාල සිදුකරවන, අද්භූත පර්යේෂණයක් වෙන්නත් පුළුවන්. සුදු හැඳගත් කාන්තාවකුත් මේ තැන් වලදී දකින්න ලැබීමෙන්, ඒ උපකල්පනය වඩාත් තහවුරු වෙනවා."

"ඔබ හරිම දක්ෂයි වොට්සන්" මගේ මිතුරා කීය. "මං නිරීක්ෂණ කරලා ඒ මගින් නිගමන වලට එළඹීමේ ක්‍රමය ඔබත් අවුරුදු ගණනක් තිස්සේ පුහුණුවීම අහක ගිහිං නැහැ."

මේ වචනවලට සවන්දීමෙන් මගේ සිතත් ඇතිවූයේ ආඩම්බරය මුසු ප්‍රීතියකි. මේ සුවිශේෂ පුද්ගලයා කෙනෙකු ඇගයීමකට ලක් කළේ කලාතුරකිනි.

"එහෙනම් මා ගත් නිගමනයන්ට ඔබත් එකඟවෙනවා?" මම ඇසීමි.

"නැහැ. ඔබේ නිගමන සම්පූර්ණයෙන්ම වැරදියි වොට්සන්"

මම මහත් ලැජ්ජාවට පත්වූයෙමි. ඒ මොහොතේ මගේ මුහුණේ පළවූ හැඟීම නොපෙනෙන්නට, විය තුළ අඳුරුබවක් තිබීම සැනසීමක් විය.

"වොට්සන්. මං කළ පර්යේෂණ සාර්ථකව අවසන් කිරීම ගැන ඔබ, වාර්තා විශාල සංඛ්‍යාවක් ලියා තිබෙනවා. එහිදී ඔබෙන් කෙරුණු කාර්යය, ඔබ සඳහන් කරල තියෙන්නේ බොහොම සුළුවෙන්. නමුත් මගේ මොළය ක්‍රියාත්මක කිරීමට ඔබෙන් ලැබුණු උත්තේජනය හරිම වැදගත්. ඔබ නොහිතන්න......"

"ඒ වුණත් හෝම්ස් ඔබ කිව්වා......"

"ඔව්. මං කිව්වා ඔබේ උපකල්පනය සම්පූර්ණයෙන්ම වැරදියි කියලා. මං කිව්වේ බොරුවක් නොවෙයි. ඔබ කිව් විද්‍යාඥයා ගනිමු. ඔහු මානසික විකෘතියකට ලක්වෙලා හරි නැතුව හරි; පුංචි සතෙකුට ඒ ළමයින්ව හපාකන්න ඉඩ ඇරලා, ඊළඟට ඔවුනට ගෙදර යන්න ඉඩහැරීමෙන් ඔහුට ලැබෙන ප්‍රයෝජනය මොකක්ද? මේ පුද්ගලයා දන්නවා ළමයින්ගේ උගුරේ තුවාල සිදුවී ඇති බව. මේ ළමයින් අතුරුදන්වුණු වෙලාවෙ ඉඳල, ගෙදර අයට හමුවුණු වෙලාව අතර තියෙන්නෙත් ඉතාම කෙටි කාලයයි. ළමයාගේ සිදුවෙන වෙනසක් නිරීක්ෂණයේ කරන්න, නැත්නම් පර්යේෂණයේ



http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රතිඵල බලාගන්න. මේ කාලය කොහොමටවත් ප්‍රමාණවත් නැහැ. එතකොට ඔබ කියන මානසිකව විකෘති වුණු විද්‍යාඥයා, සුළඟේ පාවෙලා අතුරුදන්වෙනවා. ඒ වුණත් අධෛර්යවෙන්න එපා මගේ ගිහවත් මිත්‍රයා. අඳුරු මාර්ගය ආලෝකමත් කරන්නෙකු හැටියට ඔබේ දක්ෂකම අමතක කරන්න බැහැ. මේ සිද්ධියට අදාළ වැදගත්ම කාරණා තුන ඔබ ඉතා පැහැදිලිවම පෙන්වාදුන්නා"

"ඒ කියන්නෙ?"

හකුළුවාගත් දකුණු අතේ ඇඟිලි එකින් එක දිගහරිමින් ඔහු කරුණු ගෙනහැර පෑවේය. "අංක එක: අපට ඉන්නවා අතුරුදන් වෙන ළමයෙක්. අංක දෙක: සුදු - කළු හැඳගත් නෝනා කෙනෙකුත් ඉන්නවා. අංක තුන: ඒ ළමයා ආපසු හමුවෙන්නේ ඔහුගේ උගුරේ පුදුමාකාර විදියේ තුවාලෑ සහිතව. එපමණක් නොවෙයි ළමයා ශාරීරිකව දුර්වල වෙලා.

මීළඟට අපට පැහැදිලිව පෙනෙනවා අංක 1 හා 3 සම්බන්ධ කරන සාධකය අංක 2 බව. එතකොට අසරණ පුංචි ළමයෙකු පැහැරගෙන ගිහිල්ලා, ඔහුට තුවාල සිදුකරන නාටකය රඟදක්වන ප්‍රධාන චරිතය, නාඳුනන ගැහැනියක්. ඒ ගැන සැකයක් නෑ. ඔබට මං කියන දේ පැහැදිලිද වොට්සන්? සිද්ධීන් අනුපිළිවෙළට අරගෙන කථාවක් ගොඩනඟා ගත්තාම හැමදෙයක්ම පැහැදිලි වෙනවා."

"මට නම් තවමත් කිසිදෙයක් තේරුම් ගන්න බැහැ" ඒ බව හඟවමින් මම හිස දෙපසට සැලීමි. "ඇයි ළමයින්ට තුවාල සිදුවුණේ? පුංචි සතෙකුගෙන් නෙමෙයි නම්, ළමයින්ට තුවාල සිදුවුණේ කොහොමද? මේවා මට කොහොමටවත් තේරුම් ගන්න බෑ."

"ඩෙමිටර් නෞකාවේ නාවිකයින් අතුරුදන් වුණේ කොහොමද කියන එක වගේ, මේකත් තේරුම් ගන්න අමාරුද?" හෝම්ස් ඇසීය.

ඔහු එය පවසද්දී කටහඬ අඩුවැඩි කළ ආකාරයෙන්, මගේ ඇඟ සීතල වී ගියේය.

"දෙවියනේ හෝම්ස්" මට කෑගැසිණ. "ඔබ කියන්නේ මේ සිදුවීම් දෙක එකට සම්බන්ධ ඒවා කියලද?"

සිනාවක් නැඟීමට මෙන් හෝම්ස්ගේ දෙතොලේ චලනයක් සිදුවිය. එහෙත් එය සිනාවක් නොවූ බව ගැස්ලාම්පුවක් යටින් යද්දී එයින් නිකුත් වූ එළියෙන් දුටුවෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"අන්තිමට අතුරුදන්වුණු ළමයා හොයාගත්තු පොලිස්භටයා සමග මං කථාකලා වොට්සන්. ඔහු ඒ තුවාල විස්තර කලේ කොහොමද දන්නවද? එකිනෙකට අඟලක් පමණ ඈතින් පිහිටා තිබුණු සිදුරු දෙකක් හැටියට. ඒවායේ දර්, රළු කඩතොලු වූ ඒවාලු. එහෙම කිව්වාම ඔබේ මතකයේ මොනවා හරි අවදිවෙනවද?"

මට යලින් වරක් සිහිවුනේ මාස දෙකකට පෙර විට්බි වරායට ගොඩගැසූ නෞකාව, ලේ තැවරුණු කම්බ කැබලි ආදියයි. "අර සුනඛයාද?" මම ඇසීමි.

"නැහැ වොට්සන්. මේ තුවාල කොහොමවත් ඒ සුනඛයා කල ඒවා වෙන්න බෑ. ඌ ඉතා විශාල එකෙක්ලු. දුටු අය විස්තර කර තිබුණේ ඌ දවැන්ත බල්ලෙක් ලෙසයි. වරාය අසල වැල්ලේ උගේ පා සටහන් කිහිපයක් මට දකින්න ලැබුණා. ඒවයිනුත් ඔප්පුවුණේ දුටු අය පැවසූ වදන් නිවැරදි බවයි. එහෙම බල්ලෙකුගේ උල් දත් දෙක තිබෙන්නේ එකිනෙකට අඟලක් නෙමෙයි, ඊට වඩා බොහොම ඈතින්. එතකොට අපි අවධානාවත්ත කපිතාන්ගේ උගුරේ සහ ළමයින්ගේ උගුරුවල තිබුණු සිදුරු, ඇතිකලේ බල්ලෙක් වෙන්න බෑ. මේ අපරාධකාරයා ගැන මා කල උපකල්පනය තවමත් එතරම් ශක්තිමත් නැහැ. ඔබට මතකද ඇති ඒ ගැන මා කල නිරීක්ෂණ වලින්, මා ඇඹිණි නිගමන?"

"ඔබ කිව්වා අපරාධකාරයා ඉතාම ඉහළ ශරීර ශක්තියක් ඇති අයෙකු බව"

"අන්න හරි" හෝම්ස් කීය. "මට ලුහුඬින් සොයාගැනීමට හැකිවුණා ඔහු වැටට උඩින් මුහුදට විසිකල එක් නාවිකයෙකුගේ බර රාත්තල් 224ක් බව. ඒ වගේ බරක් ඔසවන්න පුළුවන් අපරාධකාරයෙක් අඳුරු වීථියකදී හමුවුණොත් හෙම්? මට මං කැමැතියි එහෙම වෙලාවට, මගේ ආත්මාරක්ෂාවට හොඳ ආයුධයක් ළඟ තියෙනවා නම්"

"එතකොට ඔබ හිතන්නේ මේ "එමු නෝනා" හැටියට පෙනී ඉන්නේ, ගැහැනියක ලෙස වෙස්වලාගත් අපරාධකාරයා කියලද?"

හෝම්ස්ට සිනාපහළ විය. "අප හොයන අපරාධකාරයාගේ ශක්තියේ හැටියට, ඔහු ශරීර ප්‍රමාණයෙනුත් හැඩිදැඩි කෙනෙකු විය යුතුයි. මං හිතන්නේ නෑ එහෙම කෙනෙකුට රූමත් ගැහැනියක වගේ පෙනීහිටින්න හැකිවේවි කියල"

"නමුත් ඔහු මේ වැඩේට සම්බන්ධයි. එහෙම නේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඇත්තෙන්ම ඔව්...... ආ අපි දැන් මේ ළඟාවෙලා ඉන්නේ හැම්ස්ටෙඩ් වලට. අර තියෙන්නේ කුප්‍රකට හැම්ස්ටෙඩ් පිට්ටනිය. ඔබේ බෑගය කුලීරියේ තියෙන්න අරින්න වොට්සන්. ඒක බේකර් වීදියේ අපේ නිවහනට ගෙනියන්න කියලා. මං රියැදුරාට උපදෙස් දෙන්නම්."

කුලීරිය එම පෙදෙසින් ඉවත්ව ගිය පසු, අපි දෙදෙනා පාළු පිට්ටනිය මැද තනිවීමු. දහවල් කාලයේ නම් එමය සිත්ඇදගන්නා ප්‍රසන්න තැනක් විය යුතුය. එහෙත් රාත්‍රියේ නම් එතැන තිබුණේ සිතේ චකිතයක් ඇතිකරවන භූසල බවකි. වලාකුළු වලින් වැසුණු අඩසඳ, ඉතා දුර්වල එළියක් නිකුත් කළේය. කෙටියට කපා තිබූ තණකොළ මත එකතු වූ පිණිකැට සඳ එළියේ දිලිසිණි. හීත සෘතුව ළඟාවෙද්දී වැටුණු හිමෑ ගස්වල අතු මත සැව්වී තිබුණේ යක්ෂණියන්ගේ ඇඟිලිතුඩු සිහිගන්වමිනි. හොල්මන් කථාන්තරයක් සඳහා, උවමනාවෙන්ම සකස් කළ තැනක් මෙන්, එහි තිබුණේ සිත් කලඹන පරිසරයකි. කුඩා අවදියේදී මම අවතාර හා හොල්මන් ගැන කථා අසා බියට පත්වූයෙමි. එහෙත් නවීන විද්‍යාව හදාරමින් ඉහළට ඉගෙනුම ලබද්දී, හොල්මන් කථා මගේ සිතෙහි ඉවත්විය. එහෙත් එද රාත්‍රියේ හැම්ස්ටෙඩ් පිට්ටනියේ තිබූ භයංකර පෙනුමෙන් නම්, මගේ සිත අප්‍රමාණ කැලඹීමට පත්විය. ගෙදරින් පිටත්ව එද්දී උණ්ඩ පිරවූ පිස්තෝලය සාක්කුවට දමාගැනීම, මගේ සැනසීමට කරුණක් විය.

"සැකයක් නෑ වොට්සන්. ඔබ හිතනවා ඇති, මේ පාළු පිට්ටනියකට අපි ආවෙ මොන එකකටද කියල?" හෝම්ස් ඇසුවේ කෙඳිරිලි හඬෙනි.

"ඔබ එහෙම දෙයක් කළේ, මොකක් හරි වැදගත් අරමුණක් ඇතිව බව මට විශ්වාසයි" මම කීවෙමි.

"මගේ හිතවත් මිත්‍රයා. ඔබ මා ගැන තබා ඇති ඒ විශ්වාසය, නොබිඳෙන බව මට සහතිකයි"

සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව ඔහු සමග එන ලෙස මට සංඥා කළ හෝම්ස්, ගස්වල සෙවණැලිවල සැඟවෙමින් ඉදිරියට ගමන් කළේය. අඳුරු වලාකුළු දිගින් දිගටම සඳ ආවරණය කිරීමට පටන්ගෙන තිබිණි. එබැවින් අන්ධකාරයේ ඔහු පිටුපස යාමට මට හැකිවූයේ, ඔහුගේ කලිසම් කකුල්වල චලනයට නෙත්



http://sherlockholmesinvestigations.blogspot.com

යොමුකරගෙන ඉදිරියට නාමෙති. සැහෙන වෙලාවකට පසු අපි, පිට්ටනියේ නැගෙනහිර පැත්තේ උස් පඳුරු කිහිපයක, ලොකු සෙවණැල්ලක් තිබූ තැනක නැවතුණෙමු. දැන් තම මුව වටා රවුම් කළ හෝම්ස්, මගේ කනට හොඳටම ලංවී යමක් කීවේය.

"පාළු පිට්ටනියේ හැමතැනක්ම වගේ මෙතැන ඉඳගෙන අපට නරඹන්න පුළුවනි." ඔහු කෙඳිරුවේය. "කිසිම ආකාරයක ශබ්දයක් නොකර අපි නිහඬව සිටිය යුතු බව, මං අමුතුවෙන් කියන්න උවමනා නැහැ නේද?"

මම හිස සොලවා, එය තේරුම් ගත් බව හැඟවීමි.

"කෝ රිවෝල්වරය ගෙනාවද?"

මම යළිත් හිස සෙලවීමි.

"විශිෂ්ටයි. මං ඔබට අවවාද කරනවා රිවෝල්වරය සූදානමෙන් තබාගන්නා ලෙසට. ඔබට කැමැති පහසු ඉරියව්වකින් ඉන්න. නමුත් නින්ද යාමේ අවදානමක් තියෙනවා. නිදාගන්න නම් එපා. ඒත් අපට මේ රෑ කොච්චරමක් වෙලා බලාගෙන ඉන්න වේවිද කියන එක නම් මට කියන්න බෑ වොට්සන්"

මම බිම වාඩිවූයෙමි. ඕනෑම මොහොතක ක්ෂණිකව රිවෝල්වරය අතටගත හැකිවන සේ, එය උකුළ මත තබාගතිමි. මා අසලම හෝම්ස් වකුටුවුණේ දණගසාගන්නා ඉරියව්වෙනි. ඔහු කඳ පහතට නමාගෙන, ඕනෑම මොහොතක ඉදිරියට පැනීමට සූදානමෙන් සිටියේය. එය මට සිහිකළේ, ගොදුරක් එනතුරු අඳුරේ සැඟවී සිටින සිංහයෙකුගේ ඉරියව්වය. එය ඉතා නිවැරදි උපමාවකැයි මට සිතේ. ෂර්ලොක් හෝම්ස් යනු ගොදුරු දඩයම් කරගන්නා දඩයක්කාරයෙකු මිස අන් කවරෙක්ද?

නිහඬව, දැඩි සෝදිසියෙන් අපි ඉතා දීර්ඝ වේලාවක් බලාසිටියෙමු. ඈත දෙව්මැඳුරේ ඔරලෝසුව පැයෙන් පැයට නාදවිය. ඒ අනුව කාලය ගතවී ගිය හැටි මම තේරුම් ගතිමි. එහෙත් මට දැනුණේ කාලය ගෙවී ගියේ ඉතා සෙමින් බවයි. ඉඳහිට ළඟින් හෝ ඈතින් නිශාචර පක්ෂියෙකු නගන හඬ අපට අසන්නට ලැබිණ. ඒ හැරෙන්නට හැම අතින්ම පැවතුණේ දැඩි නිහඬතාවයකි. කිසිදු අමුතු දෙයක් සිදුවෙන අයුරක් නැතැයි, මගේ සිත කියන්නට විය.

එහෙත් එක්වරම බලාපොරොත්තු නොවූ මොහොතක විලාප හඬක් අපට අසන්නට ලැබිණ. මගේ ඇඟ හිරිවැටී ගියේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"දෙවියනේ! මොකක්ද ඒ ශබ්දය?" මට කෑගැසිණ. මා එය කියන විටත් සිටි තැනින් ඉහළට පිනූ හෝම්ස්, ශබ්දය ආ දිසාවට වේගයෙන් දුවන්නට පටන්ගත්තේය. රිවෝල්වරය අතට ගෙන මම ඔහු පසුපස දිවගියෙමි.

විලාප හඬ නැඟුණේ, අප සැඟවී සිටි තැනට විරුද්ධ දිශාවේ, සොහොන්ගැලි වලින් අඳුරු වී තිබූ තැනකිනි. අප එතැනට ළංවෙද්දී අන්ධකාරයේ කළු පැහැය මැද සුදු පාටින් සෙලවෙන යමක් මම දුටුවෙමි. එහෙත් එක් ක්ෂණයකින්ම එය අතුරුදහන් විය. එය නොපෙනී ගියේ කොතරම් වේගයෙන්දැයි කියතොත්, මා ඇත්තෙන්ම යමක් දුටුවාදැයි මටම අවිශ්වාසය. එහෙත් වැඩිදුර ඒ ගැන සිතීමට මට අවකාශයක් නොලැබිණ. ඊළඟ මොහොතේ මගේ අවධානය යොමුවූයේ තණකොළ මත වැටී තිබූ නිසල සිරුරක් වෙතය.

ඒ කුඩා පිරිමි දරුවෙකි.

මා ඔහු පරීක්ෂාකරන අතරේ, හෝම්ස් අප දුටු සුදු ඡායාව පිටිපස හඹා ගියේය. මිනිත්තු කිහිපයකින්, හති දමමින් ඔහු ආපසු පැමිණියේ කෝපයෙන් මෙන්ම කලකිරීමෙනි.

"ඒකි පැනල ගියා! අන්ධකාරය නිසා මට වේගයෙන් දුවගන්න බැරිවුණා. ලන්තෑරුමක් අරගෙන එන්න අමතක වුණේ මගේ නරක වෙලාවට. පා සටහන් වලින් ඇති ප්‍රයෝජනේ මොකක්ද, ඒවා කෙනෙකුට පෙනෙන්නේ නැත්නම්. කොහොමද පුංචි දරුවාට?"

"ඔහු හුඟක් දුර්වලයි" මම කීවෙමි.

"බලන්න වොට්සන් ඔහුගේ උගුර දිහා. මොනවා හරි සලකුණු තියෙනවද?"

කුඩා දරුවාගේ කමිස කොලරය පහත්කර බැලූ මම භ්‍රාන්තවීමි. ඔහුගේ සුදුමැලි උගුර දෙපස, කඩතොලු වූ දරයක් සහිත ලේ ගලමින් තිබූ රතු පැහැති සිදුරු දෙකක් විය!



http://sherlockholmesinvestigations.blogspot.com

# 5

## ඛේදජනක මරණයක්.

අප බේකර් වීථිය වෙත ආපසු ගිය ගමන, මා තනිව ගමන්කල ගමනකට සමාන විය. ඊට හේතු වූයේ, දඩි කලකිරීමකට මෙන්ම කෝපයකට ද පත්ව සිටි හෝම්ස්ගේ මුවෙන්, එකදු වචනයක් හෝ පිට නොවීමය.

කුඩා දරුවා පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඔහුගේ තුවාල පිරිසිදු කොට, මම ඒවා වෙළුම් පටි වලින් ආවරණය කළෙමි. ඉන් පසු රැකවරණය සඳහා දරුවා පොලිසියට භාරදෙන ලදී. එහෙත් හෝම්ස්ගේ හිතේ ඇතිවී තිබූ සිත්වේදනාව මගහැරී ගියේ නැත. මගේ මිත්‍රයාගේ ශරීර සෞඛ්‍යය ගැන මට මහත් බියක් ඇතිවූයේ මෙවැනි කාලවකවානු වලය. සෑහෙන වේලාවක් යනතුරු, ඔහු නිහඬව කල්පනා කළේය. පරාජය නිසා ඔහු පත්වුණු තත්ත්වය, මගේ සිතේ කැලඹීමක් ඇති කළ බව හෝම්ස්ට වැටහෙන්නට ඇත. එහෙයින් ඔහු උත්සාහයෙන් මුවට සිනාවක් නගාගෙන කථා කළේය.

"ඔය වගේ දේවල් වලින් කම්පාවට පත්වෙන්න එපා මිත්‍රයා" ඔහු කීය. "මගේ මෝඩකම නිසා අපි එක සටනක් පරාද වුණු බව ඇත්තයි. ඒත් මුළු සංග්‍රාමයෙන්ම ඇතිවෙන ප්‍රතිඵල, ඒකෙන් තීරණය වෙන්නේ නැහැ. තවත් රාත්‍රී ක්ලි එළඹේවි. ඒ අතරේ අපි ක්‍රියාශීලී වෙමු. තවත් පියවරක් ඉදිරියට තබන්න කලින්, අපට එරෙහිව ඇති ගැටලු ගැන අවබෝධයක් ලබාගමු. ඒකට මුහුණදිය යුතු ආකාරය ගැන තේරුම් ගමු. රියැදුරු උන්නැහේ. කරත්තය ඔහොම නවත්වන්න. මං ඉක්මනට එනවා."

අපේ කරත්තය නවත්වන ලද්දේ පොත් වෙළඳසලක් ඉදිරිපිටය. එහි ඇතුළත පහන් දල්වා තිබිණි. එක්කෝ එහි අයිතිකරු හිරු පායන්නටත් පෙර උදෑසනින්ම අවදිවන්නෙකු විය යුතුය. නැතිනම් නිදාගැනීමට අපහසු පුද්ගලයෙකු වියයුතුය.


http://sherlockholmesinvestigations.blogspot.com

කුලිරියෙන් බැසගිය හෝම්ස් තම සැරයටියෙන් දිගින් දිගටම දොරට තට්ටු කළේය. අන්තිමේදී එය විවෘත වූ බව මම දුටුවෙමි. මිනිත්තු කිහිපයකට පසු මගේ මිතුරා ආපසු පැමිණ කරත්තයට නැග්ගේය. ඔහු අතේ තිබුණේ තරමක් විශාල පොතකි.

"ඔය පොත් වෙළෙන්ද නින්ද නොයෑමේ රෝගය තියෙන කෙනෙක්. රෑට නින්දෙන් ඇහැරුණොත් ඔහු කරන්නේ, ඉහළ තට්ටුවේ තිබෙන නිරගස් නිදනකාමරයෙන් පහළට බැස, සාප්පුවට ඇවිත් පොත් කියවීම. ඒ කවුද කියලා දැනගත් වහාම ඔහු දොර විවෘත කළා. මේ වගේ කෙළෙඹුන් මහා හරියට ප්‍රයෝජනවත් වෙලා තියෙනවා වොට්සන්" ඔහු කීවේ අප යළිත් ගමන් ඇරඹූ පසුය.

අප බේකර් වීථියට ළඟාවෙද්දී හිරු පායාගෙන ආවේය. නැග ආ හිරුගේ වෛවර්ණ කිරණ අපේ තිරහන වෙත ද වැටිණ. මඳ වේලාවක් ගතවෙද්දී සෑහෙන තරම් හිරු එළියක් වැටිණි. නොඉවසිල්ලෙන් සිටි මම හෝම්ස් ගෙනා පොතේ නම කුමක්දැයි පරීක්ෂාකර බැලීමි.

නම් බැම්මෙන් බැඳ තිබූ විශාල පොතක් වූ එහි නම වූයේ

**"වැම්පයර්වරු හා ඔවුන්ගේ සොයුරු වර්ගයා - එද සිට අද දක්වා"**

එය විවෘත කළ වහාම මුල් පිටුවේ තිබුණේ චිත්‍රයකි. එහි වූයේ බිම වැතිර සිටි මිනිසෙකු වටා එක් රැස්වී සිටි, මිනිසාට තරමක් සමාන පෙනුමක් සහිත, එහෙත් කළුපාට යෝධ පිහාටු සහිත සත්ත්ව වර්ගයකි. උදේ පාන්දරම මගේ මිත්‍රයාගේ කියවීමේ රුචිය අවදි කළ පොත ගැන, මම පුදුමයට පත්වූයෙමි. පොතේ පිටුවක් දෙකක් පෙරළද්දී දකින්නට ලැබුණේ මුල් පරිච්ඡේදයයි. එහි මුල් ඡේදය මම නිකමට කියවා බැලීමි. එහි මෙසේ සඳහන් විය.

"වැම්පයරයෙක් යනු කවුද? ඒ සියදිවි හානිකරගත් පුද්ගලයෙක්, තවත් වැම්පයර්වරයෙකුගේ ගොදුරක්. නැතිනම් තමාගේ ආත්මය යක්ෂයාට විකුණා දැමූ පුද්ගලයෙකු විය හැක. දහවල් කාලය පුරා ඔහු වැතිර සිටින්නේ මිනීපෙට්ටියක් තුළය. හිරු බැසගොස් අන්ධකාරයෙන් ලොව වැසී යන තුරු, එම සොහොනෙන් නැගිටීමට ඔහුට අවසර නොමැත. හිරු බැස ගිය පසු අවදිවන ඔහු, තමාගේ පාපකාරී ආහාරය වන මිනිස් රුධිරය සොයා ගමන් අරඹයි.



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු ස්වාභාවික මරණයකට පත්වනාවේ. එහෙත් අනතුයන්ට ඔහු විනාශකර දැමීමට හැකිය. මෙය සිදුකළ හැක්කේ, දහවල් කාලයේ ඔහු නිදාසිටියදී ඔහුගේ හදවත පසාවන සේ ලී උලක් යැවීමෙනි, එසේත් නැතිනම් ඔහුගේ ගෙල කපා දැමීමෙන් සහ ඔහුගේ අපිරිසිදු මුඛය සුදුළූනු වලින් පුරවා දැමීමෙනි. මෙතෙක් නොමැරී සිටි එම වැම්පයරයා සාමදානයේ සැතපෙන්නේ එවිට පමණි.

ඉන්දියාව ආදී පෙරදිග රටවල ජනයා, වැම්පයරයන් ඇතිවීම වැළැක්වීමට ඉතා ඥානාන්විතව කටයුතු කරති. කෙනෙකු මියගිය විට මළසිරුර භූමදාන නොකරන ඔවුහු, දර දැමූ සෑයක දමා මළසිරුර පුළුස්සා දමති. මෙය ශතවර්ෂ ගණනක් තිස්සේ ආසියාතු රටවල ඉටුකෙරෙන චාරිත්‍රයකි. මෘතශරීර ආදාහනය කොට මෙසේ විනාශකර දැමීම, තවමත් අපේ යුරෝපා රටවල දක්නට නොලැබීම කණගාටුවට කරුණකි."

"මොන පිස්සු බහුබූත කතාද?" කී මම පොත වසාදැමුවෙමි.

"ඇයි වොට්සන්, මොකුත් ප්‍රශ්නයක්ද?" ඔහුගේ අඩවන් දෑසින් මා කළ දෙය දුටු මගේ මිතුරා විමසුවේය.

"මට ඔබ ගැන හරි පුදුමයි හෝම්ස්" මම කීවෙමි. "බුද්ධිමත් මිනිස්සු මේව විශ්වාස කරන්නේ නැහැ. මේ වගේ මිථ්‍යා දේවල් වලට යොමුවෙන්නේ නොමේරූ මනසක් ඇති අය. එහෙම නේද?"

ඔහු වෙතින් දිස්වූයේ සන්සුන් බවකි. "කෙනෙකු සටනට යනවා නම් තමන්ගේ සතුරා ගැන හැමදෙයක්ම දැන සිටිය යුතුයි. ප්‍රබල ආයුධයක් ලෙස යොදාගත හැක්කේ එයයි" හෝම්ස් කීය. "මේ සිද්ධියේ කෙලවරක් දකින්න මට උවමනායි වොට්සන්. ඔවුන් ගැන පුළු තොරතුරක්වත් අහිමි කරගන්න මට බෑ."

"හෝම්ස්. බැස්කවිල් සිද්ධිය ආරම්භයේදී ඩෙවොන්ෂයරයේදී ඔබ කියූ දේ දැන් ඔබට අමතකද? "දුෂ්ට ක්‍රියා හා භීෂණය සමග මට හැකිතාරමින් මං සටන්කරනවා. ඒ වුණත් භීෂණයේ පියා වන යක්ෂයා මා සමග සටනට ආවොත්? ඒක නම් මට සෑහෙන්න අමාරු වෙන්න ඉඩතියෙනවා." ඔබ අද කිව් ඒ කතාවට මටත් එකග විය හැකි බවයි කිවයුත්තේ"

"වොට්සන්. ගොඩක්ම ශක්තිමත් නාවිකයන් නවදෙනෙක් අකාලයේ මරණයට පත්වුණා හදිසියේම. පුංචිළමයි පස්දෙනෙක් උගුරෙන් ලේ ගලාගිය. සිදුරු සහිතව හිරිහැරයට ලක්වුණා. එහෙම



http://sherlockholmesinvestigations.blogspot.com

නම් මෙව වුණේ කොහොමද කියල තේරුම් කරන්න. ඒවා තේරුම් කළ හැකි සරල උපකල්පනයක් ඔබ ළඟ තියෙනවද?" මගේ මිත්‍රයා එම ප්‍රශ්නය ඇසුවේ අනුකම්පා විරහිත ස්වරයකිනි.

"එහෙම උපකල්පනයක් මා ළඟ ඇත්තෙ නෑ" මම කීවෙමි. "මම අපරාධ පරීක්ෂකයෙක් කියල කාටවත් කියන්නෙත් නෑ"

මා කථාකළ අයුරෙන් ඔහුගේ කෝපය නිවීගියේය. මෙවර ඔහු සිනාවූයේ හිතාදර අයුරෙනි. "මගේ හිතවත් වොට්සන්. ඔබ නම් පරණ මනුස්සයාමයි. ඔබ පුරුදු විධියට කලින් දරූ මතයේම නොසැලී සිටිනවා. මං ඔබෙන් යළිත් ඉල්ලා හිටින්නේ, මං පැමිණි නිගමනය ගැන විශ්වාසය තියන්න කියලයි. මට ලැබුණු දත්ත හැම එකක්ම විශ්ලේෂණය කරලා, මේ වගෙ විනිශ්චයකට එම පහසුවුණේ නෑ මොටසන්. ඒ සඳහා මං බොහොම ආදරයෙන් වැළඳගෙන හිටි මගේ ප්‍රතිපත්ති, මගේ මූලධර්ම විශාල ගණනක් අත්හැර දමන්න සිදුවුණා. කිසිදෙයක් විය නොහැකි හැම දෙයක්ම ඉවත්කිරීමයි මට පුරුදු විධිය. මං ඒක කළා. එතකොට ඉතිරිවෙන්නෙ එකම විකල්ප විසඳුමයි. ඒක විය නොහැකි දෙයක් වගේ පෙනුණත්, නිවැරදි එක එය විය යුතුයි. කුමන විධියකින් මං යන මාර්ගය වැරදි නම්, ඒකෙ වගකීම මම සම්පූර්ණයෙන්ම භාරගන්නවා."

"ඔබ නිවැරදි නම්?"

ඔහුගේ මුහුණේ මතුවූයේ බැරෑරුම් පෙනුමකි. "මගේ හිතවත් මිත්‍රයා. මං නිවැරදි නම්, අප ඉදිරියේ තියෙන්නේ බොහොම භාරදූර එහෙත් අප්‍රසන්න කටයුත්තක්. ඉතාමත් අප්‍රසන්න කටයුත්තක්"

ඉන්පසු ඔහු යළිත් නිහඬවූයේ. ගමනේ ඉතිරි කොටසේ අපි දෙදෙනා කල්පනාවේ ගෙළී, නිහඬව ගමන් කළෙමු. අප නිවහනට ළඟාවෙද්දී, හිරු කිරණක් පොළොවට නැගෙමින් තිබිණි. මගේ ඇඟට බලවත් විඩාවක් දැනුණේ, අප උමගල් විසිත්ත කාමරයට පා තබද්දීය. එයට හේතුව කුමක්ද?

පසුගිය පැය විසිහතර තුළම මට නිදාගැනීමට ලැබුණේ ඉතාමත් කෙටි කාලයකි. එහෙයින් මෙලෙස විඩාපත් බවක් දැනීම පුදුමයට කරුණක් නොවේ.

හෝම්ස් තම හාන්සිපුටුවේ හිඳගෙන දෙපා උඩට ගත්තේය. ඔහු පයිප්පය දල්වාගෙන කල්පනා කරන්නට පටන් ගනිද්දී මම ඇඳට



http://sherlockholmesinvestigations.blogspot.com

වැටුණෙමි. හොඳටම දහවල් වී මා අවදිවන විටත් මගේ මිත්‍රයා එම පුටුවේ එම ඉරියව්වෙන්ම සිටියේය.

"මිත්‍රයා. ඔබ නිදාගන්නෙ නැද්ද?" රැවුල බා, නාන කාමරයෙන් එළියට ආ මම හෝම්ස්ගෙන් ඇසීමි. මීළඟට මම, ඔහු ඉදිරියෙන් වූ පුටුවේ හිඳගතිමි.

කියවමින් සිටි පොතේ තවත් පිටුවක් පෙරළූ හෝම්ස්, මා දෙස හෙළුවේ සිනාමුසු බැල්මකි. "අක්‍රියව සිටීමෙන් ඇරෙන්න වෙනත් කිසිම දේකින් මං වෙහෙසට පත්වෙන්නෙ නෑ වොට්සන්. මුළු උදේ වරුවම මං ගතකළේ මේ පොත කියවමින්. ඒකෙන් මට හැකිවුණා බුද්ධිය අවදිකරලා ප්‍රබෝධයක් ලබන්න." හෝම්ස් කීය.

"මොකක්ද ඒකෙ අවසාන ප්‍රතිඵලය?" මම ඇසීමි.

"මේ ක්ෂේත්‍රය අනෙකාගේ සිත් ඇදගන්නා එකක් පමණක් නෙමෙයි; ඇද බැඳ තබාගන්නා එකක්. මං මුලින් පයිප්පය දල්වා ගන්නට ඒක නිවී ගියා. පයිප්ප යළිත් දල්වා ගැනීම සඳහා මිනිත්තු දෙකකට පොත වහන්නවත් මට හිතුණේ නෑ. කාමරයේ වාතාශ්‍රය පිරිසිදු ඒකයි. ඔබ දැනගෙන හිටියද වොට්සන්, වැම්පයර්ලාගෙන් සෙවණැල්ලක් වැටෙන්නෙත් නැති බව?"

"ඔය ප්‍රශ්නය මට වෛද්‍ය විද්‍යාලයේදී කවදාවත් මතු වුණේ නෑ"

"ඒක ඔවුන් හඳුනාගැනීමට යොදාගත හැකි අපූරු ක්‍රමයක්. ඒ වගේමයි ඔවුන් කැටපතකින් දිස්වෙන්නෙත් නෑ"

"වෙන මොනවද?"

"තව හුඟක් දේවල් තියෙනවා. ඔවුනට පුළුවනි වෙනත් සතෙකුගේ වේෂයක් ගන්න......... වවුලෙකුගේ, බල්ලෙකුගේ, වෘකයෙකුගේ.... නැත්නම් පල්ගැටියෙකුගේ. ඊළඟට ඔවුනට පුළුවනි ව්‍යුහයක් නොමැති තරලයක් බවට හැරෙන්න; උදාහරණයක් හැටියට පුල්ලි සහිත දුමාරයක් වෙන්න, නැත්නම් වාෂ්පයක් වෙන්න"

මම සුරුට්ටුවක් දල්වාගතිමි. "ඒ වුණත් හෝම්ස් මේව ඔක්කොම මහ විකාර අදහස් නේ. මට නම් පේනෙන්නෙ නෑ......."

ඔහු පුටුවෙන් නැගිට්ටේ අතේ තිබූ පොත පසෙකින් තබමිනි.

"............ ඔය අදහස මොහොතකට ඔබේ ළඟම රඳවාගන්න වොට්සන්. මං මේ ඔබට සවන් නොදී අකාරුණික වෙන්න හදනවා නොවෙයි. මගේ රැවුල බා මං ඉක්මනින් සූදානම් වෙන්න ඕන"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ ගෙදරින් බැහැර යන්නද හදන්නෙ?" මා ඇසුවේ අසුනෙන් නැගිටීමට සූදානම් වෙමිනි.

"කරදර වෙන්න එපා මිත්‍රයා" ඔහු කීය. "මට හිතෙන හැටියට මට අද කාලය ගෙවීමට තියෙන්නේ බොහොම කම්මැලි ආකාරයකට. ඒක අන්තරායදායක කටයුතු වලින් තොරයි. ඔබට කාලය ගෙවාගැනීමට අපහසු වේවිද? එහෙනම් මං යෝජනා කරන්න කැමැතියි, මං කියවමින් හිටි පොත කියවලා බලන්න කියල." එසේ කියූ ඔහු නිවසින් පිටවී ගියේය.

මගේ මිත්‍රයාගේ කාරුණික ඔවදනට සැලකීමක් වශයෙන්, ඔහු කියවමින් සිටි පොතෙන් පිටු කිහිපයක් තුන් කියවීමට මම තීරණය කළෙමි. පළමුවැනි පරිච්ඡේදය කියවා අවසන් කළ පසු, එහි සඳහන්ව තිබූ කරුණු, මගේ සිතේ උනන්දුවක් ඇතිකිරීමට සමත් නොවීය. වෘකයන් හා බැඳුණු අධ්‍යාත්මාවලම්බන භූතාත්ම ස්වභාව, යන්තර ගුරුකම්, රාත්‍රියේ අසන්නට ලැබෙන විලාප ආදී මාතෘකා, මගේ සිත් ඇදගත්තේ නැත. උදේ කෑම වේලාව පසුවී තිබුණත්, උදේ ආහාර වේලක් එවන ලෙස හඩ්සන් මහත්මියට දැන්වීමි. උදේ කෑම කා අවසන් කොට, කෝපි පානය කරද්දී මගේ සිත යොමුවූයේ, හෝම්ස් හා මා ඇරඹූ ඉතා අසාමාන්‍ය පරීක්ෂණය වෙතය.

ෂර්ලොක් හෝම්ස් යනු කුමන ආකාරයක පුද්ගලයෙකුද යන්න, මම හොඳින් දැනසිටියෙමි. විවිධ විෂයන් පිළිබඳව ඔහු සතුව දැනුම් සම්භාරයක් තිබිණි. නොයෙක් අත්දැකීම් වලින් පරිණත බවක් ලබා සිටි ඔහු, කිසිසේත් මිථ්‍යා මතවලට ගොදුරු වන්නෙක් නොවීය. එසේ නම් කලින් ද රාත්‍රියේ "චාලු තෝනා" ගේ අඩවියේ මුහුණදුන් සිදුවීම නිසා, ඔහු හොල්මන් අවතාර වැනි දෙයට නැඹුරු වූයේ ඇයි? භූතාත්ම සමග කටයුතු කරන 'යකැදුරෙකු වීමට ඔහු උත්සාහගන්නේ ඇයි? මම සාමාන්‍ය බුද්ධියක් ඇති අයෙක්මි. එහෙත් මගේ මිත්‍රයාගේ බුද්ධි මට්ටම, මට වඩා ඉහළ තලයක තිබිණි. ඔහුගේ සිතුම් පැතුම් වලි ද එවැන්නක් දැකිය හැකි විය. ඔහු නිගමනයකට පැමිණි ආකාරය මට තේරුම් ගතහැකි වූයේ, කුඩා ළමයෙකුට මෙන් හෝම්ස්, කාරණයෙන් කාරණය මට සරලව පැහැදිලි කළ පසුය. මගේ මිත්‍රයා මට පැවසුවේ ඔහුගේ විනිශ්චය කෙරෙහි විශ්වාසය තබන්න ලෙසටයි. මම එසේ කරමි. ඒ තීරණයට



http://sherlockholmesinvestigations.blogspot.com

පැමිණි පසු මම ඔහුගේ පොත් රාක්කයෙන් පොතක් තෝරාගතිමි. ලෝකයේ ඉතිහාස ගතවූ කුප්‍රකට අපරාධකරුවන් පිළිබඳ වාර්තා පොතක් වූ එය කියවීමට පටන් ගතිමි. වරින්වර සුරුට්ටුවක් ද උරමින් පොත කියවද්දී කාලය නොදැනීම ගෙවී ගියේය.

ඉර බැසගොස් අඳුරු වැටෙද්දීත් මගේ මිත්‍රයා ආපසු පැමිණියේ නැත. ඔහු ඉක්මනින් ආපසු නො ආවොත්, හැම්ස්ටෙඩ් පිට්ටනියට ගොස් "වාටු නෝනා" ගැන සෝදිසියෙන් සිටීමට අපට අවස්ථාවක් නොලැබෙනු ඇත. මේ ගැන සිතද්දී එක් කරුණක් යළි යළිත් මගේ සිතේ රැව් පිළිරැව් දෙන්නට පටන්ගත්තේය. එනම් හැම්ස්ටෙඩ් වෙත අප දෙදෙනාගෙන් එක් අයෙකුට හෝ යා නොහැකි නම්, තත්ත්වය භයානක වන බවයි. අදත් අසරණ කුඩා දරුවෙකු "වාටු නෝනා" ගේ හිරිහැරයට ලක්වී මියයාමට වුවත් ඉඩ ඇත. ඉර බැස ගොස්, තවත් දෙපැයක් ගතවූ පසුත්, මගේ මිත්‍රයා ආපසු නිවහන වෙත පැමිණියේ නැත. තනිව හෝ හැම්ස්ටෙඩ් වෙත ගොස් මෙම භයානක අපරාධය වැළැක්වීමට මම තීරණය කළෙමි. සීතල සඳහා අඳින ලොම් කබායක් හැඳ, දෙකන් ද ආවරණය වන සේ හිස්වැස්මක් පැළැඳ, රිවෝල්වරය සාක්කුවේ දමාගෙන කුලීරියකින් හැම්ස්ටෙඩ් බලා පිටත්වීමි.

හැම්ස්ටෙඩ් මුඩුබිම සම්පූර්ණයෙන්ම පාළුවට ගොස් අන්ධකාරයේ ගිලී තිබිණි. ඒ හරියේ දී රිය නවත්වන මෙන් මම රියැදුරාට කීවෙමි. මෙන රාත්‍රියේ මෙම පාළු අඩවියට තනිව යාම, නුවණැති ක්‍රියාවක් නොවන බව ඔහු කීය. ඔහු තැත්කළේ මා ආපසු කැඳවාගෙන යාමටයි. එහෙත් මම එය ප්‍රතික්ෂේප කළෙමි. ඔහු බලාපොරොත්තු වූ කුලිය ගෙවූ වහාම රියැදුරා ආපසු ගියේය. "වාටු නෝනා" ගේ අපරාධ ගැන ඔහුට අසන්නට ලැබී ඇතුවා නොඅනුමානය. ඇගේ පළමුවැනි වැඩිහිටි ගොදුර නොවී, තම දිවි ගලවා ගත යුතු යයි ඔහුට සිතෙන්නට ඇත.

මම අන්ධකාරයේ තනිවූයෙමි. ක්ෂණිකව තීරණ ගෙන ක්‍රියාත්මක වන මගේ මිතුරා නොමැතිව, මා කර ඇත්තේ අනුවණ ක්‍රියාවක් නොවේද? ඒ බව මගේ හිත නොනවත්වාම කියන්නට පටන්ගෙන ඇත. දැන් ඉතින් මේ කටයුත්ත අත්හැර දමා ආපසු යාමට ක්‍රමයක් නැත. පිට්ටනියේ එක් කෙළවරක වූ ගෑස් ලාම්පුවෙන් එළිය විහිදුණු රවුම පසුකොට, මම අන්ධකාරය දෙසට ගමන් කළෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

මා එසේ ගමන් ඇරඹුවා පමණි. එක්වරම මගේ දෙසවණට වැටුණු ශබ්දයෙන් මගේ ඇඟ සීතල වී හිරිවැටී ගියේය.

මුලින් එය ඈතින් ඇසුණේ හැඳිනිය නොහැකි නොපැහැදිලි හඬක් ලෙසය. මීළඟට එය මරණීය තුවාල ලැබූ සතෙකු පදික වේදිකාව දිගේ බඩගාගෙන එන්නාක් මෙන් ඇසිණ. මීළඟට ක්‍රමයෙන් ඒ ශබ්දය වෙනස් වූ බව හඳුනාගත්තෙමි. කුඩා ලෝහමය රෝද තාරපාර මත ගමන්කරන හඬක්ද? කවුරුන් හෝ පියානෝවක් එහි ලෝහ රෝද මත පාර දිගේ තල්ලුකරගෙන එනවා විය යුතුය. ශබ්දය ක්‍රමක්‍රමයෙන් වැඩිවී මා අසලටම පැමිණි බව මම තේරුම් ගත්තෙමි.

මගේ හදවත වේගයෙන් ස්පන්දනය වන්නට පටන්ගත්තේය. මෙහි එද්දී මම ලන්තෑරුමක් ගෙන ආවෙමි. එහෙත් මෙතෙක් එය පාවිච්චි කිරීමට අමතක වූ බව සිහිවූයේ මේ මොහොතේදීය. ලන්තෑරුමේ කළු ආවරණය පසෙකට ඇද, එහි කහපැහැති ආලෝක කදම්බය ඉදිරියට යොමු කළෙමි. මීළඟට රිවෝල්වරය අනෙක් අතට ගෙන ඕනෑම මොහොතක වෙඩිතැබීමට සූදානම් වීමි.

මගේ දෙපා අසලට එය ළඟාවෙද්දී ගල් පොළොවේ ඇතිල්ලුණු යකඩ රෝද වලින් නැඟුණේ කනට ඉතා අමිහිරි ශබ්දයකි. මම ඒ දෙසට රිවෝල්වරය එල්ල කරගෙන සිටියෙමි.

"ලොක්කා!" අඳුරේ සිට කවුදෝ කියනු ඇසිණ. "පරණ සොල්දාදුවෙකුට පිනට සිලිමක් දෙන්න පුළුවන්ද?"

"මෙසේ කී පුද්ගලයා දෙසට ලන්තෑරුම ළං කොට මම මහත් පුදුමයෙන් බලා සිටියෙමි. ඔහු කුඩා යකඩ රෝද තිබූ පෙට්ටියක් වැනි ලී කරත්තයක වාඩිවී සිටියේය. ඔහු පැළඳ සිටියේ ගෙවීගිය පරණ කැප් තොප්පියකි. දික්වුණු, පැසුණු, කෙස් රැසක් තොප්පියට යටින් එළියට ඇදී තිබිණ. එයට පහළින් පෙනුණේ නොකඩවාම මත්පැන් පානය කිරීම නිසා රතුවුණු මුහුණකි. මේ වෙලාවේ ද ඔහු පදමට වෙරිවී ඇතැයි මට සිතිණ. ඔහු ආබාධිත පුද්ගලයෙකු බැව් මා දුටුවේ මේ මොහොතේදීය. කකුල් දෙකක් වෙනුවට කරත්තය ඉදිරිපස තිබුණේ දණහිස දක්වා වූ කකුල් කොට දෙකක් පමණි. ඔහු යුද්ධයේදී ආබාධිත පුද්ගලයෙකු විය යුතුය. රළු සමක් සහිත අත ඔහු ඉදිරියට දිගු කරගෙන සිටියේ ජීවිත කාලයම සිඟා කා හුරුපුරුදු පුද්ගලයෙකු විලසිනි. මා හයට පත්කළ මේ අද්භූත පුද්ගලයා,



http://sherlockholmesinvestigations.blogspot.com

ආබාධිත අසරණ රණවිරුවෙක් බව දැනීම මට සැනසීමක් විය. මම කුවුන් එකේ කාසියක් ඇද ඔහුට දුන්නෙමි.

"ලොක්කා, ඔබට දෙවියන්ගේම පිහිටයි" ඔහු කීවේ තම අපිරිසිදු කබායේ උඩ සාක්කුවට කාසිය ඔබා ගනිමිනි. "සුමාන ගණනකින් මට හොඳ කෑම වේලක් කන්න ලැබුණේ නෑ. ඒ ඔක්කොටම හරියන්න, අද රෑට කනවා නියම භෝජනයක්" එසේ කී ඔහු තම දෑත් පෙට්ටියේ දෙපැත්තට දමා බිම ගසමින්, කරත්තය තල්ලු කරගෙන ඉදිරි අන්ධකාරයට ඇදී ගියේය. ගැහැනියක මෙන් බියට පත්වීම ගැන ලැජ්ජාව මිශ්‍ර සැනසුම් හැඟීමෙන් මම බලාසිටියෙමි.

කළු ආවරණයෙන් ලන්තෑරුමේ එළිය වසා දමූ මම, යළිත් වරක් පිට්ටනියේ පඳුරු අතර වූ අඳුරු තැනකට පිවිසියෙමි. මෙම ස්ථානයේ මට දැනුණේ අධික සීතලකි. ඝන මීදුමක් පොළොව මට්ටමෙන් ඉදිරියට ගලා ආවේය. යන්තමින් තිබූ සඳ එළියෙන් පෙනුණේ මීදුමෙන් නොවැසුණු, ගස්වල ඉහළ කොටස් පමණි.

කලින් ද රාත්‍රියේ "වාටු හෝවා" ගේ ගොදුරක් බවට පත්වූ අසරණ දරුවෙකු අපි සොයාගත්තෙමු. එතැනට යාම මගේ අරමුණ විය. මගේ මිත්‍රයාගේ මඟපෙන්වීම නොමැතිව එතැන සොයාගැනීම පහසු කරුණක් වූයේ නැත. කිහිපවතාවක්ම වැරදි තැන්වලට ගොස් ආපසු හැරී, අන්තිමේදී නිවැරදි තැනට ළඟාවීමි. ෂර්ලොක් හෝම්ස් සමග දීර්ඝ කාලයක් තිස්සේ මා යෙදුණු පරීක්ෂණ වලින්, අපරාධකාරයින්ගේ පුරුදු ගැන මට යම් වැටහීමක් තිබිණ. එක්වරක් ඔවුන් අපරාධයක් කළ තැනකට, යළිත් වරක් පැමිණීම සිරිතකි. කලින් ද රාත්‍රියේ සුදු හැඳගත් කාන්තාව අදත් එහි නොපැමිණීමට හේතුවක් නොමැත. මේ අදහස් සිතැතිව, මම පඳුරුවලින් වැසුණු අතුලක් ඇතුළේ සැඟවී නොඉවසිල්ලෙන් බලාසිටියෙමි.

මට බොහෝ වේලාවක් බලාසිටීමට සිදුනොවීය. මුලින්ම මට දැනුණේ මා අවට පරිසරයේ සිදුවන වෙනස්වීමකි. මීළඟට මගේ සිරුරට දැඩි අපහසුතාවයක් දැනිණ. මගේ ඇඟ බියෙන් වෙව්ලා රෝමෝද්ගමනය වෙද්දී මම රිවෝල්වරය අතට ගෙන සූදානම් වීමි.

මට එය දක්නට ලැබුණේ එවිටය.

එක්වරම මා දුටුවේ හැඩයක් නොමැතිව අහසේ පාවී ආ සුදු පැහැති යමක් පමණි. එය අඳුරේ තිබූ තද කළු පැහැති ගස් අතරින්



http://sherlockholmesinvestigations.blogspot.com

මීදුම මත අවතාරයක් මෙන් පාවී ආවේය. මඳ වේලාවක් ගතවෙද්දී ඒ ඡායාව කාන්තාවක් බව මට හඳුනාගැනීමට හැකිවිය. එය තව තවත් මා දෙසට ළංවෙද්දී, දසුන වඩාත් පැහැදිලි විය. ඇය ඇගේ දෑතේ යමක් ඔසවාගෙන සිටියාය. කුඩා දරුවෙකු දුර්වල හඬින් කළ හැඬීමක් මගේ දෙසවනට වැටිණ. සිදුවන්නේ කුමක්ද යන්න තේරුම් ගත් මගේ සිතේ ඇතිවූයේ, වාවාගත නොහැකි ශෝකයකි. වහා පඳුරු අතරින් නැගිට ගොස්, මම ඇයට රිවෝල්වරය එල්ල කොට කෑගැසීමි.

"ඒයි නැවතියන්!"

මෙතෙක් වේලා පැවැති නිහඬතාවය බිඳගෙන මගේ කටින්ම නිකුත් වූ තර්ජනාත්මක හඬට මම ද තිගැස්සුනෙමි.

බිහිසුණු අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට හෝම්ස් සමග යෙදුණු ත්‍රාසජනක අවස්ථා වලට මම ද සහභාගී වී ඇත්තෙමි. එහෙයින් ඕනෑම භයානක තත්ත්වයකට මුහුණදීමට මට පලපුරුද්දක් තිබිණි. එහෙත් එද රාත්‍රී හැම්ස්ටෙඩ් පිට්ටනියේ මා මුහුණදුන්නේ ඉතා අප්‍රසන්න අත්දැකීමකටය. මට දකින්නට ලැබුණු මුහුණ මගේ සිතේ ඇති කළේ, ඇඟ කිළිපොළා යන භීතියක් හා පිළිකුළකි. ඇයට තිබුණේ සිනිඳු සමක් හා රන්වන් පැහැති කෙස් වැටියකි. එහෙත් කෝපාවිෂ්ය වූ ඇගේ විශාල දෙනෙතින් පිළිබිඹු වූයේ වෛරයයි. උගුලක අසුවූ සතෙකුගේ මෙන් ඇගේ දෙතොල් දෙපසට ඇදී ගියේය. එයින් නිරාවරණය වූයේ සුදු පැහැති උල් දත් පෙළකි. ඇගේ රදනක දත් සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේට වඩා වෘකයෙකුගේ මෙන් දිගුව උල්ව පිහිටා තිබිණි. බලලෙකු විසින් මරාගත් ගොදුරක්, වෙනත් සතෙකු විසින් පැහැරගන්නට තැත්කරද්දී කෝපයෙන් පිඹින්නාක් මෙන්, හඬක් ඇගේ උගුරෙන් නිකුත්විය. එයින් තිගැස්සුණු මම අඩියක් පිටිපසට ගත්තෙමි.

මගේ ග්‍රහණය ලිහිල් වූ බව දුටු නිසාදෝ, ඇගේ මුහුණේ හැඟීම් වෙනස් විය. දැස් වලට නැගුණු වෛරය අතුරුදන් විය. රතු දෙතොලින් රුදුරු දත් වැසී ගියේය. තම දෑතේ වූ පොදිය බිම තැබූ ඇය, ප්‍රේමාන්විත සිනාවක් පා, ඇගේ අත් මා දෙසට දිගු කළාය. ඇගේ මුහුණේ රූපශෝභාවෙන් මම ඇයට වසඟවුණෙමි. මට සියල්ල අමතක විය. ඇය මා වෙත යොමු කළේ ආදරවන්ත බැල්මකි. මගේ අතේ තිබූ රිවෝල්වරය බිම වැටෙන හඬ මට ඇසිණ. ඇය ඉදිරියට පාවී අවුත් මගේ දෑත් වලින් අල්ලා ගත්තාය.



http://sherlockholmesinvestigations.blogspot.com

"නවතිනු!"

කැලැරොදේ නිහඬතාවය බිඳදමමින් කිසිවෙකු ගුගුරනු ඇසිණ. ඇය පිටුපසට පැන්නාය. ඇගේ මුහුණ යළිත් වරක් විරූපී විය. ඇය නැවතත් කෝපාවිෂ්ට වූ බැව් මම දුටුවෙමි. විෂඝෝර සර්පයෙකු මෙන් ඇය කෝපයෙන් පිඹීමට පටන්ගත්තාය.

"අපවිත්‍ර දුෂ්ට හැතිරිය! මෙතැනින් පලායං යන්න වහාම!" මා පිටිපස සිට කෑගැසුවේ වැරහැලි හැඳ සිටි උස මිනිසෙකි. මේ ඇඳුම මට හඳුනාගත හැකිවිය. ස්වල්ප වේලාවකට පෙර කරත්තයක නැඟී ගිය, දෙපා අහිමි වයසක යුදභටයා හැඳ සිටියේත් මේ වැරහැලි ඇඳුම නොවේද? ඔහුගේ දෙපා අසල පෙට්ටි කරත්තය තිබෙනු මම දුටුවෙමි. ඔහුට දැන් දෙපා ඇති නිසා කරත්තය අනවශ්‍යය. අඩ සිහියෙන් සිටි නිසා, මේ මගේ මනසට මැවෙන විකාර සිහිනද? ඒ හුරුපුරුදු කටහඬකි. මගේ සිහිමද ගිහිය නිසා, ඒ කාගේ කටහඬදැයි මට හඳුනාගැනීමට නොහැකි විය. ඔහු ඉදිරියට දිගු කරගෙන සිටි දකුණු අතේ, සඳ එළියෙන් බැබළෙන යමක් දුටුවෙමි. ඒ පිහියක් හෝ ගිනිඅවියක් වැනි ආයුධයක්ද? සමීප වී බැලීමේදී ඒ රිදියෙන් තැනූ කුරුසියක් බව මම දුටුවෙමි. මගේ සිහි විකල් වී ඇතැයි මට සිතිණ.

අලුතෙන් ආ තැනැත්තා අතේ වූ කුරුසිය දුටු වහාම කාන්තාවගේ දෙනෙත් වල වෙනසක් ඇතිවිය. මුලින් ද්වේෂය පිරවූ දෑසෙන් දැන් කියැවුණේ භීතියයි. තම දෑත් වලින් මුහුණ ආවරණය කරගනිමින්, ඇය යළිත් වරක් පිඟින ශබ්දය පිටකළාය. අනතුරුව කෝපය හා තැතිගැනීම පිළිබිඹු හඬක් ද නගා, අඳුර වෙත පැන එක්වරම අතුරුදන් වූවාය.

සිහි විකල් වීමට සමීප තත්ත්වයකට පත්ව සිට, යළිත් සාමාන්‍ය තත්ත්වයට පත්වෙද්දී ඇය අත්හැර දමා ගොස් සිටි පිරිමිදරුවා දුටුවෙමි. අවුරුදු පහක් හෝ හයක් වයසැති ඔහු මුහුණපෑමට වූ සිදුවීම නිසා, භීතියෙන් සුදුමැලිව සිටියේය. ඔහුගේ කමිස කොලරය පහත්කොට ගෙල්ල පරීක්ෂා කළෙමි. "වාටු නෝනා" ගේ ග්‍රහණයෙන් මා ගලවාගත් උස මිනිසා එතැනට පැමිණ මා අසල දණගසා ගත්තේය.

"ඔහුගේ උගුර දෙපසත් තුවාල තියෙනවද වොට්සන්?"

ඒ කටහඬ මම හඳුනාගතිමි. ඒ මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස්ය.



http://sherlockholmesinvestigations.blogspot.com

"තුවාල මොකුත් නෑ" මම කීවෙමි.

"ඔහුට දැන් ටිකෙන් ටික සිහිය එනවා"

"දෙවියන්ට ස්තූතිවේවා. අපි හොඳ වෙලාවටයි ආවේ. ඉතින් ඔබට කොහොමද මිත්‍රයා? ඔබටත් අනතුරක් නෑ නේද?" ඔහු ඇසීය.

"මට මොකුත් නෑ. ඒ වුණත් කෝ අර හිගන්නා?"

හෝම්ස් සිනාවෙන්නට පටන්ගත්තේය. මීළඟට ඔහුගේ මුහුණ හැකිළී ගියේය. ඔහු කථාකරන්නට පටන්ගත්තේ, මගෙන් කාසියක් ලබාගත් ආබාධිත සෙබළාගේ කටහඬෙනි.

"ලොක්කා! මගේ මාව හෙව්වද?" බලන්නකෝ හොඳ කැම වේලකින් ලැබෙන ප්‍රයෝජනය. නැඳුණු කකුල් දෙක වෙනුවට මට ආපහු අලුත් කකුල් දෙකකුත් ලැබුණා"

"ඔබ තෝරාගෙන තියෙන්නෙත් ඔබට හුදුසුම රැකියාව නෙමෙයි හෝම්ස්" මම කීවෙමි. "ඔබ අපරාධ පරීක්ෂකයෙක් වෙන්න ගත් තීරණයෙන්, ඇත්තෙන්ම පාඩුව වුණේ නාට්‍ය ක්ෂෙත්‍රයට"

මා කියූ දෙය ගැන ඔහු උනන්දුවක් දැක්වූයේ නැත. "වොට්සන්. ඔබ මේ රාත්‍රියේ කළේ මහ අමෝඩ වැඩක්. ඇත්තෙන්ම මෝඩ ක්‍රියාවක්"

මම ඒ ගැන වාදකිරීමට නොගියෙමි. ඔහු කියූ දෙයට මම සම්පූර්ණයෙන්ම එකඟ වූයෙමි. සුදු ඇඳගත් කාන්තාව ගැන මට එක්වරම සිහිවිය. "හෝම්ස් වාටුනෝනා අපෙන් බේරිලා පැන යනවා නේද?"

"ඒකෙන් එච්චර ප්‍රශ්නයක් නෑ" ඔහු කීය. "ඒ මොකද මං දන්නවා ඇය ගිහින් නවතින්නේ කොහේද කියලා" ඔහු මගේ උරහිසට උඩින් මහාමාර්ගය දෙස බලාසිටියේය. "පොලිස් භටයෙක් මේ පැත්තට එනවා. වොට්සන්. අපි දෙන්නා මේ රාත්‍රියේ පිට්ටනියේ නිදහසේ ඇවිදින්න ආ අය. අපට මේ කුඩා දරුවා අහම්බෙන් හමුවුණා. ඒ ටික මතකයි නේද?"

පොලිස් භටයාගේ සිතේ අප ගැන ඇතිවූයේ සැකයකි. එහෙත් මගේ මිත්‍රයා පැවසුවේ පාරේ ඇවිදිමින් සිටි අපි, අසරණ දරුවා හඬනු අසා ඔහුගේ පිහිටට ආ බවය. එය ඒත්තු ගැන්වීමට හෝම්ස් සමත්විය. අවශ්‍ය නම් ඊළඟ දවසේ පොලිස් ස්ථානයට පැමිණ සිද්ධිය ගැන සම්පූර්ණ විස්තරයක් ලබාදිය හැකි බව ඔහු කීය. දරුවා පොලිස්භටයා භාරයේ සිටියදී අපි හැම්ස්ටෙඩ් පිට්ටනිය හරහා ඉක්මනින් ඇවිද ගියෙමු.



http://sherlockholmesinvestigations.blogspot.com

"හෙමින් යමු වොට්සන්. හෙමින්!" හෝම්ස් කෙඳිරිලි හඬින් කීවේ මගේ ගමන ඇවිදීමකට වඩා දිවීමකට සම්පවුණු නිසා විය යුතුය. "මිනිහා තවමත් අප දිහා බලාගෙනයි ඉන්නේ. ඔහුගේ හිතේ සැකයක් ඇතිවෙන දෙයක් අපි අතින් කෙරුණොත්, අපි අමාරුවේ වැටෙනවා. පොලිස්කාරයින් කියන්නේ එච්චර මොලයක් තියෙන අය නෙමෙයි. ස්කොට්ලන්ඩ්යාඩ් එකත් එක්ක කාලයක් තිස්සේ කළ ගනුදෙනු වලින් ඒක මං හොඳට දන්නවා. වාටු නෝනාගේ වැඩ අපි පටන්අරගෙන කියල, අපව අල්ලාගෙන ගිහිං පොලිස්කූඩුවට දමාවි"

මේ වන විට මගේ සිතේ තිබූ කැලැඹීම පහව් ගොස්, සිතේ කුතුහලයක් ඇතිවෙමින් තිබිණි. මිනිත්තු කිහිපයකට පෙර "වාටු නෝනාට" වසඟ වී මඟ මරණයේ දොරටුව කරා ගියෙමි. මගේ මිත්‍රයාට පින්සිදුවන්නට මට ජීවිතය බේරාගැනීමට හැකිවිය. දැන් මට අවශ්‍ය වූයේ මිළඟට සිදුවන්නේ කුමක්ද යන්න දැනගැනීමටයි.

"කොහේද හෝම්ස් අපි මේ යන්නේ?" මම ඇසීමි. "විදි කුරුසයකට හැකිවුණේ කොහොමද මේ බිහිසුණු උවදුරට මේ තරම් බලපෑමක් කරන්න? මේක මට කොහොමවත් තේරුම් ගන්න බැරි ප්‍රහේලිකාවක්"

"ඉවසන්න මිත්‍රයා ඉවසන්න. හෙට උදේට ඉරපායන්න කලින් මේ හැමදෙයක්ම ඔබට තේරුම් කර දෙන බවට මං පොරොන්දුවෙනවා"

පැයකට නොඅඩු කාලයක් අපි ඉදිරියට ඇවිද ගියෙමු. විටෙක අඳුරු වලාකුළු වලින් සඳ වැසී ගියේ, අවට අන්ධකාරයෙන් වසාලමිනි. පිට්ටනිය හරහා සෑම අතකටම තිබූ අඩිපාරවල් රැසකි. අප කළුවරේ ගමන් කළේ අඩි පාරවල් මතින්ද තණකොළ උඩින්ද යන්න මට වෙන්කරගත හැකි වූයේ, පාද බිම ගැටෙන හඬ අනුව පමණි.

"වොට්සන්. ලන්තෑරුම දිගටම අඳුරු කරල තියාගන්න. අපේ ගමනට ඒකෙ එළිය උදව්කරගන්න හැටියක් නෑ. ඒ මොකද එහෙම කළොත් අපේ ගමන ගැන වෙනත් කෙනෙකුට බලාගන්න පහසුවෙනවා." ඔහු කීය.

මගේ මිත්‍රයා ඔහුගේ ගමන්වේගය අඩු කළේ ද නැත. අප යන්නේ කොතැනකටද යන්න ගැන මේ වනවිටත් හෝම්ස් නියවින



http://sherlockholmesinvestigations.blogspot.com

නිරණයකට පැමිණ ඇති අයුරක් මම දුටුවෙමි. අන්තිමට අප පැමිණ නැවතුණේ අඩිහයක් පමණ උස් වූ වැටක් අසලය. උල් යකඩ කූරු වලින් සාදා තිබූ වැට මුදුනේ, පහතට නැමුණු යකඩ උල් පේළියක් ද වැටට පාස්සා තිබිණි. සඳ වසාගෙන තිබූ වලාකුළු මේ මොහොතේ ඉවතට පාවී ගියේය. අප පැමිණ සිටියේ කොතැනකටද යන්න සඳ එළියෙන් දුටු විට මගේ ඇඟ හිරිවැටී ගියේය. අප සිටියේ සොහොන් පිටියක වැට අයිනේය!

"දවල් කාලෙදී නම් මේ වැට මේ තරම් උස බවක් මට පෙනුණේ නෑ" හෝම්ස් කීය. "ඒ වුණත් මං හිතන්නේ ඔබේ උදව් ලැබුණොත් මට එහා පැත්තට පනින්න පුළුවන් වෙයි"

"මොනවා හෝම්ස්? ඔබ දැන් ඇත්තටම එහෙම දෙයක් කරන්න ද සූදානම් වෙන්නේ?"

"නැතුව මං විහිළුවක් කළා කියල හිතුවද වොට්සන්? නගින්න තියෙන්නේ අඩි හයක් උස වැටකුව. මැදිවියේ මම එහෙම දේකට උදව් ඉල්ලන්නේ ඇත්තටම" —

"මොනවද මං කරන්න ඕනෑ?"

"දැත් වලින් යමක් තදින් ග්‍රහණය කරගන්න වඩාත් හොඳ හැකියාවක් තියෙන්නේ මට" මගේ මිතුරා කීය. "මුලින්ම මං ඔබේ කරට නගිනවා. ඒ උදව්වෙන් මං වැට මුදුන අල්ලාගෙන ඒ උඩට නගිනවා. ඒක වඩාත් නුවණට හුරුයි නේද වොට්සන්?"

"හ්ම්"

"වැට උඩට නැග්ගට පස්සේ, මං ඔබට අතදෙන්නම්. මං රාත්තල් එකසිය හතලිහක් බර කෙනෙක්. තත්පර කිහිපයකට එච්චර බරක් රඳවාගන්න ඔබේ කොන්ද ඔරොත්තු දෙයිද? ඔබ ඇෆ්ගනිස්ථානයේදී ලබා ඇති තුවාල ගැන මට අමතක නෑ. එහෙම ආබාධයකුත් තියෙන නිසා.............. මං ඔබේ කරට නගින එක හරිද මන්ද.....?"

ඔහු ඒ ඉල්ලීම කළ ආකාරයෙන් මට එය ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් නොවීය. මම මදක් පහත්ව කොන්ද නමාගෙන සිටියෙමි. හෝම්ස් මගේ පිටට පා තබද්දී මට කෙඳිරි ගෑවිණි. එහෙත් තත්පර කිහිපයකදී ඔහු වැටේ යකඩ කොකුවල එල්ලී හරස් යකඩ කූරක් මතට නැග ගත්තේය. මීළඟට පහතට දිගු කළ ඔහුගේ අතක එල්ලී මම ද මුදුනට ඇදුණෙමි. මිනිත්තුවක් ගතවෙද්දී අප



http://sherlockholmesinvestigations.blogspot.com

දෙදෙනා සොහොන් බිම ඇතුළට පැන අවසන්ය. දැන් අපේ තනි නොතනියට සිටියේ මළවුන් පමණි.

මෙවැනි වෙලාවක නොයෙක් බහුබූත සිතේ මවාගෙන, සිතේ කැලඹීමක් ඇතිකරගන්නා පුද්ගලයින් මම දැක ඇත්තෙමි. මා එවැනි කෙනෙකු නොවේ. එහෙත් සොහොන් පිටියේ කිරිගරුඬ ස්මාරක මැදට වී සිටි මම, සුළඟෙන් සෙලවුණු සයිප්‍රස් අතු වලින් නැඟුණු හඬෙන් පවා සසල වීමි. මෙහි සාමාන්‍යයෙන් සැතපෙන දහස් ගණනකගේ ආත්ම, අප එහි යාම ගැන විරෝධය පළකර හඬ නගනවා යයි මට සිතිණ. අන්ධකාරයට වී අප දෙසට නෙත් යොමු කරගෙන, අප ගැන සෝදිසියෙන් නෙත් කීයක් ඇත්ද? මගේ සිතේ ඇතිවූයේ තැතිගැන්මකි. හදිසියේම එක් යෝධ සයිප්‍රස් ගසක් මුදුනෙන් අසන්නට ලැබුණු ශබ්දයෙන් මම තිගැස්සීමි. ඒ ගසකින් ගසකට පියාඹූ විශාල වවුල් රැළක් බව මම පසුව දුටුවෙමි. සාක්කුවට අත දමා රිවෝල්වරය තිබේදැයි මම බැලීමි. එය සීතලට දැනුණත්, එහි ස්පර්ශය මගේ සිතේ ඇතිකළේ සැනසීමකි.

සොහොන් බිමට වැටුණු මඳ එළියෙන්, අප ඉදිරියේ වූ කුඩා ගොඩනැගිල්ලක් වැනි තැනක් දිස්විය. පසුබිමෙන් තිබුණු මීදුම හා ඝනඅඳුර මැදින්, ගොඩනැගිල්ලේ වහලත් කිරිගරුඬ බිත්තිත් මම දුටුවෙමි. මා දෙසට හැරුණු මගේ මිතුරා, තම උඩුතොල මත දබරැඟිල්ල තබා, කථානොකර ඉදිරියට එන මෙන් මට සංඥා කළේය.

"ඔබේ ලන්තෑරුම අපට මෙතැනදී ප්‍රයෝජනවත් වෙනවා වොට්සන්" හෝම්ස් මගේ කනට කෙඳිරුවේය. ඒ අප එම ගොඩනැගිල්ලේ දොර අසලට පැමිණි පසුවය.

"කරුණාකරල ලන්තෑරුමේ එළිය මේ දොරේ අගුලට හොඳට වැටෙන්න අල්ලන්න. බලමු ගෙවල් බිඳින හොරෙකුට තියෙන දක්ෂතාවය මටත් තියෙනවද කියල." කී ඔහු සාක්කුවෙන් කුඩා පසුම්බියක් එළියට ගත්තේය. එහි තිබුණේ කුඩා ආයුධ කට්ටලයකි. එය විවෘත කළ මගේ මිතුරා දොරේ අගුල ඇරගැනීමට සුදුසු ආයුධය තෝරා ගැනීමට අගුල දෙස නෙත් යොමු කළේය.

"හා හෝ! මේ මොකද මේ?" ඔහුට කියැවිණි. "කවුරු හරි දොරේ අගුල ඇරල"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන් මොකක්ද හෝම්ස්?" මම ඇසීමි. මවිතයට පත්ව සිටි මට, මගේ මිත්‍රයා කලින් දුන් උපදෙස් අමතක වී තිබිණ. මා ඔහු ඇමතුවේ කෙඳිරිලි හඬෙන් නොව උස් හඬෙනි.

"දැන් ඉතින් රිවෝල්වරය සූදානම් කරගන්න" හෝම්ස් ඉතා සෙමෙන් කීය. මගේ නොසැලකිලිමත් ක්‍රියාව ගැන ඔහුට තරහ ගිය බව මම තේරුම් ගතිමි.

"මේක ඇතුළෙ මොකක් හරි බිහිසුණු කටයුත්තක් සිදුවෙමිනුයි තියෙන්නෙ" කී ඔහු අගුළ ඇරීමට ගත් ආයුධ පසුම්බිය සාක්කුවට ඔබාගත්තේය.

ඔහුගේ නියෝගයට මම වහා කීකරුවීමි. ඊට අමතරව ලන්තෑරුමේ එළිය නොපෙනෙන ලෙස, එහි කළුපාට ආවරණය ඉදිරියට කරකැවීමි. මගේ මිත්‍රයා ඉතාම සෙමින් දොර ඉදිරියට තල්ලු කළේය. අපේ වාසනාවකට මෙන් දොරේ සරනේරු මල කා නොතිබූ බැවින්, හඬක් නොනැගාම දොර විවෘතවිය.

සොහොන්ගෙය ඇතුළත වූයේ දීප්තිමත් ආලෝකයකි. බලාපොරොත්තු නොවූ දීප්තියෙන් ඇස් බොඳපෙනී ගිය නිසා, මම දකුණතින් දෙනෙත් ආවරණය කරගතිමි. දෙනෙත් එම ආලෝකයට හුරුවෙද්දී මට දකින්නට ලැබුණේ ඉතාම බිහිසුණු දර්ශනයකි. එයින් භය වූ මම එක්වරම තිගැස්සුණෙමි. තව ටිකෙන් මගේ අතේ වූ ලන්තෑරුම ද බිම වැටෙන්නට ඉඩ තිබිණි.

බියෙන් සිත කැළඹූ එම දර්ශනය මම කෙසේ විස්තර කරම්ද?

සොහොන් ගෙය කෙළවර පුද්ගලයෝ කිහිපදෙනෙක් සිටියහ. ඔවුන් සිටියේ, දිග මේසයක් වටවූ යම්කිසි දෙයක් වෙත නෙත් යොමුකරගෙනය. එක්වරම මගේ සිතට නැගුණේ ශල්‍ය වෛද්‍යවරයෙකු කළ ශල්‍යකර්මයක් නරඹන සහෝදර වෛද්‍යවරුන් පිරිසකි. එහෙත් ශල්‍යාගාරයක වෛද්‍යවරුන් මෙන් නොව, ඔවුන් හැමදෙනෙකුම සැරසී සිටියේ කළු පැහැති ඇඳුමෙනි; ඒත් එක් පුද්ගලයෙකු හැර. මැදින් සිටි තරුණයා ඔහුගේ කළු කබාය ඉවත්කර සිටි බැවින් ඔහු හැඳ සිටියේ සුදු කමිසයක් බව මම දුටුවෙමි.

අප මේ සොහොන්ගෙය තුළට ඇතුළු වූ බව ඔවුනට නොදැනුණු සැටියකි. ඒ තරමටම දැඩි අවධානයකින්, ඔවුනු ඒ බැරෑරුම



http://sherlockholmesinvestigations.blogspot.com

කටයුත්තේ යෙදී සිටියහු, දෙවියනි! ඒ නම් පුදුමාකාර කටයුත්තක් නොවේද? දැන් අවුරුදු හතක් ගතවී ඇතත් එද රාත්‍රියේ දුටු අයුරින්ම, එය මගේ මනසයේ තවමත් සිතුවම් වී ඇත.

ඔවුන් ඉදිරියේ මේසය මත තිබූ ඒ දේය මිනීපෙට්ටියකි. ඒ තුළ සිටියේ කාන්තාවකි. සැටින් රෙද්දෙන් ඇසූ කොට්ටයක් මත හිස තබාගෙන, අලංකාර සුදු ඇඳුමකින් සැරසී. දැන් එකිනෙක පටලවාගෙන එහි සිටි සුන්දර කාන්තාව මම හඳුනාගත්තෙමි. ඒ මීට ස්වල්ප වේලාවකට පෙර මා 'වෙටා' ගැනීමට උත්සාහ කළ තරුණියමය. මීට මොහොතකට මෙපර නිදි ලොවට පිවිසි විලසින් ඇය දෙනෙත් වසාගෙන සිටියාය. කබාය ඉවත්කරගෙන සිටිනු මා දුටු තරුණයා, ඇය ඉදිරියේ සිටගෙන සිටියේය. ඔහුගේ අතේ අඩි දෙකක් පමණ දිගු වූ ලීයෙන් තැනූ උලක් විය. එහි උල් කෙළවර ගින්නෙන් පුළුස්සා තිබූ හැවින් කළු පැහැ ගැන්වී තිබිණි. ඔහු එක් අතකින් ඒ ලී උල අල්ලාගෙන සිටියේ, හරියටම ඇගේ හදවත ඉදිරියෙනි.

අවුල් වූ සිහිින් සිටි මා, දකින්නට ලැබුණු දේවල් තේරුම් ගැනීමට උත්සාහ ගන්නා පමණින්, එක්වරම දම් වේගවත් චලනයක් මම දුටුවෙමි. තරුණයාගේ මෙතෙක් මා නොදුටු අනෙක් අතේ තිබුණේ ලී මිටියකි. එය ඉහළ සිට පහළට වේගයෙන් එල්ල විය. මිටි පහර එල්ල වූයේ ලී උලේ උඩ කෙළවරටය.

සොහොන් ගෙය දෙදරවමින් මහා බිහිසුණු විලාප හඬක් නැගෙන්නට විය. මිටියෙන් පහර දෙකක් හෝ තුනක් ලී උල මතට එල්ලවිණි. එවිට ලී උල ඇගේ පපුව පසාකරගෙන ඒ තුළට ගිලා බැස්සේ, වතුර මලකින් මෙන් ලේ විහිදුවමිනි. මිනීපෙට්ටියේ වූ මළසිරුර ඒ මේ අතට ඇඹරෙන්නට පටන්ගත්තේ, ඇණයකින් ලෑල්ලකට සවිකළ දවැන්ත සර්පයෙකු විලසිනි. ලී මිටි පහර එල්ල වෙද්දී, ඇගේ විලාපය බිහිසුණු තත්වයෙන් ද තීව්‍ර බවෙන් ද වඩාත් වැඩිවිය. මිනීපෙට්ටියේ ඉහළ කෙළවරේ නැගිට සිටි වයස්ගත පුද්ගලයෙක්, පොතක් දිගහැරගෙන සිටි අයුරු මම අහම්බෙන් මෙන් දුටුවෙමි. මේ බිහිසුණු දර්ශනය වෙත දෙනෙත් යොමුවී තිබූ නිසාම, ඔහු කළේ කුමක්ද යන්න මා හරිහැටි දුටුවේ මිනිත්තු කිහිපයකට පසුවය. යාච්ඤා ග්‍රන්ථයක් වූ එම පොත දිගහැර ගත් වයස්ගත තැනැත්තා, එහි පාඨ නොනවත්වාම ජප කළේය. මඳ වේලාවකදී විලාප සියල්ල නැවතුණු බැව් මම දුටුවෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

මේ දර්ශනයෙන් මා පමණක් නොව හෝම්ස් ද භීතියට පත්විය. සම්පූර්ණයෙන්ම සුදුමැලි වී සිටි ඔහුගේ කට තදින් වැසී තිබිණි. කෙසේ වෙතත් කලබලය අවසන් වූ වහාම හෝම්ස් ඉදිරියට පා නැඟුවේය. එක්වරම මතුවූ අමුත්තන් දෙදෙනා දෙස ඔවුහු පුදුමයට පත්ව බලාසිටියහ.

"මේ මහාචාර්ය වෑන් හෙල්සිං වෙන්න ඇති කියල මං හිතනවා?" හෝම්ස් ප්‍රශ්නය යොමුකළේ යාච්ඤා පොතක් අතැතිව සිටි වයස්ගත පුද්ගලයාටය. "මේ අනෙක් අය දොස්තර සේවඩ්, සර් ආතර් හෝම්වුඩ් හෙවත් ගොඩැල්මිං සාමිවරයා වෙන්න ඇති. මේ ඇමරිකානු ජාතික මහත්මයා නම් මං හඳුනන්නේ නෑ" හෝම්ස් කීවේ කහ පැහැති හිසකෙස් තිබූ තරුණයා පෙන්වමිනි. ඔහුගේ කබායේ තිබුණේ ඇමරිකානු මෝස්තරය නිසා, මගේ මිත්‍රයා ඒ බව තේරුම් ගන්නට ඇත.

"මම ක්වින්සි මොරිස්, ගොඩැල්මිං සාමිගේ යාළුවෙක්, ඔහේ කවුද? මගේ යහළුවන්ගේ නම් ඔහේ කොහොමද දැනගත්තෙ?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ ඉන්නේ මගේ උදව්කාරයා දොස්තර ජෝන් වොට්සන්. ඉතිරි විස්තර හැමදෙයක්ම ඔබට කියන්නත් මට පුළුවනි. ඔබ කියන දේවලට සවන් දෙන්නත් පුළුවනි. හැබැයි ඒ හැම එකක්ම, මේ මරණයේ හා භීෂණයේ කුටියෙන් එළියට ගියාට පස්සේ"

"මං ඔබ ගැන අහල තියෙනවා" මෙතෙක් වේලා ආගමික පොත දිගහැරගෙන සිටි වයස්ගත මහතා කීය. ඔහු ඉංග්‍රීසි කථාකරද්දී එහි විදේශීය උච්චාරණයක් ද ඇති බැව් මම හඳුනාගත්තෙමි.

"හෝම්ස් මහත්මයා. ඔබ මෙහේ ආව එකෙන් දැන් මට නුගක් දේවල් තේරුම් ගන්න පුළුවනි. මම මගේ මේ මිත්‍රයින් සමග සොහොන් ගැබට පැමිණියේ, පෙරහුරුවක් පවත්වන්න විතරයි. හෙට රාත්‍රියේ අප කරන්න තීන්දු කරගත් ඒ බැරෑරුම් කටයුත්තට පෙරහුරුවක් පවත්වන්න. නමුත් හැම්ස්ටෙඩ් පළාතම භීෂණයෙන් ත්‍රස්ත කළ මේ කාන්තාව, අද ඇගේ මිනීපෙට්ටියේදී හමුවුණේ අපි බලාපොරොත්තු නොවුණු විදියට. ඇය ඒ තත්ත්වයට ගෙන එන්න ඇත්තේ ඔබ විසින් බව මට විශ්වාසයි. ඔබේ යෝජනාව වටිනා එකක්. නමුත් මං කැමැතියි මුලින්ම මගේ සගයින් සමග කතාබහ කරලා අවසන් තීරණයකට ඇවිත් හිටින්න"



http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් හිස සොලවා එයට එකඟත්වය පළකළේය. එවිට වැන් හෙල්සිං නමින් හැඳින්වුණු තැනැත්තා සෙසු අය පසෙකට කැඳවාගෙන ගියේය. අපට නො ඇසෙන සේ කොඳුරමින්, ඔහු මිතුරන් සමග යම් සාකච්ඡාවක් පැවැත්විය. මගේ දෙනෙත් යොමුවුණේ ස්වල්ප වේලාවකට පෙර මිනීපෙට්ටියේ ජීවත්ව සිටි ගැහැනිය වෙතය. දැන් ඇගේ පෙනුම දුටු මගේ දෙපා පණ නැතිවී ගියේය. මා ක්ලාන්ත වීමට යන බව මට ම වැටහිණි. වහාම හෝම්ස්ට සමීප වී, ඔහුගේ කරට අත තබා වාරුගෙන, මගේ හිස ඔහුගේ උරහිසට හේත්තු කරගතිමි. මඳ වේලාවක් යද්දී මගේ ක්ලාන්ත ගතිය අඩුවී ගියේය. තම සාකච්ඡාව අවසන් වූ බැවින් මහාචාර්යවරයා අප වෙත පැමිණියේය.

"අපි එකඟයි" ඔහු කීය. "බර්ක්ලි චතුරශ්‍රයේ මට කාමරයක් තියෙනවා. අපි එතැනට ගිහිං කතාබහ කරමු. අපට පුළුවන් එතැනදී කාගෙන්වත් බාධාවක් නැතිව, ඕනෙම දෙයක් සාකච්ඡා කරගන්න. ඔබට කියන්න තියෙන දේ ඔබ කියන්න. මගේ කථාව මං කියන්නම්. හැබැයි ඒක දුර්වල හිතක් ඇති, භයෙන් ක්ලාන්ත වෙන අයට සුදුසු කථාවක් නෙමෙයි. ඒක තමයි කවුන්ට් ඩ්‍රැකියුලාගේ කථාව!"



http://sherlockholmesinvestigations.blogspot.com

# 6

# ට්‍රාන්සිල්වේනියාවේ ඩ්‍රැකියුලා නම් ආදිපාදවරයාගේ කථාව

අපි ලන්ඩනයේ බර්ක්ලි චතුරශ්‍රයේ පිහිටි මහාචාර්ය වැන් හෙල්සිංගේ නවාතැනට ගියෙමු.

"ඔබේ මිත්‍රයාගේ මුහුණ බැලුවාම ම මට නිගමනයකට එන්න පුළුවනි" මහාචාර්යවරයා කීය. "ඔහු හිතනවා ඇති ඔහු ඇවිත් ඉන්නේ මිනීමරණ අපරාධකාරයෙකුගේ කාමරයට කියල. ඔහු දන්නෙ නැද්ද මේ සිද්ධියේ ඇත්ත කථාව? ඔබ ඔහුට ඒක කිව්වෙ නැද්ද?" වයසක පුද්ගලයා තළල රළිකරමින් විමසුවේ මගේ මිත්‍රයාගෙනි.

"ඔහුට මං කිසිදෙයක් කිව්වෙ නෑ. ඒකට හේතුව අද හැන්දෑව වන තුරු මේ කිසිම දෙයක් මා දැනගෙන හිටියෙත් නෑ."

හෝම්ස් පිළිතුරු දුන්නේය.

හෝම්ස් හිඳගත්තේ දොර අසලම වූ හාන්සිපුටුවේය. අපේ සත්කාරකයා ඔහුට පිළිගැන්වූ වයින් වීදුරුව ප්‍රතික්ෂේප කළ හෝම්ස්, තම පයිප්පය සාක්කුවෙන් එළියට ගත්තේය. ඊළඟට එය දුම්කොළ වලින් පිරවීම ඇරඹුවේය. අබාධිත සොල්දාදුවා ලෙස වෙස්වළා ගැනීමට ඔහු යොදාගත්, නූල් ගැලවුණු පරණ කැප් තොප්පිය ඔහුගේ හිස මත තිබිණ. ඉශාලගාන්ගෙය තුළ අප දුටු බිහිසුණු කටයුත්ත නිසා, මගේ සිතේ ඇතිව තිබුණේ දැඩි පිළිකුලක් මෙන්ම අප්‍රසාදයකි. මට දැනුණු බඩ දැවෙන ගතිය හා ඔක්කාරය තවමත් පහව නොගිහිණ. ඔවුන් මා වෙත පිළිගැන්වූ වයින් මා ප්‍රතික්ෂේප කළේ ඒ නිසාම නොවේ. මිනීමරුවන් සමඟ හවුලේ එකට වයින් බීම මට කිසිසේත් හුරුපුරුදු වැඩක් නොවීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" මහාචාර්යවරයා කීය. "ඔබ මේ ගැන මොන තරමක් ඉද්වල් අන්නවද? ඔබට හරියටම දැනගන්න ලැබුණේ මොනවද?" එම ප්‍රශ්න ඉදිරිපත් කළ වයසක



http://sherlockholmesinvestigations.blogspot.com

මහාචාර්යවරයා මගේ මිත්‍රයා දෙසට නෙත් යොමුකරගෙන සිටියේ දැඩි අවධානයකිනි. ඉව අල්ලන දඩබල්ලකුගේ දෙනෙත් වැනි ඒවායින්, මම එක් දෙයක් පැහැදිලිව වටහා ගතිමි. එනම් මොහු ද මගේ මිත්‍රයා මෙන් තීක්ෂ්ණ බුද්ධියක් ඇති විද්වතෙකු බව ය. දැන් මේ එකට ළංවී සිටින්නේ යුරෝපා මහාද්වීපයේ තිබෙන අතිවිශිෂ්ට ගනයේ මොළ දෙකක් විය හැක.

"මහාචාර්යතුමා" හෝම්ස් කථාව ඇරඹුවේය. "දැන් ටික වෙලාවකට කලින් පසුවට ලී උලක් යවා ඔබ මෙලොවින් තුරන් කළ ගැහැනිය, වැම්පයර්වරියක් බව මං දන්නවා. වැම්පයර් කියන්නේ, අනුන්ගේ ලේ උරාබොමින් ප්‍රාණය රැකගන්නා, යක්ෂණියක් හෙවත් භූතාත්මයක් බවත් මං දන්නවා. ජීවත්ව සිටියදී ඇගේ නම ලූසී වෙස්ටෙන්රා බවත්, ඇය මියයන දිනවල ගොඩැල්මිං සාමි සමග විවාහ ගිවිසගෙන සිටි බවත් මං දන්නවා. ඊට අමතරව මං දන්නවා, ලූසී වෙස්ටෙන්රාව මේ වැම්පයර් තත්ත්වයට පත්කළ මිනිහා එංගලන්තයට ආව හැටි. ඔහු එංගලන්තයට ආවේ අගෝස්තු අටවැනිද විට්බි වරායට ගොඩගැසූ ඩෙමිටර් නම් නෞකාවේ. මං නොදන්නා හිස්තැන් බොහොමයකුත් තියෙනවා. මහාචාර්ය ඒබ්‍රහැම් වැන් හෙල්සිං. ඒ හිස් තැන් ඔබ පුරවාවී කියල මං විශ්වාස කරනවා."

මේ අසා අනෙකාගේ දෙනෙතේ පළවුයේ විස්මයයි. ඔහුට තිබුණේ ද හෝම්ස්ට මෙන් තරමක් ලොකු හිසකි; පුළුල් මුහුණකි. ඉදිරියට වක්වුණු සෘජු නාසයක් සහිත වූ ඔහුගේ මුහුණේ, එකදු රැවුල් ගසක් නොවීය. රතුපැහැති හිසකෙස් ඝනව වැඩීතිබුණේ, හිස මුදුනට වන්නටය. පුළුල් නළල් තලයක් තිබූ නිසා, ඔහු ඉතා බුද්ධිමත් නිර්භය තැනැත්තෙක් බැව් බැලූ බැල්මට පෙනිණ. අතිශය පුදුමයට පත්ව සිටි ඔහු, මගේ මිත්‍රයා දෙස බලාසිටියේ කටින් එකදු වචනයක් නබා, ශබ්දයක් වත් පිට නොකරමිනි. අන්තිමේදී ඔහුගේ දෙතොලට සිනාවක් නැගිණ.

"හෝම්ස් මහත්මයා. අතිශයින්ම දක්ෂ කෙනෙක් හැටියට ඔබට කීර්තිනාමයක් ලැබිල තියෙන එකේ පුදුමයක් නෑ." වැන් හෙල්සිං කීවේ හිස පහත්කරමිනි. "ඔබ මේ තරමක් කාරණා දැනගත්තේ මොන ආකාරයෙන්ද? මං බොහොම කැමැතියි අන්න ඒක දැනගන්න"



http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් දල්වාගත් පයිප්පයෙන් නිල් පැහැති දුම් වලලු කිහිපයක් ඉහළට යැව්වේය.

"ඒ ගැන අපි පස්සෙ කථාකරමු" හෝම්ස් කීය. "ඊට කලින් ඔබේ කථාන්තරය අපට දැනගන්න සලස්වන එක ඔබට වැඩදායකයි"

"ඔව්. බාගවෙලාවට එහෙම කියන එකත් හරි" වැන් හෙල්සිං පැවසුවේ මිතුරන්ගේ මුහුණු බලමිනි.

ගොඩැල්මිං සාමි යනුවෙන් හඳුන්වනු ලැබූ තරුණයා වයින් වීදුරුව අතැතිව ගැඹුරු කල්පනාවකට වැටී සිටියේය. "චාටු හෝනා" ගේ භූතාත්මය අවසන් කළ ඔහුගේ සිත තිබුණේ, වෙනත් ලොවක බව මම තේරුම් ගතිමි. සෙස්සෝ වැන් හෙල්සිං පලකළ අදහස අනුමත කළහ.

තමා වාඩිවී සිටි අසුනෙන් නැගී සිටි මහාචාර්යතුමා, තම දෑත් කලිසම් සාක්කු දෙකේ දමාගෙන, කාමරයේ ඉහළ පහළ සක්මන් කිරීමට පටන් ගත්තේය. ඔහුගේ ගැඹුරු කටහඬේ සිත්ඇදගන්නා ස්වභාවයක් තිබිණ. ඔහුගේ ඉංග්‍රීසි උච්චාරණයේ විදේශික බවක් තිබුණත් පැවසූ දේ පැහැදිලි විය.

"ඔබට මගේ නම දැනගන්න ලැබුණේ දේව බලයකින්ද කියන්න මං දන්නෙ නෑ. නමුත් එය නිවැරදියි. ඕලන්දයේ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේයි මම සේවය කරන්නේ. කායික වෛද්‍ය විශේෂඥයෙකු ලෙසත්, මහාචාර්යවරයෙකු ලෙසත්, දැන් මං අවුරුදු ගණනාවක් කටයුතු කරල තියෙනවා. මට මේ දොස්තර ජෝන් සේවඩ් මුලින්ම හමුවුණේ එහිදී. ඒ හමුවීමෙන් අප අතර ඇතිවුණු මිත්‍රත්වය දවසින් දවස, මොහොතින් මොහොත වැඩිවුණා. එහෙම වුණත්, දැන් ඔහු මනුස්සයින්ගේ ශරීරයට වැලඳෙන රෝග ගැන සොයා බැලීම අමතක කරලා. ඔහුගේ සිත දැන් ඇදී ගිහින් තියෙන්නේ, මිනිස් සිත නැමැති ගැඹුරු අගාධය විමසා බලන්නටයි." එසේ කියූ වැන් හෙල්සිං මුහුණේ කළු රැවුලක් වවාගෙන සිටි තරුණයාගේ උරහිස මත අත තැබීය.

"ඒ වුණත් දොස්තර ජෝන් සේවඩ්, ලන්ඩනයේ මානසික ආරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂක ධුරය අත්හැර දමලා, වෙනත් කටයුත්තකට යොමුවී ඇති බව මට ආරංචි වුණා. එය දැනගැනීමෙන් මා පුදුමයකට පත්වුණේ නැහැ. ඒ මොකද මොන



http://sherlockholmesinvestigations.blogspot.com

ක්ෂේත්‍රයට පිවිසුණෙත් සේවර්ඩ් කුසලතා පරිපූර්ණ දක්ෂ වෛද්‍යවරයෙක් බව මං දැනහිටියා. මෙවර ඔහු භාරගෙන තිබුණේ ඔහුගේ මිත්‍රයා වූ, කලින් ආතර් හෝම්වුඩ් නමින් හැඳින්වුණු ගොඩැල්මිං සාමිවරයා වෙනුවෙන් කටයුත්තක්. ඒ කටයුත්ත තමා ගොඩැල්මිං සාමිගේ පෙම්වතිය වන, ලුසී වෙස්ටෙන්රා මෙනෙවියට වැලඳුණු රෝගය ගැන සොයා බැලීම. ඇය ස්වභාවයෙන්ම නිරෝගී ශක්තිමත් තරුණියක්. නමුත් අගෝස්තු මාසයේ මුල් කාලයේ, ඇය එක්තරා අබිරහස් රෝගයකින් පෙළෙන්නට පටන්ගත්තා. මේ රෝග තත්ත්වයෙන් සුවය ලබන අයුරකුත් කිහිපවිටක්ම පෙනුණා. නමුත් ඒ සෑමවාරයකම ඇය යළියළිත් ඒ භයානක රෝගයටම ගොදුරු වුණා. අන්තිමේදී එය කොතරම් උත්සන්න වුණාද කියතොත්, ඇය ජීවිතයත් මරණයත් අතර සටනක යෙදෙන තත්ත්වයට පත්වුණා. ලුසී මෙනෙවිය නිතර නිතර නින්දෙන් රාත්‍රී කාලයේ ඇගේ නිවසෙන් පිටතට ඇවිද ගොස් තිබෙනවා. ඇගේ නිවස තියෙන්නේ විට්බි ප්‍රදේශයේ. ඇය මේ විධියට එළියට ඇවිදගිය හැමවතාවකම, රෝගය දරුණු අතට හැරුණා. මගේ මිත්‍ර සේවර්ඩ්ට ලොකු ගැටලුවක් වුණේ මෙන්න මේ කාරණයයි. ඇයි සිහිනයෙන් එළිමහනට ඇවිදගිය හැමවතාවකම, ලුසීගේ රෝගය උත්සන්න වුණේ? ඊට පස්සේ තමයි එක්තරා අසාමාන්‍ය සිදුවීමක් වුණේ. ඒක දැනගත්තාම මං තේරුම්ගත්තා, අපි මේ මුහුණ දෙන්නේ සාමාන්‍ය රෝගයකට නොව, ඊට වඩා අතිශය භයානක තත්ත්වයකට බව.

ලුසී වෙස්ටෙන්රා මෙනෙවියගේ මිතුරියක් හිටියා, මීනා හාකර් නම් මෙනෙවියක්. ඇය විවාහවීමට බලාපොරොත්තුව හිටියේ ඇගේ පෙම්වතා වූ ජොනතන් හාකර් මහත්මයා සමග. මම කලින් කියූ සිදුවීම වෙන කාලයේ තමයි, ඇය විවාහ වෙලා හාකර් මහත්මිය බවට පත්වුණේ. තමන්ගේ හිතවත්ම මිතුරිය වුණු ලුසීගේ දුබල රෝගී තත්ත්වය ගැන අහන්න ලැබිලා, ඇය රැකබලා ගැනීමට මීනා පැමිණියා.

එක දවසක් මහ රාත්‍රියේ මීනාට නින්දෙන් ඇහැරුණා. ඇයට දකින්නට ලැබුණේ තමන්ගේ හිතවත්ම මිතුරිය ඇඳේ නොමැති බව. ලුසී සොයමින් ගෙදරින් එළියට ගිය මීනාට දකින්නට ලැබුණේ නිවස කිට්ටුව තිබුණු සොහොන් බිමක, සියදිවි



http://sherlockholmesinvestigations.blogspot.com

නසාගෙන මියගිය කෙනෙක්කුගේ දෙසාහොනා මත ලූසී වැතිරිලා හිටි හැටි. ඊළඟට ඇය දුටුවා කළු පැහැති දිගු දෙයක්, ලූසී මෙනෙවියගේ සිරුරට උඩින් නැමිගෙන සිටින බව. මේ දුටු මීනා හාකර් මෙනෙවියට කෑගැහුණා. ඒ ශබ්දයට ඒ කළුපැහැති සෙවණැල්ල හිස ඔසවා බැලුවා. මීනාට දකින්න ලැබුණේ වෛරය පිටකරන, ගින්දර මෙන් රතු පැහැති ඇස් දෙකක් සහිත සුදුමැලි මුහුණක්. කොහොම වුණත් මීනා, ලූසී සිටිය තැනට යද්දී, අර භයානක රූපය අතුරුදන් වෙලා. ලූසී මෙනෙවිය හැඳගෙන සිටියේ ඇගේ රාත්‍රී ගවොම පමණයි. ඇය සීතල නිසා රෝගී වේවි කියන බියෙන්, මීනා තම කරේ තිබුණු මෆ්ලරය ගලවා ඒක ලූසීගේ බෙල්ල වටේ ඔතලා, ඒක ගැළවී නොයන්න ආය කටුවක් ගැහැව්වා.

ගෙදර ආවට පස්සේ කටුව ගලවලා මෆ්ලරය ඉවත් කරද්දී මීනාට දකින්න ලැබුණා, බෙල්ලේ කුඩා සිදුරු දෙකක් ඇති බව. තමන් ආය කටුව ගසද්දී බැරිවීමකින් එය මිතුරියගේ බෙල්ලේ ඇණෙන්න ඇති කියලයි මීනා හිතුවේ. එදා රාත්‍රී ලූසී වෙස්ටෙන්රා මෙනෙවියගේ රෝගී තත්ත්වය තවත් බරපතල අතට හැරුණා."

"මොහොතකට නවත්වන්න" හෝම්ස් කීය. "මේක සිදුවුණු දිනය හරියටම කවද ද?"

"දිනය අගෝස්තු මාසේ 11 වැනිද"

"හොඳයි. කරුණාකරලා දිගටම කථාව කියන්න"

"ලූසී යළිත් වරක් රෝගී බවට පත්වුණා," මහාචාර්යවරයා කථාව පටන්ගත්තේය. "මොනවා හරි තදබල ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකොළොත්, ඇය මියයාමට ඉඩ ඇති බව වෛද්‍යවරුනට වැටහුණා. එතකොටයි ඔවුන් මාව කැඳෙව්වේ.

හෝම්ස් මහත්මයා. ඔබ නිරීක්ෂණය කරන ඉතාම සුළු දෙයින් පවා, තර්කානුකූලව නිගමනවලට පැමිණීමට, ඔබට විශිෂ්ට හැකියාවක් ඇති බව සුප්‍රසිද්ධ කරුණක්. ඒ වුණත් මහත්මයා මේ කාන්තාවට තිබුණු රෝග ලක්ෂණ විස්තර කිරීමේදී, අප තරම් ඉක්මනට ඔබටවත් නිගමනයකට එන්න හැකිවේද කියල මං දන්නේ නෑ. සොහොන් පිටියේ දකින්න ලැබුණු දර්ශනය, සෞඛ්‍ය තත්ත්වය ඉතා වේගයෙන් පිරිහී ගිය හැටි, බෙල්ලේ දකින්න ලැබුණු කුඩා සිදුරු දෙක. ආහ්! රාත්‍රී අන්ධකාරයේ ක්‍රියාත්මක වෙන, අමනුෂ්‍ය බලවේගවල කටයුතු මීට වඩා හොඳින් පෙන්වන,



http://sherlockholmesinvestigations.blogspot.com

අවස්ථාවක් එළියට ආවෙ කවදද? මං වහාම ක්‍රියාත්මක වුණා. කුඩා කාලයේ සිටම මට අසන්නට ලැබී තිබුණු දේවල් මං ප්‍රයෝජනයට ගත්තා. ලූසී මෙනෙවියගේ ජනේලය වටා සුදුළූණු මල් කිණිති ගැටගසන්න මං පැකිළුණේ නෑ. ඇගෙ ගෙල්ල වටා රිදී කුරුසියක් රඳවන්නත් මා පියවර ගත්තා. නමුත් අවාසනාවක මහත! මගේ ඒ සියලු උත්සාහයන් අහක ගියා. ලූසී මෙනෙවියගේ මව අඥාන අයුරින් ක්‍රියාකරාවි කියල මං හිතුවෙ නෑ. ඇය මේ ගෙදරට ආව ගමන් කරල තිබුණේ, තමන්ගේ දුවට හොඳ වාතාශ්‍රයක් ලැබෙන්න කියලා, සුදුළූනු මල් අතු ඉවත්කරලා, ජනෙල් හොඳින් හැරදැමීමයි. ඇයට හිතෙන්න ඇත්තෙත්, ජනේලයෙන් ඇතුලට එන්න හැකියාව තිබුණේ පිරිසිදු වාතයට පමණක් කියලයි!

ඇගේ මවගේ එම ක්‍රියාව නිසා ලූසීගේ සෞඛ්‍ය තත්ත්වය යළිත් වරක් සීඝ්‍ර ලෙස පිරිහෙන්නට පටන්ගත්තා. මේ අවාසනාවන්ත තරුණිය වෙනුවෙන් අපට කිරීමට ඉතිරිව තිබුණේ බොහොම ස්වල්පයයි. ඇයගේ ශරීරයෙන් ඉවත්වූ රුධිරය වෙනුවට, රුධිරය ලබාදීම, දිගින් දිගටම කළ හැකි දෙයක් නොවන බව අපි දැනහිටියා. ගොඩැල්මිං සාමිගේ මිතුරෙකු වන මේ ක්වින්සි මොරිස් මහත්මයා එක්සත් ජනපදයේ සිට එංගලන්තයට ආවේ මේ කාලයේ. ලූසීට රුධිරය ලබාදීමේ කටයුත්තට ඔහුත් රුධිරය පරිත්‍යාග කළා." ඔහු කීවේ ඇමරිකානු ජාතිකයා දෙසට හිස පහත්කරමිනි. "නමුත් ඇගේ අවාසනාවන්ත ඉරණමෙන් ඇය ගලවාගන්න අපට හැකියාවක් තිබුණෙ නෑ. ලූසී වෙස්ටෙන්රා මෙනෙවිය සැප්තැම්බර් 20 වැනිදා මියගියා. පුවත්පත්වල "වාටු හෝනා" යන නමින් හැඳින්වූ හූතාත්මය උපන්නේ එදා රාත්‍රියේ"

"මොන බහුබූත විකාර කථාද?" මට කෑගැසිණ. මට මගේ හැඟීම් පාලනය කරගත නොහැකි විය. මා මහාචාර්යවරයා ළඟට යැවුණේ මා නොදැනුවත්වමය. ඔහු මා දෙස බැලුවේ වෛද්‍යවරයෙකු රෝගියකු දෙස බලන බැල්මකි.

"හෝම්ස්" මම කෑගැසීමි. "මේ පුද්ගලයා ඔය උත්සාහ කරන්නේ ඔහුට විරුද්ධව එල්ල වෙන මිනීමැරුම් චෝදනාවෙන් ගැලවෙන්න. භූතාත්මයක් විනාශ කළා කියල ඔහු කියන කථාව, ඔබ විශ්වාස කරනවද? ඔහු විනාශ කළේ, ලෙයින් මසින් සැදුණු ගැහැනියකගේ ජීවිතය බව අපි දුටුවා. එහෙම නේද? අපරාධකාරයින් හැමවිටම



http://sherlockholmesinvestigations.blogspot.com

උත්සාහ කරන්නේ තමන් කළ අපරාධය වසන් කරන්න. එහෙත් මේ විධියේ අසාර්ථක උත්සාහයක් නම් මං දැකල නෑ"

මෙසේ කියමින් මම මගේ රිවෝල්වරය අතට ගත්තෙමි. සෑම අතින්ම අනෙක් අයට කොටුවී ඇති බව තේරුම් ගන්නා අපරාධකාරයා තරම්, භයානක සතෙකු නොමැති බව මම දැන සිටියෙමි. මා රිවෝල්වරය අතට ගත්තේ එබැවිනි.

මගේ මිත්‍රයා තම අසුනේ නොසැලී සිටියේ දෙනෙත් අඩවන් කරගෙනය. ඔහුගේ මුහුණ සහ දුම් වලාවකින් වැසී තිබෙනු මම දුටුවෙමි. "වාඩිවෙන්න වොට්සන්" ඔහු මට කීවේ කාරුණික ස්වරයෙනි. "ඔබෙ නිර්භීත භාවය මං අගය කරනවා. ඒත් මේ වෙලාවේ නම්, ඔබට ලොකු වැරැද්දක් වෙලා තියෙන්නේ. මහාචාර්ය වැන් හෙල්සිංගේ කථාව සම්පූර්ණ ඇත්ත."

මම පුදුමයෙන් මගේ මිත්‍රයා දෙස බැලීමි. මගේ සිතිවිලි සම්පූර්ණයෙන්ම අවුල් වී ගිය අයුරක් මට දැනිණ. හෝම්ස්ට සිදුවී තිබෙන්නේ කුමක්ද? ඔහුගේ තියුණු බුද්ධිය, වැඩ වැඩිකම නිසා, මොටවී ගොසින්ද? ඔහුගේ ඉල්ලීම නිසා මම යළිත් වරක් අසුනේ වාඩිවූයෙමි. එහෙත් සාක්කුවේ දමාගත් රිවෝල්වරයට යෙදූ ග්‍රහණය ලිහිල් නොකෙළෙමි.

මහාචාර්යවරයාගේ මිතුරන් තිදෙනා ඔහුට කොතරම් පක්ෂපාතද යන්න මා හරිහැටි දුටුවේ, ආපසු මගේ අසුනේ වාඩිගත් විටය. තම නායකයාට හිරිහැරයක් වෙතැයි ඔවුහු අසුනෙන් නැගිට සිටියහ. ඒ, අවශ්‍යවුවහොත් මා හා පොරබැදීමට සූදානමෙනි.

"වෙස්ටෙන්රා මෙනෙවියගේ නිවස තියෙන්නේ, විට්බි වරායට කොයිතරම් කිට්ටුවෙන්ද?" හෝම්ස් ඇසුවේ මහාචාර්යවරයා වෙත දෙනෙත් යොමු කරගෙන ය.

"කාරණා විශ්ලේෂණය කිරීමට ඔබට ඇති හැකියාව ගැන මම යළිත් ඔබට හිස නමනවා." වැන් හෙල්සිං කීය. "මේ අවාසනාවන්ත කාන්තාවගේ නිදනකාමරය තියෙන්නේ විට්බි වරාය පෙනෙන තෙක් මානයේ. ජනේලයක් ඇරියාම, විට්බි වරායට නැව් යන එන හැටි ඇයට පැහැදිලිව පෙනෙන්න ඇති."

"ඔබ කිව්වා ඇගේ නිවස අසල බොහොන් පිට්ටනියක් ඇති බව." හෝම්ස් කීය. "ඊටත් එහා පැත්තේ තිබෙන්නේ මොකක්ද?"

"බොහොම කාලයකට පෙර කනවාරාමයක් හා දෙව්මැදුරක්ව තිබුණු ගොඩනැගිල්ලක්" මහාචාර්යවරයා කීය. "ඒක දැන් බාගෙට



http://sherlockholmesinvestigations.blogspot.com

කඩාවැටිලා. පාළුවට ගිය නෂ්ටාවශේෂ තමයි දැන් ඉතිරිවෙලා තියෙන්නේ."

හෝම්ස් ගිස සෙලවූයේ එම කරුණ සිහියට ගනිමිනි. ඔහුගේ කම්මුල් රත්පැහැයට හැරී තිබූ බව මම දුටුවෙමි.

"එහෙනම් ඔබත් ඒ කරුණු වල සම්බන්ධතාවය දුටුවා?" වැන් හෙල්සිං ඇසීය.

"එහෙම නුදුටුවා නම් නවදුරටත් මෙවැනි වෘත්තියක නොයෙදී විශ්‍රාම ගැනීමයි මට සුදුසු" හෝම්ස් කීය.

"මේ අහන්න" මා කීවේ නොඉවසිල්ලෙනි. "මොන සම්බන්ධයක් ගැනද මෙහෙල ඔය කතාකරන්නෙ? ඔබ දෙදෙනා අතරවුණු කතාබහට මං කන්දුන්නා. ඒත් ඔය තොරතුරු එකිනෙකට සම්බන්ධවෙන්නෙ මොන ආකාරයටද? මට නම් එහෙම දෙයක් පෙනෙන්නේ නෑ"

ඔවුහු පුදුමයෙන් මෙන් මා දෙස බැලූහ. මා එතැන සිටි බවක් වත් ඔවුනට අමතකව තිබූ සැටියකි.

"මගේ හිතවත් වොට්සන්. මට සමාවෙන්න. හැමවිටකම වගේ කෙනෙකු සමග සාකච්ඡා කරද්දී ඔබට කරුණු පැහැදිලි කර දෙන්න මට අවස්ථාව ලැබෙනවා. නමුත් මාව මේ වගේ තත්ත්වයකට පත්වෙන්නෙ කලාතුරකින් තමයි. අපි කථාකළ ඒ කාරණා ඔබට පහදා දෙන්න මට බැරිවුණා වොට්සන්.

ලූසී වෙස්ටෙන්රා මෙනෙවිය සොහොන් පිටියේ සොහොනක් මත, ක්ලාන්ත ගතියෙන් වැතිර සිටි දවසක් ගැන මහාචාර්යතුමා අපට කිව්වා. ඒ දවස මෙතැනදී අපට වැදගත් වෙනවා. ඒක ඔබට නොපෙනී ගියා වෙන්න බෑ මිතුයා?"

"ඔය දවසෙ ඔබ කියන විධියේ වැදගත්කමක් මට නම් පෙනුණෙ නැහැ." මා කීවේ මදක් අමනාප ස්වරයෙනි. ඔහු ආචාරශීලී ලෙස කීමට තැත්කළත්, එයින් හැඟුණේ මා, සරල කාරණා තේරුම් ගැනීමට බැරි මෝඩයෙකු ලෙසයි.

"හිතලා බලන්න වොට්සන්" ඔහු කීය. "මගේ වික්‍රමාන්විත පරීක්ෂණ කොයිතරම්ක් ඔබ ඉතාම විද්‍යානුකූල විධියට වාර්තා කරලා තියෙනවද? ඉතින් මේ කාරණාව ඔබට නොපෙනී යන්න හැටියක් නෑ. වෙස්ටෙන්රා මෙනෙවියට ඒ ඉරණමට මුහුණ දෙන්න වුණේ, ඩෙමිටර් නෞකාව විට්බි වරායට ගොඩගහලා දින තුනක්වත් යන්න කලින්"


http://sherlockholmesinvestigations.blogspot.com

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ"

"ඒ විධියටම ඔබට මේ කාරණයත් පැහැදිලි වෙවි. ලුසි වෙස්ටෙන්රා මෙනෙවියගේ ගෙදරට අල්ලා එක් පැත්තකින් තියෙන්නේ සොහොන් පිට්ටනියක්. අනෙක් පැත්තේ පාළු ගෙයක්. නැවක ගමන් කළ, නාවිකයන් රැසක් මරාදැමූ ඝාතකයෙකුට සැඟවී ඉන්න, මේ පාළුගෙය අපූරු තැනක් නේද?"

"දෙයියෝ සාක්කි! මෝඩයෙකුට වගේ මට මේ කිසිදෙයක් නොපෙනී ගියහැටි" මම දකුණු අතින් නළලට තට්ටු කරගත්තෙමි.

"ඔබ මෝඩයෙකු වුණා නෙමෙයි වොට්සන්" හෝම්ස් කීය. "අද හැන්දෑවේ සිට ඔබට මුහුණ දෙන්න සිද්ධවුණේ කටුක අත්දැකීම් වලට. සියුම් කාරණා හඳුනාගැනීමට ඔබ තිබූ සංවේදී බව, අද හොඳටම මොට වෙලා. ඒ නිසයි අද හැන්දෑවේ හැම්ස්ටෙඩ් පිට්ටනියේ තව ටිකෙන් ජීවිතය පවා අහිමි වී යන තත්ත්වයට ඔබ පත්වුණේ" කී හෝම්ස් යළිත් වරක් තම අවධානය වැන් හෙල්සිං වෙත යොමු කළේය. "මං මීට කලින් අහල නැති නමක් අද ඔබ සඳහන් කළා. කවුන්ට ඩ්‍රැකියුලා යන නමින් ඔබ සඳහන් කළේ කවුරුන්ද?"

"ඕක අපට සාකච්ඡා කරන්න හොඳ මාතෘකාවක්. මං කැමැතියි දැනගන්න, ඔබ ඔය දේවල් දැනගත්තෙ කොහොමද කියන එක?" වැන් හෙල්සිං ඇසීය.

හෝම්ස්ගේ මුහුණේ පළවූයේ ඔහුගේ නොඉවසිලිමත් භාවයයි. "ඒකෙ ඒ තරම් වැදගත්කමක් නැහැ. කෙනෙකුගේ හෝ සතෙකුගේ පා සටහන් හඳුනාගෙන, ඒ පසුපස හඹා යන්න මට දක්ෂතාවයක් තියෙනවා. ඇත්තෙන්ම ඒ ගැන විස්තර කරලා, මං පොත්පිංචක් පවා ලියල තියෙනවා. අද හවස්කාලයේ හැම්ස්ටෙඩ් පිට්ටනියට ගිය මට, "වාටු නෝනා"ගේ අඩිපාරෙන් හඳුනාගන්න හැකිවුණා. ඒවා ඇසට නොපෙනන තරම් සියුම් ඒවා; සමහර තැන් වලදී ඇඟිලිතුඩු වල ස්පර්ශයට පමණයි දැනුණේ. මේවා වැටී තිබුණේ ගොඩැල්මිං පවුලේ සොහොන් ගැබ දෙසට.

මීළඟට මම හැම්ස්ටෙඩ් පුස්තකාලයේදී මෑත කාලයේ පරණ පුවත්පත් කිහිපයක් පෙරළා බැලුවා. මා සොය සොයා සිටි කාරණයට අදාළ පුවතක් වෙත මගේ අවධානය යොමුවුණා. එහි තිබුණා, ගොඩැල්මිං සාමි විවාහ වෙන්න බලාපොරොත්තුව සිටි



http://sherlockholmesinvestigations.blogspot.com

ලුසී වෙස්ටෙන්රා මෙනෙවියගේ අභාවය ගැන. ඇගේ අසනීපය සුවකර ගැනීමට දොස්තර ජෝන් සේවඩ් හා මහාචාර්ය ඒබ්‍රහැම් වැන් හෙල්සිං දැඩි උත්සාහයක් දැරූ බවත් ඒ පුවතේ සඳහන් වුණා. ඇය මේ පළාතට ගෙන එනු ලැබුවේ විට්බි සිට බව දැනගත්තාම මගේ උනන්දුව දෙගුණ තෙගුණ වුණා. මගේ හිතවත් විශ්‍රාමලත් හමුදාභටයෙකුගේ ඇඳුම් පැළඳුම් අරගෙන මම වෙස්වලා ගත්තා. ඊළඟට හැම්ස්ටෙඩ් පිට්ටනිය බලා ගියා මම, අහම්බෙන් වගේ දොස්තර වොට්සන් හමුවුණා. එතැනින් අපි සුසාන භූමියේ පිහිටි ගොඩැල්මිං සොහොන් ගැබ වෙත ආවා. ඒකෙදි මට දකින්න ලැබුණේ මිනියක් වටා එකතුවුණු මහත්වරු කිහිපදෙනෙක්. ඒ මහත්වරු අර ප්‍රවෘත්තියේ සඳහන් අය බව නිගමනය කරන්න මට ඒ තරම් වෙලා ගතවුණේ නැහැ. මට කියන්න තියෙන්නේ එපමණයි. ඉතින් මහාචාර්යතුමා, දැන් ඔබේ වාරය."

"ඔබ ඉතා විශිෂ්ට අන්දමින් මේ දේවල් හොයාගෙන තියෙනවා." මහාචාර්යතුමා කීය. "කවුද කවුන්ට් ඩ්‍රැකියුලා කියන්නේ?" තම උපැස් යුගළ ගලවා අතට ගත් වැන් හෙල්සිං තම ලේන්සුවෙන් එහි වීදුරු පිස දමීමට පටන්ගත්තේය.

"ඇයි ඔබ මගෙන් අහන්නෙ නැපෝලියන් සාතන් කියන්නේ කවුද කියලා? යක්ෂයා කියන්නේ කවුද කියලා? ඒ දෙදෙනාගේම බොහොම සමානකම් තියෙනවා. කවුන්ට් ඩ්‍රැකියුලා කියන්නේ යක්ෂයෙක් වැනි බිහිසුණු ආත්මයක්!

කවුන්ට් ඩ්‍රැකියුලා කියන්නේ හරියටම කවුද කියන එක, මං ඔබට මුල ඉඳලම තේරුම්කරල උන්නොත් හොඳයි කියල මට හිතෙනවා. ඒ මොකද ඉදිරියේදී ඔබට ඔහු සමග ගනුදෙනු කරන්න සිදුවෙන්න පුළුවනි." වැන් හෙල්සිං තම උපැස්යුගළ යළිත් පැළඳගත්තේය.

"මට මේ විස්තර දැනගන්න ලැබුණේ හංගේරියාවේ බුඩාපෙස්ට් සරසවියේ මගේ මිත්‍රයෙකු වන මහාචාර්ය ආර්මීනියස් ගෙන්.

ඔබ අහල ඇති අට්ලා නම් රණකාමී මහා යුද්ධසේනාධිපතියා ගැන? වර්තමාන හංගේරියාව, බල්ගේරියාව හා රුමේනියාව යන රටවලට අයත්වන ප්‍රදේශයක් තමයි ට්‍රාන්සිල්වේනියා කඳුකරය. මේ රාජධානියේ අවුරුදු හාරසියයකට පමණ කලින් මහා දරුණු සංග්‍රාමයක් පැවැත්වුණා. දීර්ඝ කාලයක් තිස්සේ මේ යුද්ධය


http://sherlockholmesinvestigations.blogspot.com

පැවතුණේ. තුර්කිය ආක්‍රමණය කරන්න උත්සාහ කළ හංගේරියානු ජාතික අට්ටිලාගේ හමුදා සහ තුර්කියේ සුල්තාන්ගේ හමුදා අතර. තුර්කිවරුන්ට විරුද්ධව සටන් මෙහෙයවූයේ, අට්ටිලාගේ පෙළපතෙන් පැවත ආ ඩ්‍රැකියුලා නම් කවුන්ට්වරයෙක්. එය එංගලන්තයේ නම් යුවරාජ තනතුරට සමාන රදළවරයෙකුගේ තනතුරක්. ඉතිහාසයේ සඳහන් වෙන්නේ තුර්කියේ සුල්තාන්ගේ හමුදා, බිහිසුණු ජීවිත විනාශයක් කළ පුද්ගලයින් හැටියටයි. නමුත් කවුන්ට් ඩ්‍රැකියුලාගේ හමුදා තුර්කිවරුන්ටත් වඩා බිහිසුණු, ලේ පිපාසයෙන් පෙළුණු, භයානක පිරිසක් වූ බව මහාචාර්ය ආර්මිනියස් කියනවා. තමාට සදාකාලිකවම ජීවත්වීමේ අපේක්ෂාවෙන්, ඩ්‍රැකියුලා තම ආත්මය යක්ෂයාට භාර කළාලු. ඔහුගේ අනුගාමිකයන් මෙන්ම සතුරුත් ඩ්‍රැකියුලාව හඳුන්වන්නේ වැම්පයර් යන නාමයෙන්. එයින් ඔවුන් අදහස් කරන්නේ තමන්ගේ ජීවිතය පවත්වාගෙන යාමේ අරමුණෙන්, අනුන්ගේ ලේ උරාබොන තැනැත්තා යන්නයි. ඔහු රජකම් කළ රටේ, ඔහුගේ නාමයෙන් තවමත් භීතිය හා භීෂණය රජ කරනවා; හරියට ඔබේ රටේ රැජිනක් රජකරනවා වගෙයි. දැන් තමයි අපට මේ ගැන සිත් ඇදගන්නා සුලු කතාවන් අහන්න ලැබෙන්නේ.

මං ඔබට ජොනතන් හාකර් කියන නම සඳහන් කළා. නමුත් මේ සිද්ධියට ඔහු සම්බන්ධ වෙන්නේ කොහොමද කියලා මං ඔබට තවම කිව්වෙ නෑ.

කවුන්ට් ඩ්‍රැකියුලාට උවමනා වුණා, එංගලන්තයට සංක්‍රමණය වෙන්න. ඔහු හිතාගත්තේ මේ රටට ඇවිත් ලන්ඩනය සමීපයේ ජීවත්වෙන්නයි. ඒකට සුදුසු ගෙයක් මිලට ගන්න ඔහු තීරණය කළා. එම ගනුදෙනුව කෙරුණේ නීතිඥ සමාගමක් හරහා. මේකට අදාළ සියලුම ලියකියවිලි අරගෙන, නීති උපදේශක සමාගම වෙනුවෙන් නීතිඥයෙකු ට්‍රාන්සිල්වේනියාවට ගියා. ඔහු තමා ජොනතන් හාකර්. බොහොම ඈත ට්‍රාන්සිල්වේනියාවේ ඩ්‍රැකියුලා මන්දිරය බලා, ජොනතන් හාකර් පිටත්වෙලා ගියේ, මේ අවුරුද්දේ මැයි මාසයේදී. මේ කාරණා මට දැනගන්න ලැබුණේ මිනා මරේ මෙනෙවියගෙන්. ඇය තමා ජොනතන් හාකර්ගේ පෙම්වතිය. ඔවුන් විවාහ ගිවිසගෙන ඉඳිද්දී තමා, ඔහු ට්‍රාන්සිල්වේනියාව බලාගියේ. මේ ස්ථානය ගැන වැඩිපුර තොරතුරු පසුවට හොයාගන්න මං



http://sherlockholmesinvestigations.blogspot.com

බලාපොරොත්තු වෙනවා. මේ තරුණ කාන්තාවගෙන් මට අද විදුලිපුවතක් ලැබුණා. හෙට උදේ 10ට ලන්ඩනයට ළඟාවෙන දුම්රියෙන් ඈය මෙහෙ එනවලු. ඇයත් අපිත් දෙගොල්ලොම මේ කටයුතු කරන්නේ, කාරණා හොයන්නේ, එකම අභිරහසක් ගැන බව අප තේරුම් ගන්නේ ළඟදී. එහෙම නොවෙන්න අප සොයාගත් කාරණා මීට කලින් එකට සසඳා බලලා කාරණා තේරුම් ගන්න තිබුණා. ජොනතන් හාකර් මහත්මයාට ට්‍රාන්සිල්වේනියාවේදී බොහොම භයානක අත්දැකීම් වලට මුහුණදෙන්න සිදුවුණු බව අපට අහන්න ලැබුණා. ඒ වගේම ඔහු ජීවිතය ගලවාගෙන එහෙන් පැන ආවේ මරණය පෙනි පෙනී, තමන්ගේ ආත්මය පරදුවට තබලා බව මම දන්නවා.

විට්බි හි කවුරුත් තොරතුරු නොදන්නා දේපොළක් කවුන්ට් ඩ්රැකියුලාට අයිතිවුණා. ඔහු ඒවා අත්පත් කරගත්තාට පස්සේ සිදුවුණේ මොකක්ද කියල, අපි හරියටම දන්නේ නෑ. මං ලබල තියෙන අත්දැකීම් වලිනුත්, පුවත්පත්වල පළ කියවූ වාර්තා වලිනුත් මට යම් තරමක අවබෝධයක් ලැබුණා. විට්බි වරායට පස්සෙපට්ටි සමග රුවල් නැවක් ගොඩගැසූ බව පුවත්පත්වල පළවුණා. ඩ්රැකියුලා එංගලන්තයේ පදිංචියට ආ බව මං ඒ පුවතෙන් තේරුම් ගත්තා. අපේ අසරණ ලූසී වෙස්ටෙන්රා මෙනෙවිය ලේ උරා බොන යක්ෂ අවතාරයක් බවට පත් කළේ ඩ්රැකියුලා. ඇය ඒ තත්ත්වයෙන් නිදහස් කරලා, සදාකාලිකව සැනසීම ලබාදෙන්න අද රාත්‍රියේ අපට හැකිවුණා. සොහොන් පිට්ටනිය අසල ගරාවැටුණු දේවමැඳුර ගැන මං ඔබට කිව්වා නේද? ඔහු ලන්ඩනයට පැමිණෙන තුරු ලැගුම් ගත්තේ ඒකෙ. ඩ්රැකියුලා මුලින්ම ලූසී මෙනෙවියගේ ලේ උරා බිව්වේ එම සොහොන් බිමේදී. ලූසී වෙස්ටෙන්රාගේ ආත්මයට කළ විනාශය වෙනුවෙන්, ඩ්රැකියුලාට විරුද්ධව අප සටන්කළ යුතුයි. ඔහු තවත් ජීවිතයක් විනාශකරන්න කලින් අප ඔහු විනාශ කළ යුතුයි"

මහාචාර්ය වෑන් හෙල්සිං තම කථාව එසේ අවසන් කළේය. මගේ මුහුණේ පළ වූ එය විශ්වාස නොකරන හැඟීම ඔහු දකින්නට ඇත. මඳ වේලාවකට නිහඬ වූ ඔහු මීළඟට තම සම්පූර්ණ අවධානය යොමුකළේ මා වෙතය.

"දොස්තර මහත්මයා," ඔහු කීය. "මට තේරෙනවා. මං මේ කියූ කිසිදෙයක් ඔබ විශ්වාස කරන්නේ නෑ. එහෙම නේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඇත්තෙන්ම ඔව්" මම කීවෙමි. "මට හරි පුදුමයි. ඔබ නවීන විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රානුකූලව පුහුණුවක් ලැබූ, එම කටයුතුවල නිරතවෙන විද්‍යාඥයෙක්. එහෙම පසුබිමක් ඇති ඔබ කොහොමද මේ වගේ කිසිම පදනමක් නැති පුරංගනා කථාවක් අපට කියන්නේ? මොකක්ද ඔබේ අරමුණ? ඔබ උත්සාහ කරන්නේ මෙතැන ඉන්න අර තුන්දෙනා එක්ක ඔබ කළ අපරාධය වසන් කරන්නද? ඔබ හිතන්නේ අප මෝඩයෝ කියලද?"

"ඔබ දෙදෙනා මෝඩයෝ කියලා මං කොහොමටවත් හිතන්නේ නෑ" වෑන් හෙල්සිං කීය. "එහෙම හිතුවා නම් මෙච්චර වෙලා මං කියූ කථාව ඔබට හෙළි කරන්නේ නෑ. ඔබ දන්නවාද මං දන්නේ නෑ, සමහර වෙලාවට, මේ ලෝකයේ අපට තේරුම් කරන්න අමාරු කාරණා තියෙනවා. ඒවා විද්‍යානුකූලව ඔප්පු කරන්න හැකියාවක් නෑ. ඒ සමහරක් අද්භූත බලවේග නැතිනම් ශක්තීන්. මේ විශ්වයේ මොන තරමක් ශක්තීන් තියෙන්න පුළුවන්ද, අපේ සංවේදී ඉන්ද්‍රියවලට නොදැනෙන? සමහර විද්‍යාඥයින් කියනවා, අපේ දැසට නොපෙනුණාට, යම්කිසි ගුප්ත ආලෝක තරංග වගයක් තියෙනවාලු. අපේ ඇහැට නොපෙනුණාට ඉතා සියුම් ජීවීන් ඉන්න පුළුවන් කියලා මං විශ්වාස කරනවා. අපේ ඇඟ විනිවිද ගියත් අපට යන්තමින් හරි නොදැනෙන කිරණ වගයක් ඇති බව විද්‍යාඥයින් මෑතකදී කිව්වා. මේවා පරීක්ෂණ නළයකට අරගෙන විද්‍යාගාරයේ ඔප්පු කරන්න බැරිබව ඇත්තයි. මේ නොපෙනෙන දේවල් හැම එකක්ම අපේ සියුම් යන්ත්‍ර සූත්‍ර වලට අහුවෙන්නේ නෑ. කැමරාවල ඡේයාපටිවල සටහන් වෙන්නෙත් නෑ. කිසිම සංවේදී උපකරණයක ඔවුන්ගේ චලන හෝ කටයුතු අලකුණු වෙන්නෙත් නෑ.

අන්ධකාරය ලොව වෙලාගත්තාට පස්සේ නිදහසේ සැරිසරන්න, මෙවැනි අද්භූත බලවේග වලට හැකියාව තියෙනවා. දිවා කාලයේ ඔවුන් බැඳ තබන බන්ධන වලින්, අඳුරේදී ඔවුන් මිදෙනවා. වැම්පයර්වරුන් කියන්නෙත් එවැනි ජාතියක්.

කාලයක් මේ වගේ දේවල් අහල මමත් ඔබ වගේ හිනාවුණා. ජීවත්වී ඉන්නා අයගේ ලේ බොන, මැරුණු අයගේ භූතාත්ම කිව්වාම මට ඒක විහිළුවක් වුණා. නමුත් දැන් මං ඒවට හිනාවෙන්නේ නෑ. ඒ මොකද, ඒ වගේ අශුද්ධ ආත්ම ඇතිබවට මං සාක්ෂි දැකල තියෙනවා. ඔවුනට ඇති ශක්තීන් මොනවද, ඔවුන්ට


http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රබලව ක්‍රියාත්මක වෙන්නේ පුරවන් අමාන වගේ වෙලාවලද කියන එක මං දන් දන්නවා. ඒ වගේම ඔවුන්ගේ අඩුපාඩු සහ දුර්වලකම් ගැනත් මට යම් දැනුමක් තියෙනවා. දවල් කාලයේ ඔවුන් සිටිය යුත්තේ මිනිපෙට්ටි ඇතුළත. එහෙම සිටිය යුත්තේ, ඔවුන්ගේ උපන්බිමෙ පස්වල ඇතුළට වෙලා, නැත්නම් එම පස් මත. වැම්පයර් භූතයන් පිළිබඳව මා ඇතුළු කිහිපදෙනෙක්ම විද්‍යාත්මකව හදාරල තියෙනවා, ඒ අනුව අපි හිතාගෙන හිටියෙ මෙහෙම දෙයක්. අපි හිතුව අර හේතුව නිසා වැම්පයර්වරුන්ට, ඔවුන්ගේ මව්රටෙන් බැහැර වෙනත් රටකට ගිහිං ජීවත්වෙන්න බැහැ කියලා. නමුත් අපට වැරදුණා. ඩ්‍රැකියුලා මහ කෛරාටිකයෙක්. ට්‍රාන්සිල්වේනියාවෙන් විශාල පස් ප්‍රමාණයක් පෙට්ටිවල දමාගත්තාම. ඒකෙන් ඔහුට ලොකු වාසියක් සැලසෙනවා. එතකොට ඔහුට පුළුවනි, මේ ලෝකයේ හතර කෙළවරටම නිදහසේ සංචාරය කරන්න. ඔහු ගැන හොඳින් දන්නා කෙනෙක් ඩ්‍රැකියුලා පුනුබැඳ එනතුරු ඔහුට කිසිම හිරිහැරයක් නෑ.

ඩ්‍රැකියුලාගේ ආහාර රුචිය කොහොමද කියන එක, අපට එක් කාරණයකින් ඔප්පු වෙනවා. ඩෙමීටර් නැවට වාර්නා සිට විට්බි දක්වා එන්න මාසයක් ගතවුණා. ඒ කාලයට ඔහු නාවිකයන් නවදෙනෙකුගේ ලේ බිව්වා. තමන්ට කැමැති වෙලාවට ඔහුට පුළුවනි, තමන්ගේ බාහිර පෙනුම වෙනස්කර ගන්න. විට්බි වරායේදී නැවෙන් පැනගිය යෝධ බල්ලා ගැන ඔබට අහන්න ලැබුණා නේද? ඒකෙන් මෙම කරුණ තේරුම ගන්න පුළුවනි. මා එතැන සිටියා නම් හඳුනාගන්නවා, ඒ සුනඛයෙක් නොව වෘකයෙක් බව. ඒ මොකද ට්‍රාන්සිල්වේනියාවේ කැලෑවල බල්ලන්ට වඩා වෘකයන් සිටිනවා. ඔහුට ලබාගන්න පුළුවන් තවත් මොන මොන ස්වභාවයන්ද කියන එක වැම්පයර්යන් ගැන වැඩිදුර අධ්‍යයනය කිරීමේදී මං දැනගත්තා. ඔවුන්ට පුළුවන් වවුලන්, මීයන්, සලබයන්, බකමූණන්, දූවිලි කුණාටු, මීදුම ආදී වෙසගන්න. ඔහුට පුළුවනි අඩුම වශයෙන්, ඔහු ඉන්න සමීප ප්‍රදේශයේ කාලගුණය වෙනස් කරන්න. උදාහරණයක් වශයෙන් ඝනමීදුමක් ගලාඒමට සලස්වන්න; සුළං හා කුණාටු ඇතිකරන්න. විට්බි වරායට ඩෙමීටර් නැව ආව දවසේ අප මේ බව දුටුවා.

ඩ්‍රැකියුලා වැනි වැම්පයර්යන්ගේ ලේ බීමට ගොදුරුවන අසරණයින්ට, ඊළඟට අත්වන්නේ කණගාටුදායක ඉරණමක්.



http://sherlockholmesinvestigations.blogspot.com

මරණයෙන් පස්සේ නවුතුන් වැම්පයරයන් බවට පත්වෙනවා. ලුසී මෙනෙවිය "වාටු නෝනා" ලෙස හුහාත්මී ලැබීමෙන් ඒ බව සනාථ වෙනවා. මේ හැමදෙයකටම අමතරව ඔහුට තියෙනවා ප්‍රදුමාකාර ශක්තියක්. මිනිසුන් දසීම දෙනෙකුට තියෙන කාය ශක්තියක්. අර හැඩිදැඩි නාවිකයන්ගේ මළසිරුරු හිසට උඩින් ඔසවලා විසිකරන්න වෙන කාටද පුළුවන්? ඉතින් මහත්වරුනි ඔබට පෙනෙනවා නේද අප ඉදිරියේ ඇති කටයුත්ත කොතරම් දැවැන්ත එකක්ද යන කාරණය"

"නමුත් ඔහුට දුර්වලතා තියෙන බවත් ඔබ කිව්වා. ඒවා මොනවද කියල අපි හැමෝටම දැනගන්න" ගොඩැල්මිං සාමිවරයා කීය. මේ වනවිට ඔහුගේ මුහුණේ සුදුමැලි බව ඉවත්වී ගොස් ඇතිබව මම දුටුවෙමි. ඒ වෙනුවට ඔහුගේ දෙනෙතේ පිළිබිඹු වූයේ වෛරයයි. තම මනාලිය වන්නට සිටි අසරණ තරුණියට අත්කළ භයානක ඉරණම ගැන, ගොඩැල්මිං සාමිගේ සිතේ ඩ්රැකියුලා කෙරෙහි වෛරයක් ඇතිවීමේ පුදුමයක් නැත. ඔහුගේ අතේ තිබූ වීදුරුව හිස්වී තිබිණි. "ඒ නිර්සනාට විරුද්ධව සටන්කරන්න මොනවද අපට තියෙන ආයුධ?"

"ආයුධ නම් හුගක් තියෙනවා" වෑන් හෙල්සිං පිළිතුරු දුන්නේය. "ප්‍රබල විෂ සහිත වුල්ෆ්බේන් පැළෑටිය එකක්. සුදුළූනු තවත් එකක්. මේ දේවල් තිබෙන තැන් වලට වැම්පයරයන් එන්නෙ නැ. ඔවුන් ලොකුම භයක් දක්වන්නේ, ශුද්ධ වූ කුරුසියට හා ආගම සමග බැඳුණු එවැනි දේට. අපට දවල් කාලයේත් රෑ කාලයේත් දෙකේම කටයුතු කරන්න පුළුවනි. නමුත් ඩ්රැකියුලා දවල් කාලයේ අක්‍රියවෙනවා. ඔහුට බෑ ගලාගේන්න යන වතුරපාරක් හරහා ගමන් කරන්න. ඊළගට ඔහුගේ විනාශකාරී දුෂ්ට ආත්මය කෙළවර කිරීම සඳහා අපට පුළුවනි ලී වලින් ඇණ උල් යොදාගන්න"

"විශිෂ්ටයි මහාචාර්ය වෑන් හෙල්සිං"

හෝම්ස් කීවේ, දුන්නකින් මුදා හළ ඊගයකු මෙන් පුටුවෙන් ඉහළට එසවෙමිනි. "අප ක්‍රියාත්මක කළ යුතු මූලික සැලැස්මක් ඔබ පෙන්වා දුන්නා. ඔබ අපට හෙළිකළ තොරතුරු නම් ඉතාමත් වටිනා ඒවා. පිළිතුරු වශයෙන් මට කියන්න තියෙන්නේ මෙපමණයි. මෙවැනි බලගතු සතුරෙකුට එරෙහිව නැගී සිටින්න අපට ඇති ශක්තිය සීමිතයි. ඒ වුණත් එවැනි කටයුත්තකදී අපේ සම්පූර්ණ



http://sherlockholmesinvestigations.blogspot.com

උත්සාහය යොදන්න. මාත් මගේ මිතුයාත් බොහොම සතුටින් එකඟවෙනවා.

"ඔබට බොහොම ස්තුතියි හෝම්ස් මහත්මයා" වැන් හෙල්සිං කීය. "නමුත් ඒක අවශ්‍ය වෙන්නේ නැහැ."

තමා පුදුමයට පත්වූවත් ඒ බව පෙන්වූයේ මගේ මිතුයාගේ සිරිත නොවේ. එහෙත් හෝම්ස්ගේ දෙනෙතේ මවිතය සටහන් වූ අයුරු මම ක්ෂණිකව දුටුවෙමි.

"මං එහෙම කියූ එක ගැන අමනාප වෙන්න එපා කියල මං ඉල්ලා හිටිනවා" මහාචාර්යවරයා නවදුරටත් කීය. "ඔබටම සුවිශේෂ අභිදක්ෂ ක්‍රම හා විධි මේ කටයුත්තට යොදගන්නට අපේ ඇති අකැමැත්තක් නොවෙයි. අපට උවමනා කරන්නේ මේ කටයුත්ත සම්පූර්ණයෙන්ම රහසිගතව කරන්න. හෝම්ස් මහතා කර ඇති සුවිශේෂ පරීක්ෂණ පිළිබඳ කථා හැම එකක්ම වගේ, ඕලන්ද භාෂාවට පරිවර්තනය වෙලයි තියෙන්නේ. ඒවා මගේ රටේ ඉමහත් කීර්තියට පත්වී තිබෙනවා. ඒ නිසයි අපි අකමැති මෙතනදී ඔබ අපට හවුල් කරගන්න. මගේ මිතුයින් වෙනුවෙනුත්, මගේ පැත්තෙන් පෞද්ගලිකවත් කියන්න තියෙන්නේ මේ ටිකයි. මුළු බ්‍රිතාන්‍යයම කළඹවලා ත්‍රාසයට පත්කරන්න අප කැමැති නෑ. ඩ්රැකියුලා මේ රටට ආවේ බොහොම රහසිගතව. ඔහු මේ රටෙන් යායුත්තේත් එහෙමයි."

"මහාචාර්යතුමා" හෝම්ස් කීය. "මවිසින් කර ඇති පරීක්ෂණ ඔබ රටේ පවා ප්‍රසිද්ධියට පත්වී ඇති බව ඔබ කිව්වා. නමුත් ඒ පරීක්ෂණ ඉතාම ස්වල්පයක් පමණයි. මං නිහතමානීව කියන්න කැමැතියි, මා විසින් සාර්ථක ලෙස විසඳූ පරීක්ෂණ, ඔබ කියවා ඇති ඒවා මෙන් තුන් හතර ගුණයක් ඇති බව. අප කර ඇති පරීක්ෂණ වාර්තා 'වික්‍රමාන්විත' 'රහසිගත' සහ 'අතිශය රහසිගත' යනුවෙන් කොටස් තුනකට බෙදලා දෙස්තර වොට්සන් භාරයේ තිබෙනවා. ඔබ කියවන්නට ඇත්තේ 'වික්‍රමාන්විත පරීක්ෂණ' යනුවෙන් මගේ මිතුයා හඳුන්වන රහසන්තාවයක් නොමැති ඒවා. 'රහසිගත' ලිපිගොනු වල අඩංගු ඒවා අප හෙළිකරන්නේ, අදළ පුද්ගලයින් මියගිහින් අවුරුදු ගණනකට පසුව. "අතිශය රහසිගත" ඒවා කොහොමටවත් හෙළි කරන්නේ නෑ" ඒවා අපේ මරණ සමග වැළලී යාවි. මේ කටයුත්තේදීත් ඒ ආකාරයට රහසිගත බව රකින්න අපි පොරොන්දු වෙනවා.



http://sherlockholmesinvestigations.blogspot.com

"මට කණගාටුයි මහත්මයා. ඒ වුණත් මට ඔබ දෙදෙනා හවුල්කරගන්න බැහැ" වැන් හෙල්සිං කීය.

"මහාචාර්යතුමා" හෝම්ස් කීය. "ඔබට මේ වැඩේට අපේ උදව් උවමනා නැත්නම්, ඇයි ඩ්‍රැකියුලා ගැන හැම තොරතුරක්ම අපට කිව්වේ? අප ගැන විශ්වාසය තබන්න අපහසු නම් සාකච්ඡාවට අප හවුල් කරගැනීම ප්‍රතික්ෂේප නොකළේ ඇයි?"

"මං එහෙම කළා නම් ඔබ කරන්නු ගිය පරීක්ෂණ අත්හැර දමනවාද?"

"කොහොමටවත් නෑ" හෝම්ස් කීය.

"අන්න පෙනෙනවා නේද?"

"ඔබ කරන්නේ විශාල වැරැද්දක් මහාචාර්ය වැන් හෙල්සිං. මේ තීරණය ගැන නැවත අලකා බලන්න කියලා මං ආයාචනය කරනවා" හෝම්ස් කීය.

"ඒ ගැන අපි ඒකමතිකව තීරණයකට පැමිණ අවසන්" මහාචාර්යවරයා පිළිතුරු දුන්නේය. "ඔබ දෙදෙනාගෙන් කවුරු හරි අපේ කටයුතු වලට ඇඟිලි ගහන්න උත්සාහ කරන්න එපා. එහෙම කෙරුවොත්, දැඩි ක්‍රියාමාර්ග වලට යන්නෑ අපට සිදුවෙනවා. පෞද්ගලික ක්ෂෙත්‍ර ආක්‍රමණය යන චෝදනාව උඩ ඔබ හිරභාරයට ගන්නත් පුළුවනි. ගොඩැල්මිං සාමි බොහොම බලතල තියෙන කෙනෙක්. ඔහුගේ හිතමිත්‍රයන් ඉන්නවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. මහත්වරුනි ඔබට සුභ දවසක්"

"අපි යන්න යමු වොට්සන්" හෝම්ස් අසුනෙන් නැගිට්ටේය.

අපි අශ්ව කරත්තයක නැගී බේකර් වීථිය දෙසට ගමන් කළෙමු.

"මං හිතන්නේ ඔය ඩ්‍රැකියුලා සිද්ධියට අපේ සම්බන්ධය ඔතැනින් ඉවරයි" මම කීවෙමි.

"කොහොමටවත් නෑ වොට්සන්" මගේ මිතුරා කීවේ දල්වාගත් පයිප්පයෙන් දුම් පිටකරමිනි. "මේක කෙළවරක් දකිනතුරු මං ඒකෙන් අයින්වෙන්නෙ නෑ"

"මොනවද ඔබ මේ කියන කතා? වැන් හෙල්සිංගේ අවසරයක් නැතිව අපි කොහොමද මේ ප්‍රශ්නේ තවත් ඉදිරියට යන්නේ?"

"ඔබ කියන කතාවෙත් ඇත්තක් තියෙනවා" මගේ මිතුරා කීවේ දඟකාර සිනාවක් පාමිනි. "ඒ වුණත්.............. ඔව්. ඒ වුණත් මීනා හාකර් මහත්මිය හෙට අද්දේ ලන්ඩනයට එන්නේ මොන දුම්රියේද දන්නෙ නැහැ නේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

# 7

## දුෂ්ඨයා අපට හමුවේ

පසුවද උදේ හිරු පායා එන්නට පෙර මම අවදිවීමි. අපේ විසිත්ත කාමරය තුළ ආලෝකයක් දැල්වෙන බව මගේ නිදන කාමරයට දිස්විය. පිටකබායක් හැඳගෙන මම එහි ගියෙමි. හෝම්ස්, බ්‍රැඩ්ෂෝගේ දුම්රිය කාලසටහන පෙරළමින් ඉතා උනන්දුවෙන් යමක් කියවමින් සිටියේය.

"හෝම්ස්" මම කීවෙමි. "ඔබ ගිමන් හරින්නේ බෙදවාවකයක් කරා........."

"..... ඇයි වොට්සන්?"

"මනුස්සයින් කාටත් නින්ද අත්‍යවශ්‍යයි. රහස් පරීක්ෂකයෙකු වුණත් වරින්වර නිදගන්න ඕන"

"මගේ හිතටත් මිත්‍රයා. ඔබ කියන දේ ඇත්ත." හෝම්ස් කීවේ අතේ තිබූ පොත පසෙකට දමමිනි. "ඒ නිසා මං පැයක කාලයක් විසිත්තකාමරයේ සෝෆාවේ නිදගත්තා. ඊට පස්සේ තමයි මගේ ප්‍රධාන කටයුත්තට බැස්සේ"

"මොකක්ද ඒ ප්‍රධාන කටයුත්ත?"

"පරණ දේවල් යටපත්වෙන විධියට, අලුතෙන් කරුණු සටහන් කළ ලියවිල්ලක......"

"මොනවා?"

"නෑ නෑ. මේක 19 වැනි සියවසේ ලියවිල්ලක්. මෙකෙ තියෙන ප්‍රහේලිකාව විසඳන්න උත්සාහ කළා"

"ඉතින් මොනවද ඔබට දැනගන්න ලැබුණේ?" මා ඇසුවේ ගිනිලැහ අසල පුටුවේ හිඳගනිමිනි.

"උදේ පාන්දර හයට ලන්ඩනයට ළඟාවෙන්නේ එකම දුම්රියයි. ඒක එක්සිටර් සිට එන ශීඝ්‍රගාමී දුම්රියක්. කිසි සැකයක් නෑ, හාකර් මහත්මිය මේ වෙලාවේ ලන්ඩනයට ළඟාවෙමින් සිටින්නේ ඒ දුම්රියේ. එය පැඩිංටන් පසුකර යන දුම්රියක්"



http://sherlockholmesinvestigations.blogspot.com

"අපි යනවාද ඇය හමුවෙන්න පැඩිංටන් වලට?"

"අපි යනවා ඇයව හමුවෙන්න. නමුත් ඒ පැඩිංටන් වලට නොමෙයි. මම සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය මේ අවස්ථාවේදී ටිකක් වෙනස් කරනවා වොට්සන්. මට හමුවෙලා ඉන්නවා දක්ෂ අශ්වකරත්ත රියැදුරෙක්. ඔහු මට සහතික කර කියා තිබ්බනවා, ලන්ඩනයට හැතැක්ම 10ක් ඈත තැනකදී, ඒ දුම්රියට නගින්න හැකි විධියට, අපව දොරමඟට ගිහිං දන්නම් කියලා. එතකොට ඇය සමඟ කතාබස් කරගන්න අපට වෙලාව තියෙනවා. වෑන් හෙල්සිං ප්‍රමුඛ හිතුවක්කාරයින්ගේ වචන වලින්, ඇය පක්ෂග්‍රාහී වෙන්න කලින්, අපි හැකි තරමක් තොරතුරු ඇයගෙන් අසා දැනගත යුතුයි."

"ඒ වුණත් අපි කොහොමද ඔය දුම්රියට නගින්නෙ? ඔබම කිව්වා ඒක ශීඝ්‍රගාමී දුම්රියක් බව.........."

හෝම්ස් ගේ මුහුණේ මතුවුණේ මට තේරුම් ගැනීමට අපහසු වූ සිනාවකි.

"වොට්සන්. ඔබ බ්ලැක්හීත් කණ්ඩායම වෙනුවෙන් රග්බි පාපන්දු ක්‍රීඩාවේ යෙදුණා නේද? ඒ ක්‍රීඩාවේ යෙදෙද්දී ඔබ දිවවේ මොන ආකාරයටද කියල කියන්න."

"දෙයියෝ සාක්කි!" නොදැනුවත්වම මා පුටුවෙන් ඉහළට එසවිණි.

"කලබලවෙන්න එපා වොට්සන්. සන්සුන් වෙන්න. ලන්ඩනයට හැතැක්ම දහයක් තිබියදී තැනක මේ දිනවල රේල්පාරේ අලුත්වැඩියාවක් තියෙනවා. දුම්රියේ රියැදුරා අනිවාර්යයෙන්ම ඔහුගේ වේගය අඩු කළ යුතුයි. ඔබ හරියේ දුම්රිය ගමන්කරන්නේ මං හිතන්නේ පැයට සැතපුම් දහයක දෙළහක වේගයෙන්. අපි වගේ මැදිවියේ මිනිසුන් දෙමළදෙකෙක්ට, "එම වේගයෙන් යන දුම්රියකට නැගගන්න එක, මං හිතන්නේ නෑ අමාරු වේවි කියල"

"දුම්රියේ ගාඩ් එයට ඉඩ නොදෙන්නෙ නැත්?"

"ඇයි ඉඩ නොදෙන්නෙ?"

අපි දුම්රියට නැග්ගා කියල හිතමු. ඒත් අපි නගින්නේ ටිකට් නැතුව. එහෙම නේද? මම ඇසීමි.

"ටිකට් දෙකේ මුදලයි අමතර පටුම් භාගයක මුදලයි ඔහුට දුන්නාම හරි" හෝම්ස් කීය. "ඒක අපි දුම්රිය සමාගමට දනුම්දෙන්න



http://sherlockholmesinvestigations.blogspot.com

උවමනා නෑ. වෙන්න පුළුවන් නරකම දේ ගමන්කරන දුම්රියේ නගින්න ගිහිං අනතුරට ලක්වීමයි. මොකද ඔබ කියන්නේ? කැමැතිද මේ අභියෝගය භාරගන්න?"

"හෝම්ස්. ඔබේ ඉල්ලීම නිසා මං මාරාන්තික විෂ පෙවූ ඊතල විදින වනචාරියෙකු පසුපස එළෙව්වා. "මම කීවෙමි. "පිහිපුණු සුනඛයෙකුට ගොදුරුවීමේ අවදානමට මුහුණදුන්නා. ඉතින් මේ වෙලාවේ පසුබට වෙන්න හේතුවක් මට නම් පෙනෙන්නේ නෑ. සිදුවෙන්න පුළුවන් ලොකුම දේ ශරීරයේ තුවාල ටිකක් ඇතිවීම පමණයි. ඔබ කරන අභියෝගය භාරගන්න මං සූදානම්."

"ඔය ඉන්නේ මං හඳුනන වොට්සන්" මගේ මිත්‍රයා කීවේ සතුටෙන් සිනාසෙමිනි. "මගේ ප්‍රිය වත් මිත්‍රයා. ඔබ මගේ සහායට එන බවට මගේ හිතේ සැකයක් තිබුණේ නැහැ. එහෙම නම් ඉක්මන් කරල ඇඳුම් මාරුකරගන්න. අපට තියෙනවා දුම්රියක් අල්ලාගන්න. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, මෙක දුම්රිය අතින් ඇල්ලීමක්; නැත්නම් දුම්රියේ එල්ලීමක්."

බේකර් වීථියෙන් අප පිටත්වී ගිය අශ්ව කරත්තය පැදවූයේ, ඔහුගේත් අපගේත් ජීවිත ගැන අතතක නුළ රියැදුරෙකි. වීථිවල පොලිස්භටයන් තළා පිඹිමින් වාහනවල නැවැත්වීම නිරිමට නියෝග කරද්දී, අනෙක් රියැදුරන් ශාපකරද්දී, ඔහු ඒ කිසිත් නොතකමින් තම අශ්වකරත්තය පැදවූයේය. තවත් වාහන සමග ගැටුම් සිදුවීමට ගිය අවස්ථා කිහිපයකින් අපි යන්තම් ගැළවුණෙමු. මෙසේ අධික වේගයෙන් ගමන්කිරීම වෙනුවෙන්, හෝම්ස් ඒ රියැදුරාට විශාල මුදලක් ගෙවීය. ලන්ඩනයෙන් පිටවූ පසු, ඔහු ප්‍රධාන මාර්ග මගහරිමින්, ගමනට තෝරාගත්තේ වැඩිපුර භාවිත නොවුණු කෙටි පාරවල්ය. මේවා බොහෝ තැනින් අබලන්වී තිබිණි. එබැවින් අපගේ ගමනේදී, අපට විඳින්නට සිදුවූ දුක් ගැහැට බොහෝය. කරත්තය නිතර ඉහළ පහළ ගැස්සෙද්දී අප උඩ විසිවිණි. පාර දෙපස හැරුණු කාණු වල වැටිහැටි වේගයෙන් යද්දී, රිය දෙපසට වැනුණේ, කුණාටුවට හසුවූ නෞකාවක් පරිද්දෙනි. ජීවිතය අවදානමට ලක්කරමින් කළ මේ ගමන ගැන, හෝම්ස් සැලකිල්ලක් දැක්වූ බවක් නොපෙණින. ගොදුරක් පිටුපස ලුහුබඳින දඩබල්ලකු, ගොදුර දෙස නෙත් යොමුකරගෙන සිටින අයුරෙන්, මගේ මිත්‍රයා ඉදිරිපස මාර්ගය ගැන, දැඩි අවධානයක් යොමුකරගෙන සිටියේය.


http://sherlockholmesinvestigations.blogspot.com

ඉවතට විසිවී යාම වැළැක්වීමට, අපි දෙදෙනාම දැත්වලින් කරත්තයේ අසුන් තදින් ග්‍රහණය කරගෙන සිටියෙමු. එදා උදයේ ආහාරයට කිසිවක් ගෙන නොසිටීම මගේ සතුටට හේතුවිය. ඒ කුමක් නිසාද යත්, ඇතිවූ චලනය නිසා මේ වනවිටත් මගේ බඩ දුගලීමට පටන්ගෙන තිබිණ.

අන්තිමේදී අපි අපේ ගමනාන්තයට පැමිණියෙමු. දුම්රිය මාර්ගයට යාර සියයක් නුදුරු තැනකට පැමිණෙද්දී දුනුවිලි වලාකුලකින් හාත්පස වැසී ගියේය. කරත්තය නැවැත්වීමටත් පෙර හෝම්ස් එයින් බිමට පැස්සේය. ඊට මොහොතකට පසු මම ඔහුට එකතුවීමි.

"අපි එක මිනිත්තුවක් තුලින් වැඩියි කියන්න බෑ වොට්සන්. අර බලන්න" ඔහු කීවේ හිරු පායාගෙන ආ අහස වෙත, අත දිගුකරමිනි. එළිය වැටීගෙන ආ අහස අඳුරුකරමින්, දුම්රියක කළුදුම අහස්කුස දෙසට විහිදිණි. තම පසුම්බියෙන් කාසියක් ගත් හෝම්ස්, එය රියැදුරා අතේ තැබීය. "භාරගත්ත කටයුත්ත ඉතා සාර්ථක ලෙස ඉටුකිරීම ගැන, මගෙන් අමතර රන්පවුමක්. ආපහු ලන්ඩන් යන්න. ඒ වුණත් දැන් ඉතින් වේගසීමා ගැන අමතක කරන්න එපා"

හිස්වැස්ම ඔසවා අපට ආචාර කළ රියැදුරා පිටත්වී ගියේය. තරමක් ඈතින් දුම්රිය එන හඬ අපට ඇසිණි. දුම්රිය පාර හරහා, හරස්පාර කිහිපයක් තිබුණු නිසාදෝ, එය පැමිණියේ වරින්වර "හූ" හඬ නංවමිනි.

"අපේ වැඩේට වෙලාව හරි. ඔබ සූදානම්ද වොට්සන්?"

"ඔව්"

"හිතට හොඳට ධෛර්යගන්නු වොට්සන්. මං අහල තියෙනවා අපි මේ කරන්න හදන දේ, ඉතාම දක්ෂ අයුරින්, නිරන්තරයෙන් කළ පුද්ගලයෙක් ගැන. ඒ තමා ඇමරිකාවේ හිටි මංකොල්ලකාරයා ජෙසී ජේම්ස්"

"ඒ වුණත් මං අහල තියෙන්නෙ ඔහුගෙ වෘත්තියේ අන්තිම කාලෙ ඔහු ඒ තරම් සාර්ථක වුණේ නැහැ කියලයි. එහෙම නේද?" මම ඇසීමි.

"නැහැ. ඔහු අසාර්ථක වුණේ ගමන්කරන දුම්රියකට නගින්න ගිහින් නෙමෙයි. ඔහුගේ පිටට වෙඩිපහරක් එල්ලවුණා. මට මතක හැටියට ඒ වෙඩිල්ල තැබුවේ ඔහුගේම ඥාති සොහොයුරා. ඒ ඉතින් ජෙසී ජේම්ස් කළ අපරාධවලට දඬුවම්"



http://sherlockholmesinvestigations.blogspot.com

දුම්රිය ඉදිරියට ආවේ කළුපැහැති දුම් වලාවක් අහසට නංවමිනි. එහි ඉදිරිගමන සමග පොළොව දෙදරන අයුරු මගේ දෙපාවලට දැනිණ. මීළඟට යළිත් වරක් දුම්රියේ නළාව උස් හඬින් පිඹින අයුරු අපට ඇසිණ. එයින් මම එක්වරම තිගැස්සුණෙමි. එහෙත් හෝම්ස් සන්සුන්ය. හෝම්ස්ගේ චලනයක් මා දුටුවේ ඔහුගේ නාස්පුඩුවල පමණි. ඒවා ඉතා වේගයෙන් ඇතුළටත් පිටතටත් කම්පනය විය. මෙවැනි අවස්ථාවලට මුහුණදීමට දැඩි කැමැත්තක් දක්වූ මගේ මිත්‍රයා අතිශය සතුටටත් උද්වේගයටත් පත්ව සිටියේය.

"වොට්සන්. දුම්රියේ වේගය අඩුවුණා. එන්න සූදානම් වෙන්න"

වංගුවට ළංවෙද්දී දුම්රියේ වේගය බොහෝ සෙයින් අඩුවිය. ඒ සමගම වරින්වර දුම්රියේ තිරිංග යොදන ශබ්දය ද අපට අසන්නට ලැබිණ. වේගයෙන් හමා ආ සුළඟේ තිබූ දූවිලි නිසා කිසිවක් පැහැදිලිව බලාගැනීම අපහසු විය.

"හරි වොට්සන්! දැන් පනිමු!"

එසේ කියමින් දුම්රියේ අන්තිම මැදිරිය පසුපස දිවගිය හෝම්ස්, පාපුවරුවේ කකුල් තබාගන්නා ගමන්, එහි වානේ අත්වැලේ එල්ලුණේය. ඔහු දුම්රියට නැගුණත් ඔහුගේ ගමන්කබාය සුළං පහරට පිම්බිණි. එයින් අවහිරතාවක් වුණේ මට ය. වංගුව පසුකළ දුම්රිය, දැන් ක්‍රමයෙන් වේගය වැඩිකිරීම ඇරඹුවේය. මම දිව යන ගමන් අන්තිම මැදිරිය වූ ගාඩ් මැදිරියේ අත්වැලට අත දිගු කළෙමි. එය මට අසුනොවිණි. දුම්රියේ පාපුවරුවේ සිටි හෝම්ස්, මා දිගුකළ අත දැඩිව අල්ලාගෙන, මා ඉහළට එසෙව්වේය. ඔහුගේ අයෝමය ග්‍රහණය ගැන කිසිදු සැකයක් නැත. මම පාපුවරුවට කකුලක් තබාගතිමි. ඒ සමගම හෝම්ස් තම ශක්තිය යොදවා මා මැදිරිය තුළටම එක් ක්ෂණයකින් ඇදගත්තේය.

"අපි අනුහවයෙන් බේරුණා" මම කීවෙමි. "සම්පූර්ණ ඇත්ත" මගේ මිත්‍රයා කීය. "තව ටිකෙන් අපට සිදුවන්නේ පයින් යන්න. ලන්ඩන්වලටම පයින් යන්න වුණා නම් මොන තරම් කරදයක්ද?"

දුම්රියේ ගාඩ්වරයා වූයේ විශාල උඩුරැවුලක් තිබූ හැඩිදැඩි පුද්ගලයෙකි. ප්‍රවේශ පත්‍ර පවා නොමැතිව අප, ගමන් කළ දුම්රියට නැගීම ගැන ඔහු කෝපාවිෂ්ටව සිටියේය. නොනවත්වාම අපට බැණවැදුණු ඔහු, අප දුම්රියෙන් එළියට විසිකරන බවට තර්ජනය කළේය. රන්පවුමක් දීම කිරීමෙන් සියල්ල විසඳා ගත හැකි වන


http://sherlockholmesinvestigations.blogspot.com

බවට, හෝම්ස් කල්තබා අනාවැකියක් පලකොට තිබිණි. ඒ සියල්ල ඒ අයුරින්ම සිදුවිය. මගේ මිත්‍රයා රන්කාසිය දිගුකල වහාම ගාඩ්වරයා තුටු හකුලාගත්තේය. කාකර් මහත්මිය සිටියේ කුමන මැදිරියකද යන්න පවා, අපට ඔහුගෙන් දැනගැනීමට හැකිවිය. ඇත්තෙන්ම, ඇය සිටි මැදිරියට අප කැඳවාගෙන යාමට පවා ඔහු ඉදිරිපත් විය. එහෙත් අපි එය කාරුණිකව ප්‍රතික්ෂේප කලෙමු.

අපි ඇගේ මැදිරිය සොයා දුම්රියේ ඉදිරියට ගමන්කලෙමු. අලංකාර ඇඳුමකින් සැරසී, මහීඅඳුනක තනිව වාඩිවී සිටි කාන්තාව ඉදිරියේ හෝම්ස් නැවතුණේය.

"සමාවෙන්න, ඔබ කාකර් මහත්මියද?" ඔහු විමසුවේ හිස්වැස්ම අතට ගනිමිනි.

"එහෙම විමසන්නා ශුබාකකද ඔබට මගෙන් ඇති උවමනාව?" ඇය ඇසුවාය.

ආරාධනයක් නොමැතිව අප දෙදෙනා එසේ පැමිණීම ගැන, ඇය පුදුම වූ බවක් නොපෙනිනි. එමෙන්ම ඇය අපට විරුද්ධත්වයක් ද පළ නොකළාය. පුළුල් වාටියක් සහිත හිස්වැස්මකට යටින්, අප වෙත යොමුවී තිබුණේ ඉතාම ශෝභන මුහුණකි. ඇගේ දෙනෙතේ තිබුණේ ධීමසුම් සහගත බැල්මකි. මෙම කාන්තාව අතිශයින්ම බුද්ධිමත් තැනැත්තියක බව කලින් අවස්ථාවක, හෝම්ස් මට සඳහන් කර තිබිණි.

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ මිත්‍රයා වගේම හවුල්කාරයා, දොස්තර වොට්සන්. මේ විදියට හදිසියේ කඩාවැදීම ගැන අපට සමාවෙන්න. ඊකට හේතුව අපි කියන්නම්. ඉතාම බිහිසුණු වගේම අප්‍රසන්න අබිරහසක් විසඳන්න අපි උත්සාහ කරනවා. ඒකට අදාළ තොරතුරු ටිකක් ඔබෙන් දැනගන්න අපට උවමනායි"

"මේ කවුන්ට් ඩ්‍රැකියුලා සම්බන්ධයෙන්ද?"

"ඔබ දන්නවා එහෙනම්?" හෝම්ස් කීවේ ඇගේ වචන අනුමත කරමිනි.

ඇගේ දෙතොලේ ප්‍රසන්න සිනාවක් මතුවිය.

"මං හැම දෙයක්ම දන්නෙ නෑ මහත්මයා" ඇය කීවාය. "ඒ කිව්වෙ තවමත් දන්නෙ නෑ. කරුණාකරලා මෙහෙන් වාඩිවෙන්න. ඔබ දෙදෙනා ගැන මං මීට කලින් අහල තියෙනවා. කවුන්ට් ඩ්‍රැකියුලා කියන බිහිසුණු තිරිසනා තව ටිකෙන් මගේ සැමියාව



http://sherlockholmesinvestigations.blogspot.com

මරාදමනවා. නැත්නම් සුවකළ නොහැකි දරුණු පිස්සෙක් බවට පත්කරනවා. ඔබ කටයුතු කරන්නේ ඩ්රැකියුලාට විරුද්ධවද? එහෙම නම් මං කැමැතියි ඔබ ඉල්ලන ඕනෑම සහයෝගයක් දෙන්න"

"ඔබට ස්තුතියි හාකර් මහත්මිය" හෝම්ස් කීයේය. "මට මුලින් දැනගන්න උවමනා කරන්නේ ඔබේ සැමියා ගැන ම තමා. ඔහු ඩ්රැකියුලා මන්දිරයේ රැඳී සිටි කාලය ගැන, මොනවද ඔබට කියන්න පුළුවන්?"

"මගේ සැමියා ට්‍රාන්සිල්වේනියාව බලා පිටත්වී ගිය දවසෙ ඉඳලා මට දිගින් දිගටම ලියුම් එව්වා." ඇය කීවාය. "පසුව ඔහු දිනපොතේ කරුණු සටහන්කරගෙන තිබ්බා. මං දන්නේ ඒවල සඳහන්ව තිබූ කරුණු පමණයි. ඒව කියෙව්වොත් සමහරවිට ඔබට හිතේවි, මේව උන්මත්තකයෙකු ඔහුගේ දිනපොතේ ලියූ සටහන් කියල"

"මේ වෙලාවේ නම් අහන්න ලැබෙන කිසිම දෙයකින් අපි පුදුමයට පත්වෙන්නේ නෑ. කරුණාකරල කියන්න තියෙන හැම දෙයක්ම අපට කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"මේක බොහොම දීර්ඝ කථාවක්. නමුත් මං ඔබට හැකි තරමක් කෙටියෙන් කියන්නම්" ඇය කතාව ඇරඹුවාය. "කවුන්ට් ඩ්රැකියුලාට උවමනා වෙලා තිබුණා, එංගලන්තයෙන් ගෙයක් සහිත වත්තක් මිලට ගන්න. ඒ සඳහා අදාළ ලියවිලි සකස් කිරීමට නීතිඥයෙකු එවන්න කියලා, ඔහු නීති උපදේශක සමාගමට දැන්නුවා. ඒ සඳහා ට්‍රාන්සිල්වේනියාවට යැවුණු නීතිඥයා තමා මගේ සැමියා, ජොනතන් හාකර්.

ඩ්රැකියුලා මන්දිරය බලා ඔහු ගිය ගමනේදී, ඔහුට ඒ පළාත්වල වැසියන් බොහෝ ගණනක් මුණ ගැහුණා. ජොනතන්ට පෙනුණේ ඔවුන් මිථ්‍යා විශ්වාස ඇදහූ පුද්ගලයින් ලෙසයි. මේ අය හැම කෙනෙක්ම ජොනතන්ට ආයාචනා කළාලු, ඩ්රැකියුලා මන්දිරය වෙත නොගිහිං ආපහු හැරෙන්න කියලා. නමුත් ඔහු ඒ කිසිදෙයක් ගණන් ගත්තේ නෑ. මන්දිරයට ගිය ඔහුට පෙනුණේ, ඩ්රැකියුලා, සැඟවුණු රුදුරු බවක් තිබුණත් ප්‍රියමනාප පුද්ගලයෙකු හැටියටයි. මට මතකයි ජොනතන් ලියල එවල තිබුණු එක් කාරණයක්. එංගලන්තයට ඇවිත් කාලයක් විනෝදජනක ලෙස ගතකරන්න ඩ්රැකියුලා මග බලාගෙන හිටියාලු. ඉඩම් මිලට ගැනීම ගැන අදාළ



http://sherlockholmesinvestigations.blogspot.com

ගිවිසුමෙ තිබුණු කොන්දේසි එකකට වත්, ඩිරැකියුලා විරුද්ධත්වයක් පැවෙ නැතිලු. ජොනතන්ට පැවරී තිබුණු කටයුතු හැම එකක්ම ඔහු බොහොම කෙටි කාලයකින් අවසන් කළා. ඉතින් ඔහු ආපහු එංගලන්තය බලා එන්න සූදානම් වුණා. ඔහු ආපසු ආව වහාම විවාහ වෙන්නයි අප බලාපොරොත්තුවෙන් සිටියේ.

නමුත් ඩිරැකියුලා ඒකට විරුද්ධ වුණලු. ඔහු කියා තිබුණේ, අඩුම ගණනෙන් තව මාසයක් වත්, ජොනතන් ට්‍රාන්සිල්වේනියාවේ රැඳී සිටිය යුතු බව. මේ ගැන ජොනතන් විරුද්ධත්වය ප්‍රකාශ කළා. නමුත් කවුන්ට් ඒවා කනකට ගත්තේ නැතිලු.

වැඩි දවසක් යන්න පෙර මගේ සැමියාට වැටහිලා තියෙනවා, ඔහු සිටි නියම තත්ත්වය. තමන් ඩිරැකියුලා මන්දිරයේ සිරකාරයෙක් බවට පත්වී ඇති බව ජොනතන් තේරුම් ගත්තලු. මේ මන්දිරයේ කොතැනකවත් කැටපත් තිබිල නැහැ. ජොනතන් රැවුල බෑම සඳහා ගෙනගිය එකම කැටපතත්, කවුන්ට් ඉවතට විසිකරල බිඳදමල තියෙනවා. මීට අමතරව මගේ සැමියාට ඒත්තු ගිය තවත් කාරණයක් තමයි, කවුන්ට් ඩිරැකියුලා කිසිම දවසක දවල් කාලෙ දකින්න නොලැබුණු එක. මේ කාරණා නිසා ජොනතන්ගෙ හිතේ විශාල සැකයක් ඇතිවුණා.

තමන්ට ඇතිවූ ප්‍රශ්න වලට පිළිතුරු සොයමින්, ඔහු ඩිරැකියුලා මන්දිරයේ හැම තැනක්ම ගවේෂණය කරන්න උත්සාහ කරල තියෙනවා. එවිට ඔහුට දකින්න ලැබුණේ මොකක්ද? මන්දිරයෙන් පිටවීමට තිබුණු සෑම දොරටුවක්ම අරින්න බැරි විධියට වසා අගුළුදමා ඇති බව.......... ඔහු ජීවිතයේ අතිශයින්ම භයට හා කම්පනයට පත්කළ දර්ශනයක්, මගේ සැමියාට දකින්න ලැබුණේ එද හැන්දෑවෙ.........." කී හාකර් මහත්මිය කිසිවක් නොකියා කථාව නැවැත්වූවාය. හෝම්ස් ඇය දෙස හෙළුවේ අනුකම්පා සහගත බැල්මකි.

"පසුබට වෙන්න හේතුවක් නෑ හාකර් මහත්මිය" ඔහු කීය. "ඊයෙ පෙරේද අපට අහන්න ලැබුණු දකින්න ලැබුණේ බොහොම පුදුමාකාර දේවල්. ඒ නිසා ඕනෑම දෙයක් විශ්වාස කරන්න අපි සූදානම්. මොන වගේ දෙයකින්ද ඔබේ සැමියා භීතියටත් කම්පනයටත් පත්වුණේ?"

ඇය යළිත් කථාව පටන්ගත්තාය. "මන්දිරයේ එක් ජනේලයකින් එළියේ, බිත්තියට හඳඑළිය වැටී තිබුණාලු. මේ බිත්තිය දිගේ හිස



http://sherlockholmesinvestigations.blogspot.com

පහළට සිටින සේ කවුන්ට් ඩ්‍රැකියුලා පහළට රූටා ගියේ, හරියට යෝධ වවුලෙකු තටු විහිදගෙන පහළට යන ආකාරයටලු. ඔහුගේ ලෝගුවත් වවුලෙකුගේ අත්තටු වගේ පහළට එල්ලා වැටෙමින් තිබූ හැටි ජොනතන් දුටුවාලු."

"දෙයියෝ සාක්කි!" මට කියැවිණි.

"පුදුමාකාර දේවල් තව තියෙනවා දොස්තර මහත්මයා" ඇය කීවාය. "මෙම දර්ශනයෙන් ජොනතන් භීතියට පත්වෙලා, ඔහුගේ ඇඟ හිරිවැටී ගියාලු. ඒ වුණත් තමන්ගේ සත්කාරක ඩ්‍රැකියුලා ගැන ඇත්ත තත්ත්වය, මගේ සැමියාට දකින්න ලැබිලා තියෙන්නේ පසුවද.

ජොනතන් බොහොම නිර්භය පුද්ගලයෙක් හෝම්ස් මහත්මයා. මොකක්ද දන්නවද ඔහුට හිතුණේ? ඔහු හිතුවලු, කවුන්ට් ඩ්‍රැකියුලාට ගෙදර බිත්තිය දිගේ පහළට රූටා යන්න පුළුවන් නම්, තමන්ටත් එහෙම යාමට හැකිවිය යුතුයි කියල. එහෙම හිතල ජනේලයකින් එළියට ආ ඔහු, බැරෑදියක ආධාරයෙන් පහළට බැස්සලු. ඔහු පා තැබුවේ හතරවටේටම තාප්ප වලින් වටවූ මැද මිදුලක් වගේ තැනකට. ඒක පිටුපස තිබුණා අඳුරු තැනක්. ඒක ඇතුළේ ඔහුට දකින්න ලැබුණේ මොකක්ද දන්නවද? මිනීපෙට්ටියක් ඇතුළෙ වැතිර හිටි කවුන්ට් ඩ්‍රැකියුලා! ඔහු සිටියේ මාරාන්තිකව පරළ වූ තත්ත්වයකින්. මිනීපෙට්ටියේ පිටපැත්තේ තිබුණා ඩ්‍රැකියුලාගේ නිල ලාංඡනය. ඔහුගේ මුහුණ ඉදිමිලා; තොල් දෙකෙනුත්, කටේ දෙපැත්තෙනුත් වැගිරුණේ අමුලේ. මේ භයානක දර්ශනය දුටු ගමන් ජොනතන් භීතියෙන් වියරුවුණා. ළඟ තිබුණු සවලක් ඔහු අතට ගත්තේ, එයින් පහරක් එල්ල කරල ඩ්‍රැකියුලාව විනාශ කරන්න. නමුත් ඊට මොහොතකට පෙර කවුන්ට් දෙනෙත් විවෘත කළා. ඔහු දුටුවා ජොනතන් ප්‍රහාරයක් එල්ල කරන්න සූදානම් බව. ඩ්‍රැකියුලා ක්ෂණිකව ක්‍රියාත්මක වුණා. ඒ නිසා ජොනතන් එල්ල කළ පහරින්, සතුරාගේ නළලේ තැළුම් තුවාලයක් විතරයි ඇතිවුණේ. දැන් ඉතින් තමන්ට පණපිටින්, මේ බිහිසුණු හිරගෙදරින් එළියට යන්න හතුරා ඉඩ නොදෙන බව, මගේ සැමියා දැනගත්තා. තමන් බේරී ගියොත් ඩ්‍රැකියුලාට පාඩුයි. ඔහුට එංගලන්තයේ අසරණ ජීවිත බිලිගන්න ජොනතන් ඉඩ තියන්නේ නැහැ. නමුත් කොහොමහරි තමන්ගේ ජීවිතය ගළවාගන්න මගේ සැමියා සමත්වුණා.



http://sherlockholmesinvestigations.blogspot.com

ඒ බිහිසුණු යක්ෂයාගේ වහළු යට, මගේ සැමියා මුහුණ දුන්නු කෲර වධහිංසා නිසා, ඔහුගේ සිහිය විකල් වුණා. සති ගණනක් ඔහු බුඩාපෙස්ට්වල, මානසික රෝහලක කල්ගෙවුවේ උන්මත්තකව. එහි වෛද්‍යවරුන්ට හැකිවුණා මගේ ලිපිනය ඔහුගෙන් දැනගන්න. ඔහුගේ අසනීපය ගැන වෛද්‍යවරු මට දන්වා එවා තිබුණා. මං හංගේරියාව බලා ගියා. අපි දෙන්නා විවාහවුණේ එහේදි. ඊට පස්සේ අපි හිතුවේ මේ භයානක සිහිනය ඉවරයි කියලයි. නමුත් අප හිතූ දේ වැරැදි බව ඉක්මනින්ම දැනගන්න ලැබුණා. ජොනතන් ඔහුගේ අසනීප තත්ත්වයෙන් යන්තම සුවයක් ලැබුවා විතරයි. ඒ දවස්වල මට මහාචාර්ය වැන් හෙල්සිං ගෙන් ලිපියක් ලැබුණා. ඔහු දන්වා තිබුණා කවුන්ට් ඩ්‍රැකියුලා එංගලන්තයට පැමිණ ඇති බව. එද මගේ සැමියා දිවුරා කියා හිටියා, ඒ බිහිසුණු තිරිසනා මේ ලෝකයෙන් තුරන් කරන බවට. මේ මොහොතේ ජොනතන් ඉන්නේ විට්බි වල. ඔහු ලොකු කටයුත්තක යෙදිලයි ඉන්නේ. කවුන්ට් ඩ්‍රැකියුලා පස් පෙට්ටි පනහක් එංගලන්තයට ගෙනාවලු. ඔහු ඒවා තැන් තැන් වලට යවලලු. ජොනතන් උත්සාහ දරමින් ඉන්නේ ඒවා යැවූ තැන් සොයාගන්නයි",

මිනා හාකර් මහත්මිය එම පුදුමාකාර කථාන්තරය අපට කීවේ සන්සුන් අයුරෙනි. ඇගේ සැමියා සදාකාලික උන්මත්තකයෙකු බවට වුවත් පත්කළ හැකිව තිබූ, භයංකර සිදුවීම් එකින් එක විස්තර කරද්දී, මගේ සිතේ ඇතිවූයේ දැඩි භීතියකි. ගමන්කිරීමට අපහසු තියුණු කඳුබෑවුම් හා කඳු ශිඛර සහිත ට්‍රාන්සිල්වේනියාව, මගේ සිතේ මැවී පෙනිණ. රාත්‍රී කාලයේ සිත කලඹන හඬින් උඩුබුරලන, රෞද්‍ර වෘකයන් පිරි වනාන්තර අහිත ට්‍රාන්සිල්වේනියාව. ඒ ගැන සිතමින් සිටි මම දුම්රියේ නළා හඬින් තිගැස්සුණෙමි. මා සැබවින්ම සිටින්නේ එංගලන්තයේ රමණීය ගම්පෙදෙසක් හරහා ගමන්කරන දුම්රිය මැදිරියක බව මට සිහිවුණේ එවිටයි.

හාකර් මහත්මියගේ කෙටි, එහෙත් වීරත්වය පිළිබිඹු වූ කථාන්තරය ඇසීමෙන්, මගේ සිතේ ඇය ගැන ඇතිවූයේ පැහැදීමකි. තම ප්‍රේමවන්තයා සිහි විකල් වී පිස්සෙකු බවට පත්ව සිටියත්, අප්‍රතිහත ධෛර්යයකින් ඔහු යළි සුවකරගෙන, ඔහු හා විවාහවීමට තරම් නිර්භීත වූ ඇය වීරවරියක් නොවේද? මේ අදහස ඇතිවුණේ මගේ සිතේ පමණක් නොවන බව මට වැටහුණේ, හෝම්ස් ඇය අමතා කී දේට සවන් යොමුකරද්දීය.



http://sherlockholmesinvestigations.blogspot.com

"හාකර් මහත්මිය. ඔබේ ස්වාමිපුරුෂයා කටයුතු කර ඇති නිර්භීතභාවය සමාන කළ හැක්කේ, ඔබ දක්වා ඇති නිර්භීත භාවයට පමණයි. අපට තවත් එක ප්‍රශ්නයක් ඉතිරි වෙනවා. කවුන්ට් ඩ්‍රැකියුලා වෙනුවෙන් එංගලන්තයේ මිලට ගත් වත්ත හා මන්දිරයේ නම මොකක්ද කියලා ඔබේ ඇමියා හෙළිකළාද?"

"ඔහු ඒ විස්තර හෙළිකළා පමණක් නොවෙයි; මට තවත් දේවල් ලැබුණා හෝම්ස් මහත්මියා." ඇය කීවාය.

"එම ස්ථානයේ ඡායාරූප පවා මට ලබාදුන්නා" බිම තිබූ මල්ලට අත දැමූ ඇය පාර්සලයක් ගෙන එය මගේ මිත්‍රයා අතට දුන්නාය.

ඡායාරූප වලින් දක්වුණේ ගල්වලින් ඉදිකළ පුරාණ මන්දිරයකි. එය වටාවූ උස් ගල් තාප්පය, මල බැඳුණු යකඩ ගේට්ටු හා මිදුලේ වැවී තිබූ කප්පාදු නොකළ ගස් වෙත, අපේ අවධානය යොමු විය. ඒ ගස් නිසා දවල් කාලයේ පවා එහි තිබුණේ අන්ධකාර බවක් බැව්, ඡායාරූප වලින් පැහැදිලිවම පෙනිණ. ගෘහනිර්මාණ ශිල්පය අනුව ඒ මැඳුර, මධ්‍යකාලීන යුගයේ ඉදිකරන ලද්දක් බැව් සිතාගත හැකිවිය. එහෙත් ශතවර්ෂ ගණනාවක් තිස්සේ පසුකාලීනව යම් යම් කොටස් අලුතෙන් එකතුකර තිබූ බව අපි දුටුවෙමු. ඒ අනුව අපට එක් කරුණක් නිශ්චිතව සිතාගැනීමට හැකිවිය. එනම් මෙය දන් කිසිදු සැලැස්මක් නැති, විවිධ තැන්වල විවිධ ආකාරයට, කාමර, බරාඳ, තරප්පු, ගබඩා, බිම්මහල් පිහිටි, අද්භූත ගුහාවක තත්වයට පත්ව ඇති බවය. හරිහැටි ඉර එළියක් නොලැබුණු එම අන්ධකාර නිවසේ, තෙත බිත්ති මත බැඳුණු පුස් හා පෙද පාසිවල පිළුණු ගඳ මට දනෙන්නාක් මෙන් විය.

"ඒ ඉඩම සහිත මන්දිරයේ නම කාෆැක්ස්. එක තියෙන්නේ පර්ෆ්ලීට් අසල හරස්පාරක" හාකර් මහත්මිය පැවසුවාය. "මගේ සැමියා ඔහුගේ කැමරාවෙන් තමයි ඡායාරූප ගත්තේ. ඒ ඩ්‍රැකියුලාට නිවස පෙන්වීම සඳහා, ට්‍රාන්සිල්වේනියාව බලා පිටත්වෙන්න කලින්. මේ ඉඩම අක්කර 20ක් පමණ විශාල එකක්. ඉඩම වටේට තියෙන්නේ ගොඩනැගිලි කිහිපයක් පමණයි. එයින් එකක් දොස්තර ජෝන් සේවඩ් යටතේ පාලනය වන මානසික රෝහල. මං හිතන්නේ නෑ ඔබට ඒ කරුණාවන්ත දොස්තර මහත්මයා හමුවෙලා ඇති කියල. මේ ලෝකයේ මට උන්නු මගේ ඉතාම ආදරණීය මිතුරිය, පහුගිය දවස්වල දරුණු ඛේදවාචකයකට මුහුණදුන්නා. ජෝන් සේවඩ් දොස්තර මහත්මයා තමයි ඇගේ ජීවිතය



http://sherlockholmesinvestigations.blogspot.com

ගලවාගැනීමේ අරමුණෙන්, තමන්ගේ ජීවිතය පරදුවට තබලා කටයුතු කළේ"

"ඔව්. ලූසී වෙස්ටෙන්රා මෙණෙවියට අත්වුණු ශෝකජනක ඉරණම ගැන අපට දැනගන්න ලැබුණා." හෝම්ස් කීවේ ඡායාරූප ආපසු දෙමිනි.

"හැබැට?" ඇය ඇසුවේ ඇහිබැම ඉහළට නංවමිනි. මේ භයානක අපරාධවලත්, අසරණ ලූසීගේ මරණයත් අතර සම්බන්ධයක් තියෙනවද? ඒ බවත් මං කොහොමටවත් දැනහිටියෙ නෑ?"

"හාකර් මහත්මිය, ඔය කරුණ ගැන දැඩීදුර සාකච්ඡා කරන්න අපට වැඩි වෙලාවක් නැහැ වගෙයි නේද?" හෝම්ස් ඇසීය. "මං හිතන්නෙ අපි පැඩිංටන් වලටත් ඇවිත්, එහෙම නේද වොට්සන්? මං ඔබට ශුභ දවසක් ප්‍රාර්ථනා කරනවා හාකර් මහත්මිය. ඔබ අපට ලබාදුන් තොරතුරු බොහොම ප්‍රයෝජනවත් වේවි. අප ඔබ හමුවෙන්න ආ බව කිසිම කෙනෙකුට හෙළි නොකරන ලෙස, මං ඔබෙන් ඉල්ලා හිටිනවා. එහෙනම් අපි යමු වොට්සන්"

පැඩිංටන් දුම්රියපොළේදී ඇයට දුම්රියෙන් බසින්නට ඉඩදී අපි බලාසිටියෙමු. දෙස්තර ජෝන් ජෙව්ඩ් පැමිණ ඇය කැඳවාගෙන යනතුරු මඳක් රැඳී සිට, අපි ඉන්පසු දුම්රියෙන් බැස්සෙමු. අප දුම්රියපොළෙන් ඉවතට එද්දී හෝම්ස් සිටියේ අතිශයින්ම ප්‍රීතිමත් ස්වභාවයකින් බව මම වටහා ගත්තෙමි. සංගීත ප්‍රසංගයක ඔහු ඇසූ කළ මියුරු සංගීත ඛණ්ඩයක්, හෝම්ස් සිවුරුහන් කරමින් සිටියේය.

"හොඳයි වොට්සන්. මොනවද දැන් ඔබට හිතෙන්නේ?"

"මීනා හාකර් කියන්නේ පුදුමාකාර චිත්ත ධෛර්යයක් ඇති කාන්තාවක්." මම කීවෙමි.

"ඒකෙ නම් කිසිම සැකයක් නෑ. ඒක හොඳටම පැහැදිලියි" හෝම්ස් කීය. "මං ඇහුවෙ මේ අපරාධකරුවා හා ඔහුගේ කටයුතු ගැන, ඔබට තවමත් අවිශ්වාසද?"

"මට නම් තවමත් අවිශ්වාසයි" මම පිළිතුරු දුන්නෙමි. "නමුත් මං පිළිගන්නවා, මුලින් මං හිටිය තරම් දැඩි ස්ථාවරයක නෙමෙයි දැන් මං ඉන්නෙ. විශ්වාස කළ යුත්තේ මොකක්ද, නොකළ යුත්තේ මොකක්ද කියල හිතාගන්න මට තවමත් අමාරුයි. මට වෙලාවකට මෙහෙම හිතෙනවා හෝම්ස්. මේ ගැන අපි කතාබහ කළ හැම



http://sherlockholmesinvestigations.blogspot.com

පුද්ගලයෙකුම, අසාමාන්‍ය විධියට අද්භූත දර්ශන දක තිබෙනවා; ඔවුන් ඒවා විශ්වාස කරනවා. මෙක හරිම පුදුමාකාරයි."

"ඒ හැම කෙනෙකුම එකම දේ දුටු බව; එකම විධියට ගිහිම; අහඹු සිදුවීමක් වෙන්න පුළුවන්ද වොට්සන්?"

"ඒක මං දන්නෙ නෑ" මම කීවෙමි. "ඒ වුණත් අපි හැමදෙයක් ගැනම විද්‍යානුකූලවයි ඉගෙනුමක් ලැබුවෙ. සිද්ධාන්තයේ උගන්වන දේ නිවැරදිද යන්න ප්‍රායෝගික පරීක්ෂණ කරල අත්හද බැලුවා. විද්‍යාගාරයෙදි ඒ ප්‍රායෝගික පරීක්ෂණ සාර්ථක වුණු නිසයි, සිද්ධාන්තය විශ්වාස කළේ. හොඳයි ඔබ කොහොමද? ඔබ කාබනික, අකාබනික රසායන විද්‍යා දෙක ගැනම හසළ දැනුමක් ඇති කෙනෙක්. ඔබේ ප්‍රායෝගික පරීක්ෂණයෙකින් ඔප්පු නොවුණු දෙයක් ඔබ විශ්වාස කරනවද?

මට නම් තවමත් ඒවා විශ්වාස කරන්න අමාරුයි හෝම්ස්. මහා රාත්තිරියේ තමන්ගේ සොහොන් වලින් නැගිටලා, ජීවත්ව ඉන්න අයගෙ ලේ බීලා, තමන්ගේ ජීවය රැක ගන්නා වැම්පයර් භූතයන්? අනෙක් අයට අහුනොවී සැනගන්න, මීදුම හා කුණාටු මැවිය හැකි පුද්ගලයන්?"

"මෙක පුංචි ලෝකයක්. එහෙම එකිනෙකට ප්‍රතිවිරුද්ධ චින්තන දෙකක්, මේ ලෝකෙ තිබෙන්න හැටියක් නැහැ. එහෙම නේද වොට්සන්?" හෝම්ස් කීවේ මගේ මතයට හිස නමමිනි. "අද රෑට අපට යන්න තියෙනවා, පර්ෆ්ලීට්වල ඩ්රැකියුලා මිලට ගත් වාසභවනය බලන්න. එතනදීවත් අපට හැකිවේවි, ඔබ කිව් අර චින්තන දෙක එකින් එක විමසා බලන්න. ඊලඟට සම්මුතියකට එන්න"

අප භාරගත් කටයුත්ත ගැන එදා දිවා ආහාරය තුරු හෝම්ස් කිසිවක් සඳහන් නොකෙළේය. දවසේ ඉතිරි කාලය ඔහු ගතකළේ, අප නිවසේ රසායන විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය තැන්පත් කර තිබුණු කෙළවරට වී, රසායන විද්‍යා පරීක්ෂණයක නියැලෙමිනි. නිවසේ සිට මා ගෙන ආ වෛද්‍ය විද්‍යාත්මක සඟරා කිහිපයක් කියවීම සඳහා මම කාලය ගතකළෙමි.

ඉර අවරට යද්දී තම අසුනෙන් නැගී සිටි මගේ මිතුරා, පිටකබාය ඉවත දමා ඇඳුම් කට්ටලයෙන් සැරසුණේය. මීළඟට වැහි හා සීතල සුළඟෙන් ආරක්ෂා විය හැකි කබායක් ද හැඳගත්තේය. ඉන් පසු



http://sherlockholmesinvestigations.blogspot.com

ලාච්චුවක් විවෘත කළ ඔහු රිවෝල්වරයක් එළියට ගෙන, එය තම සාක්කුවට දමාගත්තේය. ඔහුගේ මේ හැසිරීම ගැන මා බලාසිටි ආකාරය දුටු මගේ මිත්‍රයාගේ මුහුණේ සිනාවක් මතුවිය.

"අපේ හතුරාට විරුද්ධව පාවිච්චි කළ හැකි ආයුධ අතරට වෙඩි උණ්ඩ යොදගත හැකි බව, වෑන් හෙල්සිං සඳහන් කළේ නම් නෑ. ඒ බව මට මතකයි වොට්සන්. ඒ වුණත් අපි දන්නෙ නෑ, මගදි අපට මුහුණදෙන්න වෙන්නෙ, හොඳා වගේ භයානක උපද්‍රව වලටද කියල. ලන්ඩන් නගරයේ පාතාල ලෝකයේ දුෂ්ට මැරවරයන්ගෙන් ආරක්ෂාවෙන්න නම, මට හැමදාමත් ගිනියම් වුණු ඊයම් මුනිස්සම් වල පිහිට ලැබුණා. මං කැමැතියි ඔබත් ඔබේ රිවෝල්වරය අරගන්නවා නම්"

කාෆැක්ස් වත්තට ඇතුළුවීමට තිබූ මහ යකඩ ගේට්ටුව සම්පූර්ණයෙන්ම මල බැඳුණු එකක් විය. හාකර් මහත්මිය අපට පෙන්වූ ඡායාරූප නිසා, මෙය හඳුනාගැනීම අපහසු නොවිණි. අප එය ඉදිරියට යද්දී තදින්ම ඇඳිරි වැටී තිබුණේ නැත. කෙසේ වෙතත් වත්ත ඇතුළත ඝනව වැඩුණු පඳුරු හා උස්ගස් වලින් වැසී තිබිණ. ඒ නිසා, ගේට්ටුවෙන් ඇතුළත පිහිටියේ මොනවාදැයි අපට දැකගන්නට නොලැබිණි. අගුළ ගැලවී තිබුණු ජනේලයක පියන සුළං සමග පැද්දී, සුළං පාර සමග වැසී යන ශබ්දය අපට එක්වරම ඇසිණ. භයානක හොල්මන් කථාවක් ලිවීමට නම් මෙය අපූරු පරිසරයක් යයි මට සිතිණ.

හෝම්ස්ගේ ඉල්ලීම අනුව මම ලන්තෑරුමේ එළිය වැඩිකොට එය ඉහළට ඔසවා ඇල්ලීමි. දැන් එහි ආලෝකය ගේට්ටුවේ විශාල යකඩ ඉබියතුරු අගුළ වෙත වැටිණ. හෝම්ස් තම සාක්කුවෙන් යතුරු රාශියක් තිබූ යතුරු කෑල්ලක් එළියට ගත්තේය. මෙය ගෙවල් බිඳින සොරුන් භාවිත කරන විවිධ ආකාරයේ හොර යතුරු වලින් සමන්විත එකකි. අගුළ දෙස බලා මිනිත්තුවක් පමණ කල්පනා කළ මගේ මිත්‍රයා, එක් යතුරක් තෝරාගත්තේය. එය අගුළට දමා දෙවරක් කරකවද්දී අගුළ වහා විවෘත විය. ගේට්ටු පියන තල්ලු කරද්දී එයින් තරමක උස් හඬක් නැගිණ. එය නම් අපේ සතුටට හේතු වූයේ නැත.

"අපි ගේට්ටුව ඇරී බව මිනිහ දැනගත්තා, මං හිතන්නෙ" හෝම්ස් කීය. "අපට වත්තට ඇතුළුවෙන්න, වෙන කිසිම විධියක් නෑ.



http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම පරෙස්සමෙන් අඩිය තියල එන්න වොට්සන්. අපි ඔහුගේ වත්තට පා තියල බව ඔහු දන් දන්නවා."

ගේට්ටුව ළඟ සිට නිවස වෙනට සෑහෙන දුරක් තිබිණි. මිදුලේ කොතරම් ගස් වැවී තිබුණේ ද යත්. සමහර තැන් වලදී අපට ඉදිරියට යාමට සිදුවූයේ එකෙක් පසුපස අනෙකාය. සුළඟට එහා මෙහා පැද්දෙමින් වැදුණු ජනේලයේ හඬ හැරෙන්නට, මුළු පරිසරයේම තිබුණේ සිත් කුළඹවන නිශ්ශබ්දතාවයකි. කලින්ද රාත්‍රියේ මට දැනුණු කාගේ හෝ ඇස් අප වෙත යොමුවී තිබෙනවාය යන හැඟීම යළිත් මගේ සිතේ ඇතිවිය. ගොඩනැගිල්ලට කිට්ටු වන්නට, එම හැඟීම වඩාත් තදින් දැනිණි. මහදොර ඉදිරිපස දොර සහ ඔක් ලෑල්ලෙන් තනා, හරහට යකඩපටි දමා සවිමත් කළ එකකි. අපට නොපෙනෙන තැනක සිට ඇස් දෙකක් අප වෙත යොමුවී, අප කරන සෑම ක්‍රියාවක්ම නිරීක්ෂණය කරනවා යන්න මෙතැනදී මට වඩාත් දැනිණි.

යතුරු කැරැල්ලේ ඔහු උත්සාහ කර බැලූ දෙවැනි යතුරෙන්ම දොරඅගුළ හැරගැනීමට හෝම්ස් සමත්විය. දොර ලෑල්ලේ බර නිසා එය ඇතුළට තල්ලු කිරීමට සෑහෙන උත්සාහයක් දැරීමට අපට සිදුවිණි. මගේ අතේ තිබූ ලන්තෑරුමේ එළියෙන් මා දුටු මුල්ම දෙය නම් දොරටුව හරහා තිබූ ඝන මකුළුදැලක් හා මෙහි දූවිලි තට්ටු ගණනක් එකතුවී තිබුණු බැවින් මෙය පැහැදිලිව පෙනිණි. මෙය කුඩා කුරුල්ලෙකු වුවත් පටළවා ගැනීමට තරම් ශක්තිමත් යයි මම සිතිමි.

"අපට මොකක් හරි වැරැද්දක් වෙලා තියෙනවා හෝම්ස්" මම කීවෙමි. "දීර්ඝ කාලයකින් මේ ගෙදරට කිසි කෙනෙකු ඇතුළුවෙලා නැති බව හොඳටම පැහැදිලියි. එහෙම ඇතුළුවුණා නම්, මේ විශාල මකුළුදැල නොකඩා ඔහුට ඇතුළට යන්න හැටියක් නෑ"

"අපි කටයුතු කරන්නේ සාමාන්‍ය මිනිහෙක් සමග නොමෙයි වොට්සන්. අනෙක මේක ඇරුණාම මේ ගෙදරට වෙනත් දොරටු තියෙන්න පුළුවනි"

තමා අතේ තිබූ සැරයටියෙන් හෝම්ස් එම මකුළුදැල කඩා දැම්මේය. ඉන්පසු අපි ප්‍රධාන විසිත්ත කාමරයට පිවිසුණෙමු.

එක්වරම මගේ නාසයට දැනුණේ තරමක දුර්ගන්ධයකි. මෙය කොතරම් අප්‍රසන්න එකක්වී ද යත්, මම හුස්ම ඉහළට නොගෙන සිටීමට උත්සාහ කළෙමි. එහෙත් එය කළ හැක්කක්ද?


http://sherlockholmesinvestigations.blogspot.com

සාමාන්‍යයෙන් කාලයක් තිස්සේ වසා තිබෙන පාළු ගෙවල්වල පිළුණු ගඳක් හෝ වාතය අපිරිසිදු වීම නිසා ඇතිවූ ගඳක් තිබීම ස්වාභාවිකය. එහෙත් මේ එවැනි ගඳක් නොවේ. මේ නම් මිනිසෙකු හෝ සතෙකු මරණයට පත්වී, මළසිරුර කුණුවීම නිසා ඇතිවූ දුර්ගන්ධයකි. අප මේ නිවසට පිවිසියේ බිහිසුණු කටයුත්තක යෙදීමේ අරමුණෙනි. ඒ නිසා නාගවෙලාවට මේ දුගඳ මගේ සිතේ ඇතිවූ පිළිකුළ නිසා මනසේ මැවුණු එකක්ද? කිසිසේත් එසේ විය නොහැක.

එක් තැනකදී මගේ මිත්‍රයා මට එතැනම නවතින මෙන් සංඥා කළේය. ඔහුට උවමනා වූයේ මගේ අතේ තිබූ ලන්තෑරුමේ එළිය ඔහුගේ දෙපා අසල පොළොවට යොමුකිරීම බව මම තේරුම් ගතිමි. දූවිලි තැවරුණු පොළොවේ පිරිමියෙකුගේ බූට් සපත්තුවක අඩියේ ලාංඡනයයි. ඒ දුටු මම තිගැස්සුණෙමි.

"මේ සපත්තු අඩියේ ලොකු ඇණ ගසා ඇති බව පෙනෙනවා" හෝම්ස් කීය. "ඒකෙන් තේරෙන්නේ මේ බරවැඩට අඳින බූට් සපත්තු බවයි. සැකයක් නෑ. ශ්‍රමදාන කම්කරුවෙකුගේ සපත්තුවක්. මං කිව්වා නේද වොට්සන්, මේ ගෙදරට තවත් දොරටු තියෙන බව"

මෙම ගරාවැටුණු පෞරාණික මන්දිරයේ සෑම තැනකම පාගේ ඇවිදිමින්, අප කොයිතරම් වේලාවක් ගතකළේද යන්න, මට හරියටම කීම අපහසුය. එහි තිබූ දුර්ගන්ධයට මේ වනවිට මගේ නාසය හා පෙණහැලි යම්තරමකට පුරුදු වී තිබිණ. අන්තිමේදී අපට යාමට ඉතිරිවී තිබුණේ, නිවසේ දෙවිමැඳුර ලෙස වෙන්කළ කාමරයට පමණි. ඒ සඳහා අඳුරු බිම්මහල දෙසට තරප්පු කිහිපයක් බැසයාමට සිදුවිය. තරප්පු පෙළ අවසානයේ තදින් වසා තිබූ දොරකි. අගුළු දමා නොතිබූ එය විවෘත කිරීම අපහසු නොවීය.

මෙතෙක් වේලා මා සිතා සිටියේ, දැන් ඕනෑම දුගඳක් ඉවසීමට මගේ නාසය හුරුවී ඇතැයි කියාය. එහෙත් අර කාමරය විවෘත කළ වහාම නැගී ආ දුර්ගන්ධය, ආඝ්‍රාණ ඉන්ද්‍රිය පමණක් නොව, මගේ පෙණහලු ද කැඩී යන තරමේ ඉතාම දරුණු එකක් විය. එය ඉවසාගත නොහැකිව මට ක්ලාන්ත ගතියක් දැනිණි. බඩ දඟලන්නට පටන්ගෙන, තව මොහොතකින් මා වමනය දමීමට ද ඉඩ තිබිණ. ඇඟිලි වලින් නැහැය තදකරගත්තත්, ඒ වනවිට පමාවුණා වැඩිය. මළමිනී කුණුගඳ මගේ නාසයේ පටක හා ස්නායු

විනිවිද ගොස් මොලයට ඇතුළු වී, මොළයේ දුවිල්ලක් ඇති කළේය. කාමරයේ තබා තිබූ ලී පෙට්ටි අපට දකින්නට ලැබුණේ එවිටයි.

සමහරක් පෙට්ටි කාමරය අසිනේ ගොඩගසා තිබූ අතර, අනෙක්වා කාමරය පුරා තැන් තැන් වල තිබිණි. එම පෙට්ටි දිගින් අඩි 7ක් හෝ 8ක් වූ අතර පළල අඩි 3ක් පමණ විය. පෙට්ටි සමහරක පියන් ඉවත්කර තිබිණි. ඒවායේ උඩටම එනතුරු පුරවා තිබුණේ කළුම කළු පැහැති පස් බව අපි දුටුවෙමු. හෝම්ස් පෙට්ටි සංඛ්‍යාව ගණින් ගන්නා අතර මම ලන්තෑරුම ඉහළට ඔසවා එළිය කළෙමි. ගණින් කොට අවසානයේ ඔහු මා දෙසට හැරුණේය. ලන්තෑරුමේ මලානික එළියෙන් මා දුටුවේ, හෝම්ස්ගේ මුහුණේ ද භීතිය හා මරණය සටහන්වී ඇති බවයි.

"වොට්සන්. පෙට්ටි විසිනවයයි තියෙන්නේ"

"ඔබට හොඳටම විශ්වාසද?"

"මං දෙපාරක් ගණන් කළා. අපි මේ ගෙදර හැම කාමරයකටම ගියා. ඒ කොහේවත් එක පෙට්ටියක්වත් තිබුණේ නෑ. ඒකෙන් අපට තීරණය කරන්න පුළුවන් එක දේයයි. ඒ තමා......" කීමට සූදානම් වූ දෙය අසම්පූර්ණව නවතා, ඔහු එක්වරම නිශ්ශබ්ද විය. ඊට හේතුව විමසීමට මම සූදානම්වීමි. වහාම නිශ්ශබ්දවෙනු මෙන් හෝම්ස් මට සංඥා කළේය. ඔහුගේ අවධානය යොමුවී තිබුණේ මගේ දකුණු උරහිසට ඉහළින් වූ යම් දෙයක් වෙතය. ඒ කුමක්දැයි බැලීමට මම ආපසු හැරුණෙමි.

මා ආපසු හැරෙද්දීම එය අතුරුදන් විය. ඒ, මට පිටුපසින් තිබූ පටු අඳුරු බරාඳයේ සිට, අප දෙස බලාසිටි කිසිවෙකුගේ මුහුණය. මා එය දුටුවේ එක් නිමේෂයකට පමණි. උස් නළලක්, වකුටු වූ දිගු නැහැයක් හා හතරැස් නිකට සහිත මුහුණක්, මට එක් ක්ෂණයකට පෙනී නොපෙනී ගියේය. ඒ කොතරම් ඉක්මනින්ද යත්, ඇත්තෙන්ම එතැන මුහුණක් දුටුවාද යන්න, මට විශ්වාස කිරීමට පවා අපහසු විය.

වහාම තම රිවෝල්වරය අතට ගත් හෝම්ස් අඩියට දෙකට කාමරය හරහා ඇවිද ගොස් බරාඳය වෙත ළඟාවිය. එතැන රැඳී සිටිමින් ඔහු තම මුහුණ ඉදිරියට දිගුකළේය. ඒ වහාම අඩියක් පිටුපසට තබා ඔහු මුහුණ මා දෙසට හැරෙව්වේය. මම වහාම එතැනට ගොස් බරාඳය දෙස බැලීමි.


http://sherlockholmesinvestigations.blogspot.com

මුලදී මට දකින්නට ලැබුණේ අන්ධකාරය තුළ රතු පැහැයෙන් බබලන කුඩා මැණික් කැට රැසක් මෙන් එළිරැසකි. ඒවා හෙමින් ඉදිරියට එමින් තිබිණ. මගේ ඇඟ ගැටවලා ගියේය. ඒ කුමක් දැයි මට හඳුනාගත හැකිවූයේ තත්පර කිහිපයකට පසුවය. ඒ රතු පැහැති ඇස් තිබූ මීයන් විශාල සංඛ්‍යාවකි. මම වහාම මගේ රිවෝල්වරය අතට ගෙන සූදානම් වීමි. ප්‍රමාණයෙන් ලොකු මීයන් දහස් ගණනක් එකා පිටුපස එකා කාමරය තුළට ඇදී ආහ. උන් නැගූ ශබ්දය ක්‍රමයෙන් වැඩිවූයේ කුරුලු කූඩුවක කුරුල්ලන් නගන ශබ්දයට සමානත්වයක් ගනිමිනි. උන් එන්නේ අපව සපා කෑමට බව තේරුම් ගනිද්දී මගේ ඇඟ හිරිවැටී ගියේය! අප දෙදෙනාම වෙඩි තබන්නට පටන්ගත්තේ එකවරමය. අප දෙසට කඩාවැදුණු මීපොදි දෙසට රිවෝල්වර එල්ල කරමින් අපි නොනවත්වාම වෙඩි තැබීමු. ඒ සමගම අපි දෙව්මැදුරට ළඟාවූ තරප්පුපෙළ දෙසට දිවගියෙමු. මැරී වැටෙන මීයන්ගේ අඩුව පිරවීමට, තවත් මීයන් සිය දහස් ගණනක් ඉදිරියට ආවේ, නොනවත්වා ගලන දුඹුරු පැහැති ගංගාවක් පරිද්දෙනි. වෙඩි තබමින් ම අපි පැන දිවවෙමු. එය අවසන් වූණේ අප ගොඩනැගිල්ලෙන් එළියට පා තැබූ පසුවය.

වෙනත් කළ යුතු හෝ කළ හැකි දෙයක් නොවූයෙන්, අපි ආපසු යාමට තීරණය කළෙමු. දුම්රියපොළ වෙත යන අතර හෝම්ස් නිහඬතාවය බින්දේය.

"දැන් අපට පෙනෙන හැටියට කවුන්ට් ඩ්‍රැකියුලා තවමත් යුද්ධ හමුදා වලට අණදීලා, සටන් පෙරමුණට යවනවා. මම නම් හිතන්නේ අපේ ආක්‍රමණයට විරුද්ධව ඔහු සාර්ථකව ප්‍රහාර එල්ල කළා"

"ජරා සත්තු!" මට කෑගැසිණ.

"ඒක නම් ඇත්ත" හෝම්ස් කීය. "ඔහුගේ ශක්තිය පෙන්වලා අපව භය කරන්න කළ වැඩක්. ඒක සාර්ථක වුණා. ඒ වුණත් අපි යම් කිසි ජයග්‍රහණයක් ලැබුවා"

"මොන ජයග්‍රහණයක්ද? අපට කරන්න පුළුවන් වුණු කිසිම දෙයක් නෑ" මා කීවේ කෝපයෙනි.

"එතැනදී ඔබ වැරදියි වොට්සන්. පෙට්ටි පනහෙන් මෙතැන තිබුණේ විසිනවයයි. ඒකෙන් අපට තේරෙනවා ඩ්‍රැකියුලාට තවත් හැංගෙන්න තැන් තියෙනවා"

"ඒකෙන් අපට ඇති ප්‍රයෝජනය මොකක්ද?" මම ඇසීමි.


http://sherlockholmesinvestigations.blogspot.com

මගේ ප්‍රශ්නය ඔහුට ඇසුණු බවක් නොපෙනිණි. ඔහුගේ අවධානය යොමු වී තිබුණේ, අප යමින් සිටි පැත්තට විරුද්ධ දිශාවට, එනම් කාෆැක්ස් දෙසට ගමන්කළ ලොකු අශ්වකරත්තයක් වෙතය. තරමක් උස, රෝද හතරේ ප්‍රයෝජනයෝගී එකක් වූ එය පහන් කණුවක් අසලින් යද්දී, එහි ගමන්කළ පිරිස මම යන්නමින් දුටුවෙමි. පිරිමි හතරදෙනෙක් හෝ පස්දෙනෙක් එතැන සිටියහ. ඒ අතර සිටි උපැස්යුගලක් පැලඳගත් හැඩිදැඩි පුද්ගලයා මට හඳුනාගත හැකි විය.

"වෑන් හෙල්සිං" පුදුමයට පත් මට කියැවිණි.

"ඔව්. කරත්තයේ පස්දෙනෙක් හිටියා." හෝම්ස් කීය. "තවත් අමතර කෙනෙක්. ඒ ජොනතන් හාකර් විය යුතුයි. ඔහු විට්බිවල යෙදී හිටිය කටයුත්ත අවසන් කරන්න ඇති. සැකයක් නෑ. අපට ලැබුණු පිළිගැනීම වගේ එකක්ම තමා, මහාචාර්යතුමාටයි ඔහුගේ පසුයන්ටයි ලැබෙන්නෙත්"

අප අඳුරු සෙවණැලි තුළටවී සිටි බැවින් කරත්තයේ ගමන් කළ අය, අප නොදකින්නට ඇත.

"ඔබට තේරෙනවා නේද වොට්සන්" මගේ මිත්‍රයා කථාව ඇරඹුවේ අප යළිත් බේකර්වීදියේ 221 B හි අපේ නිවහන වෙත ගිය පසුය. වයින් බෝතලයක් විවෘත කොට, අපි වයින් ස්වල්පයක් පානය කළෙමු.

"පරීක්ෂණ කටයුතු නියමාකාරයෙන් පටන්ගන්නෙ දැන්. අපි දන්නවා ඩ්‍රැකියුලාට තිබෙනවා තවත් සැඟවෙන්න ගුහා. ඒවා සොයාගන්නා එක අපේ වගකීම. ඒ හැම එකක්ම හොයාගත්තොත්, එතැනින් ඉදිරියට වැඩ කටයුතු අපට පහසුයි. එතකොට අපට ඉතිරි වෙන්නෙ එකම කටයුත්තයි. ඔහුට මිලකළ නොහැකි තරම් වටිනා ට්‍රාන්සිල්වේනියාවේ පස් විනාශයට පත්කරන එක. එතකොට ඔහුට මේ බ්‍රිතාන්‍ය දූපත් වල පෙන්වන හපන්කම් බොහොම දුරට සීමා කරන්න සිදුවෙනවා."

"මේ දුෂ්ට අධමයා අපට හොයාගන්න හැකි වුණොත්?"

"එහෙම වුණොත් ඒක අපට විශාල ජයග්‍රහණයක්. ඔහුගේ වැම්පයර් පරපුරක් මෙහෙ බෝකරන්න ඉඩ නොදී, වැම්පයර්වරු සමූලඝාතනය කළ යුතුයි. ඒ හැර වෙන විකල්පයක් නෑ"

අපගේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කරන ශබ්දයක් ඇසිණ.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක හරි පුදුමයි" මා කීවේ දොර විවෘතකිරීමට අසුනෙන් නැගිටිමිනි. "කවුරුවත් තරප්පුව නගින ශබ්දයක් මට නම් ඇහුණේ නෑ"

අත තිබූ වීදුරුව මේසය මත තබා මම දොර විවෘත කළෙමි. බලාපොරොත්තු නොවූ ලෙස පැමිණ සිටි අමුත්තා දුටු මට එක් වරම කථාකරගත නොහැකි විය.

දොරටුව අසල සිටගෙන සිටියේ අඩි හයකටත් වඩා උස පුද්ගලයෙකි. ඔහු කළුම කළු ඇඳුමකින් සැරසී සිටියේය. ඔහුගේ දෙනෙත් දිළිසෙන ගිනි අඟුරු මෙන් රතු පැහැති විය. ඔහුගේ හිස කෙස් මෙන්ම ඝනව වැඩුණු "පඳුරු" වැනි ඇහිබැම ද කළු පැහැති විය. ඔහුගේ අතේ තිබුණේ රිදී මිටක් සවිකළ සැරයටියකි. මේ හැමදේකටම වඩා මගේ දෙනෙත් ඇදී ගියේ, බාගෙට විවරව තිබූ ඔහුගේ මුව වෙතය. කිණිසි දෙකක් මෙන් තියුණු උල් සහිත ඔහුගේ උල් දත් දෙක උඩු රැවුලට දෙපසින් අසාමාන්‍ය ලෙස පහළට දිගුවී තිබිණ. ඒ රුදුරු මාංශ භක්ෂක සත්වයකුගේ දඩයම් දත් යුගලයකි. මෙම භයානක පුද්ගලයාට අපේ දොර විවෘත කිරීම, බේකර් වීථියේ ශාන්ත සුන්දර නිසල බව විනාශ කිරීමට කරන ඇරයුමක් නොවේද? මට ඒ බැව් හොඳාකාරවම වැටහිණි. අපගේ සොඳුරු නිවහන මේ අධම යක්ෂයා ගෙන් අපවිත්‍ර නොවනු පිණිස, වහාම දොර වසා දැමිය යුතු බවට, මගේ හෘදසාක්ෂිය හඬ නගා කීය. එහෙත් මා අතින් සිදුවූයේ කුමක්ද? දොර වසනු වෙනුවට, ඔහුට ඇතුළුවීමට ඉඩ සලසා මම පසෙකට වීමි.

මා ගැන කිසිදු තැකීමක් නොකළ අමුත්තාගේ දෙනෙත් යොමුවූයේ මගේ මිත්‍රයා වෙතය. හෝම්ස් මේ වනවිට අමුත්තා හමුවීමට අසුනෙන් නැගිට සිටියේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයාද?" ඔහු විමසුවේ ඉතාම ගැඹුරු, රළු එමෙන්ම අමිහිරි හඬකිනි. මගේ මිත්‍රයා හිස පහත් කර එය අනුමත කළේය.

"මම කවුන්ට් ඩ්‍රැකියුලා!"



http://sherlockholmesinvestigations.blogspot.com

# 8

## සොයා යාම

අපේ අමුත්තා තමා හඳුන්වාදී මිනිත්තුවක් පමණ ගතවන තුරු සියල්ලෝම නිශ්චලව සිටියහ. මගේ මිතුයා නිහඬවූයේ, එක්වරම පැමිණි මෙම අමුත්තා නිසා මවිතයට පත්වී නොවන බව මට හොඳටම විශ්වාසය. අමුත්තා දොරකඩ හිටිනු දුටු වහාම, ඔහු කවුද යන්න පිළිබඳව අපට සැකයක් නොවිය. මට නම් සිතුණේ සටනකට සූදනමින් විරුද්ධවාදීන් දෙදෙනා එකිනෙකා දෙස බලාසිටියේ වෙනුත් කාරණයකට යන්නය. එය සටනකට සූදනමෙන් ප්‍රතිවාදියාගේ හැඩරුව දකබලා ගනිමින්, ඔහුගේ නිර්භීත බව තක්සේරු කිරීමට කළ උත්සාහයන් විය යුතුය. මෙම ද්වන්ධ සටන නැරඹීමට සූදනම් වූ ප්‍රේක්ෂකයෙකුගේ භූමිකාවට වැඩි යමක් මට හිමිවී නොතිබිණි. මිනිත්තුවකත දෙකකට පසු තම මුහුණේ වූ රෞද්‍ර බැල්ම ලිහිල් කළ කවුන්ට හිස නමා ෂර්ලොක් හෝම්ස්ට ආචාර කළේය.

එසේ කරද්දී ඔහුගේ අතට ගෙන තිබූ උස සේද හිස්වැස්ම බිම ගැවී නොගැවී ගියේය.

"ඔබ හඳුනාගන්න ලැබීම මට ගෞරවයක් මහත්මයා" වැරකියුලා කීය. "එංගලන්තයේ දරුණු අපරාධකාරයින් අල්ලා ගැනීමට ඔබේ ඇති දක්ෂතාවය ගැන මගේ මවුපියෝත් මට කියවන්න ලැබෙනවා මහත්මයා. අපි ඒ තරමට වාසනාවන්තයි. මේ ක්ෂෙත්‍රයේ ඔබ පෙන්වා ඇති විශිෂ්ට දක්ෂකම යුරෝපා මහාද්වීපය තුළ වෙන කිසිම කෙනෙකු ශෙණ්ඨ නැතිබව සහතිකයි"

"ඔබ කියන තාලේ ඉහළම වර්ණනා ලබන්න තරම් අතිවිශිෂ්ට දක්ෂකම් මා පෙන්වලා නැහැ කවුන්ට්" මගේ මිතුයා කීවේ හිස පහත් කොට ආචාර කරමිනි. "ඔබ ගැන කියන්න තියෙන්නේ, ඔබ එන්න කලින්ම ඔබේ කීර්ති නාමය එංගලන්තයට පැතිරුණා"



http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් තම කටහඬෙන් කවුන්ට් වෙත අප්‍රසාදය පළනොකළත් වචනවල එය ගැබ්ව තිබිණ. එය ඔහුට නොඇසුණාක් මෙන් ඩ්‍රැකියුලා දත් විලිස්සා සිනාසුණේය. දළිපිහි මෙන් තියුණු ඔහුගේ දිගු උල් දත් දුටු මගේ ඇඟ කිළිපොලා ගියේය.

"රාත්‍රිය සීතලයි. ඒ කාලෙ වගේ මං තවමත් තරුණ නැහැ" ඩ්‍රැකියුලා කීය. "මං ඇතුළට එන්නද?"

"කරුණාකරල ඇතුළට ඇවිත් ඉඳගන්න. බාගවෙලාවට ඔබ කැමැති වේවි මගේ හිතවත් වොට්සන් සහ මා සමග වයින් ස්වල්පයක් රසවිඳින්න. තව වීදුරුවක් ගේන්න වොට්සන්"

"ස්තුතියි. මං මත්පැන් ගොන්නේ නැහැ!" පැවසූ අමුත්තා අපේ දොර වසා අපේ විසිත්ත කාමරය ඇතුළටම පැමිණියේය. ඔහු මගේ මිත්‍රයාට වඩා අගල් හතරක්වත් උසින් වැඩිවූ බැව් මම දුටුවෙමි.

"ඔබේ අකමැත්තක් නැත්නම් මං නැගිටලා ඉඳගෙනම කථාකරන්නම්" ඔහු කීවේ හෝම්ස් අත දිගු කර පෙන්වූ පුටුවේ හිඳනොගනිමිනි. "රාත්‍රි කාලය හැටියට තියෙන පැය ගණන සීමිතයි. උදේ ඉර පායන්න කලින් කළ යුතු වැඩ රාශියක් මට තියෙනවා. මං ආව කාරණය මොකක්ද කියල මං කියන්නම්. ඊට පස්සෙ මං මෙහෙන් පිටවී යන එක ඔබට ලොකු සහනයක් වේවි"

"ඒක නම් සම්පූර්ණ ඇත්ත කවුන්ට්" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි.

එයට අමුත්තා වෙතින් පළවූයේ අප්‍රසාදය බව මම තේරුම් ගතිමි.

"ඔබ බොහොම කෙළින් කථාකරන කෙනෙක් හෝම්ස් මහත්මයා. ඒත් මගේ රටේදි නම් ඒක අවදානම් වැඩක්. මා එක්ක කථාකරද්දී ඔබේ කට පරිස්සම් කරගත්තොත් හොඳයි"

"අනේ හැබෑට?" මගේ මිත්‍රයා ඇසුවේ උපහාසාත්මක හඬෙනි. "ඒක නෙමෙයි මගේ හිතවත් කවුන්ට්. අපි දෙන්නම බොහොම නාකි මිනිස්සු. අපි දෙන්නා ඉන්නේ අනිත් එක්කෙනාට සිරිත් විරිත් කියාදෙන වයසකද? කෙළින් කියන්න. මොකක්ද ඔහේට මගෙන් කෙරෙන්න ඕන උදව්ව?"

"අද හැන්දෑවෙ ඉර බැහැගෙන යද්දී ඔබ මගේ නිවසට ආවා. ඇයි ඒ?" "කවුන්ට් ඇසීය.

"මං හිතන්නේ ඒ ප්‍රශ්නයට පිළිතුර අපි දෙන්නම දන්නවා" හෝම්ස් කීය.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඒකත් ඇත්ත. අපි දෙන්නම ඒක දන්නවා" අමුත්තා පිළිතුරු දුන්නේය. "මට උවමනා වුණේ ඔබ නිදහසට කියන කරුණු මොනවාද කියල දැනගන්න. නමුත් ඔබ බොහොම සූක්ෂ්ම විධියට, කෙළින් පිළිතුරක් දෙන්නේ නැතිව ප්‍රශ්නය මඟ හැරියා. එහෙම නේද? ඔබ දන්නවාද ෂර්ලොක් හෝම්ස්, මං ට්‍රාන්සිල්වේනියාවෙන් පිටවෙලා එන්න කලින් කළ ප්‍රධානම දේය මොකක්ද කියල?"

"අනේ නැහැනේ!"

"............. මං කළ ප්‍රධානම දේ, මං සංක්‍රමණය වෙන රට ගැන පොත් වලින් කරුණු හැදෑරුවා. මං කියවූ නොයෙක් පොත් හා සඟරා අතර තිබුණා "ස්ට්‍රෑන්ඩ්" නම් එක් විශේෂ සඟරාවක්. ඔබ කළ අපරාධ පරීක්ෂණ ගැන විස්තර කරලා දොස්තර වොට්සන් ලියූ කථාන්තර, ඒ සඟරා කලාප හැම එකකම තිබුණා. අද හවස පර්ෆ්ලීට් හි මා පදිංචි නිවස ආක්‍රමණය කළ පුද්ගලයා ඔබ බවයි මට දැනගන්න ලැබුණේ. එතකොට මං තේරුම් ගත්තා, මං එංගලන්තයේ යෙදෙන කටයුතු ගැන ඔබේ අවධානය යොමුවී ඇති බව. නමුත් මගේ පෞද්ගලික ඇඩ කටයුතු වලට ඔබ මොකටද ඇඟිලි ගහන්න එන්නේ? මට බෑ ඒකට ඉඩ දෙන්න. මං ඔබට අනතුරු ඇඟවීමක් මේ කරන්නෙ. එහෙනම් ඔබට හිරිහැරයක් සිදුවෙන්න කලින්, ඔය කටයුතු සම්පූර්ණයෙන්ම අත්හැර දමන්න. ඒක ඔහේලට දැනුම්දීල යන්නයි මං මේ ආවෙ"

සිගරට්ටුවක් දල්වාගත් හෝම්ස්, කවුන්ට් ඩ්‍රැකියුලා දෙසට දුම් වලාවක් පිම්බේය. "ඔබ පැමිණියේ ඒ අරමුණෙන්ද?" හෝම්ස් ඇසීය. "එහෙම නම් මට කියන්න තියෙන්නේ මේ තරම් මඟ ගෙවාගෙන ඔබ ආව එක නිෂ්ඵල ගමනක් කියලයි."

හෝම්ස් පිඹි දුමෙන් ඩ්‍රැකියුලාට කිසි ගැහැටක් නොවීය. ඔහු ආශ්වාස ප්‍රශ්වාස කළ බවක් වත් නොපෙනිණ.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "මං බොහොම ධනවත් කෙනෙක්. මට නිදහසේ ඉන්න ඉඩ දෙන්න. මට ඒ උදව්ව කළොත් ඔබට අවාසියක් වෙන්න මං ඉඩ තියන්නෙ නෑ"

"කවුන්ට් ඩ්‍රැකියුලා" හෝම්ස් කීවේ සිගරට්ටුව අළුබඳුනේ ඔබා අසුනෙන් නැගී සිටිමිනි. "ට්‍රාන්සිල්වේනියාවේදී සමහර විට අපරාධකාරයින්ට, මුදල් බලයෙන් නීතියෙන් ගැලවෙන්න පුළුවන් ඇති. නමුත් මේ දොස්තර වොට්සන් වත් මා වත් ඔබට මුදලට


http://sherlockholmesinvestigations.blogspot.com

ගන්න බෑ. යුක්තිය, ධාර්මිකත්වය, සදාචාරය, අපි මුදලට පවාදෙන්නේ නෑ. මොන තරමක් රත්රන් මගේ දෙපා ළඟ ගොඩගහන්න සූදානම් වුණත්, අපරාධකාරයින්ට, ඝාතකයින්ට මගෙන් සමාවක් නෑ."

එම පිළිතුරට කවුන්ට් ඩ්රැකියුලාගේ දෙනෙතේ ඇතිවූ යම් බැල්මක් මම දුටුවෙමි. එදා ග්‍රිම්පන් මඩ ගොහොරුව අසලදී ශ්‍රීමත් හෙන්රි බැස්කවිල් මරාදැමීමේ අරමුණෙන් ඔහුගේ උගුර වෙත පිනූ භයානක සුනඛයා මගේ සිහියට නැගිණි. එදා ඒ සුනඛයාගේ මා දුටුවෙත්, අද ඩ්රැකියුලාගේ දෙනෙත් වල මා දුටු බැල්ම ම නොවේද?

"වැඩිදුර කල්පනා කරල බලන්න කියල මං ඔබෙන් ඉල්ලා හිටිනවා." කවුන්ට්වරයාගේ කට හඬේ තිබුණේ තර්ජනාත්මක ස්වරූපයකි. "ෂර්ලොක් හෝම්ස්, තමුසෙ හිතන්නේ ලෝකයේ තියෙන භයානක දේවල් හැම එකකටම තමුසෙ මුහුණදීලා පුරුදුයි කියලද? ඔහේ ඒව මතුපිට අතගාල බලල තියෙනවා. එච්චරයි. මගේ පාලනය යටතේ පවතින අද්භූත බලවේග වලින් දහෙන් පංගුවක් ක්‍රියාත්මක වෙද්දී, ජොනාතන් හාකර් පිස්සු වැටුණා. ඒත් ජීවිතය ගලවාගන්න තරම් ඔහු වාසනාවන්ත වුණා. ඒ අද්භූත බලවේග වලට ක්‍රියාත්මක වෙන්න කියලා මං ආඥා කරන්න උවමනාවක් නැහැ. මං මෙතැන ඉඳිද්දීම, මං වචනයෙන් නොකිව උපදෙස් පිට, ඒවා ඒකරාශී වෙනවා. නමුත් ඒ එක අරමුණක් වෙනුවෙන්. මොකක්ද ඒ අරමුණ? මගේ ඉදිරි ගමනට බාධාකරමින් එන සෑම බලවේගයක්ම සුනු විසුනු කරවිනාශකර දමන්න. සීතල මිනීවළවල් වලින් උන් නැගිටිනවා. ලෝකයට ගිහින් මරණයට පත්වෙන අයත් ඉන්නේ ඒ අතර. ඒ තමයි මගේ මළවුන්ගේ හමුදාව. ඔහේට තේරුණාද ෂර්ලොක් හෝම්ස්. තමුසේ නොමැරෙන කෙනෙක්ද? නෑ. වෙලාව ආවම තමුසෙගෙ පණ යාවි. ඔහේ වගේ කොයි මොහොතක හරි මැරෙන්න පුළුවන් කෙනෙක්, කොහොමද මං වගේ හතුරෙකුට මුහුණ දෙන්නේ?"

"කවුන්ට් ඩ්රැකියුලා" හෝම්ස් කීය. "හොල්මන් අවතාර කථාවලින් මං භයවුණේ පුංචි කාලෙ විතරයි. ඒව ගැන මගේ හිතේ තිබුණු භය නැතිවෙලා ගිහින් දැන් හුඟක් කල්. ඔහේගෙ අර මියො


http://sherlockholmesinvestigations.blogspot.com

තමුදුවෙන් මොනවද මට කලේ? මී හමුදුවට වගේම ඔහේගෙ කයිවාරු වලටත් මං භය නෑ."

"මීයො එව්වේ තමුසෙට අනතුරු ඇඟවීමක් හැටියට විතරයි." කවුන්ට් පිළිතුරු දුන්නේය. "මං තමුසෙට සහතික කරලා කියන්නම් හෝම්ස්. මං වැඩේ හරියට පටන්ගත්තොත් තමුසෙට ගැලවීමක් නෑ. තමුසෙගෙ ජීවිතේ.........."

"මං හිතන්නේ මං මේ අහගුගන හිටි ප්‍රමාණෙ හොඳටම ඇති. වොට්සන් අපේ අමුත්තට පිටවෙන්න දොර ඇරල දෙන්න"

"අවශ්‍ය නෑ" කී කවුන්ට් ලෝගුව සකස් කරගෙන දොර විවෘත කරගත්තේය. පිටවී යෑමට යොස් මඳකට නැවතුණු ඔහු ආපසු හැරී හෝම්ස් වෙත බැල්මක් හෙළීය. "මේ අහනවා ෂර්ලොක් හෝම්ස්" ඩ්‍රැකියුලා කීය "භයානකම දේ මරණය නෙමෙයි. මරණයට වඩා අන්ත භයානක, ඒ වගේම පිළිකුල් සහගත ඉද්වල් තියෙනවා. මගේ වැඩවලට දිගටම අවහිර කරන්න ආවොත් ඔහේට පෙනේවි ඒ මොනවද කියලා" හඬදයක් නැගෙන සේ දොර වසාගෙන කවුන්ට් ඩ්‍රැකියුලා පිටවී ගියේය.

ඇත්තෙන්ම ඔහු පිටවී ගියාද යන්න දැනගැනීමට මගේ සිතේ ඇතිවූයේ මැඩගත නොහැකි කුතුහලයකි. මා එතැනට පැන එහා දොර විවෘත කලේ මොහොතකට පසුවය. විසිත්ත කාමරයේ තිබූ ආලෝකයෙන් තරප්පු පෙළට හොඳින් ආලෝකමත් වී තිබිණි. එහෙත් මිනිස් පුළුටක් වත් එහි නොවිය.

"දොර වහන්න වොට්සන්, හුළං පාර හරි සීතලයි"

ඔහු නියම කල අයුරින් මා දොර වසා දැමූ පසු ගිනිඋදුන වෙත ගිය හෝම්ස්, යකඩ අඬුවෙන් ගිනිපුලිඟු අවුස්සා කාමරය උණුසුම් කලේය. "ඒ අසාමාන්‍ය සීතල ඔබට දැනුණාද වොට්සන්?" ඔහු ඇසීය. "ගිනිඋදුනට එතුර දමලා තිබ්බලා, ජනෙල් ඔක්කොම හැරදම්මා වගේ දැඩි සීතලක් කාමරයට ආවා. අපි අර කාෆැක්ස් මන්දිරයට ඇතුළු වෙද්දින් මට ඒ වගේම සීතලක් දැනුණා. ඒක ඩ්‍රැකියුලාගේ ශරීරය වටේ පවතින වාෂ්පයක් වගේ දෙයක්. ඔය බලන්න. ඔහු පිටවෙලා ගියාට පස්සේ දැන් කාමරය ටිකෙන් ටික උණුසුම් වෙනවා"

"ඔබ කිව්වාම තමයි, මට ඒක පැහැදිලි වුණේ. ඒ වෙලාවෙ ඉඳලම මට සීතලක් නම් දැනුණා"



http://sherlockholmesinvestigations.blogspot.com

"අපේ හමුවීම ගැන මොනවද වොට්සන් ඔබට හිතෙන්නේ? කාරණා එළියට ආව, තොරතුරු හුවමාරු කරගත් හමුවීමක්. එහෙම නේද? ඔහු මෙතැනට ආවෙ මොන අරමුණක් මුදුන්පත් කරගන්න කියලද ඔබ හිතන්නෙ?"

"මට නම් ඒක හොඳට පැහැදිලියි හෝම්ස්. ඔහු කරගෙන යන වැඩ සටහනට ඔබ ලොකු අවහිරයක්. එහෙම නොකර පැත්තකට වෙන්න කියලා, ඊට ඔබ කැමැති කරවා ගන්න ඔහු බලාපොරොත්තු වුණා. මුලින්ම බැලුවා අල්ලස් දීලා කැමැති කරවා ගන්න. බැරි බව පෙනුණාම තර්ජනය කළා"

"මා ගැන ඔබ ලියූ කථාන්තර කියවූ ඕනම කෙනෙක් තේරුම් ගනීවි" හෝම්ස් කීවේ සිනාසෙමින්. "...... අපරාධකාරයින්ට මාව මුදලට ගන්න බැරිබව. එපමණක් නොවෙයි. ඔහුට කරන්න පුළුවන් කියලා කළ තර්ජන, ඒවායේ වැදගත්කමක් අපට දකින්න ලැබෙන්නේ කලාතුරකින්. මං හිතන්නේ නෑ ඒව සාර්ථක වේවි කියලා. නෑ වොට්සන්. ඩ්රැකියුලා මෙහෙ ආවෙ මට පාඩුවේ ඉන්න කියන්න නෙමෙයි. ඔහුගේ අරමුණ වුණේ මොකක්ද දන්නවද? බොරු කාරණාවක් කියාගෙන ආවෙ, තමන්ගේ හතුරා මොන විධියේ කෙනෙක්ද කියා හරිහැටි බලාගන්න. අන්න ඒකටම තමයි අද හවස අපිත් ඔහුගේ පර්ෆ්ලීට්හි නිවසට ගියෙ"

"ඉතින් ඔබට හිතෙන හැටියට මෙහෙේ ආව එකෙන් ඩ්රැකියුලාට ඇතිවුණු වාසිය මොකක්ද?"

"වෙන මොනවා නැතත්, අඩුම ගණනේ ඔහුට විරුද්ධව මං කටයුතු කරන වෙලාවක, මාව හරිහැටි අඳුනාගැනීම. ඔබ දුටුවා නේද වොට්සන්, මිනිහ මෙහේ ඇවිත් හිටි ටිකට, එක මොහොතක් අහක බැලුවෙ නෑ. මා දිහාවම බලාගෙන හිටියා"

"ඒක ඇත්ත. ඒත් ඒවා මනුස්සයෙකුගේ ඇස් නෙමෙයි. බිහිසුණු තිරිසන් සතෙකුගේ ඇස්"

"ඔබේ ඒ අදහසට මාත් එකඟවෙනවා" මගේ මිතුරා කීය. "කවුන්ට් ඩ්රැකියුලා කියන්නේ හරිම ෂෛකරාටික වගේම භයානක තිරිසනෙක්. ඔහුගේ උල්දත් හා නියපොතු, මිනීමස් කන සතෙකුගේ ඒවාට වඩා භයානකයි. ඒ මොකද ඒවා ක්‍රියාත්මක වෙන්නේ බලගතු මොළයක විධානයන්ට අනුව. ඔහුව විනාශකිරීම මගේ මීළඟ පියවර බව ඇත්තයි. නමුත් මං මුලින් කී කාරණා නිසා, ඒ පියවර තැබීමට මගේ හිතේ පැකිලීමකුත් ඇතිවෙනවා.



http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. ඉතා බිහිසුණු අවදානම් කටයුතු හමුවේ ඔබ පසුබට වෙනවා මං කවදාවත් දැකල නෑ."

"මගේ හිතේ භයක් තියෙන්නේ මගේ ජීවිතය ගැන නෙමෙයි වොට්සන්. මගේ භය තියෙන්නේ ඔබේ සොඳුරු බිරින්දෑ ගැන. ඇය අකාලයේ වැන්දඹුවක් වෙනවා දකින්න මං කැමැති නෑ."

මගේ මිත්‍රයා අදහස් කළේ කුමක්ද යන්න මට වැටහුණේ මිනිත්තුවකට හෝ දෙකකට පසුවය. එවිට මම කථාකළෙමි.

"මිත්‍රයා. මං අවිවාහකව ඉඳිද්දී ඔබේ අවදානම් කටයුතු වලට සහභාගී වෙන්න කවදාවත් භයවුණේ නෑ. දැන් මං විවාහ වෙලා කියල එවැනි කටයුතු වලදී පස්ස ගහන්න් උවමනා ඇයි? මගේ බිරිඳ මෙතැන හිටියා නම් ඇය කියාවි, ඔබේ කටයුතු වලට හවුල්වීම මගේ යුතුකමක් කියල. ඇය ඒටට කිසිසේත් විරුද්ධ නෑ. මං ඔබට සහතික වෙන්නම් හෝම්ස්"

"ඔබ කටයුතු කරන්නේ ඒ පිළිවෙලට බව මං දැනගෙන හිටියා වොට්සන්" හෝම්ස් කීවේ අතිශය සතුටට පත් මුහුණෙනි. "හොඳයි. මෙවර මං මේ අතගහන්න බලාපොරොත්තු වෙන පරීක්ෂණය, අනෙක් ඒවාට වඩා හැම අතින්ම වෙනස් එකක්. එහෙම දේකට පටලැවීම එක පැත්තකින් බලනකොට එතරම් ඥානාන්විත නෑ. ඒ බව ඔබට දැනටම වැටහෙනවා ඇති. ඒ බව පෙනී පෙනීත් ඔබ ඊට සහභාගි කරවාගන්නා ලෙස, ඔබ මගෙන් ඉල්ලා හිටිනවා. එහෙම නම් ඔබ හවුල්කර ගැනීම හැර මට වෙන විකල්පයක් නෑ."

හොඳයි වොට්සන්. ඔබ ඉස්සර වෙලාම කළ යුතු දෙය මෙයයි. පහළ තට්ටුවට ගිහිං හඩ්සන් මහත්මියට කියන්න, ලොකු පෝච්චියකට කෝපි පිළියෙල කරලා අඩට එවන්න කියලා. අපි මුලින්ම ක්‍රියාන්විතය සඳහා සැලැස්මක් පිළියෙළ කරගත යුතුයි. ඒකට රෑ නිදිමරාගෙන ඇය ගණනක් අපට ගිනාබලන්න වෙනවා."

ඩ්රැකියුලාගේ මෙම විෂම ක්‍රියාවලිය එරෙහිව ප්‍රතිප්‍රහාර එල්ල කළ හැකි, සෑම කෝණයක් ගැනම අපි හිතා බැලුවෙමු. කෝපි පෝච්චියේ කෝපි අඩුවෙද්දී රාත්‍රිය ද ක්‍රමයෙන් ගෙවී ගියේය. මේ ගැටලුව විසඳීමට හොඳම ක්‍රමය ලෙස මා කළ යෝජනාව මෙයයි. දහවල් කාලයේදී අප කාෆැක්ස් නිවසට යායුතුය. එහි ගොස් ඩ්රැකියුලා ඔහුගේ පස් පෙට්ටියක් තුළ නිදසිටියදී විනාශ කළ යුතුය. එහෙත් මගේ මිත්‍රයා ඒයට එකඟවූයේ නැත.



http://sherlockholmesinvestigations.blogspot.com

"මිනිහ ආපහු කාෆැක්ස් වලව්ව යාවි කියල මං හිතන්නෙත් නෑ වොට්සන්. මං හිතන්නෙත් ඔහු බුද්ධිමත් වැම්පයරයෙක් කියලයි. එහෙම නම් ඔහු සැහෙන කාලෙකට කාෆැක්ස් මන්දිරයට යන එකක් නෑ. මට දැන් කරන්න තියෙන්නේ මේ දෙයයි. මං ආපහු විට්බි වලට යන්න ඕනෑ. ගිහින් බඩු පෙට්ටි ප්‍රවාහණය කරන අශ්වකරත්තවල රියැදුරන් ගැන සොයා බැලිය යුතුයි. අපට දකින්න නොලැබුණු පස්පෙට්ටි විසිඑක යැව්වේ කොහේටද කියලා, මට පුළුවනි හොයා දැනගන්න. ඒ පෙට්ටි ඇත්තෙ කොතැනද, ඩ්රැකියුලා ඇත්තෙ ඊට හුඟක් ඈතින් වෙන්න බෑ"

"මං හඩ්සන් මහත්මියට කියන්නම් අපව කලින් අවදිකරන්න කියල" මම කීවෙමි.

"මගේ හිතවත් මිතුරුයා," හෝම්ස් කීය. "ඔබ සමග ගමනක යෙදෙන්න ලැබීම මං හැමවිටකම අගය කරනවා. නමුත් මේ වෙලාවෙ නම්, ඔබේ පැමිණීම අවශ්‍ය වෙන්නෙ නෑ. දුම්රිය ප්‍රවේශ පත්‍ර දෙකකට මුදල් නාස්ති කරන්නෙ ඇයි, අපට එකකින් ඒ රාජකාරිය ඉටුකරගත හැකිනම්? ඇඳිරි වැටෙන වෙලාව වෙද්දි මං ආපහු එන්නම්. සැලැස්මේ ඉතිරි කොටස එතකොට සාකච්ඡා කරමු. ඒ අතරේ අපි දෙන්නටම හොඳ නින්දක් නිදාගන්න පුළුවන් නම් හුඟක් ප්‍රයෝජනවත් වේවි."

කවුන්ට් ඩ්රැකියුලා අපට එරෙහිව එල්ල කළ තර්ජනය, හෝම්ස් කිසිදු ගණනකට නොගත්තේ ඉතා නිර්භය ආකාරයකින් බව සැබෑය. එහෙත් ඒ අත්දැකීම ඔහුගේ හිතේ මහත් කැලැඹීමක් ඇතිකළ බව මම තේරුම් ගතිමි. රාත්‍රියේ දෙවරක්ම මම නින්දෙන් අවදිවීමි. ඒ දෙවාරයේ ම අපේ විසිත්ත කාමරය දෙසින් අසන්නට ලැබුණේ හෝම්ස්ගේ වයලීනයෙන් නිකුත් වූ සංගීත ස්වරයයි. එවැනි අවස්ථා වල ඔහුට පාඩුවේ සිටීමට ඉඩහැරීම වඩාත් සුදුසු බව මම දැනසිටියෙමි. විසඳීමට පටන්ගත් ගැටලුව විසඳා අවසන් කරන තුරු, ඔහුගේ හැසිරීමේ ස්වභාවය වෙනස් වෙයි. ඒ නිසා ඔහුට දෙස් පැවරීමෙන් ප්‍රයෝජනයක් නොවන බව මා අත්දුටු කරුණකි. ඔහු විට්බි බලා දුම්රියෙන් යන ගමනේදී අවශ්‍ය පරිදි නින්දට යන බව නොඅනුමානය. ඉතා අපහසුවෙන් නින්දට ගිය මට ද සැනසිලිදායක නින්දක් නොලැබිණි. දුෂ්ඨ කවුන්ට්වරු හා වාවු හෝනලා සිහිනයෙන් දුටු මම කිහිපවාරයක්ම බියවී අවදිවූයෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

පසුවද උදේ මා අවදිවෙද්දී හෝම්ස් නිවසෙන් පිටත්ව ගොස් සිටියේය. එහෙත් ඔහු මා වෙනුවෙන් ලියුම් කැබැල්ලක් සයිඩ්බෝඩය මත තබාගොස් තිබිණ.

"හිතවත් වොට්සන්,

මා නමට ලැබෙන ලිපි හා විදුලි පුවත් සියල්ල විවෘත කර බලන මෙන් මම හඩ්සන් මහත්මියට උපදෙස් දුනිමි. වැදගත් ප්‍රශ්නයක් උද්ගත වූවොත් කෙසේ හෝ එය මට දැනුම්දීමට ඇය කටයුතු කරනු ඇත. අද දවසේ ඔබ ආපසු ඔබේ නිවසට ගොස් බිරිඳ සමග කාලය ගතකළ යුතු යයි මම යෝජනා කරමි. හොඳ මල් කලඹක් රැගෙන යාම වඩාත් යෝග්‍යයි.

"එස්. එච්"

මම ඔහුගේ යෝජනාව පිළිගතිමි. මල් වෙළෙඳසැලට ගොස් ඇය වෙනුවෙන් ක්‍රිසැන්තිමම් මල්පොකුරක් මිලට ගතිමි. එය රැගෙන ගිය මා දුටු ඇය අතිශය ප්‍රීතියට පත්වූවාය.

ඉන්පසු දහවල් කෑමවේලක් සූදා, ඇය සමග අවන්හලකට ගියෙමි. එද හැන්දෑවේ හෝඩ්ව සංගීත ප්‍රේක්ෂණාගාරයේ පැවති සංගීත ප්‍රසංගයක් සඳහා ද ඇය කැඳවාගෙන ගියෙමි. ආපසු එන ගමනේදී කළ කතාබහේ වැඩි හරියක් නෙරුණේ ඇයගෙනි. ඇයට කථාකිරීමට ඉඩදී මම හැකිතරම් නිහඬවූයෙමි. ඊට හේතුව, අප මේ දිනවල යෙදෙන පරීක්ෂණය ගැන තොරතුරු ඇයට කීමට, මගේ තිබූ නොකැමැත්තයි. කවුන්ට් ඩ්‍රැකියුලා ගැන කියා අනවශ්‍ය ලෙස ඇය භයට පත්කරන්නේ ඇයි?

හැන්දෑවේ නිවසට ගිය ඉක්මනින්ම ආපසු බේකර් වීථිය බලා පිටත්වීමට මම තීරණය කළෙමි.

"ඔයා පරෙස්සම් වෙන්න" මා ඇයගෙන් සමුගනිද්දී බිරිඳ කීවාය.

එය රහසක් ලෙස තබාගන්නට මා උත්සාහ කළත් එය සාර්ථක වී නැත. මා සහ මගේ මිත්‍රයා යෙදුණු පරීක්ෂණයේ බිහිසුණු බව ඇයට ඉවකින් මෙන් වැටහුණාවත්ද? මා ගැන හොඳින්ම වටහා ගෙන සිටි එකම පුද්ගලයා ඇය නොවේද?

මා බේකර් වීථියට ළඟා වෙද්දී අපේ විසිත්ත කාමරය පමණක් නොව මුළු ගොඩනැගිල්ලම අන්ධකාරයේ වෙළී තිබිණ. හඩසන්



http://sherlockholmesinvestigations.blogspot.com

මහත්මිය නින්දට යන්නට ඇතැයි සිතා, මම ඉදිරි දොර විවෘතකරගෙන උඩුමහලට ගියෙමි. මගේ බලාපොරොත්තුව වූයේ හෝම්ස් එනතුරු එහි රැඳී සිටීමය.

මා විසිත්ත කාමරයේ පහන දැල්වූවා පමණි. දොර විවෘත කරගෙන එතැනට කඩාවැදුණේ නිතර පාරතොටේ ගැවසෙන නාලේ රස්තියාදු කාරයෙකි. ඔහුගේ දෙක්කාලේ වූ සිගරට් කොටය, කොතරම් කෙටි වී ද යත්, මුහුණේ රැවුල්කොට වලට එයින් ගිනි නොඇවිළුණේ ඇයිද යන්න පුදුමයකි. මේ මගේ මිත්‍රයා ම නොවේදැයි තහවුරු කරගැනීම සඳහා, මම දැඩි අවධානයකින් ඔහු දෙස බලාසිටියෙමි. මඳ වෙලාවකින් ඔහු හිස්වැස්ම ගළවා ඉවත් කළේය. ඔහුට සිදුවී තිබූ ආපදාව මට දකින්නට ලැබුණේ එවිටය.

වම් ඇසට ඉහළින් එල්ල වූ පහරක් නිසා, මුහුණේ වම්පැත්ත තැළී නිල්පැහැ ගැන්වී තිබිණ. උඩ ඇසිපිය මතට ලේ ගලාඒම නිසා එය ඉදිමී තිබුණේ, ඇස සම්පූර්ණයෙන්ම වැසී යන පරිද්දෙනි.

"දෙයියෝ සාක්කි හෝම්ස්!" මට කෑගැසිණි. "මොනවද ඔබට වුණේ? මට නම් පේන්නේ ඔබ පාරේදී කවුරු හරි එක්ක සණ්ඩුවෙලා වගෙයි"

"හරියටම හරි වොට්සන්" ඔහු කීවේ සිනාසෙමිනි. "නිරීක්ෂණ මගින් නිගමනයට ඒමට ඔබට ඇති හැකියාව, දවසින් දවසම දියුණු වෙනවා."

"හොඳ වෙලාවට මං මගේ ඖෂධ අඩංගු වෛද්‍ය බෑගය අරගෙන ආවේ." මා කීවේ එය විවෘත කරමිනි. "මෙහෙන් වාඩිවෙන්න. මං ඕකට ප්‍රතිකාර කරන අතරේ පුළුවනි ඔබේ කථාව කියන්න"

"ඒක තව මිනිත්තු කිහිපයකින් එහාට දමන්න වොට්සන්. ඉස්සර වෙලා මං රැවුල කපලා, නාලා, වැදගත් මිනිහෙකු විදියට ඇඳුම් ඇඳ ගතයුතුයි. ඊට පස්සේ ඔබට පුළුවනි වෛද්‍ය රාජකාරි පටන්ගන්න. මුහුණේ තිබෙන මේ පැල්ලම තමා සාර්ථකත්වයේ ලාංඡනය. ඒකට ඔබේ වෛද්‍ය විද්‍යාත්මක හාස්කම් යොදන්න. ඒ අතරේ මං ඔබට කියන්නම්, සිත් ඇදගන්නාසුලු අයුරින් ගෙවී ගිය දවසක කථාව."

පැය කාලකට පමණ පසු හෝම්ස් විසිත්ත කාමරය වෙත ආපසු ආවේ ඔහුගේ සුපුරුදු දම් පැහැති පිට කබායෙන් සැරසීගෙනය. ඔහු



http://sherlockholmesinvestigations.blogspot.com

හාන්සි පුටුවේ හිඳගෙන කථාව කියන අතරේ මම ඔහුගේ මුහුණේ වූ තැල්මට ප්‍රතිකාර කළෙමි.

"ඔබට හිනාවෙන්න තරම් හාස්‍යජනක දෙයක් නම් මා ළඟ නැහැ කියන්න. අපි දෙන්නාමගෙම ජීවිත විනාශවෙන වැරැද්දක්, තව ටිකෙන් මා අතින් සිද්ධවෙනවා වොට්සන්.

මෙපමණ දවසක් මං හිතාගෙන හිටියේ ඩ්‍රැකියුලා ක්‍රියාත්මක වෙන්නේ තනිවම කියලයි. එතකොට මං නිගමනය කළා තනි ඩ්‍රැකියුලාට එරෙහිව අපි දෙන්නෙක්ම ඉන්නවා නේද කියලා. නමුත් ඔහුගේ කටින්ම අපට අහන්න ලැබුණා, ඔහු බොහොම ධනවත් පුද්ගලයෙකු බව. එහෙම කෙනෙකුට තමන් වෙනුවෙන් මුදලට සේවය කළ හැකි නියෝජිතයන් ලබාගැනීම, අමාරු වැඩක් නොමෙයි. එහෙම නේද? මේ කාරණාව මට කල්පනා වුණේ නැති එක හරි පුදුමයි. විටම් විරාය පැත්තේදී මගේ ඔලුවට පහරක් එල්ල වුණා. එතකොට තමයි ඒ කරුණ මගේ මොළේට කා වැදුණේ.

මං මුලින්ම ගියා ලොයිඩ්ස් ආයතනයට. නැව් වල ගමනාගමනය, සියලු නාවික තොරතුරු සැපයීම හා බඩු ප්‍රවාහණය කෙරෙන්නේ මේ ආයතනයෙන් බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ. මං ඒ කාර්යාලයෙන් එළියට බැහැලා, පටු පාරක් දිගේ ඉදිරියට ගමන් කළා. මා පිටිපස්සෙන් ආවා තරුණයන් දෙදෙනෙක්. එක්වරම මාව පහුකරගිය ඔවුන්, පාර අවහිරකරලා මාව නවත්තා, මට මේ ප්‍රහාරය එල්ල කළා. මගේ අතේ තිබුණේ මගේ සැරයටිය පමණයි. ඒකටත්, මා හොඳින් දන්නා ජපන් ආත්මාරක්ෂක සටන් ක්‍රීඩාවෙන් පිහිටිදුවෙන්න ජීවිතය ගළවා ගත්තා. එහෙම නොවෙන්න ඒ පටුමගේ ඔබට මගේ මිනිය දකින්න ලැබෙන්න ඉඩතිබුණා. ඒ මගේ සිරුරෙන්ම ගලා ගිය ලේ විලක. මං එල්ල කළ පහරවලින් උන්දෙන්නා කපුණම් ගහලා බිම ඇදවැටුණා. ඊළඟට නැගිටලා පණ බේරාගැනීමට පැන දුවන්න තරම් උන්දෙන්නාට මොළේ තිබුණා. කොහොම වුණත් මට එල්ල වුණු මේ ප්‍රහාරයෙන් මං පාඩම් කීපයක්ම ඉගෙන ගත්තා.

මං මොන තරම් මෝඩයෙක්ද වොට්සන්? මං දන්නවා ඔබ මේ විස්තර ඔබේ වාර්තා වල ලියුවාම, ඔබේ පාඨකයන් අතර මට ලැබී තිබෙන කීර්තිනාමය පවා අඩුවේවි. මගේ හතුරාගේ බල පරාක්‍රමය මං අඩුවෙන් තක්සේරු කළා. ඒක හින්ද මේ 'ප්‍රහාරය මට හොඳ පාඩමක්.



http://sherlockholmesinvestigations.blogspot.com

බේකර් වීථියේ මේ ගෙදරින් මං එළියට බැස්ස මොහොතේ ඉඳලම ඔත්තුකාරයන් මා පිටුපස ආවා. මං යන්නේ කොතැනකටද කියල උන් දැනගත් වගාම, පිටිබිවල ඉන්න ඩ්‍රැකියුලාගේ නියෝජිතයන්ට දන්වන්න ඇති. මගේ කටයුතු එතැනින්ම අත්හිටවෙන විදියේ දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න නියෝග එන්න ඇති. ඒ මගින් ඊයේ රාත්‍රි මට කල අනතුරු ඇඟවීමට අමතරව, ඔහුගේ ශක්තිය පෙන්වන්න ඩ්‍රැකියුලාට උවමනා වෙන්න ඇති."

"ඔබ ඔය තරම් පහරක් කෑලත්, මට නම් පෙනෙන්නේ ඔබ ඉන්නේ බොහොම සන්තෝෂයෙන් සැහැල්ලුවෙන් වගෙයි?" මම ඇසීමි.

"හිතේ සන්තෝෂයක් ඇති නොවෙන්නෙ මොකද?" හෝම්ස් කීය. "ලන්ඩනයේ ඩ්‍රැකියුලාට සැඟවෙන්න තියෙන හැම තැනක් ගැනම තොරතුරු මං හොයාගත්තා"

"කාගෙන්ද?"

"මට පහරදෙන්න කලින්, ප්‍රවාහණ කාර්යාලයේ ලිපිකරුවාගෙන්. ඔහුගේ ආයතනය මගින් ප්‍රවාහණය කරන හැම දෙයක් ගැනම සම්පූර්ණ වාර්තා, ලිපිගොනුවල ඔහු සටහන් කර තිබුණා. ඒක අපේ වාසනාවක්. අගෝස්තු 10 වැනිද ඔවුන්ගේ සමාගම, ලී පෙට්ටි පනහක් විට්බි සිට ලන්ඩන් බලා දුම්රියක ප්‍රවාහණය කළා. ඒ බඩුත් සමග සේවකයන් ද පැමිණ තිබෙනවා. ඔවුන්ගේ අනුග්‍රාහකයාගේ ඉල්ලීම් අනුව මේ පෙට්ටි ලන්ඩන් නගරයේ තැන් හතරකට ගෙනිහින් තියෙනවා. කාෆැක්ස් මන්දිරය එයින් එකක්."

"මං හිතන්නේ මේ සෑම තැනකටම ගිහින් පරීක්ෂාකර බලන්න අපට සිදුවේවි?" මා ඇසුවේ ඔහුගේ මුහුණේ ඇසට පහළින් වූ ත්‍රිකෝණාකාර තුවාලයකට අයඩින් ද්‍රාවණය ආලේප කරමිනි. මෙයින් තද දැවිල්ලක් ඇතිවන්නට ඇත. එහෙත් හෝම්ස් ඒ බවක් පෙන්වූයේ නැත.

"අපි ඒ කිසිම තැනකට යන්නෙ නෑ, වොට්සන්"

"යන්නෙ නෑ?" මවිතයට පත් මගේ අතින් තව ටිකෙන් අයඩින් බෝතලය අතහැරෙන්නට ඉඩ තිබිණ.

"එහෙම කළොත් අපි කරන්නේ, තවත් අය විසින් සෝදිසියට ලක් කරන ලද තැන්, යළිත් සෝදිසි කර බැලීමක් පමණයි. මම



http://sherlockholmesinvestigations.blogspot.com

එතැනට යන්න කලින් තවත් මහත්මයෙක් එහි ගිහිං විමසා ඇති බව මට දැනගන්න ලැබුණා. මට නම් හොඳටම විශ්වාසයි, මේ පුද්ගලයා ජොනතන් හාකර් බව. තමන් හොයාගත් තොරතුරු ඔහු වැන් හෙල්සිං ප්‍රමුඛ මිතුරු කැලට, මේ වෙනකොටත් දැනුම් දී ඇති. බොහොම වෙලාවට ඔවුන් අද දවස පුරාම, ඩ්‍රැකියුලාගේ විවේකාගාර විනාශ කිරීමේ ප්‍රයෝජනවත් කටයුත්තක යෙදිලා ආපහු එනවා ඇති."

"එහෙනම් ඩ්‍රැකියුලාගේ හපන්කම් එතෙනින් ඉවරවේවිද?" මම ඇසීමි.

"ඒ ගැන නම් මට සැකයි වොට්සන්" ඔහු පිළිතුරු දුන්නේ දෙමනස් ස්වරයෙනි. "මගේ හිතේ ලොකු සැකයක් තියෙනවා, මේ ක්‍රමයෙන් ඩ්‍රැකියුලාව වනසා දමන්න හැකි වේවිද කියලා"

මගේ වෛද්‍ය උපකරණ හා බෙහෙත් කුප්පි වෛද්‍ය බෑගය තුළ තැන්පත් කළ මා එය වසා දැමූයේ කලකිරීමෙනි.

"මට නම් ඔබව තේරුම් ගන්න බෑ හෝම්ස්. ඔබ මුලින් කිව්වා ඩ්‍රැකියුලාට හැංගෙන්න තියෙන තැන් ගැන බලන්න අපි යාම අවශ්‍ය නැහැ කියලා. දැන් කියනවා මේ භයානක නිරිසන් මාරයාගේ අණසකට මුළු එංගලන්තයම යටත් වෙලා. මේ වගේ බරපතල අර්බුදයක් ඇති වෙලාවක, ඔබ ඒක ගණනකට වත් නොගෙන ඉන්නා හැටි, මීට කලින් මං දැකල නෑ."

ඔහු මහ හඬින් සිනාසුණේය.

"මෙතැන හිනාවෙන්න තරම් විහිළුවක් තියෙන බවක් මට නම් පෙනෙන්නේ නෑ," මම කෝපයෙන් පැවසීමි.

"මගේ හිතවත් මිත්‍රයා. මං ඔබ්ට කලේ ලොකු අසාධාරණයක්", අසුනෙන් නැගී සිටි ඔහු තම අත මගේ උරහිස මත තැබුවේ මා සනසන අයුරෙනි. "කවුන්ට් ඩ්‍රැකියුලා ඉන්නේ හිතේ ලොකු කැලැඹීමකට පත්වෙලා. එහෙම නැත්නම් ඇයි ඔහු මැරවරයින් එව්වේ මට පහර දෙන්න? ඔහු හොඳටම දන්නවා මගේ තියෙන අත්දැකීම්වල හැටියට, ඔය පොලු මුගුරු ගත් මැරවරයින් දෙදෙනෙකුට මාව මරාදමන්න බැරි බව. මං ඔබට කලින් කිව්වා වගේ, මෙක අනතුරු ඇඟවීමක්. ඊටත් වඩා ඒක බොහොම කලබලේට ගත් පියවරක්. අපි දෙන්නාම දන්නවා මිනිස්සු කලබලේට තීරණ ගත්තාම, සිදුවෙන වැරදීම් වැඩිබව. අපි


http://sherlockholmesinvestigations.blogspot.com

කිසිදෙයක් නොකර බලාගෙන ඉන්නවා කියන එකෙන් මං අදහස් කළේ ඒක. අපට කරන්න තියෙන්නේ ඉවසීමෙන් බලා හිඳීම."

"බලා හිඳීම? මොකක් සිදුවෙනකං ද අපි බලාඉන්නෙ?"

"ඩ්‍රැකියුලා අතින් ඔහුගේ පළමුවැනි වැරැද්ද සිදුවෙන තුරු අපි බලාඉන්නවා වොට්සන්. මං ඔබට සහතික වෙන්නම්. ඒක ඩ්‍රැකියුලාගෙන් සිදුවන අවසාන වැරැද්දත් වේවි"

සැහෙන වෙලාවක් යනුතුරු අප අතර පැවතියේ නිහඬතාවයකි. අපි දෙදෙනාම ජනේලයේ වීදුරුව තුලින් රාත්‍රී අන්ධකාරය දෙස බලා සිටියෙමු. එකවර අප දෙදෙනාගේ ම සිත්වලට නැගුණේ එකම සිතිවිලි යයි මම විශ්වාස කරමි. මේ රාත්‍රිය ගෙවී යාමටු පෙර ඩ්‍රැකියුලාගේ ගොදුරක් බවට පත්වී මෙලොවින් සමුගන්නේ කවුරුන්ද?



http://sherlockholmesinvestigations.blogspot.com

9

# ඩ්‍රැකියුලා අතින් වරදක් සිදුවේ.

ඒ 1890 ඔක්තෝබර් මාසයේ මුල් සතිය බව මට හොඳින් මතක ඇත. එම දින කිහිපයේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ ස්වභාවය ද වෙනස්වී තිබිණි. කිසිවෙකු නුරුස්සනා අයුරින් හැසිරුණු ඔහු, කතාබහකට දක්වූයේ අප්‍රියතාවයකි. ඔහු මීට පෙර මේ තරම් වෙනස් වී සිටි කාලයක් මට සිහිකිරීමට පවා අපහසු විය. පැයෙන් පැය, දවසෙන් දවස කාලය ගතවී ගියේය. එහෙත් කවුන්ට් ඩ්‍රැකියුලාගේ ඉදිරිගමන ගැන අපට කිසිදු ආරංචියක් නොලැබිණි. කටුවක් තුළට වදිනා ගොළුබෙල්ලෙකු මෙන් හෝම්ස්, රහස්‍ය බවකින් වැසී, සැඟවී, නිශ්ශබ්දව සිටියේය. ඔහුගේ උදව් අපේක්ෂා කරමින් අනුග්‍රාහකයෝ කිහිප දෙනෙක්ම බේකර් වීථියේ නිවහනට පැමිණියහ. මේ කිසිවෙකුවත් උණුසුම් අයුරින් පිළිගෙන, ඔවුන්ගේ ගැටලු වලට කන්දීමට මගේ මිත්‍රයාට උවමනාවක් නොවීය. එහෙයින් එම අනුග්‍රාහකයන් අපේ නිවසෙන් පිටවී ගියේ, යළි මෙහි නොඑන තීරණය සිතැතිව බව මම තේරුම් ගතිමි. ඔක්තෝබර් 3 වැනිදා හවස හතර පමණ වෙද්දී තන පැහැති රැවුලක් තිබූ පණිවුඩ කරුවෙක් හෝම්ස් සොයා පැමිණියේය. ඔහුගේ ලියුම් කැබැල්ල කියවූ හෝම්ස්ගේ මෙතෙක් තිබූ නිහඬ බව බිඳවැටිණ.

"ලියුම ලෙස්ට්‍රේඩ්ගෙන්. ඔහුට ඕනෑලු වහාම අපව හමුවෙන්න. ඔබේ කබාය හැඳගන්න වොට්සන්. අපි බලාපොරොත්තුවෙන් ඉඳපු අවස්ථාව මේක වෙන්න පුළුවන්" කී ඔහු වහා හැඳපැළඳ ගත්තේය.

"කොහේටද අපි යන්නෙ?" මම ඇසීමි.

"වයිට්චැපල්හි මෘත ශරීරාගාරයට. ලෙස්ට්‍රේඩ් එතැන බලාගෙන ඉන්නවා අප එනතුරු"

ස්කොට්ලන්ඩ්යාඩ් හි අපගේ මිත්‍ර පොලිස්පරීක්ෂක ලෙස්ට්‍රේඩ් ගැන ඔබට මතක ඇතැයි සිතමි. ඔහු සැමවිටම සිටියේ තමාගේ දක්ෂකම් ගැන අධි තක්සේරුවකිනි. ලෝහිත පරීක්ෂණය නමින්



http://sherlockholmesinvestigations.blogspot.com

නම් කළ, හෝම්ස් සමඟ මා සහභාගී වූ ප්‍රථම රහස් පරීක්ෂණය ගැන, මම පාඨකයනට විස්තර කර ඇත්තෙමි. ලෙස්ට්‍රේඩ් මට මුල්වරට හමු වූයේ එම පරීක්ෂණයේදීය. ඒ හමුවීම ද සිදුවූයේ මළසිරුරක් සහිත පාළු නිවාසයක. ඉන්පසු විවිධාකාරයේ පරීක්ෂණ රැසකදීම ඔහු සමග කටයුතු කරන්නට අපට අවස්ථාව සැලසිණ. මෙවර නැගෙනහිර ලන්ඩනයේ සුදුහුණු ආලේප කළ මෘත ශරීරාගාරයක, ඔහු හමුවන්නට ලැබීම පුදුමයක් නොවිණි. ඔහුගේ මුහුණ මට සිහිකළේ, දිගින් දිගටම සේවයේ යෙදීමෙන් හෙම්බත්වුණු, වයස්ගත කම්කරුවෙකුගේ මුහුණය. අප එතැනට ළඟාවෙද්දී වත් ඔහුගේ මුහුණ ආලෝකමත් නොවිණි.

"හෝම්ස් මහත්මයා, ඔබ ආ එක ගැන මට සන්තෝෂයි" ඔහු කීය. "අපට අද කටයුතු කරන්න වෙලා තියෙන්නෙ බිහිසුණු අපරාධයක් ගැන. ඇත්තෙන්ම බිහිසුණු එකක්"

"ඇයි මොකක්ද සිදුවෙලා තියෙන්නෙ?" මගේ මිතුරා විමසීය.

"අපේ භයානක සිහිනය යළිත් ඇත්ත වෙලා. කුප්‍රකට මිනීමරු *ජැක් ආයෙත් එයාගෙ පරණ සෙල්ලම් පටන් අරගෙන"

"කොහොමටවත් වෙන්න බැහැ" මම කීවෙමි. "ඔබට ලොකු වැරැදීමක්"

ලෙස්ට්‍රේඩ් හිස සෙලවූයේ මා කී දෙයට එකඟනොවෙමිනි. "එහෙම නොවුණා නම් අපටත් ලොකු සැනසීමක් දෙස්තර මහත්මයා. නමුත් තියෙන සාක්ෂි වලින් පැහැදිලිවම ඔප්පුවෙනවා මේක ජැක්ගේ වැඩක් බව."

"කෝ මළසිරුර?" හෝම්ස් ඇසීය.

"ඇතුළෙ තියෙනවා" කී ලෙස්ට්‍රේඩ් මෘතශරීරාගාරය තුළට අප කැඳවාගෙන ගියේය.

වෛද්‍යවරයෙක් ලෙස අවුරුදු ගණනාවක් ද ඇෆ්ගනිස්ථානයේ යුද පෙරමුණේ ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස ද මම සේවය කර ඇත්තෙක්මි. යුද්ධයෙන් මියගිය සෙබළුන් නිතර දකීමෙන් විය යුතුව තිබුණේ, මරණය නිසා කම්පා නොවෙන දැඩි බවක්, මගේ සිතේ ඇතිවීමය. එහෙත් සිදුවූයේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. මරණය ගැන මගේ සංවේදී බව වඩාත් වැඩිවිය. මෙම

---

* 1888 දී ලන්ඩනයේ වයිට්චැපල් වීථිවල ගැවසුණු ගණිකාවන් රාශියක් කපා කොටා මරා දැමූ ජැක් ද රිපර් (Jack the Ripper)



http://sherlockholmesinvestigations.blogspot.com

මෘතශරීරාගාරයට පිවිසි පසු මට දකින්නට ලැබුණේ සුදුරෙදි වලින් ඔතා එක පෙළට තබා තිබූ මළසිරුරු ශ්‍රේණියකි. එයින් මගේ සිතේ ඇතිවූයේ අප්‍රසන්න හැඟීමක් බව මම නොසඟවා හෙළිකරමි. එතැන තිබූ පරිසරය ද සිතේ පහන් හැඟීමක් ඇති නොකෙළේය. රසායනික ගන්ධයක් පැතිරවූ කාබොලික් අම්ලයේ තියුණු සුවඳ සතරවටින්ම දැනිණ. මෘතශරීරාගාර සේවකයෙකු රැඳී සිටි එක් කෙලවරකට ලෙස්ට්‍රේඩ් අප කැඳවාගෙන ගියේය.

ඔහු හිසෙන් කළ සංඥාවක් සමග සේවකයා මළසිරුර වසා තිබූ සුදු රෙද්ද ඉවත් කළේය. එහි දුර්ගන්ධය කොතරම් පිළිකුල් සහගත එකක් වූයේ ද යත්, තව ටිකෙන් මා වමනය කිරීමට ඉඩ තිබිණ. මියගොස් සිටියේ කාන්තාවකි. මිනීමරුවා කවුරුන් වුවත් මියගිය තැනැත්තියට කර තිබූ තුවාල වලින් ඇති වූයේ හද කම්පාකරවන හැඟීමකි.

"මිනිය වහල දන්න" හෝම්ස් සේවකයාට කීය. "ඇය කවුද?" හෝම්ස් ඇසුවේ ලෙස්ට්‍රේඩ්ගෙනි. මෙවැනි අපරාධ කරන භයානක මිනීමරුවෙකුට, වීථියේ ගැවසෙන්නට ඉඩ හැරීම ගැන, මා මෙන්ම මගේ මිත්‍රයා ද දැඩි කෝපයකට පත්වූ බව මම දුටුවෙමි.

"වීථියේ සිගා කෑ රේච්ල් හොබ්ස් නම් ගැහැනියක්" ලෙස්ට්‍රේඩ් කීය. "රාත්‍රී වීථි සංචාරයේ යෙදුණු පොලිස් භටයෙකුට, ළඟ හරස් වීථියක තිබී ඇගේ මළසිරුර හමුවුණේ පාන්දර තුනට. ඒ වෙනකොටත් ඇය මියගිහින් පැයක් පමණ ගතවෙලා"

"මේක මිනීමරු ජැක්ගේ වැඩක් කියලා ඔබ හිතන්නේ ඇයි?" හෝම්ස් ඇසීය.

"මොනවද හෝම්ස් මහත්මයා මේ ප්‍රශ්න?" ලෙස්ට්‍රේඩ් විමසුවේ තරමක් උපහාසාත්මක අයුරකිනි. "වීථියේ ගැවසුණු අහිංසක ගැහැනියෙකුව කපල–කොටල, දරුණු තුවාල සිදුකරලා ඇගේ මළසිරුර වීථියක දමායන්නේ, මිනීමරු ජැක් මිසක් වෙන කවිද?"

"ඇගේ ගෙල කපා දමලා නැහැ ලෙස්ට්‍රේඩ්." හෝම්ස් කීය. "ඊට වඩා වෙනස් දෙයක් සිදුකරලා තියෙන්නේ. පිහියක් තරම් මුවහත් නැති ආයුධයකින් ගෙල ඉරාදමලා! ඇගේ සිරුරේ වෙන කොහේවත් තුවාල නැහැ. ඒ ගැන ඔබට මොනවද කියන්න පුළුවන්? මිනීමරු ජැක් ලොකු ප්‍රසිද්ධියකට පත්වුණු විශේෂම කරුණ ඔබේ මතකද? ඔහු මළසිරුරේ නොයෙක්



http://sherlockholmesinvestigations.blogspot.com

විච්ඡේදන සිදුකළා පිහියෙන්. මේ සිරුරේ එවැනි දෙයක් දකින්න ලැබෙන්නේ නැහැ."

"මං හිතන්නේ ඔහු ඒ කටයුත්තට අතගහන්න කලින්, ඔහුට කාගෙන් හරි බාධා පැමිණෙන්න ඇති." ලෙස්ට්‍රේඩ් කීය. එහෙත් ඔහු කථාකළේ තම සොයා ගැනීම ගැන මුලදී තරම් විශ්වාසයකින් නොවේ.

"ඒක අපට පිළිගන්න බැහැ," හෝම්ස් කීවේ හිස සොලවමිනි. "ඔහු ඒ කටයුත්තෙ යෙදිල ඉඳිද්දී කවුරු හරි බාධා කළා නම්, ඇයි මේ මළසිරුර පාන්දර තුන වෙනකම් හම්බවුණේ නැත්තේ? ලෙස්ට්‍රේඩ් ඔබ කියන්නෙ ඇය, ඇගේම ලේ විලක මියගියා කියල. නමුත් ශරීරයේ අනෙක් තැන් වල වත්, තුවාලයේ වත් ලේ නැහැ. එතකොට ඔබ කියන කාරණාව මෙතැනට ගැළපෙන්නේ නැතිව යනවා. එහෙමත් නැතිනම් මිනීමරුවා තමන්ගේ ගෙදර ගෙනියන්න අලුත් සිහිවටනයක් සොයාගෙනද? මේ මිනීමැරුම මතක් වෙන්න, මේ අසරණ ගෑනිගෙ ලේ ටික අරගෙන ගියාද?

"හෝම්ස් මහත්මයා, එහෙම නම් ඔය හැම එකකටම ගැළපෙන උපකල්පනයක් ඔබ ගොඩනගල ඇති?"

"උපකල්පනයක් නම් මා ළඟ තියෙනවා," හෝම්ස් කීය. "නමුත් ඔබ ඒක විශ්වාස කරාවිද කියන එක ගැන මගේ හිතේ ලොකු සැකයක් තියෙනවා. එහෙනම් අපි යමුද වොට්සන්? වැඩ රාශියක් තියෙනවා කරන්න. නමුත් ඒකට අපට ඉතිරි වී තිබෙන්නේ කෙටි කාලයක් පමණයි" හෝම්ස් එතැනින් පිටවී යාමට සූදානම් විය.

"මොනවා හෝම්ස් මහත්මයා?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ මෙය තමාට විශ්වාස කිරීමටවත් අපහසු වූ අයුරෙනි. "ඔබ කියන්නෙ ඔබ මේ ගැටලුව විසඳීම භාරගන්නේ නැහැ කියලද?"

"ලෙස්ට්‍රේඩ්, මං කියන්නෙ මට මෙතැනින් වහාම පිටත්වෙලා යන්න උවමනා බව විතරයි. මේ අපරාධය මිනීමරු ජැක්ගේ වැඩක් කියල ඔබ හිතාගෙන ඉන්න ඇති. ඒ අදහස වෙනස්කරගන්න. මේකට සම්බන්ධ තැනැත්තා ජැක්ට වඩා භයානක, ඊට වඩා කෙරාටික පුද්ගලයෙක්"

ලෙස්ට්‍රේඩ් හෝම්ස් සමීපයට පැමිණ සීරුවෙන් සිටගෙන, තම මුහුණ හෝම්ස් දෙසට හැරෙව්වේය.

"හෝම්ස් මහත්මයා, ඒකද ඔබේ අවවාදය? මං කැමතියි ඔබටත් අවවාදයක් කරන්න. ඒ තමයි ඔබේ අවවාද ඔබම තබාගන්න. ඔබේ



http://sherlockholmesinvestigations.blogspot.com

උදව් නැතිව අපරාධකාරයින් අත්අඩංගුවට ගැනීමට ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට අමාරුවක් නෑ. මේ වගේ අද්භූත දේවල් ගැන ඔබ උනන්දුවක් දක්වන නිසයි, මං ඔබට එන්න කියල ආරාධනා කළේ. නමුත් දැන් මට පෙනෙනවා මේක ඔබට තේරුම් ගන්න අමාරු විධියේ ගැටලුවක් බව. එහෙනම් මහත්වරුනි. ඔබ දෙදෙනාටම ශුභ දවසක්"

අපි එතැනින් එළියට බැස වීදියට පා නගද්දී හෝම්ස් මහ හඬින් සිනාසෙන්නට පටන්ගත්තේය. "ඕව ජූරියට පත්කරවන වැඩට ලෙස්ට්‍රේඩ් බොහොම දක්ෂයි." හෝම්ස් කීය. "ඔහු මට හමුවෙන හැම සැරේකම මට දකින්න ලැබෙන්නෙ, කලින් සැරේට වඩා මෝඩ, හිතුවක්කාර ලෙස්ට්‍රේඩ් කෙනෙක්. මිනිහගේ අනුවණ කමේ කෙළවරක් නෑ වගෙයි."

"ඔබ හිතන්නේ මේ අපරාධය ඩ්රැකියුලාගේ වැඩක් කියලද?"

උගුර පෙදපස ඉරාදමා තිබූ රේචල් හෝන් ගැහැනියගේ මෘතශරීරය මගේ සිහියට නැඟිණ.

"වෙන කාගෙද? කොහොම වුණත් වැඩේ බොහොම නොසැලකිලිමත්ව අපිරිසිදුවට කර තිබීම ඔහුගේ පිළිවෙළ නොවෙයි. ඒකෙන් මට හිතාගන්න පුළුවන් මෙහෙම දෙයක්. ඔහු ඉන්න ඇත්තේ ලේ පිපාසා වී නොඉවසිල්ලෙන්. ඒ වගේම ඉක්මනින් එතැනින් පැනයාමේ අරමුණෙන්. එහෙම නොවෙන්න ඔහු මළසිරුර කොහේ හරි හංගනවා. ඒ, කිසිකෙනෙකුට එය හොයාගන්න අපහසු විධියට. මට නම් හිතෙනවා වොට්සන්, ඩ්රැකියුලා හදන්නෙ රටෙන් පිටවෙලා යන්නයි."

"පිටවෙලා යන්න? කොහේට යන්නද?"

හෝම්ස් දෙඋර හැකිළුවේ ඒ ගැන තමාට නිශ්චිත අදහසක් නොමැති බව හඟවමිනි.

"ඒක මට හරියටම කියන්න බැහැ වොට්සන්. නමුත් ඔහු එංගලන්තය අත්හැර දමලා ආපහු ට්‍රාන්සිල්වේනියාවටම යන්න අදහස් කළා වෙන්නත් පුළුවනි"

"ඔහුට මෙහේ එල්ලවෙන අභියෝග වල හැටියට ඒක බොහොම බුද්ධිමත් තීරණයක්" මම කීවෙමි.

"ඒ වගේම කවුන්ට් ඩ්රැකියුලා කියන්නේ, ලේසියෙන් තමන්ගේ සටන අත්හැර දමන විධියේ කෙනෙකුත් නෙමෙයි." හෝම්ස් කීය.



http://sherlockholmesinvestigations.blogspot.com

"බාගවෙලාවට ඔහුගේ සැලසුම් සතුරන්ට හෙළිවුණු නිසා, ඒව වෙනස්කරන්න උත්සාහ දරනවා වෙන්නත් පුළුවනි. කොහොම නමුත් ඔහු සටන මුළුමනින්ම අත්හැර දමාවි කියල හිතන්න අමාරුයි. නැහැ වොට්සන්. ඩ්‍රැකියුලා ඊළඟට තබන පියවර මොන ආකාරයේ එකක් වුණත්, ඔහු යටත් වෙන්නේ නම් නෑ"

"ඔබ ඊළඟ පියවර ගැන කිවූ නිසයි මං අහන්නෙ. අප ඊළඟට ගන්නේ මොන වගේ පියවරක්ද?"

මගේ මිත්‍රයා මඳ වේලාවක් නිහඬව කල්පනා කළේය. ඔහු යළිත් කථාකළේ මිනිත්තු කිහිපයකට පසුවය. "වොට්සන්. ඩ්‍රැකියුලාට තිබුණා ඔහුගේ මේ අපරාධය සඳහා ලන්ඩන් නගරයේ ඕනෑම තැනක් තෝරාගන්න. ඒ වුණත් ඇයි ඔහු වයිට්චැපල් ප්‍රදේශයෙන්ම පටන්ගත්තෙ?"

"ඒ මොකද ඔහුට අවශ්‍ය ගොදුරු මේ පැත්තෙ පහසුවෙන්ම හොයාගන්න පුළුවන් නිසා" මම කීවෙමි.

"ඒ එක කාරණයක්. වෙනත් කාරණා මොනවද ඔබට මතක් වෙන්නෙ? මොකුත් නෑ? සිංහයෙක් ගොදුරු හොය හොයා, උගේ ගුහාවෙන් බොහොම ඈතට, දඩයමේ යන්නෙ නෑ. අත්හැර දමූ පාළු ගොඩනැගිලි වෙත ඔහු දක්වන ආසක්තවය ගැන, අපි හොඳින් දන්නවා. හොඳට හොයල බැලුවොත්, හැතැක්ම භාගයක දුරක් ඇතුළත ඔහුට උවමනා කරන ජාතියේ පාළු ගොඩනැගිල්ලක්, අපට හොයාගන්න බැරිවෙන්නේ නෑ. අපි ඉක්මනින් පටන්ගමු. හොඳටම ඇඳිරිවැටීගෙනයි එන්නෙ. බේරිලා යන්න අමාරු විධියට කොටුවුණු තිරිසනෙක් අතින්, ඕනෑම භයානක දෙයක් සිදුවෙන්න පුළුවනි. ඒ ගැන මං ඔබට අමුතුවෙන් කියන්න ඕන නෑ"

ලන්ඩනයේ නැගෙනහිර කොළවරේ අත්හැර දමා විනාශයට පත්ව, දුගඳ හමමින් තිබූ ගොඩනැගිලි සෑහෙන සංඛ්‍යාවක් අපි දුටුවෙමු. ඊළඟ පැය දෙකම අප ගතකළේ අත්හැරදමා ගිය එවැනි තැබෑරුම්, අවන්හල් හා නවාතැන් පරීක්ෂා කරමිනි. එක්කෝ ඔවුන් යෙදුණු නීති විරෝධී කටයුතුවල තවදුරටත් යෙදීම අපහසුවන්නට ඇත. නැතිනම් පාතාල ලෝකයේ අනෙක් තරගකරුවන් සමග කරට කර සිටීමට නොහැකි වන්නට ඇත. මේ කුමක් හෝ නිසා කූට ව්‍යාපාරිකයෝ තම ගොඩනැගිලි අත්හැරදමා ගොස් සිටියහ. අපි ඒවා තුළටම ගොස් පරීක්ෂා කළෙමු. දූවිලි හා මකුළුදැල් වලින්



http://sherlockholmesinvestigations.blogspot.com

අපේ ඇඳුම් අපිරිසිදු වුවා මිස, සතුරාගේ ලකුණක් හෝ දකගන්නට නොලැබිණ. මෙවැනි අපිරිසිදු ගුහාවකින් එළියට එද්දී හෝම්ස් එක්වරම මගේ අතින් අල්ලා ගත්තේය.

"වොට්සන්. අපි මේ සෝදිසිය කළ පිළිවෙළ සම්පූර්ණයෙන්ම වැරදියි"

"ඒක හරි කතාවක් නේ. දන්නද ඔබට ඒ බව මතක්වුණේ?" මා ඇසුවේ සිතේ ඇතිවූ තරහක් ද ඇතිවය.

"මට සමාවෙන්න මිත්‍රයා. මං ඒ නිගමනයට එන්න තිබුණේ මීට කලින්. මේ හිස්වූ, අත්හැර දමූ ගොඩනැගිලි එකක්වත් හිස්වෙලා අවුරුද්දකට හමාරකට වැඩි නෑ. මේ වගේ තැනක් කොයි මොහොතක හරි බොහෝම ඉක්මනින්, වෙනින් කෙනෙක් මිලදී ගන්න පුළුවනි. ඒ වුණත් අත්දැකීමෙන් අපි දන්නවා, ඩිරැකියුලා හුඟක්ම කැමැති මෙහෙම වගේ තැන්වලට කියලා. අත්ඇර දමලා අවුරුදු ගණනාවක් ගතවුණු, කිසිවෙක් ඉක්මනින් මිලදී ගනීවි කියල හිතන්න අමාරු තැනක් තමා ඔහු තෝරාගෙන ඇත්තෙ. එහෙම තැනක් තවත් කෙනෙකුගේ අවධානයට ලක්වෙන්න තියෙන ඉඩකඩ බොහොම අඩුයි. වොට්සන් එතකොට මොකක්ද ඔබේ හිතට එන්නෙ?"

"මට හිතෙනවා ඔහු තෝරාගනීවි, පදිංචියට නුසුදුසු, කඩාදමන්න යෝජිත ගොඩනැගිල්ලක්"

"විශිෂ්ටයි වොට්සන්. ඔබ රහස්පරීක්ෂක වෘත්තියට යෝග්‍යම කෙනෙක්. මේ හරියේ පාර කෙළවර තියෙනවා, ඔබ කියන විධියේ ගොඩනැගිල්ලක්. ඒකෙ ඉස්සර තිබුණේ සත්ත්ව ඝාතකාගාරයක්. නමුත් දැන් සෑහෙන කාලෙක ඉඳලා පාළුවට අත්හැරදමලා. නගර සභාව ළඟකදී තීරණය කළාලු ඒක කඩාදමන්න. අපරාධකාරයෙකුට මීට වඩා හොඳ තැනක් කොහේද? වහාම යමු වොට්සන්. නාස්ති කරන්න කාලයක් නෑ" ගමන් කරමින් තිබූ කුලීරියක් නැවැත්වූ අපි ඊට නැගුණෙමු.

ගඩොලින් තනා තිබූ තනි තට්ටුවේ ගොඩනැගිල්ලක් වූ සත්ත්ව ඝාතකාගාරය පිහිටා තිබුණේ වයිට්චැපල් පෙදෙසේ එක් කෙළවරකය. එය ඉදිරිපස තරමක මිදුලක් තිබිණි. එය අබලන් වූ ලී වැටකින් වටකොට තිබිණි. ගොඩනැගිල්ලේ වීදුරු ජනේල සම්පූර්ණයෙන්ම ආවරණය වන සේ- පිටින් ලෑලි තබා ඇණ ගසා තිබිණ. වත්තට ඇතුළුවන ගේට්ටුවට අගුළු දමා තිබුණේ නැත.



http://sherlockholmesinvestigations.blogspot.com

"හරි විධියට නම් මෙතන තියෙන්න ඕන අගුළු දමල" මගේ මිත්‍රයා කීවේ කෙඳිරිලි හඬෙනි. "මෙතෙන් තේරෙන්නෙ ඔහු මෙතැන ඉන්නවා වොට්සන්."

මෙය අසන්නට ලැබුණු විට මගේ සිතේ ඇතිවූයේ වකිතයකි. ගොඩනැගිල්ල ඇතුළතින් සැකකටයුතු ශබ්දයක් ඇසෙද්දී මගේ සිතට දැනුණු භය දෙගුණ තෙගුණ විය. මෙම අන්ධකාරයේ සෙවණැලි අතර, කුමක් හෝ කුටයුක්තියක් සිදුවෙමින් ඇත. එය වඩාත් අප්‍රසන්න වූයේ, මෙම සිදුවීම වලට සම්බන්ධව ඇත්තේ, මියයන්නේ නැති භූතයෙකු වීම නිසාය.

කලකට පෙර සත්ත්ව ලේ වලින් පෙඟුණු මේ භූමියේ, නොසිතන ආකාරයේ භයානක දෙයක් සිදුවීමට ඉඩ තිබේ. ඒ ඕනෑම දේකට සූදානමෙන් ගේට්ටුවෙන් ඇතුළු වී, මම හෝම්ස් පිටුපස ගියෙමි.

මුලින්ම මට දකින්නට ලැබුණේ ගොඩනැගිල්ලේ ඉදිරි දොර අසල ඇණයක එල්ලා තිබූ දැල්වූ ලන්තෑරුමය. එයින් එතරම් දීප්තිමත් එළියක් නොවිහිදිණි. මගේ දෙනෙත් අන්ධකාරයට හුරුවෙද්දී, අවට මිදුලේ සිදුවූ කටයුතුත් දේවල් මට දැකගන්නට ලැබුණේය. ගල්අඟුරු මෙන් කළුපැහැ අශ්වයින් දෙදෙනෙකු බැඳ තිබූ, බඩු ප්‍රවාහණය කරන වර්ගයේ ලොකු අශ්වකරත්තයක් එහි විය. මෙම කරත්තයේ ඉදිරිපස යොමුකොට තිබුණේ ගේට්ටුව දෙසටය. හැඩිදැඩි කම්කරුවෝ දෙදෙනෙක්, හතරැස් ලී පෙට්ටියක් එසවීමට ඩහදිය මුගුරු හෙළමින් සිටියහ. ඒ පෙට්ටිය අප කාෆැක්ස්හි දුටු පෙට්ටි විසිනවයේ ඒවාට, සෑම අතකින්ම සමාන විය. සේවකයනට අණ දෙමින්, එම කටයුතු මෙහෙයවමින් සිටියේ කවුන්ට් ඩ්‍රැකියුලා ම බව අපි දුටුවෙමු. වාසනාවකට මෙන් ඔහු සිටියේ අපට පිටුපා ගෙනය. අප එතැනට ළඟාවෙද්දී කම්කරුවෝ තම කටයුත්ත නවත්වා අප දෙස බැලූහ. මෙය දුටු කවුන්ට්වරයා ආපසු හැරී බැලුවේය.

අප හඳුනාගනිද්දී ඔහුගේ සුදුමැලි මුහුණ කෝපයෙන් රතුවිය. ඔහුගේ දෙනෙත් රතු පැහැයට හැරුණේ ගිනිදැල් විලසිනි. ඔහුගේ උඩුතොල ඉහළට ඇදුණේ, අපට සමච්චල් කරන කුරිරු හිනාවක් පෑමටය. ඒ සමගම කිණිසි මෙන් මුවගත් උල් දත් දෙකත්, ලේ පාට උඩුතොලත්, කළු උඩුරැවුල සමග කැපී පෙනිණ. ඔහුගේ හුස්ම


http://sherlockholmesinvestigations.blogspot.com

ගැනීම වේගවත් විය. හිස්වැස්මක් නොතිබුණෙන්, කළු කෙස් රොද කිහිපයක් නළල හරහා වැටී තිබූ අයුරු අපි දුටුවෙමු. මේ හැම එකකින්ම ඔහුගේ මිනිමරු තිරිසන් ස්වභාවය, වඩාත් හොඳින් මතුවී පෙනිණ. හෝම්ස් පැය දෙකකට පෙර කී දෙයක් මේ මොහොතේ මගේ සිහියට නැඟිණ. පැනයාමට ගැලවීමට ක්‍රමයක් නොමැතිව කොටුවන සතා, උගේ බිහිසුණුම ස්වභාවයට පත්වේ.

"මෝඩ බූරුවෝ!" ඔහු කෝපයෙන් කෑගැසුවේ බෝම්බයක් පුපුරණ විලසිනි. ඒ ශබ්දය පාළු ගොඩනැගිල්ලේ බිත්ති මත වැදී දෝංකාරය නැංවීය. "මරණය නියත තැනට මැරුම් කන්න ආව උඹලා, මොන තරම් මෝඩ හරක්ද?"

කෝපයට පත්වූයේ අපේ සතුරා පමණක් නොවේ. හෝම්ස්ගේ මුහුණ ද කෝපයෙන් දිලිසුණු අයුරු මම දුටුවෙමි. එහෙත් ඔහු කලබල නොවී මේ දෙස බලා සිටියේ යමක් අනුමානය. ඒ, "වාටු නෝනා" ගෙන් මගේ ජීවිතය ගලවාගත් විදි කුරුසිය බව මම හඳුනාගතිමි. "කවුන්ට්, ඔබ මහ පිස්සු සතා" හෝම්ස් කීවේ තැන්පත් ස්වරයෙනි. "ඔහේගේ සේවකයන්ට නියම කරන්න, ඔය පෙට්ටිය බිමට බාන්න කියල"

ඩ්‍රැකියුලා දැඩි ලෙස කෝපාවිෂ්ට විය. ඒ දුටු සේවකයෝ පස්සෙන් පස්සට ගොස් බිත්තියට හේත්තු වූහ. කවුන්ට් ක්‍රියාත්මක වූයේ එවිටයි.

ඔහු සිටි තැන සිට අප සිටි තැනට තිබුණේ, අඩි පහළොවක පමණ දුරකි. ඔහු අප සිටි තැනට පැන්නේ එක පිම්මෙනි. එසේ පනිද්දී දකුණතෙන් හෝම්ස් වෙත එල්ල කළ පහරට මගේ මිත්‍රයා බිම ඇද වැටුණේය. ඔහු අතේවූ කුරුසිය අහකට විසිවී ගියේය. දුෂ්ට කවුන්ට්වරයාට බාධාකිරීමට මම ඉදිරියට ගියෙමි. තම වම් අත මගේ පපුවට තැබූ ඩ්‍රැකියුලා මා බිමට වැටෙන පරිදි පිටුපසට තල්ලු කළේය. එයින් මා බිම ඇද වැටුණේ, සිදුවූයේ කුමක්ද යන්න සිතීමටත් පෙරය.

එක් ක්ෂණයකින් අශ්වකරත්තයට පැනගත් ඔහු රේන්ස්පටි එක් අතකට ගෙන, අනෙක් අතට ගත් කසයෙන් අශ්වයනට පහර එල්ල කළේය. අශ්වයන් විදුලි වේගයෙන් ඉදිරියට පිනුවේ බිම වැටී සිටි මා දෙසටය. තව නිමේෂයකින් මා රථයේ රෝද වලටත්, අශ්වයින්ගේ කකුල් වලටත් යටවෙන බව දුටු මම, දෑතින් මුහුණ



http://sherlockholmesinvestigations.blogspot.com

වසා ගතිමි. මගේ මුහුණ දෙපැත්තෙන්ම අශ්වයින්ගේ කුර ගැටෙන හඬත්, කරත්ත රෝද වල හඬත් ඇසිණි. ඉහළට නැඟුණු දූවිලි වලාකුළෙන් බේරීමට මුහුණ වසාගත් මම, දැන් ඉවත් නොකෙළෙමි. මීළඟට මට අහන්නට ලැබුණේ කලබල වූ මගේ මිත්‍රයා මගේ නම කියමින් උස් හඬින් කෑගසන ආකාරයයි.

"වොට්සන්! වොට්සන්! ඔහු කෑගැසුවේ මගේ උරහිසෙන් අල්ලා සොලවමිනි. "වොට්සන්. ඔබට තුවාල වුණේ නැහැ නේද? දෙවියන්ගෙ නාමෙන් කතාකරන්න වොට්සන්!"

මගේ මිත්‍රයා අතිශය භීතියට පත්ව සිටි බව ඒ කටහඬෙන් තේරුම් ගතිමි. මුහුණ වසාගෙන සිටි දෑත් ඉවත්කොට, දෙපැත්තට වැලමිටි ගසාගෙන හිස ඉහළට එසවූයෙමි. හෝම්ස් පුදුමයෙන් මෙන් මා දෙස බලා සිටියේය. "ඔහු පැන ගියා නේද හෝම්ස්?"

ඔහු උස්හඬින් සිනාසුණේ සැනසීමට පත් අයුරිනි. "ඔබට එක් වාරයක් තුවාල වෙන්නේ නැතුව, ඔහු සියවාරයක් පැනල ගියත් කමක් නෑ. මගේ හිතවත් මිත්‍රයා, කණගාටුවෙන්න එපා. අපි ඉක්මනින් ඔහුව හොයාගන්නවා."

"හෝම්ස්. ඔබ කොහොමද ඩ්‍රැකියුලාව හොයාගන්න බලාපොරොත්තු වෙන්නෙ?" මා ඇසුවේ මගේ සිරුරේ තිබූ වැලි පිසදමමිනි.

"ඔබට මතකද අපි ලන්ඩන් නගරය මැදින් ජොනතන් ස්මෝල් හා ඔහුගේ මිතුරු කුඩා වනචාරියා හඹා ගිය හැටි?"

"ටෝබිගේ උදව්වෙන්!"

"ඔව්. අපරාධකරුවන් ලුහුබැඳ යාමට ටෝබිට තියෙනවා හොඳ ඉවක්. අශ්වකරත්තයක් ගියා පාර ඉවකිරීම ඌට එච්චර අමාරුවෙන්නෙ නෑ"

"ඒ වුණාට මට මෙහෙම දේකුත් [illegible] වෙනවා" මම කීවෙමි. "ජොනතන් ස්මෝල්ගේ උදව්කාරයාට ක්‍රියෝසෝට් තෙල් වගයක් පෑගිලා, ඒ සුවඳට ඉව කරමින් අපරාධකරුවා හොයායෑම, ටෝබිට අමාරුවුණේ නෑ. ඒ වුණත් මේ අශ්වකරත්තයේ රෝද ටෝබි කොහොමද හඳුනාගන්නෙ? පහුගිය පැය කීපය තුළ අශ්වකරත්ත දහස්ගණනක් මේ පාරේ යන්න ඇති"

"ඔන්න වොට්සන් ඔබට වැදගත් කාරණා අමතක වෙනවා. අපි දැන් මේ ඉන්නෙ කොහේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"අපි ඉන්නේ පරණ සත්ත්ව ඝාතකාගාරයක. ඒත් ඒක කොහොමද...............?"

"වොට්සන්. ඔබ මට කියන්නේ සත්ත්ව ලේ නැවත නැවතත් උරාගත් මේ පස් ගැවුණු කරත්ත රෝද හඳුනාගැනීම, හොඳ බල්ලෙකුට අපහසු දෙයක් කියලද?"

"මගේ හිතවත් මිත්‍රයා. ඔබ නම් හැබෑ දක්ෂයෙක්"

"ඔබ ඔහොම කියනකොට, මට ලැජ්ජත් හිතෙනවා වොට්සන්" කී ඔහුගේ මුහුණ රතුවූයේ සිනාවල්ලක් ද සමගිනි. ඒ සිනාවෙන් පසු තවත් බොහෝ කාලයක් යනතුරු, අප දෙදෙනාගෙන් එකෙකුගේ වත් මුහුණේ යළිත් සිනාවක් මතුවූයේ නැත.

Reading Purpose Only



http://sherlockholmesinvestigations.blogspot.com

# 10

## භයානක හෙළිදරව්වක්

"ඒයි මගේ කුඩුවල ඉන්නවා හපුරු බල්ලෝ පනස්දෙනෙක්. උඹ මෙතැනින් ගියේ නැත්නම් මං උන්ව අතාරිනවා. උං උඹේ කැලිවත් ඉතුරු කරන එකක් නෑ!" ෂර්මන් මහතා උඩ තට්ටුවේ සිට බෙරිහන් දුන්නේය. ඒ, මා පහළ තට්ටුවේ ඔහුගේ දොරට තට්ටු කළාට ලැබුණු පිළිතුරය.

සිව්රහස් සලකුණ කථාවේ මගේ අත්දැකීම විස්තර කරද්දී, ෂර්මන් මහතා ගැන කළ සඳහන පාඨකයාට මතක ඇතැයි සිතමි. ටෝබි නම් බල්ලාගේ අයිතිකරුවා වූ ෂර්මන්, ආගන්තුකයනට ආචාරශීලී අයෙකු නොවේ. පිංචිං පටුමගේ පිහිටි ඔහුගේ අබලන් නිවස වෙත ගොස්, දොර විවෘත කරවා ගැනීමට මා තැත්කරද්දී, ඔහු ඉහත සඳහන් ලෙස තර්ජනය කරමින් මට බැණවැදුණේය.

"ෂර්මන් මහත්මයා! මම දොස්තර වොට්සන්. මං ආවෙ ඔහේ හම්බවෙන්න. මේ දොර පොඩ්ඩක් අරින්න" මම කෑගැසුවෙමි.

"තමුසේ වික්ටෝරියා මහරැජින වුණත් මට කමක් නෑ!" ඔහු කෑගැසුවේය. "පලයං මිනිහෝ මෙතැනින් යන්න. උඹ නොගියොත් මං කරන වැඩේ දන්නවද? මං ළඟ ඉන්නවා පිස්සු වැටිච්ච ටෙරියර් බල්ලෙක්. ඌ අතහැරියොත් ඌ පනියි තමුසෙගේ බෙල්ලටම. ඌ තමුසෙගෙ උගුර හපාකනවා සහතිකයි" ඔහු උඩ තට්ටුවේ ජනේලයෙන් එබී, පහළ බලා සිටියේ දැල්වුණු ඉටිපන්දමක් ද අතැතිවය.

"මං ආවේ බල්ලෙක් අරගෙන යන්න"

"ඔව් ඉතින් උඹට දෙන්නම් බල්ලෙක්. ඌ හපාකද්දී උඹ මරලතෝනි කියමින් මැරේවි. ඒ මොකද මේ නාකි ෂර්මන් කිව්ව වෙලාවට ගේ දොරකොඩින් පිටවෙලා නොගිය නිසා. මං උඹට දෙන්නේ තත්පර තිහයි! ඊට පස්සේ බල්ලාව අතාරිනවා!" ඔහු කීවේ විහිළුවට නොවන බව මම තේරුම ගතිමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා කිව්වා............" මම හැකිතරම් උස්හඬින් කෑගැසුවෙමි. ෂර්මන්ගේ දොර අරවාගැනීමට අවශ්‍ය මගේ මිත්‍රයාගේ නම සඳහන් කිරීම පමණක් බව මම දැනසිටියෙමි. එහෙත් එය කොතරම් ඉක්මනින් ක්‍රියාත්මක වේද යන්න, මට අමතකව තිබිණ.

උඩුමහලේ ජනේලය ඇරුණේ එක් ක්ෂණයකිනි. තත්පර කිහිපයක් යද්දී ඉදිරි දොර විවෘත විය. ඇතුළේ සිටියේ වෙනදාටත් වඩා කෙට්ටු, වයස්ගත, කුදුවුණු ෂර්මන් මහතාය. ඔහු තම උපැස් යුගළ තුළින් අපහසුවෙන් මා දෙසට නෙත් යොමුකළේය.

"මට සමාවෙන්න දොස්තර මහත්තයා" ඔහු කීවේ මට නිවසට ඇතුළු විය හැකිවන පරිදි දොර ළඟින් ඈතට වෙමිනි. "ඔන්න බලන්න. ෂර්ලොක් හෝම්ස් මහත්තයගෙ නම කියන තුරු, ඔබේ නම කිව්වට මට මතක්වුණේ නැහැනෙ. එන්න මහත්තයා ඇතුළට"

"කෝ අර පිස්සු හැදිච්ච ටෙරියර් බල්ලා?"

"ඒක මං ගොතපු බොරු කතාවක් මහත්තයො." ඔහු කීවේ ලැජ්ජාවෙන් සිනාසෙමිනි. "මේ පැත්තෙ ඉන්න නොසන්ඩාල කොල්ලො රෑට ඇවිත්, මාව ඇහැරවන්ඩ මගේ දොරට ගහනවා. ඔය ළඟ ඉන්න උරුලෑවා ඇත්ත එකෙක්. ඌ නම් හපාකනවා. ටිකක් ඈතට වෙලා ඉන්න මහත්තයා. එතුමා එන්න ඇත්තෙ ටෝබිව අරන්යන්න වෙන්න ඇති?"

"ඔව්. අපට උවමනා වෙලා තියෙනවා ටෝබිගේ හපන්කම් වලින් ප්‍රයෝජන ගන්න"

"අන්න ඉන්නවා නොම්මර හතේ කූඩුවේ"

ඉටිපන්දම අතින්ගත් ඔහු, මා කැඳවාගෙන ඉදිරියට ගියේය. අප ගිය බරාඳය දෙපසම කූඩුවල දැමූ, නොයෙක් වර්ග හා ප්‍රමාණ වල බල්ලෝ සිටියහ. ඉහළින් එල්ලා තිබූ අනෙක් කූඩුවල කුරුල්ලෝ, උරගයෝ සහ නොයෙක් ආකාරයේ වල්සත්තු වූහ. අපේ හිස්වලට ඉහළින් වූ බාල්කයක, සෑම අගලක් පාසාම සිටියේ බස්සන්, බකමූණන් හා කුකුළන්ය. අංක 7 දරණ අලු කූඩුවෙන් ටෝබි එළියට ගත් උගේ අයිතිකරුවා ඌ මට භාර දුන්නේය. මා හඳුනාගන්නට ටෝබි සමත්විය. ඌ නගුට සොලවමින් මා දැකීම ගැන සතුට පළකළේය. මම උගේ හිසට තට්ටුකළෙමි.

"මට පෙනෙන්නේ ඌ ඔබතුමාව හඳුනාගෙන වගෙයි" ෂර්මන් කීය. "මේ සැරේ ඌට සීනි ගුලියක් දෙන්න උවමනා වෙන්නෙ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"ටෝබි හොඳ බල්ලා" මම කීවෙමි.

"දෙස්තර මහත්තයා. ඌ තමයි අපිට ඉන්න හොඳම බල්ලා. ෂර්ලොක් හෝම්ස් මහත්තයා ඉතක් කලා කියන්න" ෂර්මන් අවසාන වශයෙන් කීය.

මම ටෝබි සමග කුලීරියක නැඟී ඩයිට්වැපල් වෙත ගියෙමි. හෝම්ස් අප එනතුරු හොඩහැගිල්ල ඉදිරිපිට බලාසිටියේය. වේගයෙන් හමා ආවේ සනු මීදුමකි. ඒ ගැන නොතැකූ ඔහු පයිප්පය උරමින් සිටියේය.

"අන්න මගේ හොඳ මිත්‍රයෙක්" හෝම්ස් කීවේ ටෝබි දුටු විටදීය. ඌ ද මිත්‍රයා හඳුනාගෙන නගුට වැනීමට පටන්ගත්තේය. "ටෝබිට හොඳට කන්න තිබුණට මෑතකදී ව්‍යායාමයක් තිබිල නෑ. කමක් නෑ. අපි වැඩි හරිය අඩුකරමු. වොට්සන්, ඩ්‍රැකියුලාගේ අන්තිම වාසභවනය මං සොයාගැනීමට ලක්කලා. මේ දැනුයි ඒ කටයුත්ත අවසන් වුණේ"

"මොනවද ඔබට හමුවුණේ?"

"බොහොම ස්වල්පයයි." කී ඔහු සාක්කුවට අතදමා දීප්තියෙන් බැබළෙන කහ පැහැති වටකුරු ලෝහ ලපත්තක් අතට ගත්තේය. "මේක ගැන මොනවද ඔබට හිතෙන්නේ?"

"රන් කාසියක්!" කී මම ඉදිරි දොර අසල එල්ලා තිබූ ලන්තෑරුමේ එළියෙන් එය පරීක්ෂා කර බැලීමි. එහි මැද රාජ්‍ය ලාංඡනයක් වූ අතර, දෙපැත්තේම අකුරු වලින් යමක් සටහන් කොට තිබිණි. ඒ කිසිවක් කියවීමට හෝ තේරුම් ගැනීමට මට නොහැකි විය.

"රූබල් එකක්ද?" මම ඇසීමි.

"නැහැ. රූබල් කාසි හදන්නේ රිදී වලින්" හෝම්ස් කීය. "මට හිතෙන හැටියට මේක හංගේරියන් ක්‍රවුන් කාසියක්. පහළොස් වැනි ශතවර්ෂය අවසන් වෙද්දී තුර්කි-මග්‍යාර් යුද්ධය පැවැති කාලේ නිකුත් කළ එකක් වගෙයි. සාලේ බිම සිමෙන්තිය කැඩී ගිය තැනක තිබිලයි මට ඒක හමුවුණේ"

"මොකක්ද ඒකෙන් අදහස් වෙන්නේ?" මම ඇසීමි.

"වාසනාව ළඟාකරන්න කියලා මේ වගේ දෙයක්, ඔහු යන එන තැන ගෙනියනවා කියල හිතන්න අමාරුයි" මගේ මිත්‍රයා කීය. "ඒ නිසා අපට හිතන්න පුළුවන්, මේක ඔහු ට්‍රාන්සිල්වේනියාවේ ඉඳල ගෙන ආ දෙයක් බව, මේ ඔහුගේ කටයුතු සඳහා අවශ්‍ය වන මුදල්.



http://sherlockholmesinvestigations.blogspot.com

මට හමුවුණු එකම කාසිය ඕක. අනිවාර්‍යයෙන් ඔහු ළඟ තියෙන්න ඇති. ඒකෙන් අදහස් වෙන්නෙත් ඔහු එංගලන්තය හැර දමා යනවා කියන එකයි."

"එහෙනම් ජයග්‍රහණය අපටයි?" මම මහත් සතුටෙන් ඇසුවෙමි.

එහෙත් හෝම්ස්ගේ මුහුණේ සතුටක් පිලිබිඹු නොවීය. "අපි දිනුවද?" ඔහු ඇසීය. "ඔව් බාගවෙලාවට. ඔහු ආපහු යන්නේ ට්‍රාන්සිල්වේනියාවටමද? එහෙම නම් මට සන්තෝෂයි. එහෙම නැතුව ඔහු යන්නේ වෙනත් තැනකට නම්, ඒකෙන් අපට සෑහීමකට පත්වෙන්න බෑ. කොහොම වුණත් ඔහු ගිය මග පසුපස ඉව කර යායුතුයි. වොට්සන් ඔබ ඊට සූදානම්ද?"

"වෙන කවදටත් වැඩිය සූදානම්"

"හොඳයි. එහෙනම් පොළොව ඉවකරල බලපන් ටෝබි!" පැවසූ හෝම්ස් බල්ලාට සක්ත්ව ඝාතකාගාරයේ පොළොවට ඉව අල්ලා බැලීමට සැලැස්වීය. "ඉව කරපන්, ඉව කරපන්"

මගේ මිත්‍රයාගේ සංඥාව තේරුම් ගෙන දෝ, ටෝබි උගේ තෙත් නාසය බිම තබා, ඉවකරමින් කැරකුණේය. මීළඟට ඌ නගුට සොලවමින් මිදුල පුරා දිව ගියේ, පොළොවේ පස්වල පුස්ඹට ඉව අල්ලමිනි.

බලු කරපටියක් සහිත ලණුවක් සාක්කුවෙන් ගත් හෝම්ස්, එය ටෝබිගේ කරේ ගැටගැසීය. ටෝබි ඉතා ඉක්මනින් ඌ ගැටගසා තිබූ ලණුව ඇදගෙන ගේට්ටුව දෙසට දිවයාමට තැත්කළේය.

"අපි යමු වොට්සන්" හෝම්ස් කීවේ ආපසු හැරී මා කැඳවමිනි. "ටෝබි අනික් මිනිස්සු ගැන බලන්නෙ නෑ"

හවස්වරුවේ වයිට්චැපල් ප්‍රදේශයේ ඇවිදීමට ගිය අයට, අප තිදෙනා අපූරු දර්ශනයක් වන්නට ඇත. බල්ලෙක් බුරමින් ඉදිරියට ඇදෙන හැටි; ඌ ගැටගැසූ ලණුව ඇගේ මැදිවියේ මිනිහෙක්; ඒ පිටිපස හතිදමමින් දිවයන තවත් මැදිවියේ මිනිහෙක්. වීථියේ ගමන් කළ ජනයාගෙන් සෑහෙන කොටසක් අප දෙස හැරී බලන්නට ඇතුවා නොඅනුමානය. පාර අයිනේ කිසිවක් වෙළඳාම් කරමින් සිටි තැනැත්තෙක්, හෝම්ස්ගේ ඇඟේ හැපී ඉවතට විසිවී ගියේය. ඔහු බිම ඇදහොවැටී බෙරුණේ යන්තමිනි. ඔහු කෝපයෙන් මිට මොලොවා ගෙන තර්ජනය කරද්දී, අපි එය නුදුටුවාක් මෙන් ඉදිරියටම ගියෙමු.



http://sherlockholmesinvestigations.blogspot.com

නැගෙනහිර ලන්ඩනයේ අඳුරු පටුමාවත් වල සිට ටෝබි අප ගෙන ගියේ, ලන්ඩනයේ අපට හුරුපුරුදු වැදගත් මාවත් දෙසටය. වයිට්චැපල් වැනි අඳුරු මුඩුක්කු පෙදෙසක, ඩ්රැකියුලා ගැවසීමේ පුදුමයක් නැත. එහෙත් වැදගත්තුන් ජීවත් වූ පෙදෙසකට ඔහු පැමිණ ඇති බැව් දක, අපි පුදුමයට පත්වූයෙමු.

අපි ටෝබි පිටිපස දිගින් දිගටම දිව ගියෙමු. විවේක ගැනීම සඳහා මොහොතකට හෝ නැවතීමට අපට නොහැකි විය. සෙනග අතරින්, අප වේගයෙන් ගමන් කරද්දී මීදුම ගලා ඒමට පටන්ගෙන තිබිණ. මාර්ගයේ තිබූ අඳුර සහ නොපැහැදිලි බව මැකීමට, ගෑස් ලාම්පු වලින් නිකුත් වූ එළිය ප්‍රමාණවත් නොවීය. මේ එකක් වත් ටෝබිට බාධාවක් නොවූ බව අපි දුටුවෙමු. සත්ත්ව ඝාතකාගාරයේ ඉව පිටුපස ඌ ගමන් කළේ, හිසේ කිසිදු සැකයක් නොමැතිවය.

අන්තිමේදී මා [illegible] මගේ නිවස පිහිටි පෙදෙස වෙත ටෝබි අප ගෙනයාමට පටන්ගත්තේය. එවිට මගේ සිතේ ඇතිවූ හැඟීම මා විස්තර කරන්නේ කෙලෙසද? සවස වැඩ අවසන් වී ගෙදර බලා එන කෙනෙකුට, විශාල ගින්නක සළකුණු ඇතදී දකින්න ලැබුණොත්? මේ ගිනිගන්නේ මගේ ගෙදරද? යනුවෙන් විශාල බියක් ඔහුගේ සිතේ ඇතිවේ. මගේ සිතේ එවේලේ ඇතිවූයේ ද එවැනි හැඟීමකි. බියවීමට කරුණක් නොමැති යයි මටම කියාගනිමින්, මම සිත සනසාගැනීමට උත්සාහ දැරුවෙමි. ඩ්රැකියුලා බොහෝදුරට යන්නට ඇත්තේ පැඩිංටන් දුම්රියපොළට විය හැක. එහෙත් මගේ සිතේ ඇතිවූ බිය තුරන් නොවීය. මගේ බිරිඳ නිවසේ සිටින්නේ තනිවමය. ඇය භයානක අත්දැකීම් රැසකට මුහුණදී ඇත්තේ, තරුණවිය [illegible] පෙරය. තවත් බියකරු අත්දැකීම් වලට මුහුණදීමට සිදුවුණොත්?

අපට ඉදිරියට යාමට ලැබුණේ තවත් යාර සියයක දුරක් පමණි. හෝම්ස්ගේ අතේ වූ ලණුව අත්හැරගන්න සේ ටෝබි එක්වරම ඉදිරියට පැන්නේය. ඉන්පසු ඌ වේගයෙන් ඉදිරියට දිව ගොස් මගේ නිවස වෙත යාමට තිබූ තරප්පු පෙළ දිගේ ඉහළට නැගුණේය.

මගේ නිවසේ ඉදිරිදොර [illegible] විවෘතව තිබිණි. දොරෙන් ඇතුළට ගිය ටෝබි ජයග්‍රාහී අයුරෙන් නොනවත්වාම බුරන්නට පටන්ගත්තේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන්......" හෝම්ස් යමක් කියන්නට සැරසුණේය. එහෙත් ඔහු එය අතරමග නැවැත්වූයේ, ගෙදර ගෑස්ලාම්පුවේ එළියෙන් මගේ මුහුණ දුටු විටයි.

ටොබිගේ කෑගැසීම එක්වරම නැවතිණි. මට සිතුණේ ඌට එක්වරම යම්කිසි අනතුරක් එල්ල වන්නට ඇත කියාය. හෝම්ස් පිටිපස නොනවත්වාම දුවැවිත්, මා සිටියේ අධික වෙහෙසකිනි. එහෙත් වරකට තරප්පු දෙක බැගින් නගිමින්, තරප්පු පෙළ ඉහළට වේගයෙන් දිව ගියෙමි. නිවස තුළදී මට මුහුණදීමට සිදුවන්නේ කුමන අන්දමේ අන්තරායකටදැයි ඒ වෙලාවේ ඒ ගැන කිසිවක් මගේ සිතට ඇතුළු නොවීය. මගේ මිත්‍රයා පැමිණියේ මා පිටුපසිනි.

තව ටිකෙන් මා දොරටුව ළඟම බිම ඇදවැටෙන්නට ඉඩ තිබිණි. ඒ, දොරටුව ළඟම බිම වකුටුවී සිටි, ටොබිගේ ඇගේ පය පැටලීයාමෙනි. වලිගය දෙකකුල් අතර රුඳවාගත් ටොබි ශෝකයෙන් වැළපෙන්නාක් මෙන් කෙඳිරිගාමින් සිටියේය. ඌගේ මෙම හැසිරීමට හේතුවක් මුලදී මට සිතාගැනීමට නොහැකි විය.

තවමත් ගේ ඉදිරිපස හා ශාලාවේ පහන් දැල්වූ ගමන්ය. මුළු නිවස පුරාම තිබුණේ දැඩි නිහඬතාවයකි. වේදනාත්මක හැඟීමක් මගේ සිතට ටිකෙන් ටික දැනෙන්නට පටන්ගත්තේ එවිටයි. මගේ මුළු ඇඟම හිරිවැටී ගිය බවක් මට දැනිණ. මීට පෙර මට එවැනි හැඟීමක් ඇතිවී තිබුණේ දෙවරක් පමණි. එක් වරක්, බේකර් වීථියේ නිවහනට කවුන්ට් ඩ්‍රැකියුලා පැමිණි වෙලාවේය. දෙවැනි වාරය, වයිට්චැපල්හි සත්ත්ව ඝාතකාගාරයේ එක්වරම අප දකිමෙන් ඩ්‍රැකියුලා විස්මයට පත්වූ මොහොතේදීය. මුළු ඇඟම හිරිවැටී යාමට හේතු වූයේ, ඔහු මිනීවළේ සිට ගෙන ආ අධික ශීතල බව මම දැනසිටියෙමි.

"හෝම්ස්. ඔහු මෙහේ ඇවිත් තියෙනවා" මා කීවේ සියලු බලාපොරොත්තු කඩවූ හඬෙනි.

"හැමතැනක්ම පරීක්ෂා කරලා බලමු." මගේ මිත්‍රයා කීය. "ඔබේ බිරිඳ තවමත් මේ කොහේ හරි හැංගිලා ඉන්න ඉඩ තියෙනවා."

මීළඟ මිනිත්තු කිහිපය අප ගතකළේ ගෙදර සෑම අස්සක් මුල්ලක්ම පීරා බලමිනි. ඩ්‍රැකියුලාගෙන් ගැළවී සැඟවී සිටින්නට මේරිට හැකිවෙන්නට ඇතැයි දිගින් දිගටම මම සිතා සිටියෙමි. එහෙත් ඇය දකින්නට නොලැබිණි. යථා තත්ත්වය තේරුම් යද්දී


http://sherlockholmesinvestigations.blogspot.com

මගේ සිතේ ඇතිවූයේ දරාගත නොහැකි ශෝකයකි; කම්පාවකි. බිම මහලේ සෑම තැනක්ම සෝදිසි කර අවසානයේ, මම පළමුවැනි තට්ටුවට එමින් සිටියෙමි. අපේ නිදන කාමරයේ සිටි හෝම්ස් කෑගසන හඬක් මට ඇසෙන්නට ලැබුණේ එවිටයි. මා එහි දිවගියා නොව පියාඹා ගියා වැනිය.

කාමරයේ මැද සිටියේ වැඩිවිය ඉක්මවූ කාන්තාවකි. උපැස් යුගලක් පැළඳ සිටි ඇගේ හිසකෙස් පැසී ගොස් තිබිණි. ඇගේ දුඹුරු පැහැති ගවුම දූවිල්ලෙන් වැසී තිබූ අතර, ඇය අපස්මාර රෝගියකු මෙන් හිගැස්සෙමින් වෙවුලමින් සිටියාය.

"ඇය මට අහුවුණේ අල්මාරියක් ඇතුළෙ රිංගලා සිටියදී," හෝම්ස් කීය. "ඇය කියන්නෙ ඇය ඔබේ අසල්වැසියෙක් කියලා?"

"මේ අපේ අල්ලපු ගෙදර බාටන් නෝනා" මට මගේ හැඟීම පාලනය කරගැනීමට නොහැකි විය. මම ඇගේ උරහිසෙන් අල්ලා සෙලවූයෙමි. "බාටන් නෝනා! කතා කරන්න. කෝ මගේ බිරිඳ? ඇයට මොකද වුණේ?"

"කලබල වෙන්න එපා වොට්සන්" හෝම්ස් ඔහුගේ අත මගේ අත මත තැබීය. "ඇය ඉන්නේ අප්‍රමාණ හයකට පත්වෙලා. ඔබ සැර දම්මාම, ඇය තවත් හයට පත්වේවි. ඔබේ ගෙදර බ්‍රැන්ඩි තියෙනවද?"

"පහළ විසිත්ත කාමරයේ තියෙනවා"

"හොඳ මනුස්සයා වගේ ගිහින් වීදුරු තුනක් සූදානම් කරන්න. අපි තව ටිකකින් පහළ තට්ටුවට එනවා"

බාටන් මහත්මිය සිටියේ ක්ෂණික ස්නායු කම්පනයකට පත්වය. බ්‍රැන්ඩි ස්වල්පයක් පානය කොට මද වේලාවක් ගත වෙද්දී, ඇය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වූවාය. ජීවිතයේ වේදනාකාරී අභියෝග ඇයට අමුත්තක් නොවිණි. "ඇෆ්ගනිස්ථානයේ තිබූ යුද්ධයේදී, මයිවාන්ඩ් සටන් පෙරමුණේ ඇගේ සැමියා මියගිහින්ය. කාලතුවක්කු හමුදාවේ සේවය කළ ඔහු, මා සමඟ එකට සටන් පෙරමුණට ගිය සොල්දාදුවෙකි. ඔහුගේ මරණය නිසා සම්පූර්ණයෙන්ම අනාථ තත්ත්වයට පත්වූ ඇයට, නිවසක් ලබාගැනීමට හැකි වූයේ ද මගේ උත්සාහය නිසයි.

මද වේලාවක් ගතවෙද්දී ඇයට සෑහෙන තරම් සුවයක් ලැබිණි. එහෙත් ඇගේ දත්වල වෙවුලීම දිගටම තිබිණි. කෙසේ වෙතත්



http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් ඉදිරිපත් කළ සරල ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇයට හැකිවිය. පහත සඳහන් වන්නේ ඇය පැවසූ විස්තරයයි.

"මෙගෙහේ වැඩට එන සේවිකාව, අද කලින් වැඩ ඉවර කරල තිබුණා" මහලු කාන්තාව කීවේ කෙඳිරිලි හඬෙනි. "ඉතින් ඇයට කලින්ම ගෙදර යන්න වොට්සන් මහත්මිය ඉඩදීල තිබුණා. ඇය හිටියේ හරි පාළුවෙන්. ඉතින් මං තේ එකක් අරගෙන මෙහෙ ආවා. ඇවිත් විසිත්ත කාමරේට වෙලා අපි දෙන්නා තේ බිබී කතාකර කර හිටියා. වැඩිවෙලා ගියේ නෑ, මෙන්න එක පාරටම දඩස් ගාල ඉස්සරහ දොර ඇරුණා. ඇතුලට ආවා මිනිහෙක්. ඒ මිනිහා හරි උසයි. කළුම කළුයි. ඇස් දෙක උඩුනෙන් තියෙන රතුපාට ගිනිඅඟුරු දෙකක් වගේ......"

"මොහොතක් ඉන්න," හෝම්ස් කතාවට බාධා කළේය. "ඔහු කළුම කළුයි කියල ඔබ අදහස් කළේ, ඔහු කළුම කළු ඇඳුමකින් සැරසී හිටියා කියන එක නේද?"

"ඔව් මහත්මයා, එහෙම වෙන්න ඇති. මට නම් දුටුව ගමන් හිතුණේ ඔහු මරණය වගේ කළුම කළුයි කියන එක විතරයි. ඔහුගේ කට ලේ රතු පාටයි. කට ඇරෙද්දී මං දැක්කා තාවෙ දෙපැත්තෙ දිග උල් දත්දෙකක්. ඔහු කෙළින්ම දොර ළඟ හිටගෙන, ඇහිපිය නොහෙල්ලා බලාගෙන හිටියා.

වොට්සන් නෝනට හොඳටම තරහ ගියා. ඇය හිටියේ රෑට අඳින ගවුම ඇඳලා. ඊට උඩින් කබායක් ඇඳගෙන. කබායේ දෙපැත්ත මැදට අඳින ගමන් ඇය ඇහුවා "තමුසේ කවුද? මෙහේට ආවෙ මොකටද?" කියලා.

එතකොට ඔහු හිනාවුණා. ඔහුගේ දිග උල් දත්දෙක මං දුටුවේ මේ වෙලාවෙ තමා.

"ඔබ මේරි වොට්සන් නේද?" ඔහු ඇහුවේ ගැඹුරු හඬින්. ඒ කටහඬට මගේ ඇඟ හිරිවැටුණා.

"ඔව්. මං මේරි වොට්සන් තමා. ඔයා කවුද?"

"ඔබේ සැමියා දොස්තර ජෝන් වොට්සන් නේද?" ඔහු ඇහුවා.

එතකොට ඇය භයවුණා. "මේ ජෝන් ගැන ආරංචියක්ද? ඇයි ඔහුට මොකක් හරි කරදරයක් වෙලාද? කෝ ඔහු?" එහෙම ඇසූ ඇය කාමරය හරහා දුවන්න පටන්ගත්තේ උඩතට්ටුවට යන්නයි. මෙන්න එතකොට අර මිනිහා ඉස්සරහට ආවේ ඇයට මඟ අවහිරකරමින්.

"තමුසෙ කවුද?". ඇය තවත් සැරයක් ඇහුවා.


http://sherlockholmesinvestigations.blogspot.com

"මේ හැන්දෑවෙ ඔබව ආරක්ෂකයාගෙන් කැඳවාගෙන යන්නෙ මං තමයි" ඔහු කිව්වා.

"මාව කැඳවාගෙන යන්න එහෙම ආරක්ෂකයෙක් මං ඉල්ලුවෙ නෑ" ඇය කිව්වා. "ඔහේ කවුද කියල මං දන්නෙත් නෑ. ඔහේ මගේ සැමියාගෙ යාළුවෙක් කියල මං විශ්වාස කරන්නෙත් නෑ. කෝ මගේ සැමියා? තමුසෙ මොකද ඔහුව කළේ?"

ඇය මෙහෙම කියල කෑගැහුවට අර මිනිහා උත්තරයක් දුන්නෙ නෑ. එතකොට වොට්සන් නෝනා මට කිව්වා: "බාටන් නෝනා, පොලීසිය කැඳවන්න"

ඔන්න එතකොට අර මිනිහා ආයින් හිනාවෙන්න පටන්ගත්තා. ඒ හිනාවෙ තිබුණෙ මහ මුසල හඬක්. එකපාරටම ඔහු හිනාව නැවැත්තුවා. ඔහුගේ මූහුණෙට ආවෙ බැරෑරුම් පෙනුමක්.

"මට තව ඉතිරිවෙලා තියෙන්නේ බොහොම ටික වෙලාවයි. මට හුඟක් දුර ගමනක් යන්න තියෙනවා" ඔහු කිව්වා. එහෙම කියල ඇගේ අතින් අල්ලාගත් ඔහු එකපාරටම ඇය ඇදල ගන්න උත්සාහ කළා.

පොලීසිය කැඳවන්න කියල මට කියමින්, වොට්සන් නෝනා විලාප තියල කෑගහන්න පටන්ගත්තා. මෙන්න ඔහු එක මොහොතකින් ඇයව ඉහළට ඔසවලා ගත්තෙ, බෝනික්කෙක් උස්සනවා වගේ පහසුවෙන්. ඇය ඔහුට දෙපයින් ගහමින් මරළතෝනි නැගුවා. ඔහු වොට්සන් නෝනාවත් අරගෙන එළියට බැස්සේ, මහ භයානක විධියට මා දිහා ඔරවලා බලමින්.

දෙස්තර මහත්තයා හිතාගන්නවා ඇති මං හරි බයගුල්ලෙක් කියල. මං ඇත්තෙන්ම ලේසියට භය වෙන කෙනෙක් නෙමෙයි. ඒත් ඒ වෙලාවෙ බිත්තියට හේත්තු වෙලා හිටි තැනින්, මට අඩියක් හොලවගන්න බැරුව ගියා. ඒ මිනිහාට තිබුණේ යක්ෂයාගේ ඇස්දෙකක්. අපායේ දැල්වුණු ගින්දර උගේ ඇස්දෙකේ මං දුටුවා. මං හිතුවා ඒ මොහොතේම මං මැරේවි කියලා.

වොට්සන් නෝනට ඒ වෙලාවෙම සිහිය නැතිවුණා. ඊළඟට ඔහු මට කථාකළේ සන්සුන් හඬකින්.

"දෙස්තර මහත්තයාට කියන්න, ඔහුත් ඔහුගේ මිත්‍රයාත් මා පිටිපස්සෙන් එළවන්නේ නැත්නම්, නෝනට කිසි කරදරයක් වෙන්නේ නැහැ කියලා. නමුත් ඔවුන් මා කියන දේ අහන්නේ නැතුව ආවොත්..........' ඇයට අත්වෙන ඉරණම............ මං ඒක



http://sherlockholmesinvestigations.blogspot.com

මතක් කරන්න උවමනා නැහැ. දෙස්තර වොට්සන් දන්නවා" ඊළඟට ඔහු තරප්පු පෙළ බැහැලා ගිහින් මීදුමත් එක්ක එකපාරටම නොපෙනී ගියා.

දෙස්තර මහත්තයා, මං හොඳටම භය වෙලයි හිටියේ. මං හිතුව ඔහු ආපහු ඇවිත් ඊළඟට මාව අරගෙන යාවි කියල. ඉතින් මං උඩ තට්ටුවට දුවල අල්මාරියක් ඇතුළේ හැංගුණා. දෙවියන් වහන්සේට ස්තුති වෙන්න මගේ ජීවිතේ බේරුණා. මහත්තයලට මේව කියල ඉවරවුණු ගමන් මං යනවා පල්ලියට. වොට්සන් නෝනාගේ ආත්මය වෙනුවෙන් මං දෙවියන් ඉදිරියේ ඇයට ඉටිපන්දමක් දල්වන්න ඕන. දෙවියන් වහන්සේ මගේ ජීවිතේ ගලවා දුන්නේ ඒකටයි"

"දෙයියෝ සාක්කි හෝම්ස්!" යැයි මා කෑගැසුණේ වියරුවෙන් මෙනි. "අර දුෂ්ට තිරිසනා මගේ බිරිඳ අරගෙන ගිහින්!"

"තවත් එක ප්‍රශ්නයක් තියෙනවා බාටන් නෝනා. ඔහු මීළඟට යන්නේ කොහේටද කියන එක ඔහු සඳහන් කළාද?"

"නෑ මහත්මයා" ඇය කීවාය. "ඒ වුණාට ඔහු මෙතැනින් පිටවී ගියාට පස්සේ මට ඇහුණා, රෝද හතරේ ලොකු අශ්වකරත්තයක, රෝදවල ගබ්දය. ඔහු ගියේ කිංස්-ක්‍රොස් පැත්තට"

"ඔබට ස්තුතියි බාටන් නෝනා. ඔබෙන් දැනගන්න ලැබුණු කරුණු අපට හුඟක් ප්‍රයෝජනවත්" හෝම්ස් කීය.

තවමත් වෙවුලමින් සිටි ඇය අපහසුවෙන් ඇවිදගෙන නිවසෙන් පිටවී ගියාය. බ්‍රැන්ඩි ඩිකැන්ටරය අතට ගත් හෝම්ස් අප දෙදෙනා වෙනුවෙන් වීදුරු දෙකට බ්‍රැන්ඩි ස්වල්පය බැගින් වත් කළේය.

"කවුන්ට් ඩ්‍රැකියුලා, කියන දේ කරන, කරන දේ කියන මිනිහෙක් කියල මං විශ්වාස කරනවා" මගේ මිතුරා කීවේ වීදුරුව අතට ගනිමිනි. "අපි ඔහු පසුපස එළවා ගියේ නැත්නම්, ඔහු වොට්සන් මහත්මිය නිදහස් කර ආපහු එවාවි. ඒකෙ සැකයක් නෑ."

"එතකොට ඊට පස්සෙ?" මම ඇසීමි. "මගේ බිරිඳ නිදහස් කරල එවල ඔහු ඊළඟට තවත් කාගෙ හරි බිරිඳක් පැහැරගෙන යාවි. මෙකට අපට ඉඩ දෙන්න බෑ හෝම්ස්. මේ බිහිසුණු යක්ෂයාට මේ විදියට අපරාධකරන්න ඉඩ දෙන්න, අපට කොහොමටවත් බෑ. ඔහු මිහිපිට ඉතුරු කළයුතු කෙනෙක් නෙමෙයි. භයානක විෂඝෝර සර්පයෙක් මරා දමනවා වගේ ඔහු විනාශ කළ යුතුයි. ඒකට අපට



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ දෙපිය [illegible] එයාගෙම මොකක් වුණත් කමක් නැහැ."

"ඒ සිද්ධියෙන් [illegible] අහිමිවුණත් කමක් නැද්ද?"

[illegible] කරගැනීම සඳහා මට තත්පර කිහිපයක් අවශ්‍ය විය. "[illegible] නෑ."

මා [illegible] ඇගේ උරහිසට තට්ටුකළේ සිනාමුසු මුහුණෙනි.

"[illegible] වොට්සන්මයි. ඔබේ [illegible] ඉතින් මං කොහොමද ඒ [illegible] ඉල්ලන්න?" බරන්ඩ් වීදුරුව [illegible]

"අපි [illegible] ආපසු භාරදෙමු. නිකම් [illegible] නැතිගයක් නැටියට, හොඳ මස් කුට්ටියක් සමගින්. [illegible] කිංස්ක්‍රොස් දුම්රිය පොළට. මේ [illegible] වෙන එකක් වෙන්න තවමත් ඉඩක් නැහැ."

අපි [illegible] අසලින් ගමන් කළෙමු. ඇගේ නිවසේ කිසිදු [illegible] දැල්වී තිබිණි.

"ඇය [illegible] වොට්සන් මහත්මිය වෙනුවෙන් ඉටිපන්දමක් දල්වන්න," [illegible] කීය. "හොඳ ආගම භක්තියක් ඇති කාන්තාවක්."

"මං විශ්වාස කරනවා ඇය අපි දෙන්නා වෙනුවෙනුත් ඉටිපන්දම් දල්වාවි කියලා," මම කීවෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

# 11

## වැම්පයර්ගේ අඩ්ඩාරේ

ෂර්මන් මහතාට ටෝබි භාරදීමෙන් පසු අපි කුලීරියක නැගී කිංස්ක්‍රොස් දුම්රියපොළ බලා පිටත්වූයෙමු. අප හැකි ඉක්මනින් යායුතු බවට හෝම්ස් රියැදුරාට උපදෙස් දුන්නේ නැත. මගේ බිරිඳ සිටින්නේ ජීවිතය හා මරණය අතර තත්ත්වයකය. එසේ නම් අප මෙලෙස ප්‍රමාදවෙමින් ගමන් කරන්නේ ඇයි? කිසිදු හදිසියක් නොමැතිව අශ්වයාව උවමනා වේගයෙන්? එය මට තේරුම් ගැනීමට අපහසුවිණි.

"අපි හැකි වේගයෙන් බ්‍රැක්ලියුලා ලුහුබඳින බව ඔහු දැනගත්තොත්, වොට්සන් මහත්මියගේ ඉරණම ඒකෙන්ම තීන්දුවේවි" හෝම්ස් කීය. "සැකකාරයෙකු ලුහුබැඳ යාම ඕන මෝඩයෙකුට කරන්න පුළුවනි. ස්කොට්ලන්ඩ් යාඩ් එකේ පොලිස් නිලධරයන් ඒ බව අපට කිහිපවතාවක්ම පෙන්වලා තියෙනවා. නියම දක්ෂකම කියන්නේ අපරාධකාරයාට නොදැනෙන්න, නොතේරෙන්න ලුහුබැඳයාම. ඒකයි නියම ශාස්ත්‍රය. ඒත් බොහොම අවදානම් වැඩෙත් ඒකයි. බ්‍රැක්ලියුලා මේ වෙනකොට, ඔබේ බිරිඳත් රැගෙන දුම්රියකට නැගල හොඳ පෝලිසියෙන් ඇති. ඒ අපි, ඔහු ලුහුබැඳ එනවද කියල බලන්න. ඒ දුම්රිය පිටත්වෙන්න කලින් අපි දුම්රියපොළේ වේදිකාවට ළඟාවුණොත්? එහෙම වුණොත් සහතිකයි, ඔබේ බිරිඳ අවලංගු කාසියක් තරමට වත් වටින්නේ නැතිව යනවා" හෝම්ස් මගේ අත ගෙන දැඩිව ග්‍රහණය කළේ මා සනසන අයුරෙනි. "හිතට ධෛර්යය ගන්න මිත්‍රයා. කරන්න පුළුවන් හැම දෙයක්ම අපි මේ මොහොතේ කරමිනුයි ඉන්නේ"

කිංස්ක්‍රොස් දුම්රියපොළට ළඟාවූ පසු අපි දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කරන නිලධරයන් කිහිපදෙනෙකුට කථා කළෙමු. එයින් තුන්වැන්නාට යමක් මතක තිබිණ. අසාමාන්‍ය ලෙස හැසිරුණු උස මහත්මයෙකුට, විට්බි නගරය කරා යාමට ටිකට්පතක් තමා විකිණු



http://sherlockholmesinvestigations.blogspot.com

බව නිලධරයා කීය. එහෙත් මෙරිලෙග් හැඩරුව ඇති කාන්තාවක් ඒ මහතා සමග සිටි බව දුම්රිය නිලධරයාට මතක නොතිබිණ.

"ඔය කියන උස මහත්මයා ළඟ තිබුණු බඩුබාහිරාදිය ගැන ඔබට මොකුත් මතකද?"

"ආ ඔව්" නිලධරයා කීය. "ඔහු ළඟ තිබුණා දිග ලී පෙට්ටියක්. ඒක පැටෙව්වේ ඒ දුම්රියේම තිබුණු බඩු පෙට්ටියට. ඒක හරි බර එකක් බව මට පෙනුණා. ඒ මොකද, මිනිසුන් තුන්දෙනෙක් උවමනා වුණා, ඒක ඔසවන්න."

"විට්බි බලා යන ඊළඟ දුම්රිය පිටත්වෙන්නෙ කීයටද?" හෝම්ස් විමසුවේය.

නිලධරයා දුම්රිය කාල සටහන පිරික්සා බැලීය.

"දිගටම විට්බි පනුකරයන දුම්රියක් අද නම් නැහැ." ඔහු කීය. "ඔබට උවමනා නම් හෙට උදේ පාන්දර හයට තියෙනවා දුම්රියක්. ඒක යන්නේත් වෙස්ටර් වලට විතරයි. වෙස්ටර් වලින් තවත් දුම්රියක නැගිලා විට්බි බලා යන්න වෙනවා"

"ඒක අපට ප්‍රමාද වැඩියි වොට්සන්" කී හෝම්ස්ගේ මුහුණේ තිබුණේ කැලඹීමට පත් ලකුණුය. "මං හිතූ එක හරි. ඔහු ඇයව ගෙනියන්නේ අර පෙට්ටිය ඇතුළෙ දාල වහල!"

මගේ හිතේ ඇතිවූයේ දරාගත නොහැකි ශෝකයකි. ඉතා සියුමැලි සිරුරක් ඇති මගේ බිරිඳ, අර අධම පාපිෂ්ඨයා මව් රටෙන් ගෙනා අපිරිසිදු පස්පෙට්ටියක දමා වසා? ඒ ගැන සිතන විටත් මගේ සිත වාවාගත නොහැකි විය.

"හෝම්ස්. ඔබ තවත් මොනව කරන්නද බලාගෙන ඉන්නේ?" මට උස් හඬින් කෑගැසිණ. "දැන් වෙලාව රෑ දහයයි. ඒ දුෂ්ටයා අපව පරාජය කරමින් පිටත්වෙලා ගිහිනුත් ඉවරයි. අපට ඔහු පිටුපස යා හැකි ක්‍රමයක් වත් නැහැ."

"ටිකක් ඉවසන්න වොට්සන්. මේ නගරයේ ඉන්නවා දුම්රියක වේගයට වැඩි වේගයකින් අශ්වකරත්තයක් පදවාගෙන යා හැකි රියැදුරෙක්. ඔහුගේ නම සීසර්. ඔහු තමා හාකර් මහත්මිය ආ දුම්රිය අල්ලන්න අපට උදව් කළේ. ඔහුගේ උදව් අපට ලැබෙන බව මට විශ්වාසයි. ඩ්‍රැකියුලා දුම්රියෙන් බහින්න කලින් විට්බි වෙත ගිහින් ඔහුව අත්අඩංගුවට ගන්න අපට හැකිවේවි"

"ඒ වුණත් අපට හැකිවේවිද ඉක්මනට සීසර් හොයාගන්න?"



http://sherlockholmesinvestigations.blogspot.com

"බේකර් වීථියේ අවිධිමත් රහස් පරීක්ෂකයන්ට ඒ වැඩේ භාර දුන්නාම, ඔවුන් සීසර් කැඳවාගෙන එවි."

අපි වහාම බේකර් වීථිය බලා පිටත්ව ගියෙමු. වීථියේ ගමන් කළේ රථවාහන ඉතා ස්වල්පයක් පමණි. හිඟන කොලු රළ පාර මැදට වී ක්‍රීඩාවක යෙදී සිටියහ. ඔවුන් එකෙකු හෝම්ස්ගේ ඔත්තුකාර සේවයේ සිම්සන් බව මම හඳුනාගත්තෙමි. අප අශ්වකරත්තයෙන් බසිනු දුටු වහාම ඔහු බිරුමෙන් පිටගෙන ආචාර කළේ, හමුදා භටයෙකුගේ ආචාර විලාසයෙනි. පොදු රැළේ සෙසු අය ද අත් ඉහළට ඔසවා ආචාරය ප්‍රදානය කළහ.

"තමුසෙලාගෙ කණ්ඩායමේ ඔක්කොම මෙතැන ඉන්නවා නේද සිම්සන්?" හෝම්ස් ඇසීය. "මට වහාම උවමනායි සීසර් කියන අශ්වකරත්ත රියැදුරාගේ ඉස්වය. ඔහුගේ කොස්සෑවට දිගයි; බාගෙට පැහිලා. කරත්තයේ එහෙළ නැමිල පවත්වලා. පැය භාගයක් ඇතුළත ඔහුව මෙතැනට කැඳවාගෙන ආවොත්, තුමුන් එකෙක් තෑගියක් ලැබෙනවා. විසිර යා!"

තම අණදෙන නිලධාරියාගේ අණට කීකරු වූ කොලුවෝ හයදෙනා වහා දිවගියහ.

"හොඳ කොල්ලෝ. උන් කොහොමහරි මිනිහව හොයාගෙන ඒවි" හෝම්ස් කීය.

අපි අපේ නිවහනට ගොස්, කොයි මොහොතක හෝ පිටත්වීමට සූදානමෙන් බලාසිටියෙමු. මා විසිත්ත කාමරයේ ඉහළ පහළ සක්මන් කළේ නොඉවසිල්ලෙනි. මිනිත්තු දහයක් පහළොවක් ගතවී ගියේය. සීසර්ගේ කිසිදු පෙනුමක් නැත. මගේ සිතේ තිබූ අසහනය වඩාත් උග්‍රවිණි. මා මිනිත්තු විස්සක් ගෙවාගත්තේ ඉතා අමාරුවෙනි. ඒ මොහොතේ අශ්ව කරත්තයක් අපේ නිවහන ඉදිරිපිටට පැමිණ නැවැත්වූ බව මම ඇසුවෙමි. වැරහැලි හැඳගත් කොලුවෙක් අශ්වකරත්තයෙන් බැස, අපේ දොරටුව වෙත දිව එන අයුරු මම දුටුවෙමි.

"ඔය එන්නේ සිම්සන්" මට හඬනගා කියැවිණි. මගේ කබාය හා හිස්වැස්ම මගේ අතට ගැනුණේ නිරායාසයෙනි.

නින්දට යාමට සූදානම් වෙමින් සිටි හඩ්සන් මහත්මියගෙන් හෝම්ස් කෝපි පෝච්චියක් ඉල්ලා සිටියේ, මීට පැය කාලකට පමණ පෙරය. ඇය කෝපි පිළියෙළ කිරීමෙහි නිරතව සිටියාය. වැරහැලි හැඳගත් කොලුවෙකු අපේ දොර ඇරගෙන තරප්පු පෙළ



http://sherlockholmesinvestigations.blogspot.com

ඉහළට දිව එන අසුරු ඇය දකින්නට ඇත. හඩ්සන් මහත්මිය කොස්සක් ද රැගෙන තරප්පු පෙළ පාමුලට ආවේ කොලුවා පන්නා දැමීමේ අරමුණෙනි. ඔහු පැමිණියේ තමාව උදව් කිරීමට යයි පවසා, හඩ්සන් මහත්මිය ආපසු යැවීමට හෝම්ස් සමත් විය. "බොහොම හොඳයි සිම්සන්" කී මගේ මිතුරා සාක්කුවෙන් කාසි අනූරක් ගෙන කොලුවාගේ දෑතට අත හැරියේය. "තමුසෙට තුට්ටුන් එකයි. අනික් අයට සිලිමක් ගණනේ තියෙනවා. ශුභ සන්ධ්‍යාවක් සීසර්. ඔබට මතක ඇති අපව?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. ඔබට යන්ඩ ඕනෙ කොහේටද? මට දැනගන්න ඕනෙ එච්චරයි"

"විට්බි!"

"එම වචනය ඇසූ සැණින් සීසර්ගේ ඇහිබැම ඉහළ ගියේය. "ඈයි මහත්මයා විට්බි හුඟක් ඈතයි නේ. ඒ ගමනට සම්පූර්ණ දවසක් ගතවේවි. මගේ අශ්වයෝ දෙන්නත් මං වගේම හුඟක් වයසයි. ඔය තරම් දුර, අමාරු ගමනක්.........."

සීසර් යටි තොල ඉදිරියට දිගුකොට නළල රැලිකරගත්තේය.

"මෙකෙන් ගමන පහසුවේවිද?" සාක්කුවෙන් රත්රන් පවුමක් ගත් හෝම්ස් එය තම අත්ල මත තබා ඉදිරියට දිගු කළේය. තම අත ඒ දෙසට දිගු කොට කාසිය ඩැහැගත් රියැදුරා කීවේ "මං සූදානම්, අපි යමු වහාම" යනුවෙනි.

"මේ පරීක්ෂණයට අපට හරියට සල්ලි වියදම් වෙනව වොට්සන්." හෝම්ස් කීවේ අශ්වකරත්තය මීදුමෙන් වැසුණු වීථි මැදින් ඉදිරියට ඇදෙද්දීය. "ඒ වුණත් මං භය නැතුව කියන්නම්, ඩ්‍රැකියුලා විනාශ කරන්න අපට හැකිවුණොත්? ඔව් ඒක අපට ලැබෙන මහා තෑග්ගක් වගේ වේවි. ඒ තෑග්ග අපට වටිනවා, යන වියදම් ඔක්කොටම වඩා."

අප ලන්ඩන් සිට විට්බි දක්වා අශ්වකරත්තයෙන් ගිය ගමන ගැන විස්තර, ඔබ ඉදිරියේ තැබීමට මම බලාපොරොත්තු නොවෙමි. එම ගමනෙන් මා අධික වෙහෙසකට පත්වූ බව නම් සඳහන් කළ යුතුය. අතරමගදී අප රථය නැවැත්වූයේ තුන්වරක් පමණි. ඒ විඩාපත් අශ්වයන් මාරුකිරීමටය. එය සිදුවන අතරේ අපි කෑම ගැනීම ද සිදුකර මඳ විවේකයක් ද ගත්තෙමු. නාඳුනන අශ්වකරත්ත වලට මාරු කිරීම සඳහා අසුන් දීමට, සමහර අසුන් හිමියෝ අකැමැත්ත



http://sherlockholmesinvestigations.blogspot.com

පළකළහ. එහෙත් හෝම්ස් නොඉවසුරුව රිදී කාසි දිගු කළ නිසා ඒ බාධාව මගහැර ගැනීමට හැකි විය.

විට්බි දක්වා ගමන්මග ඕසර් හොඳින් දැන සිටි බැව් පෙනිණ. නැගෙනහිර වෙරළ තීරයේ පැවැති මීදුම නිසා, පාර පවා දැකගැනීමට හැකි වූයේ යන්තමිනි. හැරී යායුතු මංසන්ධි වලදී යායුතු දිශාව නිශ්චය කර ගැනීම, ඉතාමු අපහසු කරුණක් වන්නට ඉඩ තිබිණ. එහෙත් මාර්ගය ගැන හොඳ වැටහීමක් හා පළපුරුද්දක් තිබූ රියැදුරාට, මේ කිසිවක් ගැටලු වූයේ නැත. ප්‍රධාන මාර්ගයේ නොගොස්, ඒ දුර අඩු කර ගැනීමට යොදා ගත හැකි කෙටි පාරවල් ගැන ද ඔහු දැන සිටියේය. ඒ මේ අතට වැලි සහිත බොරලු පාරවල්, පටු මාර්ග හා කඳු බෑවුම් ඔස්සේ ඔහු රිය පැදවූයේ විවේකයක් ගැන නොසිතමිනි. ඊළඟ දවසේ මැදියම් රාත්‍රිය වෙද්දී එනම් ඔක්තෝබර් 4 වැනිදා වනවිට අපි මුහුදුබඩ නගරයකට ළඟාවෙමින් සිටියෙමු. ඒ බව මා තේරුම් ගත්තේ, එහි තිබූ වැරදිය නොහැකි මාළු පිළිගඳ නිසාය. මේ සම්පූර්ණ දුරම අශ්වයෙකු පිට පැමිණියාක් මෙන් අධික ගමන් වෙහෙසක් මට දැනිණ.

"මං දන්නේ නෑ මහත්තයෝ, මං අතින් මහත්තයාගෙ කටයුතු අවුල්වුණාද කියල" රියැදුරා කීවේ විට්බි දුම්රියපොළ ඉදිරියේ රිය නවත්වමිනි. "මේ යක්ෂ මීදුම නොවෙන්න, ඊට පැය ගණනාවකට කලින් මං ඔබ මෙහාට ගෙනැත් දාන්නෙ."

"ඒ ගැන ඔබට කණගාටුවෙන්න දෙයක් නෑ" හෝම්ස් රියැදුරාගේ අත උණුසුම් අයුරින් ග්‍රහණය කරගෙන පැවසුවේය.

"අපි හොයන පුද්ගලයා මෙතැනින් ගියේ කොතැනටද කියන එක මං හිතන්නේ අපි දන්නවා. ඔන්න ඔබට තවත් අමතර පවුමක්. කාමරයක් කුලියට අරගෙන අද රෑට මෙහේ නවතින්න. හෙට උදේම පුළුවන් ලන්ඩනය බලා පිටත්වෙන්න"

"මුදල් එපා හෝම්ස් මහත්මයා" රියැදුරා කීවේ ඔහුගේ හිස සොලවමිනි. "හෙට උදේ අටට මං මෙතැනට එන්නම්. මහත්තයල ආපහු ලන්ඩන් යනවා නම් මං එක්ක යන්නම්. ශුභ රාත්‍රියක් මහත්වරුනි" රේන්ස් පටිය සොලවා අසුට සංඥාවක් කළ ඔහු, මුහුද අයිනේ වූ හෝටලයක් දෙසට රිය පදවාගෙන ගියේය.

"දැන් අපි මොකද කරන්නේ?" මා ඇසුවේ තරමක් නොසතුටු හඬෙනි. ලන්ඩනයේ සිට ආ දිගු දුෂ්කර ගමනේදීවත්, මගේ සිතේ ඇතිවූ හැඟීම සතුටුදායක පැත්තට නොහැරිණි.



http://sherlockholmesinvestigations.blogspot.com

"අපි යමු නැව් කටයුතු කාර්යාලයට" මගේ මිත්‍රයා කීය. "ඩ්රැකියුලා නොවරදවාම යන්න ඇත්තේ, නැවේ ගමනට කාමරයක් වෙන්කරවා ගන්න. ඒ ගමන්ම ඔහුගේ ලී පෙට්ටියත් ගෙනියන්න ඇති.ව ඒ නැවට පැටවීම ගැන උපදෙස් දීලා මුදල් ගෙවන්න. එතැන නාට හරි ඩ්රැකියුලා ගැන මතක තියේවි."

නාවික කටයුතු කාර්යාල හැම එකක්ම පාහේ වසා තිබිණි. එහෙත් එකක පමණක් ඇතුළත ආලෝකය දැල්වෙන බව, දොරට උඩින් පිහිටි වීදුරුවකින් අපි දුටුවෙමු. කිහිපවරක් දොරට තට්ටු කළත් එය නොහැරිණි. අපි නොනවත්වාම තට්ටු කරද්දී ඇතුළත සිටි කිසිවෙක් අපට බැණ වැදුණේය. අන්තිමේදී අපෙන් ගැලවීමක් නොමැති බව වටහාගත් ඔහු දොර හැරියේය. තට්ට හිසක් තිබූ මිටි තරබාරු පුද්ගලයෙකු වූ ඔහු අප වෙත හෙළුවේ සැකය මුසු බැල්මකි.

"කාර්යාලය වහලා. වැඩක් කරගන්න ඕන නම් එනවා සඳුදා උදේට!" කී ඔහු 'දබස්' ගා දොරවසා දැම්මේය.

සුසුමක් හෙළූ හෝම්ස් සාක්කුවට අත දමා තුට්ටුන් භාගයේ කාසියක් අතට ගත්තේය. ඔහුගේ කාසි සාක්කුව ද දැන් බොහෝ දුරට හිස්වී ඇති බව මම දැනසිටියෙමි. දොරේ පහත, එය හා සිමෙන්තිය අතර වූ සිදුරෙන් හෝම්ස් කාසිය ඇතුළට තල්ලු කළේය. ඉන්ද්‍රජාලයකින් මෙන් යළිත් වරක් දොර විවෘත විය. මෙවර අප වෙත යොමු වූයේ මිත්‍රශීලී මුහුණකි.

"මහත්වරුනි. එන්න ඇතුළට" ලිපිකරුවා කීය.

එය ඉතා කුඩා කාමරයක් විය. එහි තිබූ එකම වැදගත් භාණ්ඩය වූයේ ලී මේසයක් බව මම දුටුවෙමි. ඉඩ තිබූ හැම තැනකම පොත්, ලිපිගොනු හා මිටිබැඳ තිබූ කඩදාසි වලින් පිරී ගොසිනි. මේසය පිටුපස වූ පුටුවේ හිඳගත් ලිපිකරු අප දෙස බැල්මක් හෙළාගෙන සිටියේය. "මේ මහත්වරුන්ට මොනවද මගෙන් කෙරෙන්න ඕන?"

අප සොයන පුද්ගලයා පිළිබඳවත් ඔහු සතුව තිබූ ලී පෙට්ටිය ගැනත් විස්තරයක් කළ හෝම්ස්, එම තැනැත්තා ගැන ලිපිකරුට මතක තිබේද යන්න විමසුවේය. ඔහු හිස මදක් ඉදිරියට නමාගෙන කල්පනා කළේය.

"මට නම් එහෙම කෙනෙක් ගැන මතකයක් නැහැ........... මිනිත්තුවක් ඔහොම ඉන්න" කී ඔහු පිටිපසට නැමී බිත්තියේ වසා



http://sherlockholmesinvestigations.blogspot.com

තිබූ ජනේලයක් විවෘත කළේය. එය විවෘත වූයේ, නැවට පටවන බඩු ගබඩා කරන වාප්පු අංගයට බව මම තේරුම් ගතිමි.

"ක්ලැන්සි!" ලිපිකරු කෑගැසීය. "මෙහාට එනවකෝ වැඩකට" කී ඔහු ජනේලය වසාදැම්මේය.

"පහුගිය අවුරුදු හතළිහ තිස්සේම මේ පැත්තෙන් නැවට බඩු පැටෙව්වේ ක්ලැන්සි. ඔහේලා හොයන මිනිහා මෙහේට ආව නම් ක්ලැන්සි දකින්න ඇති"

ලිපිකරුවාගේ කැඳවීම අනුව එතැනට පැමිණියේ, අපට වයසක් අනුමාන කිරීමට අපහසු වූ, එකැසත් අන්ධ, සිරුර කේඩෑරි වී ගිය තැනැත්තෙකි. ඔහුගේ දකුණු හක්කේ ගුලියක් මෙන් එළියට ඉල්පුණු තැනක් විය. මේ නාවිකයන් නිතර හැපීමට ගන්නා දුම්කොළ කැබැල්ලක හපයක් වියයුතු යයි මම අනුමාන කළෙමි. කාමරයට ඇතුළුවී දොර වසා දැමූ ඔහු, අප දෙදෙනා දෙස හෙළුවේ විමසිලිමත් බැල්මකි.

ලිපිකරුවාට ඩ්‍රැකියුලා ගැන කළ විස්තරය යළිත් වරක් කියූ හෝම්ස්, එවැනි පුද්ගලයෙකු දුටුවේද යන්න ක්ලැන්සිගෙන් විමසුවේය. ඔහු යමක් කීමට මැලි බවක් දැක්වූ නිසා කාසියක් අතින් අත මාරු කිරීමට හෝම්ස්ට සිදුවිණි. වාසියක් ඇතිවුණු වහාම ක්ලැන්සි ගිරවෙකු මෙන් දොඩවීමට පටන්ගත්තේය.

"මහත්තයා ඔය කියන විදියේ මිනිහෙක් මං ඊයේ රෑ දුටුවා. මං හිටියේ මගේ පයිප්පය උර උරා, එළියෙ බඩු පෙට්ටියක් උඩ වාඩිවෙලා. ඒ මිනිහා ආවෙ අශ්වකරත්තයක් දක්කාගෙන. ටිකක් ඈතින් කරත්තෙ නවත්වලා ඒ මිනිහා බිමට පැන්නා. ඔහු මුලින්ම ගියේ වෙනත් නාවික කටයුතු කාර්යාලයකට. එක පාරට මෙහේට ආවෙ නෑ. මිනිත්තු පහකට පස්සෙ ඔහු ආපහු ඇවිත් කරත්තෙට නගින හැටි මං දුටුවා. ඒ ගමන කරත්තය ඉස්සරහට දක්කාගෙන ඇවිත්, මේ කන්තෝරුව ඉස්සරහ කරත්තෙ නැවැත්තුවා. නවත්වල මගේ අතට රන් කාසියකුත් දුන්නා, මට කිව්වා ඔහුගේ කරත්තයේ පිටිපස්සේ ලී පෙට්ටියක් තියෙන බවත්, ඒ පෙට්ටිය "සරීනා කැතරින්" කියන රුවල් නැවට පැටවීමට තියෙනවා කියලත්. ඒක මේ ළඟම නැංගුරම් දාල තියෙන නැවක්.

මේ මිනිහගේ පෙනුමයි කතාකළ පිළිවෙළයි මට එච්චර ඇල්ලුවේ නෑ. ඒ මොනවා වුණත් මිනිහා දුන්නු රන් කාසිය ඇත්ත



http://sherlockholmesinvestigations.blogspot.com

රත්තරන් වගෙයි මට පෙනුනේ. ඉතින් මං වාඩිවෙලා හිටි තැනින් බිමට බැස්සා. බැහැලා ගියා ලී පෙට්ටිය පටවන වැඩේට. ඒ පෙට්ටිය හරි බර එකක් මහත්තයෝ. ඒක උස්සන්න මිනිස්සු තුන් දෙනෙක් ඕනවුණා. පෙට්ටිය උස්සාගෙන ගිහිං නැවේ, බඩු ගබඩාවට දමන්න පැය කාලකට වැඩිය ගියා. අපි කරපු හැම දෙයක් ගැනම ඒ මිනිහා හරි සෝදිසියෙන් හිටියේ. ඒ වුණත් ටික වෙලාවකට පස්සේ ඇවිත් බලද්දි කොටද මිනිහා කොහේ ගිහින්ද කියල නෑ. දැනුත් මං ඒ ගැනයි කල්පනා කර හිටියේ. ඒ ඉන්න කොට තමයි මේ කන්තෝරුවට ආවා කලේ හරි පුදුම වැඩක් නේ. මිනිහෙක් කොහොමද ඒ තරම් ඉක්මනට අන්තර්ධාන වෙන්නේ?"

"සරිනා කැතරින්" කෙමන්ඩුරාන්ගෙන් මොන රටක මොන වරායටද?" හෝම්ස් ලිපිකරුවාගෙන් විමසුවේය.

ලිපිකරුවා මේසය මත වූ ලිපිගොනුවක් පෙරලා බැලීය. "සරිනා කැතරින් යන්නේ කළුමුහුදේ තිබෙන වාර්නා වරායට. හෙට උදේ......... ඒ කියන්නේ අද එළිවෙන පාන්දර අටට නැව පිටත් වෙනවා"

"වාර්නා?" මට කෑගැසිණ. "හෝම්ස් ඩෙමිටර් නැව ආවෙත් වාර්නා වල ඉඳල නේද?"

"මේ නැව නැංගුරම් දාල තියෙන්නේ කොහේද?" හෝම්ස් විමසුවේය.

"මේ ළඟ. ක්ලැන්සි. මේ මහත්තුරු එක්ක ගෙන ගිහින් නැව පෙන්වන්න." කී ලිපිකරුගේ මුහුණේ මතුවුණේ කුතුහලයක ලකුණුය. "ඇයි මේ මිනිහා මිත වෙලා තියෙන්නේ? මොනව හරි බඩු හොරෙන් පිටරට පටවන එකකටද?"

"ඔව්. බලාගෙන ගියාම මෙහෙ, බඩු හොරෙන් රට පැටවීමක් තමා" කී හෝම්ස් සේවකයාගේ අතින් ඇදගෙන මිදුලට බැස්සේය.

තවමත් වරාය වසාගෙන තිබුණේ අන්ධකාරය සහ මීදුමකි. නැවේ රුවල් සියල්ල හකුළා තිබිණි. කුඹගස් සමග එය අඩඅඳුරේ දිස්වූයේ යෝධ පෞරාණික සතෙකුගේ ඇටසැකිල්ලක් විලසිනි. සුළං පහර සමග ආ රැල්ල සමග නැව පැද්දෙමින් තිබිණි. එවිට නැව් තට්ටුවේ ලෑලි වලින් හා ගැට ගසා තිබූ කඹ වලින් "ක්‍රීක් ක්‍රීක්" ශබ්දයක් නිකුත්විය. මට එක්වරම සිහිවූයේ ඩෙමිටර් නෞකාවේ අප දුටු බියකරු දර්ශනයයි. ඩ්‍රැකියුලා යන හැමතැනකටම



http://sherlockholmesinvestigations.blogspot.com

අස්වාභාවික ලෙස මෙලෙස මීදුම ගලා ඒම ඔහුගේ හපන්කමක්ද? මම ඒ ගැන කල්පනා කළෙමි. ක්ලැන්සි දිගටම ජැටිය මත රැඳී සිටියේය. නැවට නැගීමේ අරමුණෙන් අපි නැව වෙත දමා තිබූ ලී පාලම වෙත ගියෙමු. ඇතදීම අපට දකින්නට ලැබුණේ, අපිරිසිදු නාවික ඇඳුමකින් සැරසුණු, පුළුල් උරහිස් තිබූ නාවිකයෙකි. ඔහු මුහුද දෙස බලාගෙන සිටියේය. ඔහුගේ මුවේ දල්වාගත් සුරුට්ටුවක් ද විය. අපි තවදුරටත් ඉදිරියට නොගොස් එතැනම නැවතුණෙමු.

"මේ නැවේ කපිතාන් වෙන්න ඇති. ගොඩබිම ගැවසෙන මිනිස්සු ඔහුගේ නැව ආක්‍රමණය කරනවාට ඔහු කැමැති වෙන්නේ නෑ." හෝම්ස් කීවේ මගේ කනට කොඳුරමිනි. "මා ළඟින්ම ඉන්න වොට්සන්. මිනිහව බොරුවෙන් රවටාන්නෙ නැතුව, අපේ අරමුණ ඉටුකරගන්න බැහැ"

අප ඒ දෙසට ගමන්කළ හඬ නාවිකයාට ඇසෙන්නට ඇත. ඔහු ආපසු හැරී බැලුවේය. මීළඟට ඔහු ඉදිරියට ආවේ, අපට නැවට පිවිසීමට නොහැකි වන පරිද්දෙන් පාලම අවහිර කරමිනි.

"අද රෑට කිසිම කෙනෙකුට නැවට ඇතුළුවීම තහනම්" ඔහු කීවේ අනතුරු ඇඟවීමක විලාසයෙනි. "කැමැති නම් හෙට උදේට ඇවිත් බලන්න"

හැඩිදැඩි සිරුරක් තිබූ ඔහුගේ මුහුණේ, කැළැල් රාශියක් මම දුටුවෙමි. ඒ නිතර සණ්ඩුසරුවල් වලට සහභාගී වීමෙන් ඇතිවූ සලකුණු බව මට තේරුම් ගත හැකි විය.

"බොහොම හොඳයි" හෝම්ස් කීවේ නිලධරයෙකුගේ විධායක කටහඬක් ආරූඪ කරගනිමිනි. "සර්, කැතරින් නැවේ කාර්ය මණ්ඩලය, නැවේ ආරක්ෂාව ගැන හොඳ සෝදිසියකින් ඉන්න බවයි පෙනෙන්නේ. ඒ පිළිවෙළ ඉතාම හොඳයි. ඒක අනෙක් සේවකයන්ටත් ආදර්ශයක්. වරාය අධිකාරියේ අපට පුළුවනි ඔවුන් ඒ ගැන දැනුවත් කරන්න"

"ඔබ වරාය අධිකාරියෙන්ද?" නාවිකයා විමසුවේ හොරැහින් හෝම්ස් දෙස බලමිනි. ඔහුගේ හිතේ සැකයක් ඇතිවූ බැව් පෙනිණ.

දකුණු අතේ දබරැඟිල්ල තම නළල මත තැබූ හෝම්ස් සංඥාවක් කළේය. "අපි මේ වරායෙ ඉන්න හැම දෙනෙකුටම ඒ බව දැනගන්න ඉඩතියන්න හොඳ නෑ" හෝම්ස් කීය. "ටිකක් රහසිගතව කළ යුතු වැඩක්. මටත් මගේ මිත්‍රයාටත් යෙදෙන්න තියෙන රාජකාරියේ අප්‍රසන්න බව කාටත් කියන්නෙ මොකටද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"මං කලින් දැකල තියෙන වරායේ නිලධරයන්ට වඩා ඔබේ පෙනුම වෙනස්. ඒ මොකද?"

"ඔබට පෙනෙන්නේ එහෙමද?" හෝම්ස් ඇසීය. "වරායේ නිලධරයන් මොන වගේ පෙනුමක් තියෙන අයද කියල මට කියන්න."

මෙයට නාවිකයාගෙන් පිළිතුරක් නොලැබුණු විට, හෝම්ස් දිගටම කථාකළේය. "මේක අපේ රටේ වැදගත් වී ඇති ප්‍රශ්නයක්. ඔබ අපට අවහිර නොකොළොත්, මේ ආරවුල පහසුවෙන්ම විසඳාගන්න අපට හැකිවේවි. ඔබ අපට අවහිර කළොත් මට කියන්න වෙන්නේ මොකක්ද දන්නවද? තමන්ගේ දේශයටත් මහරැජිනටත් විරුද්ධ රුසියන් රුවල් නැවක් උකුම්ය කියල හිතන නාවිකයනුත්, අපේ රටේ ඉන්නා බව. පත්තරකාරයින්ට මේ වගේ ආරංචියක් ලැබුණොත් කොහොමට හිටීවිද? එහෙම උණොත් පත්තරවල මුල් පිටුවේ, ලොකු අකුරෙන් වැටෙන ඒව ගැන මං හිතන්නවත් කැමැති නෑ."

හෝම්ස්ගේ මෙම කථාවෙන් හැඩිදැඩි පුද්ගලයාගේ ආකල්පය වෙනස් වූ බව පෙනිණ. "මහත්මයා. ඔබ දැනගත්තොත් හොඳයි. මම අපේ රාජකීය නාවික හමුදාවට බැඳිලා ඉන්දියාවේ රාජකාරි කළ කෙනෙක්. වික්ටෝරියා මහරැජිනටත්, යූනියන් ජැක් කොඩියටත්, මේ නෙඩ් බ්‍රිජර් විතර පක්ෂපාත වෙන කිසිඑකෙක් හොයන්න බෑ. රුසියන්කාරයො එක්ක යාත්‍රාකළාට, මමත් හොඳ ඉංග්‍රීසි ජාතිකයෙක්. ඔබට උවමනා රාජකාරිය මොකක්ද කියලා මට කියන්න. එතකොට මං පෙන්වන්නම්, මං මගේ රටට මොනතරම් ආදරේ මිනිහෙක්ද කියල."

හෝම්ස් තත්පර කිහිපයක් කල්පනා කළ බැව් පෙනිණි. ඊළගට ඔහු නාවිකයාට සංඥා කළේ තමා දෙසට ළංවෙන අයුරෙනි.

"ඔබ අහල තියෙනවද මහත්මයා වොටසන් සැලැස්ම ගැන?" හෝම්ස් නාවිකයාගෙන් ඇහුවේ රහසක් කියන අයුරෙන් අඩු ශබ්දයෙනි. "අහල නෑ? ඔබ ඒක අහල නැති එක ගැන මං පුදුමවෙන්නෙ නෑ. ඒ මොකද පහුගිය අවුරුදු දහයක කාලය ඇතුළත ආරක්ෂක අමාත්‍යාංශය, බොහොම අමාරුවෙන් රැකගත් ලියවිල්ල තමා වොටසන් සැලැස්ම."



http://sherlockholmesinvestigations.blogspot.com

හිස එසවූ මගේ මිත්‍රයා දෙතුන්වරක් වට පිට බැලුවේය. ඒ තමා කියන රහසට සවන් යොමුකරන මෑතියේ කිසිවෙකු සිටිදැයි සැකහැර දැනගන්නා අයෙකු ලෙසිනි.

"මං තේරුම් ගත්තා" හෝම්ස් යළිත් කීය. "ඔබ ඔබේ රට වෙනුවෙන් ජීවිතය වුණත් කැපකරලා මේ රහස රැකගන්න සූදානම් අවංක කෙනෙක් බව. එහෙම නොවෙන්න මේ රහස මං ඔබට හෙළිකරන්නෙ නෑ. ඔබ සමහර විට අහලා නැතුව ඇති මහාචාර්ය වොට්සන් ගැන? මහාචාර්ය වොට්සන් තමා ආරක්ෂක ක්‍රමෝපායන් ගැන, තීක්ෂණ බුද්ධියකින් කටයුතු කරන ඉහළම විද්වතා. ඔහු සැලසුම් කළා ඉතා විශිෂ්ට ආරක්ෂක සැලැස්මක්. ඒක ක්‍රියාත්මක කළොත්, මේ මහා බ්‍රිතාන්‍යයේ වටේම වෙරළ තීරයට, පහරදෙන්න තියා කිට්ටුවෙන්නවත් කිසිම සතුරු රටකට බෑ. කොච්චර කාලයකට කියලද ඔබ හිතන්නේ? තවත් අවුරුදු තිහකට!"

නෙඩ් බ්‍රිජ්ර්ගේ එකට තදවූ දෙතොල් වලින් සිවුරුහන් කෙරිණ.

"මේ සැලැස්ම සතුරු අතට පත්වුණොත් අපි විනාශයි" හෝම්ස් තවදුරටත් කීය. "එහෙම වුණොත් අපේ රටට මුහුණ දෙන්න වෙන භයානක ප්‍රතිඵල ගැන, ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ. එංගලන්තය කියන්නේ විදේශික රහස් ඔත්තුකාරයින් පිරී ඉතිරී ගිය තැනක්. කවුන්ට් ඩ්‍රැකියුලා යන බොරු නමෙකින් පෙනී ඉන්න රහස් ඔත්තුකාරයෙකුගේ අතට, වොට්සන් සැලැස්මේ පිටපතක් ලැබිල තියෙනවා. යුරෝපා මහාද්වීපයේ තමන්ගේ ප්‍රධානීන්ට ගෙනියන අරමුණෙන්, ඔහු මේක රහසේම හොරැවින් "සරිනා කැතරින්" නෞකාවේ හංගා ඇති බව, අපට දැනගන්න ලැබුණා. මේ විශාල ලියකියවිලි තොගය හංගලා තියෙන්නෙ පස් පිරවූ ලී පෙට්ටියක. අපට දැනගන්න ලැබුණා, ඊයේ රාත්‍රියෙ හෝටලයෙන් පිටවී ඔහු, වරායේ ජැටිය පැත්තට ආවා කියල. ඔය කියන විධියේ බරින් වැඩි විශාල ලී පෙට්ටියක් නැවට පටවනවා. ඔබ මුරට ඉන්න වෙලාවෙ මෙහෙම දුටුවද?"

බ්‍රිජ්ර් තම නිකට කැසුවේ මදක් කල්පනා කරමිනි. "ඔය කියන විදියේ පෙට්ටියක් මම නම් දැක්කෙ නෑ. මං මේ නැව මුර කරන්න ආවෙ පැය භාගයකට කලින්. මට කලින් මුරට හිටියේ පෙට්කින්. ඔහු රාජකාරි කරද්දි ඔය කියන මිනිහා ලී පෙට්ටිය ගෙනැත් හැංගුවද දන්නෙ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම නම් අපට නැව සෝදිසි කරල බලන්න අවසරද?"

"ඔව්" ඔහු කීවේ මාර්ගයෙන් ඉවත් වෙමිනි. "නෙඩ් ව්‍රිජර් තමන්ගේ රටේ ආරක්ෂාවට බාධා කළා කියල කිසි කෙනෙකුට කියන්න මම ඉඩතියන්නේ නෑ."

නැවට නැගීමට තිබූ ලී තරප්පු පෙළ දිගේ අපි වේගයෙන් ඉහළට දිව ගියෙමු.

"මොකක්ද හෝම්ස් ඔබ වොට්සන් පැලැඹීමක් ගැන කිව්වේ?" මම ඔහුගේ කනට කොඳුරමින් ඇසීමි.

"මිත්‍රයා" හෝම්ස් කීය. "කුණාටුවක් කුදින් ගමන වෙලාවට හැංගුරම් දන්න, ඕනෑම වරායක් හොඳ වරායක් කියල කතාවක් තියෙනවානෙ. ඔබට තාවකාලික උසස්වීමක් දීම ගැන ඔබ අමනාප වෙන එකක් නැහැ කියල මං විශ්වාස කරනවා............... නැවේ බඩු ගබඩාව ඇත්තේ මේ පැත්තේ වෙන්න ඇති. යමු බලන්න"

තරප්පු පෙළ මුදුනේ ලන්තෑරුමක් එල්ලා තිබිණි. හෝම්ස් එය දැල්වීය. ඉන්පසු නැවේ පහළ තට්ටුවේ බඩු ගබඩාකර තිබූ පහළ කොටසට යෑම අපහසු වූයේ නැත. එහි තිබූ විශාල පෙට්ටි, පීප්ප හා කඹ අතරේ, අප සෙවූ දිග ලී පෙට්ටිය තිබිණ. මිනීපෙට්ටියක් වැනි එහි හැඩයට මගේ ඇඟ කිලිපොළා ගියේය.

"මේරි........!" මම ඇතින්ම පෙට්ටිය බදාගත්තෙමි. එහි පියන එසවීමට මා වෙරදැරුවේ, කිසිදු ආයුධයක් නොමැතිව මගේ ඇඟිලි තුඩු වලිනි.

"හොඳට කල්පනා කරල වැඩ කරමු" කී හෝම්ස් අසල තාර පීප්පයක් මත වූ යකඩ කූරක් අතට ගත්තේය.

පෙට්ටියේ මුදුනට ගසා තිබූ ඇලි ගැලවී යන සේ යකඩකූරේ තුඩ ඒ අතරට දමා ඉස්සුවෙමි. ශබ්දයක් නංවමින් ලෑල්ල ගැලවී ගියේය.

"හෝම්ස්. ඔය ලන්තෑරුම දෙන්න" එහි ආලෝකයෙන් මට දකින්නට ලැබුණු දෙයින් මට කෑගැසිණ.

පෙට්ටිය පිරෙන්නට තිබුණේ පුසුවැලි පමණි!



http://sherlockholmesinvestigations.blogspot.com

# 12

# උපරිම ශක්තියෙන්

## I කොටස

පෙට්ටියේ මුදුනටම පිරී තිබූ කහපැහැති වැලි දෙස බලාගෙන, නිහඬව, අප කොයිතරම් වෙලාවක් ගතකළේද යන්න මම නොදනිමි. බලාපොරොත්තු වූ ලෙස මගේ බිරිඳ දකින්නට නොලැබී මගේ සිතේ මුලින්ම ඇතිවූයේ කම්පනයක් පමණි. මිළඟට කිසිවක් සිතාගත නොහැකිව දැඩි ගිහියකට පත්වූයෙමි. පෙට්ටිය තුළට දෑත් දමා මම එහි වූ වැලිගොඩ පහුරු ගෑවෙමි. වැලිවලට යට කොට හෝ ඇගේ සිහි විසඳු සිරුර දකින්නට ලැබේදෝයි මගේ සිතේ සැකයක් තිබුණි. අන්තිමට පෙට්ටිය අඩියේ ලැලි මතුවුවත් මගේ මේරි එහි නොසිටියාය.

"ඇය මේකෙ නැහැ වොට්සන්" හෝම්ස් තම දෑතින් මගේ දෑත් අල්ලා ඉවතට ගනිමින් පැවසීය. "මේ පෙට්ටිය බොරු ප්‍රයෝගයක්. මේක අපව රවටන්න යෙදූ උපායක්."

"ඒ වුණත් හෝම්ස් ඇයට මොකෑ වුණේ?" මා ඇසුවේ සිහි විකල් වූ පුද්ගලයෙකු පරිද්දෙනි. "ඒ යක්ෂයා මගේ මේරිට මොනව කරලද?"

එයට දියහැකි පිළිතුරක් මගේ මිත්‍රයා සතුව නොවීය. අනතුරුව පැවැතියේ දැඩි නිහඬතාවයකි. වයස්ගත පුද්ගලයෙකු රළු හඬින් ගැයූ නාවිකයන්ගේ ගීතයක් අපට ඈතින් අසන්නට ලැබිණි. ඒ බඩු පටවන ජැටිය දිසාවෙනි. මම හෝම්ස් වෙත මගේ නෙත් යොමු කළෙමි. "ක්ලැන්සි" අප දෙදෙනාටම එක්වරම කියැවිණි.

අප නැවේ ඉහළ තට්ටුවට පැමිණෙද්දී, මීදුම අතරින් නැව් කටයුතු කාර්යාලයට ගිය ක්ලැන්සි අපි දුටුවෙමු. අප ඉදිරියෙන්ම පහළින් පිහිටි නැව් බඳාදයේ අනඩ බ්‍රිජර් සිටියේය.

"බ්‍රිජර්" හෝම්ස් කෑගැසීය. "ඔය මිනිහව අල්ල ගන්න"



http://sherlockholmesinvestigations.blogspot.com

රිවෝල්වර අතට ගෙන අපි නැවේ සිට පහළට බසින පාලම දිගේ දිව ආවෙමු.

"මේ පැත්තේ" බ්‍රිජර් කෑගසනු ඇසිණ. ගබඩා කාමර පිටිපස තැනක, ක්ලැන්සි, බ්‍රිජර්ගේ ග්‍රහණයට හසුවී සිටියේය.

"මූ බොහොම චතුරු මාළුවෙක්. විනෝද ක්‍රීඩා සඳහා අල්ලගන්න හොඳයි" බ්‍රිජර් කීය. "ඌව අල්ල ගත්තා විතරයි, මගේ අතත් හැපුවා"

"ඔව්. මං හැපුවා තමයි" ක්ලැන්සි කෑගැසුවේ කෝපයෙනි. "මං ටිකක් තරුණ කාලෙ උඹව අහුවුණා නම් හදල නිකං ඉන්නෙ නෑ. අවලක්ෂණ තට්ටයා! උඹ හොඳයි මෝරුන්ට කෑමට මුදට දමන්න............. දෙයියම්පා. මාව ටිකක් අතඇරපන්"

"ඔව්. එතකොට ඔහේට පැනල දුවන්න පුළුවන් නේ" හෝම්ස් කීය. "ක්ලැන්සි. තමුසෙ අපට අල්ලගන්න හොඳ ආරක්ෂා කරන මිනිහා අපරාධකාරයෙක්. ඔහු ලන්ඩනයේදී මිනීමැරුම් කරල පැන ආව, පොලීසියට ඕන කරන මිනිහෙක්. තමුසෙ කැමැති ඒ අපරාධකාරයා අල්ලගන්න අපට උදව්කරන්නද? නැත්නං ජීවිතේ ඉතිරි කාලේ හිරගෙදර ගතකරන්නද? කෝ අර කවුන්ට් ඩිරැකියුලා? පෙට්ටි දෙක මාරුකරන්න ඔහු තමුසෙට කීයක් ගෙව්වද?"

ක්ලැන්සිගේ මුවෙන් වචනයක් හෝ පිටනොවීය.

"හොඳයි........... තමුසෙ කියන්නෙ නෑ එහෙනම්?" හෝම්ස් ඇසීය. "තමුසෙට උවමනා වැඩකටයුතු ඒ පිළිවෙලට කරන්නද? වොට්සන්. අපි පොලීසිය කැඳවමු"

ඔහුගේ ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා මම එතැනින් පිටවී යාමට සූදානම් වුණෙමි.

"ඔහොම ඉන්න මහත්වරුනි" ක්ලැන්සි කීවේ පරාජිත ස්වරයෙනි. මම ගමන නවත්වා ආපසු හැරී බැලුවෙමි. ඔහු දෙනෙත් බිමට යොමු කරගෙන කතා කිරීම ඇරඹුවේය.

"ඔහේලට දැනගන්න උවමනා කාරණා ඔක්කොම මං කියන්නම්. ඒත් ඊට කලින් මේ ගෝරිල්ලාට කියන්න, මාව නිදහස් කරල මෙතැනින් යන්න කියල"

හෝම්ස් හිස වනා බ්‍රිජර් වෙත සංඥාවක් කළේය. ඒ අනුව ඔහු ක්ලැන්සිගේ අත අත්හැරියේය. ඒ අකමැත්තෙන් බව මම දුටුවෙමි. බිම බලාගෙන මඳ වේලාවක් සිටි ක්ලැන්සි ලොකු හුස්මක් ඉහළට ගෙන කතාකළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ ලොක්කා මට අම්බර රන්කාසියක් දුන්නා මේ වැඩේට. ඔහු ළඟ තිබුණා තවත් ලී පෙට්ටියක්. හැබැයි ඒක හිස්. ඒක තිබුණෙ ජැටිය ළඟ. මිනිහ කිව්වා ඒක පුරවන්න මුහුදුවැලි මට වෙරළෙන් අරගෙන එන්න කියලා. මම වීල්බැරෝවකුයි සවලකුයි අරගෙන වැල්ලට ගියා. ගිහින් වීල්බැරෝව පිරෙන්න මුහුදු වැලි පටවාගෙන ආපහු ආවා. එතකොට අර ඔහු ළඟ තිබුණු හිස් ලී පෙට්ටිය පෙනෙන්න තිබුණෙ නෑ. මේකෙ තිබුණු බඩු ඒකට දැම්ම බව ඔහු මට කිව්වා. ඒ හින්ද මේ අනික් පෙට්ටියට මං ගෙනා වැලි පුරවන්න කිව්වා. ඒ ගමන මං මිනිස්සු තුන්දෙනෙකුත් උදව් කරගෙන, මේකට වැලි පටවලා, ඔහු කිව හැටියට "සරිනා කැතරින්" නැවට පැටෙව්වා. ඒකෙ අනික් විස්තර මං ඔබට කලින් කියල ඇති."

"තමුසෙ නම් මහ පුදුම මිනිහෙක්" මුලු කියැවිණි. "රත්තරන් කාසියක් පගාවට අරගෙන, තමුසෙ කළ වැඩේ දන්නවද? අසරණ ගැහැනියෙක් පෙට්ටියක දාලා හොරෙන් පැහැරගෙන යන්න තමුසෙ උදව්කරලා! තමුසෙත් මිනිහෙක්ද?" මට කෝපයෙන් කෑගැසිණ.

ක්ලැන්සිගේ මුහුණේ දිස්වූයේ මවිතයෙන්ලත් බැල්මකි. "මං ඒ වගේ නරක මිනිහෙක් කියලද හිතුවෙ? පැහැරගෙන යන්න එතැන ගැනියෙක් හිටියෙ නෑ මහත්තයෝ"

"පෙට්ටිය ඇතුළෙ ගැහැනියක් හිටියෙ නෑ කියලද තමුසෙ කියන්නෙ?" හෝම්ස් ඇසීය.

"මොන පිස්සුද මහත්තයා. පෙට්ටිය පිරෙන්නම තිබුණෙ පස්. මේ නාකි ක්ලැන්සි කාන්තාවන්ට බොහොම ගෞරව කරන කෙනෙක්"

"ඒකෙන් මොනවද හෝම්ස් අපිට හිතාගන්න පුළුවන්?" මම ඇසීමි.

"ඔහු ලන්ඩනයේ ඉඳල විට්බි අහ අතරෙදී ඇයව කොහේ හරි හංගලද?"

"කලබල වෙන්න එපා වොට්සන්. අපි හොයල බලමු." කී හෝම්ස් හැරුණේ ක්ලැන්සි දෙසටය. "තමුසෙ "සරිනා කැතරින්" නැවට පැටෙව්වා වැලි පෙට්ටිය. එතකොට කෝ අනික් පෙට්ටිය? අර උස මිනිහා ළඟ තිබුණු අනික් පෙට්ටිය?



http://sherlockholmesinvestigations.blogspot.com

"මං දන්නෙ නෑ මහත්තයෝ. මං වැලි අරගෙන එද්දි ඒ පෙට්ටිය පෙනෙන්න තිබුණෙ නෑ."

හෝම්ස් තම අවධානය නෙඩ් බ්‍රිජර් වෙත යොමු කළේය. "ගතවුණු පැයක කාලෙදි මේ වරායෙන් නැව් මොනව හරි පිටත්වෙලා ගියාද?"

"ඔව්. මං හිතන්නෙ නැව් දෙකක් පිටත්වුණා." බ්‍රිජර් කීය. "මුලින් ගියා ඇමරිකන් රුවල් නැවක්. ඊට පස්සේ, ඒ කියන්නෙ මීට පැය භාගයකට විතර කලින්, තවත් නැවක් පිටත්වුණා. ඒක වාෂ්ප බලයෙන් ක්‍රියාකරන දුම්නැවක් විය යුතුයි. ඒකෙ නළාව මට ඇහුණා. ඒ දෙකම යා යුතු නියම වෙලාවට යන්න බැරිව හුඟක් වෙලා බලාගෙන ඉඳපු ඒවා වෙන්න ඇති. ඒ මොකද ඔවුන් පිටත්වෙලා ගියේ නෑ මීදුමත් තියෙද්දිමයි."

"ඒ නැව් දෙක ගැන නමුසෙ අන්නෙ මොනවද කියනවා බලන්න" හෝම්ස් ක්ලැන්සිට අණ කළේය.

"දුම්නැව නම් 'කිං හෙන්රි' නෞකාව වෙන්න ඇති. ඒක ඔස්ට්‍රේලියාවට යන්න තිබුණු එකක්. අනික් එක මොකක්ද කියන්න මං දන්නේ නෑ."

"මං කිව්වෙ ඇමරිකන් රුවල් නැවක් කියලා" බ්‍රිජර් කීය. "මං ඒකෙ කපිතාන් එක්ක කතාකළා. ඒකෙ නම බැල්ටිමෝ. බඩු ප්‍රවාහණය කරන නැවක්. ඒක ගියේ බොස්ටන් වලට."

හෝම්ස් කෙඳිරිගාමින් හිටි ක්ලැන්සිට පිටව් යාමට අවසර දුන්නේය.

"කෝ මගේ බිරිඳ?" මම මගේ මිතුරාගෙන් ඇසීමි. මා සිටින්නේ අසාමාන්‍ය ලෙස සන්සුන් නොවන බව මගේ මිතුරාට වැටහෙන්නට ඇත. ඔහු මා දෙස බලාසිටියේ භයට පත්වූ බැල්මකිනි. මා සිහි විකල්වීමේ තත්ත්වයකට ලංව ඇතැයි ඔහුට සිතෙන්නට ඇත.

"වැම්පයරයෙකුට මනුෂ්‍යයෙකුට මෝහනයට පත්කර, වශීකරන්න පුළුවන් හැකියාවට සීමාවක් නෑ" හෝම්ස් කීය. "බොහොම වෙලාවට ඩ්‍රැකියුලා ඔබේ බිරිඳට ආඥා කරන්න ඇති, නොපෙනෙන තැනකට වී හැංගිලා ඉන්න. ඒ ක්ලැන්සි එක්ක වැඩ කටයුතු ඉවරවෙන තුරු." එසේකී හෝම්ස් බ්‍රිජර් දෙසට හැරුණේය. "අපට මෝටර් බෝට්ටුවක් කුලියට ගන්න පුළුවන් කොහෙන්ද?"



http://sherlockholmesinvestigations.blogspot.com

බ්‍රිජර්ගේ මුහුණට නැගුණේ අප අවිශ්වාස කරන බැල්මකි. "තමුසෙලා කවුද? වරාය අධිකාරියේ නිලධරයන් කියල මට කියන්න එපා." ඔහු කීවේ තර්ජනාත්මක හඬෙනි. "ආරක්ෂක සැලසුම් ගැනයි, විදේශික ඔත්තුකාරයො ගැනයි තමුසෙලා කිව්වෙ පට්ටපල් බොරු බව මට දැන් විශ්වාසයි. තමුසෙලා ඔය කවුරු පස්සෙද එලවන්නෙ? මොකක්ද ඒ මිනිහගෙයි තමුසෙලාගෙයි අතර තියෙන ප්‍රශ්නය? මට හිතෙනවා තමුසෙලා ගැන දන්වලා වහාම වරාය ආරක්ෂක සේවය කැඳවන්න. උං ආව ගමන් තමුසෙලව දමන්නෙ යකඩ විලංගුවල"

ඔහුගෙන් ගැලවීමට සත්‍යය හෙළිකිරීම හැර වෙනත් විකල්පයක් නොවීය. අප ගැන ඇත්ත හෙළිකළ හෝම්ස්, කවුන්ට් ඩ්‍රැකියුලා මිනීමරුවෙකු මෙන්ම, කාන්තාවක පැහැරගෙන ගිය තැනැත්තෙකු බව පහදා දුන්නේය. එහෙත් ඩ්‍රැකියුලා ඩැම්පයර්වරයෙකු බැව් මගේ මිත්‍රයා සඳහන් කළේ නැත. මෙම අපරාධකාරයා අල්ලා ගැනීම අපේ එකම අරමුණ බව, හෝම්ස් අවධාරණයෙන් කියා සිටියේය. අප බලාපොරොත්තු නොවූ ලෙස නාවිකයාගේ මුහුණට සිනාවක් නැගිණ.

"ෂර්ලොක් හෝම්ස් කියන්නේ ඔබද?" ඔහු ඇසීය.

"ඔව්?"

"හෝම්ස් මහත්මයා. මං ඔබව හමුවෙන්න බලාගෙන හිටියේ බොහොම කාලෙක ඉඳල" නාවිකයා කීවේ මගේ මිත්‍රයාගේ දකුණු අත ගෙන සොලවමිනි. "මට සැකයක් නෑ. ඔබට තවමත් මතක ඇති කපිතාන් මෝගන්? ඔහු තමා මගේ මස්සිනා. මතක නෑ? අවුරුදු කිහිපයකට කලින් ඉංග්‍රීසි ඔධයේ මීදුම් කලාපයකට යාත්‍රා කළ ඇලීසියා නම් රුවල් නැවේ කපිතාන්වරයා?"

"මීදුම් කලාපයේදී අද්භූත ලෙස අතුරුදන් වූ ඇලීසියා නැවද?" හෝම්ස් ඇසීය. "ඒ ගැන ස්තූතියක් මට භාරගන්න බෑ මහත්මයා. මට තවමත් විසඳන්න බැරිවුණු ගැටලු වලින් එකක් තමයි, ඒ ඇලීසියා රුවල් නැවේ ගැටලුව"

"ඒ වුණත් හෝම්ස් මහත්මයා. ඉතාමත් වැදගත් කරුණක් පෙන්වා දෙන්න ඔබ සමත්වුණා. නාවික බලධරයන් කීවේ මගේ සොහොයුරාගේ වරදින් නැවට ඒ ඉරණම අත්වුණා කියලයි. නමුත් ඔහු පිළිබඳ වාර්තා වලින් ඔබට පෙන්වා දෙන්න හැකිවුණා, එය



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ අතින් සිදුවූ වැරැද්දක් විය නොහැකි බව. ඒ ගැන මං ඔබට හැමදමත් ණයගැතියි මහත්මයා"

"ඔබ හරි කරුණාවන්තයි. ඒක තමයි. කොහොමද අපි බෝට්ටුවක් හොයාගන්නේ?"

"මේ කිට්ටුවම නැංගුරම් දමල තියෙන, වාෂ්ප බලයෙන් ක්‍රියාකරන බෝට්ටුවක් ගැන මං දන්නවා," නාවිකයා කීවේ ඇසක් වසා ඉඟිමරමිනි. "අද රෑට අපි ඒක පාවිච්චි කලාට ඒකෙ අයිතිකාරයාට දැනගන්න විදියක් නෑ."

"විශිෂ්ටයි" හෝම්ස් කීය. "ඔබට අපත් සමඟ ඇවිත් එය පෙන්වා දෙන්න පුළුවන් නම් මං කෘතඥ වෙනවා. ඉක්මන් කරන්න මිත්‍රයා. බැල්ටිමෝ නැව මේ වෙනකොටත් සෑහෙන දුරක් ගිහින් ඇති"

"ඩ්‍රැකියුලා පලායන්න ඇත්තෙ බැල්ටිමෝ නැවෙන් කියල ඔබ හිතන්නේ ඇයි?" මම ඇසීමි. "කිං හෙන්රි නැවෙන් වෙන්න බැරි ඇයි?"

"මෙහෙ ඉඳල ඕස්ට්‍රේලියාවට හුඟක් දුරයි" හෝම්ස් කීවේ හිස සොලවමිනි. "අපි දන්නවානේ ඩ්‍රැකියුලාගේ බඩගින්න සහ කෑම රුචිය ගැන. වෙනත් වරායකට ළඟාවෙන්න කලින් ඔහු නැවේ නාවිකයො හැමදෙනාම ආහාරයට ගනීවි. වොට්සන්. ඔහු යන්නේ ඇමරිකා එක්සත් ජනපදය ආක්‍රමණය කරන්න. "සරීනා කැතරින්" නැවට ලී පෙට්ටියක් පටවලා ඔහු කළේ කපටි සූත්තරයක්. ඒක කළේ අප නොමග යවන වංචනික අදහසින්. තව ටිකෙන් ඔහු සාර්ථක වෙනවා"

වාෂ්ප බලයෙන් ක්‍රියාකරන බෝට්ටුව සෑහෙන තරම් විශාල එකක් විය. එය කුඩා ප්‍රමාණයේ නැවක් යයි මට සිතිණ. එහි ගල් අඟුරු ගබඩාවේ ප්‍රමාණයත් තරම් ගල්අඟුරු විය. එය පණගන්වාගත් වහාම අපි ගමන් ඇරඹීමු. සුක්කානම ක්‍රියාකරවීම මට භාරවූ අතර, හෝම්ස් බෝට්ටුවේ ඉදිරියට වී ඉදිරිමග නිරීක්ෂණය කළේය.

"කිසිම ආලෝකයක් දල්වන්න එපා" හෝම්ස් කීවේ බෝට්ටුව ඉදිරිපස පහනක් දල්වීමට බ්‍රිජර් සූදානම් වෙද්දිය. ඔහු පුදුමයට පත්ව මගේ මිත්‍රයා දෙස බැලීය.

"මහත්තයා. මේ ඝන මීදුමේ එළියක් නැතිව යාත්‍රාකරනවා කියන්නේ සියදිවි නසාගන්නවා වගේ වැඩක්"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මං දන්නවා—හැබැයි අපි ඔහු පිටුපස ලුහුබඳින බව ඩ්‍රැකියුලා දැනගත්තොත්, ඔහු වොට්සන් මහත්මිය මරා දමාවි. අපේ අරමුණ ඇය බේරාගැනීම. ඒ නිසා කොතරම් අන්තරායදායක වුණත් එලියක් නොදල්වා යමු. ඒ ගැන තීරණයක් ගැනීම ඔබට භාරයි වොට්සන්"

"බ්‍රිජ්" මම කෑගැසුවෙමි—"දෙවියන්ගේ නාමයෙන් අපි කළුවරේම යමු"

කෙඳිරිගෑ නාවිකයා දල්වාගත් ගිනිකූර නිවාදැමුවේය. මොහොතකින් අප වටකර ගත්තේ වරායේ ඝනාන්ධකාරයයි.

වරායෙන් අප මහ සාගරයට පිවිසෙන-දොරටුව වෙත ළංවෙද්දී, මීදුම තරමක් තුනී වී තිබිණ. එහෙත් අප ඉදිරියට යාත්‍රාකරද්දී ඝන මීදුම හතර වටෙනිම අප වසාගත්තේය. මෙය හා සසඳද්දී මට හොඳින් හුරුපුරුදුව තිබූ ලන්ඩන් මීදුම ඉතා සුළු එකක් යයි මට සිතිණ. මේ මීදුමේ ඝනත්වය කොතරම් වී ද යත්, මට හුස්මගැනීම පවා අපහසු විය. තමා ලුහුබැඳ එන වැළැක්වීමට, මෙය ඩ්‍රැකියුලා විසින්ම නිර්මාණය කළ මීදුමක්ද? මහාචාර්ය වැන් හෙල්සිං පැවසූ එක් කරුණක් මට මෙවෙලේ සිහිවිය. "තමා අවට පරිසරයේ දේශගුණයට හා කාලගුණයට නියුණු ලෙස බලපෑම් කරන්නට ඩ්‍රැකියුලාට පුළුවනි" එම කරුණ සත්‍යයක් නම්, මේ මීදුම මවා ඇත්තේ ඔහු නම්, එය සතුටට කාරණයකි. කුමක් නිසා ද යත්, අප සිටින්නේ ඩ්‍රැකියුලාට මා කලින් සිතූ තරම් ඈතින් නොවේ.

අප කොයිතරම් දුරක් ගමන් කළාද, කොපමණ වේලාවක් ගතවුණාද යන්න ගැන මට කිසිවක් සිතාගත නොහැකි විය. ඊට එක් හේතුවක් නම් අන්ධකාරය නිසා ඔරලෝසුවේ වේලාව දැකගැනීමට නොහැකි වීමයි. දැඩි වෙහෙසට පත්ව සිටි මම සුක්කානම අල්ලාගෙනම නිදිකිරා වැටෙන්නට වීමි. මේ අතර බිරිඳගේ ආරක්ෂාව පිළිබඳව තැවීම නැවතත් මගේ සිහියට නැගිණ. මේ අන්ධකාර සීතල ලෝකය හැර වෙනත් එකක් නැතැයි සිතෙන තරමට අපි අඳුරේ යාත්‍රාකරමින් සිටියෙමු. හෝම්ස්ගේ මුවෙන් පිටවූ යම් ශබ්දයක් නිසා, මම තිගැස්සී අවදිවූයෙමි.

"ඔහෝ!"

"ඇයි හෝම්ස්, ඔබ මොනවා හරි දුටුවාද?"

"මට හරියටම විශ්වාස නෑ," ඔහු කිය. "බොහොම ඈත එළියක් වගෙයි මට යන්තමට පේනුණේ. හරියටම කියන්න බෑ.



http://sherlockholmesinvestigations.blogspot.com

බාගවෙලාවට වලාකුළු අතරින් උතුරු තාරකාව මතුවෙලා පෙනුණද දන්නෙ නෑ"

අපි නිහඬව ඒ දෙස බලා සිටියෙමු. මීදුම කඩතුරාව හරහා කිසිවක් දැනගැනීමට නොහැකිවීම හදට වේදනාවක් විය. අපට අල්ලාගැනීමට බැරි ලෙස ඩිරැකියුලා පැන ගිහින්ද? මගේ සියලු බලාපොරොත්තු කඩාවැටෙද්දී එම එළිය මම ද දුටුවෙමි.

"හෝම්ස්" මට කෑගැසිණ. "අන්න පෙනෙනවා. අර පැත්තේ!"

එය රාත්‍රී ඝනාන්ධකාරය මැදයේ තිබූ, කහපැහැති කුඩා ආලෝකයකි. අප දුටුවේ එය අපේ වම පසින්, යාර හයසියයක් පමණ ඉදිරියෙන් තිබූ බවයි. මීදුම වළාවක් පාවී යනවිට එය නොපෙනී ගියත්, මඳ වේලාවකින් යළිත් දිස්විණි. මගේ සිතට නම් එය බලාපොරොත්තුව පිළිබඳ දැල්වුණු පහනක් විය.

"ඒක නම් සහතිකෙන්ම නැවක එළියක්" බ්‍රිජර් කීය.

"අපි සම්පූර්ණ වේගයෙන් යමු බ්‍රිජර්" මගේ මිත්‍රයා පැවසීය. "අපි නැව පහුකරගෙන ඉදිරියට යමු"

Reading Purpose Only



http://sherlockholmesinvestigations.blogspot.com

# 12

## II කොටස

"මහත්මයා අපට යන්න තිබෙන්නේ බොහොම පටු මුහුදු මාර්ගයක. මේ හරියෙ ඉදල දිගටම ඉදිරියට, මුහුදට යටින් අර යෝධ ගල්පරය තියෙනවා. ඒක හැතැක්ම ගණනාවක් දුරට තියෙනවා. හරි පරෙස්සමෙන් ඕන ඉදිරියට යන්න. පොඩ්ඩක් වැරදුණොත් අපි තුන් දෙනාගෙම මිනීවළවල් මේ මුහුද මැද්දෙම තමා." එසේ කියූ බ්‍රිජර් වාෂ්ප ඇන්ජිමේ වේගය එක්වරම වැඩි කළේය.

ඉදිරිපස දියකඳ කපාගෙන බෝට්ටුව ඉදිරියට ඇදුණේ, සිහින් පොද වර්ෂාවක් ඉහළ නංවමිනි. වේගයෙන් හමා ආ සීතල සුළඟ සමඟ පතිත වූ මේ මල් වැස්සෙන්, අපේ මුහුණු තෙමී ගියේය. මගේ හිස්වැස්ම සුළඟින් ගැළවී, මට අල්ලා ගැනීමට නොහැකි අයුරෙන් සුළඟේ පියාඹා ගියේය. ගනවූ සැඹ මීදුමක් පාසාම, ඉදිරියෙන් ගිය නෞකාවේ ආලෝකය වඩාත් පැහැදිලිව දර්ශනය විය.

රුවල් නැව පසුකර ඉදිරියට ගොස් ඊළඟට අප කරන්නේ කුමක්ද? ඒ ගැන සිතීමට අපට අවකාශයක් නොලැබුණේ නැව අල්ලාගැනීමට තිබූ උනන්දුව නිසයි. නැවේ කපිතාන්ගේ අවසරයකින් තොරව නැවට නැඟීම නීතිවිරෝධී ක්‍රියාවකි. උද්ගතව තිබූ තත්ත්වයන් යටතේ ඔහුගෙන් ඊට අවසර ලැබේද යන්න සැකසහිතය. අප බලහත්කාරයෙන් නැවට නැඟුණොත්, බොහෝවිට අපේ දෑත්වලට ඉක්මනින් යකඩ විලංගු වැටීමට ඉඩ ඇත. කෙසේ වෙතත් පළමුවෙන්ම අප නැව අල්ලාගත යුතුය. කළයුත්තේ කුමක්ද යන්න ඉන්පසු තීරණය කළ හැක. දැන් අපේ ප්‍රශ්නය බෝට්ටුවේ වේගය තවත් වැඩිකරගන්නේ කෙලෙසකද යන්නයි. එන්ජිමේ බොයිලේරුව පිපිරීමට ඉඩ නොතබා වේගය හැකිතාක් වැඩිකරගත යුතුය.

අපි 'බැල්ටිමෝ' නෞකාවට යාර තුන්සිය පනහක් පමණ සමීප වූයෙමු. මෙතෙක් වේලා මොහොතින් මොහොත ළංවෙමින් තිබූ



http://sherlockholmesinvestigations.blogspot.com

ආලෝකය, එක්වරම ඈත්වෙන බවක් අපි දුටුවෙමු. මගේ සිතේ ඇතිවූයේ බලාපොරොත්තු කඩවීම නිසා ඇති වූ කම්පනයකි.

"අන්න නැවේ වේගය වැඩිකළා. ඔවුන් පැනයනවා!" මට කෑගැසිණ.

"ඔහු අපව දැකලා" හෝම්ස් කීය. "ඔහුට වවුලෙකුට මෙන් අන්ධකාරයේ ඇස් පෙනෙනවා කිව්වා මට අමතක වුණා. නැවේ කපිතාන් සහ කාර්ය මණ්ඩලය වැඩකරනවා ඇත්තේ ඩ්රැකියුලාට ඕන හැටියට. බ්‍රිජර් වේගය තවත් වැඩිකරන්න! දමන්න තවත් අඟුරු!"

"ඒක කරන්න බෑ. බොයිලේරුව දෙදරනවා. කොයි මොහොතේ පුපුරාවිද දන්නෙ නෑ"

"මං කියන්නේ කොහොම හරි වේගය වැඩි කරමු කියලයි" හෝම්ස් කෑගැසීය.

"හරි හරි" බ්‍රිජර් පිළිතුරු දුන්නේය. "වේගය වැඩි කරමු. ඊට පස්සෙ අපි අපායෙදි නැවත හමුවෙමු"

ඔහු ගිනිඋදුනට තවත් ගල්අඟුරු දමා, වේගය වැඩිකරන ලීවරය අන්තිම කෙළවරටම ඇද්දේය. අප දියමතු පිට ඉදිරියට විසිවී ගියේ ඊතලයක් පරිද්දෙනි.

මීදුම තුනී වන්නට පටන් ගත්තේය. එය මගේ සන්තෝෂයට හේතු විය. එහෙත් මීදුම ඉවත්වීමට හේතුව වූයේ වේගයෙන් හමා ආ සුළඟය. ඒ සුළඟ නිසා අපට ඇතිවූ අවාසිය මා තේරුම් ගත්තේ මඳ වේලාවක් ගතවූ පසුය. සුළං හැමීම වැඩිවෙත්ම රුවල් නැවේ හැකිළී තිබූ රුවල් සම්පූර්ණයෙන්ම පිරී, වේගය අධික ලෙස වැඩිවී තිබිණ. මේ වනවිට රුවල් පවා හොඳින් දැකිය හැකි තරමට, අපි නැවට ළංවී සිටියෙමු. බොයිලේරුව පුපුරා යන තරම් බලයකින් ක්‍රියාකරමින්, අප වේගයෙන් ඉදිරියට ගිය බව සැබෑය. එහෙත් රුවල් නැව සුළඟේ බලයෙන් ඊට වඩා වේගයෙන් ගමන් කළේය. අපට එරෙහිව හමා ආ මේ සුළඟ, අපේ අවාසනාවටම හැමූ එකක් වීමට බොහෝ දුරට ඉඩ ඇත. එහෙත් මේ වෙලාවේ නම් එය කිසියම් අද්භූත බලයකින් මැවූ සුළඟක් දැයි මගේ සිතේ සැකයක් ඇතිවිණි. එසේ නොවන්නට, අපේ සතුරාට උවමනා දිශාවටම, උවමනා වූ මොහොතේම, උවමනා ආකාරයෙන්ම වේගවත් සුළඟක් හැමුවේ කෙසේද? කෙසේ වෙතත් නැව លුහුබැඳීම අපි අත් නොහැරියෙමු.


http://sherlockholmesinvestigations.blogspot.com

"බ්‍රිජර් වේගෙ වැඩිකරමු!" හෝම්ස් කෑගැසීය. "නැවත් මේ බෝට්ටුවත් අතරේ තියෙන පරතරය ඒ විගේමයි.

"බොයිලේරුවට ගල් අඟුරු දැමීමයි, එන්ජිම ක්‍රියාත්මක කිරීමයි, දෙකම එකසැරේ මට කරන්න බෑ"

ඔහුගේ කබාය ගලවා ඉවත දැමූ හෝම්ස් නාවිකයා අසලට ගොස් බොයිලේරුවට ගල් අඟුරු දමන්නට පටන්ගත්තේය.

මේ අතර කාලගුණයේ තදබල වෙනස්වීමක් සිදුවිණි. අපගේ කන් බිහිරි කරවමින් අහසේ හෙණ පුපුරන්නට පටන්ගත්තේය. එක්වරම කළු වලාකුළු දෙබෑවී අපගේ හිස්වලට ඉහළින් ධාරානිපාත වර්ෂාවක් කඩාහැලෙන්නට පටන්ගත්තේය. දිගින් දිගටම ගැසූ අකුණු පහරින් අහස ආලෝකමත් වූ අතර, හෙණ හඬ ද පැතිර ගියේය. අපගේ ඉදිරිගමනට අවහිර කරන අයුරෙන් මුහුදේ රැළි වඩාත් ප්‍රචණ්ඩ වන්නට පටන්ගත්තේය. සමහර රළ අඩි ගණනක් ඉහළට නැග බෝට්ටුව තුළට කඩා හැළුණේ අප මහත් අපහසුතාවයකට පත්කරමිනි. මුහුදුරළ මෙසේ යාත්‍රාව තුළට කඩාවැදීමෙන් බොයිලේරුව ක්‍රියා විරහිත වීමේ අවදානමක් තිබිණි. මේඝ ගර්ජනා සහිතව මෙසේ හදිසියේ මෙවැනි කඩා වැටීම, අහඹු සිදුවීමක් යයි සිතන්නේ කෙලෙසද? ඩ්‍රැකියුලා අපට එරෙහිව ඔහු සතු සියලු බල පරාක්‍රමයන් යෙදවීම අරඹා ඇති බව පැහැදිලිය.

"බොයිලේරුවට වතුර එන්න නොදී පරෙස්සම් කරගන්න" බ්‍රිජර් හෝම්ස්ට අනතුරු ඇඟෙව්වේය. මහා මුහුදුරළ දිගෙන් දිගටම අපේ බෝට්ටුව තුළට කඩාහැළුණොත්, ඇත්තෙන්ම ඒ අපේ ගමනේ අවසානයයි. අප මහමුහුදු මැද අසරණව සිටියදී, රුවල් නැව පලායන අයුරු මගේ සිතේ මැවී පෙනිණි. වැස්ස හෝ දියරැළි නොතකු හෝම්ස්, සවල දැතින් ගෙන, යන්ත්‍රයකින් මෙන් වේගයෙන් බොයිලේරුවට ගල්අඟුරු වීසි කළේය. එන්ජිම තදින් දෙදරන්නට පටන්ගත්තේ එහි අවසානය ළඟාවූ කලක මෙනි. අල්ලා ගැනීමට අපහසු අයුරින් චලනය වූ සුක්කානම හැකි වෙර යොදා අල්ලා ගෙන මම යාත්‍රාව හැසිරවීමට පියවර ගත්තෙමි.

"බොයිලේරුව පුපුරන්නයි හදන්නේ" බ්‍රිජර් මොරදුන්නේය.

මෙතෙක් වේලා යන්ත්‍රයක් මෙන් නොනවත්වාම ක්‍රියාත්මක වූ හෝම්ස් ගල් අඟුරු දැමීම මොහොතකට නැවැත්වීය.

"කමක් නෑ. වේගය එහෙමම තියාගමු" හෝම්ස් කීය.


http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහේට පිස්සුද?" ඒ ප්‍රශ්නය බ්‍රිජර් ගෙනි.

"බ්‍රිජර් ඔබ පීනන්න දක්ෂයෙක්ද?"

"මොකක්?"

"මෙතැන ඉඳන් ගොඩබිමට පිහිනාගෙන යන්න ඔහේට පුළුවන්ද?"

"මං ඊට වඩා දුර පීනලා තියෙනවා" ඔහු පිළිතුරු දුන්නේ හෝම්ස් පැවසූ දෙය තේරුම් ගැනීමට අපහසු වී වියයුතුය.

"එහෙනම් මේ බෝට්ටුවෙන් පැනලා ගොඩට පීනන්න. ඉතිරි හරිය බලාගන්න මටයි වොට්සන්ටයි පුළුවන්"

"මහත්තයා කියන්නේ මං බයගුල්ලෙක් කියලද?" ඔහු විමසුවේ කරුණ තේරුම් ගත් පසුවය.

"මං එහෙම කියන්නේ නෑ මනුස්සයෝ" හෝම්ස් කීය. "මේක ඔබ යෙදිය යුතු සටනක් නොමෙයි. ඔබේ ජීවිතය අවදානමට ලක් කර ගෙන අපට උදව් කරන්න එන්නෙ ඇයි?"

"ඒකට කමක් නෑ හෝම්ස් මහත්තයා. මං නාවිකයෙක්. ගොඩබිම රැකියා කරන අයට බෝට්ටුව හසුරවන්න දීලා මං කවදවත් ගොඩබිමට ගිහිල්ලත් නෑ යන්නෙත් නෑ"

"මෝඩයෙක් වෙන්න එපා බ්‍රිජර්" හෝම්ස් කෑගැසුවේය. "මෙහෙම වීර ක්‍රියාවල යෙදීමෙන් ඔබට ලැබෙන වාසියක් නෑ."

"කණගාටුයි. ඔහේ කියන ඒවා මට ඇහෙන්නෙ නෑ" කී නාවිකයා, එන්ජිම දිගටම ක්‍රියාත්මක කළේය.

"හෝම්ස් අර බලන්න!" මම ඉදිරිය පෙන්වීමි. මෙතෙක් වේලා මහා සාගරයේ ඈත දියඹට හමමින් තිබූ වේගවත් සුළගේ දිශාව දැන් වෙනස් වී ඇත. ඉදිරියට ගමන් කරමින් තිබූ නෞකාව අංශක 90ක කෝණයකින් හැරී දිශාව වෙනස් කර තිබිණි. හෝම්ස් ඒ දෙස බලාසිටියේ පැනයන හරිණයෙකු දෙස අසරණව බලා සිටින දඩයක්කාරයෙකු විලසිනි.

"මිනිහා අපෙන් ගැලවිලා පැනගන්නයි හදන්නෙ"

"ඔහොම ගියොත් නම් එයාට ගැලවීමක් නෑ" බ්‍රිජර් කීය. "එයා කෙළින්ම යන්නේ දියමට්ටමට යටින් තියෙන ගල්පරය දිහාවට"

විනාශය කරා යන එම ගමන දෙස අපි නිහඬව බලාසිටියෙමු. නිරතුරුවම මගේ සිහියට ආවේ මගේ බිරිඳය. ඇය ඇතුළු සැම දෙයක්ම, සැම කෙනෙක්ම විනාශකර දමා පැනයාමට, මේ නිරිසනා



http://sherlockholmesinvestigations.blogspot.com

නිර්ණය කර ඇතිද? නැත. ගල්පරයක් ගැන නොදන්නා ඔහු මේ දිහාවට ගමන් කරන්නේ, දැනටමත් අන්තරායදායක තත්ත්වයක ඇති යාත්‍රාව සමග අප විනාශකර දැමීමට විය හැක. ඒ දෙකින් කුමක් වුවත් අන්තිමට විනාශයට පත්වන්නේ මගේ බිරිඳගේ ජීවිතයයි. මගේ සිහි විකල්වී ගියා යයි මට සිතිණි. තමාගේ මුළු ලෝකයම සට්ටනය වී විනාශය කරා යන හැටි කෙනෙකුට අසරණව බලාසිටින්න සිදුවුණොත්?

එක්වරම සිදුවූ විදුලි කෙටීමකින් මුළු ප්‍රදේශයම ආලෝකමත් විය. නැවෙන් වැටුණු යමක් අඳුරු සාගරයට පතිත වී නොපෙනී ගියා යයි මම සිතුවෙමි.

"ඒ මොකක්ද?" මම මගේ සහකරුවන්ගෙන් ඇසීමි. මා ඒ ප්‍රශ්නය අසද්දීම තවත් කළු පැහැති වස්තුවක් මුහුදට වැටෙන අයුරු විදුලි කෙටීම්වල එළිය මගින් දකින්නට ඇතිණ. මේ අසාමාන්‍ය දසුන මගේ සිතේ ඇති කළේ භීතියකි.

"දෙවියනේ!" මම කෙඳිරිගෑවිමි. "මේ නැවේ සේවක මණ්ඩලය නේද මුහුදට පනින්නේ?"

"සැකයක් නෑ" හෝම්ස් කීය. "උඹුත් හිතනවා ඇති නැවේ ගිහින් ගල්පරයේ හැපිලා මැරෙනවාට වඩා දැන්ම මුහුදට පනින එක හොඳයි කියලා"

හෝම්ස් අත දිගුකළ පැත්තේ මුහුදේ වර්ණයේ වෙනසක් විදුලි එළියෙන් දුටුවෙමි. ඒ ජලමට්ටමට යටින් තිබූ ගල්පරය නිසා වියයුතුය. එය අපට වඩා හොඳින් ඇවුන් දකින්නට ඇත. ඉහළ නැගි රළ පහළට කඩාවැටී සුදුම සුදු පෙණකැටි බවට පත්වී තිබිණ. මට බැස්කර්විල් සුනඛයාගේ සුදුපැහැති උල් දත් මෙන්ම ඩ්‍රැකියුලාගේ කිණිසි තුඩුමෙන් උල් දත් සිහියට නැගිණ.

බොයිලේරුවෙන් නිකුත් වූ ශබ්දයේ තද්බල වෙනසක් ඇතිවිය. ගෙවී ගිය සෑම තත්පරයකම එය වඩාත් තියුණු විය. "මහත්වරුනි, ඔන්න බොයිලේරුව පුපුරණවා!" ටිප්ප් කටිහිරියෙන් කෑගැසීය.

"වතුරට පනිමු වොට්සන්" හෝම්ස් කීවේ සන්සුන් ස්වරයෙනි. මම මඳක් පැකිළුණෙමි. වතුරට පැන්නොත් මීළඟට සෑහෙන දුරක් පිහිනා යෑමට සිදුවෙයි. කලකට පෙර ඇෆ්ගන් යුද්ධයේදී මට සිදු වූ ආබාධය නිසා, දීර්ඝ දුරක් පිහිනා යෑම මට කළ හැකි වේද? යාර සියයක් පිහිනීමට පෙර, මා වතුරේ ගිලෙනු නො අනුමානය. එසේ



http://sherlockholmesinvestigations.blogspot.com

වුවත්......? තීරණයක් ගැනීමට අපහසුව සිටි මා සඳහා තීරණය ගනු ලැබුවේ මගේ මිත්‍රයා විසිනි. ඔහු එක් නිමේෂයකින් මා මුහුදට තල්ලු කර දැම්මේය. හිස පහතට සිටින සේ මා මුහුදට ඇදවැටිණි.

වතුරේ තිබුණේ කෙනෙකු මරණයට පත් කළ හැකි තරම් අධික ශීතලකි. එහෙත් මට මුලින්ම ඇතිවූ ප්‍රශ්නය එය නොවේ. හිස පහතට සිටින අයුරින් දියට පැනුණු මම, මුහුදු පතුල දෙසට ගිලා බැස්සෙමි. මගේ පෙණහැලි වල තිබූ වාතය කටින් පිටවෙමින් මුහුදු වතුර පෙවෙනු මට දැනිණ. සැහෙන වේලාවක් යනතුරු වතුරේ ගිලෙද්දී, මා යළිත් උඩට මතුවේදැයි මගේ සිතේ සැකයක් මතුවිය. මඳ වේලාවක් ගතවෙද්දී පහතට ගිය වේගය අඩුවිණි. දෑත් හා දෙපා ගසමින් සැහෙන උත්සාහයක් දරා, මම දිය මතුපිටට පැමිණියෙමි. පපුව පිරෙන්නට පිරිසිදු වාතය ආශ්වාස කිරීමට ලැබීමෙන් පසු මට දැනුණු සනීපය මෙතෙකැයි කිව නොහැක. පෙඟී තිබූ ලෝම කබාය ගලවා දැමීමෙන් පසු, මගේ බර වඩාත් සැහැල්ලු විය. ඉන්පසු හිස දියමතුපිට තබා ගැනීම අපහසු කරුණක් නොවිණි.

එක්වරම මගේ වම්පසින් මුහුදේ මහා පිපිරීමක් සිදුවිය. ඉතා ළඟක අකුණක් ගසද්දී සිදුවන අයුරින්, කන්බිහිරි කරවන ශබ්දයක් හා දීප්තිමත් ආලෝකයක් නිකුත් කරමින්, එය සිදුවිණි. එදෙසට හිස හරවා බැලූ මට දකින්නට ලැබුණේ, කළු දුම්රොටු සමග මුහුද මැද ඇතිවූ ගිනිමැලයකි. මුහුදේ හැම තැනකම නොයෙක් සුන්බුන් විසිරී තිබිණි. මගේ සිතේ තිබූ කැලැඹීම නිසා ඒ කුමක්දැයි තේරුම් ගැනීමට මට මඳ වේලාවක් ගතවිය. ඒ, මිනිත්තුවකට දෙකකට පෙර මා ගමන්ගත් වාෂ්ප බෝට්ටුව පුපුරා ගිය ආකාරය බවත්, දක්නට ලැබුණේ එහි සුන්බුන් බවත් අන්තිමේදී මම තේරුම් ගත්තෙමි.

මට එක්වරම සිහිවූයේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ය. බොයිලේරුව පිපිරීමට පෙර යාත්‍රාවෙන් පැනගැනීමට හෝම්ස් සමත්වූවාද? එසේ නොහැකි වූවා නම් ඔහු නිසැකවම ගිනි ජාලාවට මැදිවන්නට ඇත. එසේ නම් මා ඉදිරියේ මේ දල්වෙන්නේ හෝම්ස්ගේ මළසිරුර ආදාහනය වන ගිනිමැලයද? මොහොතකට පෙර මා මුහුදට තල්ලුකොට මගේ පණ බේරූ මගේ මිත්‍රයා කෝ? මගේ සිතේ ඇතිවූයේ යටපත් කරගත නොහැකි ශෝකයකි. මම හැකිතරම් ශබ්ද නගා ඔහුගේ නම කියා කෑගැසීමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්...... හෝම්ස්........!! හෝම්ස්.......................!!!"

එයට පිළිතුරක් නොලැබිණි. මගේ දෙසවණට ඇසුණේ වේගයෙන් හැමූ සුළඟේ ශබ්දය හා අහස ගුගුරන හඬ පමණකි. මම දෙවරක්, තුන්වරක් නොව කිහිප වාරයක්ම මගේ මිත්‍රයාගේ නම කියා, මගේ උපරිම ශබ්දයෙන් කෑගැසීමි. එහෙත් පිළිතුරක් නොලැබිණි.

එහෙනම් මේ මගේ හිතවත් මිත්‍රයාගේ අවසානයද? බේකර් වීථියේ නිවහනට වී පයිප්පයක් දල්වාගෙන, එක දිගට පැය ගණනක් කල්පනාවේ වෙළී සිටි, විශ්මිත රහස් පරීක්ෂකයා; එංගලන්තයේ පමණක් නොව මුළු යුරෝපය පුරාම විශිෂ්ට කීර්තියකට පත්වූ ශ්‍රේෂ්ඨ චින්තකයා; බලගතු රජපවුල් වල මෙන්ම අසරණ මහලු කාන්තාවන්ගේ ද ප්‍රශ්න විසඳීමට, තම කාලය එක සේ කැපකල උතුම් මානව හිතවාදියා. ඔහු ලොවෙන් සමුගන්නේ මේ අයුරෙන්ද? ඔහුට සාමදානයේ සැතපීමට සිදුවී ඇත්තේ එංගලන්තයේ ඈත කෙළවරක, ගල් පරයක් අසල මුහුදේ සීතල සොහොන්බිමකද?

ඊයම් බරු බැස්සවූ කලක මෙන් ශෝකයෙන් බර වූ හදවතින්, බෝට්ටුවේ ගිනිගෙන දැවෙන ඉතිරි කොටස දෙස මම බලාසිටියෙමි. අනතුරුව සෙමින් සෙමින් වෙරළ දෙසට පිහිනන්නට පටන්ගතිමි.

මගේ මිත්‍රයා ඔහුගේ එදිනෙදා කටයුතු නිසාත්, දිනපතාම ඇවිදීම නිසාත් නිරෝගී සිරුරකින් යුක්තවිය. එහෙත් මගේ තත්ත්වය ඊට වඩා බොහෝ දුරට වෙනස් විය. පිහිනා යායුතු දුරෙන් භාගයක් පිහිනීමටත් පෙර, මගේ උරහිස තුදින් කකියන්නට පටන් ගත්තේය. හතිවැටුණු පසු මට හුස්ම ගැනීම පවා අපහසුවිණි. නමුත් මගේ වාසනාවකට මෙන් ජල මට්ටමට ඉහළ වූ ගල්පරය වෙතට ළඟාවීමට මට හැකිවිය. තැනිතලාවක් වැනි වූ ගල්තලාව මත සෑහෙන තරම් උසට මුහුදු වැලි එකතු වී තිබිණි. අධික විඩාව නිසාත්, වතුරේ ශීතල නිසාත් මා ක්ලාන්ත වීගෙන එන බවක් මට දැනිණි. මුහුදු රැල්ලෙන් ඉවතට ගසාගෙන නොයනු පිණිස ගල්පරය මැද හරියටවත් මා යායුතුය. පිහිනීමට නොහැකිව සිටි මම ගල්පරය මත වූ වැලි මත එරෙමින්, වැටි වැටී බඩගාමින්, එය මැදට ගමන් කළෙමි. මා සිහිනැතිවුණේනට ඇත්තේ සෑහෙන තරම් දුරක් ගමන් කළ පසු විය යුතුය.



http://sherlockholmesinvestigations.blogspot.com

මා එතරම් වේලාවක් සිහි නැතිව සිටියා විය නොහැක. ඒ කුමක් නිසා ද යත්, මට යළි සිහි ලැබෙන විටත් අපේ යාත්‍රාවේ සැකිල්ල, තවමත් වරාය එළිය කරමින් ගිනිගෙනත් දැවෙමින් තිබිණි. ඊට අමතරව මා අතිශය පුදුමයට පත්කළ තවත් දෙයක් මට දැකගන්නට ලැබිණි.

මා සිටි තැනට අඩි විස්සක් පමණ දුරින් 'බැල්ටිමෝ' නෞකාව අනතුරට පත්ව, ගල්පරය මත එල්ලී හිරවී ඇති සැටි දුටුවෙමි.

ගල්පරයේ වැදුණු නිසා නැවේ පැත්තක විශාල සිදුරක් සෑදී තිබිණ. ඒ හැරෙන්නට නෞකාවට වෙනත් හානියක් සිදුවූ බවක් දිස්වූයේ නැත. නැවේ බඳට මෙවැනි හානියක් සිදුවූයේ දියමෙදී නම් එයින් මුළු නෞකාවම මුහුදුබත් වී විනාශවන්නට ඉඩ තිබිණ. එහෙත් දැන් නැවෙහි අඩක් තිබුණේ මුහුදු මට්ටමෙන් උඩ ගල්පරය මත නිසා, නැවට සිදුවිය හැකිව තිබූ හානියෙන් වැළැකිණි. නැවේ ඉදිරි කොටස අහස දෙසට යොමුවී තිබූ අතර රුවල් හා කඹ පහතට එල්ලා වැටිණි.

මා මුලින්ම සිතුවේ නැව මුහුදුබත්වී, මගේ බිරිඳ මුහුදේ ගිලී මියයන්නට ඇත යනුවෙනි. එහෙත් මේ දසුන දුටු වහාම මගේ සිතේ යම් සැනසීමක් ඇති විය. ඒ සමගම මා භයට පත්කරමින් ඇතිවුණු සිතිවිල්ලකි. 'කෝ ඩ්රැකියුලා?' ඊළඟ මොහොතේ මගේ ප්‍රශ්නයට පිළිතුරු ලැබිණ. අහසේ කෙටූ විදුලියකින් හාත්පස ආලෝකමත් වෙද්දී මම ඔහු දුටුවෙමි. මේ කාලකණ්ණි දුෂ්ටයා නැවේ එක් කෙළවරක නැගිට, මා සිටි පැත්ත බලා සිටි අයුරු මම දුටුවෙමි.

ඔහු මා දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය. මුහුණ සුදුමැලි වූවත් ඔහුගේ දෙනෙත් ගිනි අඟුරු මෙන් රත් පැහැ විය. ඔහුගේ කළු පැහැති ලෝගුවක් වැනි ඇඳුම කුණාටු සුළඟේ සැළුණේ, යෝධ වවුලෙකුගේ පියාපත් විලසිනි. ඔහු තම දැතින් යම් දෙයක් අල්ලාගෙන සිටියේය. ඒ අප්‍රාණික වස්තුව කුමක්දැයි හඳුනාගැනීමට එදෙස දෙවරක් බැලීමට මට ඇවැසි නොවිණි. ඒ සුදු පැහැති රාත්‍රී ඇඳුමක් ඇඳ සිටි කාන්තාවකි, ඇය මගේ බිරිඳ මේරිය. ඒ බැව් දකිද්දී මගේ සිහි විකල්ව මම උමතුවීමට ආසන්නව සිටියෙමි. ඇය ජීවතුන් අතරද? නැතහොත් මියගොස්ද? මා සිටින්නේ තරමක් දුරින් නිසා එය නිශ්චිතව තේරුම් ගැනීම මට අපහසු විය. ඇය



http://sherlockholmesinvestigations.blogspot.com

මියගොස් නම් මට කළ හැක්කේ කුමක්ද? මගේ ජීවිතය විනාශවුවත් මා කළ යුතු දෙයක් ඇත. එනම් මේ තිරිසන් භූතයා මෙලොවින් තුරන් කිරීමයි.

ඔහු හා මා අතර තිබුණේ අඩි කිහිපයක පරතරයකි. සෑහෙන වේලාවක් අපි එකිනෙකා දෙස බලා හිටියෙමු. මීළඟට ආපසු හැරුණු ඩ්‍රැකියුලා, කපිතාන්ගේ කුටිය දෙසට ගමන්කොට නොපෙනී ගියේය. ඒ, හැකිනම් ඔහු පසුපස එන ලෙස මට කරන ලද අභියෝගයකි.

මම අතිශය භීතියට පත්වීමි. ෂර්ලොක් හෝම්ස් මියගිහින්. දැන් කවුන්ට් ඩ්‍රැකියුලා හා සටනට මා තනියම්!



http://sherlockholmesinvestigations.blogspot.com

# 13

## හමුවීම

අකුණුගැසීම සමග ඇතිවූ විදුලිකෙටීම් අවසන් විය. තවත් සෑහෙන වේලාවක් මම එතැනටම වී ඔහේ බලාසිටියෙමි. මුළු මුහුදු තීරයම යළිත් වරක් ඝනාන්ධකාරයෙන් වැසීගියේය.

මා කිසිවකට නොසැලෙන නිර්භය පුද්ගලයෙකු යයි පවසා, පාඨකයා මුළාකිරීමට මම උත්සාහ නොදරමි. එහෙත් මගෙ එක්වරම ඩ්රැකියුලාගේ අභියෝගය පිළිගෙන 'බැල්ටිමෝ' නෞකාවට නොගියෙමි. එයට හේතුව මගේ ජීවිතය විනාශ වෙතැයි තිබූ ප්‍රාණ භය නොවේ. ඩ්රැකියුලා පැහැරගෙන ගිය මගේ බිරිඳ ඔහු අතින් මරණයට පත්ව සිටීමට දැන් බොහෝ දුරට ඉඩ ඇත. ඔහු මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් ද මරා දමීමේය. අපට උදව් කළ නෙඩ් බ්‍රිජ්ර්ගේ මරණයට ද ඩ්රැකියුලා වගකිව යුතුය. මේ අපරාධ වෙනුවෙන් ඔහුගෙන් නිසි පළිය ගතයුතුය. ඉදිරියේදී මෙවැනි අපරාධ සිදු නොකිරීමට ඔහු මෙලොවින් තුරන්කළ නොහැකි නම් එංගලන්තයෙන් නෙරපා හැරිය යුතුය. එසේ නොකොට, ඔහුගේ උගුලක හසුවී එක්වරම මියයාමෙන් ඇති ඵලය කුමක්ද? මියයනවා නම් මියයායුත්තේ, ඩ්රැකියුලා ද විනාශකරගෙනමය. අහෝ! මගේ හිතවත් මිත්‍රයා මේ මොහොතේ සිටියා නම්..........! මෙවැනි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දිය යුත්තේ කුමන අයුරකින්ද යන්න දන්නේ ඔහු පමණි. ඔහු මියගොස් ඇයක් යාමට පෙර, මේ ශූර බුද්ධිමතාගේ නුවණේ අගය පෙනෙන්නට පටන්ගෙන තිබේ.

මෙලෙස කල්පනා කරමින්, සුසුම් හෙළමින් සිටීමෙන් ඃකිසිදු ප්‍රයෝජනයක් නැත. යම්කිසි ආකාරයක ඉදිරි පියවරක් ගත යුතුය. වැම්පයරයාට නොපෙනී ගල්පරය මත ගොඩගසා ඇති 'බැල්ටිමෝ' නැවට යාමට සුදුසුම ක්‍රමය කුමක්ද? මේ ගැන කල්පනා කරමින්, ගල්පරය මත ඇවිදමින්, මම ඒ දෙසට ගමන් කළෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

කිසිදු ශබ්දයක් නොනගා, අඳුරු සෙවණැලි අතරේ සැඟවෙමින් මම ඉදිරියට පා නැඟුවෙමි. නැවේ පර්දු මිනාවූ පැත්තේ බඳ අසලට ළංවූ මම, ඉතා පරෙස්සමින් පය තබමින්, නැවේ එක් කෙළවරකට ඇදුණෙමි. එක්වරම පිටිපසින් ආ කිසිවෙක් එක අතකින් මගේ කටවසා, මා බිමට පෙරළා ගත්තේය. මම කෑගැසීමට උත්සාහ කළෙමි. එහෙත් ඔහුගේ අත වඩාත් තදින් මගේ කටට හිරවූයේ, මට හුස්ම ගැනීම පවා අපහසු කරමිනි. ඔහුගෙන් ගැලැවීමේ අරමුණෙන් මම සම්පූර්ණ ශක්තිය යොදා දැඟලුවෙමි. එහෙත් සතුරාගේ අයෝමය ග්‍රහණයෙන්, මට ගැලවීමට තබා සෙලවීමට වත් නොහැකි විය. දැන් ඉතින් මා සිටින්නේ මරණය හමුවේය. මගේ මුළු සිරුරම අප්‍රාණික විය. කුසුරුදු කටහඬක් මගේ කනට කොඳුරන හඬ මට ඇසිණි.

"වොට්සන්! කිසිම ශබ්දයක් කරන්න එපා. ශබ්දයක් පිටවුණොත් අපේ සැලසුම විනාශවේවි"

දෙවියනි! ඒ හෝම්ස්ගේ කටහඬය.

ඔහු තම අතින් මගේ කට වසා නොතිබුණේ නම් මට සතුටෙන් කෑගැසෙන්නට ඉඩ තිබිණ. ඔහු ඉතා සෙමින් ඒ ග්‍රහණය ලිහිල් කළේය. ඒ සමගම මගේ දෑත් හා දෙපාවලට යෙදූ පීඩනයද ලිහිල් කළේ, මට බිම හිඳගත හැකිවන පරිද්දෙනි.

"හෝම්ස්!" මම කෙඳිරිලි හඬින් කියා කළුවරේම ඉදිරියට අත දිගු කළෙමි. මට අවශ්‍ය වූයේ මේ මා දකින්නේ සිහිනයක් නොවන බව සැකහැර දැනගැනීමටයි. ඔහුගේ උරහිස මට හසුවිණි. වතුරෙන් පෙඟී තිබුණත් ඒ හෝම්ස්ගේ උරහිස බව මම හඳුනාගතිමි. "මෙක මොන තරම් පුදුමයක්ද? අපේ බෝට්ටුව පුපුරා ගිනිගනිද්දී ඔබ කොහොමද බේරුණේ?"

"මගේ හිතවත් වොට්සන්" ඔහු කීවේ ඉතාම මෘදු හඬකිනි. "ඔබ ස්වභාවයෙන්ම විමසිලිමත් කෙනෙක් නිසයි, මේ වගේ වෙලාවක ඔය ප්‍රශ්නය අහන්නේ. ඒ කිහිපුණු පිපිරීමෙන් පණ බේරා ගැනීම ඒ තරම් අමාරු වුණේ නැහැ. ඒ මොකද, ඒක සිදුවෙද්දී මං එතැන හිටියෙ නෑ"

"ඔබ හිටියෙ නෑ?"

"නෑ වොට්සන්. ඔබ මුහුදට තල්ලු කරල දැං, මං ඒකෙ තවත් ඉඳීවි කියල හිතනවද? මගේ අමුතු ගති පැවතුම් ගැන ඔබ



http://sherlockholmesinvestigations.blogspot.com

පාඨකයන්ට වාර්තා කරල ඇති. ඒ කොයි එකකවත් ඔබ ලිව්වද, පුපුරන්න කිට්ටු වාෂ්ප බෝට්ටුවක එදී ඉදීම මගේ විනෝදාංශයක් කියල? මං බෝට්ටුවෙන් මුහුදට පැන්නා"

"ඒක අපූරුයි. ඒත් කෝ බ්‍රිජර්? ඔහුත් ඔබ සමග හිටියද?"

මගේ මිත්‍රයාගෙන් පිළිතුරක් ලැබුණේ මඳවෙලාවකට පසුවය. "නෑ වොට්සන්. ඔහු හිටියෙ නෑ"

"ඔහු.......?"

"ඔහු මා සමග මුහුදට පනීවි කියන විශ්වාසයෙන් තමා මං මුහුදට පැන්නෙ. නමුත් දැන් මට ඒ ගැන සැකයි. ඒ මොකද මං වතුරේ යටට යන්න කලින් බොයිලේරුව පිපිරුවා. මට හිතෙන්නේ ඔහුට පනින්න වෙලාවක් ලැබුණේ නැහැ. ඒක නෙමෙයි. ඔබ දැන් මිනිත්තු කිහිපයකට කලින් ඩ්‍රැකියුලාව දුටුවද?"

"ඔව්. මෙරී හිටිය ඔහුට අහුවෙලා"

"මමත් ඒක දුටුවා" හෝම්ස් කීය. "දැන් කවුන්ට ඩ්‍රැකියුලා කරන්න හදන්නෙ මොකක්ද දන්නවද? ඔහු හදන්නේ ඇය ඇමක් හැටියට පාවිච්චි කරන්න"

"ඒ කියන්නේ?"

"වෙනිං කෙනෙක්ව උගුලක පටලවා ගැනීම සඳහා, ඇය ඇමක් හැටියට යොද ගන්න" හෝම්ස් කීය. "ඔහු හිතන්නේ මං මියයන්න ඇති. නැත්නම් බරපතල තුවාල ලබල මරණාසන්නව ඇති කියල. වොට්සන්. ඔබේ බුද්ධිමත්කම ගැන ඩ්‍රැකියුලා කරල තියෙන්නේ අඩු තක්සේරුවක්. ඔහු හිතන්නේ, ඔහු ඇටවූ උගුලට, ඔබ මෝඩයෙකු වගේ අහුවෙවි කියලයි. කොහොම වුණත් ඔබ ඔහුගේ බලාපොරොත්තු කඩකරන්න දෙනෑද නෑ."

"මොකක්ද ඔබ කියන්නෙ? මට ඒක තේරුම් ගන්න අමාරුයි"

අඳුරු පැහැති වලාකුළු මහලක් සුළගේ ගසාගෙන යද්දී, බැබලෙන තරු වල එළිය යන්තමින් මුහුදට වැටිණි. හෝම්ස් ඔහුගේ හිස එක් පැත්තකට හරවද්දී, තරු එළිය ඔහුගේ දෙනෙත් වලට වැටී දිලිසෙන අයුරු මම දුටුවෙමි.

"ඔබේ ඔරලෝසුව හරියට වැඩ කරනවද?" හෝම්ස් ඇසීය.

ඇතුළු කබායේ සාක්කුවෙන් මම එය අතට ගත්තෙමි. මීළඟට එය කනට කර බැලීමි.

"ඔව්. ටික් ටික් ගානවා"



http://sherlockholmes-investigations.blogspot.com

"මගේ වෙලාව හයට මිනිත්තු දෙකයි" තරු එළියෙන් තම සාක්කු ඔරලෝසුව පරීක්ෂා කළ මගේ මිත්‍රයා කීය.

"මගේ වෙලාවත් ඒකමයි" මම කීවෙමි.

"හොඳයි. මං කියන දේ හොඳින් තේරුම් ගන්න වොට්සන්. මං ඔබට දෙනවා මිනිත්තු පහක කාලයක්. හරිද? ඔබ දුටුවා නේද 'බැල්ටිමෝ' නැවේ බඳේ තියෙන විවරයේ විශාලත්වය? හරි. ඔබ මේකෙන් රිංගලා නැවට ඇතුළුවෙන්න ඕන. ඒක ඩ්‍රැකියුලා කොහොමටවත් බලාපොරොත්තු වෙන දෙයක් නෙමෙයි. ඒ මොකද ඒක පහසුවෙන්ම අනිත් අයට දකින්න පුළුවන් මාර්ගයක් නිසා. ඔබ ඇතුළට ගිහිං, හය පහුවෙලා මිනිත්තු තුනක් වෙනතුරු ඉවසා සිටින්න. ඒ වෙලාවට ඔබට එළියෙන් ඇහේවි වෙඩි ශබ්ද කීපයක්. ඒවා ගැන කිසිම සැලකිල්ලක් කරන්න එපා. ඔබ තරප්පු පෙළ දිගේ උඩට නැගලා නැව් තට්ටුවට ගොඩවෙනවා. එතකොට ඔබ කෙළින්ම යන්නේ කපිතාන්ගේ කුටියට. ඔබේ බිරිඳ ඒ කුටියේ ඉන්න හැටි ඔබට දකින්න ලැබේවි. ඔබ ඇය ඔබේ භාරයට අරගෙන, ඇය ඔසවාගෙන නැවෙන් පිටවිය යුතුයි. ඒක ඉතාම ඉක්මනින් කළ යුතු දෙයක්. මේ අතරේ ඔබ එක්තරා දෙයක් කළ යුතුයි. ඒ මොකක්ද? ඔබේ බිරිඳ නැවත හමුවීම ගැන සන්තෝෂය පළකරලා කෑගහන්න; මුළු ලෝකෙටම ඇහෙන්න තරම් ශබ්දයට කෑගහන්න........."

"......... නමුත් හෝම්ස් ඒකෙන්.........."

"නැහැ මිත්‍රයා. මගේ කීම අහලා ඔබේ ප්‍රීතිය ප්‍රකාශ කරන්න. නමුත් ඒකක් මතක තියාගන්න. ඔබගේත් වොට්සන් මහත්මියගේත් ජීවිත රැඳී තියෙන්නේ, ඔබ කොයි තරම් ඉක්මනට නැවෙන් ඉවත්වෙලා, ගොඩබිමට පැනගන්නවාද කියන කාරණය මතයි. තේරුණාද?"

"තේරුණා. නමුත් මං ඒව කරන අතරේ ඔබ මොනවද කරන්නේ?" මම හෝම්ස්ගෙන් ඇසීමි.

ඔහු තම ජලරෝධක කබායේ සාක්කුවෙන් රිවෝල්වරය එළියට ගත්තේය. ඔහු මුහුදේ බැස සිටියත් එය ජලයෙන් ආරක්ෂා වී තිබිණ.

"කවුන්ට් යුද පෙරමුණේ බොහොම අත්දැකීම් ලබල තියෙන කෙනෙක්." හෝම්ස් කීය. "මං කරන්නේ ඔහුට බොහොම හුරුපුරුදු



http://sherlockholmesinvestigations.blogspot.com

දෙයක්. නමුත් මං හිතනවා මේ මොහොතේ එවැනි දෙයක් වේවි කියල ඔහු හීනෙකින් වත් හිතන එකක් නෑ. මං බලාපොරොත්තු වෙන්නේ ඔහුගේ අවධානය වෙනත් පැත්තකට යොමු කරන්න. නමුත් ඒක කොයිතරම් දුරට සාර්ථක වේද කියන්න බෑ"

"හෝම්ස්, ඔබේ සැලසුමේ හැටියට ඔබ ඉන්නේ භයානක අන්තරායකට මුහුණදීලා" මම කීවෙමි.

"ඇත්තම කියනවා නම් වොට්සන්, ඔබට තියෙන කටයුත්ත මගේ කාර්යයට වඩා දෙතුන් ගුණයක් භයානකයි. ඇය ඔබේ බිරිඳ නිසා මං හිතුවා, ඇය බේරාගැනීමේ වගකීම ඔබ දරන එක වඩා හොඳයි කියලා. එහෙම නොවෙන්න මමයි ඒක කරන්නේ. හොඳයි, එහෙනම් ඉක්මන් කරන්න වොට්සන්. ඔබට දුන්නු මිනිත්තු පහෙන් එක මිනිත්තුවක් අපි දැනටම ගතකරලා, අවසන්" එසේ කී මගේ මිත්‍රයා සෙවණැලි අතරේ සැඟවී නොපෙනී ගියේය.

නැවේ බඳේ වූ ආවාටය ඉතා විශාල එකක් වූ බව සැබෑය. එහෙත් එය තුළින් නැවට රිංගා යෑම, මං හිතූ තරම් පහසු එකක් වූයේ නැත. නැව පැත්තට ඇලවෙද්දී, සිදුර පොළොවේ මට්ටමෙන් අඩි හයකට වඩා ඉහළට ගොස් තිබිණ නැව්බඳ කැඩිගිය කොනැනකින් හෝ අල්ලාගත යුතුව තිබිණි. ඒ සඳහා කකුලේ ඇඟිලිතුඩුවලින් සිටගෙන, අත් හැකිතාක් ඉහළට දිගුකිරීමට මට සිදුවිය. ඊළඟට බිඳුණු ලෝහ දරයක එල්ලී, ශරීරය ඇතුළට ගැනීම ද අමාරු කටයුත්තක් විය. මගේ උරහිසේ තිබූ ආබාධය නිසා මට දැනුණේ දැඩි වේදනාවකි. එය වචනයෙන් විස්තර කළ නොහැකි තරම් වේදනාකාරී එකක් විය. එහෙත් මගේ මේරි, මේ දුෂ්ට නිරිසනාගෙන් බේරා ගැනීම ගැන සිතූ විට, එම වේදනාව මට අමතක විය.

ශබ්දයක් නොනංවා ආවාටය තුළට රිංගාගැනීමට මට හැකිවිණි. මුලදී තද අඳුරක් තිබුණත්, දෙනෙත් එයට හුරුවෙද්දී මට අපහසුවක් වූයේ නැත. නැව් තට්ටුවට යන තරප්පු පෙළ කෙළවර විවෘතව තිබූ දොරෙන්, අහසේ බැබළෙන තරු දකින්නට ලැබිණ. මගේ ඔරලෝසුව අතට ගෙන තරු එළියට අල්ලා වෙලාව පරීක්ෂා කර බැලීමි. හය පසුවී මිනිත්තු එකයි. ඉතා පරෙස්සමින් අඩිය තබමින් මම තරප්පු පෙළ වෙත පා නැගුවෙමි. මීළඟට හෝම්ස්ගේ සංඥාව ලැබෙන තුරු සූදානමෙන් සිටියෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

කලින් මට කී අයුරෙන් නියමිත වෙලාවට ඔහු ක්‍රියාත්මක විය. හයයි මිනිත්තු තුනට වෙඩි ගබ්ද මෑකක් එළියෙන් ඇසිණ. මොහොතක් හෝ පමානොවී මම තරප්පුව දිගේ ඉහළට දිවගියෙමි. මගේ ක්ෂණික ක්‍රියාකාරිත්වය නිසා, නව නිමේෂයකින් මගේ ජීවිතය අහිමිවීමට ඉඩ තිබිණ.

නැවේ ඉහළම තට්ටුවට නැඟුණු විගස, මට දැඩි ශීතලක් දැනිණ. ඒ, උණුසුම්ව තිබූ කාමරයක දොර ශීත කාලයේ සුළඟට විවෘත කළ විට දැනෙන ආකාරයේ අධික ශීතලකි. මීට පෙර කිහිප විටක්ම මා මේ අත්දැකීමට මුහුණ දී තිබිණ. ඒ නිසා මෙය ඇතිවූයේ කෙලෙසකද යන්න තේරුම් ගැනීමට, වැඩිදුර කල්පනා කිරීමේ ඇවැසිතාවයක් නොවීය. ළඟම තිබූ අන්ධකාර තැනකට වහාම පහත්වූයෙමි. එසේකොට මොහොතක් ගතවෙද්දී, කළු පැහැති ලෝගුවකින් සැරසුණු පුද්ගලයෙකු, කපිතාන්ගේ කුටියේ සිට පිටවී ගිය ආකාරය මම දුටුවෙමි. ඔහු ගමන් කළේ මා සැඟවී සිටි තැනට අහේ දුරිනි.

හෝම්ස් කී කරුණ මට සිහිවිය. "මතක තියාගන්න. ඔබගේත් වොට්සන් මහත්මියගේත් ජීවිත රැඳී තියෙන්නේ, ඔබ කොයිතරම් ඉක්මනින් නැවෙන් ඉවත්වෙලා යනවාද කියන කාරණය මතයි."

ඩ්‍රැකියුලා අනෙක් පසට හැරී වෙඩිහඬ ඇසුණු පැත්තට පිටවී ගිය වහාම මම අඳුරු මුල්ලෙන් එළියට ආයෙමි. එවිට මට දකින්නට ලැබුණේ කෙටි තරප්පු පෙළකි. එය දිගේ මම ඉහළට දිවගියෙමි. එය අවසන් වූ වහාම ජනෙල් කිසිවක් නොතිබූ කුටියක් දුටුවෙමි. එය අන්ධකාරයේ තිබිණ. බිත්ති අතපත ගා බැලූ මට දොර අසල තිබූ ලන්තෑරුමක් හමුවිය. වහාම මගේ සාක්කුවෙන් ගිනිපෙට්ටිය එළියට ගෙන ගිනිකූරක් දල්වා ගැනීමට උත්සාහ කළෙමි. එය අනාරක්ෂිත ගිනිකූරක් වූ නිසා, යන්තමින් තෙත්ව තිබුණත්, කිහිපවරක් උත්සාහ කොට, එය දල්වා ගැනීමට හැකිවිය. එයින් ලන්තෑරුම දල්වූයෙමි. එයින් නිකුත් වූ එළියෙන් මම කුටිය වෙත නෙත් යොමු කළෙමි. මේරි එහි සිටියාය!

සිව්රහස් සලකුණ කථාවේදී මේරි මෝස්ටන්ගේ සුන්දර පෙනුම ගැන මා කළ විස්තරය, මගේ පාඨකයන්ට මතක ඇතැයි සිතමි. එහෙත් එද නැව්කුටියේ සිටි මේරි දුටුවා නම් මේ සම්පූර්ණයෙන්ම වෙනත් කෙනෙකු යයි කවුරුන් හෝ කියනු නොඅනුමානය.



http://sherlockholmesinvestigations.blogspot.com

කූඩුවකින් බිමට වැටුණු කුරුලු පැටවෙකු මෙන් ඇය සිටියේ, ඉතා දුර්වලව කම්පනයට පත් විලසිනි. සීතලට අඳින කබායක් වත්, දෙපයට පාවහන් වත් නොමැතිව, ඇය සීතලෙන් වෙවුලමින් සිටියාය. ඇගේ නිල් පැහැති දෙනෙත් විශාලව විවෘතව තිබිණි. ඒ භීතියෙන් නොවේ. මා ඇය බේරාගනීවි යයි ඇය කිසිවිටෙකත් නොසිතන්නට ඇත. ඇගේ දෙනෙත් මෙලෙස විශාලව තිබුණේ, වශීකරණ මෝහනයකට පත්කර තිබීම නිසාය. මේ තත්ත්වය යටතේ ඇගේ දැස් වලට කිසිවක් නොපෙනිණි. මේරිට පැනයාමට නොහැකි වනු පිණිස ඩ්‍රැකියුලා ඇය මෝහනයට පත්කරන බව නිසැක යයි හෝම්ස් කී වදන් මට සිහිවිය. ඇය ජීවත්ව සිටිනු දුටු වහාම, මගේ සිතට ඇතිවූයේ විශාල අස්වැසිල්ලකි. එහෙත් මම වහාම ඇගේ උගුර දෙපස පරීක්ෂා කර බැලීමි. ඩ්‍රැකියුලා හා වාටුනෝනා ගොදුරු කරගත් පුද්ගලයින්ගේ උගුරුවල දෙපස තිබූ සිදුරු කිසිවක්, මේරිගේ ගෙලේ නොවීය. එම භීෂණයෙන් ඇය ගලවාගැනීම ගැන, මම දෙවියන්ට ස්තුති කළෙමි. කුටියේ තිබූ අල්මාරියකින් ලෝම බ්ලැන්කට්ටුවක් ගෙන, මේරි එහි ඔතාගත්තෙමි. මීළඟට ඇය ඇකින් ඔසවාගෙන නැව් තට්ටුව මතට පා තැබුවෙමි.

මා තරප්පුපෙළ අසලට යද්දී, ඩ්‍රැකියුලා කිසිවෙකු සමග කතාබහ කරමින් සිටින හඬක් මට ඇසිණ. එම ශබ්දය ඈතට ගමන් කරන්නේද, නැතිනම් ළඟට එන්නේද යන්න මට තේරුම් ගැනීමට අපහසු විය. කෙසේ වුවත් ඒ කටහඬ මගේ සිතේ ඇතිකළේ පිළිකුලක් මෙන්ම වෛරයකි.

"එහෙනම් උඹ තවමත් ජීවතුන්ව ඉන්නවා?" ඩ්‍රැකියුලා විමසනු මට ඇසිණ.

එයින් මා කොපමණ තිගැස්සුණේද යත්, මගේ දෑතේ තිබූ බිඳෙනසුලු පොදිය, තව මොහොතෙන් මට බිම අතහැරෙන්නට ඉඩ තිබිණ. එහෙත් මා හොඳින් බලද්දී දුෂ්ටයා නැව් තට්ටුව මත සිටින බවක් මම නුදුටුවෙමි. මීළඟට මට හෝම්ස්ගේ තියුණු කටහඬ අසන්නට ලැබිණ. ඒ අනුව ඩ්‍රැකියුලා කතාබහ කරමින් සිටින්නේ හෝම්ස් සමග බව මම තේරුම් ගතිමි.

"කවුන්ට්. තමුසෙ හිතුවෙ තමුසෙට කැමැති තරම් මනුෂ්‍යයින් ගොදුරු කරගන්න ඉඩ තියලා, මං වළපල්ලට යාවි කියලද?"



http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් ඇසීය. ඔහු සිටියේ දොරටුවට මතවූ වැලි තට්ටුවේය. හෝම්ස් සමීපයේම, වැලිතට්ටුව මත ඩ්රැකියුලා මට පිටුපා සිටගෙන සිටියේය. ඔහුගේ කළු ලෝගුව සීතල සුළඟට ලෙලදෙන් අයුරු මම දුටුවෙමි.

"කෝ තමුසෙගෙ සාළුවා?" ඩ්රැකියුලා හෝම්ස්ගෙන් ඇසුවේ උපහාසාත්මක හඬෙනි.

මේ මගේ වාරයයි.

"හෝම්ස්! මං ඇයව බේරා ගත්තා" හැඬූ සිට මම හැකිතාක් උස් හඬෙන් කෑගැසුවෙමි.

ඩ්රැකියුලා ඉතා වේගයෙන් ආපසු හැරුණේය. ඔහුට තිබුණේ දඩයක්කාරයන් දෙදෙනෙකුට මැදිවූ ව්‍යාඝ්‍රයෙකුගේ ක්ෂණික චලනයයි. තම ප්‍රාණ ඇපකාරයා අහිමිවීමට යාම ගැන ඔහු දැඩි ලෙස කෝපාවිෂ්ඨව සිටියේය.

"දුවන්න වොට්සන් දුවන්න!" කියා කෑගැසූ හෝම්ස් ඉදිරියට පැන්නේය. ඩ්රැකියුලා හා මා අතරට පිවිසීමට හෝම්ස්ට අවශ්‍ය වූයේ පිම්මක් පමණි.

මා ජීවිතයටම දක ඇති ඉතාම නිර්භීත ක්‍රියාව එයයි. මා අසල සිට ඩ්රැකියුලා දෙසට හෝම්ස් රිවෝල්වරය එල්ල කරගෙන සිටියේ මට පලායාම සඳහාය. එහෙත් මේ භයානක තත්ත්වය නිසා මම ගල්ගැසී බලාසිටියෙමි. මගේ හා මගේ බිරිඳගේ දිවි ගලවාගැනීමට පැනදුවනු වෙනුවට, මම එතැනම බලාසිටියෙමි. මගේ මිත්‍රයාට ඩ්රැකියුලාගෙන් විපතක් වීමට ඉඩ ඇතැයි හැඟීමක් මගේ සිතේ ක්ෂණිකව ඇතිවිය. එතැනින් පැනදිවීමට මට ශක්තියක් නොතිබුණේ එබැවින් විය යුතුය. ඩ්රැකියුලා හෝම්ස් දෙස බලා මහහඬින් සිනාසුණේය.

"ෂර්ලොක් හෝම්ස්" ඩ්රැකියුලා කීය.

"වෙඩි තියනවා බලන්න තමුසෙගෙ මහ ලොකු ආයුධයෙන්. තමුසෙ උපදින්න අවුරුදු සිය ගණනකට කලින්, සටන් පෙරමුණට හමුදා මෙහෙයවපු සේනාධිපතියෙක් මම. එහෙම කෙනෙකුට තමුසෙගෙ ඔය ආයුධයෙන් මොනවද කරන්න පුළුවන්?"

"හෝම්ස් රිවෝල්වරය ඩ්රැකියුලා දෙසට එල්ල කොට වෙඩි තැබුවේය.

වරක්! දෙවරක්! තුන්වරක්...! ..... රිවෝල්වරයේ කාණු හැම එකකම පතරොම් සියල්ල අවසන්වනතුරු වෙඩි තැබුවේය. වෙඩි



http://sherlockholmesinvestigations.blogspot.com

එහෙත් දුම සුළඟේ පාවී යද්දී ඩ්‍රැකියුලා නිරුපද්‍රිතව සිටගෙන සිටියේ මහ හඬින් සිනාසෙමිනි. මීළඟට තම අතින් මගේ මිත්‍රයා පසෙකට තල්ලුකර දුමු කවුළුවෙ. නැවේ බඳ දිගේ ඉහළට බඩගාන්නට පටන්ගත්තේ, කටුස්සෙකු බිත්තියක් දිගේ ඉහළට බඩගාන පරිද්දෙනි.

"දුවන්න වොට්සන්!" හෝම්ස් කෑගැසීය. "පණට ආදරේ ඇත්නම් පැනගන්න!"

මගේ මිත්‍රයාගේ අනතුරු ඇඟවීම නිසා මගේ දෙපා ක්‍රියාත්මක වූයේ ඒ මොහොතේදීය. ඒ වනවිට සාතුරා නැවට නැග අවසන්ය. ඔහු සිටින්නට ඇත්තේ මට අඩි දහයක් හෝ දොළහක් ඈතින් විය යුතුය. මෙරි ද ඔසවා ගෙන නැව් තට්ටුව අයිනෙන් සිට පහළට පැනීමට මා සූදානම් වූවා පමණි. එක්වරම ඩ්‍රැකියුලා තම බැල්මට මගේ දෙනෙත් සිරකරගත්තේය.

"ඔහුගේ බැල්මෙන් පරෙස්සම්වෙන්න වොට්සන්" හෝම්ස් එසේ කියන විට පමාවූවා වැඩිය. "ඔහුගේ ඇස්දිහා බලන්න එපා. ඒ බැල්මට හිරවුණොත් මරණය නියතයි!"

මම අතිශය භීතියට පත්වූයෙමි. මගේ තළලට ඩහදිය දමන අයුරු මට දැනිණ. මගේ සංවේදී බවේ වෙනසක් නොවීය. සිහි මූර්ජාවූ කාන්තාවක් මා දෑතේ සිටිනා බැව් මට මතක තිබිණ. අප දෙදෙනාම බිහිසුණු අවදානමකට මුහුණදී ඇති බැව් මම දැන සිටියෙමි. එහෙත් මට සෙලවීමටවත් නොහැකි විය. මගේ සිරුර ගල්ගැසී ඇති බවක් මට යන්තමින් දැනිණ.

කිසිදු ශබ්දයක් නොනගා ඩ්‍රැකියුලා අප අසලටම පැමිණියේය. ඔහුගේ මුහුණේ තිබුණේ දත් විලිස්සීමක්ද? සිනාවක්ද? ඒ මගේ මෝඩකම ගැනද? ඔහුගේ ජයග්‍රහණය ගැනද? මේ කිසිවක් මට තේරුම් ගැනීමට හැකියාවක් නොතිබිණි. ඔහුගේ දෙනෙත් මට පෙනුණේ, ගිනියම්ව උණුවූ ලෝදිය ගලා එන ආවාට දෙකක් ලෙසය. ගිනි දැල්ලකට ඇදී යන පළඟැටියෙකු ලෙස, මම ඊට ඇදී ගියෙමි. ඒ මගේ විනාශය බව දැන දැනත් මා ඇදී ගියේ ඒ දෙසටයි. ඔහුගේ ලෝදිය ප්‍රවාහයක් වැනි බැල්මෙන් ඉවතට දෑස් ඇද ගැනීමට මට හැකි නොවිණි. දැන් ඔහු අප ළඟටම පැමිණ ඇත. මීළඟට ඔහු මා දෙස බලා යළිත් වරක් දත් විලිස්සුවේ කිණිසි තුඩු මෙන් මුවහත් දත් මට ප්‍රදර්ශනය කරමිනි. කුණුවී ගිය මළ සිරුරකින්



http://sherlockholmesinvestigations.blogspot.com

හමන දැඩි දුර්ගන්ධය ඔහු වෙතින් හමා ආවේය. එය මට වමනය සාදන තරම් පිළිකුලක් ඇති කළේය.

මීළඟට එක් පුදුමාකාර දෙයක් සිදුවිය.

තම දුර්ගන්ධය වඩාත් ප්‍රබල ලෙස විහිදුවමින් ඔහු මා ළඟට පැමිණ සිටිද්දී, ඔහුගේ දෙනෙතේ බැල්ම වෙනස්විය. ඒවා මගේ උරහිස් වලට ඉහළින්, මගේ පිටුපස තැනකට යොමුවිය. මීළඟට ඒවායේ දිස්වූයේ භීතියයි. මා ඩ්‍රැකියුලා වෙතින් මෙතෙක් දැක නොතිබූ භීතියකි.

ඔහු මා බැඳ දැමූ බන්ධනය සිඳ බිඳ දැමීමට මේ අලුත් වෙනස එක්වරම සමත්වූයේ නැත. මගේ පසුපසින් ඇසුණු ෂර්ලොක් හෝම්ස්ගේ ජයග්‍රාහී කටහඬින් ඒ අඩුපාඩුව සම්පූර්ණ විය.

"කවුන්ට් ඩ්‍රැකියුලා!" හෝම්ස් කෑගැසුවේය. "සූර්යයා පායා එද්දී තමුසෙගෙ බල බිඳෙනවා. තමුසෙගෙ ශක්තිය ඔක්කොම දියවී යනවා"

මම එක්වරක් පිටුපස හැරී බැලුවෙමි. මගේ මිත්‍රයා කිවූ ලෙසින්ම පායන හිරුගේ රෝස පැහැති කිරණ ක්ෂිතිජයෙන් ඉහළට නැගෙමින් තිබිණ. අඳුරු වළාකුළු ඈතට පාවී ගියේය. මොහොතින් මොහොත හිරු වඩාත් දීප්තිමත් විය. මගේ සිතේ ඇති වූයේ ඉමහත් ප්‍රීතියකි. ඒ මෙලොව රැඳීමට තිබූ බලාපොරොත්තු මේ වනවිටත් මා අත්හැර දමා සිටි නිසයි.

සතෙකු පිඹින්නාක් මෙන් අප දෙසට ශබ්දයක් නිකුත් කළ සතුරා අඩි කිහිපයක් පිටිපසට ගියේය.

"කවුන්ට් ඩ්‍රැකියුලා" හෝම්ස්ගේ කටහඬ යළිත් ඇසිණ. "මේ ලෝකය පිරිසිදු කරන සූර්යයාගේ කිරණ දිහා බලන්න. තව මොහොතකින් ඒවා ඔය තැවඩුන් වැදේවි. එතකොට ඔහේගේ බලය නැතිවෙනවා. අපි ඔහේව විනාශ කරන්නේ එතකොටයි"

කවුන්ට්වරයාට එය තවදුරටත් ඉවසා සිටීමට නොහැකි විය. බලාපොරොත්තු කඩවීමත්, කෝපයත් ප්‍රදර්ශනය කරමින් ඔහුගේ මුවෙන් නිකුත්වූයේ තර්ජනා හඬකි. එය වඩාත් සමීප වූයේ ගොදුර අහිමි වූ වෘකයෙකු නගන රෞද්‍ර හඬටය. මෙසේ හඬ නගමින් ඔහු නැව තට්ටුවෙන් පහළට පැන්නේය.

මම මගේ දෙනෙත් පහළට යොමුකළෙමි. මට දකින්නට ලැබුණේ ඩ්‍රැකියුලාගේ සිරුර. දැවැන්ත වෘකයෙකුගේ සිරුර ලෙස



http://sherlockholmesinvestigations.blogspot.com

වෙනස් වූ අයුරුය. ඇගේ නිසල සටහන් හිරු එළියක් නොවැටුණු අන්ධකාර සෙවණැල්ලක් දෙසට ඒකයා පැනදිව්වේය. මිළඟට ඌ අන්ධකාරයේ නොපෙනී ගියේය.

"වොට්සන්. මගේ මිතුරා කොහොමද ඔබේ සුවදුක්?" මගේ පිටුපසින් කටහඬක් ඇසිණ.

"අපි ඉක්මනට මේරීව රෝහලකට ගෙනියන්න ඕන" මම කීවෙමි.

"මොනවා? ඔහු ඇයටත් තුවාල කරලද?" හෝම්ස් ඇසුවේ නැතිගත් හඬකිනි.

"ඔබට ස්තුතිවෙන්න ඔහුට ඒකට ඉඩක් ලැබිල නෑ" මම කීවෙමි. "නමුත් දිගින් දිගටම සීතලට විවෘතවීමෙනුත්, ඔහු කළ මෝහනයෙනුත් ඇය ඉන්නේ සිහි මූර්ජා වෙලා. මට භය ඇය නියුමෝනියා රෝගයට ගොදුරුවේවිද කියලයි"

"එහෙම නම් වහාම අපි ඇයව රෝහලකට ගෙනියමු........... ඒ වුණත් මේ කවුද එන්නෙ?" හෝම්ස් අසද්දී මම පිටිපස හැරී බැලුවෙමි.

ඩ්‍රැකියුලා පැනගිය පැත්තේ සිට, මහද හතරේ ලොකු අශ්වකරත්තයක් අප දෙසට පැමිණියේය. ශක්තිමත් අශ්වයින් ජෝඩුවක් ඇදගෙන ආ ඒ කරත්තය පැදවූයේ, කළු ලෝගුවක් හැඳ සිටි පුද්ගලයෙකි. රියේ වේගය වැඩිකිරීම සඳහා ඔහු අශ්වයින්ට තළන අයුරු මම දුටුවෙමි. මගේ මුළු ඇඟම සීතල වී ගියේය. මේ ඩ්‍රැකියුලාගේ තවත් වෙස් මාරුවක්ද?

ගල්පරය කෙළින්ම වෙරළේ අශ්ව කරත්තය නැවැත්වූ ඔහු හිස්වැස්ම ඉවත් කළේය. ඒ අශ්ව හිනාවෙන් රියැදුරා සීසර් බව අපි හඳුනාගත්තෙමු.

"හෝම්ස්" මට කෑගැසිණ. "ඒ ඇවිත් ඉන්නේ සීසර්"

"ඔව් වොට්සන්. අපි යමු ඔහු සමඟ".

සිහි විසඥ වූ කාන්තාවක ඇකින් ඔසවාගෙන, මා එන අයුරු දුටු සීසර් පුදුමයට පත්ව බලාසිටියේය. එහෙත් අපට කිසිදු අනතුරක් නොමැති බව තේරුම් ගත් පසු ඔහුගේ මුහුණේ මතුවූයේ සිනාවකි.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ" ඔහුට කියැවිණි. "වරාය පැත්තෙන් මහා පුපුරණ ශබ්දයක් ඇහුණා. මං දැනගත්තා ඒ ඔබ දෙදෙනා බව. මං හිතුවේ මහත්තුරු කෑලි කෑලි වලට කුඩුවෙන්න



http://sherlockholmesinvestigations.blogspot.com

ඇති කියලයි. උදේට තුළංපාර යන්නෙ මේ පැත්තට නිසා මං හිතුවා ඔබ දෙදෙනාගෙ මළකඳන් දෙකක් මේ පැත්තට ගොඩගහල ඇති කියල. දැන් කොහේටද මහත්තයො ඔහේලට යන්න ඕන?"

"සීසර්, ඔබ නම් නියම සමාජ සේවකයෙක්" හෝම්ස් කීය. "අපට උවමනා කරන්නේ හැකි ඉක්මනින් විට්බි රෝහලට යන්නයි."

මගේ දෑතේ හරහට ගෙන සිටි ගෙරි අමග කරත්තයට ඇතුළුවීම තරමක් අපහසු විය. හෝම්ස් ඒ සඳහා උදව් කළේය. අන්තිමට ඔහු රියට නැගුණු පසු රිය පණ ගැන්වුණ.

"හෝම්ස්" මම ඇසීමි. "දැන් ඩ්රැකියුලාට මොකද වෙන්නෙ? ඔබ ඔහුට පැන යන්න ඉඩ දෙන්නෙ නැහැ නේද?"

"කලබල වෙන්න එපා වොට්සන්. ඔහුට යන්න තියෙන ම්ලඟ නැව තව පැය එක හමාරකට පිටත්වෙන්නෙ නෑ. අපට තව වෙලා තියෙනවා" කී හෝම්ස් ක්ෂිතිජය දෙසින් නැග ආ රතු පැහැති බෝලයක් බඳු හිරු දෙස නෙත් යොමු කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

# 14

## අවසානය

මේරි වෛද්‍ය කාර්ය මණ්ඩලයට භාරකොට, අපි දෙදෙනා විට්බි රෝහලේ විවේකාගාරයේ රැඳී සිටියෙමු. රෝහල් සේවකයෙකු ලවා ගෙන්වා ගත් සුරුට්ටු දෙකෙන් එකක් උරා අවසන් කළ මම, දෙවැන්න දල්වාගැනීමට සූදානම් වීමි. හෝම්ස් මා ඇමතුවේය.

"වොට්සන්. ඔබව ටික් වෙලාවකට මෙහෙන් නැතිකරල යන්න මට සිදුවෙනවා"

"මේරිගේ තත්ත්වය කොහොමද දන්නෙ නෑ" මම කීවෙමි. "ඒ ගැන වෛද්‍යවරු කියන්නෙ මොනවද කියල දැනගන්නවත් ඔබ ඉන්නෙ නැද්ද?"

"මගේ හිතවත් මිත්‍රයා. මට තව තියෙන්නේ හරියටම මිනිත්තු හැත්තෑපහයි. මේ රටේ යනපත 'මිනිය,' 'ඕරැකියුලාගේ භීෂණය' සතුටුදායක විධියට අවසන් කළ යුතුයි. ඒ නිසා කළ යුතු වැඩ රාශියක් මට ඉතිරිවෙලා තියෙනවා. ඒකට මං වහාම වරායට යායුතුයි. මං ආපහු එද්දී වොට්සන් මහත්මිය අවදානම් තත්ත්වයෙන් මිදිල ඉඳිවි කියල මට විශ්වාසයි."

"මාත් එනවා ඔබ සමග යන්න" මගේ දෙවැනි සුරුට්ටුව අළුබඳුන තුළට දමමින් මම පැවසුවෙමි.

"ඔබේ බිරිඳ මේ වෙලාවේ, ජීවිතයයි මරණයයි අතර සටනක. ඇයට සිහිය එනකොට ඔබ මෙහේ නොහිටියොත් ඇයට මොනවද හිතෙන්නේ? මීට පස්සේ මොනවා හරි හැටලුවක් විසඳන වැඩකට මං ඔබේ සහය ඉල්ලුවොත්, ඇය ඒකට විරුද්ධ වෙන්නත් ඉඩ තියෙනවා. අනික් එක ඔබ මේ වෙලාවේ ආව කියල මට අමුතු වාසියක් සැලසෙන්නෙ නෑ. කමක් නෑ වොට්සන්. ඇගේ ස්වාමිපුරුෂයා හැටියට ඔබ මෙහේ රැඳී සිටිය යුතුමයි. ඔබේ පාඨකයන් වෙනුවෙනුත් ඔබ සිටිය යුතුයි........" ඔහු තවත් යමක් කීමට තැත්කොට මගේ අතගෙන තදින් ග්‍රහණය කරගෙන මා දෙස



http://sherlockholmesinvestigations.blogspot.com

බලාසිටියේය. මින් පෙර මා කිසිදිනෙක දැක නැති අයුරෙන් මගෙන් ඔහු සමුගත් ආකාරයෙන් මගේ සිතේ ඇති වූයේ චකිතයකි. මිළඟට එක්වරම ආපසු හැරී හෝම්ස් එතැනින් පිට වී ගියේය.

ඔහුට තනිවම එසේ යෑමට ඉඩහැරීම ගැන මට ඉක්මනින් ළතැවීමට සිදුවිය. මේරිට ප්‍රතිකාර කිරීමේදී ඔහුට සහාය විය හැකි බව මම එම අංශය භාර විශේෂඥ වෛද්‍යවරයාට පැවසුවෙමි. ඔහු ආචාරශීලී අයුරින් එය ප්‍රතික්ෂේප කළේය. එබැවින් කතාබහ කිරීමට කිසිවෙකු නොමැතිව, මට විවේකාගාරය තුළ තනිව බලා සිටීමට සිදුවිය.

මා එතැන පැය කීයක් රැඳී සිටියාද යන්න, මම නිශ්චිතව නොදනිමි. අන්තිමේදී මුහුණ පුරා රැවුලක් වවාගත් තරබාරු වෛද්‍යවරයා විවේකාගාරයට පැමිණ මා හමුවිය.

"දැන් ඇය හිරිහැරයකින් තොරව යහනේ සැතපෙමින් ඉන්නවා" ඔහු කීවේ මා නොඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමිනි. "අන්තරායදායක තත්ත්වයෙන් ඇය තවමත් සම්පූර්ණයෙන්ම මිදිල නැහැ. ඒ වුණත්, ප්‍රශ්නයේ නරකම හරිය දැන් අවසන්" මේ සීතල කාලයක් වුණත් නළල පුරා ඩහදිය බිඳු වගුරුවමින් සිටි වෛද්‍යවරයා පැවසුවේය.

"මං ගිහින් ඇයව බලන්නද?"

"කමක් නැ. ඒත් මිනිත්තු කිහිපයකට විතරයි"

මගේ බිරිඳ රඳවා සිටි කාමරයට තදින් ආලෝකය නොවැටෙන සේ ජනෙල් තිර ඇද තිබිණි. විශාල කොට්ටයක් සහිත සුදු ඇතිරිල්ලක් මැද, මට ඇය පෙනුණේ කුඩාවටය.

"අඩි ශබ්දය ඇහෙනකොටම මං දැනගත්තා එන්නෙ ඔයා බව" ඇය කීවාය. "පේනවා නේද? මටත් තියෙනවා රහස් පරීක්ෂකයෙක් වෙන්න දක්ෂතාවයක්"

"මුහුණට සිනාවක් නගා ගත්තත්, කිසිදු පිළිතුරක් දීමට මට හැකියාවක් නොතිබිණි. ඇගේ ඇඳ අසල දණගසා ගෙන, මම දෑතින්ම ඇගේ අතක් ගෙන මගේ කම්මුල මත තබාගතිමි. ඇය තවමත් ජීවතුන් අතර සිටීම මොන තරම් සතුටක්ද? මම ඒ ගැන සිතෙන් දෙවියන් වහන්සේට ස්තුති කළෙමි.

මිනිත්තු පහක් ගතවීමට පෙර සුදුපැහැති කබායක් හැඳගත් වෛද්‍යවරයෙක් කාමරයට පැමිණියේය. ඔහුගේ මුහුණ මා



http://sherlockholmesinvestigations.blogspot.com

නොදුටුවත්, ඔහු නවක වෛද්‍යවරයෙක් විය යුතු බව මම අනුමාන කළෙමි. මේරි තම දෙනෙත් පියාගත්තාය. මට කිසිදු බාධාවක් නොකළ ඔහු, රෝගියාගේ නාඩිවැටීම සෝදිසි කළේය. මීළඟට ඔහු කාමරයේ ජනේල ආවරණය කර තිබූ ජනෙල් රෙදි හොඳින් සැකසුවේ, කාමරය හැකිතාක් අඳුරුවන අයුරෙනි. කාමරයෙන් ඉවත්ව යාමට නොසිතා වෛද්‍යවරයා ගැන තැකීමක් නොකොට, මම මගේ පාඩුවේ සිටියෙමි.

"දෙස්තර වොට්සන්, ඔගේ දිගු බැල්ම පෙනෙන්නෙ මගෙන් ඈඳක හාන්සිකරල ගෙනෙනවා වගේ නම් හොඳයි කියල!"

ඒ කටහඬෙන් මා උඩ විසිවී බිම වැටුණේයයි කීවොත් නිවැරදිය. මගේ හදවත අප්‍රමාණ වේගයකින් ගැහෙන්නට පටන් ගත්තේය. මේ අඳපුවක් වැනි නිසසල තැනක, මා කිසිවිටෙකත් අසන්න බලාපොරොත්තු නොවූ යක්ෂ කටහඬෙකි. ඒ. මම ඒ හඬ හඳුනාගතිමි. ඒ කවුන්ට් ඩ්‍රැකියුලාය! ඔහුගේ නව ඇඳුම ආවරණය වනසේ ඔහු වෛද්‍යවරුන් අඳින සුදු දිග කබායක් හැඳ සිටියේය. ඔහුගේ මුහුණ, කබාය මෙන්ම සුදුමැලිය. ඇඳේ පාමුල සිට ඩ්‍රැකියුලා මා දෙස බලා දත් විලිස්සූ ආකාරයට මම තැති ගත්තෙමි. එහි ලියැවී තිබුණේ 'මරණය' යන නිමිත්ත බව මම තේරුම් ගතිමි.

"මේ මහ දවාලෙ? උඹ කොහොමද මෙහෙ ආවෙ යක්ෂයා?"

යන ප්‍රශ්නය නැගූ මම ඔහු හා ඇය අතරට පැන්නෙමි. ඇය ශාන්තව නිදමින් සිටියාය. මගේ කබායේ ඇතුළු සාක්කුවේ වූ රිවොල්වරය මගේ අතට ආවේ මා නොදැනුවත්වමය.

"මොකද මට එන්න බැරි?" ඔහු ඇසීය. "ඉර එළියෙන් මට ඒ තරම් හිරහැරයක් නෑ. එකම දේ, මට රාත්‍රී කාලයේ සලසාගත හැකි වාසි බොහොමයක්, දවල් කාලයේ ලබාගන්න බෑ. රාත්‍රී කාලයට මගේ කටයුතු වලට එරෙහිව පෙන්න කිසිම කෙනෙකුට බෑ. ඒක ඔහේ දැකල තියෙනවා නේ. නමුත් දවල් කාලයේ ඒ ආකාරයෙන්ම කරන්න බැරි නිසා තමයි, මං මේ වෙස් වලාගෙන ආවෙ. කොහොම වුණත් ඔය ආයුධයයි පැත්තකට දාන්න. රෑ වුණත් දවල් වුණත් මට වෙඩිවදින්නෙ නැහැ. කෝ ඔහේගෙ යාළුවා ෂර්ලොක් හෝම්ස්? මනුෂ්‍ය ප්‍රාණියෙක් වෙලත් ඔහු පැගෙන්න බලසම්පන්නයි. ඔහුට වික්‍රමාන්විත ක්‍රියා, අභියෝගවලට මුහුණ දෙන්නෙ නැතුව ජීවත්වෙන්න බැරි බව මං දන්නවා............ ඊත්......."



http://sherlockholmesinvestigations.blogspot.com

කිසිවෙකු තරප්පුව නැගගෙන උඩුමහලට එන ශබ්දය අසන්නට ලැබිණ. එත්වරම ජනේලය වෙත ගිය කවුන්ට්, එය බිඳගෙන එළියට පැන්නේය. කාමරයේ දොර විවෘත වූ මොහොතේම ඔහු බිම පතිත වූ බැව් මම දුටුවෙමි. හෝම්ස් කාමරයට ඇතුළුවූයේ, රැවුල වවාගත් ප්‍රධාන වෛද්‍යවරයාද, රෝහල් කාර්ය මණ්ඩලයේ තවත් දෙදෙනෙකු ද සමගිනි.

බිඳුණු වීදුරුව වෙත ගිය හෝම්ස් එතැනින් එබී බැලීය.

"ඔහු පැන ගියා......" හෝම්ස් කීවේ බලාපොරොත්තු කඩවූ විලසිනි. "සැකයක් නෑ. යන්න ඇති "සරිනා කැතරින්" නැවට. ඩ්‍රැකියුලා දැන් ඔබේ බිරිඳට මොනවත් හිරිහැරයක් කළාද?"

"නැහැ. මං හිටියේ ළඟම තමයි. ඔහුට සුපුරුදු කපටිකම කරන්න ඉඩක් ලැබුණේ නැහැ" මම පිළිතුරු දුන්නෙමි.

"මොකක්ද දැන් මෙතැන සිද්ධ වෙන්නෙ?" කෝපයට පත් වෛද්‍යවරයා විමසුවේය "ඔහේලා දෙන්නා ලෙඩෙක් අරගෙන එන්න කලින්, මේක බොහොම නිශ්ශබ්ද රෝහලක්. එක මිනිහෙක් පිස්සුවෙන් වගේ ඉස්සරහ දොර බලෙන් ඇරගෙන ඇතුළුවෙනවා. ඊළඟට තව කෙනෙක් වීදුරු ජනේලයක් කඩාගෙන උඩ තට්ටුවෙන් පහළට පනිනවා. මට ඉතිරිවෙලා තියෙන්නේ පැත්තකට වෙලා බලා ඉඳීම විතරයි. මේක තවත් ඉවසන්න බෑ. මං වහාම පොලීසිය කැඳවනවා. ඔහේලට පුළුවන් වේවි මේකට විසඳුමක් දෙන්න"

"සමාවෙන්න දොස්තර මහත්මයා" හෝම්ස් කීවේ සාක්කුවට අත දමමිනි. "මං පවුම් පහක් දුන්නොත් ඔබේ බිඳුණු ජනේලය හදගන්න හැකිවේවි නේද?"

"ඒ මුදලෙන් නම් බිඳුණු ජනේල ඔක්කොම හදල, රෝහලේ රසායනාගාරයට බන්සන් දාහකයකුත් මිලට ගන්න පුළුවන් වේවි" සතුටට පත් වෛද්‍යවරයා පැවසීය.

"මං ඔබට කිව්ව නේ වොට්සන්" මගේ මිත්‍රයා කීවේ සැනසුම් සුසුමක් හෙළමිනි. "මේ පරීක්ෂණය අපට බොහොම මුදල් වියදම් වෙන එකක් බව"

මෙරි තවදුරටත් රෝහලේ රඳවා අපි දෙදෙනා එළියට බැස්සෙමු.

"අපි දැන් ඩ්‍රැකියුලාගෙ පස්සෙන් එළවාගෙන යනවද?" මම ඇසීමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වෙනකොට ඔහුගේ නැව පිටත්වී ගිහින් ඇති." හෝම්ස් කීය. "මං ජැටියේ ඉඳල එද්දී නාවිකයෝ නැව යාත්‍රාකරවන්න සූදානම් වෙමිනුයි හිටියෙ. කොහොම වුණත් ආපහු වාර්නා වලට යනතුරු ඩ්‍රැකියුලා එළියට එවි කියල මං හිතන්නේ නෑ"

"ඒ වුණත් හෝම්ස්..... අපට පුළුවනි දුම්රියෙන් වාර්නා වලට යන්න. එහෙම ගිහින් අනුකූල අවසානයක් දකින තුරු ඇයි අපි සටන් කරන්නෙ නැත්තෙ?"

"අපි ඒ කටයුත්ත මහාචාර්ය වැන් හෙල්සිංට සහ ඔහුගේ මිත්‍රයින් පිරිසට භාරකරමු වොට්සන්. මේ ගැටලුවේ අපට භාර කොටස මෙතැනින් ඉවරයි" මගේ මිත්‍රයා කීය.

"පරීක්ෂණයක් අවසන් වෙන්න කලින් මේ ආකාරයට ඒකෙන් ඉවත්වීම සාමාන්‍යයෙන් ඔබේ සිරිත නොවෙයි?" මා කීවේ පුදුමයට පත්වය.

"පරීක්ෂණය අරඹද්දී මුලින්ම අපේ අරමුණ වුණේ, දුෂ්ට වැම්පයර්ගේ ග්‍රහණයෙන් එංගලන්තය මුදවා ගැනීම" හෝම්ස් කීය. "එහෙම නේද වොට්සන්? ඒ උත්සාහයේදී අපි නොදැනුවත්ම ඇමරිකාවත් වැම්පයර් ග්‍රහණයෙන් බේරා ගත්තා. මං හිතන්නේ, පිටින් කාගෙන්වත් ආධාර උපකාර නැතුව මැදිවයසේ මහත්වරු දෙන්නෙකුට මේ තරම් දෙයක් කරන්න හැකිවීමත් ලොකු දෙයක්. එහෙම නේද?"

"එතැනදී ඔබ නිවැරදියි කියල අපි කොහොමද දන්නෙ?" මම ඇසීමි. "වැන් හෙල්සිංල ට්‍රාන්සිල්වේනියාවට ගියත් බාගවෙලාවට ඩ්‍රැකියුලා හොයා ගැනීමට නොහැකි අසමර්ථ වේවි. අවුරුද්දක් දෙකක් ගතවෙද්දී ආපහු එංගලන්තයේ මිනිසුන්ගේ ලේ වල රස විඳින්න ඩ්‍රැකියුලා මෙහෙ එන්න ඉඩ තියෙනවා. එහෙම වුණොත්?"

"මහාචාර්ය වැන් හෙල්සිංගේ දක්ෂකම අඩුවෙන් තක්සේරු කරන්න එපා" මගේ මිත්‍රයා කීය. "ඔහු මහාපඬුබට වීර්යයෙන් වැඩ කරන මිනිහෙක්. ඔහුත් ඔහුගේ සගයනුත් රෑ දවල් නොතකා ඩ්‍රැකියුලා පසුපස ලුහුබඳින බවට සහතිකයි. අවුරුදු හාරසියක් තිස්සේ මේ කවුන්ට්වරයාට නොලැබුණු සදාකාලික සැනසීම ලැබෙන තුරු, වැන් හෙල්සිං ප්‍රමුඛ කණ්ඩායම ඒ උත්සාහය අත්හරින එකක් නෑ. තුමුත් අපි තමා මුලින්ම වැම්පයර්ගේ හිතේ මනුෂ්‍ය ප්‍රාණ ගැන භයක් ඇතිකරලා ඔහුට පැන දුවන්න


http://sherlockholmesinvestigations.blogspot.com

සැලැස්සුවේ; ඒක තමා මේ පරීක්ෂණයේ යෙදීමෙන් අපට සැලැසුණු වාසිය."

අප වීථියට පා තබද්දී හෝම්ස් නිහඬ විය. විට්බි නගරයේ ජනයා උදෑසන පිබිදී තමන්ට නියමිත වැඩකටයුතුවල යෙදෙන්නට පටන්ගත්තා පමණි.

"වේගයෙන් පැදවූ අශ්වකරත්තයක් රෝහල දෙසට ගමන් කළේය. දිගින් දිගටම සීනු නාද කරමින් පැමිණි බැවින්, ඒ ගිලන් රථයක් බව අපි තේරුම් ගත්තෙමු.

පිටුපස දොර විවෘතකළ ඔවුහු බැන්ඩේජ්වලින් වෙළූ පුද්ගලයින් කිහිපදෙනෙකු එළියට ගන්නා අයුරු අපි ඈත සිට බලා සිටියෙමු.

"මොකක්ද සිදුවුණේ?" හෝම්ස් විමසුවේ පාරේ සිටි පොලිස් භටයෙකුගෙනි.

"අද පාන්දර නැවක් මුහුදුබත් වෙලා. කුණාටුවක් තිබුණොත් නිතරම වෙන දෙයක්. කුණාටුවත් එක්ක ගහගෙන ගිහින් නැව ගල්පරයේ හැපිලා".

"හුඟක් මියගිහින්ද?"

"විස්තර මොකවත්ම නැහැ. කපිතාන් කියන්නේ නැව ගල්පරේ හැපෙන්න කලින් නාවිකයන් කඳුළුත් මුහුදට පැන්න බවයි. ඔවුනට මොකක් සිදුවුණාද කියල කවුරුත් දන්මින නැහැ. වරින්වර කීපදෙනෙක් හම්බවුණා. ඒ කිහිපදෙනෙක් තමයි ගිලන් රථ වලින් අරගෙන ගියේ"

"ඇමරිකන්කාරයෝ ඔහොම දේකට ඔට්ටු, ගස් ගල් වගේ මිනිස්සු" හෝම්ස් මා සමඟ කීවේ තවත් ගිලන් රියකට ඉඩදී පාරේ පසෙකට වෙමිනි. "ඒ වුණත් ඇල්ටිමෝ නෞකාව මහ සාගරේ මැදට යාත්‍රා කළා නම්, ඔවුනට ඩ්‍රැකියුලාගෙන් ලැබෙන්නේ දියේ ගිලෙනවාට වඩා භයානක සංග්‍රහයක්. දෙවියනේ! අපට අමතකවුණු හැටි. වොට්සන් අපි ඉක්මනින් ආපහු රෝහලට යමු. ගිහින් බලමු අපේ මිතුරා ටුප්ස් ඒ අතරේ ඉන්නවද කියල. මං හිතන්නෙ නෑ ඔහු......"

"රෝගීන් ගිලන්රථ වලින් භාරගන්නා තැන තිබුණේ මහා කලබලයකි. සමහර නාවිකයන් දියේ ගිලීමෙන් මරණයට පත්ව සිටීම ශෝකය දනවන කාරණයක් විය. ඔවුන්ගේ මළසිරුරු මෘතශරීරාගාරය වෙත ගෙන යන ලදී. මේ අතර කිසිවෙකු ගාප



http://sherlockholmesinvestigations.blogspot.com

කරන හඩ ඇසී මම සැකිමින් එදෙස බැලුවෙමි. හැඩිදැඩි නාවිකයෙකු ස්ට්‍රෙචරයක රඳවාගැනීමට උපස්ථායකයෝ දෙදෙනෙක් උත්සාහ කරමින් සිටියහ. ඔහු කවුදැයි හඳුනාගත් පසු මට ඇතිවූයේ අප්‍රමාණ සතුටකි.

"හෝම්ස්! නෙඩ් බ්‍රිජර් පණ බේරාගෙන"

ඔහුගේ නම කියනු ඇසී ඇය දෙස බැලූ බ්‍රිජර්ගේ සිතේ ද සතුටක් ඇතිවූ බැව් අපි දුටුවෙමු.

"මෙක මලවුන්ගෙන් නැගිටීමේ රාත්‍රියක්" හෝම්ස් කීවේ සතුට පිරුණු මුහුණෙනි. "ඉස්සර වෙලාම මම. ඊළඟට ඔබ. උසාවියකදී මගෙන් ඇහුවා නම්, මං දිවුරලා කියනවා යාත්‍රාව පුපුරන්න කලින් බ්‍රිජර්ට මුහුදට පැනගන්න බැරිවුණා කියලා"

"ඔබ එහෙම කිව්වා නම් ඒක නිවැරදියි හෝම්ස් මහත්මයා" බ්‍රිජර් කීය. "බොයිලේරුව පුපුරද්දී මං අඩි පහළොවක් විතර ඉහළට විසිවුණා. ඒ වුණත් පහළට වැටුණේ හොඳ සිහිකල්පනාව ඇතුව. ඒ නිසා මට හැකිවුණා ගොඩට පීනන්න. මට ඇතිවුණේ සුළු තුවාල කිහිපයක් විතරයි"

මීළඟට ඔහු මා දෙසට හැරුණේය. "අහෝ කොහොමද මිත්‍රයා. ඔබේ බිරිඳ ඔබට ලැබුණාද?"

"ඔබට ස්තූතිවන්තවෙන්න ඇය ලැබුණා"

"අර තක්කඩි අපරාධකාරයාට මොකද වුණේ?"

"ඔහු අදට අපෙන් බේරුණා" හෝම්ස් කීය. "නමුත් ඔහු පිටිපස ලුහුබඳින කණ්ඩායමක් ඉන්නවා. මං හිතන්නේ නෑ ඔහුට ඔවුන්ගෙන් ගැලවීමක් තියෙයි කියලා"

"ඒක නෙමෙයි හෝම්ස්" මම ඇසීමි. "බැල්ටිමෝර් නෞකාවේ තිබුණු පස්පෙට්ටියට මොකද වුණේ? ඒක නැතුව ඩ්‍රැකියුලාට කොහේවත් යන්න හැකියාවක් නැහැ නේද?"

මගේ මිත්‍රයාගේ මුහුණේ හැඟීම් වල කිසිදු වෙනසක් නොවීය. "මගේ හිතවත් වොට්සන්. ඔබ සමඟ හෝටලේ නොහිටි වෙලාවේ මං ගියේ කොහේ කියලද ඔබ හිතන්නේ? මං ගියා බැල්ටිමෝර් නෞකාවට. ඔහු කවුරුන් හරි එවලා පස්පෙට්ටිය ගෙන්වාගන්න බව මං දැන හිටියා. ඒ නිසා මං බලාපොරොත්තු වුණේ, ඔහුට කලින් ගිහින් පස්පෙට්ටිය මුහුදට පෙරලා දමන්න. නමුත් ඒක සාර්ථක වුණේ නෑ"

"සාර්ථක වුණේ නෑ?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඩ්‍රැකියුලා මට වඩා එක පියවරක් ඉදිරියෙන්. ඔහු කවුරුන් හරි එවලා පස්පෙට්ටිය නැවෙන් ඉවත් කරගෙන ගිහින්. ඒක ඔහු ළඟ ඇති"

මගේ මුහුණේ ඇතිවූ බලාපොරොත්තු කඩවූ සලකුණු ඔහු දකින්නට ඇත.

"ඒ ගැන අමතක කරල දමන්න වොට්සන්. ඇඳුම් මාරුකරගෙන ටිකක් විවේක ගත්තාම ඔබේ ඔය දොම්නස් හැඟීම් පහවෙලා යාවි. ඒ වෙනකොට වොට්සන් මහත්මියගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් අතට හැරී ඇති බව අපට දැනුම් දේවි. ඒ ගැන මට සැකයක් නෑ. ඒක නෙමෙයි මිත්‍රයා. අපි දෙන්නට හෝටලයක නවාතැන් ගන්න, ඔබ අතේ සෑහෙන තරම් මුදල් ඇති කියල මං විශ්වාස කරනවා.........."

Reading Purpose Only



http://sherlockholmesinvestigations.blogspot.com

# 15

# අලුත් අභිරහසක්

විහිදුණු ලේ පිපාසිතයාගෙන් එංගලන්තය මුදවා ගැනීමෙන් පසු, අප වෙත ළඟාවූ පළමු නොවැම්බර් මාසයයි මේ. ශීත සෘතුවේ හිම වැටීම ඇරඹී තිබිණ. මම විසිත්ත කාමරයේ මගේ හාන්සි පුටුවට වී නවකථා පොතක් කියවමින් සිටියෙමි. මේරි ඇගේ උකුළ මත වුල් බෝලයක් තබාගෙන, ගොතන කටු වලින් යම් ඇඳුමක් ගොතමින් සිටියාය. රාත්‍රි දහයේ ඝණ්ඨාසම ඔරලෝසුවේ නාදවිණි. නිදිබරව සිටි මම එයින් අවදිවූයෙමි. පොත වසා තැබූ මම නින්දට යාමට සූදානම් වුණෙමි. කිසිවෙකු අප නිවසේ සීනුව නාද කළේ ඒ මොහොතේමය. මේරි ඇගේ අතේ වූ ගෙතුම ඉවතට දමමේ සුසුමක් හෙළමිනි.

"තවත් ලෙඩෙක්" ඇය කීවාය. "ඔයා අද දවස තිස්සෙම ලෙඩුන් බලලා හරි මහන්සියෙන් නේද හිටියේ?"

"ඒත් ඉවරයක් නෑ වගෙයි පෙනෙන්නේ" කී මම ඉදිරි දොර වෙත ගියෙමි. දොර විවෘත කළ මට දකින්නට ලැබුණේ මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස්ය.

"මේ තරම් රෑ වෙලත් තවම නින්දට ගියේ නැද්ද වොට්සන්?"

"හෝම්ස්!" මා කීවේ අතිශය සතුටෙනි.

"මේ හිම වැටෙන වෙලාවේ? එන්න ඇතුළට. ඔබව හුඟක් දවසකින් මට හමුවුණේ නෑ. මං හිතුණේ මං ඔබව අන්තිමට දැක්කේ.........."

"............. බැංකුහොරා චෙඩ් මැක්ග්‍රා අල්ලන්න අපි ස්කොට්ලන්තයට ගිය ගමනේදී නේද?" ඔහු කීවේ විසිත්ත කාමරයට පිවිසෙමිනි. ගමන්බිමන් වල යෙදීමට අඳින ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි ඔහුගේ, හිස්වැස්ම හා උරහිස් මත අලුත් හිම තැන්පත් වී තිබිණ. මේරි දුටු වහාම ඔහු හිස්වැස්ම ඉවත් කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"අන්න වොට්සන් මහත්මයාගේ අතේ තියෙනවා ශරීරය උණුසුම්ව තියාගන්න හොඳ ඇඳුමක්. මොනවද වොට්සන් මහත්මිය මේ සැරේ ගොතන්නේ? ස්වෙටරයක්ද? නැත්නම් දෙස්තර මහත්තයාට මෆ්ලරයක්ද?"

"ඒ එකක් වත් නෙමෙයි" මෙරි කීවේ හෘදයංගම සිනාවක් පා ඔහු පිළිගනිමිනි. "ඒක ලෝම් කබායක්. ඔබ පුදුමයට පත්කරවමින් ඔබට නත්තල් තෑග්ගක් හැටියට අඳින්නයි ගොතන්න පටන්ගත්තේ. මොකෝ දැන් මේ විස්තර අහලා, ඔබ ඔක්කොම අවුල් කළා නේ"

"එහෙනම් ඒක දැක්ක බව මං අමතක කරන්නම්" මගේ මිතුරා කීය. "ස්තුතියි වොට්සන්. ඒ වුණත් බය වෙලා හිටි ඉන්න වෙලාවක් නෑ. මං ආව කුලීරිය ගේට්ටුව ළඟ. රියැදුරා මං එනතුරු බලාගෙන ඉන්නවා. තව පැය භාගයකින් නැව පිටත්වෙනවා. මං ඒක අල්ලා ගත යුතුයි"

"මොනවා? කොහේද ඔබ යන්නේ? යුරෝපයටද?" මම ඇසීමි.

"විසඳීමට ටිකක් කාලය ගතවෙන ගැටලුවක් මට ලැබිල තියෙනවා" හෝම්ස් කීවේ උරහිස් මත වූ හිම ඉවතට පිස දමමිනි. "නෑ නෑ මගේ මිත්‍රයා. මං මේ ආවේ ඔබව ඒකට කැඳවාගෙන යන්න නෙමෙයි" ඔහු කීවේ මා කතා කිරීමට සූදානම් වෙන අයුරු දකිමෙනි. "පහුගිය දිනවල අපට මුහුණ දෙන්න වුණු අත් දැකීම බොහොම වෙහෙසකාරී එකක්. ඒ නිසා මේ තරම් ඉක්මනට ඔබේ බිරිඳගෙන් ඔබව උදුරාගන්න, මං හීනෙකින් වත් හිතන්නේ නෑ. ඒ ගැන අපි වාද කරන්න උවමනා නැහැ. මේ ගමන තනිව යන්න මං තීරණය කරල ඉවරයි වොට්සන්.

වරායට යන ගමන් මට හිතුණා ඔබ දෙදෙනාට කතාකරලා, ශුභ පතල යන්න. අනෙක මට ලැබුණු මේ විදුලි පුවත පෙන්වල යන්න.

"හැමදෙයක්ම සාර්ථකයි. ඔහු මියගියා. අනාරාධිතවම ඔබෙන් ඉටුවී තිබූ සියලු උපකාරවලට මගේ කෘතඥතාව පිළිගන්න.

ඒ. වී. එච්.

වාර්නා, බල්ගේරියාව."

"ඒ. වී. එච්. කියන්නෙ?" මම ඇසීමි.

"ඒබ්‍රහැම වෑන් හෙල්සිං" හෝම්ස් කීය.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඩ්‍රැකියුලා මේ ලෝකයෙන් සදහටම සමුගෙන වගෙයි. මගේ සිහිවටන එකතුවට අමුණාගන්න මේ විදුලිපුවත ප්‍රයෝජනවත්. මේ පරීක්ෂණය මතක් වෙන්න මට ඇති එකම සිහිවටනයත් ඒකයි"

"අපි ඩ්‍රැකියුලා සමග සටනක යෙදිලා කළ කී දේ ගැන වෑන් හෙල්සිංල දැනගත්තෙ කොහොමද? ඔවුන් එය දැනගත් බවක් මං දැනහිටියේ නෑ"

මා කීවේ විදුලිපුවත ආපසු මගේ මිතුරා අතට දෙමිනි.

"ඔහු මුල ඉඳලම ඒ ගැන දැනහිටියා. මං ඔබට කිව්වේ වෑන් හෙල්සිංගේ දක්ෂකම ගැන අඩුවෙන් තක්සේරු කරන්න එපා කියලා" කී මගේ මිත්‍රයා අසුනෙන් නැගිට්ටේය.

"එහෙනම් ඔබ දෙදෙනාට සුභ නත්තලක් සහ වාසනාවන්ත නවවසරක්! අනුවශෙන්දී අපි නැවත හමුවෙමු."

"එසේම වේවා! හෝම්ස් අපට අලුත් අවුරුද්දෙ ලැබෙන්න තියෙන්නෙ මොන වගේ අභිරහස් හා අද්භූත ගැටලු වේවිද දන්නෙ නෑ?"

"මගේ හිතවත් මිත්‍රයා. ඒක නම් ඔබට වගේම මටත් අභිරහසක්." කියා අපෙන් සමුගත් ඔහු හිම වැස්සේ අන්ධකාරයේ නොපෙනී ගියේය.



http://sherlockholmesinvestigations.blogspot.com

# වාල්ටන් මිනීමැරුම

බටහිර යුරෝපයට අධික ශීතලක් දැනුණු එම වර්ෂය ..........' බව මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. මගේ බිරිඳගේ අකල් මරණයෙන් පසු, මම යළිත් වරක් බේකර් වීථියේ නිවසනේ පදිංචියට ගොස් සිටියෙමි. නොවැම්බර් මාසයේ මුල්සතිය වනවිටත්, ලන්ඩන් නගරය මීදුමෙන් වැසී යාමට පටන්ගෙන තිබිණ. ඒ දිනවල අභිරහස් ලෙස පෙනුණු පරීක්ෂණ කිහිපයක්ම ලැබිණ. එහෙත් ඒ එකක් වත් මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ සිත් ඇද ගැනීමට සමත් වී තිබුණේ නැත. කිසිදු සැඟවුණු අභිරහසක් නොතිබුණු ඒ අපරාධ, ස්කොට්ලන්ඩ්යාඩ් හි ලෙස්ට්‍රේඩ් ආදීන්ට වුවද පහසුවෙන් විසඳිය හැකි ඒවා බව මගේ මිත්‍රයාගේ අදහස විය.

හඩ්සන් මහත්මිය අපේ උදේ ආහාරය සූදානම් කරන තුරු එදා අපට නොයෙක් වැඩ කටයුතු තිබිණි. උදෑසන පුවත්පත් කිසිවක් තවමත් අප වෙත ලැබී නොතිබිණි. එහෙයින් හෝම්ස් පෙර සතියේ පුවත්පත් වලින් කපා වෙන්කරගත් අපරාධකරුවන් පිළිබඳ වාර්තා කිහිපයක් තම "ස්ක්‍රැප්" පොතක අලවමින් සිටියේය. මම විලියම් ක්ලාක් රසල්ගේ මුහුදු කථාන්තර පොතක් කියවීමට පටන් ගත්තෙමි.

"ඔබ මොනවා කිව්වත් වොට්සන්, මහාචාර්ය මොරියාටිගේ වැටීමත් සමග ලන්ඩන් පාතාල ලෝකය සම්පූර්ණයෙන්ම බිඳ වැටුණා. සෙබස්ටියන් මොරාන් ඇතුළු අපරාධකාරයන්ට යන එන මං නැතිවුණා. 'M' අකුරෙන් නම සඳහන් අපරාධකාරයන් අතර කී දෙනෙක්ද තවමත් නිදහසේ ඉන්නේ? හොර සල්ලි අච්චු ගැහූ මොරිසන් හිරේ. මිනීමරපු මැකෙන්ලි, මේබ්‍රික් දෙන්නාම පෝරකයට ගියා. ජෝන් මාටින් මැරවරයාගේ නඩුව තවමත් ඉවර

---

* අත් පිටපතේ මේ වර්ෂය සඳහන් වූ ස්ථානය පොත් කාලුන් විසින් කා දමා ඇති හැවින් වර්ෂය නිශ්චිතව සඳහන් කළ නොහැක. එහෙත් වෙනත් කථාවක වොට්සන් සඳහන් කරන්නේ මෙය තමා හමුවීමටත් පෙර හෝම්ස්ට යොමු වූ අභිරහසක් බවයි? - පරිවර්තක



http://sherlockholmesinvestigation.blogspot.com

නැගෑ. මංකොල්ලකාරයො මගෙරිජ් දිවි ඇති තෙක් හිරේ. අපට තවම අල්ලගන්න බැරිවුණේ මැකල්ටන් සහ මුවර්හෙඩ් පමණයි. එයාලටත් වැඩි දවසක් හැංගිලා ඉන්න මං ඉඩ තියන්නෙ නෑ."

ඔහුගේ එම කථාව සිදු කෙරෙද්දීම හඩ්සන් මහත්මිය අපේ උදේ ආහාරය උඩුමහලට එව්වාය. සෑහෙන තරම් කුසගින්නේ සිටි අපි තවත් පමාතොවී ආහාර ගැනීම ඇරඹුවෙමු.

"ඔබ දන්නවද වොට්සන්, හඩ්සන් මහත්මිය ආහාර පිළියෙළ කිරීමට කොයිතරම් දක්ෂ වුණත්, සමහර දේවල් ඇය පිළියෙළ කරන්නේ මගේ වටයේරු අනුව බව?"

"උදාහරණයක් වගයෙන්?"

"උදාහරණ කීපයක්ම මට දෙන්න පුළුවනි. එකක් තමා මේ බේකන් හා විස් මිශ්‍ර ඔම්ලට් එක........"

"කිසිවෙකු අප නිවසේ දොරටුව අසල ඉගිම් කාන්තාවගෙන් යමක් විමසනු ඇසී, මගේ මිත්‍රයා කථාව නැවැත්විය. මීළඟට ඒ අමුත්තා වේගයෙන් තරප්පු පෙළ නැග උඩුමහලට එන ශබ්දය අසන්න ලැබිණ. කෑම සැපීම මදකට නැවැත්වූ හෝම්ස්, තත්පර කිහිපයක් සවන් යොමුකරගෙන සිටියේය. අනතුරුව ඔහුගේ දෙනෙත් දීප්තිමත් වෙන අයුරු මම දුටුවෙමි.

"මට වැරැද්දක් නොවෙයි නම්, මේ එන්නේ අපේ හිතවත් ග්‍රෙග්සන්. ඔහු අපට මොනවා හරි ගැටලුවක් අරගෙන එනවා" හෝම්ස් කීය.

අමුත්තා දොරට තට්ටු කරද්දී අපි ඔහු ඇතුළට කැඳෙව්වෙමු.

"සුභ උදෑසනක් ග්‍රෙග්සන්. ඇතුළට එන්න. අපි නම් දැන් තමයි උදේ ආහාරය ගන්නෙ. ඔබත් ඇවිත් මෙහෙන් වාඩිවෙන්න......." මගේ මිත්‍රයා කීය. ඔහු පැවසූ අයුරින්ම අමුත්තා වූයේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ අපරාධ පරීක්ෂකයෙකු වූ ටෝබියස් ග්‍රෙග්සන්ය.

"සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා. මං ඇත පාරෙ එන හැටි ඔබ ජනේලයෙන් දුටුවාද? නැත්නං කොහොමද මං එන බව දැනගත්තෙ?"

"මෙච මේ විධියට තේරුම් කරලා දෙන්න ගියාම, ඊළඟට කිසිකෙනෙක් මගේ හපන්කම් අගය කරන්නෙ නැතුව යනවා." මගේ මිතුරා කීවේ කෝපි පෝච්චිය ග්‍රෙග්සන් දෙසට ළං කරමිනි.


http://sherlockholmesinvestigations.blogspot.com

"මෙහේ නිතර යන එන අයගේ අඩි ශබ්ද වලින් ඔවුන් හඳුනා ගැනීම ඒ තරම හපන්කමක් කියල මං හිතන්නේ නෑ. කෙට්ටු, බරෙන් අඩු පුද්ගලයෙකු වන ලෙස්ට්‍රේඩ් ගේ අඩි ශබ්දය එක විධියක්. ටිකක් තරබාරු ඔබේ අඩි ශබ්දය ඊට වඩා තියුණුයි. ස්ටැන්ලි හොප්කින්ස්ගේ තියෙන්නේ ඊට වඩා වෙනස් පියවර හඬක්. බ්‍රැඩ්ස්ට්‍රීට්ගේ අඩි ශබ්දය බොහොම වේගවත්; ඔහු තරප්පු පෙළේ දුවනවා වගෙයි. මේ මගේ හිතවත් දෙස්තර මහත්මයා තරප්පු පෙළ නගින්නේ වෙනත්ම ආකාරයකට. මට හඳුනාගන්න පහසුම, ඔහු උඩුමහලට නගින හඬ...............ා.. කෝපි කෝප්පයක් බොන ගමන් කථා කරමු. අද උදේ පාන්දරින්ම ඔබ ආවෙ, අඩි ශබ්ද වලින් පුද්ගලයින් හඳුනාගැනීම ගැන, මගෙන් ඉගෙනගන්න කියල මං හිතන්නේ නෑ?"

"නැහැ හෝම්ස් මහත්මයා. මේක ඊට වඩා බරපතල කාරණයක්" ග්‍රෙග්සන් කීවේ සුරුට්ටුව නිවා දමා කෝපි කෝප්පයක් වත් කර ගනිමිනි. "ඔබතුමා කෑම කාල අවසන් කළාම කථාව කියන්නද? නැත්නම්........"

"අපි මේ කෑම කන්න පටන්ගත්තා විතරයි" හෝම්ස් කීය. "මං වඩා කැමතියි, ඔබේ කථාන්තරය වහාම පටන් ගන්නවා නම්. එතකොට කෑම කාල අවසන් වුණු වහාම, අපට පුළුවනි ක්‍රියාත්මක වෙන්න"

කෝපි කෝප්පයට සීනි හැඳි හතරක් පහක් දමාගත් ග්‍රෙග්සන් මිනිත්තු කිහිපයක් නිහඬව කල්පනා කළේය. ඔහු කථාව පටන් ගත්තේ ඉන්පසුවය.

"මහත්මයා. මේක තුන් මිනීමැරුමක්. මියගිය තුන්දෙනාම කාන්තාවෝ!"

"දෙයියෝ සාක්කි!" මට කියැවිණි.

"ඔව් වොට්සන් මහත්මයා. මහ අපරාධයක්. සිද්ධිය වෙලා තියෙන්නේ ඊයෙ උදේ දහයත් දවල් දෙකටත් අතර. ලෙස්ටර්ෂයර් ප්‍රාන්තයේ මික්හැම් වලට නුදුරු ආර්ච්හිල් නම් ගම්මානයේ. කැඳවීම ලැබුණු ගමන් ඊයේ හවස දුම්රියෙන් මං පිටත්වෙලා ගියා. මං මූලික පරීක්ෂණය පැවැත්වුවා. නමුත් මෙතැන මොකක් හරි ලොකු අභිරහසක් තිබෙනවා වගෙයි මට එක්වරම හිතුණේ. ඒක නිසා මේක අපි තවත් අවුල් කරන්නේ නැතිව ෂර්ලොක් හෝම්ස්



http://sherlockholmesinvestigations.blogspot.com

මහත්මයාට භාරදිය යුතුයි කියලා මට හිතුණා. මං එම ස්ථානයට පොලිස් ආරක්ෂාව යොදලා, අද උදේ පාන්දරින්ම ආවේ ඔබතුමාව කැඳවාගෙන යන්න" පොලිස් නිලධාරියා එක හුස්මට කියාගෙන ගියේය.

හෝම්ස්ගේ මුහුණේ මා දුටුවේ අතිශය සතුටට පත් සිනාවකි.

"විශිෂ්ටයි ෆෙර්ගසන්" හෝම්ස් කීය. "දැන් මං කැමැතියි සිද්ධිය පිළිබඳ තොරතුරු මුල සිටම දැනගන්න"

"ලන්ඩන් සිට දුම්රියෙන් උතුරට යද්දී ලෙස්ටර්ෂයර් ප්‍රාන්තයේ අපට හමුවෙනවා හැමල්ටන් නම් දුම්රියපොළක්. ඒ ලෙස්ටර් නගරයට ළඟාවෙන්න හැතැක්ම දහයකට එකොළහකට කලින්. සිද්ධිය වුණු තැනට ළඟාවෙන්න, හැමල්ටන් වලින් දුම්රියෙන් බැහැලා, හැතැක්ම තුනහමාරක් පමණ රට ඇතුළට යා යුතුයි. එතකොට තමයි මේ සිද්ධිය වුණු ආවිහිල් ගම්මානය අපට හමු වෙන්නේ. ඔබ සමහරවිට අහලත් ඇති. ආවිහිල්වල තමා, ඒ පළාතේ තිබෙන පැරණිම මානසික රෝහල තියෙන්නේ. අපරාධය සිදු වුණේ මේ රෝහලට යාර දෙතුන් සියයක් දුරින්, වත්තක් මැද පිහිටි විශාල නිවසක. මේ ගෙදර වාසය කළේ අවුරුදු පනස්පහක් වයසැති විවියන් වාල්ටන් මහත්මියයි. ඇගේ අවුරුදු දහහතක් වයසැති දියණිය ජූන් වාල්ටන් මෙනෙවිය සහ ගෙදර සේවිකාව ශේරා වුඩ්හැම් මහත්මිය. ඇය අවුරුදු හැටපහක් පමණ වයස්ගත තැනැත්තියක්. මේ තුන්දෙනා මරණයට පත්වෙලා තියෙන්නේ වෙඩිවැදීමෙන්. මං කියන ඒව ඔබට පැහැදිලිද හෝම්ස් මහත්මයා?"

"ඔව් පැහැදිලියි. දිගටම කියන්න"

"මේ පවුලට අයත් තවත් ගෘහ සේවිකාවක් ඉන්නවා, සුසාන් ජෝන්ස් නම් තැනැත්තියක්. ඇය තමයි සාමාන්‍යයෙන් මේ ගෙදර මුළුතැන්ගෙයි වැඩ කරන්නේ. නමුත් වාල්ටන් පවුලේ ඥාති පවුලක සේවිකාව මේ දිනවල අසනීපයෙන්. ඒ නිසා සුසාන්ව ඒ ගෙදර කටයුතු සඳහා යවලයි තිබුණේ. ඒ ගෙදර කෑම උයාදුන් සුසාන්, ආපසු වාල්ටන් නිවසට ඇවිත් තියෙනවා. අපරාධය මුලින්ම දකින්න ලැබී තියෙන්නේ ඇයට. ඇය වහාම පොලිසිය කැඳෙව්වා."

"වාල්ටන් පවුල ගැන මොනවද ඔබට දැනගන්න ලැබුණු තොරතුරු?"


http://sherlockholmesinvestigations.blogspot.com

"විවියන් වාල්ටන් මහත්මිය අවුරුදු දෙක තුනකට පෙර ඇගේ සැමියාගෙන් වෙන්වුණු බවයි මට දැනගන්න ලැබුණේ. ඔහු හෙක්ටර් වාල්ටන් නම් කෙනෙක්; බීර කර්මාන්ත ශාලාවක හිමිකරුවෙක්. ඔහු දැනට ජීවත්ව සිටින්නේ හකල්ටන් සිට සැතපුම් හතරක් පමණ ලන්ඩනය පැත්තට තිබෙන නිව් බෙවර්ලි නගරයේ"

"මං හිතනවා ග්‍රෙග්සන් අපි කවදාවත් පමා නොවී වහාම ඔබ සමග ආවොත් හොඳයි කියලා," කෑම අවසන් කළ හෝම්ස් කීවේ දුම්රිය කාල සටහන පරීක්ෂා කරමිනි.

වහා හැඳ පැළඳගෙන අපි පිටත්ව ගියෙමු. තවත් මිනිත්තු දහයක් ගතවෙද්දී ලෙස්ටර්ෂයර් ප්‍රාන්තය බලා පිටත්වෙන උදේ දුම්රිය අල්ලාගැනීමට දුම්රිය ස්ථානයට ළඟාවීමට අපට හැකිවිය. "වාල්ටන් මිනීමැරුම" නමින් පුවත්පත් වාර්තාකරුවන් හැඳින්වූ මේ අපරාධය පිළිබඳ තොරතුරු, එදින පුවත්පත් රැසකම මුල් පිටුවේ පළවී තිබිණ. එහෙත් ග්‍රෙග්සන්ගෙන් දැනගන්නට ලැබුණු තොරතුරු වලට වැඩියමක් පුවත්පත්වල නොවිය.

හකල්ටන් දුම්රිය පොළේ දී [illegible] හතරේ කුලී රියකට නැඟුණු අපි ආවිහිල් බලා පිටත් වී ගියෙමු. ගල් දැමූ සකස් කළ පාර අශ්ව කරත්ත ගමනාගමනයට යෝග්‍ය එකක් විය. මේ ප්‍රදේශයේ වැසියන් ජීවත් වූයේ සත්ත්ව පාලනයෙන් හා ගොවිතැනින් බව, පාර දෙපස වූ විශාල ගොවිපොළ හා ගොවි බිම් වලින් අපි තේරුම් ගත්තෙමු.

සැතපුම් තුනක් පමණ ඉදිරියට ගිය පසු පාරේ වම් පැත්තේ දක්නට ලැබුණේ විශාල ජලාශයකි. ආවිහිල් විල නමින් හැඳින්වුණු එය ස්වාභාවික ජලාශයක් බව ග්‍රෙග්සන් කීය. ජලාශය අවසන් වුණු වහාම පාරේ වම් පැත්තට වැටුණු පාර අසල විශාල නාම පුවරුවක් විය. "ශාන්ත ඇන්ඩෘ බෝස්ටල් පාසල" යනුවෙන් එහි සඳහන්ව තිබිණි. ජලාශය මැද පිහිටි විශාල දූපතක් වැනි උස් ගොඩබිම් කොටසක, බාලාපරාධකරුවන් හික්මවීමට යොදාගත් බෝස්ටල් පාසල පිහිටා තිබූ බැව් [illegible] පැවසුවේය. එම අඩවිය පසුකොට යාර දෙසියයක් පමණ යද්දී, ග්‍රෙග්සන් කලින් සඳහන් කළ මානසික රෝහල අපි දුටුවෙමු. පාරේ දකුණු පසින් වූ උස් කඳු මුදුනක පිහිටි එය කටුකම්බි වැටකින් වටකර තිබිණි. "ආවිහිල් රෝහල" යනුවෙන් නම් කර තිබූ එහි තිබුණේ රෝහලකට වඩා


http://sherlockholmesinvestigations.blogspot.com

බන්ධනාගාරයක පෙනුම බව මට සිතිණි. වෝල්ටන් නිවස සහිත වත්ත තිබුණේ එම පාරේම තවත් සැතපුම් කාලක් පමණ ඉදිරියෙනි.

සැහෙන සෙනගක් එතැන රැස්වී සිටියත්, කිසිවෙකුට එහි ඇතුළුවීමට ඉඩ නොලැබෙන සේ පොලිස් නිලධරයෝ රැකවල් දමා සිටියහ. ප්‍රාදේශීය වෛද්‍යවරයා ද එහි පැමිණ සිටියේය. එහෙත් පොලිස් නිලධරයන්ගේ ඉල්ලීම අනුව ලන්ඩන් නගරයෙන් ෂර්ලොක් හෝම්ස් මහතා පැමිණ පරීක්ෂා කොට අවසන් කරන තුරු, මරණ පරීක්ෂණය ඇරඹී නොතිබිණි.

"ෆෙග්සන්. ඔබ දුන්නු නියෝග, වෝල්ටන් පොලිස් නිලධරයන් අකුරටම අනුගමනය කළා වගෙයි" හෝම්ස් කීය.

"ඔව් මහත්මයා, මෙතන ප්‍රධානියා හැටියට ඇවිත් ඉන්නේ ස්කොට්ලන්ඩ්යාඩ්හි මගෙන් පුහුණුව ලැබූ තරුණයෙක්. වයසක කෙස් පැහුණු අය වගේ නෙමෙයි. මේ තරුණයන්ට යමක් කියා දුන්නාම මතක හිටිනවා. ඒ වගේම ඒ උපදෙස් ක්‍රියාත්මක කරනවා. අපරාධ පරීක්ෂණ ගැන ඔවුනට හොඳ වැටහීමක් තියෙනවා"

ප්‍රධාන පාරේ සිට යාර පනහක් පමණ දුරින් උස් බිමක් මත වෝල්ටන් නිවස දිස්විය. අවුරුදු පනහකට හැටකට පෙර ගොඩ නංවන ලද තනි තට්ටුවේ ගෙයක් වූ එය තරමින් විශාල, ශක්තිමත් එකක් බැව් ඇතට පෙනිණ. ඉඩමේ ආරක්ෂාවට පාර අයිනේ දිගටම ගස් සමග සම්බන්ධ කොට තැනූ උස් මායිම් වැටක් තිබිණි. පැරණි ගේට්ටුවක් තිබුණත් එය නිතරම අගුළු දමා තබන වර්ගයේ එකක් නොවීය. වත්තේ හෝ නිවසේ ආරක්ෂාව පිළිබඳව අයිතිකරුවනට ප්‍රශ්නයක් නොතිබූ නිසාදෝ, ඔවුන් හොඳ ගේට්ටුවක් ගැන සැලකිලිමත් නොවන්නට ඇත. නිවස වටේටම ඉඩමේ මල් හා පළතුරු වර්ග විශාල වශයෙන් පාලා තිබිණි. මීට අමතරව නිවසට පිටුපසින් පිහිටියේ කටුකම්බි වැටකින් වෙන් කෙරුණු විශාල කැලෑරොදකි. පසුව අපට දැනගන්නට මෙන් දකින්නට ලැබුණු පරිදි එය වලිකුකුළන්, හාවුන්, නරින් දඩයම් කිරීම සඳහා වෙන්කොට තිබූ, වෝල්ටන් පවුලට අයත් දඩබිමකි. මළසිරුරු දෙකක්ම අපට දක්නට ලැබුණේ මේ කම්බි වැට හා නිවස අතර වූ හිස් බිම්කඩ තුළය.

විවියන් වෝල්ටන් මහත්මිය මුහුණ යටිපැත්තට සිටිනසේ වැටී මියගොස් සිටි අතර, ඊට යාර දහයක් පමණ නුදුරින්, ඇගේ



http://sherlockholmesinvestigations.blogspot.com




Reading Purpose Only Not For Print



http://sherlockholmesinvestigations.blogspot.com

දියණිය වූ ජුන් වාල්ටන් ද මුහුණ යටිපැත්තට සිටින සේ වැටී මියගොස් සිටියාය. මළසිරුරු අසල විශාල වශයෙන් ලේ ගලාගොස් තිබිණි. අනෙක් මියගිය තැනැත්තියගේ මෘතශරීරය තිබුණේ නිවස ඇතුළත බැව් අපට අසන්නට ලැබිණි.

වයස අවුරුදු පනස්පහක් යයි පැවසුණු විවියන් වාල්ටන්ට තිබුණේ ඊට වඩා තරුණ පෙනුමකි. උරහිස් තෙක් දිගට වැවූ රන්වන් පැහැති කෙස් කළඹක් ඇය සතුවිය. හැට්ටයට උඩින් ජර්සියක් ද දිග කලිසමක් ද හැඳ සිටි ඇය, දෙපාගේ දණහිස තෙක් ආවරණය වන "ගම්බූට්ස්" වර්ගයේ සපත්තු පැළඳ සිටියාය. ඇගේ දියණිය ජුන් ද හැඳ සිටියේ මවගේ ආකාරයේම ඇඳුමක් හා එම වර්ගයේම ගම් බූට්ස් සපත්තුය. කෙට්ටු උස ශරීරයක් තිබූ තරුණියගේ රන්වන් පැහැති ඉහස කෙටියට කපා තිබිණි. දෙදෙනාටම වෙඩි පහර එල්ල වී තිබුණේ හිසේ පිටුපසටය. ඒවා ඉතා ළඟ සිට තැබූ වෙඩි පහරවල් බව දුටු වහාම මම වටහා ගත්තෙමි.

මළසිරුර පරීක්ෂා කිරීමට පෙර හෝම්ස් මුලින්ම කළේ බිම වැතිරී, මළසිරුර අවට පොළොව පරීක්ෂා කිරීමය. විටෙක තමාටම යමක් කියාගනිමින්, විටෙක තළල රැලිකර ගනිමින්, මළසිරුර වටේ පොළොව පරීක්ෂා කළ ඔහු, මීළඟට සෙමෙන් සෙමෙන් නිවස දෙසට ගියේය. එතැනින් යළිත් කම්බි වැටේ පිහිටි කඩුල්ල අසලට ගොස්, එතැන බිමට ලං වී යළිත් වරක් පොළොව නිරීක්ෂණය කළේය. මීළඟට පරෙස්සමින් බිම අඩි තබමින් ජුන් වාල්ටන් මෙනෙවියගේ මළ සිරුර වැටී තිබුණු තැනට පැමිණෙද්දී, ඔහු තමාටම සිනුරුහන් කරගත් අයුරු මම දුටුවෙමි. අනතුරුව ඔහු පොලිස් භටයෙකු ලවා දුඹුරු කඩදාසි කවර කිහිපයක් ගෙන්වා ගත්තේය. පතරොම් වල හිස් තොප්පි කිහිපයක් එක් මල්ලක් තුළට දැමූ ඔහු, වියැළුණු කොළ ගොඩක් අසළ තිබී ඔහුට හමුවුණු සුදු පැහැති අත් වැස්මක් තවත් මල්ලක් තුළට දමා ගත්තේය. මීළඟට ඔහු මවගේ හා දුවගේ මළ සිරුරු ද ඔවුන්ගේ මතුපිට ඇඳුම් පැළඳුම් ද පරීක්ෂා කළේය.

කිසිදු කතාබහක් නොකළ හෝම්ස් මීළඟට නිවසේ පසුපස දොරින් නිවසට ඇතුළු විය. අපි ඔහු පසුපස ගියෙමු.

ඇතුළුවුණු තැනම තිබුණේ වගාකටයුතු සඳහා භාවිත කළ මුල්ලු, අත් ඉස්කෝප්ප ආදී ආයුධ, පොහොර හා මල්පෝච්චි ගබඩා


http://sherlockholmesinvestigations.blogspot.com

කළ කාමරයකි. ඊට යාබදව විශාල මුළුතැන්ගෙයක් ලෙස ද නැතිනම් අමුත්තන් සමග සතුටු සාමිචියේ යෙදීමට ද පාවිච්චි කළා යයි සිතිය හැකි තරමක් විශාල සාලයකි. සේරා වුඩ්හැම් මහත්මිය මියගොස් සිටියේ එතැනය. උසින් අඩි පහකට වැඩි නොවූ ඇය කෙට්ටු සිරුරක් තිබූ කාන්තාවකි. ඇයට ද වෙඩි පහර එල්ල වී තිබුණේ ඉතා ළඟ සිට බැව් පැහැදිලි විය. කෙසේ වෙතත් අනෙක් දෙදෙනාට මෙන් නොව ඇයට වෙඩිපහර එල්ල වී තිබුණේ පපුවට බැව් අපි දුටුවෙමු.

ඒ අසලම පොළොවේ, බිම වැටුණු ලී මින්දේසියෙක් හා සුනු විසුනු වී ගිය තේ කෝප්ප, පිඟන් හා තේ පෝච්චියේ කැබැලි දක්නට ලැබිණ. මීට අමතරව වුඩ්හැම් මහත්මියගේ සිරුරෙන් ගලාගිය රුධිරය ද බිඳුණු තේ කෝප්ප වල තිබී විසිරුණු තේ පැන්, සීනි හා කිරි වියළී ගොස් තිබෙනු අපි දුටුවෙමු. අපට එම කාමරයට ඇතුළු වීමට ඉඩ නොදුන් හෝම්ස්, මෙවර සාක්කුවේ තිබූ කාචය එළියට ගෙන සියුමැලිව පොළොව පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. බිඳුණු කෝප්ප, පිඟන් කැබැලි සියල්ල එක් කවදසි කවරයකට ද එම කාමරයේ තිබී අහුලාගත් ප්‍රතිරෝම කොපු තවත් කවරයකට ද දමාගත්තේ තමාටම තමන් කියාගනිමිනි.

"ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "දැන් ඔබට පුළුවන් වෛද්‍යවරයාට පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අවසර දෙන්න. වොට්සන්, ඔබත් වෛද්‍යවරයෙක් නිසා ඔබ එතැන රැඳී සිටීම අපට ප්‍රයෝජනවත් වෙන්න පුළුවනි. ඔබේ වෛද්‍ය සගයා පවසන්නේ මොනවද කියල හොඳින් මතක තියාගන්න. ඒ අතරේ මම මේ කැලෑරොදේ ඇවිදල එන්නම්. මේ වගේ බිහිසුණු දර්ශනයක් දුටුවට පස්සේ, හිත සන්සුන් කර ගැනීම ටිකක් අපහසුයි. ඊකට හොඳම ක්‍රමය ගහකොළ සතාසිව්පාවා අතරේ ඇවිදලා එන එකයි."

මා මුලින් සිතාසිටියේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන තුරු හෝම්ස් ඒ ළඟටම වී සිටිනැයි කියාය. නමුත් වෛද්‍යවරයා පැමිණෙද්දී හෝම්ස් කඳුල්ලෙන් පැන කැලෑරොදට වැදෙන අයුරු මම දුටුවෙමි.

ළඟ සිට තැබූ වෙඩි පහර වලින් මොළයට සිදු වූ තුවාල නිසා වාල්ටන් මහත්මිය හා ඇගේ දියණිය මියගොස් සිටි බව වෛද්‍යවරයාගේ මතය විය. මේ අතර සේරා වුඩ්හැම් මහත්මියගේ



http://sherlockholmesinvestigations.blogspot.com

මරණයට හේතුව, පපුවට එල්ල වූ වෙඩි පහර නිසා හෘදය වස්තුවට හා පෙණහැල්ලට සිදුවූ තුවාල බව නිගමනය කෙරිණි.

හෝම්ස් කැලෑරොගේ සංචාරය නිම කොට ආපසු එද්දී, හදිසි මරණ පරීක්ෂණ විභාගයේ කටයුතු සූදානම් වී තිබිණ. එහිදී අපට දැනගන්නට ලැබූ විස්තර දැන් මම ඔබ වෙත ඉදිරිපත් කරමි. මුලින්ම සාක්ෂි දුන්නේ පවුලේ මුළුතැන්ගෙයි සේවිකාව වූ සුසාන්ය.

"මගේ නම සුසාන් ජෝන්ස්. මගේ වයස අවුරුදු තිස්හතරයි. මං වාල්ටන් පවුලේ සේවිකාවක ලෙස බැඳිලා අවුරුදු අටක් වෙනවා.

සතියකට විතර කලින් ෆර්ගියුසන් මහත්මයලාගේ ගෙදර සේවිකාව ලිස්සා වැටී අත කැඩුණා. ඇයව සනීප වෙන තුරු කෑම පිළියෙල කරගන්නු මාව එවන්න පුළුවන්ද කියා ෆර්ගියුසන් නෝනා, අපේ නෝනාගෙන්, ඒ කියන්නේ විවියන් වාල්ටන් නෝනාගෙන් අහල තිබුණා. ඒ නිසා එදා ඉඳල හැමදාම උදේ දහයට මම ෆර්ගියුසන් නිවසට යනවා. එගේ දවල් කෑම හා රෑ කෑම පිළියෙල කර දීලා දවල් දෙකට මම ආපහු එනවා. ඒ එන්නේ පැයක් විතර විවේක අරගෙන, අම් ගෙදර වැඩකටයුතු කරන්නයි. මං නැති නිසා මේ ටිකේ ඉවුම්පිහුම් වැඩ තුමල් සේරා.

ඊයේ දවලුත් වෙනදා වගේ දවල් දෙකට මං ගෙදර ආවා. ගේ ඉස්සරහ පැත්තේ සීනුව නාදකළා. ඒත් කිසිකෙනෙක් දොර ඇරියේවත්, කථාකරන හඬක් ඇහුණේවත් නැහැ. ඒ නිසා මම ගේ පිටිපස්සෙන් ගියා. එවිටයි මට දකින්නට ලැබුණේ- ගේ පිටුපස මිදුලේ නෝනාලා දෙන්නා වැටී හිටියා. ලේ ගලාගොස් ඇති හැටි දුටුවාම ඔවුන් මියගොස් බව එක්වරම මට තේරුණා. මට එක්වරම "සේරා! සේරා!" කියල කෑ ගැහුණා. මං පිටුපස දොරෙන් ගේ ඇතුළට දිව්වා. එතකොටයි දුටුවේ සේරාත් පිටුපස සාලයේ මැරී වැටී හිටි හැටි. එතකොට පාර ළඟට දුවල ගිහින් පොලීසියට ඉක්මනට එන්න කියන්න කියලා පාරේ ගිය ළමයෙකුට කිව්වා"

හදිසි මරණ පරීක්ෂක- "ඔබ විවියන් වාල්ටන් නෝනාගේ ස්වාමිපුරුෂයා අඳුනනවාද?"

"සාක්ෂිකාරිය- "ඔව්. මං රැකියාවට බැඳුණේ ඒ මහත්මයා ගෙදර ඉඳිද්දි තමයි"

ම. ප. - "ඒ මහත්මයා මෙහෙන් ඇවිත් නෝනා එක්ක සණ්ඩු කර යනවාද?"



http://sherlockholmesinvestigations.blogspot.com

සාක්ෂිකාරිය - නැහැ. මහත්මයා වෙන්වෙලා ගිහින් දැන් අවුරුදු දෙක තුනක් ඇති. ඔහු මාසයකට විතර සැරයක් මෙහෙ එනවා. ලොකු නෝනා සමග කථාකරන්නේ ටිකයි. ඔහුගේ දුව වන ජූන් වෝල්ටන් මෙනෙවිය සමග හුඟාක් කථා කර කර ඉඳලා, විහිළුතහළු කර කර ඉඳල යනවා.

ම. ප. - ඔහු ගෙදරින් වෙන්වෙලා නම් එන්නේ ඇයි?

සා - ගෙදර වියදමට හා අලුත් වැටුප් ගෙවීමට මුදල් දෙන්නයි ඔහු එන්නේ. ඔහු ඒ මුදල් දෙන්නේ ජූන් මෙනෙවිය අතට. සමහර වෙලාවට ඔහු ගෙදර පුස්තකාලයෙන් කියවීමට පොත් අරගෙන යනවා. නැතිනම් ජූන් මෙනෙවියට කියවීමට ඔහු අලුතෙන් මිලට ගත් පොත් අරගෙන එනවා. ඔහු නමට ලියුම් ඇවිත් තිබුණොත් ඒවාත් අරගෙන, තේ බිලා පැය දෙකකින් තුනකින් ආපහු යනවා.

ම. ප. - ඔහු එන්නේ උදේ වෙලාවටද හවසටද?

සා - හැමදම එන්නේ සවස තුනට විතර. කවදාවත් උදේ ඇවිත් නැහැ.

ම. ප. - අන්තිමට ඔහු මෙහේ ආවෙ කවදද?

සා - සතියකට කලින් මෙහේ ආවා. හරියටම කිව්වොත් ගිය බ්‍රහස්පතින්ද.

ම. ප. මේ පවුලට ඉන්න තරහකාරයින් කවුද?

සා - මං දන්නා තරමින් තරහකාරයින් කවුරුත් නෑ.

ම. ප. - ෆර්ගියුසන් පවුල හා මේ පවුල අතර තිබෙන සම්බන්ධය මොකක්ද? ඔවුන් ඔබේ සේවය ඉල්ලා සිටියෙ ඇයි?

සා - එහේ නෝනා වයස්ගතයි. ඇයට තනියම වැඩකටයුතු කරගන්න අමාරුයි. මං කලින් හිටපු විදියට එහේ සේවිකාව වැටි තුවාල වුණා.

ම. ප. - පවුල් දෙක අතර තිබෙන සම්බන්ධය මොකක්ද කියලත් මං ඇහුවා.

සා - එහේ ඉන්නා ලිලියන් ෆර්ගියුසන් නෝනා, අපේ නෝනගෙ නැන්ද කෙනෙක්.

ම. ප. - වෙනදාටත් මේ විධියට ඒ අයට උදව් කරන්න ගිහින් තියෙනවද?

සා - ඔව්.

ම. ප. - මේ අපරාධය කවුරුන් සිදුකලා කියලද ඔබ සැකකරන්නේ?


http://sherlockholmesinvestigations.blogspot.com

සා - එහෙම කෙනෙක් ගැන මට හිතාගන්න බැහැ.

ම. ප. - මෙහේට නිතර ආගිය වෙනත් අය කවුද?

සා - වෙනත් කවුරුත් නිතරම මෙහේ ආවේ ගියේ නැහැ. ජූන් මෙනෙවිය ලන්ඩනයේ ඉගෙන ගත් කාලේ, ඇයට හිටි යෙහෙළියන් ඉඳහිටලා එනවා. වෝල්ටන් පවුලේ නෑදෑ හිතවතුන් ඉඳහිට මෙහේ එනවා. ඉස්සර මහත්මියා මෙහේ ඉන්න කාලෙ නම්, බලිකුකුළන් හා හාවුන් දඩයම් කරන්න යාළුවන් මෙහි ආව ගියා. ඒත් මෑත කාලෙ නම් එච්චර කවුරුවත් ආවේ නෑ.

මීළඟට සාක්ෂි දුන්නේ රැල්ෆ් ෆර්ගියුසන් මහතාය.

"විවියන් වෝල්ටන්, මගේ බිරිඳ ලිලියන් ගේ ඥාති දියණියක්. මගේ බිරිඳ දණහිස් ඉදිමීමේ රෝගයෙන් පෙළෙන නිසා ඇවිදින්න බැහැ. ඒ නිසා ඉඳහිට හෝ මෙහි ඇවිත් යන්නේ මම. අප පදිංචි වෙලා ඉන්නේ මෙහි සිට යාර දෙසීයක් පමණ දුරින්, පාරේ අනෙක් පැත්තේ තිබෙන ෆෙයාෆීල්ඩ් නම් නිවසේ. අපේ සේවිකාව වැටී තුවාල වුණු නිසා අපි විවියන්ගෙන් ඔවුන්ගේ සේවිකාව ඉල්ලා ගත්තා. ඇය නැති අතරේ තමා මේ අපරාධය සිදුවෙලා තියෙන්නේ.

ම. ප. - මේ අපරාධය සම්බන්ධයෙන් කවුරුන් වගකිව යුතුයි කියලද ඔබ හිතන්නේ?

සා - මෙහෙම අපරාධයක් කිරීමෙන් කාටවත් ඇති ප්‍රයෝජනයක් නැහැ. මට හිතෙන්නේ මේක පිස්සෙකුගේ වැඩක්. සමහර විට ආච්හිල් මානසික රෝහලෙන් පැන ආ දරුණු උන්මත්තකයෙකු කළ වැඩක්ද දන්නෙ නෑ.

ම. ප. - ඔබ හෙක්ටර් වෝල්ටන් මහත්මයා හොඳින් අඳුනනවාද?

සා - ඇත්තෙන්ම ඔව්.

ම. ප. - ඔහු අතින් මෙහෙම දෙයක් වුණා කියල ඔබට..........

සා - කොහොමටවත් හිතෙන්නෙ බෑ. ඔහු ඉතාමහොම කරුණාවන්ත කෙනෙක්. ඔහු තමන්ගේ දියණියට බොහොම ආදරය කළා. විවියන් හුඟක් තදින් කෝපයට පත්වෙන කෙනෙක්. ඒ නිසා ඇය සමග ජීවත්වෙන්න බැරිව වෙන්වී ගියාට, මෙවැනි අපරාධයක් කරන්න තරම් හෙක්ටර්ගේ හිතේ කිසි තරහක් තිබුණේ නෑ.

ම. ප. - මුදල් හදල් හෝ දේපොළ පිළිබඳව, වෝල්ටන් මහත්මිය හා ඇගේ සැමියා අතර ප්‍රශ්න ඇතිවී තිබුණද?

ස - මං දන්නා තරමින් එහෙම දෙයක් තිබුණේ නැහැ. ඔහු බීර සමාගමක අයිතිකරුවෙක්. ඔහුට මුදල් පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා



http://sherlockholmesinvestigations.blogspot.com

කියල මං හිතන්නේ නැහැ. මේ ගෙදර සේවකයන්ගේ පඩිනඩි ඇතුළු සියලුම වියදම් සඳහා, ඔහු ඇවිත් ලොකු මුදලක් ජුන් අතට දී යන බවයි මට දැනගන්න ලැබුණේ. එහෙම ආව වෙලාවට ඔහු අපේ ගෙදරටත් ඇවිත් කතාබස් කර යනවා."

"මීළඟට සාක්ෂිදීමට නියමිතව සිටියේ හෙක්ටර් වාල්ටන් මහතාය. එහෙත් මේ වනතුරුත් ඔහු පැමිණ සිටියේ නැත. එබැවින් ඔහු වහාම කැඳවීමට කටයුතු කරන ලෙස මරණ පරීක්ෂකවරයා පොලීසියට නියෝග කළේය. මෙම අවාසනාව ගැන අසා ඔහු කලින් දිනයේ පැමිණ, පැය කිහිපයක් නතර වී පිටවී ගිය බවත්, මේ ගැන ඔහු අතිශයින්ම කම්පාවට පත්ව සිටි බවත්, ෆර්ගියුසන් මහතා දැනුම් දුන්නේය.

"මරණ පරීක්ෂණ විභාගය තව පැයකින් කල් තැබූ නිසා, ඒ අතරේ අපට පුළුවනි නිවස පරීක්ෂා කරලා බලන්න. එහෙම නේද ෆර්ගසන්?" හෝම්ස් ඇසීය.

"ඔව් හෝම්ස් මහත්මයා. වාල්ටන් මහත්මයා එනතුරු අපට පුළුවන් ඒ කටයුත්ත කරන්න."

නිවස සෝදිසිකිරීම හෝම්ස් කළේ ඉතා ක්‍රමානුකූලවය. මුලින්ම ඔහු නිවසේ දළ සැලැස්මක් ඇඳගෙන, කාමරවලට අංක යොදා, ඒ කාමර මොනවාදැයි සූසාන් ජෝන්ස් සේවිකාවගෙන් විමසා දැනගත්තේය. අනතුරුව ඉදිරිපස ආලින්දයෙන් පටන්ගෙන කාමරවල තිබූ දේ සටහන් පොතේ ලියා ගත්තේය. කබා සාක්කුවේ තිබූ කාචය ගෙන, සෑම කාමරයකම පොළොව හා ජනේල ද සෝදිසි කළේය. මැදිවියේ කාන්තාවක හා තරුණියක ජීවත්වන නිවසක, දකින්නට බලාපොරොත්තු විය හැකි සාමාන්‍ය දේ හැර, අමතර කිසිවක් මෙහි නොතිබිණ.

හෝම්ස්ගේ විශේෂ අවධානයක් යොමු වූයේ වාල්ටන් මහත්මිය හා දියණිය ගේ නිදන කාමරය වෙතය. තරමක් විශාල කාමරයක් වූ එහි, ඔවුන් දෙදෙනාගේ පාවිච්චිය සඳහා ද්විත්ව ඇඳක් තිබිණ. කාමරයේ එක් කෙළවරක බිත්තියටම සවිකළ පොත් අල්මාරියක් විය. එහි වීදුරු දොරපියන් දෙකම වසා තිබිණ. මව හා දුව දෙදෙනාම නිතර පොත්පත් කියවූ අය බව සිතාගත හැකිවිය. චාල්ස් ඩිකන්ස්, තෝමස් හාඩි හා බ්‍රොන්ටේ සොහොයුරියන් ලියූ පොත් රාශියක් ඇඳේ එක් පසෙකින් වූ රාක්කයක විය. ඇඳේ



http://sherlockholmesinvestigations.blogspot.com

අනෙක් පැත්තේ කොට්ටය අසල පොත් සලකුණක් තැබූ ෂේක්ස්පියර්ගේ හැම්ලට් නාට්‍යයේ පිටපතක් විණි.

තරමක් විශාල ඇඳුම් අල්මාරියක් ද මේ කාමරයේ තිබෙනු අපි දුටුවෙමු. එය සම්පූර්ණයෙන්ම විවෘතකොට, ඇඳුම් සියල්ලම පාගේ එළියට ඇද දමා තිබිණි. එහි ඉහළ තට්ටු දෙකකම ගබඩාකර තිබූ ලිපිලේඛන, ලිපිගොනු සියල්ල බිමට ඇද දමා, අවුස්සා දමා තිබුණේ, කඩදාසි කාමරය පුරා විසුරුවමිනි. අල්මාරියේ ලාච්චු එළියට ඇද දමා තිබූ අතර මුරු-කාසි-කිබ්බියක් බිම වැටී තිබෙනු දක්නට ලැබිණි. අනෙක් කාසි කිබ්බියත්ම පරීක්ෂා කළත්, ඒවා අවුල් කළ බවට හෝ ඇද දමූ බවට සලකුණු නොවීය.

වාල්ටන් මහතා පැමිණ ඇති බැවින් මරණ පරීක්ෂණ විභාගය යළි ඇරඹීමට සූදානම් බව, නිවසතුළට දිව ආ පොලිස් භටයෙක් අපට දැනුම් දුන්නේය. අප එතැනට ළඟාවනවිට හෙක්ටර් වාල්ටන් මහතා සාක්කි දීම අරඹා තිබිණි. අඩි හයක් පමණ උස, හැඩිදැඩි සිරුරක් තිබූ ඔහු සතු වූයේ කඩවසම් පෙනුමකි. ඔහුගේ රන්වන් පැහැති හිසකෙස් කෙටියට කපා තිබූ අතර රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකර සිටියේය. ඔහු කලක් දක්ෂ පාපන්දු ක්‍රීඩකයෙකුව සිටි බව අපට පසුව දැනගන්නට ලැබිණි.

"............. මම වෘත්තියෙන් ව්‍යාපාරිකයෙක්. මියගොස් සිටින්නේ මගේ බිරිඳ, දියණිය හා සේවිකාව. මගේ බිරිඳ සමග මං විවාහ වුණේ මීට අවුරුදු විසිහතකට පෙර. අපට සිටින්නේ දියණියන් දෙදෙනෙක් පමණයි. අපේ වැඩිමහල් දියණිය පෙනිලොප් විවාහ වුණේ මීට අවුරුදු තුනකට පමණ පෙර. ඉන්පසු ඒ දිනවලම ඇය ඇගේ සැමියා සමග කැනඩාවට සංක්‍රමණය වුණා.

විවියන් කුඩා දේට පවා අධික ලෙස කෝපයට පත්වෙන තැනැත්තියක්. ඒ නිසා අවුරුදු හත අටක සිට අප අතර අඩදබර තිබුණා. වැඩිමල් දියණිය විවාහ වෙනතුරු ගෙදර තරමක් දුරට සාමයක් පැවතුණා. ඇය කැනඩාවට ගියාට පසු, මට මේ ගෙදර වාසය එපාවුණා. ඒ මොකද බාල දුව ඒ කාලයේ ලන්ඩනයේ නැවතී ඉගෙනීම ලැබුවා. ඉතින් මං බිරිඳගෙන් වෙන්වී නිව් බෙවර්ලි නගරයේ පදිංචියට ගියා. මගේ කර්මාන්ත ශාලාව තියෙන්නේත් ඒ කිට්ටුව. ඒ නිසා මගේ ව්‍යාපාරය කරගෙන යෑමට එහි නැවතී සිටීම පහසු බව මට පෙනුණා.



http://sherlockholmesinvestigations.blogspot.com

මෙහිදී හදිසි මරණ පරීක්ෂකවරයා හරස් ප්‍රශ්න ඇසීම ඇරඹුවේය.

මරණ පරීක්ෂක - ඔබ බිරිඳ හා දියණිය බැලීමට නිතර පැමිණියාද?

සාක්ෂිකරු - නිතර නොවෙයි. විශේෂ හේතුවක් නොතිබුණොත් මාසයකට වරක් ආවා. ඇගේ දුව හතල්ටන් ගොල්ෆ් සමාජයේ සාමාජිකාවක්. හැම ඉරිදාවකම වගේ එහි ගොස්, දුව සමග ගොල්ෆ් ක්‍රීඩාකර, ඇය සමග කතාබස් කර ආවා.

ම. ප. - නමුත් ඔවුනට මුදල් දීමට ඔබ මාස්පතා ගෙදර ආවා. සතියකට වරක් දුව හමුවුණත් එහිදී ඇයට මුදල් නුදුන්නේ ඇයි?

සා - ගෙදර වියදමට දෙන මුදල් ඇගේ අතට භාරගන්න ජූන් කැමැති වුණේ නැහැ. ඇගේ මව ඉදිරිපිටදීම එය දීම සුදුසු බවයි ඇගේ අදහස වුණේ. ගොල්ෆ් ක්‍රීඩාවෙන් පසු මිතුරන් සමග කතාබහ කරන්න, මම තරමක් වෙලා එහි සමාජශාලාවේ රැඳුණා. ඒ අතරේ ඇය ගෙදර ගියේ තනියම. ලොකු මුදලක් අතට දී කුලීරියකින් ඇය ආපසු යවන්න මම කැමැති වුණේ නැහැ.

ම. ප. - ඔබ ගිය සතියේත් මෙහි ඇවිත් ගියා?

සා - ඔව්. ගිය බ්‍රහස්පතින්දා, ඒ කියන්නේ හරියටම සතියකට පෙර මං ආවා.

ම. ප. - ඊට පසු ඔබ ආවේම නැහැ?

සා - නැහැ. ඊයෙ තමයි ආවේ.

ම. ප. - ගිය ඉරිදා ක්‍රීඩා සමාජයේදී දුව හමුවුණාද?

සා - නැහැ. එදා ඇය ක්‍රීඩාකරන්න ආවේ නැහැ.

ම. ප. - මේ මරණ ගැන ඔබ සැකකරන්නේ කවුද?

සා - මට එහෙම සැකහිතන්න කිසිවෙක් නෑ. අපේ පවුල සමග ලොකු අමනාපයක් ඇති කිසිවෙකු ගැන මම දන්නේ නෑ. මෙය විකෘති මනසක් ඇති කෙනෙකුගේ වැඩක් වීමට ඉඩ ඇති බවයි මට හිතෙන්නේ.

ම. ප. - එහෙම නැත්නම් මුදල් කොල්ලකෑමට?

සා - ඔව්. එහෙම දෙයක් වෙන්නත් පුළුවනි. මං ඔවුනට මාස්පතා දෙන මුදල් උවමනාවටත් වඩා වැඩි බව මං දැනහිටියා. නමුත් අමතර මුදල් විවියන් බැංකුවේ තැන්පත් කළා.

ම. ප. - ඔබ ගිනිඅවි පාවිච්චි කරනවාද? ඒවා මේ වෙලාවේ තියෙන්නේ කොහේද?



http://sherlockholmesinvestigations.blogspot.com

සා - සතුන් දඩයම් කිරීමට යොදා ගන්නා රයිෆලයක් හා ආත්මාරක්ෂාවට රිවෝල්වරයක් මා ළඟ තියෙනවා. ඒවා මා පදිංචි ගෙදර සුරක්ෂිතව තියෙනවා. පරීක්ෂාවට අවශ්‍ය නම් ඒවා පොලීසියට වහාම භාරදෙන්න මං කැමතියි.

ම. ප. - මේ මරණය සිදුවුණේ බ්‍රහස්පතින්දා උදේ දහයත් දහවල් දෙකත් අතර බව පැහැදිලියි. ඔබ ඒ වෙලාවේ කොහේද හිටියේ. ඒ විස්තර අපට කියන්න.

සා - මුදල් ලබාගැනීමට අවශ්‍යතාවයක් තිබූ නිසා මං උදේ බැංකුවට ගියා.

ම. ප. - ඒ කීයටද? මොන බැංකුවටද?

සා - මං ගියේ මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ, නිව්බෙවර්ලි ශාඛාවට. උදේ දහයට බැංකුව ඇරිද්දී මං එතැන. මුදල් ලබාගෙන මං දහයයි කාලට කලින් එතැනින් පිටවුණා. කර්මාන්ත ශාලාවට ගිහින් එහි කටයුතු සොයා බලලා, එකොළහමාර පමණ වෙද්දී එතැනින් පිටවුණා. එකොළහට මිතුරෙක් හමුවෙන්නත්, දවල් කෑම ඔහු සමග ගන්නත් මං කල් ඇතුව යොදාගෙන හිටියා.

ම. ප. - ඒ කොහේද?

සා - නිව්බෙවර්ලි වලට හැතැක්ම හුදකක් දුරින් තියෙන ඔක්හැම් හි ගෝල්ඩන් ඊගල් සමාජශාලාවේදී. නමුත් ඒ සඳහා පිටත්වෙලා යද්දී මගේ අශ්වකරත්තය විශාල වාහන තදබදයකට හැඳිවුණා. සැක්සිකෝබර්ග් චතුරශ්‍රය අසල සිදුවුණු වාහන අනතුරක් නිසා, පාර සම්පූර්ණයෙන්ම අවහිර වී තිබුණා.

(මෙහිදී පොලිස් නිලධාරියෙක් ඉදිරිපත් වී එය සත්‍ය බව තහවුරු කළේය. උදේ 10.15ට පමණ අශ්වකරත්ත දෙකක් එකිනෙක ගැටීම නිසා එක් රියැදුරෙක් මරණයට පත්වූ බවත්, වාහන අවහිරය පැය එකහමාරකට වැඩි කාලයක් තිබූ බවත් ඔහු පැවසීය.)

ම. ප. - හොඳයි. එතකොට ඔබ මිතුරා හමුවුණේ කීයටද?

සා - මං සමාජශාලාවට යද්දී දවල් දොළහට කිට්ටුයි. මා එනතුරු බලාගෙන ඉඳලා ඔහු පිටව් ගොහින් තිබුණා. ඊට පසු මම ගෙදර ඇවිත් නැමකාලා නිදාගත්තා.

ම. ප. - මේ මරණය ගැන ඔබ දැනගත්තේ කොහොමද?

සා - අපේ ඥාතියෙකු වන ෆර්ගියුසන් මහතා පණිවුඩකරුවෙකු එවා තිබුණා. මං හිතන්නේ එයාට පැවස තුනහමාර හතර වෙන්න ඇති. මං එවෙලේම මෙහේ ආවා.


http://sherlockholmesinvestigations.blogspot.com

තවත් කිහිපදෙනෙකුගෙන් සාක්ෂි විමසීමෙන් පසු ඉන්ක්වෙස්ට් විභාගය අවසන් විය. මෙය මනුෂ්‍ය ඝාතනයක් බව තීන්දු කළ මරණ පරීක්ෂකවරයා, එය සිදු කළ අය වහා අත්අඩංගුවට ගන්නා ලෙස පොලීසියට උපදෙස් දුන්නේය.

මේ කටයුතු අවසන් වනවිට සවස දෙක පමණ වී තිබිණි. එදිනට නවාතැන් ගැනීමේ අරමුණෙන් සහ දහවල් ආහාරය සඳහා අපි, හකල්ටන් හි එලිෆන්ට් ඇන්ඩ් කාසල් තානායම වෙත ගියෙමු. වැඩ කටයුතු රාශියක් සඳහා ලන්ඩන් නගරයට යායුතු බව පවසමින් ෆ්‍රෙගසන් අපෙන් සමුගත්තේය.

"අපි නොදන්නා කරුණු බොහොමයක් මරණ පරීක්ෂණයේදී එළියට ආවා" මම කීවෙමි. "හෝම්ස් ඔබ හිතන්නේ හෙක්ටර් වෝල්ටන් කියූ හැම දෙයක්ම ඇත්ත කියාද?"

මඳ වේලාවක් නිහඬව සිටි මගේ මිතුරා, පයිප්පය දල්වා ගත් පසු කථාව ඇරඹුවේය. "ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව, සිතෙන් හෝ නිගමනයකට ඒම වැරදි ක්‍රමයක් වොට්සන්. ඔහුට පක්ෂව හෝ විරුද්ධව ප්‍රමාණවත් තරම් සාක්ෂි නැහැ. ඇත්තම කියනවා නම්, මේ අපරාධයට අදාළ වැදගත් කරුණු හා විශාල ප්‍රමාණයක් මතුවී නැති බවයි මට පෙනෙන්නේ.

මේ ප්‍රදේශය ගැන අපට පැහැදිලි වැටහීමක් නැ. මොවුන් මේ පවසන තැන් හා ඒ තැන් වලට ඇති දුර ආදිය කිසි දෙයක් අපි හරිහැටි දන්නේ නැ. අපරාධකාරයා කවුරුන් වුවත්, ඔහු එය සිදුකොට වහාම පැනගොස් ඇති බව පැහැදිලියි. මෙහේට යන්න එන්න තියෙන පාරවල් මොනවද? ඒ දැනුම අපට ලබාදෙන්න කෙනෙක් ඇත්තෙ නැ. මුලින්ම මට උවමනායි මේ ප්‍රදේශයේ සිතියමක්. ඒක හොයාගෙන වැඩ කටයුතු පටන්ගමු"

මෙම ගම්මානය හා අවට ප්‍රදේශයේ මිනුම් දෙපාර්තමේන්තුව නිකුත් කළ සිතියමක් ලබාගත හැකි ආකාරය ගැන අපි සොයා බැලුවෙමු. එය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයෙන් ලබාගත හැකි බව අසන්නට ලැබී, තානායමේ සේවකයෙකු යවා සිතියමක් ගෙන්වා ගත්තෙමු. මගේ මිතුරා එය දිගින් දිගටම අධ්‍යයනය කළේය. තානායමේ හාන්සි පුටුවකට වී පුවත්පතක් කියවූ මට සවස තුනහමාර පමණ වන විට නිදිමතක් දැනිණ.

"වොට්සන්" හෝම්ස් කියද්දී මා සිටියේ නිදි කිරා වැටෙමිනි." ඔබට කැමැති නම් අපි වෙන්කරවා ගත් කාමරයට ගිහින් නිදා ගන්න.



http://sherlockholmesinvestigations.blogspot.com

සිතියමේ සඳහන් තැන් හැකිතාක් දකල, හරිහැටි බලාගන්න. මං කැමතියි. මං පැයකට දෙකකට ගිහිල්ල එන්නම්"

එසේ කියූ මගේ මිතුරා එක අතකින් සිතියම ද, අනෙක් අතින් මගේ සැරයටිය ද ගෙන තානායමෙන් පිටවී ගියේය. කළයුතු අන් කිසිවක් නොතිබූ නිසා, මම නිදන කාමරයට වී ඇඳේ වැතිරුණෙමි.

කලින් ද රාත්‍රියේ අපි ලන්ඩනයේ වෙම්බලි ශාලාවේ පැවැති සංගීත ප්‍රසංගයක් නැරඹීමට ගියෙමු. එය අවසන් වී අප ආපසු නිවහනට එන විට ඇඳියම් රැය ද පසු වී තිබිණ. එබැවින් හකල්ටන්හි තානායමේ ඇඳේ වැතිරුණු වහාම මට නින්ද ගියේය.

මට ඇහැරෙන විට, ඇඳිරි වැටෙන්නට ද පටන්ගෙන තිබිණි. මම කබා සාක්කුවේ තිබූ මගේ ඔරලෝසුව ගෙන පරීක්ෂා කර බැලුවෙමි. හවස හය පසුවී තිබූ බව එහි සඳහන් විය. මම හැඳ පැළඳ ගෙන තානායමේ විසිත්ත කාමරය වෙත පැමිණියෙමි. මගේ මිතුරා තවමත් ආපසු නොපැමිණි බව තානායම් පාලකයා පැවසුවේය.

මම තේ කෝප්පයක් පානය කරමින් මිතුරා බලාපොරොත්තුවෙන් ආලින්දයට වී සිටියෙමි. ෂර්ලොක් හෝම්ස් ආපසු පැමිණෙන විට රාත්‍රී නව පසු වී තිබිණ. ඔහු අධික ලෙස වෙහෙසට පත්වී සිටි බැව්, දුටු වහාම මම තේරුම් ගතිමි. තේ කෝප්පයක් බීමට ඔහු විසිත්ත කාමරයට පැමිණියේ, උණුවතුර ස්නානය කොට, පිටකබායකින් සැරසී ගෙනය. තවමත් දල්වා නොගත් පයිප්පය ඔහුගේ අතේ විය.

"අපි අපේ කාමරයට යමු වොට්සන්. නිදහසේ කථාකරන්න එතැන වඩා හොඳයි. මෙතැන නුගත් සෙනඟ ගැවසෙනවා"

හෝම්ස් පහත් හඬින් මට කීවේ, තේ කෝප්පය බී අවසන් කළ පසුය.

"කොහොමද අද හවස්වරුවේ ඇවිද්ද ප්‍රයෝජනවත් යමක් හොයාගන්න ලැබුණද?" අපේ කාමරයේදී මම ඇසීමි.

ඊට පිළිතුරක් නොදුන් ඔහු, යළිදු ගෙන ගිය සිතියම කබාසාක්කුවෙන් එළියට ගෙන, එය ඇඳ මත දිගහැරියේය. සිතියම කිළිටි වී තැන් තැන් ඉරී ගොස් තිබුණු අතර, කිහිප තැනක පැන්සලෙන් කළ සලකුණු ද මම දුටුවෙමි.

"මං හවස්වරුවම ගතකළේ, සිතියමේ මෙන්න මේ හරියේ ඇවිදිමින්" ඔහු කීය. "මම මෙතෙක් ගියපු මේ තැන් අඳුනාගන්න


http://sherlockholmesinvestigations.blogspot.com

වොට්සන්. අපේ පරීක්ෂණයට අදාළ වෙන වැදගත් තැන් කීපයක් මෙකෙ තියෙනවා. මං කැමතියි ඔබ ඒවට අවධානය යොමු කරනවා නම්.

ඔබට මතකද අපි ආවිහිල් කරා යද්දී දුටුව බෝස්ටල් නිවාසය? අර ආවිහිල් ජලාශය මැද්දේ දූපතක තියෙනවා කිව්වේ? මෙන්න මේ තියෙන්නේ ඒක" ඔහු කීවේ සිතියමේ එක් තැනකට ඇඟිල්ල දිගු කරමිනි.

"ඔව්. මට මතකයි"

"හරි. මම අද මුලින්ම ගියේ එතැනට. ඒක ඔබ දන්නවා නොයෙකුත් අපරාධ කරලා අසුවෙන අවුරුදු විසිඑකට අඩු, එනම් බාල වයසේ අය තබාගන්නා තැනක්. එළිමහන් සිරකඳවුරක් වගේ රැඳවුම් නිවාසයක්"

"ඒක කොහොමද හෝම්ස් අපේ මේ ප්‍රශ්නයට වැදගත් වෙන්නේ?"

"මම එතැනට ගියේ යම් අරමුණක් ඇතිව" හෝම්ස් කීය. "මට මුලින්ම උවමනා වුණේ එතැන ක්‍රීඩා ආගාරයේ ගබඩාව භාර හන්ටර් නම් සේවකයා ගැන තොරතුරු ලබාගන්න. මරණ පරීක්ෂණයේ දී මුලින්ම සාක්කි දුන් සුසාන් ජෝන්ස් නම් තරුණ සේවිකාව ඔබට මතක ඇති. ඇය ගෙදර නොහිටි උදේ දහයත් දහවල් දෙකත් අතර තමා මේ අපරාධය සිදුවුණේ. එහෙම නේද වොට්සන්?"

"ඔව්"

"මේ සුසාන් ජෝන්ස් විවාහ ගිවිසගෙන ඉන්නේ, බෝස්ටල් නිවාසයේ හන්ටර් නම් ගබඩා භාරකරු සමග බව, අද උදේ මට දැනගන්න ලැබුණා. මං ගියේ ඔහු හමුවෙන්න. නමුත් ඔහු දින තුනකින් රැකියාවට ඇවිත් නැහැ. ඔහු බෝවෙන රෝගයකින් පෙළෙන බව ලියුමකින් දන්වා එවා තිබුණා. වෛද්‍ය සහතිකයක් එවා නැහැ......."

"ඇයි ඔහු ගැන ඔබේ හිතේ සැකයක් ඇතිවුණේ?" මම ඇසීමි.

"සැකයක් ඇතිවුණාම නෙමෙයි වොට්සන්. පරීක්ෂණයක් නිසි පරිදි පවත්වනවා කියන්නේ, ඒකට අදාළ සෑම කෙනෙකු පිළිබඳවම තොරතුරු හොයා බලා, වැදගත් තැන් ඉහළට මතු කර ගැනීම. මේ හන්ටර් නම් තැනැත්තා, කලින් යුද්ධ හමුදාවේ සේවය කොට ඉන් ඉවත්වූ, වයස තිස් අටක කෙනෙක් බවයි මට දැනගන්න ලැබුණේ.



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ රාජකාරී සතුටුදායක බව පාලකයින් කිව්වා. හන්ටර්ගේ ගෙදර ලිපිනය මං ඉල්ලා ගත්තා. ඒ අනුව ඔහු ගැන තවදුරටත් හොයා බලන්න පුළුවනි. ඊට අමතරව වෙනත් වැදගත් කරුණක් මට දැනගන්න ලැබුණා"

"ඒ මොකක්ද?"

"බෝස්ටල් නිවාසයේ රැඳවියන් දෙදෙනෙක්, ඊයේ බ්‍රහස්පතින්දා උදේ පාන්දර එතැනින් පැනගිහින්"

"මොනවා?"

"ඔව්. අවුරුදු 16ක් හා 17ක් වයසැති ටොම් සහ ටෙරී නම් තරුණයින් දෙදෙනා, දීර්ඝ සිරදඬුවමක් විඳිමින් මෙහේ ඉඳලා තියෙන්නේ. ඔවුන් මෙතෙන්ට එන්නට කර ඇති වැරැද්ද ගැන මං ඇහුවා. වෙළඳසලකට වැදී, එහි මුදල් භාරකරුගේ හිසට පොල්ලකින් පහරදී මුදල් මංකොල්ල කෑමයි, ඔවුන් කර ඇති වරද. බදාදා රාත්‍රියේ ටොම් සහ ටෙරී නේවාසිකාගාරයේ ඉඳල තියෙනවා. බ්‍රහස්පතින්දා උදේ බලද්දී නැහැ.

"කොහොමද ඔවුන් පැන ගිහින් තියෙන්නේ?"

"ඒක තමයි තවම හිතාගන්න අමාරු" හෝම්ස් කීය. "බෝස්ටල් නිවසට යන තාර පාර ඇරුණාම වටේටම තියෙන්නේ ලොකු ජලාශයක් බව ඔබට මේ සිතියමේ පෙනෙනවා ඇති. තාර පාර හරහා රැඳවියෙකුට පැන යාම ලේසි පාසු නැහැ. ඒ මොකද මුරගේට්ටු දෙකක් තියෙනවා. මුරකරුවන් බොහොම සෝදිසියෙන් ඉන්නේ. ඒ මුර කපොලු වලින් බේරිලා ගියා කියල හිතන්න අමාරුයි"

"එහෙනම් යන්න ඇත්තේ ජලාශයට බැහැලා. ඒකෙන් පීනලා ගිහින්?" මම ඇසීමි.

"ඒකත් හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "එක අතකින් මේ ජලාශයෙන් එගොඩ වෙන්න බොහොම දුරක් පිහිනන්න ඕන. ඒ ගියත් වැටෙන්නේ මඩ ගොහොරු සහිත විශාල විල්ලු ප්‍රදේශයකට. ඒක මේ සිතියමෙත් සලකුණු වී තියෙනවා. අනෙක් කාරණය මෙකයි. බෝස්ටල් නිවාසයේ කෑම උයන්න එන අරක්කැමියෙකු, කලින්දා රෑ පැදගෙන ආ බයිසිකලය, ඊයේ උදේ බලන විට අතුරුදන් වෙලා!"

"හැබෑට? ඉතින් මොකක්ද ඔබ ගත් නිගමනය?"



http://sherlockholmesinvestigations.blogspot.com

"එතකොට වාල්ටන් මිනීමැරුම ගැන අපේ පළමුවැනි සැකකාරයන් වෙන්නේ, මේ දෙදෙනා බව පැහැදිලියි. හේතුව, ටොම් සහ ටෙරී නම් තරුණයන් දෙදෙනා බ්‍රහස්පතින්දා උදේ පාන්දරම බෝස්ටල් නිවාසයෙන් අතුරුදහන් වෙනවා. ඔවුන්, මුදල් හෝ වස්තුව හිමි අයට දරුණු ලෙස පහරදී මුදල් කොල්ලකෑම ගැන ඉතිහාසයක් ඇති අය. තවත් කාරණේක් මට දැනගන්න ලැබුණා. ඔවුන් දෙදෙනා හන්ටර් සමඟ දොහොම හිතවත්ලු. මේක මට කිව්වේ එතැන ලිපිකරුවෙක්"

"ඒත් මවුනට කොහොමද තුවක්කුවක් ලැබුණේ? අනෙක මොනවා හරි කොල්ලකාගෙන ගිය බවට සාක්ෂිත් නැහැ නේද?" මම ඇසීමි.

"මෙහෙමයි. තුවක්කුවක් කොහොම අහාගා ගත්තද කියන එක මේ වෙලාවෙ අපට අදාළ වෙන්නෙ නෑ" හෝම්ස් කීවේ නිවී ගිය පයිප්පය යළි දල්වා ගනිමිනි. "වාල්ටන් නිවස පිටිපස කැලෑව වළි කුකුළන්, හරින් හා හාවුන් ගැවසෙන තැනක්. මේ දඩබිමේ දඩයම්කිරීම පවුලේ විනෝදාංශයක්. වාල්ටන් පවුලේ අයත් ඔවුන්ගේ හිතවතුන් හා ඥාතීනුත්, වරින් වර ඒවට සහභාගී වූ බව අපට අහන්න ලැබුණා. ඒකට යොදාගන්නා රයිෆල් දෙකක් ගෙදර තිබිය යුතු බව කියැවුණත්, නිවස පරීක්ෂා කිරීමේදී ඒ එකක්වත් අපට හමුවුණේ නැහැ"

"එතකොට හෝම්ස් ඔබ කියන්නේ, ටොමී සහ ටෙරී බ්‍රහස්පතින්දා උදේ පාන්දරම, කොහොමහරි බෝස්ටල් නිවාසයෙන් පැනගත්තා. ඔවුන් සුදුසු අවස්ථාව එනතුරු වාල්ටන් නිවස අසල හැංගිලා බලාගෙන හිටියා. උදේ දහයට සුසාන් ගෙදරින් පිටව් ගියාට පස්සේ නිවසට වැදිලා, කාන්තාවන් භයකරලා, රයිෆල් ලබාගන්නවා. ඒවගේ අල්ල කරලා සඟවා තිබෙන මුදල් හෝ වටිනා යමක් ගන්න අල්මාරි අරවාගන්නවා. ඉන්පස්සේ යමක් පැහැරගෙන කාන්තාවන්ට වෙඩි තබා පැනයනවා. මං හිතන්නේ ඒක වෙන්න ඇති මුලික උපකල්පනය?"

"බොහොම හොඳයි වොට්සන්" හෝම්ස් කීය. "තරුණ කාරණා එකින් එක පිළිවෙළින් ගලපා උපකල්පනයක් සකස් කරන්න, දැන් ඔබට තියෙනවා හොඳ හැකියාවක්. නමුත් මේ අපරාධයට වගකිව යුත්තේ එම තරුණයන් දෙදෙනාමයි කියා, අපට බෑ එතැනින්ම පරීක්ෂණය අවසන් කරන්න"


http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි ඒ?"

"අපරාධය ගැන හැම කෝණයකින්ම කරුණු පරීක්ෂා කර නිරීක්ෂණ කළ යුතුයි" හෝම්ස් කීය. "ඊළඟට ඒවා විග්‍රහ කර, විශ්ලේෂණය කර බැලිය යුතුයි. ඒ නිසා මං ගියා තවත් තැන් කිහිපයකට."

"ඒ කොහේටද?"

"ඔබට මතකද ෆර්ගියුසන් මහත්මයාත් ටැල්ටන් මහත්මයාත් කිව්වා, පවුලේ අය සමඟ අමනාපය කිසිවෙක් නැහැ; මේ අපරාධ පිස්සෙකුගේ වැඩක් මිස, කෙනෙක් හිතාමතා කළ ඒවා වෙන්න බැහැ කියල?"

"ඔව්"

"ඉතින් මම ගියා ආඩිහිල් මානසික රෝහලට. එහේ ඉන්න මානසික රෝගීන් කිසිවෙක් පැනගිහින් නැහැ. ඔවුන් හැම කෙනෙක්ම ඉන්නේ දැඩි ආරක්ෂක රැකවරණ යටතේ. ඒක අපේ වාසනාවට වුණු දෙයක්"

"ඇයි හෝම්ස් එහෙම කියන්නේ?"

"මානසික රෝහලෙන් පිස්සෙක් හෝ දෙන්නෙක් පැන ගිහින් තිබුණා නම්, අපේ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ අවුලක් වෙනවා. එහෙම නේද?"

"ඉතින් ඊළඟට ඔබ මොකද කළේ?"

"ඊළඟට මං ගියා ෆර්ගියුසන් පෝවුව හමුවෙන්න "ෆොයාෆීල්ඩ්" නිවසට. රැල්ෆ් ෆර්ගියුසන් මහතා විශ්‍රාම ලත් පොලිස් නිලධාරියෙක්. ඔහුත් ඔහුගේ බිරිඳ ලිලියනුත් කාරුණික අය. සාකච්ඡාවේදී ඔහු කී අයුරින් මියගිය ටැල්ටන් මහත්මිය, සුළු දෙයින් පවා කිපුණු තැනැත්තියක්ලු. ඇගේ සැමියා ඇයව අත්හැරදමා ගිය එකේ පුදුමයක් නැහැ කියලයි ෆර්ගියුසන් මහත්මයා කියන්නේ.

ඊළඟට ඔවුන්ගෙන් මට තවත් කාරණයක් දැනගන්න ලැබුණා. ටැල්ටන් වත්තට පිටුපසින් ඇති කැලෑ රොදට පිටුපස වත්ත, එනම් අල්ලපු ඉඩම අයත්වෙන්නේ විශ්‍රාමික අක්ෂි වෛද්‍යවරයෙකුට. දෙස්තර ක්ලයින් නම් ඔහු වයස අවුරුදු හැත්තෑපහක පමණ කෙනෙක්. ඔහුට අයත් ඉඩමෙන් කොටසක් ඇය අල්ලාගෙන කියලා. මායිම සම්බන්ධයෙන් ආරවුලක් තියෙනවාලු. ඒකට ඔහු දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා ඇති බවයි මට අහන්න ලැබුණේ"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණත් හොඳටම වයස්ගත වෛද්‍යවරයෙක් දේපොළ සම්බන්ධයෙන් මෙහෙම දෙයක් කරාවි කියල හිතන්න පුළුවන්ද හෝම්ස්?"

"වයස්ගත අය දේපොළ සම්බන්ධයෙන් මිනීමැරුම් කරලා නැහැ කියලද වොට්සන් ඔබ කියන්නේ?" හෝම්ස් ඇසීය. "ඔබට උවමනා නම් උදාහරණ කිහිපයක්ම දෙන්න පුළුවනි. ඔබට මතකද මං දන්නේ නෑ, ෂෙෆීල්ඩ්හි විසූ අඩි හයාමාරක් විතර උස ජෝන් ට්‍රේවිස්ගේ නඩුව ගැන? අවුරුදු අනූගණනක මිනිහා තමන්ගේ එක කුස උපන් සහෝදර දේවගැතිතුමාව වෙඩිතියලා මැරුවේ, ඔහුගේ මුදලයේ කොටස තමන්ට නොදී දේවමැදුරට පූජාකලා කියල?"

"ඔව්. ඒක හරි. ඉතින් මොනවද ඔබට අනිත් වෛද්‍යවරයා ගැන දැනගන්න ලැබුණේ?"

"ඩාල්ටන් පවුල හා ක්ලයින් පවුල අතර ඉඩම් ආරවුලක් තිබුණත්, මෑතක් වෙනතුරු ඒක ඒ තරම් දුරදිග ගිහින් තිබුණේ නැතිලු. නමුත් දොස්තර ක්ලයින් ඔහුගේ දේපොළ, ළඟදී තමන්ගේ එකම පුත්‍රයා නමට ලියල තියෙනවා. උගතෙක් හෝ රැකියාවක් නැති ක්ලයින් තරුණයා තමයි නඩුවකට බැහැල තියෙන්නේ. ඒ හරිය මට ෆර්ගියුසන්ලාගෙන් දැනගන්න ලැබුණා. ඊළඟට මම සුසාන් ජෝන්ස්ගෙනුත් ප්‍රශ්න කළා. ඇයගෙනුත් වැදගත් කරුණක් දෙකක් අහන්න ලැබුණා"

"ඒ මොනවද?"

"මායිම ගැන ඇතිවුණු ආරවුලකදී ක්ලයින් තරුණයා, වරක් ඩාල්ටන් මහත්මියට මරණ තර්ජන කළ බව සුසාන්ට අහන්න ලැබිලා තියෙනවා. සාමාන්‍යයෙන් ලන්ඩනයේ වාසය කරන ඔහු බදාදා ආවිහිල් හි සිටි බව ඇය දැක තිබෙනවා."

"එහෙනම් ඔහු ගැනත් අපට අමතක කරන්න බැහැ?"

"ඉතින් මං හවස පන්මාරට විතර ආවිහිල් වල තැබෑරුමට ගියා" හෝම්ස් කීය. "මං ගියේ මගේ මුහුණ වැහෙන විදියට කැප් තොප්පිය දමාගෙන, රස්තියාදුකාරයෙකුගේ ගමනින්. එතැන මිනිසුන්ගේ කතාබහට මම කන් දුන්නා. ඔවුන් කතාවෙන්නේ මේ අපරාධය ගැන. ක්ලයින් තරුණයා පමණ ඉක්මවා මත්පැන් පානය කරන, වැඩිහිටියනට ගරු සරුවක් නැති, අධම පුද්ගලයෙකු බවයි



http://sherlockholmesinvestigations.blogspot.com

මිනිසුන් කතාවුණේ. තද, හවසත් ඔහු ආච්චිල් වල ගැවසුණු බව ඇත්ත.

ඒ මොකද බදද රාත්‍රී එකොළහ විතර වෙනතුරු තද වර්ෂාවක් තිබිල තියෙනවා. ඒ වෙලාවෙත් තැබෑරුමේ මත්පැන් පානය කරමින් සිටි ක්ලයින් හා ඔහුගේ මිතුරෙක්, එතැනට පැමිණ සිටි තවත් කෙනෙකු සමග ගැටුමක් ඇතිකර ගත්තාලු. වැස්ස නැවතුණු වහාම ඔවුන් එළියට දමලා තැබෑරුම අයිතිකරු ඒක වහල දම්මලු. බ්‍රහස්පතින්ද ඉදල ක්ලයින් තරුණයා ගැන ආරංචියක් නෑ. ඔහු ගැන තියෙන තොරතුරු එපමණයි."

"ඊට පස්සේ ඔබ ගත්ත ඇති ක්ලයින් දෙස්තර මහත්තයා හමුවෙන්න?"

"නැහැ වොට්සන්. ඒ විමසීම් ටික කර අවසන් වෙද්දී කළුවර වැටෙන්න පටන් ගත්තා. ඉතින් ඉතිරි කටයුතු හෙටට තියලා මං ආපහු ආවා. අද මං හොයාගත් කරුණු වලින් ඔබට මොනවද හිතන්න පුළුවන්?"

"මේ කරුණු වල හැටියට අපේ පැත්තෙ එල්ල වෙන පාර්ශ්ව දෙකක් තියෙනවා. එක පැත්තකින් තෝල්ටල් නිවසෙන් පැන ගිය තරුණයන් දෙන්නා. අනෙක් පැත්තෙන් ක්ලයින් තරුණයා. මේ දෙගොල්ල ගැනම වැඩිදුර සොයා බැලිය යුතුයි. එහෙම නේද?"

"ඔව්. ටොම් සහ ටෙරී ගැටවරයින් දෙන්නා ගැන පොලිසි දැනුවත් කරලා තියෙන්නේ එදමයි. මං ග්‍රෙග්සන්ට කිව්වා තුන්මිනිමැරුමක් ගැන සැකපිටක් ඔවුන් හොයන බව, පොලිසි වලට විශේෂයෙන් දැනුම් දෙන්න කියලා. ඊළඟට හෙට අපට තියෙනවා බැරෑරුම් කටයුත්තක්. අද ඒක නොවැස්සොත් ඒක අපට ලොකු වාසියක් වගේම පහසුවක්"

"මොකක්ද ඒ කටයුත්ත?"

"මං බලාපොරොත්තු වෙනවා හෙට උදේ වරුවේ ටාල්ටන් මන්දිරය පිහිටි වතුයාය පරීක්ෂා කර බලන්න. ඇත්තෙන්ම මං බලාපොරොත්තු වුණේ අද හවසම ඒ ටික කරන්නයි. හැබැයි එඩ්ගා ක්ලයින් තරුණයා ගැන තොරතුරු හෙළිවෙද්දී, මගේ අවධානය ඒ පැත්තට යොමුවුණා. තණකොළ, මඩ සහිත පොළොව හා පාර සියුම්ව පරීක්ෂා කරන්න මං අදහස් කරගෙන ඉන්නවා. ඒක හෙමින් සැරේ කළ යුතු, වෙලා ගතවෙන වැඩක්. අද හැන්දෑවේ කළු වලාකුළක්



http://sherlockholmesinvestigations.blogspot.com

පායා ඒම නිසා, ආලෝක් මහත්මයා සතුටුදායක වුණේ නැහැ. ඒ හින්ද ඉක්මනින් අඳුරු වැටුණා. අනිත් කාරණය අපි හෙට හෙක්ටර් වාල්ටන් හමුවෙන්න ගිහින් තොරතුරු විමසා බැලිය යුතුයි. හරා ඇවිස්සිය යුතු කාරණා තුනක් තියෙනවා. මට හිතෙනවා පරීක්ෂණය ආරම්භ කරන්න සුදුසුම තැන, වාල්ටන් මහත්මයා සමග කරන සාකච්ඡාවකට පස්සේ කියලා."

"ඉතින් ඇයි අද හවසම ඔබ ඔහු හමුවෙන්න නොගියේ?" මම ඇසීමි.

"මියගිය තිදෙනාගේ අවමඟුල් කටයුතු සිදුකෙරෙන්නේ හෙට උදේටලු. ඒ බව මට කිව්වේ ෆර්ගියුසන් මහත්මයා. ඉතින් වාල්ටන් මහත්මයාට අද හවස අවිවේකී වීමට ඉඩ ඇතිලු. අවමංගල්‍ය අධ්‍යක්ෂකවරුන් හා දෙව් මැඳුරේ දේවගැතිතුමා හමුවී කළයුතු වැඩ රාශියක් ඇති. ඒකෙ සැකයක් නෑ."

අධික විඩාව නිසාම කතාබහ එතැනින් අවසන් කළ හෝම්ස්, රාත්‍රී ආහාරය ඉක්මනින් ගෙන නින්දට ගියේය. හවස් වරුවේ හොඳින් නිදා ගත් නිසා, ඇඳට ගියත් මට නිදිමතක් නොදැනිණ. හෝම්ස්ට අසන්නට ලැබුණු කරුණු ගැන නැවතත් මගේ සිතට ආවේ යටපත් කළ නොහැකි අනුමාන.

බෝස්ටල් පාසල්වල රඳවා තබාගන්නේ, බන්ධනාගාරයකට යැවීමට සුදුසු තරම් බරපතල වැරදි කරන, සමාජයෙන් වෙන් කර තැබිය යුතු ළමාලයන්ය. ටොමී සහ හැරී දෙදෙනා සැලෙන කාලයක් ආවිහිල් ගමේ ජීවත් වී ඇත. එසේ නම්, වාල්ටන් පවුල ධනවත් එකක් බව ඔවුනට අසන්නට ලැබී ඇතුවා නොඅනුමානය. ක්‍රීර කර්මාන්තශාලා හිමියෙකු වන වාල්ටන් මහතාගේ මුදල්, බැංකුවේ නොව නිවසේ අල්මාරි වල සඟවා ඇතැයි, නොමේරූ මනසක් ඇති, නූගත් ලාබාල තරුණයින්ට සිතෙන්නට ඇත. මුදලක් කොල්ලාගෙන යාමේ අරමුණෙන් ඔවුන් මේ අපරාධය සැලසුම් කළාද? ඔවුන්ගේ ගබඩාභාරකරු හන්ටර්ගෙන් සූක්ෂමව ප්‍රශ්න ඇසීමෙන්, වාල්ටන් නිවස ගැන තොරතුරු ලබාගැනීම අපහසු කරුණක් නොවේ. සුසාන් මෙම නිවසෙන් පිටවී "ෆෙයාෆීල්ඩ්" නිවස වෙත යන්නේ උදේ දහයට බව හන්ටර්ගෙන් දැනගන්නටත් ඇත.

අනෙක් අතට මේ අපරාධය හන්ටර්ගේම කටයුත්තක් විය නොහැකිද? හෝම්ස් ඒ ගැන සිතා නැත. බෝවෙන රෝගයකින්



http://sherlockholmesinvestigations.blogspot.com

පෙරළෙන නිසා යයි පසබා සේවයට නොපැමිණි ඔහු, කාලය ගතකළේ කුමන ආකාරයකටද? කලින් යුද්ධහමුදාවේ සේවය කර ඇති පුද්ගලයෙකු නම්, ඔහු ගැන විශේෂයෙන් සොයා බැලිය යුතුය. ගිනිඅවි පාවිච්චිය ගැන ඔවුන් තරම් හොඳින් දන්නා කිසිවෙකු නොමැත. හමුදාවෙන් විශ්‍රාම ගත් බොහෝ දෙනෙකු අත තවමත් ආයුධ ගැවසේ. වයස තිස්අටේදී ඔහු සේවයෙන් විශ්‍රාම ගත්තේ ඇයි? ඔහු අයහපත් හැසිරීම නිසා සේවයෙන් පහකරනු ලැබුවෙක්ද? වාල්ටන් නිවසේ පිහිටීම, එහි වාසය කරන අය, ඔවුනට ලැබෙන මිල මුදල් ගැන විස්තර, ශූසාන්ගෙන් හන්ටර්ට ලැබෙන්නට ඇති. ඔහු වාල්ටන් නිවස වෙත ගියත් දුටු කෙනෙකුට සැකයක් ද ඇති නොවේ. ඔහු පිළිබඳව සොයා බැලීම හෝම්ස්ට අමතක වුණේ කෙසේද?

මීට අමතරව එඩ්ගා ක්ලයින් නමින් හැඳින්වූ තරුණයා ගැන ද අපගේ සැකය එල්ල වේ. ඔහු නිතර ලන්ඩනයේ ගැවසෙන බෙබද්දෙකු නම්, දැනටමත් ලන්ඩන් පාතාල ලෝකය සමග සබඳතා ඇති පුද්ගලයෙකු විය හැක. එවැන්නෙකුට ගිනිඅවි යනු නිතර අතේ තබාගන්නා, නිතර භාවිතයට ගන්නා උපකරණය. මත්පැනින් සිහිවිකල් වූ අධමයෙකුට කාන්තාවන් තිදෙනෙකු අමු අමුවේ ඝාතනය කර දැමීම අපහසු කරුණක් නොවේ. ක්ලයින් තරුණයා දැන් සැඟවී සිටින්නේ ඔහු මෙයට සම්බන්ධ නිසා යයි සැකයක් ඇතිවීම පුදුමයක් නොවේ. ඔහු අතින් සිදු නොවුණත් මෙය ඔහු කිසිවෙකු ලවා කරවූ අපරාධයක්ද?

සිතින් මෙම කරුණු විශ්ලේෂණය කරමින් සිටි මට නින්ද යනවිට, මධ්‍යම රාත්‍රිය පසුවන්නට ඇත.

* * * *

"අපට අද වැඩ කරයුතු රාශියක් තියෙනවා වොට්සන්. ඉක්මනට පිටත්වෙලා ගියොත් හොඳයි" උදෙන්ම අවදි වී සිටි මගේ මිත්‍රයා මා අවදි කළේය. ඒ වන විටත් ඔහු ඇඳුම් ලා අවසන්ය. "අපේ හොඳ වෙලාවට ඊයෙ රෑ වැස්සේ නෑ. කීප වාරයක්ම මට නින්දෙන් ඇහැරුණා. මං භයෙන් හිටියේ වැහි පොදක් වත් වැටේවි ද කියල" හෝම්ස් කීවේ උදේ ආහාරයට මේසයට වාඩිවී පාන්පෙත්තක බටර් තවරමිනි. "ලොකු කළු වලාකුළක් තිබුණත් නොවැස්ස එක නම් දෙවියො බැලුව වගේ වැඩක්"


http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. මං ඔබට කියන්නයි හිටියේ" මම කීවෙමි. "ඔබට හන්ටර් ගැන වැඩිදුර හොයන්න අමතකවුණා නේද?" කලින්දා රාත්‍රියේ මගේ සිහියට නැඟුණු කරුණු ගැන මම ඔහුට මතක් කළෙමි.

"විශිෂ්ටයි වොට්සන්. ඔබ කාරණා තේරුම් ගන්න හැටි ඉතාම නිවැරදියි. ඔබට පෙනී ගොස් ඇති කරුණු හා ඔබේ උපකල්පන ඉතාම වැදගත්. අපේ මුලිකම වැඩ අවසන් වෙද්දී අපි හන්ටර් ගැන හොයා බලමු."

උදෑසන ආහාරය ඉක්මනින් අවසන් කොට, හිරුරැස් පොළොවට වැටීමටත් පෙර අපි නගරයෙන් පිටත්වීමු. අප හකල්ටන් සිට ආවිහිල් දෙසට තුළීරියක ගමන් කරද්දී ඔහු තම උකුල මත සිතියම දිගහැරි. එහි යම් තැනක් වෙත මගේ අවධානය යොමු කළේය.

"මේ සිතියම හොඳින් බලද්දී මට එක කරුණක් තේරුම් ගියා වොට්සන්. මං ඔබට කලිනුත් කිව්වා වගේ, මේ මිනීමැරුම ගැන වැටහීමක් ලබාගන්න නම්, චාල්ටන් මැඳුර අවට ප්‍රදේශය ගැන හොඳ වැටහීමක් ලබාගත යුතුයි. [illegible]නවා ඇති අපි දැන් ගමන් කරන පාර, ආවිහිල් පසුකර ගිහින් ඩියුර්ෆොරස්ට්, හන්දියේදී දෙකට බෙදෙනවා. ඒක 'T' අකුරේ හැඩේ තුන්මං හන්දියක්. වමට ගියොත් රයිස්හැම් වලට. ඒ පැත්ත අපට අමතක කරන්න පුළුවනි. නමුත් දකුණට තිබෙන පාර පිංක්හිල් පසුකර හැතැක්ම දෙකහමාරක් පමණ ගිහින් වැටෙනවා බොඩමිව් වලට. මෙන්න මේ පාර අපට හුඟක්ම වැදගත්. ඒ මොකද චාල්ටන් මැඳුරට එන්න පුළුවන් ප්‍රධාන පාර ආවිහිල් පැත්තෙන් වුණාට, ගෙදර සම්බන්ධ අතුරු පාරක් තියෙනවා පිංක්හිල් පැත්තට.

ආවිහිල් මානසික රෝහල පිහිටි ඉඩමත්, දෙස්කාර රයිලිට අයිති ඉඩමත් දෙකම උස්බිම්. ආවිහිල් පිංක්හිල් දෙකත්, ඒ නම් වලින් හැඟවෙන පරිදි කඳුවැටි මතින් වැටුණු පාරවල්. එතකොට අපට අදාළ වෙන හතරැස් කොටුවක් වැනි හරිය, සාපේක්ෂව පහත්බිමක් හැටියට සලකන්න පුළුවනි. ඒ බව සිතියමෙන් සඳහන් වෙනවා. හිටපු පොලිස් නිලධාරියෙක් වන ෆර්ගියුසන් මහත්මයාට මේ අඩවිය ගැන හොඳ වැටහීමක් තියෙනවා. මං ඔහුගෙන් විමසා බැලුවා. ඔහු කියන්නේ අප කියන හරියත්, ඊට නැගෙනහිරින්



**ආචිහිල්, පිංක්හිල් හා ඩොඩම්ඩ් විල්ලුවේ දළ සිතියම**

(පරිමාණයට නොවේ)



http://sherlockholmesinvestigations.blogspot.com

තිබෙන හරියත් දළ වශයෙන් අක්කර සියයක එකසිය පනහක බිම් ප්‍රදේශයක් බවයි. මෙකට මිටි පඳුරු, හා තැනින් තැන ලොකු ගස් ඇති වනලැහැබ් අයත් වෙනවා. මෙම බිම් ප්‍රදේශයේ විශාල කොටසක්, කුඩා පැළෑටි වලින් වැසුණු විල්ලු, නැත්නම් නිසරු ඔබිටි යනුවෙන් අප හඳුන්වන මුඩුබිම. ප්‍රධාන පාර වලට කිට්ටුව තැනින් තැන, ධාන්‍ය වගාව සඳහා වෙන් කළ කුඹුරු හා ගොවිපොළ ද ඉඳහිට පිහිටා තිබෙනවා. ෆර්ගියුසන් මහත්මයා කියන විධියට ඔය බිම් පෙදෙස හරහා සෑම අතකටම විහිදුණු තාර නොදැමූ ගුරු පාරවල් නැත්නම් මැටි පාරවල් තිබෙනවා."

"මෙක කොහොමද හෝම්ස් අපේ ප්‍රශ්නයට වැදගත් වෙන්නෙ?"

හෝම්ස් එම ප්‍රශ්නයට පිළිතුරු දීමට සූදානම් වෙද්දී අපේ රිය පසුකර වේගයෙන් ඉදිරියට ගිය කැබ්රියක්, අපට ඉදිරියෙන් නවත්වන ලදී. එයින් බැස ආවේ අපේ හිතවත් ටෝබියස් ග්‍රෙග්සන්ය.

"හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "මං ඔබ හමුවෙන්න තානායමට ආවා. නමුත් ඔබ දෙදෙනා උදේම පිටත්වෙලා ආ බව දැනගන්න ලැබුණා. කොහොමද ඔබට අපරාධකාරයා සොයාගන්න හැකිවුණාද?"

"ඇයි ග්‍රෙග්සන් එහෙම අහන්නේ? අපි නම් මේ පරීක්ෂණය පටන්ගත්ත විතරයි. ඔබට හැකිවුණාද මොනවා හරි අලුත් යමක් හොයාගන්න?" හෝම්ස් විමසුවේය.

"අපේ ලෙස්ට්‍රේඩ් කියන්නා වගේ, හෝම්ස් මහත්මයා නිරීක්ෂණ කර කර උපකල්පන ගොඩනගමින් ඉන්නවා" ග්‍රෙග්සන් කීවේ සිනාසෙමිනි. "ඔහොම ප්‍රමාද වෙච්චි අපරාධකාරයින් අත් අඩංගුවට ගන්නෙ කොහොමද? මං හොයාගත්තා අපරාධකාරයව. දන්නවද කවුද කියලා?"

"නැහැ"

"අපරාධකාරයා හෙක්ටර් වෝල්ටන්"

"මොනවා? කොහොමද ඔබ හොයාගත්තේ?"

"ඒ විස්තර අහන්න එපා හෝම්ස් මහත්මයා. මේ තුන් මිනීමැරුම සිදුකළේ ඔහුය කියන එක මට හොඳටම විශ්වාසයි. මාස තුන හතරකට කලින් ඔහු වෝල්ටන් මහත්මිය සමග ආරවුලක් ඇතිවෙලා තියෙනවා. ඔහු ඇයට තර්ජනය කළාලු. ඒ බවට ඇය පොලීසියට



http://sherlockholmesinvestigations.blogspot.com

පැමිණිලා කරලා. ඒ බව පොලිසියේ පොත්වල සටහන් වෙලා තියෙනවා. ඊළඟට මැරුම් කෑ සේවිකාව සේරා වුඩ්හැම් කලකට පෙර ඔහු විසින් ගෙදර සේවයෙන් අස් කළ තැනැත්තියක්ලු. ඇය යළිත් සේවයට බඳවාගෙන තියෙන්නේ, විවියන් වාල්ටන් මහත්මියගේ තනි කැමැත්තට. ඊකට ඇගේ සැමියා විරුද්ධ වුණාලු"

"මේවා මරණ පරීක්ෂණයේදී එළියට ආවෙ නැහැනේ. ෆර්ගියුසන් මහත්මයාගෙන් දැනගන්න ලැබුණෙත් නෑ. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"ඒක තේන්නං. නමුත් මං මේ තොරතුරු බොහොම පහසුවෙන් ලබාගත්තා පොලිස් ස්ථානයෙන්"

"ඔබ ඉතාම දක්ෂයෙක් ග්‍රෙග්සන්. ඔබ මේ ගැටලුව ඉතාම විශිෂ්ට ලෙස විසඳාවි බව සැක නෑ"

"ස්තුතියි හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීවේ ප්‍රීතිය උතුරා යන මුහුණෙනි. "ලෙස්ට්‍රේඩ්ල, හොප්කින්ස්ල හැම තිස්සෙම අඟවන්නෙ එයාලු තමයි දක්ෂයා කියල. මගේ හපන්කම පෙන්වන්න මේක හොඳ අවස්ථාවක්. මං අද දවල් හෙක්ටර් වාල්ටන් අත් අඩංගුවට ගන්න බලාපොරොත්තු වෙනවා. දැන් මේ ඒකට අවශ්‍ය ලියකියවිලි සූදානම් කරගන්න යන ගමන්"

"ග්‍රෙග්සන්" මම කීවෙමි. "අද උදේ වරුවේ මියගිය අයගේ අවමංගල කටයුතු දේවස්ථාන සුසාන භූමියේ පැවැත්වෙනවලු. ඒ කටයුතු වලට ඔබෙන් බාධාවක්......"

"නෑ නෑ දොස්තර මහත්මයා. ඒව හැම දෙයක්ම අවසන් වෙනතුරු මට පුළුවනි බලා ඉන්න"

"වාල්ටන් මහත්මයාට විරුද්ධව ප්‍රමාණවත් තරම සාක්ෂි තියෙනවා කියල ඔබ හිතනවද?" හෝම්ස් ඇසීය. "මට නම් එහෙම හිතෙන්නේ නෑ"

"ඔහු නොවෙයි නම් කවුද මේ අපරාධය කළේ?" පොලිස් නිලධරයා ඇසීය. "මට හොඳටම විශ්වාසයි ඔහු මේකට යොදා ගත් ගිනි අවිය ඇති ඔහුගේ ගෙදර. එය සෝදිසි කිරීමට බලපත්‍රයක් ලබාගත් ගමන්......"

"......... මට හිතෙනවා ඔබ කියන දේත් යම්කිසි වැදගත්කමක් ඇති බව........" හෝම්ස් කීය. "කොහොම වුණත් අපි මේ සූදානම් වෙන්නේ අපට හුරුපුරුදු විධියට පරීක්ෂාවක යෙදෙන්න. අපි ඒ


http://sherlockholmesinvestigations.blogspot.com

කටයුත්තට යන්නම්. දවල් වෙලා ඔබේ හපන්කම් දකින්න නිව් බෙවර්ලි වෙත එන්නම්"

අපෙන් සමුගත් පොලිස් පරීක්ෂකවරයා, කුලීරිය ආපසු හරවාගෙන පිටත්ව ගියේය. අපි ඉදිරියට ගමන් කළෙමු. ගමනේ ඉතිරි හරිය යද්දී මගේ මිත්‍රයා ගැඹුරු කල්පනාවක වෙළී සිටියා මිස, කතාබහකට උනන්දුවක් දැක්වූයේ නැත. ඔහුගේ සිතිවිලි වලට බාධා නොකොට මම නිහඬව සිටියෙමි.

හෝම්ස් තම දැහැනෙන් අවදිවූයේ කුලීරිය මහපාරෙන් හැරී වෝල්ටන් නිවස වෙත වැටුණු බොරළු පාරේ ගමන් කරද්දීය.

"අපි ආච්හිල් වලටත් ආවා එහෙනම්" ඔහු කීවේ සුසුමක් හෙළමිනි. "ෆ්‍රෙග්සන් කියූ කතාවෙන් මගේ හිත කැලඹුණා. හරියට නිසි පිළිවෙළකට සකසා තිබූ ලියකියවිලි ගොඩක් අවුල් කර දැම්මා වගේ" ඔහු කීය.

"ඒ බව මටත් තේරුණා"

"කමක් නෑ වොට්සන්. අපි හිතාගෙන ආව දේ ඒ පිළිවෙළටම කරමු. වෝල්ටන් මැදුරත්, එළිකුඩුලෙන් පිටින දඩබිමත් මං ඊයේ සෝදිසි කළා. අද මට පරීක්ෂා කරන්න තියෙන්නේ, දඩබිමෙන් පිටවෙන දොරටුවේ සිට. ඔබට පෙනෙනවා ඇති ඕනෑම හේතුවකට හරි මේ කැලෑ රොදට යන කෙනෙකුට ආපහු ඒමට තියෙන්නේ එකම දොරටුවක් බව. ඒ නිසා මේ කඩුල්ල, මෙතෙන් එළියට එන කෙනෙක් වත්තෙන් පිටවී යාමට නම් එක්කෝ වමට හැරිලා ගෙයි අයින දිගේ ගේ පිටුපසට ගිහින්, එතැනට බොරළු පාරට වැටිලා, ආච්හිල් ප්‍රධාන පාරට වැටෙන්න පුළුවනි. එහෙමත් නැත්නම් දකුණට හැරිලා ගියාම තාර නොදැමූ මැටි පාරකට වැටෙනවා. දැන් අපි යමු අන්න ඒ පාර දිගේ ඉදිරියට."

මුලදී පාර බොරළු සහිත වීම නිසා පා සටහන් හෝ වෙනත් ලකුණක් දක්නට නොලැබිණි. එහෙත් මඳ දුරක් ගමන් කරද්දී එහි බොරළු ගතිය නැතිව ගියේය. එය තැන් තැන් වල වැලි තිබූ, මැටි පසක් තිබූ පාරක් බවට පත්වූ අයුරු අපි දුටුවෙමු. එහි අතරින් පතර හරකුන්ගේ හා බැටළුවන්ගේ කුර සලකුණු ද බයිසිකල් ටයර සලකුණු යයි මා අනුමාන කළ ඒවාද දක්නට ලැබිණ.

"මෙන්න තියෙනවා මං හෙව්ව දේ" හෝම්ස් කීවේ සතුටට පත් හඬකිනි. "බයිසිකලයක් ගමන්කළ ටයර් සලකුණු"



http://sherlockholmesinvestigations.blogspot.com

ඉර අව්ව හොඳින් වැඩි තිබුණු තැනකට අප පිවිසි පසු හෝම්ස් සාක්කුවෙන් කාචය අතට ගෙන ගුරු පාරේ වැතිරුණේය. මුහුණ පොළොවට ළං කොට, කාචයෙන් එම සලකුණු නිරීක්ෂණය කරමින්, කඩදාසියක යමක් සටහන් කරගත්තේය. ඒ අතරම ටේප් පටියකින් යම් මිනුමක් ද ගත්තේය. එතැනින් නැගිට යාර දහයක් පමණ ඉදිරියට ගිය ඔහු, නැවත වරක් එම දිගාවී ටයර් සලකුණු පරීක්ෂා කර බැලුවේ, තනියම යමක් කොඳුරා ගනිමිනි. මීළඟට එය අවසන් කොට ඔහු යළිත් ඉදිරියට ගියේය. මීළඟට මේ පාර වැලි සහිත එකක් බවට පත්විය.

"බයිසිකලය ගමන් කරලා තියෙන්නේ වෝල්ටන් මැදුර පැත්තේ සිට ඉවතට. මං ඒ බව කිව්වේ, ඉස්සරහ රෝදයේ සලකුණු කපාගෙන, පිටිපස රෝදයේ සලකුණු වඩාත් ගැඹුරට පොළොවේ වැදී ඇති නිසා"

"එම ටයර් මොන වර්ගයේ ඒවාද කියා ඔබට කියන්න පුළුවන්ද?" මම ඇසීමි.

"බයිසිකල් ටයර් වර්ග හතළිහකට වැඩි ගණනක කට්ට පිහිටා ඇති රටා, මට හුරු පුරුදු බව මං ඔබට කියල ඇති. මෙකෙ ඉදිරිය හා පිටුපස රෝද දෙකම පෙරිලීන් වර්ගයේ ඒවා"

"මේ බයිසිකල් ටයර් සලකුණු අපට වැදගත් වෙන්නේ ඇයි?"

"ඇයි වොට්සන්? වෝල්ටන් නිවසේ අපරාධය කළේ ඔබ කියල හිතමු. බොහොම ලොකු ශබ්දයක් පිටවෙන විධියට වෙඩි තුනක් පත්තු කරලා මිනීමැරුම කළා. එහෙනම් ඔබ ගෙදරින් පිටවී යන්න කැමැති වැඩි දෙනෙකුගේ අවධානය යොමු වෙන, ආචිහිල් ප්‍රධාන පාර පැත්තෙන්ද? නැත්නම් කාගෙවත් අවධානය යොමු නොවෙන, ගේ පිටුපසින් වැටුණු මේ පාරෙන් ගිහිං පිංක්හිල් පැත්තෙන්ද?"

"නිසැකවම කාටවත් නොපෙනෙන පැත්තෙන්"

"අන්න හරි. ඊළඟට ඔබ අහුවි, ඇයි බයිසිකලයක් ගැන අවධානය යොමු කරන්නේ කියල. මිනීමරුවා කාටත් පෙනෙන විධියට ගේ ඉස්සරහ පාරෙන් අශ්වකරත්තයකින් පැනලා ගියා කියල මං හිතන්නේ නෑ. මේ ගේ පිටුපස පාරෙ අශ්වකරත්තයක් ගමන් කරන්න බෑ. එක්කො පයින් යා යුතුයි; නැත්නම් අශ්වයෙකු පිටේ; නැත්නම් බයිසිකලයක. නමුත් අශ්වයෙකු ගේ කුර සටහන් වත් පයින් ගිය කෙනෙකුගේ පා සටහන්වත් නෑ. බයිසිකලයක් ගිය ලකුණු නම් තියෙනවා......"



http://sherlockholmesinvestigations.blogspot.com

"මට හොඳටම පැහැදිලියි"

"මං ඔබට කලින් කිව්වා වොටසන්, බෝස්ටල් නිවාසයේ ළමයි දෙන්නා සමග බයිසිකලයකුත් අතුරුදන් වෙලා කියලා. එහෙම නේද?"

"ඔව්"

"මං ඒ බයිසිකලයේ අයිතිකරුවාගෙන් ඒ වෙලාවෙම අසා දැනගත්තා එහි ටයර් ගැන. ඔහුගේ බයිසිකලය ඔපන්ෂෝ ටයර් දෙකක් යෙදූ බෙන්ට්ලි සුපර් බයිසිකලයක්. ටයර් දෙක හුගක් ගෙවී තිබුණලු."

"නමුත් මෙතැන තියෙන්නේ පෙට්‍රිජ් ටයර් ලකුණු කියා ඔබ කිව්වේ......?"

"එයින් අපට තීරණය කරන්න පුළුවන් මේ පාරේ ගමන්කරලා තියෙන්නේ බෝස්ටල් ආයතනයෙන් අතුරුදන් වූ බයිසිකලය නෙමෙයි කියන එක"

"එතකොට අර ළමයි දෙන්නා නිදහස් වෙනවා?"

"බොහොම දුරට ඔව්. නමුත් ඒක හරියටම කියන්න බැහැ. ඒ මොකද ඔවුන් තව කාගෙ හරි බයිසිකලයක් හොරකම් කරගෙන ආව නම්?" හෝම්ස් ඇසීය.

"ඔව් ඒකත් හරි"

එම මැටි පාර දිගේ වැටී තිබුණු බයිසිකල් ටයර් සලකුණු පසුපස අපි සැහෙන දුරක් ගමන් කළෙමු. එක් තැනකදී පාර හරහා වැටුණු විශාල දිග මිස් අත්තක් නිසා, පාර අවහිර වී තිබිණි. බයිසිකලය පැදගෙන ගිය අයට එයින් මෑත, බයිසිකලය අත්තට උඩින් ඔසවාගෙන යන්නට සිදුවන්නට ඇතු. මෙය දුටු හෝම්ස්ගේ දෙනෙත් දීප්තිමත් වන අපූරු හැටි ලුහුවෙමි. පොළොව යළිත් වරක් පරීක්ෂා කළ ඔහුගේ මුවෙන්, සිවුරුගත් හඩක් නිකුත් විය. එතැන් සිට අඩි දහයක් පමණ ඉදිරියට මැටි පොළොව ඔහු ඉතා උනන්දුවෙන් සෝදිසි කර බැලුවේය.

"මේ බයිසිකලයේ ගමන් කරල තියෙන්නේ එක්කෙනයි. එම පුද්ගලයාගේ පා සටහන් පැහැදිලිවම තිබෙනවා. නමුත් ඒවා බෝස්ටල් නිවාසයේ ළමයින්ගේ පා සටහන් නොවන බව මට ස්ථිරවම කියන්න පුළුවනි"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ කොහොමද එහෙම කියන්නේ?"

"මෙන්න මෙතැන පොඟ් පස මත තියෙනවා, බයිසිකලය පැදගෙන ආ පුද්ගලයාගෙ හොඳට වැදුණු සපත්තු අඩි සටහනක්" හෝම්ස් කීවේ එතැනට ඇඟිල්ල දිගු කරමිනි. "මගේ අතේ තියෙන කාචය අරගන්න වොට්සන්. ඊළඟට හොඳට මුහුණ ළංකරලා ඒක බලන්න. ඒ සලකුණ ගැන මොනවද ඔබට කියන්න පුළුවන්?"

හෝම්ස් කළ අයුරින් මමත් දෙහොත් එතැනට ළං කොට එම අඩි සටහන පරීක්ෂා කර බැලීමි. එය නොගෙවුණු අලුත් සපත්තුවක සලකුණකි. විළුඹේ ලාංඡනය වෙන්ව පිහිටි අයුරෙන් හා එහි හැඩයෙන් ද, කකුලේ ප්‍රමාණයෙන් ද මට සිතුණේ, මෙය කාන්තාවකගේ සපත්තුවක අඩි සලකුණක් විය යුතු බවයි.

"මං දන්නෙ නෑ හෝම්ස් හරියටම. ඒත් මට නම් පෙනෙන්නේ මේක පිරිමියෙකුගේට වඩා ගැහැණියකගේ සපත්තුවක සලකුණක් කියලයි"

"විශිෂ්ටයි වොට්සන්" මගේ මිතුරා කීවේ අතිශය සතුටෙනි. "මේක නිවැරදිව හඳුනාගැනීම ලොකු දක්ෂතාවක්. මුලදී ටාල්ටන් නිවසේ මිදුලෙත්, මළසිරුරු අසලත් මේ වගේ තැනක හෝ දෙකකත්, මං මේ අඩි සටහන් දුටුවා. නමුත් එයින් මම සෑහීමකට පත් වුණේ නැහැ. බලන්න සපත්තු අඩි සලකුණේ ඉදිරි කොටසේ, දෙපැත්තට පිම්බුණු 'H' අකුර. මේක නිසැකවම ලේඩි හැමිල්ටන් වර්ගයේ කාන්තා සපත්තුවක ලකුණ. ලේඩි හැමිල්ටන් කියන්නේ කාන්තා පාවහන් වල මිල අධික වර්ගයක්. ඒ අතරෙත් මේවා නොගෙවුණු අලුත් පාවහන්. එහෙනම් බයිසිකලය පැදගෙන ගිහින් තියෙන්නේ නැති බැරි පවුලක ගැහැනියක් නොවෙයි."

අප තවත් ඉදිරියට ගමන් කරද්දී පාර වැටී තිබුණේ කන්දක් පහළට බැවුම් ආකාරයකටය. බයිසිකලය කන්ද බසිද්දී වරින් වර තිරිංග යෙදීම නිසා, මඩ පොළොවේ ඇතිවුණු සලකුණු අපි දුටුවෙමු. ඊට තරමක් ඉදිරියෙන් පාරේ මඩ වතුර එකතු වූ වළක් ද විය. වහා එතැනට ගිය මගේ මිතුරා මට එතැනට ළංවීමට ඉඩ නොදී බිම පරීක්ෂා කළේය.

"බයිසිකලයෙන් ආව තැනැත්තිය මෙතැනදී ඒකෙන් ඇද වැටිලා වොට්සන්" හෝම්ස් කීවේ මඩගොඩේ තිබූ සලකුණු



http://sherlockholmesinvestigations.blogspot.com

කිහිපයක් පෙන්වමිනි. "මෙන්න බයිසිකලයේ හැඩලය වැදුණු තැන. මෙන්න ඇගේ දණහිස්වල සටහන්. මේ බලන්න මඩ තැවරුණු කාන්තා අත්මේස් එකක්. මේ අප මළසිරුර ළඟ තිබී අහුලාගත් එකේ, අනික විය යුතුයි." කබා සාක්කුවෙන් ලියුම් කවරයක් එළියට ගත් ඔහු, අත්මේස් එක කවරය තුළට දමා වසා, එය සාක්කුවට දමාගත්තේය. "ඒක වම් අත. මේ දකුණු අත. බාග වෙලාවට මඩ තැවරුණු නිසා අත්මේස් එක ගලවලා අහකට විසිකරන්න ඇති............ බයිසිකලයෙන් වැටුණු පාරට සමහර විට ඇයට තුවාල සිදුවෙන්නත් ඇති. විශේෂයෙන්ම දණහිස් දෙකේ සහ වැලමිටි දෙකේ. දැන් අපි යමු ඉදිරියට."

එහෙත් ඉදිරියට තිබුණු බොරළු සහිත බෑවුම් පාරේ සලකුණු කිසිවක් දක්නට නොලැබිණ. සැතපුම් කාලක් පමණ මෙම පාරේ ඉදිරියට ගිය පසු, පාර යළිත් වළ ගොඩැලි සහ මඩ වළවල් සහිත එකක් විය. මෙය ගවයන් හා බැටළුවන් තණබිම් කරා යන, දිය සීරාව සහිත පහත්බිම් කඩක් බව අපි තේරුම් ගතිමු. ගොවිපොළ වලට බඩු ගෙන යන කරත්ත රෝද වලට පාර හෑරී විනාශ වී තිබිණි.

"මේ අබලන් පාරේ බයිසිකලයක් පැදගෙන ගියා නම්, එක්කෝ ඇය මෝඩකමට කළ වැඩක්. නැත්නම් සයිකල් ශූරියක්."

මීළඟ හෝඩුවාව දකීමට අපට වැඩිදුර යාමට අවශ්‍ය නොවීය. පාරේ වූ මඩ සහිත වළකට පෙරළුණු බයිසිකලය අත්හැර දමා ගොස් තිබිණ.

"මං කිව්වේ වොට්සන් ඇය ධනවත් කාන්තාවක් කියලා" හෝම්ස් කීවේ එතැනට ළං වෙමින් නොව යොමු කරමිනි. සෑහෙන තරම් අලුත් රැලේ වර්ගයේ බයිසිකලයක් වූ එය, කාන්තා මෝස්තරයේ එකක් විය. හෝම්ස් කී අයුරින් එහි තිබූ ටයර් දෙකම 'පෙරිග්‍රීන්' වර්ගයේ අලුත්ම ඒවා බැව් අපි දුටුවෙමු. එතැන මඩගොඩේ කිහිප තැනකම ඇගේ පා සටහන් ද තිබිණ.

මෙම ස්ථානය සියුම් ලෙස පරීක්ෂාවට ලක් කළ මගේ මිත්‍රයා, මඩ ගොඩේ වැටී තිබූ බොත්තමක් ද සොයා ගත්තේය. බොත්තම සුවිශේෂ එකක් බව එහි තැවරී තිබූ මඩ පිසදැමීමේදී අපි දුටුවෙමු. කුඩා පන් හාගයේ කාසියක් තරමට ලී වලින් තනා තිබූ බොත්තම, තද නිල් පැහැයේ හා රතු පැහැයේ තීන්ත ආලේප කොට අලංකාර කර තිබිණි.



http://sherlockholmesinvestigations.blogspot.com

"සැකයක් නෑ. ඒ කාන්තාවගේ ගවොමේ බොත්තමක්. ඇගේ ගවොමේ තද නිල් හා රතු පැහැය තිබුණේ නැත්නම් මං පුදුම වෙන්නෙත් නෑ" මගේ මිත්‍රයා කීවේ බොත්තම තම සාක්කුවට දමාගනිමිනි. "බයිසිකලයේ අංකය FE 88731. ඒක අපි සටහන් කරගමු.

"මේ තරම් අලුත්, හොඳ වර්ගයේ බයිසිකලයක් කැලේට විසිකරලා යන්න නම්, ඇය හොඳ වත් පොහොසත් කම ඇති කෙනෙක් වෙන්න ඇති" මම කීවෙමි.

"ඔව් එහෙම වෙන්නත් පුළුවන්" හෝම්ස් කීය. "එහෙම නැත්නම් වියදම් කිරීමේදී අපරාදයක්වත් නැති, නාස්තිකාර දියණියක්"

"ඇයි ඉතින් මේ යුවතී බයිසිකලය අරගෙන නොගියේ?" මම ඇසීමි. "මේක හොයාගත්ත කෙනෙක් පොලීසියට දැනුම් දුන්නාම ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන් නේ?"

"මේකයි වොට්සන් ප්‍රශ්නය. මෙතැන ඉඳලා දිගටම පාර තියෙන්නේ කන්දේ ඉහළට. ඒක ලොකු බෑවුමක්. බයිසිකලයේ නැගලා පැදගෙන යන්නත් බෑ. ඒක ඉහළට තල්ලුකරගෙන යාම වෙලා ගතවෙන, අමාරු මහන්සියක් වෙන වැඩක්. බාගවෙලාවට බයිසිකලයෙන් වැටිලා දණහිස, තැලෙමිට තුවාල වෙලා, ඇගේ ගමන වේදනාකාරී එකක් වෙන්නත් ඇති. ඒ නිසා වැඩිදුර නොගිහ ඇය බයිසිකලය මඩවගුල් අත්හැර යන්න ඇති"

එතැන් සිට ඉහළට පිංකිහිල් දක්වා තිබූ බෑවුම් පාරේ, ඉදහිට දක්නට ලැබුණු ඇගේ පා සටහනක් හැරෙන්නට, වෙනත් කිසිදු හෝඩුවාවක් හමු නොවීය.

"අපේ මීළඟ වැඩ කොටස පටන්ගන්න කලින් තේ කෝප්පයක් බිල ඉඳිමු වොට්සන්" හෝම්ස් කීවේ අප නාරදමා තිබූ ප්‍රධාන පාරට ළඟාවුණු පසුය. අපි පාර දිගේ ඇවිද ගොස්, සතුටුදායක පෙනුමක් තිබූ අවන්හලකට පිවිසියෙමු.

"අපට මේ දක්වා දකින්න ලැබුණු කරුණු අනුව, මොනවද ඔබට හිතෙන්නේ?" මගේ මිත්‍රයා විමසුවේය.

"මේ මිනීමැරුම පිටුපස ගැහැනියක් ඉන්නවා. ඒක ස්ථිරවම කියන්න පුළුවන්. එහෙම නේද?"

"පහුගිය පැය කීපය තුළ අපට දකින්න ලැබුණු දේවල් අපි මෙහෙම සම්පිණ්ඩනය කරමු" හෝම්ස් කීවේ අප වෙත ගෙන එනු



http://sherlockholmesinvestigations.blogspot.com

ලැබූ තේ කෝප්පයට සීනි දමා දිය කරමිනි. "මේ පළාතට අන්තිමට වර්ෂාවක් තිබිල තියෙන්නේ බදාදා රෑ. එයින් පස්සේ - ඒ කියන්නේ බ්‍රහස්පතින්දා, ටාල්ටන් මැනුවර් ඒට කවුරුන් හෝ කාන්තාවක් බයිසිකලයකින් ගමන්කරලා තියෙනවා. ඇය වඩාත් කිට්ටු ආවිහිල් පාරෙන් නොගිහින්, කාටවත් නොපෙනෙන කැලේ පාරක ගියේ ඇයි? ඇය සෑහෙන තරම් වත්පොහොසත්කම් ඇති කෙනෙක් බව පැහැදිලියි. සපත්තු ගැන අපි සම්පූර්ණයෙන්ම අමතක කරල දමු. මං හිතන්නෙ නෑ මේ පැත්තේ ජීවත්වෙන ගොවියෙක් හෝ එඬේරෙක් මේ තරම් වටිනා අලුත් බයිසිකලයක් මඩ වළක දමා යාවි කියල. ඇය මේ මිනීමැරුමට වගකිවයුතු අපරාධකාරිය කියන්න තරම් සෘජු සාක්ෂි තවමත් අප වෙත ලැබිල නෑ. ඒත් වක්‍ර සාක්ෂි වලින් නම් එහෙම දෙයක් කියවෙනවා."

"මිනීමැරුවේ ඇත්තටම ඇය නම්, සැකකාර ලැයිස්තුවේ කිහිප දෙනෙක් ඉවත්වෙනවා," මම කීවෙමි. "බෝස්ටල් තරුණයින් දෙන්නා, වෛද්‍ය ක්ලයිටන්ගේ පුතුයා, ඒ සමගම හෙක්ටර් ටාල්ටන්. එහෙම නේද හෝම්ස්?" මා විමසුවේ තේ කෝප්පය බී අවසන් කරමිනි.

"බෝස්ටල් තරුණයින් දෙන්නා නම් අපට අත්හැර දමන්න පුළුවනි." හෝම්ස් කීය. "නමුත් එතැනින් එහාට මොකුත් කියන්න බැහැ. බයිසිකලයේ ගිය කාන්තාව මේ අපරාධයට සම්බන්ධ කරන්න තියෙන ප්‍රධාන සාක්ෂිය, මළසිරුර අසල වැටී තිබුණු අත්මේස් එකේ අනික, බයිසිකලය වැටුණු මඩවළක තිබී හමුවීම. අපරාධය කළේ ඇය ය කියන්න තරම් ප්‍රබල සාක්ෂියක් තවමත් නෑ."

"බාගවෙලාවට ඇය, එඩියා ක්ලයිටන් තරුණයා විසින් මුදල් ගෙවා එවූ තැනැත්තියක් වෙන්න බැරිද?" මම ඇසීමි.

"තර්කානුකූලව එහෙම උපකල්පනයක් කරන්න පුළුවන් බව ඇත්තයි වොට්සන්." හෝම්ස් කීවේ තේ බීම අවසන් කර පයිප්පය දල්වා ගනිමිනි. "නමුත් ක්ලයිටන් තරුණයා නිතර ලන්ඩනයට යන එන කෙනෙක් නම්, මේ වගේ අපරාධයක් කරවන්න ඔහු ගැහැනියක් යොදා ගනීවිද? කැලෑපාරක හරියට බයිසිකලයක් පැදගන්න බැරි ගැහැනියක යොදවා ගන්නවාට වඩා, ඔහු ඒකට පළපුරුදු මැරවරයෙකු යොදවා ගනීවි. එහෙම නේද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඒකත් ඇත්ත"

"අපරාධය කළේ මේ කාන්තාව කියල අපි හිතමු වොට්සන්. නමුත් ඇයි ඇය මෙහෙම දෙයක් කළේ? වාල්ටන්ලා සමග අමනාපයක් තියෙන කාන්තාවක් ගැන අපට මේ දක්වා අහන්න ලැබුණේ නැහැ. එතකොට ඇය කොහොමද සුදුසු වෙලාවක් බලල මෙහේ ආවෙ? අපි හිතමු ආවෙ බයිසිකලයෙන් කියලා. එහෙනම් අපි අනිවාර්යයෙන්ම හොයා බලන්න ඕන කරුණු මොනවා කියලද ඔබට හිතෙන්නේ?"

"බ්‍රහස්පතින්ද උගේ බයිසිකලයක නැගී කාන්තාවක් මේ ගෙදර පැත්තට එනවා කවුරුවත් දුටුවද?" මම කීවෙමි. "සාමාන්‍යයෙන් බයිසිකලයක එහෙ මෙහෙ යන කාන්තාවක් මේ පලාතේ ඉන්නවද?"

"බොහොම හොඳයි වොට්සන්" හෝම්ස් කීය. "ඊළඟට අපට තවත් හෝඩුවාවක් තියෙනවා. FE 8731 දරන රැලේ බයිසිකලය මිලට ගත්තේ කවුද? ආදී දේවල්. ඒ ඔක්කොටම කලින් අපි ප්‍රමාද නොවී නිව්බෙවර්ලි වලට යමු. හෙක්ටර් වාල්ටන් රක්ෂිත බන්ධනාගාරයට ගන්න හේතුසාධක හැකිවුණාද? මිනීමැරුම වලට යොදාගත් ගිනිඅවිය හමුවුණාද? වැනි කාරණා හොයා බලමු"

අපි කුලීරියක නැගී අපට වඩාත් ළඟින් පිහිටි වොඩම්ඩ දුම්රියපොළ වෙත ගියෙමු. අවාසනාවකට මෙන් අප එහි යාමට පෙර, ලන්ඩන් දෙසට යන අන්දගාමී දුම්රිය පිටත්ව ගොස් තිබිණ. ඊළඟට පැමිණෙන දුම්රිය දෙකම සීඝ්‍රගාමී දුම්රිය බවත්, ඒ නිසා නිව්බෙවර්ලිහි ඒවා නොනවතින බවත්, දුම්රිය නිලධාරයෙක් අපට දැනුම් දුන්නේය. මීළඟ දුම්රිය පැමිණෙන තුරු, අපට සෑහෙන තරම් වෙලාවක් දුම්රියපොළේ රැඳී සිටීමට සිදුවිය. ඒ ගැන ළතැවීමක් නොපෙන්වූ මගේ මිත්‍රයා නිදහසේ කල්පනා කිරීමට පටන්ගත්තේය.

"අපට හමුවුණු සාක්ෂි වලින් වඩාත්ම වැදගත් ඒවා කියල ඔබට හිතෙන්නෙ මොනවද හෝම්ස්?" මම ඇසීමි.

"සැකයක් නෑ. බයිසිකලය තමයි වැදගත්ම සාක්ෂිය. මෙකෙ අංකය සඳහන් නිසා, එය මිලට ගත් පුද්ගලයා මෙතට පටලැවෙනවා. ඊළඟට වැදගත් දේවල් තමා, නිල්පාට හා රතුපාට මිශ්‍ර බොත්තම. ඒ සමගම කාන්තා අත්වැසුම" හෝම්ස් කීවේ ඒවා දමාගත් කවරය තිබූ සාක්කුවට තට්ටු කරමිනි.



http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් ඔබ කියන විධියට මේ අපරාධය ගැන හෙක්ටර් වාල්ටන්ට එරෙහිව සාක්ෂි නැති තරම්. එහෙම නේද?" මම ඇසීමි.

"ඔව් ඒක හරි වොට්සන්" ඔහු ඊට එකඟවිය. "ඔබට මතකද අර සේරා වුඩ්හැම් සේවිකාවට වෙඩිවැදිල තිබුණු තැන? එතැන තිබුණා දසත විසිරී ගිය තේ කෝප්ප, පීරිසි කැබලි. ඔබට මතක ඇති, මං ඒවා එද මල්ලකට එකතුකරගත් බව. ඒ කැබලි වලින් මං හොයාගත්තා, එතැන තේ කෝප්ප හතරක්, ඒවායේ පීරිසි හතරක්, සීනි බඳුන, කිරි ජෝගුව හා තේ පෝච්චිය තිබුණු බව. සේවිකාව තේ කෝප්ප හතරක් අරගෙන ආවෙ කාටද?" හෝම්ස් ඇසුවේ පයිප්පයේ තිබූ දැවී අවසන් වූ දුම්කොළ හා අළු ඉවතට හලමිනි.

"ඒ හතරදෙනාගෙන් මදෙනෙලගෙන් වාල්ටන් මව හා දුව බව පැහැදිලියි. ඉතිරි දෙදෙනා කවුද?" මම ඇසීමි.

"ඒ ඉතිරි දෙදෙනාගෙන් එක් කෙනෙකු සේරා වුඩ්හැම් වෙන්න ඇති" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඇය හා වාල්ටන් මහත්මිය අතර තිබිල තියෙන්නේ ලොකු හිතමිත්‍රකමක්. ඔවුන් දෙදෙනා අතර තිබුණු බැඳීම, සේවිකාව හා ස්වාමියවට වඩා යහළුවන් දෙදෙනෙකුගේ හිතවත් කමක්."

"ඔබ කොහොමද දැනගත්තෙ?"

"මට ඒක කිව්වෙ සුසාන් ජෝන්ස්" හෝම්ස් කීය. "නමුත් කවුද මේ හතරවැනි තේ කෝප්පයට හිමිකම කියූ පුද්ගලයා? අන්න එයා තමයි මිනීමරුවා"

"ඔබ කොහොමද හෝම්ස් එය තරම් විශ්වාසෙට කියන්නෙ?"

"හිතවත් මිත්‍රයා. මං ඔබට කියල දීල තියෙනවා, අපරාධ පරීක්ෂණයේ මූලධර්ම. මුලින්ම හොඳින් නිරීක්ෂණය කරන්න. ඉන්පසු ඒවා උදව් කරගෙන නිගමනවලට එන්න. වෙන්න බැරි හැම එකක්ම ඉවත්කළාම, ඉතිරිවෙන එක තමා සිදුවුණේ. මෙතැනදී ඒක ඉතාම පැහැදිලිවෙන්ම පේනනවා."

"හෝම්ස් මේ අහන්න" මම කීවෙමි. "හතරවැනි තේ කෝප්පය හෙක්ටර් වාල්ටන්ට වෙන්න බැරිද?" මම ඇසීමි.

"කොහොමටත් වෙන්න බෑ. මං හිතන්නෙ නෑ සේරා වුඩ්හැම් සේවිකාව ඒව් කියල, ඇයව රැකියාවෙන් නෙරපා දැමූ ස්වාමියා එක්ක එකට තේ බොන්න. ඊළඟට මේ ගැනත් කල්පනා කරන්න වොට්සන්. විවියන් වාල්ටන් මහත්මියත්, ජූන් වාල්ටන්



http://sherlockholmesinvestigations.blogspot.com

මෙහෙවියන් දෙන්නාම හිටියේ ගම්බූටස් පැළඳලා. ඒ වගේම ඔවුන් හැඳ සිටියේ, ගෙදරින් පිටත වැදගත් ගමනක් යන්න අඳින, හොඳ විසිතුරු ඇඳුම් ඇඳගෙන නොවෙයි. එතකොට මේ අතිරේක ආරක්ෂක පාවහන් ඔවුන් පළඳින්න ඇත්තේ කොහේ යන්නද?"

"දඩයමේ යන්න?"

"හරියට හරි වොට්සන්. ඔවුන් තුමන්ගේ නිවස පිටුපස කැලෑරොදේ දඩයමේ යන්න සූදානම් වෙලා.................... බොහෝ විට වළිකුකුළන් හෝ හාවුන් දඩයමේ. මේ කටයුත්තට ඔවුනට හවුල්වෙන්න තවත් කාන්තාවක් ඇවිත් හිටියා. හතරවැනි තේ කෝප්පය අන්න ඇයට. දැන් ඔබට පැහැදිලිද?"

"ඔව්"

"ඔවුන් දඩයමේ යන්නු සූදානම් වුණා. නමුත් ගිහින් තිබුණේ නැහැ." හෝම්ස් කීය.

"ඔබ කොහොමද ඒක දැනගත්තෙ?"

"අර ගම්බූටස් සපත්තු වල අඩියේ ලාංඡන දඩබිමට යන මාර්ගයේ තිබෙනවද කියල මං පරීක්ෂා කරල බැලුවා. නමුත් තිබුණේ නැහැ. බ්‍රහස්පතින්දා උදේ එහි කිසිවෙකු ගිය බවට සලකුණක්වත් තිබුණේ නැහැ."

"හොඳයි. මේ මිනීමැරුමේ අරමුණ වුණේ මොකක්ද? මුදල් කොල්ලකෑමක්ද?" මම ඇසීමි.

"කාන්තාවක් ගෙදරට ඇවිත්, ගෙහිමියාට තුවක්කුවක් එල්ල කරලා මිනීමරලා මුදල් කොල්ල කෑ බවක්, තවමත් අපට මේ එංගලන්තයේ නම් අහන්න ලැබිලා නැහැ." හෝම්ස් කීය. "බාගවෙලාවට ඇමරිකාවේ වික්‍රමගෝ වල නම් එහෙම අවස්ථා ඇති"

"එහෙනම් අල්මාරි ලාච්චු ඇදලා, ඒවා ඇතුලත තිබූ දේ බිමට ඇද දැම්මෙ ඇයි?" මම ඇසුවෙමි.

"මේක මුදල් කොල්ලකෑමේ අරමුණෙන් කළ එකක් බව හඟවලා පොලිසිය නොමඟ යවන්න. ඔබ ඒ කරුණ තේරුම් ගත්තද?"

"ඔව්"

"හොඳයි. දැන් අපට පෙනෙනවා කවුරු හරි ගෙදරට ඇවිත් මේ තුන්දෙනාව ඝාතනය කළා. මුදල් කොල්ලකෑමට නෙමෙයි නම්, ඒ මොකටද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"එක්කෝ වෝල්ටන් පවුල සමඟ ක්‍රෝධයෙන්. නැත්නම් ඔවුන් අතින් වුණු වැරැද්දකට පලිගැනීමේ චේතනාවෙන්" මම කීවෙමි.

"ඔව්, ඔබේ නිගමනය හරි" හෝම්ස් කීය. "ඒ වුණත් මේ පවුලෙ අය සමග ඔය වගේ ප්‍රශ්නයක් ඇති කාන්තාවක් ගැන අපට අහන්න ලැබුණෙ නෑ. එහෙම නේද වොට්සන්? ඒකට හේතුව මොකක්ද දන්නවද? මේ පැටළුණු ගැටලුව ඇතුළට හාරා අවුස්සා බැලීම තවමත් ඉවර නෑ. මෙතෙක් තව ඇළියට හොයාගත යුතු කරුණු තියෙනවා. මට හොඳටම විශ්වාසයි, මේ ගැටලුවට විසඳුම තියෙන්නේ........."

ඔහු කීමට සූදානම් වූ වාක්‍යය නිම කිරීමට පෙර, මහ හඬින් හූ හඬක් නගමින් දුම්රිය වේදිකාවට ළඟාවිය. ඒ ලන්ඩන් කරා යන දුම්රිය බැව් මහජන ඇමතුම මඟින් නිවේදනය කෙරිණි.

එයට නැගීමේ අරමුණෙන් අපි වහා ඉදිරියට ගියෙමු. දුම්රිය මේ වනවිටත් සෙනගෙන් පිරී ඉතිරී යමින් ) තිබිණි. නිව්බෙවර්ලි ක්‍රීඩාංගනයේ පැවැත්වෙන පාපන්දු තරඟයක් නැරඹීමට විශාල පිරිසක් එම දුම්රියෙන් ගමන්ගත්හ. අප දෙදෙනාට හිඳගැනීමට සිදුවූයේ දෙතැනක බැවින් ඔහුසිටක් සහාධන කිරීමට ඉඩක් නොලැබිණ.

නිව්බෙවර්ලි දුම්රියපොළේදී දුම්රියෙන් බැස පිටව යාමට අපි සූදානම් වූයෙමු. අපට දකින්නට ලැබුණේ හඳුනන මුහුණකි. "මේ ග්‍රෙග්සන් නේද?"

"සුභ සන්ධ්‍යාවක් මහත්වරුනි" පවසමින් ග්‍රෙග්සන් ඉදිරියට ආවේ අප එන බව කල්තියා දැන සිටියාක් මෙනි. "ඔන්න මට භාරවුණු රාජකාරිය හරි. මං ඒක සාර්ථකව ඉටුකළා"

"ඒ මොකක්ද ග්‍රෙග්සන්?"

"ඇයි මං අද උදේ ඔබට කිව්වුයේ බීර තම්බල් අයිතිකරු හෙස්ටර් වෝල්ටන් දැන් රක්ෂිත බන්ධනාගාරයේ" පොලිස් නිලධාරයා කීවේ සාඩම්බර ස්වරයකිනි.

"හැබෑට? ඒ වුණත් ඔහුව භාරකාරයට ගැනීම ඔබට ප්‍රශ්නයක් වුණේ නැද්ද? ඔහුට විරුද්ධව ප්‍රමාණවත් තරම් සාක්ෂි තිබුණා කියල මට හිතෙන්නෙ නෑ" හෝම්ස් කීය.

"හෝම්ස් මහත්මයා, ඔහුට විරුද්ධ ඇසින් දුටු සෘජු සාක්ෂි නැති බව ඇත්තයි. නමුත් ඔහු එම ඝාතන කළ බවට වක්‍රව සාක්ෂි මතුවෙමිනුයි තියෙන්නෙ........"



http://sherlockholmesinvestigations.blogspot.com

".......... ඔහුගේ නීතිඥයින් කෙතෙක් විරුද්ධත්වයක් එල්ල වුණේ නැද්ද?"

"මහත්මයා" ෆ්‍රෙග්සන් කීය. "නීතිඥයින් කියන්නේ කොහොමටත් අනික් අයට වඩා තර්කයක් වැඩි අය නේ. එයාල කොහොමද මාව පල්කරන්නේ? විනිශ්චයකාරතුමාට සිද්ධවුණා මං ඉදිරිපත් කළ හේතු පිළිගන්න.

වාල්ටන් මහත්මයා උදේ අනුමානාගෙ ඉඳල දෙළහ වෙනතුරු රථවාහන තදබදයක හිටියලු. ඒත් එහෙම එතැන හිටිය බව කවුද දැකල තියෙන්නෙ? දෙළහත් එකත් අතරේ ඔහු ගෝල්ඩන් ඊගල් ක්‍රීඩා සමාජයට ආ බවට සාක්ෂි තියෙනවා. ඒත් එතෙක් ඉඳල දෙක වෙනතුරු ඔහු දුවුව කොහෙහෙත් ඉන්නවද? විවියන් වාල්ටන් මහත්මිය ඝාතනය කරන්න වුවමනාවක් තිබුණෙ ඔහුට ඇරෙන්න වෙන කාටද? අර සේවිකාව සේරා වූඩ්හැම් දමගත් ඔහුගේ තිබුණා වෛරයක්........ මට විශ්වාසයි අර හැහැනු ළමයාට නම් වැදෙන්න ඇත්තෙ ඇගේ මවට එල්ල කළ මුල් වෙඩිපහර"

"හොඳයි හොඳයි ෆ්‍රෙග්සන්" හෝම්ස් කීවේ පොලිස් නිලධරයාගේ පිටට තට්ටු කරමින්. "ඔබේ ඔය දක්ෂකම නිසා ඔබ පොලිස් සේවයේ ඉහළටම යනවා නිසැකයි. ඔබ දවසක පොලිස්පති තනතුරට පත්වුණොත් මං පුදුමයට පත්වෙන්නෙ නෑ"

"ඔබ ඔහොම කියනකොට මට ලැජ්ජාත් හිතෙනවා හෝම්ස් මහත්මයා" ෆ්‍රෙග්සන් කීය. "ඔබ මට විහිළු කරනවා. එහෙම නේද? ඒක නෙමෙයි. මං හිතුවා ඔබ ආයෙ රක්ෂිතයට ගිහින් වාල්ටන් මහත්මයාගෙන් ප්‍රශ්න කරන්න කියලා?"

"කළ යුතු ප්‍රශ්න කිරීම ඔබ දැනටමත් කරලා ඇතිනේ." හෝම්ස් කීය. "මේ වෙලාවෙ ඔහු ඇත්තෙ ලොකු සිත්තැවුලකට පත්වෙලා. එහෙම වෙලාවට අපි තවදුරටත් ප්‍රශ්න කරන්න යන එක හොඳ නෑ. මං පනුවෙලා ගිහින් ඔහුව හමුවෙන්නම්. ෆ්‍රෙග්සන්, ඔබ කිව්වා නේද වාල්ටන්ගේ නිවසේ බෙවර්ලිහි නිවස ඔබ සෝදිසි කරනවා කියලා? කෝ ඒ කටයුත්ත ඔබ කළාද? ඔබට හැකිවුණාද අපරාධය සඳහා යොදාගත් ආයුධය හරි සැකසහිතයුතු දේවල් හොයාගන්න?"

"ඒ ගේ අපි සෝදිසි කළා. වැඩ රාජකාරි වැඩි නිසා ඉක්මන් සෝදිසියක් කළේ. සැකකටයුතු කිසිදෙයක් අපට හමුවුණේ නෑ"

"එතකොට වාල්ටන් මහත්මයා ළඟ තියෙනවා කිව් රිවෝල්වරය සහ රයිෆලය?" හෝම්ස් විමසුවේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ දෙක ඔහු ඊයෙම පොලීසියට භාරදුන්නා. නමුත් අපරාධය සඳහා ඔහු යොදාගෙන තිබෙන්නේ මේ ආයුධ නෙමෙයි. ඒක මට බැලූ බැල්මටම කිව්ව හැකි. කොහොම වුණත් අපි ඒ ආයුධ, ඊයෙම ගිනිඅවි විශේෂඥයා වෙත යවලයි තියෙන්නේ"

"ඒකත් එහෙමද?" යි හෝම්ස් මද වේලාවක් කල්පනා කළේය. "ෆ්‍රෙග්සන්. මමත් ගිහින් වාල්ටන් මහත්මයාගේ ගේ සෝදිසි කර බලනවාට ඔබේ විරුද්ධත්වයක් නැද්ද?"

"මගේ කිසිම විරුද්ධත්වයක් නෑ."

"ඔබට යමක් හොයාගන්න බැරිවුණා නම්, මං හිතන්නෙ නෑ මට යමක් හොයාගන්න හැකිවේවි කියල" හෝම්ස් කියද්දී ෆ්‍රෙග්සන්ගේ මුහුණේ සතුටු සිනාවක් මතුවිය. "ඒ වුණත් මං කැමැතියි එතැන පෙනුම මොන වගේද කියල බලාගන්න."

"යන්න හෝම්ස් මහත්මයා යන්න. එතැන මුරට පොලිස් භටයන් දෙදෙනෙකු ඉන්නවා. ඔබට කැමැති විධියට එතැන පරීක්ෂා කරල බලන්න. මං ඒකට උදව් කරන්නම්" කී ෆ්‍රෙග්සන්, අපට සම්පූර්ණ සහයෝගය ලබාදෙන මෙන් නියෝග කොට, ඔහු සමග සිටි පොලිස්භටයා අප සමග එවිය. ලන්ඩන් බලා යන සීඝ්‍රගාමී දුම්රිය එනතුරු, ෆ්‍රෙග්සන් දුම්රියපොළේ රැඳී සිටියේය.

හෙක්ටර් වාල්ටන් මහතාගේ නිව්බෙවර්ලි නිවස තිබුණේ ඔහුගේ බීර කම්හලට නුදුරෙන් වූ හරස්පාරකය. සුඛෝපභෝගී අශ්වකරත්ත අලෙවි කළ වෙළෙන්දෙකු සතුව තිබූ "ලෙයාඩ්ස්" නම් මෙම නිවස, ඔහුගේ මරණයෙන් පසු විකුණන ලද බව අපට අසන්නට ලැබිණි. අවුරුදු දෙකකට පමණ පෙර වාල්ටන් මහතා විසින් එය මිලදී ගත්තත් ඔහු එහි පාවිච්චියට ගෙන ඇත්තේ පහළ තට්ටුවේ කොටසක් පමණක් බව, අප සමග ගිය පොලිස්භටයා පැවසීය. අක්කරයක් පමණ විශාල වත්තක් මැද ඉදිකර තිබූ, විශාල දෙමහල් "ලෙයාඩ්ස්" නිවස, ඉතා අලංකාර එකක් විය. එහි ගෙවත්ත මෙන්ම ගේට්ටුව ළඟ සිට නිවස දක්වා තිබූ පාර දෙපස ද, වල් පැළෑටි වලින් වැසී කැලෑරොදක් බවට පරිවර්තනය වෙමින් තිබූ අයුරු අපි දුටුවෙමු.

අප ගමන්ගත් ලොකු අශ්වකරත්තය එහි පැමිණෙද්දී පොලිස්භටයෙක් ගෙතුළින් එළියට බැස්සේය. අප සමග තමන්ගේ සගයෙකු ද සිටි බැව් දුටුවිට, ඔහුගේ මුහුණට සිනාවක් නැගිණ.



http://sherlockholmesinvestigations.blogspot.com

"ලන්ඩන්වලින් ආව ෆෙගර්සන් මහත්තය කිව්වා මේ මහත්තුරු දෙන්නට ගේ පරීක්ෂා කරන්න ඉඩ දෙන්න කියලා" අපේ මිත්‍රයා සිය සගයාට කීය.

"ලෙයාඩ්ස්" නිවසේ උඩහත්තුව පාවිච්චියට නොගෙන සම්පූර්ණයෙන්ම වසා දමා තිබිණ.

"ගෙදරට සේවකයන් කවුරුවත් නෑ" මුරට සිටි පොලිස් භටයා කීවේ අපගේ විමසීමක් නොමැතිවය. "ඒ මහත්තයට උදේට කෑමයි රෑට කෑමයි හෝටලයකින් අරගෙන ආවලු. දවල් කෑම ඔහුගේ කම්හලටම ගිහින් දුන්නලු. සතියකට දෙසැරයක් කම්හලෙන් සේවකයෙක් ඇවිත් ගෙයි මිදුලයි පිරිසිදු කරල ගියාලු"

නිවස පරීක්ෂා කිරීමේදී එම කරුණු සත්‍ය බැව් පෙනිණ. නිවස අලංකාරව තබාගැනීමට වෝල්ටන් මහතා කිසිදු උත්සාහයක් දරා නොතිබූ බැව් අපි දුටුවෙමු. සතියකට දෙවරක් පිරිසිදු කළත් විසිත්ත කාමරය, ආලින්දය හා පුස්තකාල කාමර දූවිලි තට්ටු වලින් වැසී තිබිණ. නිවසට අමුත්තන් නිතර ආ ගිය බව දක්වෙන සලකුණු කිසිවක් නොවීය.

ඔහු නිවසේ භාවිතයට ගත් එකොටස ලෙස පෙනුණේ, දොරවල් වලින් එකිනෙකට සම්බන්ධව තිබූ කාමර තුනකි.

එයින් මුල්ම කාමරය වූයේ කන්තෝරු කාමරයයි. එය පිරෙන්නට මේස හා රාක්ක මත, ලිපිගොනු හා ගණන් තැබීමේ පොත්පත් තැන්පත් කර තිබිණි. කාමරයේ බිත්තියකට සවිකොට මුදල් දමන ආකාරයේ යකඩ සේප්පුවක් ද විය.

ඔහුගේ නිදන කාමරය වූයේ, නිවසේ ප්‍රධාන නිදන කාමරයයි. සෑහෙන තරම් විශාල එකක් වූ එහි ද්විත්ව ඇඳක්, කණ්ණාඩි මේසයක්, සුවපහසු හාන්සිපුටු දෙකක් හා ඇඳුම් අල්මාරියක් විය.

එයට දොරකින් සම්බන්ධව තිබූ අනෙක් කාමරය ද තරමක් විශාල එකක් විය. එහි කෑම ගැනීම සඳහා යොදගත්, පුටු හතරක් සහ හතරැස් මේසයක්, පියානෝවක්, මත්පැන් බෝතල් ගබඩා කර තිබූ කැබිනෙට්ටුවක් හා විගන් තොප්පි ඇසිරූ කැබිනෙට්ටුවක් ද විය. කාමරයේ එක් කෙළවරක, බිත්තියට හේත්තු කළ පොත් රාක්කයක් තිබිණි. එම රාක්කයටම හේත්තු වන සේ දිගු කැටපතක් සවිකළ කච්චර ලීයෙන් තැනූ අල්මාරියක් ද විය. එම අල්මාරිය නිසා රාක්කයෙන් පොත් තෝරා ගැනීමට තබා එයට ළංවීමට වත් ඉඩක් නොතිබිණි. අල්මාරිය ඒ අයුරින් පොත් රාක්කයට හේත්තු



http://sherlockholmesinvestigations.blogspot.com

වන සේ තල්ලු කරන්නට ඇතිබව් කාමරයට ඉඩ ලබා ගැනීමට බැව් අපි තේරුම් ගත්තෙමු. එම අමතර ඉඩ අවශ්‍ය වූයේ, පියානෝව හා එහි පුටුවත්, සැම කලා මේසයත් කාමරයට ගැනීමට බව පැහැදිලිව පෙනිණ. සංගීතවාදනය සඳහා ටාල්ටන් මහතා ලැබූ සහතික හා ඔහු සහභාගී වූ සංගීතප්‍රසංග වලදී ගත් ඡායාරූප කිහිපයක් බිත්තියේ එල්ලා තිබිණ.

"ටාල්ටන් මහත්තයා ව්‍යාපාරිකයෙක් වුණාට, සංගීතඥයෙක් බව මම දැනගෙන හිටියෙ නැහැ" මම මගේ මිත්‍රයාට කීවෙමි.

"ඔහු දක්ෂ පියානෝ වාදකයෙක් බව මං දැනගෙන හිටියා" හෝම්ස් කීය. "මහරැජිනගේ ජුබිලි මංගල්‍යය වෙනුවෙන් ලන්ඩනයේ පැවැත්වූ මහා උත්සව සැණකෙළියටත් ඔහු ගියාලු. ලෙස්ටර්ෂයර් ප්‍රාන්තයෙන් ගිය සංගීත කණ්ඩායමේ, ප්‍රධානියා වුණේ ඔහු බව මට හර්බියුසන් මහත්තයා කිව්වා"

"ඒ කොහොම වුණත් මේ වගේ කීර්තිමත් සංගීතඥයෙක් පැටලිලා තියෙන්නේ මහ අපකීර්තිමත් අපරාධයකට. එහෙම නේද හෝම්ස්?" මම කීවෙමි.

එයට තම හිස සෙලවීම මිස හෝම්ස්ගෙන් පිළිතුරක් නොලැබිණි.

මුලින් ටාල්ටන්ගේ නිදන කාමරයේ පොළොව හා ඇඳන් ඇතුළු සැම තැනක්ම හෝම්ස් ඉතා සියුම් ලෙස පරීක්ෂාවට ලක්කළේය. ටාල්ටන්ගේ ඇඳුම් අල්මාරිය අගුළු දමා නොතිබිණි. එහි ඇඳුම් කිහිපයක් ඉවතට ගෙන යළි ආපසු දැමූ මගේ මිත්‍රයා, ඇඳුම් අල්මාරියේ යට හා ලාච්චු ද සෝදිසි කළේය. මීළඟට ඔහු ඉතා උනන්දුවෙන් කණ්ණාඩි මේසය අසල පොළොව තම සාක්කුවෙන් ගත් බුරුසුවකින් පිස දමා දූවිලි සියල්ල සුදු කඩදාසියකට දමා එය නමා සාක්කුවට දමාගත්තේය.

මීළඟට හෝම්ස් මා කැඳවාගෙන ගියේ පියානෝව තබා තිබූ යාබද කාමරයටය. එය ඇතුළට හොඳින් එළිය වැටෙන සේ ඔහු මුලින්ම ජනෙල් සියල්ල විවෘත කළේය. ඊළඟට කබා සාක්කුවෙන් කාචය අතටගෙන, කාමරයේ සැම තැනක්ම සියුම් පරීක්ෂාවකට ලක් කළේය. පියානෝව අසල බිම හා කළුවර අල්මාරිය අසල බිම පෙර පරිදිම සියුම් බුරුසුවෙන් පිස දමා, එම දූවිලි තවත් කඩදාසියකට එකතු කරගෙන සාක්කුවේ දමාගත්තේය. මේ වන විට



http://sherlockholmesinvestigations.blogspot.com

නිවස පරීක්ෂා කිරීමේ කටයුතු අපට නිදහසේ කර ගැනීමට ඉඩදී පොලිස්භටයා එතැනින් ඉවත්ව ගොස් සිටියේය.

"ඒක නොවෙයි හෝම්ස් මං කල්පනා කළේ" මම කීවෙමි. "මෙතෙක් අපට ලැබුණු තොරතුරුවල හැටියට, අපරාධය කරල තියෙන්නෙ ගැහැනියක්. ඒ බව ඔබට හොඳටම විශ්වාසයි. ඒ වුණත් ඇයි ඔබ හෙක්ටර් වාල්ටන්ගේ ගෙදර මේ විධියට සෝදිසි කරන්නෙ? ඔහු මේ අපරාධයට හවුල් නැති බව අපි හොඳටම දන්නවා. එහෙම නේද? මේ අන්දමින් මෙතැන කාලය ගතකිරීමෙන් මොකක්ද අපට ලැබෙන ප්‍රයෝජනය?"

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීය. "ඔබ අහනවා මෙතැන කාලය ගතකිරීමෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද කියලා. ඒක තීරණය කිරීම අපිට ලෙහෙසි වුණත් කළ හැකි කටයුත්තක්. උදාහරණයක් වශයෙන් ඔබේ සැරයටියට........"

"මගේ සැරයටියට? ඔබ කියන දේ මට තේරුම් ගන්න අමාරුයි. මගේ සැරයටියෙන් මොනවා කරන්නද?" මම ඇසීමි.

"ඔබේ සැරයටිය අතා ගෙන වෝල්නට් ලීයෙන් තනා ඔප දමූ, තඹ විල්ලක් සවි කළ, එකතු මිතුයා ඔක අඩු තක්සේරුවකට ලක්කරන්න එපා." හෝම්ස් කීය. "කරුණාකර ඔක මගේ අතට දෙන්න. මං පෙන්වන්නම් මේක කොයිතරම් ප්‍රයෝජනවත් උපකරණයක්ද කියලා."

මගේ අතේ තිබූ සැරයටිය උදුරාගත් හෝම්ස්, පියාගෙන තිබූ කාමරයේ බිම දණගසා ගෙන හිස බිමට පහත් කළේය. ඔහු ලංවූයේ කැටපතක් සවිකර තිබූ කළුවර ලී අල්මාරිය අසලටය. මීලඟට ඔහු මගේ සැරයටියේ වක්වූ කෙළවර අල්මාරිය යටට දැම්මේය. කැටයම් කළ ලී කකුල් හතරක් මත සිටින සේ, අල්මාරිය සාදා තිබීම නිසා, එහි පහතම තට්ටුව හා සිමෙන්ති පොළොව අතර අඟල් 4ක හෝ 5ක ඉඩක් තිබිණි. හිස මදක් පහත් කළ මගේ මිත්‍රයා සැරයටියේ යට කෙළවරින් අල්ලා ගෙන, වක් වූ කෙළවර ඈතටම තල්ලු කළේය. ඔහු එය අල්මාරියට යටින් පොත් රාක්කයේ අඩියටත් යටින් බිත්තිය ළඟටම යැවූ බව මම තේරුම් ගතිමි.

මීළඟට ඔහු එය අමාරුවෙන් ආපසු ඇද්දේ ජයග්‍රාහී සිනාවක් නංවමිනි. ඔහු සැරයටියේ උදව්වෙන් කිහිප වාරයකදී එළියට ඇදගත් දේවල් දුක මම පුදුමයට පත්වීමි. කාන්තා පාවහන් ජෝඩුවක්, කැස්බෑ ලෙලි වලින් තැනූ කාන්තා පනාවක්



http://sherlockholmesinvestigations.blogspot.com

කාන්තාවකගේ ගවොමක් හා සමෙන් තැනූ කුඩා හතරැස් පසුම්බියක් ද එහි විය. ගවොම සේද රෙද්දෙන් මැසූ අඳුරු නිල් පැහැති එකක් විය. එහි තද රතු පැටින් මුහුදේ රළ ආකාරයට කළ සිත්තමක් විය.

"මේ ගවොමේ බොත්තම් ගැන ඔබට මොනවද වොට්සන් කියන්න පුළුවන්?" හෝම්ස් ඇසීය.

ඒවා නිසැකවම මඩගොඩුවේ තිබී අපට හමුවූ නිල්-රතු බොත්තමට සමාන විය.

"බලන්න වොට්සන් මේ ගවොමේ තැන් තැන් වල මඩ තැවරී ඇති හැටි. ඊළඟට ගවොමේ මැද හරියේ බොත්තමක් කැඩී ගිහින්. මේ ගවොම ඇඳ ගෙන හිය කාන්තා කවුරු වුණත්, මඩ සහිත පාරක ඇද වැටිලා, බොත්තමකුත් කැඩිලා, එහෙම නේද?

දැන් ඔබේ අවධානය යොමු කරන්න මේ කාන්තා සපත්තු ජෝඩුවට - මේ ලේඩි හැමිල්ටන් සපත්තු. බලන්න මේකෙ යට පැත්තෙ රටාව. අඩිලදේ අපි දුටුව එකට සමානයි ද නැද්ද? පාවහන් වලත් හුඟක් මඩ තැවරිලා. නමුත් ඒකත් පිරිසිදු කරලා නැහැ. වත් පොහොසත් කම් ඇති අය මේ වගේ ඇඳුම් පැළඳුම් වුණත් ගලවා අහකට දමනවා මිසක්, ඒවා පිරිසිදු කර පරෙස්සම් කරගන්නේ නැහැ. බාගවෙලාවට ඇය ඉන්න ඇත්තේ ලොකු හදිසියකින් වෙන්නත් පුළුවනි.

ඊළඟට අපි බලමු මේ පසුම්බිය මොකක්ද කියලා. මේක බයිසිකලයක් මිලට ගන්න කොට නොමිලේ දෙන එකක්. මේ ඇතුළෙ තියෙන්නෙ මුරිච්චි හදකිරීමට ගන්නා යතුරු දෙකක්. හො හෝ! මේකෙ බයිසිකලයේ අංකයත් සඳහන් කරල තියෙන්නේ FE 88731. මගේ මතකය නිවැරදි නම් අපට හමුවුණු බයිසිකලයේ අංකයත් ඒකයි. එහෙම නේද?"

ඔහු පැවසූ හැමදෙයක්ම නිවැරදි බව මම දැනසිටියෙමි.

"දැන් ඔබට තේරෙනවද, අපරාධයට වගකිව යුත්තේ කාන්තාවක් බව දැන දැනත් මං වෝල්ටන් මහත්මයාගේ ගේ සෝදිසි කළේ ඇයි කියල?"

"දැන් හෝම්ස් මේ ප්‍රශ්නය පෙරළෙන්නෙ අපි නොහිතූ පැත්තකට නේද?" මම ඇසීමි. "එක අතකින් බලනකොට ෆ්‍රෙග්සන් කටයුතු කරල තියෙනා ආකාරය නිවැරදියි කියන්න පුළුවන්. අපරාධයට සම්බන්ධ අයගේ ඇඳුම් පැළඳුම් තමන්ගේ ගෙදර

තිබීමෙන්ම ටාල්ටන් මහත්මයා මෙතුට බොහොම භයානක විධියට පටලැවෙනවා. ඒ ඇඳුම් කොහොමද මේ ගෙදරට ආවෙ?"

"ඒක පැහැදිලි කරන කාරණා නම් කිසිවක් අපි තවම දන්නේ නෑ" හෝම්ස් කීය. "නමුත් ඊට කලින් අප කළ යුතු වැඩක් තියෙනවා. FE 88731 දරණ රෑලේ බයිසිකලය විකුණුවේ කාටද කියල වහාම හොයල බලමු. ඒ සමගම අපි අරගෙන යමු ගවොමයි, සපත්තු කුට්ටමයි" කී මගේ මිතුරා ඒවා දුඹුරු කඩදසි මල්ලක් තුළට දමාගත්තේය. මුරට සිටි පොලිස් භටයන් එයට විරෝධය පළකරනැයි මම සිතුවෙමි. එහෙත් පුටු දෙකකට වී දුම්බොමින් කතාබහ කරමින් සිටි ඔවුන්, අප පිටවී යනු බලාසිටියේ සතුටෙනි.

නිව්බෙවර්ලි නුගරයේ බයිසිකල් අලෙවිකරන වෙළඳසල් හතරකින්ම අපි හොයා බැලුවෙමු. එහෙත් මෙම අංකය සහිත බයිසිකලයක් කවදාවත් අලෙවි නොකළ බව ඔවුහු පැවසූහ. FE අකුරු අනුව, එය කාන්තා මෝස්තරයේ එකක් වියයුතු බැව් පැවසූ එක් වෙළෙන්දෙක් මෙය කෙලින්ම ලන්ඩන් නගරයෙන් ඇණවුම් කොට, දුම්රියෙන් මෙහි ගෙන්වාගත් එකක් වියහැකි යයි කීය.

"අපට අපරාධකාරියා පහසුවෙන් අල්ලාගන්න තිබුණු එක පොටක් කැඩුණා" මගේ මිතුයා කීවේ බලාපොරොත්තු කඩවූ ස්වරයෙනි. "ඊළඟට අපි මොකද කරන්නේ?"

"ඇයි සපත්තු?"

"සපත්තු වලට අනුක්‍රමික අංක යොදන්නේ නැහැ වොට්සන්" ඔහු කීය. "මේක මිල වැඩි මෝස්තරයක් බව ඇත්තයි. ඒත් මේ වර්ගයේ සපත්තු ජෝඩු දහස් ගණනක් මේ නගරයේ සාප්පු වලින් අලෙවි වෙලා ඇති. නමුත් පතාවේ අන්තර්ගතය අපට පුළුවනි සියුම් ලෙස පරීක්ෂා කරන්න"

"පතාවේ අන්තර්ගතය?"

"ඔව් මගේ හිතවත් මිත්‍රයා," හෝම්ස් කීය. "ඒක හෙමෙයි. ඔබට මහන්සි දැනෙන්නේ නැද්ද? බඩගින්නක් හෙම? අදට අපේ වැඩකටයුතු මෙතැනින් අවසන් කරලා ආපහු යමු ලන්ඩනයට"

"ඇයි එහෙම හිතුවේ"

"අපි දන් දින දෙකක් තිස්සේ එක දිගටම මහන්සි වුණු නිසා පොඩි විවේකයක් ගත යුතුයි. අද රෑට ඔක්ස්ෆඩ් වීදියේ මාසිනි අවන්හලෙන් රාත්‍රී ආහාරය ගමු. ඊට පස්සේ බැරැඩ්ලිගේ වර්ජිනියා දුම්කොළ අවුන්ස දෙකක් පයිප්පයට දමා ඉරුවොත්,



http://sherlockholmesinvestigations.blogspot.com

ඉදිරියට කළ යුත්තේ මොකක්ද කියන එක මට පුළුවන් වෙවි හිතාගන්න"

එදා අප බේකර් වීථියේ අපේ නිවහනට ළඟාවෙන විට සැන්දෑ වී තිබිණ. පණිවුඩකරුවෙකු අත මා නමට එවා තිබූ ලිපියක් අප ගෙදරට පිවිසෙද්දීම හඩ්සන් මහත්මිය මා අතට දුන්නාය. මම එය විවෘත කර බැලීමි.

"මා හිතවත් වොට්සන්,

මගේ සොහොයුරු වෝල්ටර් මිදිසි හෘදයාබාධයකින් අද උදේ මියගිහින්. අවමඟුල ඉරිදා (හෙට). ඒ සඳහා අප ප්ලිමත් වෙත යායුතුය. ඉරිදා දවසේ මගේ ශල්‍යාගාරයේ කටයුතු ඔබට බලාගන්න පුළුවන්ද?

මෙ

ඇන්ස්ටරූදර්"

"කාගෙන්ද වොට්සන් ලියුම? මොකක්ද ප්‍රශ්නේ?" හෝම්ස් විමසුවේ මා සුසුමක් හෙළා සෝපාවේ අසුන්ගත් අයුරු දුටු විටය.

"ඔබ දන්නවා නේද දොස්තර ඇන්ස්ටරූදර්?"

"මොකද මං නොදන්නේ. මං මගේ පරීක්ෂණ වලට ඔබව රට පුරා ඇදගෙන යද්දී, ඔබේ ශල්‍යාගාරය බලාගන්න එන යහපත් දොස්තර මහත්මයා ඔහු නේද?"

"අන්න හරි. ඔහුගේ සොහොයුරෙක් මියගිහින්. ඒ අවමඟුලට සහභාගී වෙන්න ඔහු හෙට උදේ ප්ලිමත් නගරයට යනවලු. චිකිත්සාගාරය බලාගන්න මට පුළුවන්ද කියල අහනවා. මට මොනතරම් වැඩකටයුතු තිබුණත්, මේ වෙලාවේ ඔහුට පිහිට නොවී බෑ" මම කීවෙමි.

"වොට්සන්. මීට මාස පහකට හයකට කලිනුත් ඔහුගේ සොහොයුරෙක් මියගියා කියල ඔබ කීව වගේ මට මතකයි?" හෝම්ස් විමසුවේය.

"ඔව්" මම කීවෙමි. "ඔහුගේ පවුලෙ පිරිමි සහෝදරයන් හතර දෙනයි. මගේ යාළුවා තමයි බාලයා. ඒ හතරදෙනාම වෛද්‍යවරු; වෝල්ටර්, වික්ටර්, රොජර්, හෙක්ටර් තමයි ඔවුන්ගේ නම්. වික්ටර් තමයි මාස හයකට කලින් මියගියේ. දෙදෙනාම හෘදයාබාධ වලින්....."



http://sherlockholmesinvestigations.blogspot.com

"ජීවිතේ හැටි ඔහොම තමයි මිත්‍රයා" හෝම්ස් කීය. "ජීවිතය කියන්නේ තණකොළ ගහක එල්ලිල තියෙන හිම කැටිත්තක් වගෙයි. ඉර පායන්න කලින් ලස්සනට පුදුමාකාරට තිබුණට, ඉර පායා එද්දී ඒක අතුරුදන්වෙලා යනවා. ඒ වගේ අපේ පණත් අපට නොදැනීම අතුරුදන් වෙනවා"

මම එවේලේම ඇන්ඩර්සන්ට හමුවීමට ගොස් මගේ ශෝකය ප්‍රකාශ කළෙමි. පසුව, එදා සහ ඔහුගේ ආලෝකාගාරයේ වැඩකටයුතු ඇරඹීම සඳහා උපදෙස් ද, ගෞරව සැලකිලි ද භාරගෙන, ඉක්මනින් ආපසු බේකර් වීථියට පැමිණියෙමි. මා ආපසු එද්දී රාත්‍රී භෝජනය සඳහා යාමට හෝම්ස් සූදානමින් සිටියේය.

මාසිනිගේ ඉතාලි අවන්හලේදී එදා රාත්‍රී භෝජනය සඳහා එකතුව සිටියේ කිහිපදෙනෙකු පමණි. පසුබිමෙන් ඇසුණු සංගීත වාදනයට සවන් දෙමින්, අපි වයින් වීදුරුවක් තොලගෑවෙමු.

"මං බලාපොරොත්තුවෙන් හිටියේ, අපි දෙන්නම හෙට උදේ යළිත් වරක් ආවිහිල් වෙත පිටත්වෙලා යන්නයි" හෝම්ස් කීය. "දැන් ඉතින් ඔබට මා සමඟ එන්න බාධාවක් නැහැ නේද?"

"ඒක නේන්නං, නොහිතන විදියට, නොහිතන මොහොතක තමයි වැඩ පැවරෙන්නෙ" මම කීවෙමි.

"මං බලාපොරොත්තු වෙනවා හෙට ආවිහිල් යන්න කලින්, ඩේල් බයිසිකල් වල ප්‍රධාන වෙළෙන්දන් වෙත යන්න. ඒ මගින් මට හැකිවේවි එය අලෙවි කළේ කාටද කියල හොයාගන්න. ඊට පස්සෙ තමයි ආවිහිල් ගිහින් අනෙක් කාරණා ගැන අවධානය යොමු කරන්න වෙන්නෙ"

"අනෙක් කාරණා කියන එකෙන් ඔබ අදහස් කළේ මොනවද?"

"ඔබට මෙහෙම දෙයක් පෙනෙන්නේ නැද්ද වොට්සන්? මට නම් කිසිම සැකයක් නෑ මේ අපරාධය කළ කාන්තාව වාල්ටන් මහත්මිය හා ඇගේ දුව හොඳින් අඳුනන තැනැත්තියක්. ඇය මෙහෙම දෙයක් කරාවි කියලා, ඔවුන් දෙදෙනා මොහොතකටවත් හිතන්න නැහැ. සේවිකාව සහාය දෙනෙකුට තේ පිළියෙල කළ එකෙන් ඒ කරුණ තවදුරටත් ඔප්පු වෙනවා."

"හොඳයි මවට හෝ දුවට වෙඩි තැබුවේ පළිගැනීමට කියල හිතමු. ඇයි අර සේවිකාවට වෙඩි තැබුවේ?"

"ඒකෙ ඒ තරම් ගැටලුවක් නැහැ නේද වොට්සන්. මව හා දුව ඝාතනය කළාට පස්සේ සේවිකාව ඉතිරි කරල අපරාධකාරිය පැන



http://sherlockholmesinvestigation.blogspot.com

ගියා කියල හිතමු. එහෙනම් පැයක් යන්න කලින් පොලිසියට නැම තොරතුරක්ම ලබා දෙන්න සේවිකාවට හැකිවේවි."

"හෝම්ස් ඔබ කියන්න වගේ; මේ අපරාධකාරිය මව හා දුව හොඳින් අඳුනනවා වගේම වෝල්ටන් මහත්මයත් අඳුනනවා." මම කීවෙමි. "ඔහුව රවටලා ඔහුගේ ගෙදරට ගිහින් ඇගේ මඩතැවරුණු ගවුම හා සෙරෙප්පු ඒ ගේදොර හංගල යන්න තරම් ඇය කපටියි. කොහේ සෝදිසි කලත් ඔහුගේ ගෙදර සෝදිසි කරන එකක් නෑ කියල ඇයට හිතෙන්න ඇති. බාගවෙලාවට මේ ගෑනි පවුලේ හිතවතියක් වෙන්න ඇති"

"ඔව් අපට එහෙමත් හිතන්න පුළුවනි" හෝම්ස් පැවසුවේ වයින් වීදුරුව අවසන් කොට රාත්‍රී භෝජනයට සූදානම් වෙමිනි.

"මේ අපරාධකාරිය ගෙදරට එද්දිම ගිනිඅවියක් අතේ අරගෙන එන්න ඇති" මම කීවෙමි. "එහෙම වුණත් වෝල්ටන්ලගෙ සිතේ ඇය ගැන භයක් ඇති නොවුණු එක එක අතකින් පුදුමයි"

"වෝල්ටන්ලාගෙ හිතේ අපරාධකාරිය ගැන කිසිම සැකයක් තිබිලා නැහැ. ඔවුන් වලිකුකුළන් දඩයමේ යන්න සූදානම් වුණු එකෙන්ම ඒ බව පෙනෙනවා." හෝම්ස් කීය. "ඒක මේ අපරාධකාරිය බොහොම සැලසුම් සහගතව යොදගත් උපක්‍රමයක්. බාගවෙලාවට ඇගේ හිතේ තියෙන්න ඇත්තේ, මේ දෙන්නව ළඳු කැලෑව තුළට ගෙනිහින් ඝාතනය කරන්න වෙන්නත් පුළුවනි. කුමක් හෝ හේතුවක් නිසා ඒ සැලැසුම හරිගියේ නැහැ"

රාත්‍රී භෝජනය නිමා කොට නිවහනට ආපසු එද්දී රාත්‍රී දොළහ පමණ වී තිබිණි. පසුවදා උදෑසනම රාජකාරියක් සඳහා යාමට තිබූ බැවින් වහාම නින්දට යාමට මා තීරණය කළෙමි. එහෙත් මගේ මිත්‍රයා පයිප්පය ද දල්වාගෙන අණ්වීක්ෂය ළඟට වී හිඳගත්තේය. ඔහු විසින් මෙම පරීක්ෂණයේදී එක්රැස්කරගත් යම් යම් දේ අණ්වීක්ෂයේ තබා, ප්‍රබල කාචවලින් ඒවා නිරීක්ෂණය කිරීමට හෝම්ස් පටන්ගත්තේය. ඔහු තවත් පැය කීයක් ඒ කටයුත්තේ යෙදුණාදැයි මම නොදනිමි.

පසුවදා, එනම් ඉරිදා උදෑසනම අවදි වී මම මගේ හිතවත් වෛද්‍ය ඇන්ස්ට්රූදර්ගේ ශල්‍යාගාරයේ සේවය සඳහා ගියෙමි.

ඔහු, මා මෙන් නොව රෝගීන් කෙරෙහි ඉමහත් කැපවීමෙන් සේවය කළ අයෙකු බව මම දැනසිටියෙමි. මා එහි යනවිටත් රෝගීහු විශාල සංඛ්‍යාවක් ශල්‍යාගාරය වෙත පැමිණ සිටියහ. එතැන් සිට



http://sherlockholmesinvestigations.blogspot.com

ඇඳිරි වැටෙන තෙක්ම සඳුනු නොකළුවා පැමිණියේය. දහවල් අහර සඳහා මා පැය කාලක් යොදාගත්තේ ද මහත් අපහසුතා මැදය. මා ආපසු බේකර් වීථියේ නිවහන වෙත යද්දී රාත්‍රී නවය පසුවී තිබිණි.

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් ඒ වන විටත් ආපසු පැමිණ සිටියේය. ඔහු සමග කතාබහක යෙදීමට මා ආශාවෙන් සිටියත් ඊට ඉඩක් නොලැබිණි. හෝම්ස් ආපසු පැමිණියේ බොහෝ වෙහෙස මහන්සි වී බවත්, ඉක්මනින් රාත්‍රී ආහාරයක් ගැණවුම් කොට, එය විගස ගිල දමා එවේලේම නින්දට ගිය බවත්, හඩ්සන් මහත්මිය පැවසුවාය. ඔහුගේ අලුත් සොයාගැනීම් ගැන දැනගැනීමට මා සිටියේ නොඉවසිල්ලෙනි. එහෙත් වෙහෙස මහන්සිවී නිදන මගේ මිතුරා අවදි කිරීමට සිතක් මට නොවීය. කියවීමට පටන්ගෙන තිබූ මගේ නවකතා පොතේ ඉතිරි ටික කියවද්දී මට නිදිමත දැනිණි.

පසුවදා උදෑසන අටට පමණ මම අවදිවූයෙමි. මගේ මිතුරා උදේ ආහාරය ද නොගෙන, පාන්දරින්ම නිවසෙන් බැහැරගොස් සිටියේය. ඔහු ගියේ කොතැනකටද, ආපසු එන්නේ කීයටද යන්න ගැන, මා වෙත තැබූ පණිවුඩයක් හෝ නොවීය. දින දෙකකින්ම මට හරිහැටි පුවත්පතක් කියවීමට ඉඩ ලැබී නොතිබිණි. එබැවින් උදේ ආහාරයෙන් පසු පුවත්පත් සියල්ල එකතුකරගෙන ඒවා කියවීමට පටන්ගතිමි.

පුවත්පත් කිහිපයකම මුල්තැන් ලැබුණු ප්‍රධාන පුවත වූයේ වෝල්ටන් මිනීමැරුමය. කාන්තාවන් තිදෙනෙකු මෙලෙස අමු අමුවේ ඝාතනය කෙරුණු අවස්ථාවක්, එංගලන්ත අපරාධ ඉතිහාසයේ නොමැති බැව්, ඩේලි එක්ස්ප්‍රස් පුවත්පතේ සඳහන්ව තිබිණි. පුවත්පත් වාර්තාකරුවන්ගේ වැඩි අවධානයක් මෙන්ම අනුකම්පාව ද යොමු වී තිබුණේ හිරභාරයට ගැනුණු හෙක්ටර් වෝල්ටන් වෙතය.

**"………… සිය බිරිඳගේ, දියණියගේ හා සේවිකාවගේ ඝාතනය සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරව සිටින හෙක්ටර් වෝල්ටන් මැතිතුමා, පළාතේ සුප්‍රකට ව්‍යාපාරිකයෙකු මෙන්ම ධනපතියෙකු ද බව ප්‍රකට කරුණකි. මීළඟ මහාමැතිවරණයේදී කොන්සවටිව් පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස තරග කිරීමට යෝජිතව සිටින ඒ මහතා, කා අතරත් ජනප්‍රිය පුද්ගලයෙකි. දීර්ඝ කාලයක් ලෙස්ටර්ෂයර් යුනයිටඩ් පාපන්දු පිලේ නායකත්වය දැරූ ඔහු, එම ක්‍රීඩා සමාජයේ වත්මන් සභාපතිවරයා ද වේ. ඊට අමතරව ඔහු**



http://sherlockholmesinvestigations.blogspot.com

සම්මාන දිනූ පියාණෝ නාදකයෙකි. බොහෝ සංවේදී එමෙන්ම ප්‍රියමනාප පුද්ගලයෙකු වන ඔහු අතින්, මෙවැන්නක් සිදුවී ඇත්දැයි පළාත්වාසීහු මවිතයට පත්ව සිටිති. කෙසේ වෙතත් වෝල්ටන් මහතා හිරභාරයට ගැනුණේ ස්කොට්ලන්ත්යාඩ් පොලිසියේ සුප්‍රකට අපරාධපරීක්ෂක ටෝබියස් ග්‍රෙග්සන් මහතාගේ උපදෙස් පරිදිය. ඔහු රහස් පරීක්ෂණ සේවාවේ දක්ෂයෙකු බවද ප්‍රකට කරුණකි"

මෙය ඩේලිටෙලිග්‍රාෆ් පත්‍රයේ පළවී තිබිණි. අනෙක් බොහෝ පුවත්වල තිබුණේ ද එවැනිම වාර්තා බැව් මම දුටුවෙමි. එහෙත් සන්ඩේ ගැසට් පත්‍රයේ පමණක්, වෝල්ටන් මහතා වෙත සැකය එල්ල කරමින් කෙටි පුවතක් පළවී තිබිණ.

"......... අනම්ට යුහම්න් මුදල් ගැවසෙන ධනවත් ව්‍යාපාරිකයන් සිතන්නේ, දරුණු අපරාධ සිදුකොට මුදල් බලයෙන් ගැළවියාමට හැකිවෙතැයි කියාය. කොන්සවේටිව් පක්ෂයට සම්බන්ධ දේශපාලනඥයන් ඡන්දයට වඩා දණ්ඩයට පක්ෂපාතවීම ඛේදජනක කරුණකි"

යන තැනක් නොදන්වා නිවසෙන් බැහැර ගිය මගේ මිත්‍රයා ආපසු පැමිණෙන විට, සවස තුන පමණ වී තිබිණි. ඒ වනවිට දහවල් ආහාරය ද අවසන් කර සිටි මම, කෙටි නින්දක් නිදගැනීමට සූදානම් වෙමින් සිටියෙමි.

"මට සමාවෙන්න වොට්සන්, මං මුහුණකට සෝදගෙන ඉක්මනට එන්නම්" ඔහු කීවේ මට ප්‍රශ්න ඇසීමට වත් ඉඩක් නොතබමිනි.

"අද උදේ මං ඔබව අවදිකරන්නේ වත් නැතිව ගියේ ඉක්මනින් ආපසු එන්න බලාගෙන. "හෝම්ස් කීවේ එද්දී ඔහු රැගෙන ආ සැන්ඩ්විච් කිහිපයක් ගෙන එය අනුභව කරමිනි. "නමුත් මිතු ඉක්මනට එන්න ලැබුණේ නැහැ. අයහපත් කාලගුණය නිසා හැම කටයුත්තක්ම ප්‍රමාදයි."

"මොකද වුණේ? ප්‍රශ්නයක්ද?" මම ඇසීමි.

"මං ඔබට හැමදෙයක්ම මුල ඉඳලම කියන්නම්" හෝම්ස් කීවේ කෑම අවසන්කොට ගාන්සි පුටුවේ වැතිරී, දල්වාගත් පයිප්පයෙන් ලා නිල් පැහැති දුම්රැලි හැමෙව්වමින් පසුවය.

"ඊයෙ උදේ අර බයිසිකලය විකුණුවේ කාටද කියන එක හොයන්න, මං පැයක්ම වගේ මහන්සි වුණා" හෝම්ස් කීය. "ඒත් වැඩක් වුණේ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකද?"

"අපි හොයන FE 88731 ඇතුළු බයිසිකල් හතළිස් ගණනක් තිරිංග පද්ධතියේ තිබුණු යම් සුළු දෝෂයක් නිසා, සාමාන්‍ය විධියට නියෝජිතයන් මගින් අලෙවි කරලා නැහැ."

"එහෙනම්?"

"ඒවා 'බී' ශ්‍රේණියේ නිෂ්පාදන හැටියට සේල් එකකට දම්මලු. අඩු මිලක් නියම කරලා තිබුණු නිසා, ඒවා දවසට දෙකට විකිණී අවසන් වුණාලු. කවුරු ගෙනිච්චාද කියන එක සටහන් වෙලා නැහැ. සමහර විට පිට පළාත්වලට බයිසිකල් යවන සුළු වෙළඳුන් මිලට ගන්න ඇතිබවයි ඔවුන් හිතන්නේ"

"එහෙනම් උදේ පාන්දරම ඔබේ උත්සාහය අසාර්ථක වුණා?" මම ඇසීමි.

"ඔව් වොට්සන්. ඒක එක්තරා ආකාරයකට හිත අධෛර්යය කරන දෙයක් තමා. ඒත් මං හැකි ඉක්මනින් ලෙස්ටර්ෂයර් බලා පිටත්වෙලා ගියා. මං බලාපොරොත්තු වුණේ නිව්බෙවර්ලි වලට ගිහින්, රක්ෂිත බන්ධනාගාරයේ සිටි ටාල්ටන් මහත්මයා හමුවෙලා කථා කරන්න. නමුත් ඒකත් අසාර්ථක වුණා"

"ඒ මොකද?"

"ටාල්ටන් ඇප පිට නිදහස් කරවාගන්න එයාගේ අධි නීතිඥයන් ලොකු සටනක යෙදිලා හිටියේ. කිසිම කෙනෙකු සමග කතාබහ කිරීම, ඔවුන් ටාල්ටන්ට තහනම් කරලා. ඊයේ ඉරිදා නිසා මොකුත්ම කරගන්න හැකියාවක් නීතිඥයින්ට තිබුණේ නැහැ. ඉතින් මට හෙක්ටර් ටාල්ටන් මහත්මයාට කිට්ටුවෙන්නවත් අවස්ථාවක් ලැබුණේ නෑ.

මගේ කටයුතු ඒ විධියට අසාර්ථක වුණාම මං ගියා ආව්හිල් වලට. සූසාන්ගෙන් අහලා බැලුවා, ටාල්ටන් මහත්මිය හමුවෙන්න බයිසිකලයකින් එන කාන්තාවක් ඉන්නවාද කියලා"

"ඉතින්?"

"ටාල්ටන් මහත්මිය හමුවෙන්න එන කාන්තාවන් කිහිප දෙනෙකුම ඉන්නවා" හෝම්ස් කීය. "ඒ අයගේ නම් සූසාන් මට කිව්වා. නමුත් ඒ කිසිකෙනෙක් බයිසිකල් වලින් එන අය නෙමෙයි. ඔවුන් ඇවිත් තියෙන්නේ එක්කෝ තමන්ගේ ගෙදර අශ්වකරත්තයෙන්, නැත්නම් කුලී රියකින්. සූසාන් කියන හැටියට ඔවුන් හැමදෙනෙක්ම 'වගේ වයස්ගත, තරබාරු, දණහිස් අමාරු



http://sherlockholmesinvestigations.blogspot.com

තියෙන අය. රෝද දෙකේ බයිසිකලයක් සමබරව පැදගෙන යා හැකි විධියේ කෙනෙක් ගැන ඇයට මතක් කරගන්න වත් බැරිලු"

"එහෙනම් ඔබ යෙදුණු හැම කටයුත්තකටම මොකක් හරි බාධකයක් ආවද?"

"ලෝකෙ හැටි එහෙම තමයි මිතුරා. සමහර දවස් තියෙනවා. එදට අතගහන හැම වැඩක්ම වරදිනවා. ඉතින් මම තීරණය කළා, එද අපි කරන්න පටන් අරගෙන, භාගෙට අත් ඇරල දාල ආව වැඩේ, ඉතිරිහරිය කරන්න.

ඔබට මතක ඇති එද අපි අපරාධකාරිය වෝල්ටන් නිවසේ ඉඳලා පලාගිය ගුරුපාර නැත්නම් මඩපාර දිගේ ගමන් කළා. ඇය බයිසිකලයෙන් වැටුණොම, ඇය ඒක මඩවලේ දමලා, පිංක්හිල් වෙත යන්න ඇති කියලා අපි නිගමනය කළා. එහෙම නේද?"

"ඔව්?"

"නමුත් එතැනින් එහාට ඇය ගියේ කොයි පැත්තටද, ඇය දැකපු කෙනෙක් ඉන්නවද ආදී කරුණු හොයන්න, අපි උත්සාහ දැරුවෙ නැහැ නේ?"

"ඔව්. ඒක අපට අතපසු වුණා"

"අන්න හරි. මට හිතුණා වෝට්සන් මෙහෙම දෙයක්. අපි මුලින්ම හිතමු ඇය පදිංචිව ඉන්නේ ඒය අවට නෙමෙයි කියල. බයිසිකලයක් යොදගත් නිසා ඒක නිවැරදි නිගමනයක්. එහෙම නම් ඇයට පිංක්හිල් වලින් පලායන්න කෙටිම සහ ආරක්ෂා සහිතව මාර්ගය තමා ඩොඩම්ඩ් හරහා යෑමයි. ඒ සඳහා ඇය නිසැකවම ඩොඩම්ඩ් දුම්රියපොළට යන්න ඇති. ඒ වෙලාවෙ ඇය හැඳ සිටියේ වෝල්ටන් මහතාගේ අල්මාරිය යට තිබිල අපට හමුවුණු අර තද නිල් හා රතු මිශ්‍ර ගවොම; ඒක මුඩ්ඩ මතක ඇති අර විචිත්‍රවත් බොත්තම් සහිත එක?"

"ඔව් ඔව්. මට හොඳට මතකයි"

"එද රාත්‍රි ඔබ නින්දට යද්දින් මං අන්වීක්ෂයෙන් යම් යම් දේ පරීක්ෂා කරමින් හිටි හැටි ඔබට මතකද වොට්සන්?"

"ඔව්"

"මට සොයාගැනීමට හැකිවුණා.........."

හෝම්ස්ට එම වාක්‍යය අවසන් කිරීමට ඉඩක් නොලැබිණ. අපේ සිතුව නාදකරන හඬක් සමගම කිසිවෙක් කලබලයෙන් තරප්පුව



http://sherlockholmesinvestigations.blogspot.com

නැග ඉහළට ආවේය. ඒ සමගම දොර විවෘත කරගෙන ඇතුළට ආවේ පොලිස් පරීක්ෂක ටෝබියස් ග්‍රෙග්සන්ය.

"සමාවෙන්න හෝම්ස් මහත්මයා........ මං ටිකක් ප්‍රමාදයි. ඔබේ විදුලි පුවත ලැබිල දැන් ටිකක් වෙලා. ඒක නෙමෙයි. හරි වැඩේ නේ වෙලා තියෙන්නේ......" ග්‍රෙග්සන් කීවේ අනිදමමිනි.

"ඇයි මොකක්ද ග්‍රෙග්සන් වෙලා තියෙන්නේ?" හෝම්ස් විමසුවේය.

"හෙක්ටර් වෝල්ටන් නිදහස් වුණා කියල මේ දැන් මට විදුලි පුවතක් ආවා!"

"නිදහස් වුණා?"

"ඔව්. ඒ කියන්නේ ඔහුගේ නීතිඥයින් අද උදේ ඔහුට ඇප ලබා දුන්නලු." ග්‍රෙග්සන් කීවේ කලකිරීමෙනි. "ලොකු සල්ලිකාරයන්ට, දේශපාලනඥයන්ට ඕනෙම අපරාධයක් කරල බේරෙන්න පුළුවන්. මොකෝ නැද්ද හෝම්ස් මහත්මයා? අඩුම ගණනේ එක දවසක්වත් රක්ෂිතයේ ඉන්න ඔහුට උවමනා නෑ. සල්ලි ගහක් හොලවන කොට ඒව ඇහිඳගන්න කී දෙනෙක් වටවෙනවද? දැන් ඉතින් අපි කොහොමද මේ පරීක්ෂණයේ නීදහසේ පවත්වන්නේ? ඊළඟට අපරාධකාරයා රටින් පැන ගියොත්?"

"මගේ හිතවත් ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "ඔබේ ඔය ප්‍රශ්නයට පිළිතුරක් මං බොහොම ඉක්මනින් ලබා දෙන්නම්. මට තරප්පුවේ ඇහෙනවා අඩි ශබ්දයක්......" කථාව නැවැත්වූ හෝම්ස් සිනාමුසු මුහුණින් සවන් යොමු කරගෙන සිටියේය. කිසිවෙකු තරප්පුව නැග එන හඬක් සැබැවින්ම ඇසිණ.

".......... හරි. කවුද කෙනෙක් එනවා ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "අපි එයාගෙන්ම අහල බලමු. පොලිස් පරීක්ෂක ග්‍රෙග්සන් වෝල්ටන් මිනීමැරුම ගැන පරීක්ෂණ පවත්වනවා. වෝල්ටන් මහත්තයට ඇපලබාදීම ඒකට අවහිරයක්. ඒ අවහිරතාවට කළ යුත්තේ මොකක්ද කියලා, අපි මේ ආව මහත්තයාගෙන් අහමු........ මහත්මයා! කරුණාකර එන්න ඇතුළට" හෝම්ස් කීවේ දොරට තට්ටුකරන හඬ ඇසෙද්දීමය.

ඒ අනුව දොර ඇරගෙන මහත්මයෙක් අපේ විසිත්ත කාමරයට ඇතුළුවිය. ඒ පුද්ගලයා තුටු ග්‍රෙග්සන්ගේ තට බාගෙට ඇරිණි. ඔහු මුවේ රඳවාගෙන සිටි දල්වූ චුරුට්ටුව බිමට වැටිණි. ඔහු තම



http://sherlockholmesinvestigations.blogspot.com

අසුනෙන් ඉහළට එසවුණේ නොඉදුනුවත්මය. ෆ්ලෙගසන් පමණක් නොව අමුත්තා දුටු මම ද පුදුමයට පත්වීමි. ඒ අන්කිසිවෙකු නොව අද උදෑසන වන තෙක් රක්ෂිතයේ සිටි හොක්ටර් ටාල්ටන් මහතාය!

"ටාල්ටන් මහත්මයා. කරුණාකරල මෙහෙන් වාඩිවෙන්න" හෝම්ස් කීවේ ගිනිඋදුන සමීපයේ වූ, සැපපහසු අසුනක් පෙන්වමිනි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" ටාල්ටන් කීවේ ගොත ගසමිනි. "මං ආවේ................. මං හිතුවේ.................මං දන්නේ නෑ.......... පොලීසිය..........."

"භයවෙන්න එපා මහත්මයා" මගේ මිත්‍රයා කීය. "ඔබ මෙහි නැඳෙව්වේ ආයෙමත් සැරයක් පොලීසියට භාරදෙන්න නෙමෙයි. මේ පොලිස් නිලධර මහත්මයා මෙහේ ආවේ මගේ ඉල්ලීම අනුව බව ඇත්තයි. මේ අභිරහස හෙළිකිරීම ඔහු ඉදිරියේම කළොත්, ඒක ඔබට លොකු සහනයක් වේවි. ඔබ පැටලී ඇති අවුලෙන් ඔබව ගලවාගන්න ඔහුට හැකිවේවි. කථාව ඔබ කැමැති තැනකින් පටන් ගන්න" මෙසේ කියූ මගේ මිත්‍රයා ඔහුගේ හාන්ඩි පුටුවේ අසුන් ගත්තේය. මිළඟට ඔහුගේ දෑත්වල ඇඟිලි තුඩු එකට තබාගෙන දෙනෙත් පියාගත් අයුරින්, ඔහු අමුත්තාගේ කථාවට සවන්දීමට සූදානම් බව මම තේරුම් ගත්තෙමි.

"මගේ දෙමව්පියන්ට හිටි එකම දරුවා මම" ව්‍යාපාරිකයා කථාව ඇරඹුවේය. "පාසලෙන් අස්වුණාට පස්සේ ක්‍රීඩා වලට සහභාගී වෙන ගමන් පියාගේ ව්‍යාපාරික කටයුතුවලටත් මම හවුල්වුණා. අපට කවදාවත් මුදල් වලින් අඟහිඟයක් තිබුණේ නෑ. මං විවාහවෙනකොට මගේ වයස අවුරුදු විසිඅටයි.

මං මගේ බිරිඳ හැටියට ඇයව තෝරාගත්තේ කාලයක් තිස්සේ ආශ්‍රය කරලා බලලා නෙමෙයි. මැඩෙයිරාවට නැවකින් ගිය විනෝදචාරිකාවකදී හමුවෙලා, දින දෙකක තුනක ආශ්‍රය මතයි, මං ඇය විවාහකරගන්න තීරණය කළේ. ඕවියාන් පුළු දේටත් බොහොම ඉක්මනින් කෝපයට පත්වෙන ගැහැනියක් බව මං තේරුම් ගන්න කොට ප්‍රමාද වැඩියි. මං හිතුවා කාලයක් ගතවෙද්දී, දරුවන් ලැබෙද්දී මේ තත්ත්වය හරියයි කියලා. නමුත් ඒක කවදාවත් හරි ගියේ නෑ. ඒක ඇය උපතින්ම ලැබූ දෙයක් වෙන්න ඇති. ඉතාම සුළු අඩුපාඩුවකින් හෝ ප්‍රමාදයකින් කෝපාවිෂ්ට වුණු ඇය, අප කාටත්



http://sherlockholmesinvestigations.blogspot.com

යක්ෂාවේගයෙන් බැණවැදුණා මටත්, අපේ දියණියන් දෙදෙනාටත්. සේවකයන්ටත් බැණවැදෙද්දී අපි නිහඬවුණේ, ගෙදර සාමය ආරක්ෂා කර ගත යුතු නිසා.

මගේ වැඩිමහල් දියණිය විවාහ වුණාම ඇය ගෙදර ඉන්නවාට මං කැමති වුණේ නැහැ. ඒ මොකද එහෙම රැඳුණා නම් විවියන්ගේ ස්වභාවය නිසා, දියණියගේ විවාහය කඩාකප්පල් වෙන්න ඉඩ තිබුණා. කොහොම හරි පෙනිලොප් හා ඇගේ සැමියා කැනඩාවට සංක්‍රමණය වෙන්න තීරණය කලා. ඒ කාලයේදී බාල දුව ජූන් ලන්ඩනයේ නැවතිලා ඉගෙනගත්තේ.

වැඩිමහල් දුව කැනඩාවට ගියාට පස්සේ, ගෙදර තත්ත්වය හොඳටම අප්‍රසන්න වුණා. ඉතින් ගෙදරින් පිටවෙලා යන්න මම තීරණය කලා. මගේ බීර කර්මාන්තශාලාව තියෙන්නේ නිව්බෙවර්ලි වල. මං එහේ පදිංචියට ආවා. ඒ කාලෙම ඒ කිට්ටුව විකුණන්න තිබූ නිවසක් ගැන මට දැනගන්න ලැබුණා. එය මිලට ගන්න මට උදව් කලේ පර්සි රෙඩ්පාත් නම් මගේ මිත්‍රයා.

මේ වෙලාවේ පර්සි ගැනත් යමක් කිවයුතුයි. මගේ පාසලේම ඉගෙන ගත් ඔහු සිටියේ, මට වඩා අවුරුදු හතරක් පහළ පංතියක. නමුත් අපේ හිතවත්කම ඇතිවුණේ පාසලෙන් අස්වුණාට පස්සේ. ඔහුගේ පියා එංගලන්තයට, ඉතාලියෙන් වයින් ආනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගියා. පියාගේ මරණයෙන් පස්සේ එම ව්‍යාපාරයේ හිමිකරුවුණේ පර්සි. ඔවුන්ගේ වෙළඳ සමාගම තිබුණත් නිව්බෙවර්ලි වල. එකම ක්ෂේත්‍රයක සිටි අපි දෙදෙනා හොඳ යහළුවන් බවට පත්වුණේ එහෙමයි.

පර්සි රෙඩ්පාත් විවාහවුණේ මං විවාහවුණාට පසුව. පියාගේ සමාගම වෙනුවෙන් වයින් වර්ග තෝරා ඇණවුම් කිරීමට, ඔහුට නිතර ඉතාලියට යන්න සිදුවී තිබුණා. එහෙම ගිය වෙලාවක හඳුනාගත් ලාබාල ඉතාලි තරුණියක සමග ඔහු විවාහ ගිවිසගත්තා. සිල්වියා වැලෙන්ටිනෝ නම් ඇය ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ තරුණියක්. පර්සි සමග විවාහ වෙලා එංගලන්තයට ආවට පස්සේ ඇය ඉක්මනින් ඉංග්‍රීසි කථාකරන්න ඉගෙන ගත්තා. මම ගෙදර හිටි කාලයේ රෙඩ්පාත් ජෝඩුව මාසෙකට විතර සැරයක් අපේ ගෙදර ආවා. අපිත් ඔවුන්ගේ ගෙදර ගියා. ඒ නිසා විවියන් හා මගේ දියණියන් පර්සි හා ඔහුගේ බිරිඳ හඳුනනවා. ඔවුනට ළමයි හිටියේ නැහැ.



http://sherlockholmesinvestigations.blogspot.com

මං ගෙදරින් වෙන්වෙලා නිවුඉබවර්ලි වල පදිංචියට ආවට පස්සේ, මට රෙඩ්පාත් යුවළ ළඟින් ආශ්‍රය කරන්න ලැබුණා. එතකොටයි මට එක්තරා වැදගත් කරුණක් දැනගන්න ලැබුණේ. සංස්කෘතීන් දෙකක, ආගම් දෙකක අය නිසා, ඔවුන් දෙදෙනා අතර නිතර සණ්ඩු සරුවල් ඇතිවුණා. සිල්වියා බොහොම අධික ලෙස මුදල් වියදම් කරන්න පුරුදුව හිටි තැනැත්තියක්. වෛවර්ණ, මිල අධික ඇඳුම් පැළඳුම් නිතර මිලදී ගන්න ඇය පුරුදු වෙලා හිටියා. නිතර ඉතාලියට සංචාරය කරන්නත් ඇයට මුදල් උවමනා වුණා. ඒ මදිවාට ඉතාලියේ ජීවත්වුණු ඇගේ අම්මාටත් අයියාටත් ඇය මුදල් යැව්වා.

ගෙදර තිබුණු අඩුදුබ්බර නිසා තමන්ගේ ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට, පර්සි රෙඩ්පාත්ට උනන්දුවක් තිබුණේ නැහැ. ව්‍යාපාරය දවසින් දවස අඩාල වෙමින් යද්දී ඔහු මත්පැනට ඇබ්බැහිවුණා. මං කොයිතරම් උත්සාහ කළත්, ඔහු එයින් ගලවාගන්න හැකිවුණේ නැහැ. අවුරුදු එකහමාරකට කලින් ඔහු මියගියේ අධික මත්පැන් පානය නිසා ඇතිවූ රෝගයකින්. ඒ වෙනකොට ඔහුගේ ව්‍යාපාරය බංකොලොත් තත්ත්වයකයි තිබුණේ.

පර්සිගේ මරණය සිදුවුණත්, සිල්වියාගේ පිළිවෙළේ ඒ තරම් වෙනසක් ඇතිවුණේ නැහැ. ඔහුගේ ව්‍යාපාරය විකුණා දමූ ඇය, ඇගේ මව හා සොහොයුරා එංගලන්තයට ගෙන්වාගෙන, රෙඩ්පාත් මන්දිරයේ සතුටෙන් ජීවත්වුණා. කාන්තා ඇඳුම් පැළඳුම් විකුණන බොන්ඩ් වීථියේ සාප්පුවක ඇයට රැකියාවක් ලැබුණා. ඇගේ සොහොයුරාට, ලන්ඩනයේ පැරිෆ් බදම පිළිම හදන, ගෙල්ඩර් සහ සමාගමේ රැකියාවක් ලැබුණා. නමුත් ඇයට නිතර නිතර මුදල් අගහිගකම් තිබුණා. ඒ නිසා මා හමුවෙන්න මගේ ගෙදරට ඇවිත් මගෙන් වරින් වර මුදල් ණයට ඉල්ලා ගත්තා. ඒත් ඒ ණය කිසිදක ආපහු ලැබුණේ නැහැ. මෙහෙම ආව වෙලාවලට මගේ ගෙදර අස්පස් කරද්දී, මගේ ඇඳුම් සෝදා පිරිසිදු කරදීම පවා කළා. සමහරවිට මගේ ඉල්ලීමක් නැතුවම කෑම පිළියෙල කර දුන්නා.

මීට මාස තුන හතරකට කලින් ඇය කළ රැකියාව ඇයට අහිමිවුණා. මේ අතරේ අප දෙදෙනා අතර හිතවත්කම වැඩිදියුණු වූ නිසා අප විවාහවිය යුතු බවට සිල්වියා යෝජනා කළා. විවියන් ගෙන් නීත්‍යානුකූලව දික්කසාද වී නොමැති නිසා, මං ඒකට



http://sherlockholmesinvestigations.blogspot.com

එක්වරම කැමැතිවුණේ නෑ. සිල්වියාට මුදල් හදල් අමාරු වෙද්දී අප අතර විවාහයක් ගැන ඇය නිතර නිතර කියවන්න ගත්තා.

"සිල්වියා අප අතර විවාහයක් වුණත්, ආචිහිල් වල තියෙන අපේ ගෙදර අයිතිවෙන්නේ විවියන්ට. ඇයට එවන යන්න තැනක් නෑ. මං ඒක ඇය නමට ලිවිය යුතුමයි" මං කිව්වා.

"ඒක පුදුම වැඩක් නේ" සිල්වියා මට දෙස් නැඟුවා. "ඒ ගැනිගෙන් දික්කසාද වුණාට පස්සේ, තමන්ගේ ගේ ඒ ගැනිට දෙන්නේ මොකටද? මාව කසාද බඳිනවා නම් ඒ ගේ අයිතිවෙන්න ඕනෙ මට" ඇය කිව්වා.

"විවියන් ඒ ගෙදරින් පන්නා දැමුවොත්, ඊළඟට මගේ දුව කොහේ යන්නද?" මං ඇහුවා. "ඇය විවාහවුණු දවසක ඒ නිවස හා ඉඩම ඇයට අයිති වියයුතුයි"

"එහෙනම් ඔහේට කසාද බැඳලා, දවසක ඔහේ මැරුණොත් මට වෙන්නේ වැන්දඹුවක් වගේ පාරට බහින්නද?" සිල්වියා ඇහුවේ හරි කෝපයෙන්. "ඔහේට අයිති හැම දේපොළක්ම ඒ ගැනියි දුවයි අයිතිකර ගනීවි."

"මට පෙනෙන හැටියට මා එක්ක විවාහවීමකට වඩා, ඔයාට උවමනා වෙලා තියෙන්නේ මගේ දේපොළ" මං කිව්වා. "ඒ නිසා විවාහයක් කරගන්න ඉස්සර වෙලා, මං තව ටිකක් කල්පනා කරල බලන්න ඕන"

"ඔහේ ඒ ගැනි අත්ඇරදමලා, ජීවත්වෙන්නේ මා එක්ක" ඇය කිව්වා. "ඒ වුණාට ඒ ගැනි බලන්න මාසෙකට දෙගමනක් විත් යනවා. දුව බලන්න හැම ඉරිදම යනවා. එයාලට සල්ලි දෙනවා උවමනා ප්‍රමාණයටත් වැඩියා. මේක මටත් හොඳ පාඩමක්. මෙතැනින් ඉස්සරහට මං ගතයුතු පියවර මොකක්ද කියලා, මමත් කල්පනා කරල බලන්න ඕන"

එහෙම කියූ ඇය මගේ ගෙදරින් එළියට ගියේ දැඩි කෝපයකින්. ඊට පස්සේ ඇය පහුගිය සති තුනකට වැඩි කාලයක් මා හමුවෙන්න ආවේ නැහැ. දින කිහිපයකට එහා කලින් ඇය ගැන විස්තර හොයාගෙන එන්න කියලා, මං මගේ හිතවත්ම සේවකයෙකු යැව්වා. රෙඩිපාත් මන්දිරයට එපිටින් ඇය ඇගේ සොහොයුරා සමග බයිසිකල් පදින්න පුහුණුවෙමින් සිටිනු දුටු බව මගේ සේවකයා කිව්වා. ඊට පස්සේ මා ඇය ගැන හොයා බැලුවේ නැහැ.



http://sherlockholmesin/esligations.blogspot.com

ගිය බ්‍රහස්පතින්දා — ඒ කියන්නේ මිනීමැරුම සිද්ධවුණු දවසේ, දවල් එකහමාරට දෙකට විතර, කර්මාන්තශාලාවේ සිටි මට පණිවුඩයක් ලැබුණා. සිල්වියාගේ මව මා හමුවෙන්න ආවා. ඇගේ දියණිය අත්‍යවශ්‍ය කරුණකට මා හමු විය යුතු බව කියමින්, මා එනතුරු නිව්බෙරිලිහි මගේ නිවසේ ගේට්ටුව ළඟ සිටින බව මේ කාන්තාව කීවා. ඉතින් මම වහාම ආපසු මගේ ගෙදරට ආවා. ඇගේ මව යන්න ගියා. මගේ නිවසට ඇතුළු වන තැනම, සිල්වියා පඳුරකට මුවා වී හිටියා.

"මොහොතක් ඉන්න" හෝම්ස් කථාවට බාධා කළේය. "මේ වෙලාවේ ඇය හැඳ සිටියේ මොන වගේ ඇඳුමක් ද?"

"ඇය ඉතාලියෙන් ගෙන ආ රතු පාට මිශ්‍ර තද නිල් පාට සිල්ක් ගවුමක් තිබුණා. ඇය හැඳ සිටියේ ඒක." වෝල්ටන් පිළිතුරු දුන්නේය.

"ස්තුතියි. ඔබේ කථාව දිගටම කියන්න"

"මම ඉදිරි දොර ඇරිද්දීම ඇය මට ඇතුළු වුණා.

"මං ආවේ මගේ ඇඳුම් ටික අරගෙන යන්න" ඇය කීවා. "මං යනවා ටික කාලෙකට ඉතාලියට. මං එංගලන්තයේ ඉඳල එපාවෙලයි තියෙන්නේ. මං අද මෙහේ ආව බවත් කාටවත් එහෙම කියන්න එපා."

මෙහෙම කිව් ඇය, අපේ ආහාර ගැනීම සඳහා වෙන් කළ කාමරයට ගිහිං ඇඳුම් මාරු කරගත්තා. එළඟට ගේ පුරා ඇවිදිමින්, ඇගේ ඇඳුම් පැළඳුම් හා බඩු බාහිරාදිය ඔක්කොම හොයා ගත්තා. ඊට පසුව මගෙන් ලොකු මුදලකුත් ඉල්ලා ගත්තා. ඊට පසු මට කිව්වා නිවස වහල, මගේ කර්මාන්තශාලාවට ආපසු යන ලෙස. ඒ යද්දී ඇයට කුලීරියක් එවන්න කියලත් කිව්වා. මං ඇය කී අයුරින්ම කළා. ඇය කොහේ ගියාද කියන්න මං දන්නෙත් නැහැ. මං ඒක හෙව්වෙත් නැහැ.

ඊට පැයකට පමණ පස්සේ තමයි, මගේ බිරිඳ, දුව හා සේවිකාව ඝාතනය ගැන මට පණිවුඩයක් ආවේ. මට එක්වරම හිතුණේ මෙය මුදල් කොල්ලකෑමේ අරමුණෙන් ගෙදරට ආ කවුරුන් විසින් හෝ කරන්න ඇති කියලයි. නමුත් දවසක් ගතවෙද්දී මගේ හිතේ පුංචි සැකයක් ඇතිවුණා මේක සිල්වියාගේ වැඩක්දෝ කියලා.

එදා ඇය හිටියේ හිතේ හරි කැලඹීමෙන්. බොහොම කලබලේට, ඇගේ ඇඳුම් පැළඳුම් එකතු කරගෙන මෙහෙන් පිටවී ගියේ ඇයි



http://sherlockholmesinvestigations.blogspot.com

කියන එක මට ගැටලුවක් වුණා. දැන් මට හිතෙනවා. ඇගේ සැමියාගේ මරණයෙන් පසු මා සමග විවාහවෙන්න, ඇගේ යටිහිතේ බලාපොරොත්තුවක් තියෙන්න ඇති. සමහරවිට ඇය හිතුවාද දන්නේ නෑ, ඉතාලියේ වගේ බිරිඳගෙන් දික්කසාද වීම එංගලන්තයේ හරි පහසුයි කියලා. වෙන්ව ජීවත් වුණත් මං බිරිඳ හා දුව ගැන දක්වූ සැලකිම ගැන, ඇගේ හිතේ දැඩි ඊර්ෂ්‍යාවක් තිබුණා. ඔවුන් දෙදෙනා මරා දැමුවොත් පසුව, මා සමග විවාහවෙලා දේපොළ අයිතිකරගන්න හැකිවේවි කියලත් ඇයට හිතෙන්න ඇති.

හෝම්ස් මහත්මයා. ඔබ මට දුන් ලියුම් කැල්ලේ සඳහන්ව තිබූ දේ අනුව, ඔබ හැමදෙයක්ම දැනගෙන තිබෙන බව මට වැටහුණා. ඒ නිසයි මගේ නීතිඥයින් ඇගහැර මං ඔබ සොයාගෙන ආවේ. මේ සාහස ගැන මගේ හිතේ ඇත්තේ ලොකු කම්පාවක්. විශේෂයෙන්ම මගේ ආදරණීය දුවගේ මරණය මට දරාගන්න බැරි දුකක්. සිල්වියා රෙඩ්පාත් අල්ලා දෙන්න ඔබට ඕනෑම උදව්වක් කරන්න මං සූදානම්."

හෙක්ටර් ටාල්ටන්ගේ දීර්ඝ කථාවෙන් පසු අපේ විසිත්ත කාමරයේ මිනිත්තු කිහිපයක නිශ්ශබ්දතාවයක් ඇතිවිණි. අවසානයේ එය බිඳ දමමින් කථා කළේ හෝම්ස් ය.

"ග්‍රෙග්සන්. ඔබ තවමත් විශ්වාස කරන්නේ මේ අපරාධය කළේ මේ ටාල්ටන් මහත්මයා කියලද?"

"ඔහුගේ කථාව නිකං පුරාංගනා කථාවක් වගේ" ග්‍රෙග්සන් කීය. "විශ්වාස කරන්නත් අමාරුයි. ඒ වුණත් ෂර්ලොක් හෝම්ස් මහත්තයාගේ සහතිකය ලැබෙනවා නම් අපට දෙපාරක් හිතන්න දෙයක් නෑ."

"එහෙම කීම ගැන මං ඔබට කෘතඥ වෙනවා ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "මං අද උදේම ප්‍රවීණ ඇඳුමෙන් සැරසුණු ඔත්තුකරුවන් දෙදෙනකු යෙදෙව්වා. එක්කෙනෙක් ඇගේ සොහොයුරා වන කාලෝ වැලෙන්ටිනෝ පසුපස යෑමට. අනෙක් එක්කෙනා ඇගේ මව ගැන හොයමින් සිටීමට. වැඩිප්‍රමාද නොවී ඔවුන්ගෙන් මොනවා හරි තොරතුරක් ලැබේවි"

"හෝම්ස් මහත්මයා" ටාල්ටන් මහතා කීවේ අසුනෙන් නැගී සිටිමිනි. "තවදුරටත් මං ලන්ඩනයේ රැඳී සිටීමක් ඔබට අවශ්‍ය වේවි කියල හිතනවා නම් මට පුළුවනි ලැංහම් හෝටලයේ නවාතැන් ගන්න".



http://sherlockholmesinvestigations.blogspot.com

"......... ඔබේ සහභාගීත්වය අද හෙටම අපට උවමනා වෙන එකක් නැහැ" ග්‍රෙග්සන් පිළිතුරු දුන්නේය. "අවශ්‍ය වුණොත් අපි ඔබ හොයාගෙන එන්නම්. මං හිතන්නේ මීළඟට අපට ඔබව උවමනා වෙන්නේ, අපරාධකාරිය අල්ලාගෙන ඇය උසාවියට ඉදිරිපත් කරන්න සූදානම් වෙද්දී"

සිල්වියා වැලෙන්ටිනෝ රෙඩ්පාත් ගැන හැකිතරම් තොරතුරු අපට ලබාදුන් වෝල්ටන් මහතා, අපෙන් සමුගෙන පිටවී ගියේය. ග්‍රෙග්සන් දිගටම අප සමග රැඳී සිටියේය.

"හෝම්ස් මහත්මයා, ඔබ හිතන්නේ ඇය ඉතාලියට පැනයන්න ඇති කියලද?" පොලිස් නිලධාරියා විමසීය.

"ඒක නම් මට හරියටම කියන්න අමාරුයි ග්‍රෙග්සන්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එහෙම ගිහිං නම් ඇය සෙවීම පිදුරු ගොඩේ වැටුණු ඉඳිකටුවක් සෙවීම වගේ වේවි. අපරාධකාරිය සිල්වියා රෙඩ්පාත් බව පුවත්පත්වල ප්‍රසිද්ධ වුණොත්, වැඩේ හුගක්ම අමාරු වෙනවා. දැනටමත් ඉතාලියට ගිහිං නැත්නම්, ඇය වෙස්මාරු කරගෙන රටින් පිටවේවි. එහෙම ප්‍රසිද්ධියක් දුන්නෙ නෑ කියල හිතමු. එතකොට ඇය සෝදිසියෙන් ඉන්න ඉඩ තියෙනවා. ඉතාලියට ගියත් ඉක්මනින්ම ආපහු එංගලන්තයට එන්නත් ඉඩ තියෙනවා. ඒ මොකද ඇය මේ අපරාධය කළ බව සියැසින් දුටු කෙනෙක් නැතිබව ඇය දන්නවා. දේපොළ ගැන ඇගේ තිබෙන තණ්හාවෙ හැටියට, රෙඩ්පාත් මහතාගෙන් ඇයට උරුමවුණු නිවස අත්හැරදමල යන්න යාවි කියල හිතන්න අමාරුයි. මට නම් විශ්වාසයි ඇය ඇති එංගලන්තයේම......... බොහෝ විට ලන්ඩනයේම. බාගවෙලාවට ඇය ඇත්තෙ මය ඉතාලි සංක්‍රමණික සේවකයන්ගේ පවුල් වැඩි වශයෙන් ජීවත්වෙන ජනාවාසයක වෙන්නත් පුළුවනි. එහෙම රැඳී ඉන්නවා නම් අපට ඇය අල්ලාගන්න බැරිවෙන්නෙ නැහැ"

හෝම්ස්ගේ අනාවැකිය හරිගියේය. රාත්‍රී නවය පමණ වෙද්දී ඔහුගේ ඔත්තුකරුවෙකුගෙන් හෝම්ස්ට විදුලි පුවතක් ලැබිණි. ගෙල්ඩර් සහ සමාගමේ සේවය කළ කාලෝ වැලෙන්ටිනෝ නම් සේවකයා, රැකියාවේ වැඩ කටයුතු අවසන් වූ පසු පාර්සලයක් රැගෙන, තේම්ස් ගංඉවුරේ විදේශික කම්කරුවන්ගේ මුඩුක්කු පිහිටි පෙදෙස වෙත ගිය බව ද, එම ස්ථානය ආදිපාද පටුමගේ අංක 33 දරණ තැන බව ද එහි සඳහන්ව තිබිණි.



http://sherlockholmesinvestigations.blogspot.com

අපි වහා පිටත්වී ගියෙමු. නිවසේ වැසියෝ රාත්‍රී ආහාරය අවසන් කර කාඩ් ක්‍රීඩාවේ යෙදී සිටියහ. හෙක්ටර් වාල්ටන් කළ විස්තරයට සරිලන තරුණ පෙනුමැති කාන්තාවක් ද එතැන සිටියාය.

"ඔබ සිල්වියා වැලෙන්ටිනෝ, එහෙම නේද?" හෝම්ස් විමසීය.

ඇයගෙන් පිළිතුරක් නොලැබිණි. එතැන සිටි සැවොම පුදුමයෙන් ඇය දෙස බැලූහ.

"මේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ග්‍රෙග්සන්. වැඩිදුර ප්‍රශ්න කිරීමකට ඔබ පොලීසියට උවමනා වී තිබෙනවා" හෝම්ස් පවසද්දී කිසිවෙකුගෙන් විරුද්ධත්වයක් එල්ල නොවිණි.

උරහිස තෙක් දිග කළු පැහැති කෙස් වැටියක් තිබූ සිල්වියා වැලෙන්ටිනෝ ගේ සම ඔලිව් පැහැති විය. වයස තිස්පහක පමණ රූමත් කාන්තාවක් වූ ඇය, ඉතා අලංකාර ලෙස හැඳ පැළඳ සිටියාය. එතැන සිටි කාන්තාවක් හා පිරිමියෙක් ද ඇය සමඟ පොලිස් ස්ථානය ඇවත යාමට පැමිණියහ.

"හෝම්ස් මහත්මයා, ඔබ කොහොමද මේ හැම දෙයක්ම දැන ගත්තේ?" ග්‍රෙග්සන් ඇසුවේ රෝද හතරේ කුලීරියකට නැගීමට සූදානම් වෙමිනි.

"ඒක ටිකක් දිග කථාවක් ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "ඔබ මේ අපරාධකාරිය පොලිස් මූලස්ථානයට භාරදීලා බේකර් වීදියට ආවොත්, මං කියන්නම් මේ කාරණා හොයාගත් හැටි"

සිරකාරිය නිසි බලධාරියනට භාරදී, පැය දෙකක් ගතවීමට පෙර ග්‍රෙග්සන් අපේ නිවහන වෙත පැමිණියේය.

"කොතැනින් ද වොට්සන් මං කථාව පටන්ගන්න ඕන?" මගේ මිත්‍රයා විමසුවේ අමුත්තාට පුටුවක් පිළිගන්වා තම පයිප්පය ද දල්වා ගැනීමෙන් පසුවය.

"ඒක මට වඩා දන්නේ ඔබ නේ" මම කීවෙමි.

අප එද වාල්ටන් මැඳුරේ සිට පියන් හිල් පැත්තට වැටුණු ගුරු පාරේ, බයිසිකල් ටයර් සලකුණු ඔස්සේ ගිය ගමනත්, එහිදී, කරුණු රාශියක් සොයාගත් හැටිත් හෝම්ස් මුලින්ම විස්තර කළේය.

"අපි දෙන්නා මඩවලේ දමා ගිහින් තිබුණු බයිසිකලය හොයා ගන්න වෙලාව වෙනකොට, මේ ගැටලුව විසඳීමට අවශ්‍ය සාක්ෂි විශාල ප්‍රමාණයක් හොයාගෙන අවසන්" හෝම්ස් කීය. "මේ අපරාධය කළේ කාන්තාවක් බවත්, ඇය වාල්ටන්ල හොඳින්



http://sherlockholmesinvestigations.blogspot.com

හඳුනන කෙනෙක් බවත් දැන ගත්තත්, ඇය කවුද කියල හඳුනා ගැනීම තමයි ලොකුම ප්‍රශ්නය වුණේ.

මේක වෝල්ටන් මහතාගේ වැඩක් නොවෙන බව මං මුලදීම තේරුම් ගත්තා. විවියන් නම ඔහුගේ බිරිඳගෙන් නිදහස් වෙලා ජීවිතය නිදහසේ ගෙවූ ඔහුට, ඇය සැලසුම් සහගතව මරා දමන්න කිසිම හේතුවක් තිබුණේ නෑ. අනික ඔහු මේ තරම් ආදරය කළ ඔහුගේ දුවට එනු ගිනිඅවියක් එල්ල කළා කියල අපි හිතන්නේ කොහොමද?"

"අපි හිතමු ඔහුට විවියන් මහත්මියගෙන් නිදහස් වෙන්න උවමනා වුණා කියල, යළිත් විවාහ වෙන්න?" ග්‍රෙග්සන් ප්‍රශ්නයක් ඇසීය.

"එහෙම උවමනාවක් තිබුණා නම්, ඒකට වියදම් කරන්න ඔහුට උවමනාවටත් වඩා මුදල් තියෙනවා" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"අනික ඔහුගේ නිදහස් ජීවිතයට විවියන් ගෙන් බාධාවක් තිබුණේ නැහැ. මිනීමැරීමට හේතුව වුණේ ඊර්ෂ්‍යාව නැත්නම් පළිගැනීමක් කියන එක එතකොට පැහැදිලියි. අක්ෂි වෛද්‍යවරයාගේ පුතා මේකට පැටලිලා නැත්නම්, අපට සැක හිතන්න පුළුවන් කා ගැනද? වෝල්ටන් මහත්මයාට සම්බන්ධවුණු කවුරු හරි මේකට ගැවිලා ඇති ද කියන සැකය මගේ හිතේ ඇතිවුණා. ඔහුගේ නිවස පරීක්ෂා කරන්න මං තීරණය කළේ අන්න ඒ නිසයි. එවිටයි ඔහුගේ ගෙදර අල්මාරියක් යට තිබිලා ඇය හැඳසිටි ගවොම, පනාව, ලුපස්ගු, බයිසිකලයේ යතුරු සහිත සම්බැගය ආදිය හමුවුණේ.

පනාවේ රැඳී තිබුණු කෙස්ගස් වගේම, වෝල්ටන් මහත්මයාගේ නිවසේ කණ්ණාඩි මේසය අසළ බිම තිබූ දූවිලිත් මගේ අණ්වීක්ෂයෙන් පරීක්ෂා කරල බැලුවා. එහි තිබී කළු පැහැති සාප්පු කෙස්ගස් දහයක් දොළහක් පමණ මට සොයා ගැනීමට හැකිවුණා.

"මොකක්ද ඒ සොයාගැනීමේ වැදගත්කම?" ග්‍රෙග්සන් විමසුවේය.

"මේ ගෙදර මහත්මයාට තිබුණේ රන්වන් පාට කෙස්" හෝම්ස් කීය. "අනික ඒවා කෙටියට කැපූ කෙස්. ඔබට මතක ඇති විවියන් හා ජූන් වෝල්ටන් දෙදෙනාගේම කොණ්ඩය රන්වන් පාට අක්බමරු කෙස් බව. අනික මේ ගෙදර සේවකයෙක් හෝ සේවිකාවක්



http://sherlockholmesinvestigations.blogspot.com

හිටියෙත් නැහැ. එතකොට කාමරයේ බිම තිබී මා අහුලාගත් කෙස් ගස් හා ගවොම සමග වූ පහාවේ තිබී මා ලබාගත් කෙස්ගස් එක සමාන නම් මොනවද, ඔබ දෙදෙනාට හිතාගන්න පුළුවන්?" හෝම්ස් විමසීය.

"අපි දෙදෙනා මොනවා හිතුවත් කමක් නැ, හෝම්ස් මහත්මයා, ඔය කථාව දිගටම කියන්න" ග්‍රෙග්සන් කීවේ නොඉවසිල්ලෙනි.

"කළුවර අල්මාරිය යට තිබී මට හමුවුණු සේද ගවොමත් මං ටිකක් පරීක්ෂා කර බැලුවා. ඒකෙ ඇතුළෙහ ලේබලය අනුව ඒක, ඉතාලියේ නිෂ්පාදනය කළ පිරිසිදු සේදයෙන්, ඉතාලියේම මැසූ ගවොමක්. මේව එංගලන්තයේ වුණත් මිලට් ගන්න පුළුවනි. නමුත් මිල අධිකයි. ගවොමේ මිම් අනුව, ඒක අඳින කාන්තාවගේ ප්‍රමාණය හිතාගැනීම ඉතා පහසුයි. එතකොට අපට ඇය පිළිබඳ දත්ත කිහිපයක් ලැබෙනවා."

"මොනවද හෝම්ස් ඒ දත්ත?" මම ඇසීමි.

"ඇය අඩි පහයි අඟල් තුනත් - හයත් අතර උස, බර රාත්තල් අනූවත් එකසිය දහයත් අතරේ තැනැත්තියක්. කොණ්ඩය කෙටි කළු කොණ්ඩයක්. ඉතින් මම ඔය විස්තර ඉදිරිපත් කළා, වෝටර්ලූ දුම්රියපොළේ ප්‍රවේශපත්‍ර ලිපිකරුට හා සේවකයන් කිහිපදෙනෙකුට. ඔවුන්ගෙන් එක් අයෙකුට මේ කාන්තාව යන්තමින් මතක තිබුණා.

ඔහු කිව්වා දවල් දොළහමාරට හෝ එකට විතර නිල් පැහැති ගවොමක් ඇඳගත් කාන්තාවක් ආ බව. ඇගේ ඉංග්‍රීසි උච්චාරණයේ යම් තරමකට විදේශීය ගතියක් තිබුණු බව ඔහුට හොඳට මතකයි. බොහොම කලබලයෙන් සිටි ඇය, ලන්ඩන් දෙසට යන දුම්රියක් තියෙන්නේ කීයටද යන්න අහලා තියෙනවා. එය ශීඝ්‍රගාමී එකක් නොවන බව ඔහුට ස්ථිරයිද කියා දෙතුන් වරක් ඇහුවලු, විදේශීය උච්චාරණයකින්. අන්න ඒ හේතුවයි ඔහුට ඇය ගැන මතක තිබුණේ.

එතැනින් එහාට මගේ කටයුතු බොහොම පහසුවුණා. ආපසු ආව්හිල් වලට ඇවිත් ෆර්ගියුසන් පවුලගෙන් හා සුසාන්ගෙන් මං ප්‍රශ්න කළා. "විදේශීය උච්චාරණයක් ඇතිව ඉංග්‍රීසි කථා කරන, මේ තරම් උස මහත, කෙටි, කළු කොණ්ඩයක් ඇති, මේ පවුලේ හිතවතිය කවුද?" මෑත කාලයේ ඇවිත් නැති නිසා වෙන්නත් ඇති සුසාන්ට ඇය ගැන හරිහැටි මතක තිබුණේ නැහැ. ටිකක් කල්පනා


http://sherlockholmesinvestigations.blogspot.com

කරද්දී ලිලියන් ෆර්ගියුසන් මහත්මියට එක් වරම මතක් වුණා. ඔන්න එතකොට ඇය නොනවත්වාම කියවන්න ගත්තා, සිල්වියා රෙඩ්පාත් ගැන. සිල්වියාගේ ඉතිහාසය හා පෙනුම ගැන මට උවමනාවටත් වඩා විස්තර ලැබුණා. අවුරුදු දෙක තුනකට කලින් මේ ගෙදරට ඇවිත් ගිය රෙඩ්පාත්ල ගැන, මෙයාලට අමතක වුණු හැටි එක අතකින් පුදුමයි නේද? නිව්බෙවර්ලිවලදී මං ඇය හා ඇගේ පවුල ගැන තවත් තොරතුරු එකතු කරගත්තා. ඊළඟට මගේ ඉදිරි ගමනට බාධකයක් ඇතිවුණේ කාගෙන්ද දන්නවද?"

"කාගෙන්ද හෝම්ස් මහත්මයා?"

"ෆර්ගසන්ගෙන් සහ වෝල්ටන්ගේ නීතිඥයන්ගෙන්"

"මොකක්ද මගෙන් ඔබට ඇතිවුණු අවහිරය?"

"වෝල්ටන් මහත්මයා රක්ෂිතයේ සිටීම මට ලොකු අවහිරයක් වුණා" හෝම්ස් කීය. "ඊට වඩා ලොකුම අවහිරය වුණේ ඔහුගේ නීතිඥයින්ගෙන්. ඔවුන් වෝල්ටන්ට නියම කරලා තිබුණා කිසිම කෙනෙකු සමග කථාකරන්න එපා කියලා"

"ඉතින්?"

"සඳුද ඔහු ඇප පිට නිදහස් කරයන්න නීතිඥයො සමත්වෙන බව මං දැනගිටියා. ඉතින් අද උදේ පාන්දරින්ම මම ලන්ඩනයෙන් පිටත්වෙලා ගියා. උදේ දහය වෙද්දි මං නිව්බෙවර්ලි අධිකරණය අසල. ලොකු ව්‍යාපාරිකයෙක් රක්ෂිතයෙන් එළියට ගන්න, නීතිඥයෝ එකතු වෙන්නේ රොත්ත පිටින්. ඔවුන් වෙන කිසිකෙනෙකුට එතැනට ළං වෙන්න දෙන්නේ නෑ. ඒත් වෝල්ටන් අතට ලියුම් කැබැල්ලක් දෙන්න මං ක්‍රමයක් සොයාගත්තා."

"ඔබ කොහොමද එතැනට ඇතුළුවුණේ?" මම ඇසීමි.

"හකල්ටන් පොලීසියේ උපපරීක්ෂකයාගේ නිල ඇඳුම මට ගණනට ගැළපුණා" මගේ මිතුරා කීවේ සිනාසෙමිනි. "වෝල්ටන් රක්ෂිතයෙන් නිදහස් වෙලා එළියට එද්දී නීතිඥයින් ඔහුට අතට අත දීල සුභ පැතුවා. නිල ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධරයෙක් වෝල්ටන්ට සුභපතන්න ආව එක ගැන නීතිඥයින් බලාහිටියේ පුදුමයෙන්"

"ඉතින්?"

"ඔහුට අතට අත දෙන ගමන් කඩදාසියක රතුපාට අකුරෙන් මා ලියූ පණිවුඩය ඔහු අතේ තැබුවේ "මං හැමදෙයක්ම දන්නවා. මං ෂර්ලොක් හෝම්ස් කියමින්"



http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවද හෝම්ස් ඔබ ඒ ලියුම් කැල්ලේ ලියුවේ?"

"අපරාධකාරිය සිල්වියා රෙඩ්පාත් බව මට ඔප්පු කළ හැකියි. ඔබේ නිර්දෝෂීත්වය වහා හෙළි නොකොළොත්, ඔබටත් යන්න වෙන්නේ එල්ලුම් ගස්. මා හමුවීමට කැමැති නම් රහසේම ඇවිත් තව පැය භාගයකින් ඔබේ නිවස අසලදී හමුවන්න

ෂර්ලොක් හෝම්ස්"

"ඔහු පැය භාගයක් යන්න කලින් ඇවිත් මා හමුවුණා. ඔහු මුහුණ දී ඇති තත්ත්වයේ බරපතල කම මං ඔහුට තේරුම් කර දුන්නා. එවිට මෙහේ ඇවිත් අප ඉදිරියේ දන්නා හැම්දෙයක්ම හෙළිකරන්න ඔහු එකඟවුණා"

නඩු විභාගයේදී සිල්වියා වැලෙන්ටිනෝ හඬා වැළපෙමින් පාපෝච්චාරණය කළාය. වෝල්ටන් මහතා සමග අමනාප වී ගොස්, දඩයමේ යෙදීමට අවශ්‍ය බව කියමින්, සිය සොහොයුරා ලවා ගිනි අවියක් ගෙන්වා ගෙන, වෙඩි තැබීමට පුහුණුව ලැබූ ආකාරයත්, බයිසිකලයක් මිලට ගෙන එය පැදීමට පුහුණු වූ ආකාරයත්, ඇය හෙළිකළාය. දුඹුරු කඩදාසියක ඔතා පාර්සලයක් ලෙස බයිසිකලයෙන් ගෙන ආ ගිනිඅවිය, වෝල්ටන් නිවසෙන් පලා යද්දී මඩවතුර පිරුණු කාණුවකට විසිකළ බව ඇය කීවාය. පසුව පොලීසියෙන් එය සොයාගෙන ඉදිරිපත් කරන ලදි.

මනුෂ්‍ය ඝාතනය ගැන ඇය වරදකාරිය ලෙස ජූරි සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී. ඒ අනුව සිල්වියා වැලෙන්ටිනෝ රෙඩ්පාත්ට මරණ දඬුවම හිමිවිණි.

සමාප්තයි

මීළඟ ෂර්ලොක් හෝම්ස් වික්‍රමය

"භයානක මිනිහා"

ළඟදීම!



http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only...Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com




# ඩ්‍රැකියුලාට

එරෙහිව

# ෂර්ලොක් හෝම්ස්

"මේ අහගෙන ෂර්ලොක් හෝම්ස්...... භයානකම දේ මරණය නෙමෙයි......ඊටත් වඩා අන්ත භයානක දේවල් තියෙනවා. මගේ අද්භූත බලවේගවලින් දහසෙන් එකක් ක්‍රියාත්මක වෙද්දී ජොනතන් හාකර් පිස්සු වැටුණා...... මගේ හමුදාව තමයි මළවුන්ගේ හමුදාව. උන් සීතල මිනීවළවල්වලින් නැගිටලා එන්නේ......"

- කවුන්ට් ඩ්‍රැකියුලා

"හෝම්ස් මහත්තයා....... ඇයි ඔබ මගෙන් අහන්නෙ නැත්තෙ, සාතන් කියන්නෙ කවුද යක්ෂයා කියන්නෙ කවුද කියලා? ඩ්‍රැකියුලා කියන්නෙ යක්ෂයාටත් වඩා පිළිකුළු ආත්මයක්!"

- මහාචාර්ය වෑන්හෙල්සිං

මිල රු. 195/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන
141/2, දූව පාර,
බැද්දගාන,
කෝට්ටේ.